

1

ඩයලොග් ඇක්සිආටා පී.එල්.සී.

වාර්ෂික වාර්තාව 2018/19

ආර්ථික ශක්‍යතාව, සමාජ වගවීම සහ පාරිසරික වගකීම පිළිබඳ අපගේ මූලික සාරධර්ම කෙරෙහි අප අවධානය සෑම විටම යොමු වී තිබේ.
අප ගමන් මග අගනාකම්/වටිනාකම්වලින් යුතු අවස්ථාවන් සහිතව නිර්මාණය කිරීමට අපි සෑම විටම උත්සුක වන්නෙමු.

1

Scan to view the online version
http://plc2018-19.annualreports.lk

# අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

2019 මාර්තු 31න් අවසන් වූ වර්ෂය සඳහා වන අපගේ හයවන සංකලිත වාර්ෂික වාර්තාව අපි මෙහි ඉදිරිපත් කරමු. එමගින් අපගේ මූල්‍යමය සාමාජීය හා පරිසර හිතකාමී ක්‍රියාකාරීත්වය පිළිබඳ සමබර හා සංක්ෂිප්ත තක්සේරුවක් හා පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සමතුලිත කරමින් තිරසාර වර්ධනයක් ඇති කරන්නේ කෙසේද යන්න පෙන්වා දෙයි. අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර ඇති සමාගමේ ව්‍යාපාර සැලසුම් සහ අනාගතයේ දී පීපල්ස් ලීසිං හි මෙහෙයුම් කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට සෑහීමකට පත් වේ. ඒ අනුව මූල්‍ය ප්‍රකාශණ සකස් කරනු ලබන්නේ අඛන්ඩ පැවැත්ම යන සංකල්පය මත පදනම්වය.

මෙම වාර්තාව කොටස් දෙකකින් ව්‍යුහගත කර ඇත.

පීපල්ස් ලීසිං යන පුරාවෘත්තය ගොඩනගමින් සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අපි විසින් වටිනාකමක් නිර්මාණය කළ ආකාරය පළමු කොටසේ පැහැදිලි කෙරේ. වාර්තාව මගින් මෙහෙයුම් තත්ත්වය පිළිබඳ මනා අවබෝධයක් ලබා දෙන අතර අනාගත වර්ධනය සඳහා සමාගමේ අපේක්ෂාවන් සහ තිරසාර බව කෙරෙහි විශ්වාසයක් ඇති කරයි.

දෙවන කොටසේ 2019 මාර්තු 31 වන දායින් අවසන් වන වර්ෂය සඳහා විගණන කරන ලද සහ සම්පූර්ණ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඇතුළු වඩාත් සවිස්තරාත්මක තොරතුරු අඩංගු වේ. වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ මූල්‍ය කාර්‍ය සාධනය මෙම මූල්‍ය ප්‍රකාශන වල පැහැදිලි කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් විදහා දක්වයි. මෙම කොටසෙහි ආයතනික පාලනය පිළිබඳ සවිස්තර වාර්තා මෙන්ම අතිරේක තොරතුරු ද අඩංගුවේ.

සමාගමේ විවිධ පාර්ශ්වකරුවන්ගේ සන්නිවේදන අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම වාර්තාව මාර්ගගත ආකෘතියෙන් සවිස්තර වාර්තාවක් ඇතුළුව විවිධ මාධ්‍ය සහ ආකෘති වලින් ලබා ගත හැකිය.

මූල්‍ය ප්‍රකාශන මගින් ආයතනයට අදාළ මූල්‍ය අංශයන් පිළිබඳ පූර්ණ අනාවරණය කිරීමක් සපයන අතර වාර්තාකරණයේ ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාදායක අවශ්‍යතා පිළිපැදීමට අපට ඉඩ සලසයි.

මෙම ඒකාබද්ධ වාර්ෂික වාර්තාවේ නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමේ අපගේ වගකීම හඳුනාගෙන පිළිගන්නා අතර එය සමාගම සහ එහි මෙහෙයුම් වලට අදාළ සියලු ප්‍රමාණාත්මක ගැටලු සහ කරුණු ආමන්ත්‍රණය කරන බව අපි තහවුරු කරමු. නීතිමය අවශ්‍යතා වලට අනුකූල වන අතරම, අපගේ සවිස්තරාත්මක ප්‍රමාණාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම සමාගමේ විනිවිධභාවය සඳහා ඇති කැපවීමට අනුකූල වේ.

දැනට පවතින තොරතුරු මත අනාගත ප්‍රක්ෂේපනවලට අදාළ මූල්‍ය ප්‍රක්ෂේපණ සහ ප්‍රකාශන පදනම් වේ. අනාගත සිදුවීම් පිළිබඳ අපට කිසිදු සහතිකයක් ලබා දිය නොහැකි අතර, තීරණ ගැනීමේදී ප්‍රක්ෂේපිත දිනය මත අනවශ්‍ය ලෙස විශ්වාසය තැබීමෙන් වලකින ලෙස අපි මෙම වාර්තාව පරිශීලනය කරන්නන්ට උපදෙස් දෙමු. ප්‍රකාශනයෙන් පසු මෙම තොරතුරු යාවත්කාලීන කර නොමැත.

**හේමසිරි ප්‍රනාන්දු මහතා**
සභාපති/විධායක නොවන,
ස්වාධීන නොවන අධ්‍යක්ෂ

**මයිකල් ප්‍රදීප් අමීර්තනායගම් මහතා**
නියෝජ්‍ය සභාපති/විධායක නොවන,
අනන්‍ය නොවන අධ්‍යක්ෂ, ස්වාධින අධ්‍යක්ෂ

**ජෙහාන් ප්‍රසන්න අමරතුංග මහතා**
විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ

**මොහොමඩ් අනීස් මොහොමඩ් රිස්වාන් මහතා**
විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

**ජොන්සන් ඇන්තනි ප්‍රනාන්දු මහතා**
විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ

**රසිත ගුණවර්ධන මහතා**
විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ

**එන්.ඩබ්.ඒ.එම්.යූ.කේ.කේ.ඊ. වීරසිංහ මහතා**
විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

**මහාචාර්ය කෙනඩි ගුණවර්ධන මහතා**
විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

# අපගේ හයවන සංකලිත වාර්ෂික වාර්තාව







### සන්නිවේදන ක්‍රම

අපගේ වාර්තාකරණය ඉතා නිරවුල්ව විවිධ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සපුරාලයි. මෙම වාර්තාව අපගේ ව්‍යාපාර ආකෘතියට අනුකූලව ව්‍යුහගත කර ඇති අතර අපගේ උපාය මාර්ග, කාර්ය සාධනය, පාලනය සහ අපේක්ෂාවන් සහ තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීමට ඒවා උපකාරී වන ආකාරය පිළිබඳ වාර්තාවකින් සමන්විත වේ.



HTML ආකෘතියෙන් සවිස්තරාත්මක වාර්තාවක් අන්තර්ජාලයේ ඇතුළත් වේ.



මුද්‍රිත අනුවාදයට අමතරව සපයන අතිරේක තොරතුරු මෙම සංකලිත වාර්ෂික වාර්තාවේ මංගත අනුවාදයෙන් ලබා ගත හැකිය.

කොටස් දෙකකින් යුත් සංකලිත වාර්ෂික වාර්තාව මුද්‍රිත, PDF සහ CD යන ආකෘතිවලින් යුතු වේ. (වඩාත් තෝරාගත්, විශේෂිත වූ පිරිසක් වෙනුවෙන් අනුකූලතා සම්බන්ධ අනාවරණය කිරීම් සිදුකර ඇත)

GRI 102-50 GRI 102-51 GRI 102-52

### වාර්තා කිරීමේ කාල සීමාව

මෙම වාර්ෂික වාර්තාව 2018 අප්‍රේල් 1 සිට 2019 මාර්තු 31 දක්වා මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ කාර්ය සාධනයට අදාළ ප්‍රමාණාත්මක තොරතුරු ආවරණය කරයි. (ආසන්නම පෙර වර්ෂයේ වාර්ෂික වාර්තාව වන්නේ 2018 මාර්තු 31 දිනැති වාර්තාව වේ).

GRI 102-45 GRI 102-46 GRI 102-4

### වාර්තාවේ සීමාව

වෙනත් ආකාරයකින් ප්‍රකාශය කරනු නොලැබුවහොත් මෙම වාර්තාව විශාල වශයෙන් ආවරණය කරනු ලබන්නේ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. (සමාගම/පීපල්ස් ලීසිං) ආයතනයේ ශ්‍රී ලංකාව තුළ සිදුවන ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු වේ. මූල්‍ය වාර්තා තුළ පීපල්ස් ලීසිං සමාගමත් එහි පරිපාලිතයන් හයත් ආශ්‍රිත සමාගමත් (සමූහය) ආවරණය වේ.

GRI 102-48 GRI 102-49

### ප්‍රතිප්‍රකාශ සහ වෙනස්කම්

පසුගිය වාර්තාවල ඇතුළත් වූ තොරතුරුවල ප්‍රතිප්‍රකාශ සිදු කර නොමැති අතර විෂයෙහි හා සීමාවෙහි පෙර වාර්තාකරණ කාලපරිච්ඡේදයන්ගෙන් සැලකිය යුතු වෙනස්වීම් නොමැත.

කෙසේ වෙතත්, පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය වඩාත් හොඳ ඉදිරිපත් කිරීමකට අදාළ වන පරිදි සහ වත්මන් වර්ෂය හා සසැඳිය හැකි වන පරිදි අවශ්‍ය අවස්ථාවන්හිදී සංශෝධනය කර ඇත.

### උපායමාර්ගික අත්‍යාවශ්‍යතා

අපගේ උපායමාර්ගික අත්‍යාවශ්‍යතා පහ පවතින අවස්ථාවන්ගේ ප්‍රයෝජන ගැනීමට සහ අපගේ මෙහෙයුම් පරිසර හැඩගස්වන පුළුල් ප්‍රවණතා තුළ ඇති අවදානම් අවම කිරීමට අපට උපකාරී වේ.

1. තිරසාර වර්ධනයක් වෙත ගමන් කිරීම
2. පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම
3. ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වය ළඟාකර ගැනීම
4. කාර්යක්ෂම සම්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීම
5. වගකිව යුතු භාරකාරත්වය මූර්තිමත් කිරීම

සමාගමට අදාළ වන ප්‍රමාණාත්මක කරුණු වලට ප්‍රතිචාර වශයෙන් මෙම උපායමාර්ගික අවශ්‍යතා ගොඩනගන ලදී. 64 සහ 65 පිටුවල සාකච්ඡා කර ඇති පරිදි අපගේ ව්‍යාපාරයට සහ පාර්ශ්වකරුවන්ට සැලකිය යුතු ලෙස බලපාන ප්‍රමාණාත්මක අවස්ථාවන් සහ අවදානම් පිළිබඳව මෙම වාර්තාව අවධානය යොමු කරයි.

GRI 102-12 GRI 102-54

### අනුකූලතාව

මෙම වාර්තාව සම්පාදනය කිරීමේදී පහත සඳහන් කර ඇති ආකෘති රාමුවල සංකල්ප මූලධර්ම සහ මඟපෙන්වීම් අපි ලබා ගත්තෙමු -

- ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ ආයතනයේ (IIRC) සංකලිත වාර්තාකරණ ආකෘති රාමුව (IR Framework)
- ගෝලීය වාර්තාකරණ තිරසාර මාර්ගෝපදේශ (GRI G4) - විස්තීර්ණ නිර්ණායක
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය
- ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා මහ බැංකුව
- කොළඹ කොටස් හුවමාරුව
- එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDGs)
- ස්මාර්ට් ඒකාබද්ධ වාර්තාකරණ ක්‍රමවේදය

GRI 102-56

### බාහිර සහතික කිරීම්

ශ්‍රී ලංකාවේ, අර්නස්ට් ඇන්ඩ් යංග් වරලත් ගණකාධිකාරීවරු විසින් මූල්‍ය ප්‍රකාශන සමග අදාළ සටහන් විගණනය කරනු ලැබූ අතර ඔවුන්ගේ සහතික කිරීම් වාර්තාව 217 සිට 219 පිටුවල දක්වා ඇත. තිරසාර වාර්තාකරණය සඳහා ඔවුන්ගෙන් ලබාගත් බාහිර සහතික කිරීම මෙම වාර්තාවේ 387 වන පිටුවෙහි දක්වා ඇත.

අර්නස්ට් ඇන්ඩ් යංග් වරලත් ගණකාධිකාරීවරු විසින් ආයතනික පාලන නිර්දේශ වලට සමාගමේ අනුකූලතාව සඳහා බාහිර සහතික කිරීමත් නිකුත් කර ඇති අතර එය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කර ඇත. ඉහත විගණකවරුන් විසින් මූල්‍ය වාර්තාකරණය මත වන අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සමාලෝචනය කරන ලද අතර ඒ සඳහා ඔවුන්ගේ මතය 214 පිටුවේ දක්වා ඇත.

GRI 102-53

### වාර්තාව පිළිබඳ විමසීම්

මෙම සංකලිත වාර්ෂික වාර්තාව 2018/19 සහ එහි ඉදිරිපත් කර ඇති තොරතුරු පිළිබඳ ඇති ප්‍රශ්න සහ විමසීම් යොමු කළ යුත්තේ:

**ප්‍රධාන මූල්‍ය නිලධාරී**
**පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී**
**1161, මරදාන පාර,**
**කොළඹ 08**
**ශ්‍රී ලංකාව**
**තැපැල් කේතය: 00800**
**දුරකථන: +94 11 263 1631**

# අප වටිනාකම් නිර්මාණය කරන ආකාරය

අපගේ වාර්ෂික වාර්තාව අපගේ ව්‍යාපාර ආකෘතියට අනුකූලව ව්‍යුහගත කර ඇත. වෙනත් වචනවලින් කිවහොත්, මෙම අද්විතීය ප්‍රවේශය මගින් වාර්තාවේ අන්තර්ගත පිටුව සමාගමේ ව්‍යාපාර ආකෘතිය පිළිබිඹු කරයි. රූප සටහන් මනාව අධ්‍යයනය කිරීම තුළින් එය පිළිබිඹු වේ.

# අප වටිනාකම් නිර්මාණය කරන ආකාරය

## පටුන: අපගේ ව්‍යාපාර ආකෘතිය සමග අනුරූපණය

### 1 පුරාවෘත්තයක් ගොඩනැගීම


පීපල්ස් ලීසිං ආයතනය පිළිබඳව 12
– වසරේ වැදගත් තොරතුරු 16
අපගේ දක්ම සාක්ෂාත් කර ගැනීම
– සභාපතිගේ පණිවිඩය 18
අපගේ මෙහෙවරට අනුකූලව සිටීම
– ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය 20


### 3 ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය


මෙහෙයුම් පරිසරය 62
අවදානම් සහ අවස්ථාවන් 64


### 4 පාර්ශ්වකරුවන්ගේ සබඳතා ශක්තිමත් කිරීම


පාර්ශ්වකරුවන් 68
ප්‍රමාණාත්මක කරුණු 70


### 5 අපගේ ගමන්මග තීරණය කිරීම


උපායමාර්ගික ගමන් මග 74
– අපගේ පරමාර්ථ 75
– අපගේ උපායමාර්ග 76


### 6 ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම


යෙදවුම් 80


ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා භාවිතා කරන සම්පත්


වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම් 83


නිශ්චිත නිමවුම් ගොඩනැගීමට යෙදවුම් භාවිතා කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියා සහ ගනු ලැබූ ක්‍රියාමාර්ගයන්

## 2 වගකිවයුතු භාරකරුවන් වීම


අධ්‍යක්‍ෂ මණ්ඩලය 26

ආයතනික කළමනාකරණය 30

කළමනාකරණ මණ්ඩලය 32

අනුකූලතා කළමනාකරණය 35

ආයතනික පාලනය 37

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 54


## 7 නොවෙනස්වූ ගමන් මඟ


අවදානම් කළමනාකරණය 154

අපගේ කාර්යසාධනය ඇගයීම 171



නිමැවුම් 146

නිෂ්පාදනය කරන ලද භාණ්ඩ සඳහා සේවා මෙන්ම ප්‍රතිපල ළඟාකර ගැනීම සඳහා වැදගත් වන වෙනස්කම්

කෙටිකාලීනව නිර්මාණය කරන ලද වටිනාකම්

ප්‍රතිඵල 148

නිමැවුම්වල ප්‍රතිඵලයක් ලෙස ආයතනය විසින්ම හා පාර්ශ්වකරුවන් වෙත නිර්මාණය කරනලද වටිනාකම්

මධ්‍යකාලීනව නිර්මාණය කරන ලද වටිනාකම්

බලපෑම 150

සමාගමේ දැක්ම සහ මෙහෙවර අඛණ්ඩව පවත්වා ගැනීම

දීර්ඝකාලීනව නිර්මාණය කරන ලද වටිනාකම්


**Section 2**

## 8


**අනුකූලත්ව වාර්තා**

ආයතනික පාලන - ඇමුණුම් 183

විගණන මණ්ඩල කමිටු වාර්තාව 202

වේතන හා නාමයෝජනා කමිටු වාර්තාව 204

සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු පිළිබඳ කමිටු සමාලෝචන වාර්තාව 205

ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටු වාර්තාව 206


## 9


**මූල්‍ය වාර්තා**

මූල්‍ය දින දර්ශණය 212

මූල්‍ය වාර්තා සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම 213

ස්වාධීන ආරක්ෂණ වාර්තාව 214

අභ්‍යන්තර මූල්‍ය පාලනයට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රකාශනය 215

ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීන්ගේ වගකීම් ප්‍රකාශනය 216

ස්වාධීන විගණන වාර්තාව 217

මූල්‍ය ප්‍රකාශන - පටුන 220

ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනය 221

විස්තිරණ ආදායම් ප්‍රකාශනය 222

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 223

ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය 224

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 226

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 227


## 10


**පරිපූරික තොරතුරු**

ආයෝජක සබඳතාවන් 372

කාර්තුමය විශ්ලේෂණය 381

දස වසරක සාරාංශය 383

ලාභ අලාභ ප්‍රකාශය ඇමෙරිකානු ඩොලර් වලින් 385

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය ඇමරිකානු ඩොලර් වලින් 386

ස්වාධීන සහතිකකරණ වාර්තාව 387

ගෝලීය වාර්තාකරණ මුලපිරීම් දර්ශකය 388

අනුපාතවල පදනම 392

රැස්වීම පිළිබඳ නිවේදනය 393

**ඇමුණුම්**

පෙරකලාසි පත්‍රය

**සාංගමික තොරතුරු** පසුපස කවරයේ ඇතුල් පිටුව

# අප වටිනාකම් නිර්මාණය කරන ආකාරය

## අපගේ ව්‍යාපාර ආකෘතිය

පස්වැදෑරුම් අත්‍යාවශ්‍ය වූ විධානයන් මත පැතිරුණු අපගේ මූලෝපාය යොමුවීම් හා ව්‍යාපාර අකෘතිය හා ඒකාග්‍ර වූ ව්‍යුහගත හෙළිදරව් කිරීමකි. මෙම විධානයන් විසින් සියලු ආකාර වූ ප්‍රාග්ධනය ආවරණය කරනු ලබයි.

පීපල්ස් ලීසිං සමාගමේ ව්‍යාපාර ආකෘතිය එහි දර්ශනය හා දූත මෙහෙවර ලඟාකර ගැනීමට දායකත්වය ඇතිකිරීම කෙරෙහි බලපෑමක් උත්පාදනය කරන යෙදවුම්, නිමැවුම්වලට පරිවර්තනය කරන ක්‍රමවේදයයි.

### උපස්ථම්භක ව්‍යුහය

ආදර්ශ පාඨයක් ගොඩනැගීම (පිටුව 10 සිට 23 බලන්න) අපගේ දූත මෙහෙවර යථාර්ථයක් බවට පත්කර ගැනීම පිණිස අපගේ දර්ශනය ලඟාකර ගැනීමට දක්වන අඛණ්ඩ ප්‍රයත්නය කෙරෙහි දිශානති වනු ඇත.

අපගේ අගය නිර්මාණය කිරීමේ හැකියාව මත පදනම් වූ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ අපේක්ෂාවන් (උනන්දුවක් දක්වන පාර්ශ්වයන් හා සම්බන්ධතාවය ශක්තිමත් කිරීම) පිටු 66 සිට 71 සහ ක්‍රියාකාරි පරිසරය තුළ උත්කෘෂ්ඨත්වයට බලපාන උපනතීන් කෙරෙහි වූ බලපෑම් හා අවභාෂයන් (ව්‍යාපාර සංදර්ශනය කෙරෙහි යොමුව) පිටුව 60 සිට 65) පිළිබඳ අප විසින් සලකා බැලීම තුළ පරිපූර්ණ සංස්ථාපිත පාලනයකට (වගකියන භාරකරුවෙකුවීම) පිටු 24 සිට 59 )යොමුව ඇත. අපගේ මූලෝපාය (අපගේ යාත්‍රාව සනිටුහන් කිරීම පිටු 72-77) නිර්මාණය අපගේ ඉලක්කයන් සක්ෂාත් කර ගැනීම කෙරෙහි සහතිකයක් ලබා දේ.

අප අරමුණුගත කාර්ය තුළ තියුණු බවට (කාර්ය මත රැඳීම - පිටු අංක 152 සිට 178) සහතික වීම තුළින් ලබාදෙනු ඇත.

### අගය නිර්මාණය

ශ්‍රී ලංකාව තුළ බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ මනා ආරක්ෂිත වලල්ක් සහිත ක්‍රියාකාරියෙකු ලෙස පසුගිය දශක දෙකක කාලපරිඡේදය පුරා විකාශනය වූ නම්‍යශීලී ව්‍යාපාර ආකෘතිය අප සතු වේ. එය අපගේ සම්පත් භාවිත කාර්යක්ෂමතාව සම්බන්ධ වැදගත් නිර්නායකයක් වේ. එම නිසා දෛනික ක්‍රියාකාරිත්වය අනුගත වන ආර්ථික, මූල්‍ය, අලෙවිකරණ රීතීන්, මූලෝපායයන් යනාදි විවිධ ශික්ෂණයන් මගින් මගපෙන්වීමක් සිදු කරනු ඇත. තවදුරටත් ගතානුගතික ව්‍යාපාර ආකෘතීන් කෙරෙහි තර්ජනාත්මක බලපෑමක් ඇතිකරන නැගී එන සංවර්ධනයන් හා වේගවත් මෙහෙයුම් පරිසරය, තරගකාරිත්වයන් සහ විවිධත්වයන් බලපානු ඇත. පීපල්ස් ලීසිං අඛණ්ඩව එහි ව්‍යාපාර ආකෘතිය, කාර්ය දාමය, හෝ අදාල ක්‍රියාකාරකම් හා ඒ සඳහා පදනම් වූ පවතින හා අවශ්‍ය යෙදවුම්, ඉලක්කගත නිමැවුම්, ලබාගත් නිමැවුම් සහ අපේක්ෂා කළ බලපෑම සම්බන්ධ නනු සසුර කිරීම සිදු කරයි.

### පුරාවෘත්තයක් නිර්මාණය

වෘතාන්තයක් නිර්මාණය කිරීමෙහි ලා අපගේ කාර්යය අඛණ්ඩව සිදු කරන බැවින් වර්ෂය තුළ ඉස්මතු වූ විශේෂ කරුණු දෙස නැවත විචක්ශණශීලි යොමුවීමක් සිදු කරයි. අප සභාපතිතුමා අපගේ දර්ශනය හා මූල්‍යමය අන්තර්ගතයන් තාත්විකත්වයට පත්කර ගනිමින් සිටීම පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. අපගේ දූත මෙහෙවර කෙරෙහි සත්‍යවාදීවීම පිළිබඳ අප ප්‍රධාන විධායකතුමා සාකච්ඡා කරනු ලබන අතර, නව නිපැයුම් හා පාරිභෝගික සේවාව කෙරෙහි අප අවධානය යොමුවීමේ වැදගත්කම හුවාදක්වීම ද සිදු කරයි. එය අපගේ අගය නිමැවුමේ ගවේෂණයට පිටුවහලක් වේ.

### වගකිවහැකි භාරකාරත්වය

වගකිවහැකි භාරකරුවකුගේ පාරදෘෂ්‍ය බව අප අධ්‍යක්ෂ මණ්ඩලය, ඒකාබද්ධ කළමනාකරණය හා කළමනාකරණ කණ්ඩායම ඉහළින්ම පෙන්නුම්කර ඇත. පිපල්ස් ලීසිං සමාගම මේ සඳහා අත්‍යාවශ්‍ය වූ පාලනයන්, පුහුණු කිරීම් හා තාක්ෂණ භාවිතයන් සහිත ශක්තිමත් අනුගතවීමට නැඹුරු වූ පරිසරයක් ඇත. පූර්ණ ඒකාබද්ධ පාලනය මගින් විශ්වාසය හා ආයෝජකයින් සමග වූ සම්බන්ධතාවය ඇති කිරීමට කටයුතු කෙරේ. කියාමනයන්ට අවශ්‍ය සමාගම හා සමබන්ධ තොරතුරු මෙම අධ්‍යක්ෂක මණ්ඩලය මගින් ඉදිරපත් කරන වාරශික වාර්තාව තුළින් ලබා දෙයි.

### ව්‍යාපාර අස්ථිත්වය සන්දර්භය කෙරෙහි යොමුව

අපගේ මූලෝපායෙහි හදවත වෙත යොමු වූ අගය නිමැවුම අපගේ ප්‍රයත්නයයි. අපගේ දේශීය ආර්ථිකය සහ පිළිවෙලින් අපගේ ව්‍යාපාරය කෙරෙහි බලපාන ගෝලීය ආර්ථික සන්දර්ශනයේ ක්‍රියාකාරකම් වාර්තා කරනු ලබන වර්ෂයේ අපගේ ප්‍රගතිය කෙරෙහි බලපාන අකාරය සමාලෝචනය කෙරේ.

# අපගේ ව්‍යාපාර ආකෘතිය << අප වටිනාකම් නිර්මාණය කරන ආකාරය

## පාර්ශ්වකරුවන් සමඟ ඇති සබැඳියාවන් ශක්තිමත් කිරීම

අර්ථාන්විත සාකච්ඡා මගින් අපගේ ප්‍රධාන උනන්දුවක් දක්වන කණ්ඩායම් කෙරෙහි ඔවුන්ගේ අවශ්‍යතා හා උනන්දු කරුණු සම්බන්ධ නිවැරදි අවබෝධයක් ලබාගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කර දීමට කටයුතු කිරීම නිර්මාණිත අගය සමබරව බෙදා හැරීම සමබරව සිදු කරන අතරේ සිදු කරනු ඇත. මෙහෙයුම් පරිසරය හා උනන්දු පාර්ශ්ව සම්බන්ධතාවය භෞතිකත්වයට පදනම් විය. භෞතික විෂය ප්‍රශ්නුර්නය සක්ෂාත්කර ගැනිම එය පිපල්ස් ලිසිං කෙරෙහි වු අදාළත්වය, උනන්දුවක් දක්වන කණ්ඩායම් කෙරෙහි වු අදාළත්වය හා එහි වැදගත්කම මත රැඳේ. කෙතරම් දුරට භෞතිකත්වය වැදගත්ද යන්න තීරණය කිරීම බලපෑම් ගුනනයන් හා සිදුවිම් සම්භාවිතාවය මත තිරණය වේ.

## අපගේ ගමන් සනිටුහන්

අපගේ මුලෝපාය විසින් නිර්මාණය භෞතික අවස්ථාවන් ප්‍රාග්ධනික කරගැනීම හා අවදානම් අඩුකර ගැනීම හා අපගේ මෙහෙයුම් පරිසරයේ හැඩහුරුව හරිගස්වන උනන්දු පාර්ශ්වයන් සැළකිල්ලක් දක්වන හා නැඹුරුතාවක් දක්වන මුලෝපායක් මත සිදු වනු ඇත.

## ව්‍යාපාර ක්‍රියාවේ සිටිනු දකීම

පීපල්ස් ලිසිං හි ව්‍යාපාර ආකෘතිය මගින් අගය නිර්මාණය කිරිමේදි සියලු ආකාර යෙදවුම් ප්‍රාග්ධනික කිරීම සදහා මෙහෙය වේ. ආයතනයේ පරිභාහිර පාරශ්වයන්ගෙන් හා ආයතන අභ්‍යන්තරයෙන් ලබා දෙන්නා වු ප්‍රමාණාත්මක හා ගුණාත්මක යෙදවුම් වලින් මෙම ප්‍රාග්ධනය නිර්මාණය වේ. මුලය ප්‍රාග්ධනය ඉක්මවා ගිය අපගේ අනාගත ප්‍රේරණයන් හා විභවයන් වර්තමාන සන්ධර්භය තුළ වු ප්‍රාග්ධනයේ ප්‍රමාණාත්මක හා ගුනාත්මකභාවය රැඳී ඇත.

අප විසින් අගය නිර්මාණයට යොදාගන්නා අභ්‍යන්තර හා බාහිර ප්‍රාග්ධනය යෙදවුම් වේ. යම් නිශ්චිත නිමැවුමක් ලඟාකර ගැනීම යොදාගනු ලබන යෙදවුම් අපගේ ක්‍රියාකාරිත්වයන් හෝ කාර්යයන් ඉදිරිපත් කිරීම කෙරෙහි බලපානු ලබයි. මූලික මුලෝපාය විධීන් මත ක්‍රියාකාරකම් අවධානය යොමු කරයි.

නිමැවුමේ කෙටිකාලීන ප්‍රතිඵලය ලෙස නිර්වචනය කළ හැක. අප නිමැවුම ලෙස ඉදිරිපත් කරන සේවාවන් ප්‍රථිඵල ළඟා කර ගැනීමට අනුකූල වන ලෙස වෙනස්කම් සිදු කිරීම තුළින් ඉදිරිපත් කෙරේ. මධ්‍ය කාලීනව අප හා අප පිළිබඳ උන්නදු වන පාර්ශ්වයන් සඳහා අගය නිමැවුම ලෙස අපගේ ප්‍රතිඵලයන් නිර්වචනය කරයි. දීගුකාලිකව අපගේ දක්ම හා දූත මෙහෙවර අඛණ්ඩව හෙළිදරව් කිරීම මගින් ඇතිවන බලපෑම සැලකිල්ලට ගනී.

## පටිපාටිය මත රැඳීසිටීම

අපගේ ව්‍යාපාර සන්දර්භය හා සමබන්ධිත අවදානම් අවම කර ගැනීම කෙරෙහි අනාවරණය වු අවදානම කළමනාකරණ සහ විභවය වු හානි සහ අපගේ වත්කම සහ අනාවරණය වු ඉපයීම ආරක්ෂාකර ගැනීම කෙරෙහි අපගේ සංකලිත අවදානම් කළමනාකරණ රාමුව අවධානය යොමු කර ඇත. එය සහතිකවීම සම්බන්දයෙන් අවශ්‍යතා ව්‍යුත්පන්න වන ආකාරය අනුව ක්‍රියාකාරි පටිපාටීන් සංශෝධනයකර මෙහෙයුම් සදු කරන අතර නිරන්තරයෙන් නියාමනයන් හා ඇගයීම සිදු කරයි.

පෙර පිටුවෙහි සඳහන් කළ කරුණුවල අන්තර්ගතයට අනුකූල වු සහ අපගේ ව්‍යාපාර සන්දර්භයට අනුගත වන ආකාරයට මෙම වාර්තාව ව්‍යුහගත කර ඇත. (පසු පිට බලන්න)

# අප වටිනාකම් නිර්මාණය කරන ආකාරය >> අපගේ ව්‍යාපාර ආකෘතිය

**දැක්ම හා මෙහෙවර**

(පිටු අංක 12)

**මෙහෙයුම් පරිසරය**

(පිටු අංක 60 සිට 65)

**පාර්ශ්වකරුවන් හා සම්බන්ධවීම සහ ප්‍රමාණාත්මකතාව**

(පිටු අංක 66 සිට 71)

**උපායමාර්ගික දිශාව**

(පිටු අංක 72 සිට 77)

## යෙදවුම්

(පිටු අංක 80 සිට 81)

| | |
|---|---|
| **මූල්‍ය ප්‍රාග්ධනය** | ලාභදායීත්වය සහ වත්කම්වල ගුණාත්මකභාවය පිළිබිඹු කරමින් සමාගමේ ශක්තිමත් පොත් අගය |
| **බුද්ධිමත් ප්‍රාග්ධනය** | අප විසින් පාලනය කරන්නා වු දැනුම මත පදනම් වූ අස්පෘශ්‍යතා සහ ස්පෘශ්‍යතා |
| **ආයෝජන ප්‍රාග්ධනය** | අපගේ යහපාලනය තුළින් ප්‍රතිලාභ ලබන අපගේ කැපවූ අයෝජකයින් |
| **ගනුදෙනුකාර ප්‍රාග්ධනය** | ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් ඉක්මවීම තුළින් උපයාගත් පක්ෂපාතී අනුග්‍රහය |
| **ව්‍යාපාරික හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය** | ශක්තිමත් භාරකාරත්වය තුළින් ඉහළ ගිය වෙළෙඳපොල විශ්වාසය හා මූල්‍ය ස්ථායිතාව |
| **සේවක මණ්ඩල ප්‍රාග්ධනය** | සේවය කිරීමට ඇති ආශාව මගින් බලගැන්වෙන නවෝත්පාදකයින්ගේ දක්ෂ කණ්ඩායමක් |
| **සමාජයීය හා පාරිසරික ප්‍රාග්ධනය** | සදාචාරාත්මක හා වගකිවයුතු ව්‍යාපාර කටයුතු සඳහා අපගේ කැපවීම තුළින් හිමි වු ක්‍රියාත්මකවීමේ බලය |

## වටිනාකම් නිර්මාණය කරන්නා වූ ක්‍රියාකාරකම්

**තිරසාර සංවර්ධනයක් ළඟාකර ගැනීම** (පිටු අංක 84 සිට 91)

අවදානම් කළමනාකරණය ශක්තිමත් කරන අතරම, ශක්තිමත් මූල්‍ය තිරසාරත්වයක් ළඟාකර ගැනීම සහ වෙළෙඳපොල අවශ්‍යතා සපුරාලීම

**පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම** (පිටු අංක 92 සිට 103)

පුළුල් ජාලයක් හරහා නව්‍ය නිෂ්පාදන සහ සේවාවන් තුළින් සෑම ගනුදෙනුවකම අපේක්ෂාවන් ඉක්මවා යාම

**ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වය ළඟාකර ගැනීම** (පිටු අංක 104 සිට 123)

පාරිභෝගික සේවා විශිෂ්ටත්වයට සහාය වන කැපවූ සේවකයින්ට සහ ශක්තිමත් ක්‍රියාවලීන්ට සහායවීම සඳහා සරල, සෘජු ක්‍රියාපටිපාටින් පවත්වා ගැනීම

**කාර්යක්ෂම සම්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීම** (පිටු අංක 124 සිට 129)

සම්පත් කාර්යක්ෂමව සහ තිරසාරව භාවිතා කිරීම, වෘත්තීය වර්ධනය සහ ක්‍රියාකාරී වැඩ සංස්කෘතියක් පවත්වා ගැනීම

**වගකිවයුතු භාරකාරත්වය මූර්තිමත් කිරීම** (පිටු අංක 130 සිට 145)

වගකිවයුතු සහ සියල්ල ඇතුළත් මූල්‍ය සේවා සැපයීම සහ ධනාත්මක සමාජ සහ පාරිසරික සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම

පාලනය

(පිටු අංක 24 සිට 59)

අවදානම් කළමනාකරණය අධීක්ෂණය සහ ඇගයීම

(පිටු අංක 152 සිට 178)

## නිමැවුම්

(පිටු අංක 146 සිට 147)

තිරසාර ව්‍යාපාර කටයුතු තුළින් මූල්‍ය වර්ධනය

---

පාරිභෝගික අවශ්‍යතාවන්ට ප්‍රතිචාර ලෙස නව භාණ්ඩ සහ සේවා

---

කාර්යක්ෂමතාව හා සේවා ප්‍රමිතීන් ඉහළ නැංවිය හැකි වැදගත් පද්ධතීන් සහ ක්‍රියාවලීන් තවදුරටත් වැඩිදියුණු කිරීම

---

ශක්තිමත් ව්‍යාපාරික හවුල්කාරීත්වයන් අලුත් කිරීම සහ තවදුරටත් ශක්තිමත් කිරීම

---

අපගේ සේවකයින්ට අඛණ්ඩ පුහුණුව සහ සංවර්ධනය ලබාදීම

---

සවිබල ගැන්වූ ප්‍රජාවන් සහ පරිසර හිතකාමී ව්‍යාපාරික ක්‍රියාකාරකම්

## ප්‍රතිඵල

(පිටු අංක 148 සිට 149)

ලාභදායීත්වය සහ ව්‍යාපාර කටයුතුවල වර්ධනය තුළින් ස්ථාවර සහ සාර්ථක සමාගමක් වීම

---

පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ආකර්ශණය කරගත හැකි ශක්තිමත් වෙළෙඳනාම වටිනාකමක් සහ ශක්තිමත් වෙළෙඳපොල කොටසක් හිමිවීම

---

වටිනාකම් එකතුකල නිෂ්පාදන සහ සේවා විශිෂ්ටත්වය තුළින් ශක්තිමත් පාරිභෝගික අනුග්‍රහයක් සහ තිරසාර තරඟකාරී වාසියක් ලබා ගැනීම

---

නව්‍යකරණය මත පදනම් වූ පූර්ණ මූල්‍ය විසඳුම් තුළින් ආයතනයේ සන්නාමය ශක්තිමත් කරන සවිබල ගැන්වූ සහ කැපවූ ශ්‍රම බලකාය

---

වටිනාකම් නිර්මාණය කිරීමට දායක වියහැකි ශක්තිමත් කළ හවුල්කාරීත්වයක්

---

තිරසාර සංවර්ධන අරමුණු සක්ෂාත් කර ගැනීම සඳහා දායක වන අතරම, වගකිව යුතු මූල්‍ය, සමාජයීය සහ පරිසරය සඳහා ආයෝජන කිරීම තුළින් සවිබල ගැන්වූ සමාජයක්

## බලපෑම

(පිටු අංක 150)

අපගේ ව්‍යාපාරික ක්‍රියාවලියේ දිගුකාලීන බලපෑම වනුයේ පුරාවෘත්තයක් ගොඩනැගීමයි. ඒ ආදරණීය වෙළෙඳනාමයක්, ශක්තිමත් සහ විශ්වාසදායක වෙළෙඳපොල නායකයෙකු නිරන්තරයෙන් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා කලින් හඳුනා ගන්නෙකු සහ ආමන්ත්‍රණය කිරීම සහ ආර්ථික, සමාජයීය සහ පාරිසරික වශයෙන් තිරසාරව ක්‍රියාත්මක වන වගකිවයුතු ආයතනික පුරවැසියෙකු වීමයි.

# පුරාවෘත්තයක් ගොඩනැගීම

12

පීපල්ස් ලීසිං ආයතනය පිළිබඳව

18

අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම -

සභාපතිගේ පණිවිඩය

20

අපගේ මෙහෙවරට අනුකූලව සිටීම -

ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

# පීපල්ස් ලීසිං ආයතනය පිළිබඳව

## සාර්ථකත්වයේ ගමන් මග ගොඩනැගීමට අවශ්‍ය වන්නේ කුමක්ද? අපගේ අත්දැකීම් අනුව එය අපගේ දැක්ම සහ මෙහෙවරෙන් ආරම්භ වන ගමනකි.



### අපගේ දැක්ම

පාරිභෝගික හිතකාමී නිර්මාණාත්මක හා නව්‍යත්වයෙන් පූර්ණ විසඳුම් සපයන්නකු ලෙස මූල්‍ය සේවාවන්හි බවට පත්වීම.



### අපගේ මෙහෙවර

තිරසාර තරගකාරිත්වයක් පවත්වා ගනිමින් ආයතනික සේවා විශිෂ්ටත්වයක් ළගාකර ගැනීම සඳහා වටිනාකම් හා අගයන් ගලපා ගත් පාරිභෝගික සේවාවක් ලබා දීම



### සාර්ථකත්වයේ ගමන්මග

සාර්ථකත්වයේ ගමන් මග අනුව යමින් පිපල්ස් ලීසිං ආයතනය විශ්වාසදායක සන්නාමයක් ලෙස නමක් දිනාගෙන ඇත.

### සන්නාම ශක්තීන්

අපි ශ්‍රී ලංකාවේ බැංකු නොවන විශාලතම මූල්‍ය ආයතනයන්ගෙන් එකකි. රු. බිලියන 8.7ක් වූ සන්නාම වටිනාකමක් අප සතු වේ.




මහජන බැංකුවේ 75%ක හිමිකාරිත්වය

මව් ආයතනයෙන් එකතුවන අගයන්

- විශ්වසනීයත්වය
- ප්‍රාග්ධනය
- ද්‍රවශීලතාවය
- ස්ථාවරත්වය

පීපල්ස් ලීසිං සතු සුවිශේෂතාවයන්

- දක්ෂ හා නියුක්ත සේවා මණ්ඩලය
- විවිධාංගීකරණය කරන ලද ණය කළඹ
- ක්ෂේත්‍රයේ ප්‍රවණතාවන්ට නම්‍යශීලීව ප්‍රතිචාර දැක්වීමේ හැකියාව.
- එක් වහලක් යට සියලු මූල්‍ය සේවා

### ඉහළ ශ්‍රේණිගත බැංකු නොවන මූල්‍ය ආයතනයක් වීම

ප්‍රධාන පෙළේ ශ්‍රේණිගත කිරීම් දෙකකින් පිදුම් ලැබ ඇති පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් ආයතනය බැංකු නොවන මූල්‍ය ආයතන අතරින් ඉහළම ශ්‍රේණිගත ආයතනයකි.

ෆිච් රේටිස් ලංකා වෙතින්

**AA-(lka)**

වර්ගීකරණය ලබා ඇත

ෆිච් රේටිංස් ඉන්ටර්නැෂනල් වෙතින්

**B-**

ජාත්‍යන්තර වර්ගීකරණය දිනා ඇත

# පීපල්ස් ලීසිං ආයතනය පිළිබඳව

## අපගේ සංස්කෘතික පසුබිම

මූල්‍ය අන්තර්ග්‍රහණය කෙරෙහි අපගේ අවධානය අපගේ මෙහෙයුම් පාලනය කරන අතර පහත දැක්වෙන මූලික සාරධර්ම තුළින් සියලු පාර්ශවකරුවන්ට ප්‍රතිචාර දැක්වීමට අප පොළඹවයි.

ආර්ථික ශාක්‍යතාව — සමාජ වගවීම — පාරිසරික වගවීම

අපගේ දැක්ම, මෙහෙවර හා සාරධර්ම මගින් මෙහෙයවනු ලබන වගකිව යුතු මූල්‍ය සේවා සපයන්නෙකු ලෙස, අදාල නීති රීති වලට අනුගත වෙමින් සහ පාරිසරික, සමාජීය සහ පාලන (ESG) නිර්ණායකයන් ව්‍යාපාරික මෙහෙයුම් සඳහා ඒකාබද්ධ කර ගනිමින් අප වගකිව යුතු ණය සහ මූල්‍ය ආරක්ෂණ විසඳුම් සපයනු ලබන අතර අපගේ සාර්ථක ක්‍රියාවලින්, කැප වූ කාර්ය මණ්ඩලය සහ අති නවීන තාක්ෂණය ඔස්සේ අපගේ පාර්ශවකරුවන් හට වටිනාකම් නිර්මාණය කරයි.

GRI 102-5

## ආයතනික කණ්ඩායම් ව්‍යුහය




අපගේ ප්‍රධාන කොටස්හිමියා සහ අප විසින් සමාන මෙහෙයුම් ක්‍රියාකාරකම්වල නියුක්තවීම තුළින් ඇති විය හැකි අවාසිදායක තත්ත්වයන් මගහරවා ගැනීම සඳහා අපි මහජන බැංකුවේ ප්‍රධාන පාර්ශ්වකරුවන් නොවන අයට පමණක් අපගේ සේවාව සීමා කරමු.

| උප සමාගම් | | | | | | ආශ්‍රිත සමාගම |
|---|---|---|---|---|---|---|
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. | පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් ලිමිටඩ් | පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් | පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටිස් ලිමිටඩ් | ලන්කන් එලායන්ස් ෆයිනෑන්ස් ලිමිටඩ් | පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පී.එල්.සී. |
| හිමිකාරීත්වය | හිමිකාරීත්වය | හිමිකාරීත්වය | හිමිකාරීත්වය | හිමිකාරීත්වය | හිමිකාරීත්වය | හිමිකාරීත්වය |
| 75% | 100% | 100% | 100% | 100% | 51% | 37.06% |

අපගේ උප සමාගම් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සඳහා අපගේ මංගත වාර්තාව බලන්න.

http://plc2018-19.annualreports.lk/sr.html

# පීපල්ස් ලීසිං ආයතනය පිළිබඳව

පුරාවෘත්තයක් ගොඩනැගීම

GRI 102-7

## විචක්ෂණශීලී වර්ධනය

මෙතෙක් අප ආ ගමන් මග පහත පරිදි වේ. පීපල්ස් ලීසිං ආයතනය 1995 වර්ෂයේ දී පිහිටුවන ලද අතර 2012 දී 2001 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් ලෙස ලියාපදිංචි විය.



| සේවා සැපයුම් නිමැවුම් මධ්‍යස්ථාන | සේවක සංඛ්‍යාව | ප්‍රාග්ධනය | තැන්පතු | උප සමාගම් | නිෂ්පාදන පරාසය |
|---|---|---|---|---|---|

### 1995

| | | | | | |
|---|---|---|---|---|---|
| එක් ශාඛාවක් නුවර නගරයේ පිහිටුවන ලදී | 3 | රු. මිලියන 10 | තැන්පතු ලබා ගැනීම සිදු නොවුණි | නැත | ලීසිං සහ කල්බදු පහසුකම් |

### වර්තමානය - 2019

| | | | | | |
|---|---|---|---|---|---|
| ශාඛා 103ක් පුරා විහිදුණු ශක්තිමත් ජාලයක් | 2,329 | රු. මිලියන 28,603 | රු. බිලියන 88 | උපසමාගම් හයක් සහ එක් ආශ්‍රිත සමාගමක් | ලීසිං<br>ණය<br>ඉස්ලාමීය මූල්‍ය සේවා<br>තැන්පතු<br>ආන්තික වෙළදාම<br>ණය සාධකකරණය |

### අනාගත දැක්ම

| | | | | | |
|---|---|---|---|---|---|
| අනාගත අරමුණු පුහුණුව ගුණාත්මක කිරීම | අයකර ගැනීම් ක්‍රියාවලියි සවිබල ගැන්වීම | නව සේවකයන් සමග අපගේ කණ්ඩායම ශක්තිමත් කිරීම | ඉලක්කගත පුහුණුව තුළින් ණය ගුණාත්මකතාවය ඉහළ නැංවීම | නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාව අඛණ්ඩව පවත්වා ගැනීම | අපගේ පාරිභෝගික අපේක්ෂාවන්ට අනුකූලව අපගේ නිෂ්පාදන සහ සේවා විවිධාංගීකරණය කිරීම |
| කණ්ඩායම් හැඟීම තීව්‍ර කිරීමෙන් සහ අපගේ තරඟකාරී සේවා පරිසරය උත්තේජනය කිරීමෙන් අපගේ අලෙවිකරණ කාර්යය උපායමාර්ගික කිරීම | බහුමාධ්‍ය ඩිජිටල් ක්‍රම සඳහා ආයෝජනය කිරීම | සමාජ මාධ්‍ය තුළ ක්‍රියාත්මක වීම | දක්ෂ හා අභිප්‍රේරිත කණ්ඩායමක් ගොඩ නැගීම | පවතින නව නිමැවුම් හා සේවා තවදුරටත් ශාඛා ජාලය තුළ ව්‍යාප්ත කිරීම | වගකිව යුතු ආයතනික පුරවැසියෙකු වීමට අපගේ කැපවීම අඛණ්ඩව පවත්වාගෙන යාම |

පුරාවෘත්තයක් ගොඩනැගීම

# පීපල්ස් ලීසිං ආයතනය පිළිබඳව

GRI 102-7

## වර්තමානයේ මූල්‍ය ක්ෂේත්‍රය තුළ අපගේ ස්ථානය

මූල්‍ය ක්ෂේත්‍රයේ සහ පීපල්ස් ලීසිං සමාගමේ ප්‍රධාන කාර්ය සාධක දර්ශකවල සාරාංශගත සංසන්දනාත්මක විග්‍රහයක් පහත දැක්වේ.

| දර්ශකය | 2018/19 මූල්‍ය ක්ෂේත්‍රය | 2018/19 පීපල්ස් ලීසිං | 2017/18 මූල්‍ය ක්ෂේත්‍රය | 2017/18 පීපල්ස් ලීසිං |
|---|---|---|---|---|
| **ව්‍යාපාර පරිමාවන් රු. බිලියන** | | | | |
| ණය හා අත්තිකාරම් | **1,137.0** | **151.7** | 1,057.1 | 140.2 |
| ආයෝජන | **109.7** | **15.4** | 118.1 | 13.8 |
| තැන්පතු | **716.8** | **88.4** | 686.7 | 69.8 |
| ණයට ගැනීම් | **463.8** | **48.5** | 396.0 | 55.7 |
| ප්‍රාග්ධනය | **183.7** | **28.6** | 169.7 | 27.0 |
| මුළු වත්කම් | **1,431.3** | **172.5** | 1,355.0 | 160.7 |
| **ලාභදායිත්වය (%)** | | | | |
| වත්කම් මත ප්‍රතිලාභ | **2.7** | **3.9** | 3.2 | 3.7 |
| හිමිකම් මත ප්‍රතිලාභ | **12.1** | **15.9** | 16.1 | 16.7 |
| ශුද්ධ වූ පොළී ආන්තිකය | **7.4** | **9.7** | 7.7 | 8.4 |
| මූලික ප්‍රාග්ධන අනුපාතිකය | **9.9** | **14.4** | 12.4 | 18.4 |
| අවධානම් මත බර තැබූ මුළු ප්‍රාග්ධන අනුපාතය | **11.2** | **15.2** | 13.1 | 16.5 |
| **අරමුදල් ප්‍රභවය (%)** | | | | |
| මුළු තැන්පතු | **52.5** | **53.4** | 54.83 | 45.7 |
| මුළු ණයට ගැනීම් | **34.0** | **29.3** | 31.62 | 36.6 |
| ප්‍රාග්ධන අයිතම | **13.5** | **17.3** | 13.55 | 17.7 |
| **අරමුදල් භාවිතය (%)** | | | | |
| ණය සහ අත්තිකාරම් | **79.4** | **87.9** | 78.0 | 87.2 |
| ආයෝජන | **7.7** | **8.9** | 8.7 | 8.6 |
| අනෙකුත් වත්කම් | **12.9** | **3.2** | 13.3 | 4.2 |
| වත්කම් වර්ධන අනුපාතය | **5.6** | **7.4** | 11.8 | 7.3 |
| ණය සහ අත්තිකාරම් (වසරක වර්ධන වේගය) | **7.6** | **8.2** | 9.8 | 5.2 |
| **වත්කම්වල ගුණාත්මකභාවය (%)** | | | | |
| දළ අක්‍රිය ණය අනුපාතය | **7.7** | **3.9** | 5.9 | 2.7 |
| ශුද්ධ අක්‍රිය ණය අනුපාතය | **2.4** | **0.9** | 1.5 | 0.7 |

*මූලාශ්‍ර 2017 සහ 2018 මහ බැංකු වාර්ෂික වාර්තා ඇසුරිනි (ක්ෂේත්‍ර තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ අදාළ වර්ෂවල දෙසැම්බර් 31 වන දිනටය).

පෙන්වා දී ඇති දත්ත හා දර්ශනවලට අනුකූලව පීපල්ස් ලීසිං ආයතනය ශ්‍රී ලංකාවේ බැංකු නොවන මූල්‍ය ආයතන අතුරින් ඉහළට අපේක්ෂාවක් තබා ගත හැකි ස්ථාවරත්වයක් පෙන්නුම් කරනු ලබයි.

**ව්‍යාපාර පරිමාවන්**

පීපල්ස් ලීසිං ආයතනය මූල්‍ය ක්ෂේත්‍රයේ සමස්ත තැන්පතුවලින් 12.3% ක් ද, ණය සහ අත්තිකාරම් වලින් 13.3 ක් හා මුළු වත්කම්වලින් 12.1% ක් ද අත්පත් කර ගෙන ඇත.

**ලාභදායිත්වය**

පීපල්ස් ලීසිං ආයතනය ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රය තුල සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (ROA) සහ සාමාන්‍ය හිමිකම් මත ප්‍රතිලාභ (ROE) දර්ශකවලට වඩා ඉහලින් ලාභදායිත්වය පවත්වාගෙන යන සහ ඉහල ලාභදායිත්වයක් පෙන්නුම් කරන ආයතනයකි.

**අරමුදල් ප්‍රභවය**

දිගුකාලීන උපාය මාර්ගයක් මත පදනම් වූ කේන්ද්‍රීය ප්‍රවේශයක් මගින් මූල්‍ය ක්ෂේත්‍රයේ 4.4% ක් වූ තැන්පතු වර්ධනයට සාපේක්ෂව ආයතනයේ තැන්පතුවල වාර්ශික වර්ධනය 26.6% කි.

**අරමුදල් භාවිතය**

පොළී ආදායම් උපයන වත්කම් මුලු වත්කම්වලින් 94.8% ක් වන අතර එය අපගේ මූල්‍ය අතරමැදි කාර්යයේ ශක්තිමත් බව පෙන්නුම් කරයි.

**වත්කම්වල ගුණාත්මකභාවය**

පීපල්ස් ලීසිං ආයතනය සතුව ඉහළම ගුණාත්මකභාවයෙන් යුතු 70% ක ප්‍රතිපාදන ආවරණයක් සහිත ණය සහ අත්තිකාරම් කළඹක් පවතී.

# පීපල්ස් ලීසිං ආයතනය පිළිබඳව



## වසරේ වැදගත් තොරතුරු

### මූල්‍ය ප්‍රාග්ධනය

මුළු ස්කන්ධය

**රු. බිලියන 29**

2017/18 – රු. බිලියන 27

වෙළෙඳපොළ කොටස (මුළු වත්කම් අනුව)

**12.05%**

2017/18 – 11.86%

මුළු වත්කම්

**රු. බිලියන 173**

2017/18 – රු. බිලියන 161

ශුද්ධ පොළී ආදායම

**රු. බිලියන 15**

2017/18 – රු. බිලියන 12

බදු පසු ලාභය

**රු. බිලියන 4.42**

2017/18 – රු. බිලියන 4.31

මුළු මෙහෙයුම් ආදායම

**රු. බිලියන 17**

2017/18 – රු. බිලියන 14

### ආයෝජකයන්ගේ ප්‍රාග්ධනය

වෙළෙඳපොළ ප්‍රාග්ධනය

**රු. බිලියන 21**

2017/18 – රු. බිලියන 24

මිල ඉපැයුම් අනුපාතය

**4.79 වරක්**

2017/18 – 5.79 වරක්

කොටසක මිල

**රු. 13.40**

2017/18 – රු. 15.80

ලාභාංශය ගෙවීමේ අනුපාතය

**44.72%**

2017/18 – 45.83%

කොටසක ශුද්ධ වත්කම් වටිනාකම

**රු. 18.10**

2017/18 – රු. 17.11

### බුද්ධිමය ප්‍රාග්ධනය

සන්නාම වටිනාකම

**රු. බිලියන 8.7**

2017/18 – රු. බිලියන 6.5

ණය ශ්‍රේණිගත කිරීම්

ෆීච් රේටින්ස් ලංකා

**AA-(lka)**

ෆීච් රේටින්ස් ඉන්ටර්නැෂනල්

**B-**

**20**

වසර තුළ දිනාගත් සම්මාන සහ ඇගයීම්

පුරාවෘත්තයක් ගොඩනැගීම

# පීපල්ස් ලීසිං ආයතනය පිළිබඳව

## වසරේ වැදගත් තොරතුරු<<

### ගනුදෙනුකරුවන්ගේ ප්‍රාග්ධනය

**8.23%**

ණය කළඹේ වර්ධනය

2018/19 – රු. බිලියන 152,
2017/18 – රු. බිලියන 140

**26.67%**

තැන්පතු පදනමේ වැඩිවීම

2018/19 – රු. බිලියන 88,
2017/18 – රු. බිලියන 70

**248,587**

තැන්පත්කරුවන්

2017/18 – 204,125

**121,129**

ණය සහ අත්තිකාරම් ගනුදෙනුකරුවන්

2017/18 – 116,612

ඉතුරුම් තැන්පතු පදනම

**රු. බිලියන 5**

2017/18 – රු. බිලියන 4

**43%**

ගනුදෙනුකරුවන් නැවත පැමිණීමේ අනුපාතය

2017/18 – 53%

### ව්‍යාපාරික හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය

**14,564**

නව සැපයුම්කරුවන්

**29,320**

ක්‍රියාකාරි සැපයුම්කරුවන්

2017/18 – 27,431

**7**

උපායමාර්ගික බැඳීම්

**6**

ක්ෂේත්‍රයේ විවිධ සංගම්වල සාමාජිකත්ව ප්‍රමාණය

### මානව ප්‍රාග්ධනය

**2,329**

සේවක පිරිස

2017/18 – 2,085

**88.9%**

රඳවා ගැනීමේ අනුපාතය

2017/18 – 88.5%

නැවත රැකියාවට පැමිණීමේ අනුපාතය

**79%**

2017/18 – 76%

**492**

නව බඳවා ගැනීම්

2017/18 – 240

### සමාජීය සහ ස්වාභාවික ප්‍රාග්ධනය

කාබන් පතුල් සටහන ($tCO_2eq$)

**5,695**

2017/18 – 7,011

සමාජ සත්කාර සඳහා ආයෝජනය

**රු. මිලියන 122**

2017/18 – රු. මිලියන 102



පසුගිය වසරේ කළ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වලින් පසු අපි දැන් අනාගතය සඳහා වඩාත් හොඳින් සූදානම්ව සිටිමු.

පුරාවෘත්තයක් ගොඩනැගීම

# අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම

## සභාපතිගේ පණිවිඩය

GRI 102-14

අවසන් වූ මූල්‍ය වර්ෂය පීපල්ස් ලීසිං සමාගම වඩාත් ශක්තිමත් කිරීමට කටයුතුකළ වසරකි. ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අනුගමනය කිරීම, අපගේ නිෂ්පාදන කළඹ නැවත සකස්කිරීම සහ නව පාරිභෝගික කොටස් හඳුනාගැනීම තුළින් අපි දැනටමත් සාර්ථක අනාගතයක් සඳහා අඩිතාලම දමා ඇත.

මෙම වර්ෂය පීඩනයන් යටතේ ප්‍රගතිය ලබා ගැනීම පිළිබඳ කදිම නිදසුනකි. දිගින් දිගටම අභියෝගාත්මක පරිසරයක් තිබියදීත්, සමාගම ශක්තිමත් කාර්‍යසාධනයක් කරා ගමන් කළේය. ව්‍යාපාරයට බලපෑ ආර්ථික, සමාජීය හා පාරිසරික කරුණු අපගේ පාලනයෙන් ඔබ්බෙහි සිදුවූ ඒවා විය. ඒවායේ බලපෑම සැළකිය යුතු මට්ටමක පැවතිණු අතර ඒ තුළින් අපගේ මෙහෙයුම් පරිසරය හැසිරවීමට අපහසු විය. කෙසේවෙතත්, ඉදිරියට යනවිට අපගේ ශක්තිය වූයේ නව්‍යකරණය සඳහා සහ ප්‍රතිචාර දැක්වීම සඳහා අපට ඇති හැකියාවයි.

අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ අපගේ බදු පසු ලාභය පෙර වසරට වඩා 2.48%ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් මිලියන 4,416.12ක් වාර්තාකළ අතර ඒ සඳහා දායකවන ලද්දේ ඉහළ බදු සහ හානිකර පිරිවැයක් තිබියදීත් ශුද්ධ පොළී ආදායමේ වූ සැළකිය යුතු වර්ධනයයි. අලුතින් හඳුන්වා දුන් ණය ආපසු ගෙවීම් බද්ද නිසා සමාගමට අමතර තවත් රුපියල් මිලියන 436.97ක වියදමක් දැරීමට සිදුවිය. එයට අමතරව, ආශ්‍රිත සමාගමේ අප කළ ආයෝජන සඳහා රුපියල් මිලියන 348.79ක හානිකරන පිරිවැයක් දැරීමට සිදුවිය. මෙම අයිතම දෙකම සමාගමේ අයවැයෙහි අන්තර්ගතවී නොතිබුණි. පීපල්ස් ලීසිං සමූහය රුපියල් මිලියන 5,011.27ක බදු පසු ලාභයක් වාර්තාකරන ලදී. අපගේ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය පිළිවෙලින් 3.95%ක් හා 15.88%ක් වූ අතර ඒ අනුව ඒවා බැංකු නොවන මූල්‍ය අංශයේ සාමාන්‍ය අනුපාතිකයන්ට වඩා ඉහළ අගයක් ගනී. පීපල්ස් ලීසිං සහ සමූහයේ වත්කම් පදනම 2019 මාර්තු අවසානය වන විට පිළිවෙලින් රුපියල් මිලියන 172,541.28 සහ රුපියල් මිලියන 185,932.64ක් දක්වා වර්ධනය විය.

අපගේ පාරිභෝගික පදනමේ සහ සාමාන්‍ය ජනතාවගේ වැයකළ හැකි ආදායම සැළකියයුතු ලෙස අඩුවීමට හේතු වූ ආර්ථික පසුබෑම, රුපියලේ අවප්‍රමාණය, දේශපාලන අස්ථාවරත්වය, අඩු ආයෝජන සහ ඉදිකිරීම්, බලශක්ති අර්බුදය සහ අයහපත් කාලගුණය යන මන්දගාමී තත්ත්වයන් යටතේ අප වාර්තාකළ ප්‍රතිඵල පිළිබඳ ඉතා තෘප්තිමත් විය හැක.

ආර්ථික පසුබෑමක් හේතුවෙන් මූලිකවම බලපෑම් එල්ලවනුයේ අපගේ ගනුදෙනුකරුවන්ට වන බැවින් වෙනස්වන සුළු මෙහෙයුම් පරිසරයක් තුළ ක්‍රියාත්මකවීම අපට වඩාත් අභියෝගාත්මකවී ඇත. මෙම තත්ත්වය අපට විසඳීමට අපහසු සංසිද්ධීන් ඇති කරයි. කෙසේවෙතත්, අපි නොපසුබටව කටයුතු කරන ලද අතර අපගේ ප්‍රධාන විධායක නිලධාරීතුමා ඔහුගේ සමාලෝචනයේ සවිස්තරාත්මකව දක්වා ඇති පරිදි, වර්ෂය තුළ අපගේ කාර්‍යයන් පාරිභෝගිකයින්හට ඔවුන්ගේ ව්‍යාපාරික හා ජීවන රටා අරමුණු සපුරාලිය හැකි භාණ්ඩ හා සේවා සැපයීම කෙරෙහි සහ පීපල්ස් ලීසිං තරඟකාරීත්වයෙන් වෙන්කර තබාගැනීම කෙරෙහිත් යොමුවිය.

ඉදිරිය දෙස බලන විට, රටේ ප්‍රමුඛතම බැංකු නොවන මූල්‍ය ආයතනය ලෙස අපගේ ස්ථාවරය පවත්වා ගැනීම සඳහා විවිධාංගීකරණය සහ විශේෂණය කෙරෙහි අපි අවධානය යොමුකර ඇත. අපගේ සියලුම පරිපාලිත සමාගම් හොඳින් ක්‍රියාත්මක වෙමින් හොඳ මූල්‍ය ප්‍රතිඵලයක් ලබාදෙන අතරම, තරඟකාරී පරිසරයක් තුළ කටයුතුකරන අපගේ බංග්ලාදේශයේ මෙහෙයුම්ද වර්ධනය වෙමින් පවතින ආර්ථිකය තුළ ඇති අවස්තාවන් ප්‍රයෝජනයට ගනිමින් ලාභදායිතත්ත්වයක් වාර්තා කිරීමට සමත් විය. මෙහිදීද පාරිභෝගිකයාගේ මූල්‍ය අවශ්‍යතාවන් සපුරාලිය හැකි භාණ්ඩ හා සේවා සැපයීම තුළින් තරඟකාරීත්වය තුළ කැපී පෙනේ. වැඩිවන අවදානම්වලට මුහුණ දීමට සිදුවන නමුත් වැඩිවන අවස්ථාවන් රාශියක්ද සහිත තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයෙන් අපගේ හැකියාවන් පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම තුළින් දිගුකාලීන වර්ධනයක් සඳහා වන අපගේ ආයෝජනය අපි වැඩිදියුණු කරනු ඇත.

යහපාලනය පවත්වා ගැනීම පීපල්ස් ලීසිං සමාගමට සැමවිටම වඩා වැදගත් වූ අතර එය සැමවිටම එලෙසම වනු ඇත. එය සමාගමේ කොටසක් වන අතර මෙම වසර තුළද එහි වෙනසක් නොවීය. තිරසාරභාවය සඳහා සහ නියාමකයින් විසින් පනවා ඇති නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූලවීමට අපි කැපවී සිටියෙමු.

අවසාන වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන අධීක්ෂණ අංශයට ඔවුන්ගේ නොසැලෙන සහයෝගය වෙනුවෙන් මාගේ ගෞරවය හා ස්තුතිය පිරිනමමි. එසේම, සමාගම කෙරෙහි ඇති මගපෙන්වීම සහ කැපවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයටත්, අභියෝගාත්මක කාලසීමාවන්හිදී දුන් නායකත්වය වෙනුවෙන් ප්‍රධාන විධායක නිලධාරි, ඒ.එස්. ඊබ්‍රහිම් මහතාටත්, සමාගමේ ආයතනික වටිනාකම්වලට අනුගතවන අතරම පීපල්ස් ලීසිංහි දැක්ම සහ මෙහෙවර සාක්ෂාත්කර ගැනීම සඳහා දක්වන කැපවීම වෙනුවෙන් ආයතනයේ කළමණාකාරීත්වයට සහ අපගේ සේවක මණ්ඩලයටත් මගේ හදපිරි ස්තුතිය පුද කරමි. වසර ගණනාවක් තිස්සේ ඔවුන්ගේ දායකත්වය, බැංකු නොවන මූල්‍ය අංශයේ අපගේ ප්‍රමුඛ ස්ථානයට, අපගේ දැක්ම සාක්ෂාත්කර ගැනීමට සහ අනාගතයේ බොහෝ දුරක් යාහැකි උරුමයක් ගොඩනැගීමට දායකවී තිබේ. පීපල්ස් ලීසිං සමාගම විශාල වෙළෙඳපොල කොටසකට සේවා සපයන හෙයින්, බැංකු කටයුතුවලට පිවිසීමට අවකාශ නොමැති සහ අවකාශ අඩු ශ්‍රී ලංකිකයන් විධිමත් මූල්‍ය පද්ධතියට ගෙන ඒමත් සහ ඔවුන්ගේ ජීවිත සහ ජීවන තත්ත්වයන් නංවාලීමත් තුළින් මූල්‍ය අන්තර්ග්‍රහණය සඳහා අප දක්වන දායකත්වය පිළිබඳ අපට ආඩම්බර විය හැක.



හේමසිරි ප්‍රනාන්දු
සභාපති

2019 ජුනි 13 වන දින දීය

පීපල්ස් ලීසිං වෙළෙඳපොලෙන් විශාල කොටසකට සේවය කරන හෙයින්, දැනට බැංකු පද්ධතියට සම්බන්ධ නොවූ සහ ප්‍රමාණවත් බැංකු පහසුකම් නොලබන ශ්‍රී ලංකිකයන් විධිමත් මූල්‍ය ක්‍රමයට ගෙන ඒම සහ ජීවිත හා ජීවනෝපායන් නංවාලීම සදහා මූල්‍ය පද්ධතියට ඇතුළත් කරගැනීම සඳහා අපගේ දායකත්වය ගැන අපට ආඩම්බර විය හැකිය.



අනාගතයේ දී විවිධාංගීකරණය සහ
තරඟකාරීත්වයෙන් අපව වෙන්කොට
හඳුනාගැනීම සඳහා සැලසුම් සහිතව
අතීතයේදී ආයතනය ශක්තිමත්
කිරීමට අපි කටයුතු කළෙමු.

පුරාවෘත්තයක් ගොඩනැගීම

# අපගේ මෙහෙවරට අනුකූලව සිටීම

## ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

ක්ෂේත්‍රය තුළ නව හා සාම්ප්‍රදායික තරඟකරුවන්ගේ ක්‍රියාකාරීත්වය හේතු කොටගෙන අප ක්‍රියාත්මක වන වෙළෙඳපොල තුළ තරඟකාරී වාසියක් පවත්වා ගැනීම වඩ වඩාත් අභියෝගාත්මක වෙමින් පවතී. අප බැංකු නොවන මූල්‍ය සමාගම් අංශයේ ප්‍රමුඛතම සමාගමක් වන නමුත්, බැංකු වල සිට මූල්‍ය තාක්ෂණ සමාගම් (Fin Techs) දක්වා වූ විවිධ අභියෝගකරුවන් සමඟ වෙළෙඳපොළ කොටස සඳහා තරඟ කළ යුතුය. මෙම තත්ත්වය තිබියදීත් සහ සභාපතිතුමන් අනාවරණය කළ මන්දගාමී වාතාවරණයක් තුළ වුවද සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ පීපල්ස් ලිසිං සමාගම ප්‍රබල කාර්ය සාධනයක් වාර්තා කිරීමට සමත් වූ අතර මෙම සහයෝගීතාවයේ ජයග්‍රහණය පිළිබඳ මම මෙසේ ඉදිරිපත් කරමි.

### අනාගතය අද හැඩගැසීම

පසුගිය වසරේ මාගේ සමාලෝචනයේ දී මා සඳහන් කළේ අපගේ මෙහෙයුම් පරිසරයේ සිඳුවන මින්පෙර අත්නොදුටු වෙනස්වීම් හේතුකොට ගෙන අනාගතය පිළිබඳ අපගේ දැක්ම අද දින හැඩගස්වන බවයි. මෙය සත්‍යයක් ලෙස පවතින අතර, අනාගතයේ ඇති අභියෝග කලින් හඳුනා ගැනීමටත් ඒවාට මුහුණ දීමටත් අද දින අප උත්සාහ කළ යුතුය. එසේ සිදු කිරීමට අප හෙට දින වනතෙක් බලා සිටියහොත් එය ප්‍රමාද වැඩි විය හැක. අවදානම් කළමනාකරණය, ණය අයකර ගැනීම්, මෙහෙයුම් සහ අලෙවිකරණය යන ප්‍රධාන අංශ හතර විධිමත් කිරීම සඳහා ප්‍රතිව්‍යුහගත කිරීම ක්‍රියාත්මක කිරීමත් සමඟ කෙටි කාලීනව අපගේ අවධානය යොමු කරන ලද්දේ සමාගම ශක්තිමත් කිරීමට වන අතර මධ්‍යම හා දිගුකාලයේදී විවිධාංගීකරණය සහ තරඟකාරීත්වයෙන් අපව වෙන්කොට හඳුනාගැනීම කෙරෙහිය. පීපල්ස් ලීසිං සමාගම තුළ අපගේ අතීත වර්ධනය ආක්‍රමණශීලී වූ අතර අපගේ ආන්තිකයන් පීඩනයකට ලක්ව පැවතින. සමාගම ශක්තිමත් කිරීම පදනම් කරගත් මෙම වර්ෂය තුළ අප අවධානය යොමු කරන ලද්දේ රිද්මානුකූල වර්ධනයක් කෙරෙහිය.

අපගේ සේවාවන් වෙනස් කොට හඳුනා ගැනීම සඳහා, අපගේ ගනුදෙනුකරුවන්ගේ සැබෑ අවශ්‍යතා කෙරෙහිද අපි අවධානය යොමු කළෙමු. වෙළෙඳපොළ ඉදිරිපත් කරන දේ තුළින් පමණක් තවදුරටත් ඔවුන් සෑහීමකට පත් කළ නොහැක. ඉහළ තාක්ෂණික දැනුමක් සහිත අපගේ ගනුදෙනුකරුවන් ඇමසන් සහ ඊබේ සිට එයාර් බී ඇන්ඩ් බී සහ රිපල් දක්වා වූ දැවැන්ත සමාගම් සහ දක්ෂ නව නිෂ්පාදකයින් ඇතුළත් වූ ගෝලීය වෙළෙඳපොළක ආභාෂය ලත් පාරිභෝගිකයින් වේ. අපගේ ගනුදෙනුකරුවන් දැන් ඔවුන්ගේ දේශීය සේවා සපයන්නන්ගෙන් වඩාත් කඩිසර සේවාවක් සහ ඔවුන්ගේ අවශ්‍යතාවන් කෙරෙහි සැලකිලිමත් වීම අපේක්ෂා කරන අතර ඔවුන්ට අප අවශ්‍ය මොහොතේ එතැන සිටීම බලාපොරොත්තු වේ. මෙම අවශ්‍යතාව සපුරාලීම සඳහා අපට විශේෂීකරණය සහ තරඟකාරීත්වයෙන් අපව වෙන්කොට හඳුනාගැනීම විශාල ඉදිරි පියවරක් විය.

### කැප වූ පාරිභෝගික සේවය කෙරෙහි අවධානය යොමු කිරීම

ගනුදෙනුකරුවන් පිළිබද අපගේ ගැඹුරු අවබෝධය භාවිතා කරමින් අප මෙය ආරම්භ කලේ ආර්ථික ජීවන චක්‍රය කෙරෙහි අවධානය යොමු කරමිනි. එහිදී ගනුදෙනුකරුගේ ජීවන ගමන තුළ විවිධ වූ ව්‍යාපාරික සහ ජීවන රටාවේ සන්ධිස්ථාන අපි සැලකිල්ලට ගත්තෙමු. නිදසුනක් වශයන්, අපි ළමුන්ද ඇතුළුව ගනුදෙනුකරුවන් සඳහා නව තැන්පතු ක්‍රම හඳුන්වා දුන් අතර එමගින් ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ජීවිතයේ නිශ්චිත සිදුවීමක් සඳහා ඉලක්කගත මුදලක් ඉතිරි කරගත හැකිය. ගනුදෙනුකරුවන්ට අඩු පොලී අනුපාතවල ප්‍රතිලාභ භුක්ති විඳීමට සහ විවිධ වූ ආපසු ගෙවීමේ හැකියාවන් සඳහා දොර විවර කළ පුද්ගලයින්ට සහ ව්‍යාපාර සඳහා අප විසින් හඳුන්වා දුන් විචල්‍ය අනුපාත ණය සහ කල්බදු පහසුකම විශාල සාර්ථකත්වයක් පෙන්නුම් කරයි. හදිසි මූල්‍ය ගැටළු සහිත ගනුදෙනුකරුවන්ට ඉක්මන් සහනයක් ලබා දීම සඳහා පසුගිය වසරේදී දියත් කළ අපගේ රන් ණය සේවාව ශාඛා පහක් හරහා ක්‍රියාත්මක කෙරිනි. නුදුරු අනාගතයේදී අපි මෙම සේවාව තවත් ශාඛා 40 ක් හරහා ව්‍යාප්ත කරන්නෙමු. මෙම සේවාවන් සහ ඉදිරියේ හඳුන්වා දීමට අපේක්ෂා කරන මූල්‍ය සේවාවන් පාරිභෝගික අවශ්‍යතා සදහා විසදුම් ලබා දීමට අපට සහය වීමට නිර්මාණය කර ඇත.

ගනුදෙනුකරුවන්ට අප වෙත ලඟා විය හැකි මාර්ගයන් වැඩි දියුණු කිරීමට අපි අඛණ්ඩ ව කටයුතු කරන අතර ඒ භෞතික ගොඩනැගිලි මත පදනම් වූ ශාඛා ජාලය තුළින් පමණක් නොව අපගේ වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ජාලය හරහා අතථ්‍ය මධ්‍යස්ථාන තුළිනි. ගනුදෙනුකරුවන්ගේ අදහස් සහ යෝජනාවන්ට ප්‍රතිචාර දක්වමින් උපාය මාර්ගික ස්ථානවල ඇති අපගේ සේවා මධ්‍යස්ථානයන් පරිපූර්ණ ශෘඛාවන් දක්වා ඉහළ නැංවීමටත් අපි අඛණ්ව කටයුතු කරන්නෙමු.

අපගේ නිෂ්පාදනයන් සහ ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තිය විවිධාංගීකරණයෙන් ඔබ්බට ගොස් බංග්ලාදේශයේ අපගේ ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීමේදී වූ අපේක්ෂාවන් ඉටුවන බව වාර්තා කිරීමට ලැබීම සතුටට කරුණකි. එම වෙළෙදපොළේ දැඩි තරඟකාරීත්වයක් තිබියදීත් අප ලාභ අලාභ තුලිත කර ගැනීමට සමත් වූ අතර අපගේ නිෂ්පාදන, විශේෂයෙන් කල්බදු, කාලීන ණය සහ කාරක ප්‍රාග්ධන ණය වැනි නිෂ්පාදන අපව අනෙකුත් තරඟකරුවන්ගෙන් වෙන් කර හඳුනාගැනීමට හේතු විය.

**මෙහෙයුම් කාර්යක්ෂමතාව ළඟා කර ගැනීමට අප දරණ උත්සාහයේදී නවෝත්පාදනය කෙරෙහි අඛණ්ඩව ප්‍රධාන වශයෙන් අවධානය යොමු වනු අත. එසේම අපගේ වටිනාකම් ප්‍රස්තුතය වර්ධනය කිරීමට සහ අපේක්ෂාවන් ඉක්මවා යෑමට අප දරණ උත්සාහයන් තුළ පාරිභෝගික පහසුව සහ සේවාව ඉහළ නැංවීම කේන්ද්‍රීය වේ.**

# අපගේ මෙහෙවරට අනුකූලව සිටීම

## ආයතනික සේවා විශිෂ්ටත්වය ළඟා කර ගැනීම

සමාගමේ කටයුතු ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතරම, වැඩි මෙහෙයුම් කාර්යක්ෂමතාවයක්, විධිමත් ක්‍රියාවලියක් සහ වත්කම්වල ගුණාත්මකභාවය වැඩි කිරීම කෙරෙහි අපගේ අවධානය යොමු කළෙමු. සාර්ථකත්වය කරා අප යන ගමනේදී අවශ්‍ය සන්ධිස්ථාන කරා ළඟාවීමට හිතකර පරිසරයක අපගේ සේවකයින් වැඩ කරන බව සහතික කිරීම සඳහා අපි නවතම පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ මෙවලම්වල ආයෝජනය කර ඇති අතර පාරිභෝගික පහසුව වැඩි දියුණු කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා නව තාක්ෂණය පිළිබඳ ගවේෂණය කිරීම අඛණ්ඩව සිදු කරන්නෙමු.

විවිධාංගීකරණය යන්නට පෙර සැලකිල්ලට නොගත් පාරිභෝගික කොටස් පිළිබඳ ගවේෂණය කිරීමද ඇතුළත්ය. මෙම වෙළෙඳපොළ අත්පත් කර ගැනීම යනු නව පාරිභෝගික අවශ්‍යතාවන් අවබෝධ කර ගැනීම සහ ඒවා සපුරාලීමට හැකි වීම වන අතර එය අපගේ සේවකයින්ගේ අත්දැකීම්, කුසලතා සහ කැපවීම මත බෙහෙවින් රඳා පවතී. අප සමාගම ප්‍රතිව්‍යුහගතකරණය මගින් මෙම නව කොටස් වෙත ළඟා වීමට අවශ්‍ය ප්‍රවීණතාව පිළිබඳ පැහැදිලි සැලැස්මක් අපට ලබා දී ඇත. අපගේ සේවකයින් අවශ්‍ය දැනුම සහ කුසලතාවලින් සන්නද්ධ බව තහවුරු කිරීම සදහා පුහුණුව හා සංවර්ධනය දැනටමත් සිදු වෙමින් පවතී. නව තනතුරු සඳහා සමාගම තුළින්ම බඳවා ගනු ඇති අතර නව ප්‍රවීණතාවන් අවශ්‍ය අවස්ථාවන්හිදී අපි බාහිරින් බඳවා ගන්නෙමු.

අපගේ සේවකයින්ගේ කැපවීම හේතුකොටගෙන අපගේ ගමනාන්තයට ළඟා වීම සඳහා හිත් සහ අදහස් වෙනස් කිරීම පහසු වී ඇත. ඔවුන්ගේ ආකල්ප සහ සේවයේ ගුණාත්මකභාවය බැංකු නොවන මූල්‍ය අංශයේ ප්‍රමුඛයෙකු ලෙස අපගේ ස්ථානය තහවුරු කර ඇති තවත් විශේෂ සාධකයකි.

## තිරසාර තරඟකාරී වාසියක් පවත්වා ගැනීම

තරඟකාරී වාසියක් අත්පත් කර ගැනීම සඳහා අපගේ සියලු උත්සාහයන් වගකිවයුතු භාරකාරත්වය විසින් ශක්තිමත් කර ඇත. යහපාලනය සහ ශක්තිමත් අවදානම් කළමනාකරණ භාවිතයන් අපගේ කාර්යයන් හීදී ප්‍රමුඛ වන අතර අප ක්‍රියාත්මක වන ක්ෂේත්‍රයට මෙය ඉතා අත්‍යවශ්‍ය සාධක වේ. මේ හේතුව නිසා ඒවා අප ඉතා බැරෑරුම් ලෙස සලකන ව්‍යාපාර අංගයන් වේ.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා අපට ලැබී ඇති පිළිගැනීම අපගේ මෙහෙයුම් වල සාර්ථකත්වය සහ තිරසාරභාවය, අපගේ සන්නාමේ ශක්තිමත්භාවය සහ නවෝත්පාදනයන් සඳහා වූ අපගේ කැපවීම පිළිබඳ සාක්ෂියකි. තවත් බොහෝ දේ අතර, බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. වෙතින් බැංකු නොවන මූල්‍ය සේවා සන්නාම අතර අංක එකේ ස්ථානය දිනාගැනීමටත්, හය වන වරටත් දිවයිනේ හොඳම ආයතනික පුරවැසියන් දස දෙනා අතර සිටීමට හැකිවීමත්, බිස්නස් ටුඩේ හි හොඳම ලැයිස්තුගත සමාගම් 30 අතර 13 වන ස්ථානයට පත් වීමත්, ශ්‍රී ලංකාවේ දකුණු ආසියාතික ඉස්ලාමීය මූල්‍ය සංසදය වෙතින් වසරේ හොඳම ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතිය සඳහා රන් සම්මානයද, ශ්‍රී ලංකා ඉස්ලාමීය බැංකුකරණ හා මූල්‍ය ක්ෂේත්‍රයේ 2018 සම්මාන උළලේ දී වසරේ ඉස්ලාමීය කල්බදු සමාගම සඳහා වන රිදී සම්මානය සහ අපගේ 2017/18 වාර්ෂික වාර්තාවට දේශීය සහ අන්තර්ජාතික වශයෙන් හිමි වූ ඇගයීම් ද ඇතුළත්ය.

අපගේ ව්‍යාපාරය පවත්වාගෙන යන ක්‍රමයෙන් ඔබ්බට ගනුදෙනුකරුවන්ගේ ප්‍රජාවේ සහ පරිසරයේ යහපත උදෙසා තිරසාර වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කළෙමු. ඒවා ව්‍යවසායකත්ව සංවර්ධනය, මුල් ළමාවිය/අධ්‍යාපන සංවර්ධනය, මාර්ග ආරක්ෂාව, ප්‍රාදේශීය ප්‍රජාවන් සවිබල ගැන්වීම සහ පරිසරය සංරක්ෂණය යන අංශ වටා කේන්ද්‍රගත වී ඇත. මෙම ආයතනික සමාජ වගකීම් මුල පිරීම් සඳහා වූ අපගේ කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස ස්වේච්ඡා පැය 6,693 කට වැඩි දායකත්වයක් ලබා දුන් අපගේ සේවකයින්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ඇතිව වර්ෂය තුළ දිවයින පුරා වැඩසටහන් 155ක් හරහා රුපියල් මිලියන 122.23ක් ආයෝජනය කළෙමු.

**අපගේ සියලු පාර්ශ්වකරුවන් කණ්ඩායම්වලට වටිනාකම ලබා දීමෙන්, ආර්ථිකය, සමාජය සහ පරිසරය කෙරෙහි අපගේ බලපෑම ධනාත්මකව පවතින බව සහතික වන අතර එමගින් ආර්ථික වශයෙන් ශක්‍ය, සමාජීය වශයෙන් වගකිව හැකි සහ පාරිසරික වශයෙන් වගකිව හැකි තිරසාර ආයතනයක් බවට පත් කරයි.**

# අපගේ මෙහෙවරට අනුකූලව සිටීම

## උරුමය පවත්වාගෙන යාම

සමස්ත මූල්‍ය අංශයටම බලපෑම් ඇති කළ දුෂ්කරතා මධ්‍යයේ වුවද, පීපල්ස් ලීසිං සමාගම මෙතෙක් වාර්තා කළ ඉහළම බදු පසු ලාභය වන රුපියල් මිලියන 4,416.12ක් වාර්තා කිරීමට සමත් වූ අතර එය 2017/18 වසරට සාපේක්ෂව 2.48% ක වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම ලාභය වාර්තා කරන ලද්දේ ඉහළ ගිය ණය හානිකරණ පිරිවැය සහ අයවැයෙහි අන්තර්ගත නොවූ රුපියල් මිලියන 436.97ක් වූ අලුතින් පනවන ලද ණය ආපසු ගෙවීමේ බද්ද යන තත්ත්වයන් ඇති වූ පසුබිමකය. ණය සහ අත්තිකාරම් පෙර වසරට සාපේක්ෂව 8.23%කින් වර්ධනය වූ අතර තැන්පතු 26.67%කින් වර්ධනය විය. ශුද්ධ පොළී ආන්තිකය පෙර වසරේ පැවති 8.38% ප්‍රතිශතයේ සිට 9.70%ක ප්‍රතිශතයක් දක්වා වර්ධනය විය. මෙය හේතු කොටගෙන අපගේ ශුද්ධ පොළී ආදායම 24.46%ක වර්ධනයක් සමගින් රුපියල් මිලියන 15,190.20 ක් වූ අතර එය මුළු මෙහෙයුම් වියදමින් 88.89% ප්‍රතිශතයකි. ආදායමේ වර්ධනයත් සමගින් මෙහෙයුම් වියදම් සැලකිලිමත් ලෙස කළමනාකරණය කිරීම තුළින් ආදායමට පිරිවැය අනුපාතය 39.73% සිට 37.81% දක්වා සැලකිය යුතු ලෙස පහළ ගියේය.

අපගේ අක්‍රීය ණය අනුපාතය 7.7%ක් වූ බැංකු නොවන මූල්‍ය අංශයේ සාමාන්‍ය අනුපාතයට වඩා බෙහෙවින් අඩු මට්ටමක පවතින නමුත් සමස්ත ආර්ථිකයේ පැවති මන්දගාමී තත්ත්වය සමාගමේ දළ අක්‍රීය ණය අනුපාතය 3.91% දක්වා වැඩි වීමට හේතු විය. එසේම මෙම තත්ත්වය හේතුවෙන් වර්ෂය සඳහා ණය හානිකරණ පිරිවැය පෙර වසරේ රුපියල් මිලියන 1,429.97 සිට රුපියල් මිලියන 1,954.88ක් දක්වා ඉහළ ගියේය. මෙම හානිකරණ පිරිවැය තුළ විචක්ෂණශීලි පියවරක් ලෙස සමාගමේ ආශ්‍රිත සමාගමක් වන පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී හි සිදු කළ ආයෝජන වෙනුවෙන් කරන ලද රුපියල් මිලියන 348.79 ක වෙන් කිරීමද ඇතුළත් වේ.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය 3.95% ක් දක්වා ඉහළ ගිය අතර පෙර වසරේ 3.71% ක් විය. කෙසේ වෙතත්, සාමාන්‍ය හිමිකමේ වර්ධනය බදු පසු ලාභයේ වර්ධනයට වඩා වැඩි වීම හේතු කොටගෙන අපගේ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය 15.88% ක් දක්වා පසුගිය වසරට සාපේක්ෂව සුළු වශයෙන් අඩු වූ නමුත් එය බැංකු නොවන මූල්‍ය අංශයේ සාමාන්‍ය වූ 12.1% ට වඩා ඉහළ අගයක් ගත්තේය. අපගේ තැන්පතු පදනම රුපියල් බිලියන 88.37 ක් දක්වා සැලකිය යුතු වර්ධනයක් වී ඇති අතර අපගේ ඉතුරුම් පදනම රුපියල් බිලියන 5 ක සීමාව ඉක්මවා ඇත. ශක්තිමත් ස්ථාවරත්වයක් සහ අනාගත ව්‍යාපාර ව්‍යාප්තිය සඳහා ප්‍රමාණවත් බවක් පිළිබිඹු කරමින් පිපල්ස් ලීසිං ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතිකයන් වන පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය සහ සමස්ත ප්‍රාග්ධන අනුපාතය පිළිවෙළින් 14.36% සහ 15.20% ලෙස පවත්වා ගැනීමට සමත් වූ අතර එය නියාමන අවම අවශ්‍යතා වන පිළිවෙළින් 6% හා 10% වඩා ඉහළින් පැවතින. මූල්‍ය වර්ෂය අවසානයේ පීපල්ස් ලීසිං සමාගම සහ සමූහය පිළිවෙලින් රුපියල් බිලියන 172.54ක් සහ රුපියල් බිලියන 185.93ක් වන ශක්තිමත් වත්කම් පදනමකට හිමිකම් කියන ලදී.

## අනාගත අභිලාෂයන්

අප අනාගතයට මුහුණ දීමට සුදුසු බව තහවුරු කිරීම සඳහා ව්‍යාපාර කටයුතු සැලකිය යුතු ලෙස වැඩි දියුණු කළ හැකි සහ අපගේ සේවකයින්ට ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් ඉක්මවා යාමට හැකියාව ලබා දිය හැකි මෙහෙයුම් ක්‍රියාවලි ස්වයංක‍්‍රීත කිරීම සහ ඩිජිටල්කරණය යන අංශ පිළිබඳව අඛණ්ඩව ගවේෂණය කරනු ලැබේ. වෙළෙඳපොළ තුළ අපගේ ප්‍රමුඛ ස්ථානය පවත්වා ගැනීම සඳහා, තෝරා ගත් සැපයුම්කරුවන් සමග නව උපායමාර්ග බැඳීම් ඇති කර ගැනීම හා වාහන අලෙවිකරුවන් හා සම්බන්ධ වීම තුළින් ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ ඇති සම්බන්ධතාව වර්ධනය කර ගැනීමටත්, ප්‍රධාන ස්ථානයන්හි නව ශාඛා විවෘත කිරීම සහ පවතින නිෂ්පාදන නව වෙළෙඳපොළ තුළ ව්‍යාප්ත කිරීමටත්, අපි බලාපොරොත්තු වෙමු. එසේම අපගේ දක්ෂ, නියැලුණු සහ අභිප්‍රේරිත සේවක මණ්ඩලය ශක්තිමත් කිරීම කෙරෙහිද අඛණ්ඩව අවධානය යොමු කරනු ඇත. හිමිකම ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතරම ප්‍රශස්ත අරමුදල් මිශ්‍රණයක් පවත්වා ගැනීම කෙරෙහිද අපි අවධානය යොමු කරන්නෙමු.

## මිල කළ නොහැකි දායකත්වය අගය කිරීම

සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ මඟ පෙන්වීම වෙනුවෙනුත්, අප කෙරෙහි ඇති පක්ෂපාතිත්වය සහ විශ්වාසය වෙනුවෙන් අපගේ ගනුදෙනුකරුවන්ටත්, ඔවුන්ගේ දායකත්වය වෙනුවෙන් අපගේ සැපයුම්කරුවන්ටත්, අප පිළිබඳ ඇති අඛණ්ඩ අවබෝධය වෙනුවෙන් ආයෝජකයින්ට සහ උපායමාර්ගික හවුල්කරුවන්ටත් සහ ඔවුන්ගේ සහාය සහ නියාමන මඟ පෙන්වීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අංශයේ නිලධාරීන්ටත් මගේ අවංක ස්තුතිය පුද කර සිටිමි.

අපගේ මෙහෙවරට අනුකූලව සිටීම යනු අප ඉදිරියට යන විට අපගේ අනාගත පරපුර සඳහා උරුමයක් ගොඩනගමින් වෙනස්වන පරිසරයට ශක්තිමත්ව හා ධෛර්‍යයෙන් යුතුව හැඩගැසීමයි.



**ඒ. එස්. ඊබ්‍රහිම්**
ප්‍රධාන විධායක නිලධාරී

2019 ජූනි 13 වන දින දීය

# 2

# ഒരു ജലാശയങ്ങൾ
# [illegible]

26
අධ්‍යක්ෂ මණ්ඩලය

30
ආයතනික කළමනාකරණය

32
කළමනාකරණ මණ්ඩලය

35
අනුකූලතා කළමනාකරණය

37
ආයතනික පාලනය

54
සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව


4
5
6
7
8
9
2
1
3



වගකිවයුතු භාරකරුවන් වීම

# අධ්‍යක්ෂ මණ්ඩලය

GRI 102-22

## 1

**හේමසිරි ප්‍රනාන්දු මහතා**

සභාපති/විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂක

ප්‍රනාන්දු මහතා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයකු හා සභාපති වශයෙන් 2015 අප්‍රේල් මස 8 වන දින පත් කරන ලදී.

සුදුසුකම්

කොළඹ සරසවියෙන් ආර්ථික විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ඇති අතර, එක්සත් රාජධානියේ සංචාරක ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද උසුලයි. (A INST TT) තවද, බ්‍රිතාන්‍ය කළමනාකරණ ආයතනයේ අධි සාමාජිකත්වය ද උසුලයි. (FBIM)

වර්තමානයේ දරන තනතුරු

ඔහු පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් සමාගමේ මෙන්ම පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් සහ පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී. යන සමාගම්වලද සභාපති ධුරය හොබවයි. එමෙන්ම මහජන බැංකුව පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සහ ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස කටයුතු කරයි. තවද කිරිකිස්ථාන් ජනරජයේ ශ්‍රී ලංකා ගරු කොන්සාල්වරයා වශයෙන් සේවයේ නිරත වේ.

කලින් දැරූ තනතුරු

මෙතුමන් විසින් ශ්‍රී ලංකා ජනරජයේ ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් හොබවනු ලැබීය. 1994 දී අග්‍රාමාත්‍ය ලේකම්වරයා වශයෙන් රාජ්‍ය සේවයට එක් වූ ඒ මහතා ශ්‍රී ලංකා ටෙලිකොම්, ගුවන් තොටුපල හා සිවිල් ගුවන් සේවා අධිකාරිය සහ ස්වාධීන රූපවාහිනිය වැනි රාජ්‍ය ආයතන කිහිපයක සභාපති වශයෙන් ක්‍රියා කරමින් විශිෂ්ට සේවාවක් ඉටු කළේය. තවද හෙතෙම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සභාපතිවරයා වශයෙන් සහ ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයා වශයෙන්ද කටයුතු කළේය.

ප්‍රනාන්දු මහතා ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුවෙහි සභාපති ධුරය හෙබවූ අතර, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා සම්මේලනයේ සහ ආසියානු ඔලිම්පික් කවුන්සලයේ උප සභාපතිවරයා වශයෙන් නිලයන් ද්විත්වයක් හොබවන ලදී. එමෙන්ම, ඒ මහතා නාවික හමුදා ස්වේච්ඡා බලකායේ කමාන්ඩර් තනතුරේ කටයුතු කර ඇත.

## 2

**මයිකල් ප්‍රදීප් අමීර්තනායගම් මහතා**

නියෝජ්‍ය සභාපත/විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ/ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ

අමීර්තනායගම් මහතා විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂක, නියෝජ්‍ය සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ, ස්වාධීන අධ්‍යක්ෂවරයා වශයෙන් 2015 අප්‍රේල් 08 වන දින පත්කරන ලදී.

සුදුසුකම්

එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ අධිසාමාජිකත්වයද ලන්ඩනයේ ට්‍රිනිටි විදුහලේ කථන හා නාට්‍ය (ATCL SP/ Dr) ආශ්‍රිත සාමාජිකත්වයද ලබා ඇත.

වර්තමානයේ දරණ තනතුරු

අමීර්තනායගම් මහතා ගරු අග්‍රාමාත්‍යතුමාගේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි තනතුර හොබවන අතර, ප්‍රමුඛතම වෙළඳ ප්‍රචාරණ ආයතනයක් වන හෝල්ට්ස් පොලාර්ඩ් ඇන්ඩ් ස්ටොට් ආයතනයේ සභාපති හා කළමනාකරණ අධ්‍යක්ෂකද වේ. එසේම ඒ මහතා ලාදුරු රෝගයෙන් පීඩා විඳින ජනතාව නගාසිටුවීම හා පුනරුත්ථාපනය සඳහා වන සංගමයේ (SUROL) උප සභාපතිත්වය දරන අතර, අනුර බණ්ඩාරනායක පදනමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන්ද කටයුතු කරයි.

## 3

**ජෙහාන් ප්‍රසන්න අමරතුංග මහතා**

විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ

අමරතුංග මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක හා ස්වාධීන නොවන අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් 2015 අප්‍රේල් මස 08 වන දින පත්කරන ලදී.

සුදුසුකම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හා එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ (CIMA UK) අධි සාමාජිකත්වය ලබා ඇත.

වර්තමානයේ දරණ තනතුර

අමරතුංග මහතා MTD වෝකර්ස් පී.එල්.සී. හි නියෝජ්‍ය සභාපතිත්වය දරණ අතර, පීපල්ස් ඉන්ෂුවරන්ස් සභාපතිත්වයත් පීපල්ස් මයික්‍රෝ කොමර්ස් LTD, JAT හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය, බංගලාදේශයේ ලන්කන් එලායන්ස් ෆයිනෑන්ස් ලිමිටඩ් හා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කරයි.

කලින් දැරූ තනතුරු

අමරතුංග මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හා කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාවන්හි සාමාජිකයකු ලෙස කටයුතු කර ඇත.

සුවිශේෂ ජයග්‍රහණ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ අවසන් අදියරෙහි කුසලතා ත්‍යාගලාභීන් අතර, පිළිවෙලින් ප්‍රථමයා බවට පත්වීමට සමත් විය. එසේම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ ජාතික සමුලුවේදී "Value for Money Accounting" නමින් පර්යේෂණ ලිපියක් ඉදිරිපත් කරන ලදී.

## 4

**මොහොමඩ් අනීස් මොහොමඩ් රිස්වාන් මහතා**

විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂක

රිස්වාන් මහතා විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂකවරයකු වශයෙන් 2015 අප්‍රේල් මස 08 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

සුදුසුකම්

එක්සත් රාජධානියේ වේල්ස් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති රිස්වාන් මහතා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාධාරියකුද වේ. එසේම ඔහු එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ (CIMA UK) සාමාජිකයකු වන අතර, ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ සහතික ලත් සාමාජිකයකුද වේ.

වර්තමානයේ දරන තනතුරු

රිස්වාන් මහතා LIMRA හෝල්ඩින්ග්ස් ආයතනයේ ප්‍රධාන නිළධාරි – ක්‍රමෝපාය, අලෙවිකරණ සන්නිවේදනය හා නව ව්‍යාපාර අවස්ථා වශයෙන් කටයුතු කරන අතර, ඇමරිකා එක්සත් ජනපදයේ නෝර්ත්වුඩ් විශ්වවිද්‍යාලය හා බටහිර ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවන් විසින් පිරිනමන පශ්චාත් උපාධි සහ උපාධි වැඩසටහන්වල අලෙවිකරණය, ක්‍රමෝපාය සැලසුම්කරණය නව ව්‍යාපාරික අවස්ථා, ව්‍යාපාර ආචාරධර්ම සහ පාරිභෝගික හැසිරීම යන විෂයන් සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර කථිකාචාර්යවරයකු වශයෙන් හා පරීක්ෂකවරයෙකු වශයෙන් කටයුතු කරයි. එමෙන්ම බටහිර ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ නිබන්ධන අධ්‍යක්ෂවරයකු වශයෙන් ද කටයුතු කරයි.

කලින් දැරූ තනතුරු

රිස්වාන් මහතා විවිධ ක්ෂේත්‍රවල ලැයිස්තුගත පොදු සමාගම්වල සමූහයේ අලෙවිකරණ උප සභාපති, සමූහයේ අලෙවිකරණ ප්‍රධානී, ව්‍යාපාර ප්‍රවර්ධන ප්‍රධානි හා ආයතනික සන්නිවේදනය යන ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් හොබවා ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලය



## 5

**ජොන්සන් ඇන්තනි ප්‍රනාන්දු මහතා**

විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂක

විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් 2015 අප්‍රේල් 08 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කළ ප්‍රනාන්දු මහතා වර්තමානයේ විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

වර්තමානයේ දරණ තනතුරු

වර්තමානයේ, ප්‍රනාන්දු මහතා ෂෝර් ටු ෂෝර් (ප්‍රයිවට්) ලිමිටඩ්, එක්ස්පෝ ප්‍රොපර්ටි ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, එක්ස්පෝ ඉන්ඩස්ට්‍රියල් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්, එක්ස්පෝ ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, එක්ස්පෝ කාර්ගෝ ලින්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, එක්ස්පෝ ට්‍රේඩ් ලින්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ලන්කන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් (බංගලාදේශය) යන ආයතනයන්හි අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටුයතු කරන අතර XVI බෙනඩික් උසස් අධ්‍යාපනය පිළිබඳ කතෝලික ආයතනයේ හා කොළඹ කතෝලික මුද්‍රණාලයේ උපදේශක මණ්ඩලවල සාමාජිකයකු වශයෙන් කටුයතු කරයි. එමෙන්ම ඔහු කොළඹ ජාතික රෝහලේ කමිටු සාමාජිකයකු වශයෙනුත් ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික වාණිජ මණ්ඩලයේ උපසභාපති වශයෙනුත් කටයුතු කරයි.

කලින් දැරූ තනතුරු

ඇඟලුම්, ආහාර, ඇසුරුම්, මුද්‍රණය, වාණිජ මුද්‍රණය, සැපයුම් කළමනාකරණය, ඉංජිනේරු සහ ඉදිකිරීම් යනාදි විවිධ වූ ක්ෂේත්‍ර ඇතුළත් වන එක්ස්පෝ ඉන්ඩස්ට්‍රියල් සමූහය තුළ ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් හොබවා ඇති අතර, ශ්‍රී ලංකා මුද්‍රණකරුවන්ගේ සංගමයේ සභාපති වශයෙනුත් ශ්‍රී ලංකා – චීන ව්‍යාපාරික සභා සහයෝගිතාවේ උපසභාපති වශයෙනුත් කටයුතු කර ඇත.

## 6

**රසිත ගුණවර්ධන මහතා**

විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂක

රසිත ගුණවර්ධන මහතා විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂකවරයකු වශයෙන් 2016 අගෝස්තු 29 වන දින අධ්‍යක්ෂක මණ්ඩලයට පත් කරන ලදී.

සුදුසුකම්

එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු වේ.

වර්තමානයේ දරණ තනතුරු

ගුණවර්ධන මහතා දැනට මහජන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි ලෙස කටයුතු කරන අතර, පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් හා ලන්කන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් (බංග්ලාදේශය) යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරයි.

කලින් දැරූ තනතුරු

ගුණවර්ධන මහතා මහජන බැංකුවේ මූල්‍ය, කාර්යසාධන කළමනාකරණය, ආයතනික හා වාණිජ ණය, භාණ්ඩාගාර මෙහෙයුම්, ණය පාලන සහ අවධානම් කළමනාකරණය යන අංශයන්හි විවිධ තනතුරු රැසක් හොබවා ඇත. එසේම, ඔහු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-අවදානම් කළමනාකරණය සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ව්‍යාපාරික බැංකුකරණ යන තනතුරුද හොබවා ඇත. මහජන බැංකුව සමඟ සම්බන්ධවීමට පෙර ගුණවර්ධන මහතා පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ සංචාරක, වැවිලි කර්මාන්ත හා ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි තනතුරු රැසක් හොබවා ඇත.

## 7

**එන්.ඩබ්ලිව්.ඒ.එම්.යූ.කේ.කේ.ඊ. වීරසිංහ**

විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂක

වීරසිංහ මහතා විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂකවරයකු ලෙස 2018 ඔක්තෝබර් 09 වන දින අධ්‍යක්ෂක මණ්ඩලයට පත්කරන ලදී.

සුදුසුකම්

මොරටුව විශ්වවිද්‍යාලයෙන් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව සම්බන්ධයෙන් ඩිප්ලෝමාවක් ලබා ඇති අතර, කොළඹ විශ්වවිද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ඇත.

වර්තමානයේ දරණ තනතුරු

වීරසිංහ මහතා දැනට අප්කන්ට්‍රි මැන්පවර් එම්ප්ලෝයිමන්ට් ඒජන්සි (ප්‍රයිවට්) ලිමිටඩ්, හැමිස්ටෙඩ් ඉන්ටනැෂනල් ඉන්ස්ටිටියුට් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ යූ.එම්.ඒ. එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනවල කළමනාකරණ අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කරන අතර, අප්කන්ට්‍රි ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයෙහි අධ්‍යක්ෂවරයකු වශයෙනුත් ඩී. බී. විජේතුංග පදනමේ සභාපති හා ලේකම් වශයෙනුත් කටයුතු කරයි. එසේම, ඔහු මුලු දිවියිනටම සාමවිනිසුරුවරයකු ලෙසද කටයුතු කරයි.

කලින් දැරූ තනතුරු

1993 සිට 2008 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා විදේශ රැකියා ආයතනයේ අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් කටයුතු කර ඇති අතර, ශ්‍රී ලංකාවේ ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකවරයකු වශයෙන් ද කටයුතු කර ඇත.

## 8

**මහාචාර්ය කෙනඩි ගුණවර්ධන**

විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂක

ගුණවර්ධන මහතා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් ආයතනයේ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂකවරයකු ලෙස 2018 ඔක්තෝබර් මස 09 වන දින පත් කරන ලදී.

සුදුසුකම්

ආචාර්ය කෙනඩි ඩී. ගුණවර්ධන මහතා පරිගණක හා ඉංජිනේරු කළමනාකරණය ගිණුම්කරණ තොරතුරු පද්ධති (විශේෂ) යන අංශයන්ගෙන් තම ආචාර්ය උපාධිය සම්පූර්ණ කර ඇත. තවද, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියද එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයෙහි අධිසාමාජිකත්වයද ලබා ඇත.

වර්තමානයේ දරණ තනතුරු

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ තොරතුරු පද්ධති පිළිබඳ ආචාර්යවරයකු ලෙස හා කළමනාකරණය පිළිබද වූ ආචාර්ය උපාධි වැඩසටහන් සම්බන්ධීකාරකවරයකු ලෙසද කටයුතු කරයි. තවද, මානව සම්පත් අභිවෘද්ධිය පිළිබඳ ආයතනයේ පාලක මණ්ඩල ක්‍රියාකාරි සාමාජිකයෙකි.

කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු වන මෙතුමා මොරටුව විශ්වවිද්‍යාලය, කැළණිය විශ්වවිද්‍යාලය හා කොළඹ විශ්වවිද්‍යාලයේ, ගිණුම්කරණ, කළමනාකරණ තොරතුරු පද්ධති සහ පර්යේෂණ ක්‍රම යන අංශයන්හි විහිදුනු ව්‍යාපාර පරිපාලන පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන්හි බාහිර සාමාජිකත්වයද දරයි.

## 9

**ලක්මිණි දිල්රුක්ෂි කෝට්ටෙගොඩ මහත්මිය**

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ලක්මිණි කෝට්ටෙගොඩ මහත්මිය අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස 2018 ජූනි 01 දින පත් කරන ලදී.

සුදුසුකම්

නීතිවේදී උපාධිය සමඟින් කෝට්ටෙගොඩ මහත්මිය වෘත්තියෙන් නීතිඥවරියක් වේ.

වර්තමානයේ දරණ තනතුරු

කෝට්ටෙගොඩ මහත්මිය පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී., පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ්, පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් සහ පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී. යන ආයතනවල අධ්‍යක්ෂක මණ්ඩලවල ලේකම් ලෙස කටයුතු කරයි.

# ශක්තිමත් සාමූහික පාලනය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණ මණ්ඩලය එක්ව ක්ෂේත්‍රයේ වඩාත් ඵලදායී වූ පාලන ව්‍යුහයක් ගොඩනගයි.

පීපල්ස් ලීසිං ක්‍රියාකාරකම් එහි දැක්ම, මෙහෙවර සහ උපායමාර්ගික සැලසුම්වල අරමුණුවලට අනුකූල වන බව සහතික කරමින් අධ්‍යක්ෂක මණ්ඩලය ආයතනයේ කළමනාකාරීත්වයට මග පෙන්වයි. අනෙක් අතට, ආයතනයේ කළමනාකාරීත්වය විසින් ප්‍රධාන ගැටළු පිළිබඳ දැනුවත් තීරණ ගැනීම සඳහා අදාළ තොරතුරු සහ නිර්දේශ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත සපයයි.




1
2
3
4
5
6
7
8
9





වගකිවයුතු භාරකරුවන් වීම

# ආයතනික කළමනාකරණය

## 1

**සබ්‍රි ඊබ්‍රහිම් මහතා**

ප්‍රධාන විධායක නිළධාරි/සාමාන්‍යාධිකාරී

පීපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි ප්‍රධාන විධායක නිළධාරි/සාමාන්‍යාධිකාරි වශයෙන් ඊබ්‍රහිම් මහතා 2017 ජුලි මසදී පත් කරන ලදී.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී ගෞරව උපාධියක් ලබා ඇති අතර, එක්සත් රාජධානියේ වරලත් බැංකුකරුවන්ගේ ආයතනයේ අධිසාමාජිකත්වය ලබා ඇත.

ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාර කළමනාකරණය සහ අවධානම් කළමනාකරණය යන මානයන් ඔස්සේ පැතිරුන වසර 35 ක බැංකුකරණ අත්දැකීම් වලින් සමන්විත වේ.

## 2

**සංජීව බණ්ඩාරනායක මහතා**

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි

2007 ජුලි මාසයේදී සංජීව බණ්ඩාරනායක මහතා පීපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී සමග, සම්බන්ධ වන ලදී.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේත්, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ආයතනයේත්, ඕස්ට්‍රේලියාවේ සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේත් අධිසාමාජිකත්වය ලබා ඇති අතර, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ අවසාන අදියර සම්පූර්ණ කර ඇත.

වරලත් ගණකාධිකාරි සුදුසුකම ලබා ගැනීමෙන් පසු මුල්‍ය ක්ෂේත්‍රයේ ඉතා ජ්‍යෙෂ්ඨ තනතුරුවල වසර 25 කට වැඩි අත්දැකීම් ඇත.

## 3

**ලයනල් ප්‍රනාන්දු මහතා**

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි

ලයනල් ප්‍රනාන්දු මහතා 1995 වසරේදී පීපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. සමඟ සම්බන්ධ වන ලදී.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ ව්‍යාපාර හා මුල්‍ය පරිපාලනය පිළිබඳව පශ්චාත් ඩිප්ලෝමාවක්ද ලබා ඇත. තවද, ඔහු ශ්‍රී ලංකාවේ කළමනාකරණ ගණකාධිකාරවරුන්ගේ ආශ්‍රිත සාමාජිකයකුද වේ.

බැංකු හා මුල්‍ය ක්ෂේත්‍රවල වසර 30 කට වැඩි අත්දැකීම් ඇත.

## 4

**රොහාන් තෙන්නකෝන් මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි – අවදානම් හා පාලනය

1998 වසරේදී රොහාන් තෙන්නකෝන් මහතා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. සමග සම්බන්ධ වන ලදී. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ඇති අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය (විශේෂ) පිළිබද විද්‍යාවේදී උපාධිය දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව සමත් වී ඇත. එසේම, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකුද, ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සාමාජිකයකුද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ ආවසරික සහතිකපත්ධාරියෙකුද වේ.

ලීසිං ක්ෂේත්‍රයට සම්බන්ධවීමට ප්‍රථම ගිණුම්කරණය, නිෂ්පාදන අපනයන හා බැංකු යන ක්ෂේත්‍රවල අත්දැකීම් සහ ලීසිං ක්ෂේත්‍රයේ අලෙවිකරණය, ව්‍යාපාර ප්‍රවර්ධනය, ශාඛා කටයුතු හා ණය යන අංශවල අත්දැකීම් සහ වර්තමානයේ අවදානම් හා පාලන අංශයේ අත්දැකිම්ද ඇතුලුව විවිධ වු ක්ෂේත්‍රවල වසර 29 ක අත්දැකීම් ඇත.

## 5

**දමිත් මලවිතන්තිල මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි – අයකර ගැනීම් සහ පරිපාලනය

දමිත් මලවිතන්තිල මහතා 1996 වසරේදී පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පි.එල්.සී. හා සම්බන්ධ වු අතර, අයකර ගැනීම් අංශයේ ප්‍රධානියා වශයෙන් වසර 10 ක් කටයුතු කරන ලදී.

ඔහු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අවසන් අදියර සම්පුර්ණ කර ඇත.

බැංකු සහ මුල්‍ය ක්ෂේත්‍ර තුළ වසර 29 කට වැඩි අත්දැකීම් ඇති අතර, විගණන හා ගිණුම්කරණ යන අංශවලද වසර ගණනක අත්දැකීම් ඇත.

## 6

**ලක්සඳ ගුණවර්ධන මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි – අලෙවි

2002 වසරේදී පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පි.එල්.සී. හා සම්බන්ධවුනු ලක්සඳ ගුණවර්ධන මහතා ආයතනික ලීසිං අංශයේ ප්‍රධානියා ලෙස වසර 10 ක් කටයුතු කරන ලදී.

ගුණවර්ධන මහතා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද, ක්‍රමෝපායික අලෙවිකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය ද ලබා ඇති අතර, ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකුද වේ. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා ණය කළමණාකරණ ආයතනයේ ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව ලබා ඇති අතර, ඕස්ට්‍රේලියානු සහතිකපත් කළමනාකරණ ගණකාධිකරුවන්ගේ සංගමයේ සාමාජිකත්වය ලබා ඇත. එසේම, ඔහු ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ සහතික ලත් සාමාජිකයකු වන අතර, ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ (SLID) හා ශ්‍රී ලංකාවේ සහතික ලත් වෘත්තීය කළමනාකරුවන්ගේ සාමාජිකත්වය උසුලයි.

ආයතනික හා සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ මුල්‍යකරණය යන අංශයන්හි ණය දීම්, අලෙවිකරණය, අයකර ගැනීම්, ශාඛා ප්‍රවර්ධනය හා මෙහෙයුම් යන ක්ෂේත්‍රවල වසර 24 කට වඩා වැඩි පළපුරුද්දක් ඇත.

## 7

**ප්‍රභාත් ගුණසේන මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - තොරතුරු සන්නිවේදන තාක්ෂණය (සමුහය)

ප්‍රභාත් ගුණසේන මහතා 1999 වසරේදී පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පි.එල්.සී. හා සම්බන්ධ වූ අතර, මේ දක්වා වසර 20 ක කාලයක් තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කර ඇත.

ඔහු බටහිර සිඩ්නි සරසවියෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇති අතර, ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයෙන් ශාස්ත්‍රපති උපාධියද, ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයෙන් (NIBM) පරිගණක පද්ධති සැලසුම් පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත.

එසේම සිංගප්පුරු ජාතික සරසවියේ පද්ධති විද්‍යා ආයතනයෙන් තොරතුරු පද්ධති සදහා ව්‍යාපෘති කළමනාකරණය සම්පූර්ණ කර ඇත.

## 8

**උදේශ් ගුණවර්ධන මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි – අභ්‍යන්තර විගණන

ගුණවර්ධන මහතා 1999 වසරේදි දි පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හා සම්බන්ධ වන ලදි.

ඒ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේත් ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකරුවන්ගේ ආයතනයේ හා එක්සත් රාජධානි වෘත්තීය මුල්‍ය කළමනාකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන අතර, අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ සාමාජිකයකු ද වේ. එමෙන්ම ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ අවසන් අදියර සම්පුර්ණ කර ඇති අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් භාණ්ඩාගාර, ආයෝජන හා අවදානම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක්ද ලබා ඇත.

ඔහුට මුල්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ තනතුරුවල වසර 21 කට වැඩි පළපුරුද්දක් ඇති අතර, විශේෂයෙන් එයට ගිණුම්කරණය, විගණනය, මුල්‍ය කළමනාකරණය හා භාණ්ඩාගාර මෙහෙයුම් යන අංශ ඇතුළත් වේ.

## 9

**රනිල් පෙරේරා මහතා**

සහකාර සාමාන්‍යාධිකාරි - අයකර ගැනීම්

රනිල් පෙරේරා මහතා හට පීපල්ස් ලීසිං සමුහය තුළ වසර 19 කට වැඩි අත්දැකීම් ඇත.

ඒ මහතා කොළඹ සරසවියෙන් කලාප සංවර්ධනය හා සැලසුම් කිරීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධියකුත්, ඉන්දියාවේ මනිපාල් සරසවියෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියකුත් ලබා ඇති අතර, කොළඹ සරසවියෙන් ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්ද හදාරා ඇත. එසේම ඔහු වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනයෙන් අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාවක්ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ වාණිජවේදී විශේෂ උපාධියක්ද ලබා ඇත. එමෙන්ම ඒ මහතා වරලත් අලෙවිකරුවන්ගේ ආයතනයේ හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනයේ අදියර කිහිපයක් සම්පුර්ණ කර ඇත.

## 10

**යුරේෂ් ජයසේකර මහතා**

සහකාර සාමාන්‍යාධිකාරි - මානව සම්පත් (සමුහය)

(ඡායාරූපයේ පෙනී සිට නොමැත)

ජයසේකර මහතාට මානව සම්පත් ක්ෂේත්‍රයේ වසර 20 කට වැඩි පළපුරුද්දක් ඇත.

ඒ මහතා කොළඹ සරසවියෙන් ව්‍යාපාර පරිපාලනය මානව සම්පත් (විශේෂ) ශාස්ත්‍රපති උපාධිය ලබා ඇති අතර, එම සරසවියේම ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාවක් ලබා ඇත. එමෙන්ම ඔහු කැළණිය විශ්වවිද්‍යාලයෙන් ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියක්ද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක්ද ලබා ඇත.

ඉහත සියලු තොරතුරු 2019 මාර්තු 31 දිනට වේ.

ආයතනික කළමනාකරණයේ වැඩිදුර විස්තර සඳහා අපගේ මංගත වාර්තාවට පිවිසෙන්න.

http://plc2018-19.annualreports.lk/cm.html



1
12
2
13
3
14
4
15
5
16
9
10
11






# කළමනාකරණ මණ්ඩලය

## 1
**සමන් ලියනගේ මහතා**

ප්‍රධාන කළමනාකරු – ස්ථාවර තැන්පතු සහ ඉතුරුම්

ඔහු ඉන්දියාවේ මනිපාල් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර, ණය කළමනාකරණය පිළිබඳ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වයක් උසුලයි. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයේ ඩිප්ලෝමාධාරියෙකු ද වේ.

තවද මුල්‍ය ක්ෂේත්‍රයේ අවුරුදු 34 කට වැඩි අත්දැකීම් ලාභියෙකි.

## 2
**හසන්ත ද සිල්වා මහතා**

ප්‍රධාන කළමනාකරු – මෙහෙයුම්

ඔහු ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ ගිණුම්කරණ ඩිප්ලෝමාධාරියෙකි. (උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, ගාල්ල)

ඔහු විසින් අවුරුදු 8 ක විගණන හා ගිණුම්කරන අත්දැකීම් සහ අවුරුදු 19 ක සේවා අත්දැකීම් සම්භාරයක් පීපල්ස් ලීසිං සහ ෆිනෑන්ස් ආයතනය තුළ ළඟාකර ගෙන ඇත.

## 3
**පී.ඩී.සී.එස්. මහානාම මහතා**

ප්‍රධාන කළමනාකරු – මෙහෙයුම්

ඔහු පීපල්ස් ලීසිං සහ ෆිනෑන්ස් ආයතනය තුළ අවුරුදු 15 ක පමණ අත්දැකීම් සම්භාරයක් සමග අලෙවිකරණය හා මුල්‍ය ක්ෂේත්‍රය තුළ අවුරුදු 22 ක පමණ සේවා අත්දැකීම් සම්භාරයක් නතු කරගෙන ඇත.

## 4
**නීල් තුෂාන්ත මහතා**

ප්‍රධාන කළමනාකරු – මෙහෙයුම්

ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී කෘෂිකර්ම විශේෂ උපාධිය දෙවන පෙළ (ඉහළ) සාමාර්ථයක් සහිතව ලබා ඇති අතර, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයෙහි අන්තර් මාධ්‍ය අදියර සම්පූර්ණ කර ඇත.

තවද, මුල්‍ය අංශයෙහි අවුරුදු 20 කට වැඩි අත්දැකීම් ප්‍රමාණයකට හිමිකම් කියයි.

## 5
**චමිල් හේරත් මහතා**

ප්‍රධාන කළමනාකරු – මෙහෙයුම්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදි ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධියක් ලබා ඇති චමිල් හේරත් මහතා වරලත් ගණකාධිකාරි ආයතනයේ අන්තර් මාධ්‍ය සම්පූර්ණ කර ඇත.

ලීසිං ක්ෂේත්‍රයේ අවුරුදු 20 ක පමණ අත්දැකීම් ලාභියෙකි.

## 6
**කමනි දෙමටවැව මහත්මිය**

ප්‍රධාන කළමනාකරු – නීති අංශය

වෘත්තියෙන් නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්වරියක වන කමනි දෙමටවැව මහත්මිය, ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරිනියකි. තවද, මූල්‍ය, බැංකු හා රක්ෂණ නීති පිළිබඳ පශ්චාත් නීති ඩිප්ලෝමාවකටද හිමිකම් කියන්නීය. මීට අමතරව ඇය මූල්‍ය ක්ෂේත්‍රයේ ආයතනික නීතිඥවරියක ලෙස වසර 31 ක පමණ අත්දැකීම් සම්භාරයකට හිමිකම් කියයි.

# කළමනාකරණ මණ්ඩලය



## 7

**ඔමල් සුමනසිරි මහතා**

ප්‍රධාන කළමනාකරු - මූල්‍ය

කැළණිය විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණ (ගිණුම්කරන) උපාධිය පළමු පෙළ සාමාර්ථයක් සහිතව ලබා ඇති ඔමල් සුමනසිරි මහතා ගිණුම්කරණ හා විගණනය යන ක්ෂේත්‍රයන්හි අවුරුදු 14 කට වැඩි සේවා අත්දැකීම් ලාභියෙකි.

තවද, ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහ සහතික ලත් කළමනාකරණ ගණකාධිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වයද උසුලයි.

## 8

**මොහිදීන් මහරූෆ් මහතා**

ප්‍රධාන කළමනාකරු – ඉස්ලාමීය මූල්‍ය කටයුතු

ඉස්ලාමීය බැංකු හා මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාධාරියකු වන මොහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අන්තර් මාධ්‍ය සුදුසුකම සම්පූර්ණ කර ඇත.

බැංකු, මූල්‍ය, ඇඟලුම් සහ මෝටර් රථ වාහන යනාදී වූ විවිධ අංශයන්හි වසර 33කට වැඩි පළපුරුද්දක් මහරූෆ් මහතා සතු වේ.

## 9

**ශිරෝන් රණසිංහ මහතා**

ප්‍රධාන කළමනාකරු – මෙහෙයුම්

වරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකත්වය උසුලන රණසිංහ මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය මගින් ලබා දෙන ණය කළමනාකරණය පිළිබඳ සහතිකපත් ලාභියෙකි.

තවද, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් සමාගම තුළ අවුරුදු 20 කට වැඩි සේවා අත්දැකීම් ලබා ඇත.

## 10

**ප්‍රියංකා විමලසේන මහත්මිය**

ප්‍රධාන කළමනාකරු - මෙහෙයුම්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධියක් ලබා ඇති ප්‍රියංකා මහත්මිය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආවසරික සහතිකපත් ලාභිනියක් ද වේ.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් සමාගම තුළ ඇය අවුරුදු 20 කට වැඩි සේවා අත්දැකීම් සම්භාරයකට හිමිකම් කියනු ලබන්නීය.

## 11

**නන්දන වීරක්කොඩි මහතා**

ප්‍රධාන කළමනාකරු – අයකිරීම්

ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී කෘෂිකර්ම විශේෂ උපාධියක් ලබා ඇත. එමෙන්ම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහතිකපත් පාඨමාලාව සම්පූර්ණ කර ඇත.

ඔහු පීපල්ස් ලීසිං ආයතනයේ අවුරුදු 20 කට වැඩි සේවා අත්දැකීම් ලබා ඇත.

## 12

**වජිර රාමනායක මහතා**

ප්‍රධාන කළමනාකරු – අලෙවිකරණ

ඕස්ට්‍රේලියාවේ සහතිකපත් කළමනාකරණ ගණකාධිකාරවරුන්ගේ ආයතනයේ සාමාජිකත්වයද ලබා ඇති අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අන්තර්මාධ්‍ය බැංකු ඩිප්ලෝමාව හා ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයේ ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව ද ලබා ඇත.

තවද, බැංකු සහ ලීසිං ක්ෂේත්‍ර තුළ අවුරුදු 25 කට වැඩි අත්දැකීම් ලබා ඇත.

## 13

**නිශාන්ත පෙරේරා මහතා**

ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ආන්තික වෙළඳාම/ණය කළඹ කළමනාකරණය

ආන්තික වෙළඳාම, ආයෝජන යන ක්ෂේත්‍රයන්හි වසර 27 කට වැඩි අත්දැකීම් සම්භාරයක් ලබා ඇත.

## 14

**රන්දිල් සිරිවර්ධන මහතා**

ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ණය සාධකකරණය

සිරිවර්ධන මහතා එක්සත් ජාතීන්ගේ සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ, ශ්‍රී ලංකා කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සහ ගෝලීය වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය උසුලන්නෙකි.

තවද බැංකු හා මූල්‍ය අංශයන්හි ණය සාධකකරණයට අදාළව වසර 21 කට වැඩි අත්දැකීම් සම්භාරයක් ඔහු සතු වේ.

## 15

**නන්දන විතාන මහතා**

ජ්‍යෙෂ්ඨ කළමනාකරු – පරිපාලන

පශ්චාත් කළමනාකරණ ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී අලෙවි කළමනාකරණ දෙවන පෙළ (ඉහළ) උපාධියද ලබා ඇති නන්දන විතාන මහතා වරලත් ගණකාධිකරණ ආයතනයේ ආවසරික සහතිකපත් ලාභියෙකි. තවද එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අන්තර් මාධ්‍ය අදියර සම්පූර්ණ කර ඇත.

ඔහු පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් සමාගමේ වසර 20 කට වැඩි සේවා අත්දැකීම් ප්‍රමාණයක් ලබා ඇත.

## 16

**අමින්ද රාජපක්ෂ මහතා**

ජ්‍යෙෂ්ඨ කළමනාකරු – අභ්‍යන්තර විගණන

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධියක් හිමි අමින්ද රාජපක්ෂ මහතා හට අභ්‍යන්තර විගණන හා මූල්‍ය ක්ෂේත්‍රයන්හි වසර 19කට වැඩි අත්දැකීම් සම්භාරයක් පවතී.

## 17

**ගනේෂන් තුෂාන්තන් මහතා**

ජ්‍යෙෂ්ඨ කළමනාකරු – ශාඛා මෙහෙයුම්

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (වෙළෙඳපොල පිළිබඳ විශේෂ) ලබා ඇත.

තවද කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ) දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව ලබා ඇත.

ඔහු පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් සමාගමේ වසර 12 කට වැඩි සේවා අත්දැකීම් ප්‍රමාණයක් ලබා ඇත.

## 18

**විශ්වමිත්‍ර කදුරුගමුව මහතා**

ජ්‍යෙෂ්ඨ කළමනාකරු – අනුකූලතා

ඔහු වෘත්තියෙන් නීතිඥවරයකු වන අතර, ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාධාරියෙකි. (වේල්ස් විශ්වවිද්‍යාලය) තවද, ඔහු ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ යාවජීව සාමාජිකයෙකුද වේ.

විශ්වමිත්‍ර කදුරුගමුව මහතා හට ව්‍යාපාරික හා වාණිජ නීතිය පිළිබඳ වසර දොළහකට වැඩි අත්දැකීම් සම්භාරයක් පවතී.

ඉහත සියලු තොරතුරු 2019 මාර්තු 31 දිනට වේ.

කළමනාකරණ මණ්ඩලයේ වැඩිදුර විස්තර සඳහා අපගේ මංගත වාර්තාවට පිවිසෙන්න.

http://plc2018-19.annualreports.lk/mt.html

වගකිවයුතු භාරකරුවන් වීම

# අනුකූලතා කළමනාකරණය

පීපල්ස් ලීසිං හි අනුකූලතා කළමනාකරණය අඛණ්ඩව වැදගත් කාර්යයකි. අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය නෛතික, මූල්‍ය, මෙහෙයුම් සහ පිළිගත් අවදානම් සමග අපගේ අනුකූලතා අවදානම් නිරාවරණය අධීක්ෂණය කරයි.

## අනුකූල සංස්කෘතිය

පීපල්ස් ලීසිං සංස්කෘතිය තුළ අනුකූලතාවය ගැඹුරින් ගිලී ඇත. ආචාරධර්ම, අන්තර්ග්‍රහණය, විනිවිදභාවය සහ වගවීම ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන පරිසරයක් ස්ථාපිත කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය පෙරමුණ ගනී. සමාගමේ සේවකයින් ඔවුන්ගේ වගකීම සඳහා හිමිකාරිත්වය ලබාගැනීම සහ ඔවුන්ගේ කාර්යයන් අනුකූලතාවයට අනුකූලව සිදුකිරීම, අදාළ වන සියලුම නීති හා රෙගුලාසි පිළිපැදීම මෙයින් බලපායි.

සමාලෝචනයට භාජනය වන කාලසීමාව සඳහා අනුකූල නොවීම හේතුවෙන් පීපල්ස් ලීසිං සමාගම දඩ මුදල් හෝ නියාමකයින් විසින් පනවා ඇති ක්‍රියාමාර්ගයන්ට යටත් නොවේ.

## අනුකූලතා කාර්යය

අධ්‍යක්ෂක මණ්ඩලයේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට (IRMC) සෘජුව වාර්තා කිරීමේ ව්‍යුහයක් සහිත තනිව අනුකූලවීමේ කාර්යයක් මගින් සමාගමේ ව්‍යාපාරයෙන් සහ සමාගමේ අනෙකුත් ආධාරක ක්‍රියාකාරකම්වලින් සැලකිය යුතු ඉහළ ස්වාධීනත්වයක් ඇති බව සහතික කරයි.

පීපල්ස් ලීසිං විසින් අනුකූලතාවය සඳහා වැළැක්වීමේ ප්‍රවේශයක් ගන්නා අතර, ඒවා සිදුවීමට පෙර සිදුවිය හැකි උල්ලංඝනයන් වළක්වන සංස්කෘතියක් නිර්මාණය කරයි. විවිධ අන්තර සම්බන්ධිත ක්‍රියාදාමයන් සමාගමේ පුලුල් අනුකූලතා කළමනාකරණ පද්ධතිය අර්ථ දක්වයි. අභ්‍යන්තර විගණනය නිතිපතා විමර්ශණ කටයුතු සිදු කරන අතර පරීක්ෂණ පැවැත්වීම, අනුකූලතාවය අධීක්ෂණය කිරීම, අඟහු ලෙස සහ අදාළ අංශවල ප්‍රධානීන් විසින් ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරයි.

සමාලෝචනයට භාජනය වූ කාලසීමාව සඳහා, නියාමන බලධාරීන් විසින් නිකුත් කරනලද නව දිශාවන් සහ චක්‍රලේඛයන්ට අනුකූලවීම සහතික කිරීම සඳහා සමාගමේ මෙහෙයුම් ක්‍රියා පටිපාටිය හා භාවිතයන්හි වෙනස්කම් ක්‍රියාත්මක කිරීමේදී සමාගම අභියෝගයන්ට මුහුණ දුන්නේය. මෙයට මූලික වශයෙන් හේතුවී ඇත්තේ පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා වන අධික පිරිවැය සහ කර්මාන්ත පුළුල් පරිචයන්ගෙන් බැහැරවීමේ අභියෝගාත්මක ස්වභාවය සමගය. සමාගම සහ පුළුල් මූල්‍ය සේවා අංශය ඉදිරි වර්ෂවලදී අභියෝගයන්ට මුහුණ දෙනු ඇත. ඒවා නවීන සංක්‍රාන්ති ක්‍රමවේදයන්ට සරිලන පරිදි අඛණ්ඩ නියාමන වෙනස්කම්, තාක්ෂණික විද්‍යාවේ වර්ධනයන් සහ අධීක්ෂණය සහ වාර්තා කිරීමේ කාර්යයන් වැඩිකිරීම, යන කරුණු ඔස්සේ ඇතිවිය හැක.

## අනුකූලතා පාලනයන්

අභ්‍යන්තර විගණන රෙගුලාසි මගින් වංචාවන්ට හා සදාචාර විරෝධී ක්‍රියාවන්ට ගොදුරු වියහැකි යැයි සැලකෙන අංශවල විගණනයන් සිදු කරයි. එම විගණනවල සොයාගැනීම් අධ්‍යක්ෂක මණ්ඩලයේ විගණන කමිටුවට සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කරනු ලැබේ.

විස්ට්ල්-බ්ලෝවර් ප්‍රතිපත්තිය සමාගමේ ක්‍රියාකාරකම් තුළ සදාචාරාත්මක හැසිරීම් සහ කාර්යක්ෂම අනුකූලතා සංස්කෘතියක් ප්‍රවර්ධනය කරයි. නීති රෙගුලාසිවල අවදානම් සහ උල්ලංඝනය කිරීම් වාර්තා කිරීමට සේවකයනට එය යාන්ත්‍රණයක් සපයයි.

ඉහළ මට්ටමේ විශ්වාසනීයත්වයකින් යුත් සේවකයින් බඳවා ගැනීම මෙන්ම වරින්වර කාර්ය මණ්ඩලය භ්‍රමණයවීමට ඉඩ සලසමින් සමාගමේ ආචාරධර්ම වැඩ සංස්කෘතිය තහවුරු කිරීම මානව සම්පත් ප්‍රතිපත්තිය සහතික කරයි.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (AML) සහ මුදල් විශුද්ධිකරණය පිළිබඳ සියලු අංශ ආවරණය වන පරිදි ගනුදෙනු හඳුනා ගැනීමේ (KYC) ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අත්පොත සමාගම තුළ පවතී. අදාළ නීති සහ සම්බන්ධතාවයන්ට අනුකූලවීම, සහතික කිරීම සඳහා අදාළ කාර්යමණ්ඩල සාමාජිකයින්ට, KYC, AML ත්‍රස්තවාදය සඳහා මූල්‍යකරණයට එරෙහිව සටහන් කිරීම සහ පාරිභෝගික අවදානම් පැතිකඩ හඳුනාගැනීම සඳහා අවශ්‍ය පුහුණුව ලබා දෙනු ලැබේ.

## අනුකූලතා තාක්ෂණය

වර්තමාන කර්මාන්ත භාවිතයන්ට, අනුව අනුකූලතා අධීක්ෂණ සහ පරීක්ෂණ යාන්ත්‍රණ යාවත්කාලීන කිරීමට හැකි සෑම තැනකම තාක්ෂණය භාවිතා කිරීම පීපල්ස් ලීසිං සමාගම කටයුතු කරයි.

අනුමත කරන ලද ලැයිස්තු, අහිතකර මාධ්‍ය නිරාවරණය සහ වෙනත් විභව අවදානම් සහ වගකීම්වලට එරෙහිව යතුරු පුවරුවට යාමට පෙර සමාගම ගනුදෙනුකරුවන් භාවිතා කරයි.

## අනුකූලතා පුහුණුව

සමාගම තුළ අනුකූලතාවය තහවුරු කිරීම සඳහා ගනුලබන වැළැක්වීමේ පියවරවල කොටසක් ලෙස සේවකයින්ට ප්‍රමාණවත් පුහුණුවක් ලබා දේ. මේ සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව අභ්‍යන්තර හා බාහිර පුහුණු අවස්ථා ඇතුළත් පුහුණු සැලැස්මක් ස්ථාපිත කරයි. සමාලෝචනයට භාජනයවූ කාලසීමාව සඳහා, අනුකූලතා කාර්ය මණ්ඩල සාමාජිකයින්ට නීති සහ රෙගුලාසිවල වෙනස්කම් හා ජාත්‍යන්තර හොඳම භාවිතයන් පිළිබඳව යාවත්කාලීනව සිටීම සහතික කිරීම පුහුණුව ලැබුණි.

තවද, වාර්තා කරන කාලසීමාව තුළ AML/TF අවදානම් වලට නිරාවරණය වන විධායක ශ්‍රේණිවල කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා අනුකූලතා දෙපාර්තමේන්තුව පුළුල් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

# අනුකූලතා කළමනාකරණය



## අනුකූලතා ආශ්‍රිත නියාමන වර්ධනයන්

සමාලෝචනයට භාජනය වන කාල පරිච්ඡේදය තුළදී පහත සඳහන් අනුකූලතා ආශ්‍රිත නියාමන වර්ධනයන් සිදුවිනි.

- 2018 මූල්‍ය ව්‍යාපාර පනත විධාන අංක 01 මූල්‍ය පාරිභෝගික ආරක්ෂන පාදක ව්‍යුහය සඳහා
- 2018 අංක 01 දරණ රෙගුලාසිය ශ්‍රී ලංකා තැන්පතු ආරක්ෂන ක්‍රමවේදයට සංශෝධන 2010 අංක 01 දරණ රෙගුලාසිය
- මූල්‍ය ව්‍යාපාර පනත 2018 විධාන අංක 02 මෝටර් රථ සඳහා ණය මුදල් අනුමත කිරීමේද වටිනාකම සහ ණය මුදල අතර අනුපාතය
- මූල්‍ය ව්‍යාපාර පනත 2018 විධාන අංක 03 ප්‍රාග්ධන ප්‍රමාණාත්මභාවය පිලිබඳ අවශ්‍යතාවයන්
- මූල්‍ය ව්‍යාපාර පනත 2018 විධාන අංක 04 වංචල දේපල තක්සේරු කිරීම්
- 2018 අංක 01 දරණ චක්‍රලේඛය - ණය ප්‍රමාණවත්භාවය
- මූල්‍ය ව්‍යාපාර පනත 2018 විධාන අංක 05 මෝටර් රථ සඳහා ණය මුදල් අනුමත කිරීමේදී වටිනාකම සහ ණය මුදල අතර අනුපාතය සඳහා වන නියමයට සංශෝධන
- මූල්‍ය ව්‍යාපාර පනත 2018 විධාන අංක 06 මෝටර් රථ සඳහා ණය මුදල් අනුමත කිරීමේදී වටිනාකම සහ ණය මුදල අතර අනුපාතය සඳහා වන නියමයට සංශෝධන
- මූල්‍ය ව්‍යාපාර පනත 2018 විධාන අංක 07 ව්‍යාපාර මෙහෙයුම් බැහැරින් ලබා ගැනීම
- මූල්‍ය ව්‍යාපාර පනත 2018 විධාන අංක 08 ව්‍යුහාත්මක වෙනස්කිරීම් සඳහා වන නියමයට සංශෝධන
- මූල්‍ය ව්‍යාපාර පනත 2018 විධාන අංක 09 මෝටර් රථ ආනයනය අඩු කිරීම සඳහා පියවර
- මූල්‍ය ව්‍යාපාර පනත 2018 විධාන අංක 10 ක්ෂුද්‍ර ණය සඳහා උපරිම පොලී අනුපාතිකය
- මූල්‍ය ආයතන සඳහා වන නීති රීතිවලට සංශෝධන (පාරිභෝගික මනා සැලකිල්ල) 2016 විධාන අංක 01 - අති විශේෂ ගැසට් නිවේදන අංක 2092/02 - 2018 ඔක්තෝම්බර් 8
- 2018 අංක 01 දරණ මාර්ගෝපදේශ - ගෙවීම් ආශ්‍රිත ජංගම මෘදුකාංග යෙදීම් සඳහා අනුකූලතා ප්‍රමිතයන්
- 2018 අංක 06 දරණ චක්‍රලේඛය - දේශීය මුදලින් කරන ගෙවීම් සඳහා ජාතික ක්ෂණික ප්‍රතිචාරකේත ප්‍රමිතයන් ස්ථාපිත කිරීම
- 2018 අංක 04 දරණ මාර්ගෝපදේශ - අර්ථලාභි හිමිකාරිත්වය හඳුනා ගැනීම
- 2018 අංක 01 දරණ මාර්ගෝපදේශ - ප්‍රජාතන්ත්‍රවාදී මහජන කොරියා ජනරජය සම්බන්ධ එක්සත් ජාතීන්ගේ සම්බාධක ක්‍රියාත්මක කිරීම
- 2018 අංක 06 දරණ මාර්ගෝපදේශ - සැකසහිත ගනුදෙනු වාර්තා කිරීම
- 2018 අංක 07 දරණ මාර්ගෝපදේශ - ඉරානය සම්බන්ධ එක්සත් ජාතීන්ගේ සම්බාධක ක්‍රියාත්මක කිරීම

වගකිවයුතු භාරකරුවන් වීම

# ආයතනික පාලනය

## මෙම වාර්තාව

අපගේ පරමාර්ථය වන්නේ පාර්ශවකරුවන් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීම සඳහා සමාගම දරණ ප්‍රයත්නයන් හිදී සමාගම තුළ යහපාලනය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ සමබර අවබෝධයක් ලබා ගැනීම සඳහා කොටස් හිමියන්ට පහසුකම් සැපයීම සඳහා සංක්ෂිප්ත නමුත් පුළුල් ලෙස පාර්ශවකරුවන් සමග ප්‍රමාණාත්මක හා වැදගත් තොරතුරු සන්නිවේදනය කිරීමයි.

සමාගමේ ආයතනික පාලන යාන්ත්‍රණයයේ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, රාමු සහ ප්‍රධාන අංගයන් සහ අවදානම් කළමණාකරණය සඳහා එහි ප්‍රවේශය පිළිබඳ එය විස්තර මෙම වාර්තාව තුළින් ඉදිරිපත් කරන අතර එය ආයතනික පාලන ඇමුණුම් සමග එක්ව කියවිය යුතුය.

### ආයතනික පාලන වාර්තාව (37 පිටුවේ සිට 53 පිටුව දක්වා)


- ආයතනික පාලනයට සමාගමේ ප්‍රවේශය
- ආයතනික පාලන ව්‍යුහය සහ රාමුව
- ඉහළ ආකල්ප
  - අධ්‍යක්ෂක මණ්ඩලය
  - සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී
  - අධ්‍යක්ෂක මණ්ඩල අනුකමිටු
  - අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්
  - ප්‍රතිලාභ/වේතනය
  - විධායක කමිටු
  - සමාගම් ලේකම්
- කොටස්හිමියන් සමග සන්නිවේදනය සහ සම්බන්ධතාවය
- තිරසාර වාර්තාකරණයට ප්‍රවේශයන්
- අන්තර්ජාලය සහ ආරක්ෂාව


### ආයතනික පාලන ඇමුණුම් (183 පිටුවේ සිට 201 පිටුව දක්වා)

මෙම වාර්තාව පහත දැක්වෙන ප්‍රධාන නීතිමය විධි විධාන හා ස්වෙච්ඡා මාර්ගෝපදේශ වලට අනුකූල වීමට සවිස්තරාත්මක වාර්තාවක් පිරික්සුම් ලැයිස්තුවක් ලෙස සපයනු ලැබේ.

- ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ හොඳම භාවිතයන් - 2017
- 2008 අංක 03 දරණ නියෝගය මූල්‍ය සමාගම් (ආයතනික පාලනය) සහ ඒ සඳහා වන සංශෝධන.
- කොළඹ කොටස් වෙළපොළ හුවමාරු ලැයිස්තු රීති - අඛණ්ඩ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතා 7.6 සහ 7.10 වගන්ති

## ආයතනික පාලනය සඳහා අපගේ ප්‍රවේශය

සමාගම සහ එහි ආයෝජකයින් අතර විශ්වාසය හා සම්බන්ධතාවය ඇති කිරීම සඳහා හොඳ ආයතනික පාලනයක් අත්‍යවශ්‍ය බව මණ්ඩලය තරයේ විශ්වාස කරන අතර එය ව්‍යාපාරයේ දිගුකාලීන සාර්ථකත්වයට දායක වේ.එමගින් එදිනෙදා ව්‍යාපාරික කටයුතුවලදී මණ්ඩලය සහ සියලුම මට්ටමේ සේවකයින් මෙහෙයවනු ලැබේ. ප්‍රතිපත්ති සහ නෛතිකව නියම කර ඇති අවම සීමාවෙන් ඔබ්බට ගිය ආයතනික පාලන ප්‍රතිපත්තීන් හි ඉහළම තත්වයන් ලබා ගැනීමට සමාගම කැප වී සිටී.

පාර්ශවකරුවන් හට තිරසාර වටිනාකම නිර්මාණය කිරීම සහ ලබා දීම මණ්ඩලය සතු වගකීමකි. පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි මගින් සියළුම පාර්ශවකරුවන්ගේ අභිවෘද්ධිය සලසා සමාගම කළමණාරණය කිරීමට මණ්ඩලයට හැකියාව ලැබේ. ඒ තුළින් දිගු කාලීන වටිනාකම් නිර්මාණය කිරීම.පාලන ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා සමාගම විසින් අභ්‍යන්තර හා බාහිර සමාලෝචන නියමිත වේලාවට පවත්වනු ලබන අතර අනුකූල නොවීම හදුනාගත් විට අනුකූල වීම සඳහා අවශ්‍ය ක්ෂණික පියවරයන් අනුගමනය කරනු ලැබේ.

සමාගමේ උපාය මාර්ග නීතිමය අවශ්‍යතා, ව්‍යාපාර පරිසරයේ වෙනස්වීම, තාක්ෂණික දියුණුව සහ ජාත්‍යන්තර විශිෂ්ඨ භාවිතයන් සමබරව පවත්වා ගැනීම සඳහා අක්‍රිය රාමුව සහ ප්‍රතිපත්ති නියමිත වේලාවට සමාලෝචනය කරනු ලැබේ. අනුකූලතා අගයන සංස්කෘතියක් පවත්වාගෙන යාම සහ අපගේ ආයතනික අරමුණුසාක්ෂාත් කර ගැනීම සමබරව පවත්වා ගැනීම සඳහා කාර්‍ය සාධන කළමණාකරණ ප්‍රතිපත්ති ශක්තියක් ලබා දෙයි.

ආයතනික පාලන ප්‍රමිතීන්ට අනුකූලවීම වැඩි දියුණු කිරීම සඳහා වන අඛණ්ඩ කැපවීමේ කොටසක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩලය සිය පාලන කාලය තුළ අනිවාර්‍ය හා ස්වෙච්ඡා ප්‍රමිතීන්ට අනුකූලව සමාගම පාලනය කර ඇත.

### ආයතනික පාලන ආකෘති රාමුව

පීපල්ස් ලීසිං හි අරමුණ වන්නේ පාලනයේ ඉහළම ප්‍රමිතිය සාක්ෂාත් කර ගැන්ම මෙන්ම ස්වාධීනත්වය සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කරන ගෝලීය වශයෙන් පිළිගත් හොඳම භාවිතයන් සමග අනුගත වීමයි. හොඳම භාවිතයන් ශක්තිමත් ආයතනික පාලන රාමුවකට අන්තර්ග්‍රහණය කර ඇති අතර එමගින් සමාගමේ සියලු පාර්ශවකරුවන්ගේ යහපත උදෙසා සමාගමේ විචක්ෂණශීලී කළමණාකරණය සඳහා වේදිකාවක් නිර්මාණය වේ.

බැංකු නොවන මූල්‍ය අංශය පාලනය කරන විවිධ නීති, රෙගුලාසි සහ ආචාරධර්මයන් හරහා සමාග මට බාහිර යාන්ත්‍රණයක් පනවනු ලැබේ. අවදානම් කළමණාකරණය, සංස්කෘතිය සහ සාමාන්‍ය සමාගම් භාවිතයන් කෙරෙහි අවදානය යොමු කරන අභ්‍යන්තර යාන්ත්‍රණයක් සමාගම විසින් සංවර්ධනය කර ඇත.

# ආයතනික පාලනය

වගකිවයුතු භාරකරුවන් වීම



# ආයතනික පාලනය

## ආයතනික පාලන ව්‍යුහය

අපගේ පාලන ව්‍යුහය අධීක්ෂණය, වගවීම සහ වැඩිදියුණු කළ තීරණ ගැනීම සමග යහපාලනය සඳහා ශක්තිමත් පදනමක් සපයන අතර, ඵලදායී අවදානම් කළමනාකරණ අභ්‍යන්තර පාලනයක් සහ විනයානුකූලතාවයන් සමග ඒකාබද්ධව තිරසාර හැසිරීම සහතික කරයි.

ව්‍යුහය පදනම් වී ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණය සහ සේවකයන්ට සමාගමේ සමස්ත අරමුණු ලඟාකර ගත හැකි වීමත් සහ සමාගමේ සියලුම පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කිරීම තුළින් අඩු ගැටුම් මට්ටමක් පවත්වා ගැනීම යන අංශයන් තුලනාත්මක කිරීම තුළයි.

GRI 102-18

**ආයතනික පාලන ව්‍යුහය**



# ආයතනික පාලනය



## ඉහළ ආකල්ප

### අධ්‍යක්ෂක මණ්ඩලය

GRI 102-22

වර්තමාන අධ්‍යක්ෂක මණ්ඩලය අධ්‍යක්ෂකවරු අට දෙනෙකුගෙන් යුක්ත වන අතර, සියලුම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් තුළදී තාර්කික ගතිකතාවයක් සහ සංස්කෘතීන් අනුගමනය කරන ලදී.






# ආයතනික පාලනය

" ආයතනික පාලනය යනු සමාගමේ ජීවමාන රුධිරයයි"

## ආයතික පාලනයේ අධ්‍යක්ෂ මණ්ඩල කාර්‍යභාරය

පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා උපරිම වන අයුරින් සමාගමේ ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම සඳහා ඵලදායි ආයතික පාලන ක්‍රමයක් අත්‍යවශ්‍ය බව අධ්‍යක්ෂ මණ්ඩලය මුලුමුනින්ම පිළිගනු ලබයි. ආයතනික පාලනයේ මෙහෙයවන්නන් වශයෙන්, අධ්‍යක්ෂවරු මණ්ඩලය සහ පාලක කමිටු රැස්වීම්වලට සහභාගී වීමට ප්‍රමාණවත් කාලයක් කැප කරති. උපාය මාර්ග, කාර්‍යසාධනය , අවදානම් කළමණාකරණ, පාලනය සහ ව්‍යාපාර හැසිරවීම සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ ස්වාධීන තීන්දු ගෙන එයි.
වාර්ෂික වාර්තාව මගින් තම ආයතනික පාලන භාවිතයන් සහ පාර්ශවකරුවන් කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කරන කරුණු පිළිබඳ සමබර දෘෂ්ටියක් ලබා දීම සහතික කිරීම සඳහා වන වගකීම මණ්ඩලය පිළිගනී. අධ්‍යක්ෂ මණ්ඩලය සිය මෙහෙයුම් සිදු කරනු ලබන්නේ අදාළ නීති සහ රෙගුලාසි සම්පූර්ණයෙන් පිළිපැදීමෙන් බව මණ්ඩලය තනි තනිව හා ඒකාබද්ධව සනාථ කරයි. දත්ත ඒකාබද්ධ කිරීමට සහ අනාවරණය කිරීමට පහසුකම් සැලසීමට පියවර ගෙන ඇති අතර, වැඩි විශ්වාසනීයත්වයක් සහ තොරතුරු සම්පූර්ණ බව සහතික කිරීම සඳහා දත්ත කළමණාකරණ පද්ධති ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කරයි.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂතා

### උපාය

උපාය මාර්ගික සැලැස්ම වැඩිදියුණු කිරීම සහ එහි තත්වය අඛණ්ඩව අධීක්ෂණය කිරීම.

### ඩිජිටල්කරණය

ක්ෂේත්‍ර චාරිකා සහ නිලධාරීන්ගේ දිරිගැන්වීම්ම සඳහා අන්තර්ජාල බැංකුකරණය හා ඩිජිටල් ආකෘති හඳුන්වා දීම.

### කාර්ය සාධන සමාලෝචනය

අයවැයට එරෙහිව සමාගම් සහ උප සමාගම්වල ක්‍රියාකාරීත්වය අඛණ්ඩව අධීක්ෂණය කිරීම බංගලාදේශ මෙහෙයුම්වල විස්තරණය සමාලෝචනය කිරීම.

### විධායක මට්ටමේ කමිටු

ඉස්ලාමීය ව්‍යාපාර අංශය හා තොරතුරු තාක්ෂණය පිළිබඳ විශ්ලේෂණය සඳහා නව කමිටු පිහිටුවීම සහ පවත්නා කමිටුවල සංයුතිය සමාලෝචනය කිරීම.

### අධ්‍යක්ෂ මණ්ඩලය

දැනට සිටින සාමාජිකයින් විශ්‍රාම ගැනීම සහ ඉල්ලා අස්වීම සහ මණ්ඩලයට නව පත් වීම්

GRI 102-22 GRI 102-23

## අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය හා තුලනාත්මක බව

වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් අට (08) දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉහළ ස්වාධීන අධ්‍යක්ෂක නියෝජනයක් නිරූපණය කරයි. සියලුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අතර, තිදෙනක් 2018/2019 මූල්‍ය වර්ෂය තුළ ස්වාධීන අධ්‍යක්ෂවරු වූහ.

මෙම පසුබිම තුළ නියෝජ්‍ය සභාපති අමීර්තනායගම් මහතා 2019 ජුනි මස 13 වන දින සීමා සහිත ලංකා එලායන්ස් ෆිනෑන්ස් හි අධ්‍යක්ෂක මණ්ඩලයෙන් ඉල්ලා අස් විය. එතැන් සිට අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත විය. ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුගේ සේවා කාලය වසර නවයක් නොඉක්මවන බව සහතික කරයි.

ආයතනයේ ස්වභාවය හා විෂය පථය සැලකිල්ලට ගනිමින් කාර්‍යක්ෂම තීරණ ගැනීමේදී මැදිහත් නොවී අධ්‍යක්ෂ මණ්ඩලයේ වර්තමාන සංයුතිය හා ප්‍රමාණය ප්‍රමාණවත් විවිධත්වයක් සපයන බව අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි.

ගතික ව්‍යාපාරික පරිසරය තුළ තරගකාරීව සිටීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සමබරතාවය ඉතා වැදගත් වේ. ඒ අනුව, සෑම වසරකම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමාණය හා සංයුතිය හා සාමාජිකයින්ගේ කුසලතා හා නිපුණතා සමාලෝචනය කරනු ලබන්නේ සුදුසු කුසලතා,පළපුරුද්ද සහ වයස සමතුලිතතාවය සහතික කිරීම සඳහාය. නිපුණතා සඳහා ඇතුළත් වනුයේ බැංකුකරණය, ගිණුම්කරණ සහ මූල්‍ය, ව්‍යාපාර දක්ෂතා, කර්මාන්ත දැනුම, නෛතික දැනුම සහ නියාමන අවශ්‍යතා සහ අවදාන්ම් කළමණාකරණයි, සමාගම ඵලදායි ලෙස මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා අවශ්‍ය දැනුම හා නිපුණතා එහි අධ්‍යක්ෂවරුන් සතුව ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සලකයි.

# ආයතනික පාලනය

වගකිවයුතු භාරකරුවන් වීම

## අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

### ස්වාධීන හා ස්වාධීන නොවන අධ්‍යක්ෂවරු

විධායක නොවන අධ්‍යක්ෂවරු



සභාපති

උප සභාපති

ස්වාධීන නොවන අධ්‍යක්ෂවරු

ස්වාධීන අධ්‍යක්ෂවරු

### වයස් සංයුතිය අනුව




**2** අධ්‍යක්ෂවරු (වසර 60-70 දක්වා)

**1** අධ්‍යක්ෂක (වසර 40-50 දක්වා)

**5** අධ්‍යක්ෂවරු (වසර 50-60 දක්වා)

### සාමාජිකයින්ගේ සේවා කාලය




**5** අධ්‍යක්ෂකවරු (වසර 3 සිට 6 දක්වා)

**3** අධ්‍යක්ෂවරු (වසර 0 සිට 3 දක්වා)

### විශේෂඥ විවිධත්වය



# ආයතනික පාලනය

GRI 102-23 GRI 102-26

## සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී

ආයතනික පාලනයේ හොඳම භාවිතයන්ට අනුකූලව සභාපතිගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යයන්හි පැහැදිලි වෙනස්කම් දැකිය හැක. මේ තුළින් තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කිසිදු අධ්‍යක්ෂවරයෙකුට අසීමිත බලයක් නොමැති බව තහවුරු වෙයි. ප්‍රධාන විධායක නිලධාරියා විධායක කාර්යයන් ඉටු කරන අතර, සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් ඵලදායි ලෙස ඉටු කිරීමට පහසුකම් සලසයි.

### සභාපතිතුමාගේ කාර්යභාරය

- අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ, අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල සහ තනි තනි අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායිතාව සහතික කිරීම
- ආයතනික පාලනය උසස් මට්ටමකින් පවත්වා ගැනීම
- අධ්‍යක්ෂ මණ්ඩල විවාද සඳහා විවෘත පරිසරයක් ඇති කිරීම තුළින් සියලු දෙනාට සහභාගිවීමට සමාන අවස්ථාවක් ලබා දීම
- අධ්‍යක්ෂ මණ්ඩල න්‍යාය පත්‍රය අනුමාන කිරීම සහ වැදගත් කරුණු සාකච්ඡා කිරීමට ප්‍රමාණවත් කාලයක් වෙන් කිරීම
- ප්‍රධාන විධායක නිලධාරියාට සහ කළමනාකරණයට අවශ්‍ය අධීක්ෂණය, උපදෙස් සහ මඟපෙන්වීම ලබා දීම



### ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරය

- ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉහළ කළමනාකරණයට ඵලදායි නායකත්වයක් සැපයීම
- අධ්‍යක්ෂ මණ්ඩලයට හා කළමනාකාරිත්වයට වැඩිපුර රාජකාරීන් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද අවදානම් ප්‍රතිපත්තීන් හා අරමුණුවලට අනුකූලව සක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණය අතර පහසුකම් සැපයීම (සම්බන්ධීකරණය කිරීම)
- ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අවදානම් රුචිය මත ආයතනය මෙහෙයවීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත උපායමාර්ගික අරමුණු, ආයතනික වටිනාකම් හා අධීක්ෂණයේ ප්‍රගතීන් සන්නිවේදනය කිරීම සඳහා පහසුකම් සැපයීම
- සමාගම සහ එහි පරිපාලිත සමාගම් අතර, ස්වාධීනත්වය හා ගැටුම් වළක්වාගැනීමේ අරමුණින් සමාගම ආරක්ෂා කර ගැනීම
- මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම
- ආයතනයේ කාර්යයන් ප්‍රථමව හා කාර්යක්ෂමව පවත්වා ගැනීමේ අරමුණින් අනුප්‍රාප්තික විධායක කණ්ඩායමක් හඳුනා ගැනීම හා ගොඩනැගීම.
- බැංකු නොවන මූල්‍ය ආයතනවලට අදාල නීති රීති පිළිපැදීම.

# ආයතනික පාලනය

වගකිවයුතු භාරකරුවන් වීම

GRI 102-26

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම

යහපත් ආයතනික පාලනයක් සඳහා ඵලදායී හා ශක්තිමත් අධ්‍යක්ෂ මණ්ඩලයක සාමාජිකයින් ඔවුන්ගේ විවෘත හා නිර්මාණාත්මක මතයක් ඉදිරිපත් කළ යුතු බව අධ්‍යක්ෂක මණ්ඩලයේ මතයයි.

නායකත්වය හා උපායමාර්ග සැකසීම, අවදානම් කළමනාකරණය සහ පාලනය සහ අධීක්ෂණය හා කාර්යසාධනය ඉහළ දැමීම අධ්‍යක්ෂක මණ්ඩලයේ ප්‍රධාන වගකීම් වේ.




GRI 102-27

## මූල්‍ය බුද්ධිය

සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය බැංකුකරණය, ගිණුම්කරණය, කළමනාකරණය, මානව සම්පත් අලෙවිකරණය හා අධ්‍යාපනික යන ක්‍රියාවන්හි ප්‍රවීන වෘත්තිකයන්ගෙන් සමන්විත වේ. මූල්‍යමය කටයුතු සඳහා මගපෙන්වීමට මූල්‍ය දැනුමකින් හා මූල්‍ය බුද්ධියකින් හෙබි වරලත් ගණකාධිකාරීවරුන් තුන්දෙනෙකු අධ්‍යක්ෂක මණ්ඩලය තුළ සිටී.

- ජෙහාන් අමරතුංග මහතා
- රසිත ගුණවර්ධන මහතා
- කෙනඩි ගුණවර්ධන මහතා

ඊට අමතරව, නවක ප්‍රවීනතා හා ගැටළු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුම යාවත්කාලීන කරගැනීම සඳහා ගිණුම්කරණ හා නීතිමය ප්‍රමිතීන්වල වෙනස්වීම අඛණ්ඩව දැනුම මුවහත් කර ගනී.

GRI 102-24

## අධ්‍යක්ෂ මණ්ඩලය පත්වීම හා නැවත තේරී පත්වීම

අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා පත්කර ගැනීම සඳහා අධ්‍යක්ෂකවරුන් නම් කිරීමේදී විනිවිදභාවය ඉහළ නැංවීමේ අරමුණින් සමාගම විසින් විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කරයි. වේතන හා නාමයෝජනා කමිටුව විසින් පහත ක්‍රියාවලිය අනුගමනය කරනු ලැබේ.

- වර්තමාන අධ්‍යක්ෂක මණ්ඩලයේ කුසලතා, දැනුම හා අත්දැකීම්වල තුලනාත්මක බව ඇගයීම සහ අධ්‍යක්ෂවරයකු පත්කර ගැනීමේදී නව අධ්‍යක්ෂකවරයාගේ තිබිය යුතු ගුණාංග තීරණය කිරීම.
- නව අධ්‍යක්ෂවරුන්ගේ ගුණාංග අනුමත කිරීමෙන් පසුව අවශ්‍ය ගුණාංග අපේක්ෂකයනි ආකර්ෂණය කරගැනීම සහ තෝරා පත්කර ගැනීම ආරම්භ කරන ලදී.
- සුදුසුකම්ලත් අපේක්ෂකයන්ගේ යෝග්‍යතාවය පිළිබඳ ඇගයීම් කිරීම හා තෝරාගත් අපේක්ෂකයන්ගෙන් ව්‍යාපාරය බලාපොරොත්තු වන දෑ පිළිබඳ දැනුවත් කිරීම
- ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතියට යටත්ව වඩාත්ම යෝග්‍ය අපේක්ෂකයා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියට යෝජනා කිරීම

ඉහත සඳහන් ක්‍රියාපටිපාටිය අනුව, හිස් වූ පුරප්පාඩු සඳහා 2018 ඔක්තෝබර් 9 වැනි දින ආචාර්ය කෙනඩි ගුණවර්ධන සහ කීර්ති වීරසිංහ මහත්වරුන් අධ්‍යක්ෂක මණ්ඩලයට පත් කරන ලදී. ආර්. එම්. ජයසේන මහතා සහ ආචාර්ය ඒ. ඒ. එස්. ගුලාම්හුසෙන් යන අධ්‍යක්ෂකවරුන් අධ්‍යක්ෂක ධූරයෙන් ඉල්ලා අස්වූ අතර, එම වෙනස ක්ෂණිකව කොළඹ ව්‍යාපාර කොටස් හුවමාරුවේ අනාවරණයක් ලෙස කොටස්කරුවන් දැනුවත් කරන ලදී.

ඊට අමතරව, සාංගමික ව්‍යවස්ථාවලියට අනුව අධ්‍යක්ෂක ධූරයට අලුතින් තේරී පත් වූ අධ්‍යක්ෂකවරුන්ගේ ධූරකාලය ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීමේදී නැවත තේරී පත්වීමට සුදුසුකම් ලබයි. ඒ අනුව ආචාර්ය ගුණවර්ධන සහ වීරසිංහ මහත්වරුන් ඊළඟ වාර්ෂික සභා සභා රැස්වීම තුළදී නැවත තේරී පත්වීමට නියමිතයි.

පිටු අංක 204 සඳහන් වේතන හා නාමයෝජනා කමිටු වාර්තාවේ නාම යෝජනා ඉදිරිපත් කිරීම. අධ්‍යක්ෂකවරුන් පත්කිරීම පිළිබඳ සවිස්තරාත්මකව සඳහන් කර ඇත.

# ආයතනික පාලනය

GRI 102-27

## අඛණ්ඩ පුහුණුව

අලුතින් පත් කරන ලද සියලුම අධ්‍යක්ෂවරුන් ව්‍යුහාත්මක ප්‍රේරණයකට භාජනය වන අතර එමගින් අදාළ පාලන තොරතුරු, සමාගමේ ප්‍රතිපත්ති, ප්‍රධාන වාර්තා සහ අදාළ රෙගුලාසි සහ ප්‍රතිපත්ති සාමාජිකයින් හඳුන්වා දෙනු ලැබේ. ප්‍රධාන කළමණාකරණ නිලධාරීන්ට සහ සමාගමේ මෙහෙයුම් ක්‍රියාවලිය සඳහා නව අධ්‍යක්ෂවරුන් හඳුන්වා දෙනු ලැබේ.

ඒ අනුව, අලුතින් පත් කරන ලද අධක්ෂවරුන් වන ආචාර්ය ගුණවර්ධන සහ වීරසිංහ මහතාට සමාගම, ව්‍යාපාරය, පාලන පිළිවෙත්, වර්ධන උපාය මාර්ග සහ සමාගම මුහුණ දෙන අවදානම් පිළිබඳව ගැඹුරු විස්තරයක් ලබා දෙන ලදී.

අඛණ්ඩ වර්ධනයට සහ අධ්‍යක්ෂවරුන්ගේ රාජකාරී ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා පුහුණුව ඉතා වැදගත් බව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. පුහුණු අවශ්‍යතා එකතු කිරීම සහ අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණුව සංවිධානය කිරීම සමාගමේ ලේකම්ගේ වගකීම වේ. වර්තමාන ප්‍රවණතාවයන් ට අනුකූලව වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා විවිධ පුහුණු වැඩසටහන් සංවිධානය කර අතර, අධ්‍යක්ෂවරුන්ගේ පෞද්ගලිකක හැකියාවන් අනුව අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය ( සී.පී.ඩී) ද අධ්‍යක්ෂවරුන්ගේ පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා දායක වේ.

GRI 102-25

## බැඳී යාම පිළිබඳ ගැටුම් කළමණාකරණය සහ ස්වාධීනත්වය සහතික කිරීම

අදාළ රෙගුලාසිවලට අනුකූලව, යහපත් සිතිවිලි වලින් යුතුව කටයුතු කළ අතර පාර්ශවකරුවන්ගේ සහ සමස්ථයක් වශයෙන් සමාගමේ යහපත වෙනුවෙන් ඔවුන්ගේ බලතල ක්‍රියාත්මක කරන ලදී.

ස්වාධීන අධ්‍යක්ෂවරුන් ලෙෂ හඳුනා ගැනෙන්නේ සමූහ ව්‍යාපාරය එහි ආශ්‍රිත සමාගම්, නිලධාරීන් හා 10% වඩා අයිතියක් හිමි මෙන්ම ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුගේ ස්වාධීන තීන්දු වලට සුදුසු බලපෑමක් කල හැකි කොටස්කරුවන් සමග කිසිදු සම්බන්ධයක් නොමැති අධ්‍යක්ෂවරුන්ය.

වේතන හා නාමයෝජනා කමිටුව අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීන වාර්ෂික පදනමින් සමාලෝචනය කරයි. එසේම අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන නොවන බවට පත් කරන ඕනෑම අවස්ථාවකදී ඉහත සමාලෝචනය සිදු කරයි. වේතන හා නාමයෝජනා කමිටුව විසින් සාකච්ඡා කරනු ලබන ඔවුන්ගේ ස්වාධීනත්වය පිළබඳ වාර්ෂික ප්‍රකාශයක් අධ්‍යක්ෂවරුන් ගෙන් අපේක්ෂා කෙරේ.

සමාලෝචනයේදී කේතයට අනුව තුනෙන් දෙක ස්වාධීන අවශ්‍යතාවය සපුරා නොමැති බව සටහන් වූ අතර, එය අවම කිරීම සඳහා වහාම පියවර ගන්නා ලදී .ඒ අනුව, අමීර්තනායගම් මහතා සමාග මේ අනුබද්ධ සමාගමක් වන, ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ ධූරයෙන් ඉල්ලා අස්වීම සමග ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව 4 දක්වා වැඩි විය. මීට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය සේවයේ ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් බැඳියාව පිළිබඳ ගැටුම් අවම කර ගැනීමේ අරමුණින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කටයුතු අධීක්ෂණය කිරීම සඳහා පත් කරන ලදී.

වේතනය හා නාමයෝජනා කමිටුවේ අදහස් සැලකිල්ලට ගෙන පහත සඳහන් අධ්‍යක්ෂවරුන් සමාගමේ ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් ලෙස මණ්ඩලය සලකයි. අනෙක් සියලුම අධ්‍යක්ෂවරුන් ස්වාධීන අධ්‍යක්ෂවරුන් ලෙස සැලකේ.

## මණ්ඩල අනුකමිටු

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ මණ්ඩල අනුකමිටුවලට යම් යම් කාර්‍යයන් පවරා ඇත.

- මණ්ඩල විගණන කමිටුව
- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව
- වේතන හා නාමයෝජනා කමිටුව
- සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව

සෑම මණ්ඩල අනුකමිටුවකටම තමන්ගේම යොමු කොන්දේසි ඇති අතර ඒවායේ ක්‍රියාකාරකම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධීක්ෂණය සඳහා වාර්තා කරනු ලැබේ. සියළුම අධ්‍යක්ෂවරුන් යථායෝගීව හා ස්වාධීනව විනිශ්චය ඉදිරිපත් කරන අතර සමාග මේ සමස්ථ අභිවෘද්ධිය සඳහා තීරණ ගනී.

| අධ්‍යක්ෂකගේ නම | ස්වාධීන නොවීමට හේතුව |
|---|---|
| හේමසිරි ප්‍රනාන්දු මහතා | සමූහයේ මව් සමාගමේ අධ්‍යක්ෂක අනුබද්ධිත සමාග මේ සභාපති - පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රෙපටීස් ලිමිටඩ්, අනුබද්ධ සමාගමේ අධ්‍යක්ෂ - පීපල්ස් ලීසිං ප්‍රොපටි ඩිවලොප්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං මැනේජ්මන්ඩ් සහ ලංකන් ඒලියන්ස් ෆිනෑන්ස් සීමිත බංග්ලාදේශය. |
| ජෙහාන් ප්‍රසන්න අමරතුංග මහතා | අනුබද්ධිත සමාගමේ සභාපති පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී, අනුබද්ධිත සමාගමේ අධ්‍යක්ෂක පීපල්ස් මයික්‍රෝ කොමස් එල්.ටී.ඩී, ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්, බංගලාදේශය |
| ගොලුහේවගේ බින්දු රසිත පූජිත ගුණවර්ධන | සමූහයේ මව් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී මහජන බැංකුව, අනුබද්ධිත සමාගමේ අධ්‍යක්ෂක පීපල්ස් ලීසිං මැනේජ්මන්ට් ලිමිටඩ්, ලංකන් එලියන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් බංග්ලාදේශය |
| ජොන්සන් ඇන්තනී ප්‍රනාන්දු මහතා | අනුබද්ධිත සමාගමේ සභාපති ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්, බංග්ලාදේශය |

# ආයතනික පාලනය



| අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුන් | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුන් | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුන් | වැටුප් හා නාමයෝජනා කමිටුව | සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව |
|---|---|---|---|---|
| **සභාපති** | ජේ.පී. අමරතුංග | එම්.පී. අමීර්තනායගම් | ජේ.පී. අමරතුංග | එම්.පී. අමීර්තනායගම් |
| **සාමාජිකයින්** | එම්.පී. අමීර්තනායගම්<br>එම්.එච්.එම්. රිස්වාන් | ජී.බී.ආර්.පී.ගුණවර්ධන<br>එම්.ඒ.එම්. රිස්වාන්<br>ඒ. එස්. ඉබ්‍රහිම්<br>සංජීව බණ්ඩාරනායක<br>ලයනල් ප්‍රනාන්දු<br>රොහාන් තෙන්නකෝන් | එම්.පී. අමීර්තනායගම්<br>ජේ.ඒ. ප්‍රනාන්දු | ජේ. ඒ. ප්‍රනාන්දු<br>එම්.ඒ.එම්. රිස්වාන් |
| **න්‍යාය පත්‍රය** | පවතී | පවතී | පවතී | පවතී |
| **ලේකම්** | යු. ගුණවර්ධන | ඒ.අයි. අමරසිංහ | කේ.ජී.එල්.බී. කොට්ටේගොඩ | කේ.ජී.එල්.බී. කෝට්ටේගොඩ |
| **ආරාධිතයින්** | ප්‍ර. විධායක/සාමාන්‍යාධිකාරී | ප්‍ර. විධායක/සාමාන්‍යාධිකාරී | ප්‍ර. විධායක/සාමාන්‍යාධිකාරී | ප්‍ර. විධායක/සාමාන්‍යාධිකාරී |
| **විෂය පථය** | මූල්‍ය තොරතුරුවල විශ්වාසනීයත්වය නියාමනය. ආයතනයේ අභ්‍යන්තර පාලනයන් හා අවධානම් කළමනාකරණ ක්‍රමවේදයන් සමාලෝචනය සහ මූල්‍ය වාර්තාකරණය අවශ්‍යතාවයන්ට අනුගතවීම සහතිකවීම | ආයතනයේ අවදානම් ආකෘතීන් තක්සේරු කිරීම සහ කළමනාකරණය කරගතහැකි මට්ටමින් අවදානම් ආකෘතිය නඩත්තු කිරීම සහතික කිරීම | විධායක අධ්‍යක්ෂකවරුන්ගේ පාරිශ්‍රමික සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම හා අධ්‍යක්ෂක මණ්ඩලයට සාමාජිකයන් පත්කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය පිළිබඳ උපදෙස් ලබාදීම. | ආයතනය හා සම්බන්ධ පාර්ශ්ව ගනුදෙනු නියාමනය කිරීම හා "තෙවන පාර්ශ්වයන්ට ප්‍රදානය කළ පක්ෂපාති සැලකිල්ල" ආයතනයට සෘජුව සම්බන්ධිත පාර්ශ්ව සඳහා ප්‍රදානය නොකිරීම සහතිකවීම |
| **කමිටු වාර්තා යොමුව** | පිටු 202 හා 203 | පිටු 206 හා 208 | පිටු 204 | පිටු 205 |

GRI 102-33

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව මෙන්ම අත්‍යවශ්‍ය සාකච්ඡාවට බඳුන් වියයුතු හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අවශ්‍ය කරුණක් සම්මත කරගැනීමට පවත්වනු ලැබේ. වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දහතුනක් පැවැත්වූ අතර, සමාගමේ උපායමාර්ග ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා විධායක කළමනාකාරීත්වය සහාය වීම සඳහා රැස්වීම්වලදී උපායමාර්ග, මූල්‍ය අවදානම් පාලනය සහ අනුකූලතාව ඇතුළු පුළුල් පරාසයක කරුණු සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය.

## රැස්වීම් අතරතුර කාර්යක්ෂමතාව පවත්වාගෙන යාම

පවත්වන ලද රැස්වීම්වල කාර්යක්ෂමතාව උපරිම කිරීම හා රැස්වීම්වලදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ උපරිම කැපවීම ලබාගැනීම පිණිස පහත දැක්වෙන පියවරයන් ආයතන රැස්වීම් හා අඩංගු කර ඇත:

**රැස්වීමට පෙර සූදානම**

- පෙර උපලේඛනය කිරීම.
- නම්‍යශීලී මූලධාතූන් සහිත වූ තර්කානුකූල න්‍යාය පත්‍රයක් සංවර්ධනය කිරිම.
- න්‍යාය පත්‍රයේ අඩංගු වූ අයිතම සම්බන්ධ පරිපූරක තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම.
- අධ්‍යක්ෂවරයෙකුට රැස්වීම් සඳහා ඉදිරිපත් විය නොහැකි අවස්ථාවන්හිදි විකල්ප අධ්‍යක්ෂකවරයෙකු පත්කර ගැනීමට ඇති හැකියාව.
- අවශ්‍ය වූ විට ස්වාධීනව උපදෙස් ලබා ගැනීමට කැමැත්ත පරිදි බලය පවරා ඇත.

**රැස්වීම් අතරතුර**

- සියලුම අධ්‍යක්ෂකවරුන් අතර විවෘත සාකච්ඡා ඇතිවීම ධෛර්යමත් කිරීම.
- අර්ථාන්විත සාකච්ඡා සඳහා පෙළඹවීමක් හා සූදානමක් ඇති කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු තුළ සාකච්ඡා කළ කරුණු පිළිබඳව විස්තරාත්මක යාවත්කාලීනයන් ඉදිරිපත් කිරීම. කළමනාකරණය විසින් ඉදිරිපත් කරනු ලැබූ කර්මාන්ත උපනතීන් සහිත වූ මෙහෙයුම් හා මූල්‍ය ක්‍රියාකාරීත්වයේ සම්පූර්ණ හා පරිපූර්ණ වූ තොරතුරු ග්‍රහණය කිරිම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අතරතුර අවශ්‍ය වන අවස්ථාවන්හිදී එම අවස්ථාවන්ට ප්‍රධානීන් අධ්‍යක්ෂ මණ්ඩල යොමුවීම් සඳහා තොරතුරු සැපයීමට සූදානම්ව සිටීම.

# ආයතනික පාලනය

## තොරතුරු සැපයීම

අධ්‍යක්ෂවරුන්ට තම වගකීම් හා රාජකාරීන් කාර්යක්ෂමව සිදුකිරීමට උපකාරීවන ආකාරයට පරිපූර්ණ ප්‍රමාණවත් තොරතුරු යථා කාලීනව ගලායෑම සහතිකවීම කේන්ද්‍රීය කරුණකි. අධ්‍යක්ෂ මණ්ඩලයට හා අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාකච්ඡා සඳහා විෂය වන පත්‍රිකා විමර්ශනය කර ඒ සඳහා පෙර සූදානමක් ඇතිවන ලෙසට කාලවේලා සහිතව සමාජයන් වෙත යොමුකරයි. එම තොරතුරුවලට අමතර වශයෙන් අධ්‍යක්ෂකවරුන් ඉල්ලා සිටින අතිරේක තොරතුරු ද ලබාදීම සිදුවේ.

සිද්ධීන්, අවධානම් විශ්ලේෂණය සහ අවම කිරීමේ මූලෝපායයන් මූල්‍යමය බලපෑම, නියාමන අනුමිතයන් සහ අපෙක්ෂිත ප්‍රතිඵලයන් සමබන්ධ පසුබිමක් ඇති විවිධ යෝජනා වලියන් කළමණාකරණය විසින් මෙහිදී අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය සඳහා යොමු කරයි. යම් යම් කරුනු සම්බන්ධයෙන් සැඟව ඇති සත්‍ය හෙලි දරව් කලහැකි සේවාදායකයන්ට ද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අධ්‍යක්ෂ මණ්ඩල කමිටු රැස්වීම්වලට ආරාධනා කරනු ඇත. යථාවත් කිරීම සම්බන්ධයෙන් වූ නිෂ්ධය වූ අවධානයන් සහිතව ආයතනයේ මෙහෙයුම පිළිබඳ මාසික පදනමින් අධ්‍යක්ෂක මණ්ඩලය යාවත්කාලීන කිරීමට කටයුතු සලසා ඇත. තවද හය මාසිකව සිදුවන වෙළෙඳපොල තුළ සැඟව ඇති කරුණු විමර්ශනය කෙරෙහි අධ්‍යක්ෂකවරුන්ගේ අවධානයට යොමු කර ආයතන මෙහෙයුම් සඳහා උරෙනුර ගැටී කටයුතු කිරීමට පොලඹවයි.

## අධ්‍යක්ෂක මණ්ඩලය කේන්ද්‍රගතවීම

වර්ෂය තුළ මූලෝපාය, මෙහෙයුම්, පාලනය, මූල්‍ය සහ ක්‍රියාන්විතයන්ට අදාළ වූ විවිධ පැතිකඩයන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පරීක්ෂාවට යොමුවිය. ඒ සඳහා ගතකරනු ලැබූ කාලයන් පහත රූප සටහන මගින් පැහැදිලි වේ.

### අධ්‍යක්ෂ මණ්ඩල අවධානයට යොමු කල විෂය පථ




GRI 102-34

### අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම තුල සාකච්ඡාකල විශේෂ කරුණු

**2018 අප්‍රේල්**
- අයකර ගැනීමේ තත්ත්වයන් නියාමනය සහ උපදෙස් සැපයීම සඳහා උපදේශකයෙකු පත්කර ගැනීම
- ණය පියවීමට ඇති හැකියාව පිළිබඳ පරීක්ෂාවකින් ලැබුණ ප්‍රතිඵලය මත කොටසකට රු 0.50 ලාභාංශයක් ප්‍රකාශ කරන ලදී

**මැයි**
- අධ්‍යක්ෂකවරුන්ගේ කාර්යක්ෂමතාවය මැනීමට ස්වතක්සේරු පරීක්ෂාවක් සිදු කරන ලදී
- පාරිභෝගිකයින්ට ලඟාවීමට ඇති හැකියාව පුලුල් කිරීමට ශාඛා ජාලය ව්‍යාප්ත කිරීම
- විවිධ හැකියාවන් සහිත දරුවන් සඳහා සී එස් ආර් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අනුමැතිය ලැබීම

**ජූනි**
- සම්පත් ආරක්ෂණ සමාලෝචනය

**ජූලි**
- මූලෝපාය සැලසුම් හා පරීක්ෂාව සැකසූ පාලන යන්ත්‍රය සමග ආයතන ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීම
- වර්ෂය තුල හඳුන්වාදුන් ණය නිෂ්පාදන පිළිබඳ අත්පොත් සඳහා අනුමැතිය ලබාගැනීම

**අගෝස්තු**
- පාලන අවශ්‍යතාවයන් හා අනුගතවන ආකාරයට සේවය අවසන් කර

**සැප්තැම්බර්**
- දේපළ උකස් කිරීම් සම්බන්ධයෙන් විනිවිධභාවයකින් හා කාර්යක්ෂම ක්‍රමවේදයක් පිහිටුවා ගැනීම සඳහා නිශ්චල වත්කම් අගය කිරීමේ හා පරීක්ෂා කිරීමේ ප්‍රතිපත්තියක් සඳහා අනුමැතිය ලැබීම

**ඔක්තෝබර්**
- මූල්‍ය වාර්තාකරණය හා නියාමනය වැඩිදියුණු කිරීමට බංගලාදේශ මෙහෙයුම් සඳහා ප්‍රධාන මූල්‍ය නිළධාරීවරයෙකු පත් කිරීම

**නොවැම්බර්**
- ආයතන කාර්යමණ්ඩලය සඳහා ව්‍යවස්ථාපිත හා වෙනත් ප්‍රතිලාභ ගෙවීමට අනුමැතිය
- සී සී ටී වී මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමැතිය

**දෙසැම්බර්**
- ආයතන නියම කළ අවදානම් ප්‍රතිලාභය තුළට සීමාවීම සහතිකවීම සඳහා අවධානම් සම්බන්ධ ඔරොත්තුදීමේ ලේඛණයක් සංවර්ධනය කිරීම

**2019 ජනවාරි**
- කායික ක්‍රියාකාරීත්වයන් අවම කිරීම හා පහසුව වර්ධනය කිරීමට නිළධාරීන්ට කරන සංචාරක ගෙවීම් ඩිජිටල්කරණය කිරීම
- ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි සහ දුක්ගැනවිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය අනුමත කිරීම

**මාර්තු**
- ආවරණය කරනු ලබන විෂය පථය පුළුල් කිරීම සඳහා අතිරේක විධායක කමිටුවක් පිහිටුවීම

# ආයතනික පාලනය

වගකිවයුතු භාරකරුවන් වීම

## අධ්‍යක්ෂ මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාකච්ඡා සඳහා සහභාගිත්වය

අධ්‍යක්ෂක මණ්ඩලය මසකට වරක් රැස්වෙන අතර ස්වාධීන හදිසි කරුණු සම්බන්ධයෙන් ගත් කාර්ය සාකච්ඡා කැඳවනු ඇත.

වර්ෂය තුළ අධ්‍යක්ෂක මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල කමිටු රැස්වීම් වාර ගණනාවක් පැවැත්වේ. එමෙන්ම සහභාගි වූ සෑම සාමාජිකයෙකු සම්බන්දයෙන් වූ සහභාගිත්ව තොරතුරු පහත අණාවරනය කෙරේ:

| අධ්‍යක්ෂ නාමය | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර ගණන | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු | සංකලිත අවධානම් කළමනාකරන කමිටු රැස්වීම් වාර | වැටුප් හා නාමයෝජනා කමිටු රැස්වීම් වාර | සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමායෝජන කමිටු රැස්වීම |
|---|---|---|---|---|---|
| හේමසිරි ප්‍රනාන්දු | 11/13 | – | – | – | – |
| මයිකල් ප්‍රදීප් අමිර්තනායගම් | 13/13 | 10/10 | 4/4 | 6/6 | 4/4 |
| ජෙහාන් ප්‍රසන්න අමරතුංග | 11/13 | 10/10 | – | 5/6 | – |
| ජොන්සන් ඇන්තනි ප්‍රනාන්දු | 12/13 | – | – | 5/6 | 3/4 |
| මොහොමඩ් අනිස් මොහොමඩ් රිස්වාන් | 13/13 | 10/10 | 4/4 | – | 3/4 |
| ගොළුහේවගේ බිංදු රාසිත පූජිත ගුණවර්ධන | 13/13 | – | 4/4 | – | – |
| ආර්.එම්. ජයසේන | 2/2 | – | – | – | – |
| අල් අස්ගර් සාබිර් ගුලාම් හුසේන් | 3/6 | – | – | – | – |
| ආචාර්ය කෙනඩි ඩෙගාවුල්ලේ ගුණවර්ධන | 6/7 | – | – | – | – |
| නාමුගොඩ විජේසිංහ අතපත්තු මුදියන්සේලාගේ උඩවත්ත කීර්ති කුමාර එඩ්වඩ් වීරසිංහ | 7/7 | – | – | – | – |

GRI 102-28

## අධ්‍යක්ෂ මණ්ඩලයේ හා විධායක කළමණාකාරිත්වයේ කාර්යක්ෂමතාව

### අධ්‍යක්ෂක මණ්ඩල තක්සේරුව

සෑම අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු මෙන්ම සම්පූර්ණ අධ්‍යක්ෂක මණ්ඩලයේ කාර්යක්ෂමතාව පිළිබඳව වාර්ෂිකව පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටුව මගින් තක්සේරු කිරීමක් සිදු කරයි. මෙම තක්සේරුව සඳහා තෙවැදෑරුම් මූලිකාංගයන් අඩංගු කර ඇත. එනම්

1. ස්වයං තක්සේරුව
2. අධ්‍යක්ෂක මණ්ඩලයේ තක්සේරුව හා
3. සමාන තත්ත්වයේ නිළධාරීන්ගේ ඇගයීම් යනාදිය වේ.

එක් එක් අධ්‍යක්ෂකවරයා මෙන්ම අධ්‍යක්ෂක මණ්ඩලයම සඳහා ඉලක්ක ගත තරගකාරීත්ව, සමුච්ඡයක් පාරශ්‍රමික හා නාමයෝජනා කමිටුව ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය ඇගයීම පිණිස පිහිටුවා ඇත.

| අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය සාධන මිනුම් දඬු | එක් එක් අධ්‍යක්ෂකවරයාගේ කාර්ය සාදක මිනුම් දඬු |
|---|---|
| විශාලත්වය හා සංයෝජනය | ක්‍රියාකාරී ඉදිරිපත්වීම හා අනෙකුත් විධානයන් සමග ගැලපීම |
| ස්වාධීනත්වය | කර්මාන්ත හා ව්‍යාපාර දැනුම |
| අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රීයාසන්තතින් | අධ්‍යක්ෂකවරයෙකු ලෙස කාර්යක්ෂමව තම කාර්යයන් ඉදිරිපත් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සම්බන්ධයෙන් දායකත්වය |
| සන්නිවේදනය හා වගකිවයුතු බව | දැනුමදීමක් මත අධ්‍යක්ෂවරයෙකු වශයෙන් රැස්වීම්වලට ඉදිරිපත් වීමේ හැකියාව |
| ප්‍රධාන ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම | අධක්ෂකවරයාගේ පරිපූර්ණ කාර්ය සාධනය |
| මූල්‍යමය ඉලක්ක සක්ෂාත් කරගැනීම | |

# ආයතනික පාලනය

සභාපති සහ නියෝජ්‍ය සභාපති විසින් පසුගිය වසරේ ප්‍රතිඵල අනුව තනි අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං තක්සේරු කිරීම් සමාලෝචනය කරන අතර, හඳුනාගෙන ඇති හිඩැස් සඳහා වන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ඉස්මතු කරයි. මණ්ඩලය සහ එහි වරින්වර සමාලෝචනය කිරීම මණ්ඩලයේ අඛණ්ඩතාව අඛණ්ඩව පවත්වා ගැනීමට උපකාරී වේ.

2018/19 දී සිදු කරන ලද මණ්ඩලයේ ස්වයං ඇගයීම් ක්‍රියාවලිය සභාපති විසින් මෙහෙයවන ලද අතර මණ්ඩල ඇගයීම්වල සහය ඇතිව විශ්ලේෂණය කර 2019 ජූනි මාසයේ දී මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර එමගින් මණ්ඩලය සහ එහි කමිටු ඵලදායී ලෙස ක්‍රියාත්මක වූ බව නිසි ලෙස සනාථ විය.

## ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී ඇගයීම

මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධාරියා සමග සාකච්ඡා කර සමාගමේ කෙටි, මධ්‍යම හා උපායමාර්ගික අරමුණුවලට අනුකූලව සාධාරණ මූල්‍ය හා මූල්‍යමය නොවන ඉලක්කයන් වාර්ෂිකව ප්‍රධාන විධායක නිලධාරියා විසින් අත්පත් කර ගනු ලැබේ. ඉහළම විධායක නිලධාරියා ලෙස ප්‍රධාන විධායක නිලධාරියා වගකිව යුතුය. සමස්ත සමාගමේ මෙහෙයුම් සහ නියමිත ඉලක්ක සපුරා ගැනීම. ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්ය සාධනය මූල්‍ය වර්ෂය අවසානයේ දී නියමිත ඉලක්කවලට මෙන්ම මෙහෙයුම් පරිසරයේ පසුබිමට ද සමාලෝචනය කරනු ලබන අතර මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පෙර සභාපතිවරයා ප්‍රධාන විධායක නිලධාරියා සමග සාකච්ඡා කරනු ඇත.

## අනුප්‍රාප්තිය සැලසුම් කිරීම

අනුප්‍රාප්තිය සැලසුම් කිරීම පාලන ක්‍රියාවලියේ ප්‍රධාන අංගයකි. වේතන හා නාමයෝජනා කමිටුව උත්සහ කරන්නේ මණ්ඩලයේ සාමාජිකත්වය ක්‍රමානුකූලව හා පිළිවෙළට සකස් කිරීමටය. වැටුප් හා නාමයෝජනා කමිටුව, මණ්ඩලය සඳහා අනුප්‍රාප්තික හා නායකත්ව සංවර්ධන සැලසුම් සමාලෝචනය කරන අතර හඳුනාගත් අනුප්‍රාප්තිකයන් සඳහා සංවර්ධන සැලසුම් ස්ථාපිත කෙරේ.

GRI 102-35 GRI 102-36 GRI 102-37

## අධ්‍යක්ෂවරුන් සහ විධායක වේතන සහ ප්‍රතිලාභ

### ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටිය

අධ්‍යක්ෂවරුන්ගේ වේතනය පිළිබඳ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සඳහා විනිවිද පෙනෙන ක්‍රියා පටිපාටියක් සැකසීම සඳහා වේතන හා නාමයෝජනා කමිටුව වගකිව යුතුය.

සමස්තයක් ලෙස මණ්ඩලය තීරණය කරනුයේ වේතන හා නාමයෝජනා කමිටුවේ සාමාජිකයන් ඇතුළු විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ වේතනයයි.

විධායක අධ්‍යක්ෂවරුන්ගේ වේතනය තීරණය වන්නේ සභාපතිවරයා සහ/හෝ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්ය සාධනය මතය. සමාගමට මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරුන් නොමැති අතර ඔවුන්ගේ වැටුප් තීරණය කිරීමේ දී සභාපති/ ප්‍රධාන විධායක නිලධාරියාගෙන් උපදෙස් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

අවශ්‍ය යැයි සලකන විට වේතන හා නාම යෝජනා කමිටුව වේතන ප්‍රතිපත්තිය සැකසීමේදී සහ වේතනයේ මට්ටම හා මිශ්‍රණය තීරණය කිරීමේ දී බාහිර වේතන උපදේශකයින්ගෙන් උපදෙස් ලබා ගනී.

වේතන හා නාමයෝජනා කමිටුවේ සාමාජිකයින් හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ ඔවුන්ට ගෙවිය යුතු වේතනය සම්බන්ධ සාකච්ඡා කිරීමට සම්බන්ධ නොවේ.

### මට්ටම සහ වේතනය සෑදීම

වේතනයේ මට්ටම සහ මිශ්‍රණය නිර්දේශ කිරීමේදී, නාමයෝජනා කමිටුව අධ්‍යක්ෂවරුන් ආකර්ෂණය කර ගැනීම. රඳවා ගැනීම සහ පෙළඹවීම සඳහා රාමුවක් ස්ථාපිත කිරීමට උත්සාහ කරයි. වෙළෙඳපොළ අනුපාතයන්ට අනුකූල වන එවැනි වැටුප්, සමාගමේ දිගුකාලීන සාර්ථකත්වය සඳහා අවශ්‍ය ගුණාත්මක සේවකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. වෙළෙඳපොළ අනුපාත සමග පෙළගැස්වීම සහතික කිරීම වේතන ව්‍යුහය නිතර සමාලෝචනය කෙරේ.

විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට මණ්ඩලයේ සහ මණ්ඩල අනුකමිටුවල රැස්වීම්වලට සහභාගී වීම සඳහා ගාස්තුවක් ලැබේ. ගෙවනු ලබන එවැනි ගාස්තු කාර්ය සාධනය හා විශ්‍රාම වැටුප් නොවේ.

එසේ වුවද, ප්‍රධාන විධායක නිලධාරියාගේ වේතනයේ කාර්ය සාධනය හා සම්බන්ධ අනුපාතය පූර්ව නිශ්චිත ඉලක්ක සපුරා ගැනීම හා බැඳී පවතී.

වේතන හා නාමයෝජනා කමිටුවේ සංයුතිය සහ අනුගමනය කරන ප්‍රතිලාභ ක්‍රමවේදය පිළිබඳ වැඩි විස්තර සඳහා, 204 වන පිටුවේ ඇති වේතන හා නාමයෝජනා කමිටු වාර්තාව කාරුණිකව යොමු කරන්න.

## සමාගම් ලේකම්

අධ්‍යක්ෂවරුනට සමාගමේ ලේකම් හා බැඳී වෙන් වූ හා ස්වාධීන ප්‍රවේශයන් ඇත. සමාගමේ ලේකම්ගේ ප්‍රධාන කාර්යභාරයන් පහත පරිදි වේ.

- අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි නිරීක්ෂණය කිරීම සහ අදාළ විධිවිධාන සහතික කිරීම (සාංගමික ව්‍යවස්ථාවලිය, නීති හා රෙගුලාසි, සමාගම් පනත සහ සුරැකුම් හා විනිමය කොමිෂන් සභාව හි නීති රීති)
- දිගුකාලීනව පාර්ශ්වකරුවන්ගේ ආයතන කෙරෙහි ඇති උනන්දුව වැඩි කිරීම සඳහා ආයතනික පාලන රාමුව ක්‍රියාත්මක කිරීමේදී සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට සහය දැක්වීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයට, එහි අනුකමිටුවලට හා කළමනාකාරීත්වයට නිවැරදි තොරතුරු සහතික කිරීම.
- නව අධ්‍යක්ෂවරුනට අනුගත වීමට අවශ්‍ය පහසුකම් සැලසීමට සහ අධ්‍යක්ෂවරුන් නීතිමය වශයෙන් පුහුණු කිරීම හා දියුණු කිරීමට අවශ්‍ය කාර්යයන් සැලසුම් කිරීමෙහි නිරත වීම.
- ලැයිස්තුගත සමාගම් නීතිරීතිවලට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා ක්‍රියාවලි රාමුවක් නිර්මාණය කිරීම සහ ප්‍රධාන තොරතුරු නිවැරදි අනාවරණය කිරීමට අදාළව කළමනාකරණය දැනුවත් කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සම්බන්ධීකරණය කිරීම රැස්වීම් න්‍යාය පත්‍ර සකස් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය, අනුකමිටු හා කළමනාකාරීත්වය අතර සම්බන්ධීකරණය ඇති කිරීම.
- සමාගමේ ලේකම් පත් කිරීම සහ ඉවත් කිරීම මණ්ඩලයේ අනුමැතියට යටත් වේ.

සාංගමික ලේකම් පත් කිරීම හා ඉවත්කිරීම අධ්‍යක්ෂක මණ්ඩලය අනුමැතිය යටතේ සිදුවේ.

# ආයතනික පාලනය



GRI 102-19 GRI 102-20

## විධායක මට්ටමේ කමිටු

අධ්‍යක්ෂක මණ්ඩල කමිටුවලට අමතරව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලැබූ මූලෝපායන් ඉටුකර ගැනීමට පහසුවන ලෙස කර ඇති ප්‍රධාන විධායක නිලධාරී බලතල බෙදා හැරීම යටතේ විවිධ පැතිකඩයන් පිළිබඳ අවධානය යොමුකරනු ලැබූ අධ්‍යක්ෂක කමිටුවලට අතිරේකව ඇති වෙනත් විධායක මට්ටමේ කමිටු කිහිපයක් ඇත. සෑම කමිටුවක් සඳහා එයට ආවේණික බලතල සීමා ඇති අතර සංයුක්ත ක්‍රියාවලියක් අනුගමනය කෙරේ. එවැනි රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් වන ප්‍රධාන විධායක දැනුවත් කිරීම් නිරන්තරයෙන්ම සිදු කෙරේ.

| විධායක මට්ටමේ කමිටු | විෂය පරිපථ |
|---|---|
| කණ්ඩායම් කළමණාකරන කමිටු | කණ්ඩායම ක්‍රියාකාරීත්ව සමාලෝචනය, කණ්ඩායම් සහ ක්‍රියාවන්හි ප්‍රතිලාභයන් උපරිම වන ආකාරයට මූලෝපායන් ක්‍රියාත්මක කිරීම සහ කණ්ඩායම සමාගම්හි අධ්‍යක්ෂක මණ්ඩලයන්ට උග්‍ර මතභේදාත්මක කරුණු වාර්තා කිරීම හා ඒ සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම |
| ජ්‍යෙෂ්ඨ කළමණාකරන කමිටු | ආයතනය කෙරෙහි බලපවත්වන සියලු ආකාරයේ ප්‍රතිපත්තිමය කරුණු සහ ව්‍යාපාර මූලෝපායන් සමාලෝචනය සහ උග්‍ර මතභේදයනට හේතු කරුනු හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ සමගින් අධ්‍යක්ෂ මණ්ඩලය තුළින් ප්‍රධාන විධායකට සන්නිවේදනය කිරීම |
| වත්කම් හා වගකීම් කමිටු | ආයතන එයට අයත් ආයතන කණ්ඩායම තුළ ද්‍රවශීලතා මට්ටමේ තක්සේරුව සමාලෝචනය, වර්තමාන වෙළෙඳපොළ මනෝභාවයන් සහිත වූ නිෂ්පාදන දාමයන් විශ්ලේෂණය සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහිත වූ උග්‍ර මතභේදයන්ට තුඩුදුන් කරුණු සම්බන්ධයෙන් ඒකාබද්ධ අවදානම කමිටුවට වාර්තා කිරීම |
| ශාඛා ණය කමිටු | ශාඛා මට්ටමේ ණය පරිහරනය සහ ශාඛා බලතල ඉක්මවන ණය යෝජනා ඇගයීම, ප්‍රධාන කාර්යාලයීය මෙහෙයුම් දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම |
| ප්‍රසම්පාදන සමායෝජනා කමිටු | ටෙන්ඩර් පිරිනැමීමේ ක්‍රියාවලියේ සමාලෝචනය හා කලමණාකරනය කිරීම, සහ උග්‍ර මතභේදාත්මක කරුණු නිර්දේශිත නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග සමගින් ජ්‍යෙෂ්ඨ කලමණාකරන කමිටුවට වර්තා කිරීම |
| ඒකාබද්ද අවධානම කළමණාකරන මෙහෙයුම් කමිටු | ව්‍යාපාර සමූහයේ අවදානම් කළමනාකරණ ව්‍යුහය පිළිබඳ සමාලෝචනය කිරීම සහ ඒකාබද්ද අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කිරීම |
| පාලන නඩත්තු මෙහෙයුම් කමිටුව | ආර්ථික හා පාරසරික කොන්දේසි යටතේ පාලන නඩත්තුව සමාලෝචනය සහ සාමාජීය මුහුනුවරයන් සහ නිර්දේශයන් සහ මූලෝපාය පෝෂණය කිරීමේ මුලපුරණයන් අධ්‍යක්ෂක මණ්ඩලය තුළින් ප්‍රධාන විධායකට සන්නිවේදනය |

## සන්නිවේදනය හා කොටස්හිමියන් සමග සම්බන්ධවීම

### කොටස්හිමි සම්බන්ධතාවය

විනිවිධභාවය පවත්වා ගැනීමේ හා කොටස්හිමියන් සමග ඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගැනීමේ වැදගත්කම ආයතනය හඳුනාගෙන ඇත. කොටස්හිමියන් පාලනයට නතු නොකර කොටස්හිමියන්ට ඒකාකාරීව සැලකීම අධ්‍යක්ෂක මණ්ඩලය සනාථ කරනු ඇත.

ආයතනය කොටස්හිමියන් සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යාමට පහසුකම් සපයමින් ඔවුනගේ ගැටළු හා අවශ්‍යතාවයන් සඳහා විවිධ ආකාරයෙන් ඉදිරිපත්වීමක් සිදු කරයි.

- අධ්‍යක්ෂක මණ්ඩලය හා කොටස්හිමියන් අතර සෘජු මුණගැසීමක් සිදුවීමට පහසුම වාර්ෂික මහ සභා රැස්වීම කාර්යක්ෂම වූ මාධ්‍යයකි.
- කළමණාකරන කණ්ඩායම් සමග මාර්ග ප්‍රදර්ශන
- කොටස්හිමි සම්බන්ධතාව ප්‍රවර්ධනය කිරීමේ දිශාන්තියට යොමු වූ සමාගමේ සංවර්ධනය හා මූල්‍ය ක්‍රියාත්විතයන් ඇගයීම සඳහා ආයෝජක හමුවන් පැවැත්වීම.
- කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ඉදිරිපත් කරන කාර්තුමය, වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයන් තුළින් මූල්‍ය ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ තොරතුරු පතුරුවා හැරීම
- නිරන්තරයෙන් සමාගමේ වෙබ් අඩවිය තුළ තොරතුරු බාගත කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධ ගැටලු හා සැලකිලිමත් වන කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමෙහි ලා කොටස්හිමියන් දිරි ගැන්වීම හා ඒ පිළිබඳ සන්නිවේදනය සමාගම් ලේකම් වෙත යොමු කිරීමට අදාළව දක්වා ඇති වැනලයන් වාර්ෂික වාර්තාවේ පිටු 186 හි දක්වා ඇත.

GRI 102-21

### වාර්ෂික මහසභා රැස්වීම (වා.ම.රැ.)

කාලානුරූපව නිර්වද්‍යතාවයෙන් යුතු හා ප්‍රමාණාත්මක, තොරතුරු කොටස්හිමියන්ට ලබාදීම සඳහා සමාගම කැපවන අතර ක්‍රියාකාරී කොටස්හිමිකරු සහභාගිත්වය ධෛර්යමත් කරනු ඇත. වාර්ෂික මහසභා රැස්වීම්වලදී ක්‍රියාකාරීත්වය හා සමාගම සම්බන්ධ කරුණු පිළිබඳ ප්‍රශ්නාත්මකව කටයුතු කිරීමට කොටස්හිමියන්ට හැකියාව ලබාදේ.

# ආයතනික පාලනය

වාර්ෂික මහසභා රැස්වීම පැවැත්වීම පිළිබඳ දැනුම්දීම පවත්වන දිනට පෙර වූ වැඩකරන දින 15කට පෙර කොටස්හිමියන් වෙතට තැපැල් කරනු ලබයි. සාධාරණ විනිශ්චයක් සඳහා කොටස්හිමියන්ට හැකියාව ලැබෙන පරිදි එවැනි දැනුම්දීමක් සමඟ ව්‍යාපාර ස්වභාවය හා අනුමතකර ගැනීමට යොමු කරන යෝජනාවන් සාරාංශ කර දක්වයි.

සමාගම සිය ස්ථාපිත ප්‍රකාශනය මගින් පැමිණිය නොහැකි කොටස්හිමියන්ට තමන් වෙනුවෙන් වූ පෙරකලාසිකරුවෙකු මහසභා රැස්වීමට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දේ. එමෙන්ම එලෙස පත්කළ ආදේශකයෙකු සඳහා කොටස්හිමි අයිතියක් වන ඡන්දය භාවිතා කිරීමේ බලය හිමිවනු ඇත. එවැනි ආදේශකයෙකු ඉදිරිපත් කරන්නේ නම් ආදේශකයෙකු පත්කිරීමේ පෝරමය පුරවා රැස්වීම පැවැත්වීමට පැය 48 කට පෙර සමාගමට භාරදීම අපේක්ෂා කෙරේ.

සෑම ද්‍රව්‍යාත්මක හරවත් කරුණු සම්බන්ධ වෙන් වූ යෝජනාවන් සම්මතකර ගනු ලබන අතර, කොටස්හිමි වැඩි ඡන්ද අනුව එම යෝජනාවන් ක්‍රියාත්මක භාවිතයන් බවට පත්වනු ඇත.

වඩාත් වර්තමානයට ලංව පවත්වන ලද මහ සභා රැස්වීම සමාගමේ 22 වෙනි මහ සභා රැස්වීම වන අතර, එය 2018 ජූනි 22 වන දින මහජන බැංකු සේවක පුහුණු පාසල, කොළඹ 10 ලිපිනයේ පවත්වන්නට යෙදුනි.

පුළුල් ලෙස උනන්දුවක් දක්වන පාර්ශ්වයේ සළකා බලන එලෙස සමාගමේ කොටස්හිමියන්ද විමසා බලන කරුණු ක්‍රියාකාරීත්වය මූල්‍යමය කටයුතු වාර්ෂික මහ සභා රැස්වීමේදී සලකා බලයි.

- විගණනය කළ මූල්‍ය වාර්තා සමග අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව සහ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විගණකවරුන්ගේ වාර්තාව පරිශීලනය කිරීම.
- 2018 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා රුපියල් 0.50 මූල්‍ය කොටසකට වූ ලාභාංශ ප්‍රකාශ කිරීම.
- සාමාන්‍ය විගණකවරුන් වන "අර්න්ස්ට් සහ යන්ග්" සමාගමේ විගණකවරුන් ලෙස නැවත පත්කිරීම සහ අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය කිරීම සඳහා ඔවුන්ට බලය ලබාදීම.
- 2019 මාර්තු 31 අවසන් වූ වර්ෂය සඳහා විවිධ දායකත්වයන් හා ප්‍රදානයන් නිශ්චය කිරීමේ අධ්‍යක්ෂක මණ්ඩලයට අනුමැතිය ලබාදීම.

GRI 102-18 GRI 102-29 GRI 102-30 GRI 102-32

## තිරසාර වාර්තා කිරීම

ප්‍රායෝගිකව සලකා බැලීමක් හා විචක්ෂණශීලී පිවිසුමේ භාවිතයන් සලකා බලා සමාගමේ මූලෝපායයන් හා මෙහෙයුම් තිරසාර ප්‍රේෂණය කෙරෙහි යොමු කෙරේ. තිරසාර සරල ආචාර ධර්මයක් පමණක් නොවනු ඇත. එය කෙටිකාලීන ලාභය හා දිගුකාලීන ප්‍රතිලාභ සම්බන්ධයෙන් නව ආදායම් මාර්ග සහ සමාගම් ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීම, කීර්තිනාමය ප්‍රවර්ධනය කිරීමට බලපෑමක් සිදු කරයි. සංවිධාන සාර්ථකත්වය කෙරෙහි බලපෑමක් ඇති කරන සාමාජයීය පරිසරය හා ආර්ථිකමය ප්‍රේරණයන් හඳුනාගැනීමක් සිදු කෙරේ.

## තිරසාර මෙහෙයුම් කළමනාකරණයක් සඳහා අපගේ ප්‍රවේශය

විවිධ මානයන් තුළින් අගය නිර්මාණය කිරීමට උපකාරී වන මූලෝපාය පිවිසුමක් ලෙස තිරසාරත්වය හඳුනා ඇත. මෙම විවිධ වූ මානයන් ලෙස පිරිවැය අඩු කිරීම, අවදානම් කළමනාකරණය, සහ දිගුකාලීන අගය නිර්මාණය පිළිබඳ සළකා බලන හෙයින් පූර්ණ ප්‍රතිලාභ ලැබෙන පරිදි තිරසාරත්වය අපගේ ව්‍යාපාර මූලෝපායයන් තුළ අන්තර්ගත කරනු ඇත. ප්‍රේරණයක් පිහිටුවීම හා ක්‍රියාකාරීත්වය ඇගයීම ශක්තිමත් මෙහෙයුම් කළමනාකරණ පද්ධතියක් මගින් සිදු කරයි.




පාලන නඩත්තු මෙහෙයුම් කමිටුව ආයතනයේ විධායක කළමනාකාරීත්වයෙන් හා සමාජීය පැතිකඩයන්ගේ කාර්යසාධනය සමාලෝචනය කරන අතර, ඒවා ප්‍රධාන විධායක නිලධාරියා හරහා අධ්‍යක්ෂක මණ්ඩලයට දැනුවත් කරයි.

# ආයතනික පාලනය



## ව්‍යාපාරයේ ආවේනිකත්වය මත අපි තිරසාරයි




GRI 102-29 GRI 102-30 GRI 102-31

## තිරසාර වාර්තාකරණ ප්‍රවේශයන් – පරිසරය, සමාජීය හා පාලනය

පීපල්ස් ලීසිං විසින් එහි ආයෝජකයින්ට සහ පාර්ශ්වකරුවන්ට උපාය මාර්ගික හා විනිවිද පෙනෙන ESG භාවිතයන්හි දිගුකාලීන වටිනාකමෙහි වැදගත්කම හඳුනාගනී. සාම්ප්‍රදායික ගිණුම්කරණ භාවිතයන්ට වඩා සාමගමේ මූල්‍ය අපේක්ෂාවන් සහ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය තක්සේරු කිරීමේදී ආයෝජකයින්ට ESG තොරතුරු වඩාත් අදාළ හා ප්‍රයෝජනවත් යැයි සැලකේ. පිරිවැය ඉතිරි කිරීම සහ ඵලදායීතාව, අවදානම් කළමනාකරණය, ආදායම් වර්ධනය සහ වෙළෙඳපොළ ප්‍රවේශය, වෙළෙඳ නාම වටිනාකම සහ කීර්තිය, සේවකයින් බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීම සහ මානව ප්‍රාග්ධන කළමනාකරණය ඇතුළු වැදගත් ව්‍යාපාරික ප්‍රවේශයන් රාශියක් කෙරෙහි ESG බලපෑමක් ඇති කරයි.

සමාගම එහි තිරසාර කාර්‍ය සාධනය නිරීක්ෂණය කිරීමට සහ අනාවරණය කිරීමට පාරිසරික, සමාජීය සහ පාලනය යන කාණ්ඩ තුන හරහා විවිධ මෙවලම් භාවිතා කරයි.

පරිසරය (E)

- සෘජු හා වක්‍ර GHG විමෝචනය
- කාබන් තීව්‍රතාවය
- සෘජු හා වක්‍ර බලශක්ති පරිභෝජනය
- බලශක්ති තීව්‍රතාවය
- ප්‍රාථමික බලශක්ති ප්‍රභවය
- ජල කළමනාකරණය
- අපද්‍රව්‍ය කළමනාකරණය
- පාරිසරික ප්‍රතිපත්ති

සමාජීය (S)

- ප්‍රධාන විධායක නිලධාරී වැටුප් අනුපාතය
- ස්ත්‍රී, පුරුෂ වැටුප් අනුපාතය
- සේවක පිරිවැටුම් අනුපාතය
- ස්ත්‍රී, පුරුෂ විවිධත්වය
- වෙනස් නොකොට සැලකීමේ ප්‍රතිපත්තිය
- මානව හිමිකම් ප්‍රතිපත්තිය
- අධ්‍යක්ෂ මණ්ඩල විවිධත්වය

පාලනය (G)

- අධ්‍යක්ෂ මණ්ඩලය – භූමිකාවන් වෙන් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය – විනිවිද පෙනෙන භාවිතයන්
- දිරිගැන්වූ වැටුප්
- සාධාරණ ශ්‍රම පරිචයන්
- මිලදී ගැනීම් අත්පොත
- ආචාර ධර්ම හා පද්ධතිය
- අල්ලස්/දූෂණ විරෝධී ප්‍රතිපත්තිය
- තිරසාර වාර්තාව

## අන්තර්ජාල කටයුතු (Internet of things) සහ සයිබර් ආරක්ෂණය

සයිබර් ආරක්ෂාව යනු බොහෝ ආයතන මුහුණ දෙන නැගී එමින් පවතින අවදානමක් වන අතර, එමගින් පද්ධතිවලට බාධා පැමිණවීමට, දත්ත සහ වෙනත් වටිනා සමාගම් තොරතුරු සොරකම් කිරීමට සහ සමාගමේ කීර්තිනාමයට හානි කළ හැකි ඉහළ සම්භාවිතයක් හා බලපෑමක් ඇත. සමාගම සහ එහි වත්කම් සයිබර් අපරාධවලින් ආරක්ෂා කිරීම සඳහා නිර්මාණය කර ඇති තාක්ෂණයන්, ක්‍රියාවලි සහ පියවරයන්ගෙන් සයිබර් ආරක්ෂණය සමන්විත වේ. ඵලදායී සයිබර් ආරක්ෂණය මගින් පද්ධති, ජාල සහ තාක්ෂණයන් හිතාමතා අයථාභාවිතය තුළින් වන සයිබර් ප්‍රහාර අවදානම අඩු කරයි. පුද්ගලයින්, ක්‍රියාවලි සහ තාක්ෂණය යන සාධක තුන මත පදනම්ව ගොඩනගා ඇති සමාගමේ තොරතුරු ආරක්ෂණ කළමනාකරණය පද්ධතියේ (ISMS) ප්‍රධාන අංගයක් වශයෙන් සයිබර් ආරක්ෂණය සළකනු ලැබේ.



### පුද්ගලයින්

- කාර්ය මණ්ඩල පුහුණුව සහ දැනුවත්භාවය ගොඩනැගීම්
- වෘත්තීය කුසලතා සහ සුදුසුකම්
- නිපුණ සම්පත්



### ක්‍රියාවලි

- තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය (ISMS) – ISO 27001:2013 සහතිකලත්
- පාලන ආකෘතිරාමු
- ප්‍රශස්ත ක්‍රියාවලි සහ අවදානම් තක්සේරුව
- වරින්වර තොරතුරු තාක්ෂණ විගණනය - DNV
- අවදානම් තක්සේරු කිරීම සහ විනිවිදයාමේ පරීක්ෂණය (VAPT) – KPMG



### තාක්ෂණය

- බාහිර ආරක්ෂණ වළල්ල (External Firewall)
- විද්‍යුත් තැපැල් ආරක්ෂණ ද්වාරය
- වෙබ් යෙදුම් ආරක්ෂණ වළල්ල
- අවසන් පරිශීලක ආරක්ෂාව - (යෙදුම් පාලනය, උපකරණ පාලනය, DLP, දත්ත සංකේතය)
- අභ්‍යන්තර ආරක්ෂණ වළල්ල
- WSUS සේවා පද්ධතිය

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2007 අංක 07 දරණ පනතේ 168 වන වගන්තියට අනුව ඉදිරිපත් කර ඇති, අතර 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනතට අවශ්‍ය තොරතුරු ද සපයනු ලැබේ. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ පුහුණුව සහ කොළඹ කොටස් හුවමාරු ලැයිස්තුගත කිරීමේ නීති ද ඇතුළත් වේ.

## 1 සාමාන්‍ය තොරතුරු

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමග කිසිඳු නීතියකට හෝ නියාමනයකට පටහැනි සංකලිත වාර්ෂික වාර්තාව කොටස්හිමියන්ට ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි. සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූල වන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව 2019 ජූනි 13 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 2 ව්‍යාපාරයේ ස්වභාවය

(168 (1) (අ) වගන්තිය) සමාගම් 2007 අංක 07 දරන සමාගම් පනත

සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල ව්‍යාපාරයේ ස්වභාවය සහ ගිණුම්කරණ කාල සීමාව තුළ එහි යම් වෙනසක් සිදු වීද යන්න දක්වයි.

### 2.1 දැක්ම, මෙහෙවර සහ ආයතනික හැසිරීම

සමාගමේ දැක්ම සහ මෙහෙවර මෙම වාර්ෂික වාර්තාවේ 12 වන පිටුවේ දක්වා ඇත. දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ දී සමාගමේ ව්‍යාපාරික චර්යා ධර්ම ආචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති පරිදි, සියලුම අධ්‍යක්ෂවරුන් සහ සේවකයින් ඔවුන්ගේ ක්‍රියාකාරකම් ඉහළම මට්ටමේ ආචාර ධර්ම ප්‍රමිතීන්ට හා අන්තර් ක්‍රියාකාරීත්වයට ගෙන යයි.

### 2.2 ප්‍රධාන ව්‍යාපාර කටයුතු

සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් අතරට මූල්‍ය කල්බදු, කාලීන ණය, ඉස්ලාමීය මූල්‍ය, ආන්තික වෙළෙඳාම, සාධකකරණය, රන් ණය, ණය උපකරණ නිකුත් කිරීම සහ මහජන තැන්පතු රැස්කිරීම ඇතුළත් වේ. 2019 මාර්තු 31 වන විට සමාගමට පරිපාලිත සමාගම් හයක් තිබූ අතර, මෙම පිරිපාලිත සමාගම්වල ව්‍යාපාර කටයුතුවල ස්වභාවය අපගේ මාර්ගගත HTML වාර්තාවේ විස්තර කර ඇත. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ සමාගම හෝ එහි පරිපාලිත සමාගම් කිසිඳු ක්‍රියාකාරකමක නිරත වී නොමැත.

### 2.3 සමූහයේ ව්‍යුහයේ වෙනස් වීම

2019 මාර්තු 29 වන දින ස්ටර්ලින් කැපිටල් ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් මගින් සිදු කළ පුද්ගලික නිකුතුවෙන් පසු පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී. හි හිමිකාරීත්වය වෙනස්වීමකට ලක් වූ අතර, තවදුරටත් එය පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි ආශ්‍රිත සමාගමක් ලෙස නොසලකයි.

### 2.4 ශාඛා ජාලය

2019 මාර්තු 31 වන විට සමාගමෙහි සමස්ත ශාඛා ජාලය අංගසම්පූර්ණ ශාඛා 103 කින් සහ සේවා මධ්‍යස්ථාන 101 කින් සමන්විත විය.

### 2.5 මෙහෙයුම් සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල සහ විශේෂ සිදුවීම් පිළිබඳ අදහස් දැක්වීම් සහිතව 2018/19 කාලය තුළ සමාග මේ මූල්‍ය තත්ත්වය සහ කාර්ය සාධනය පිළිබඳ සමස්ත තක්සේරුවක් සභාපතිගේ පණිවුඩයේ 18 සහ 19 පිටුවල සහ ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය 20 සිට 23 දක්වා පිටු, සහ මෙම වාර්ෂික වාර්තාවේ 78 සිට 151 දක්වා පිටුවල ඇති ක්‍රියාත්මක වන ව්‍යවසාය දක්වේ. මෙම වාර්තා සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ අනිවාර්ය කොටසකි. කාණ්ඩගත කළ ආදායම්, ප්‍රතිඵල, වත්කම් සහ වගකීම් සඳහා අංශ අනුව දායකත්වය මෙම වාර්ෂික වාර්තාවේ 338 සහ 339 පිටුවල ඇති මූල්‍ය ප්‍රකාශනවල සටහන් අනාවරණය වේ.

### 2.6 අනාගත දැක්ම

මෙම වාර්ෂික වාර්තාවේ 62 සිට 65 දක්වා පිටුවල ඇති ආයතනයේ ව්‍යාපාරික පරිසරය යන කොටසේ දක්වා ඇති පරිදි ගෝලීය වෙළෙඳපොළෙහි මෙන්ම ශ්‍රී ලංකා වෙළෙඳපොළෙහි ඇති අභියෝග, අවස්ථාවන් සහ වර්ධනයන් මත පදනම්ව සමාගමේ දැක්ම සකස් කර ඇත.

## 3 මූල්‍ය ප්‍රකාශන

168 (1) (අ) සහ (2) වගන්තිය

සම්පූර්ණ කරන ලද ගිණුම් වර්ෂය සඳහා සහ අත්සන් කරන ලද සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන ප්‍රධාන මූල්‍ය නිලධාරියා සහ ප්‍රධාන විධායක නිලධාරියා විසින් නිසි පරිදි සහතික කරනු ලැබුවේ සභාපතිගේ සහ උප සභාපතිගේ අනුමැතිය ඇතිවය. එම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති අතර 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකසා ඇත. ඒවා 221 සිට 369 දක්වා පිටුවල සඳහන් වේ.

### 3.1 මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2007 අංක 07 දරණ සමාගම්වල 150 (1), 151, 152, 153 (1) සහ (2) වගන්තිවලට අනුව, සමාගමේ මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ සමූහය වගකිව යුතුය. සමාගම සහ සමූහය, සමාගමේ සහ සමූහයේ මූල්‍යමය ධනාත්මකභාවය සහ ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් පිළිබිඹු කරයි. මේ සම්බන්දයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇති බව තහවුරු කිරීමට අපේක්ෂා කරයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් 1995 අංක 15 දරණ අතර, සමාගම් 2007 අංක 07 දරණ අතර මූල්‍ය ව්‍යාපාර පනත 2011 අංක 42 සහ ඒ අනුව නිකුත් කරන ලද අධ්‍යක්ෂවරුන් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ පිළිවෙත් සංග්‍රහය.

213 වන පිටුවේ දක්වා ඇති "මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම" මෙම වාර්තාවේ අන්තර් කොටසකි.

වගකිවයුතු භාරකරුවන් වීම

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

## 3.2 මූල්‍ය ප්‍රතිඵල සහ විසර්ජනය

### පොලී ආදායම

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර සඳහා සමාගමේ සහ සමූහයේ මුළු පොලී ආදායම පිළිවෙලින් රුපියල් මිලියන 30,836.30 ක් (2017/18 දී රුපියල් මිලියන 26,704,64 ක්) සහ රුපියල් මිලියන 32,234.34 ක් (2017/18 දී රුපියල් මිලියන 27,582.05 ක්) පොලී ආදායම විශ්ලේෂණය කිරීම 244 වන පිටුවේ ඇති මූල්‍ය ප්‍රකාශනවල සටහන 6.1 හි දක්වා ඇත.

### කාර්ය සාධනය සහ විසර්ජනය

සමාගම සහ සමූහය 2018/19 මූල්‍ය වර්ෂය සඳහා බදු පසු ලාභය පිළිවෙලින් රුපියල් මිලියන 4,416.12 සහ රුපියල් මිලියන 5,011.27 (2017/18 දී රුපියල් මිලියන 4, 309.33 සහ රුපියල් මිලියන 5,017.71) කි. මෙය සමාගමේ ශුද්ධ ලාභය පෙර වසරට සාපේක්ෂව 2.48% කින් වැඩි වීමක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, සමූහයේ ශුද්ධ ලාභය පෙර වසරට සාපේක්ෂව 0.13% කින් අඩු විය.

සමාගමේ ක්‍රියාකාරිත්වය සහ ලාභය බෙදාහැරීම පිළිබඳ විස්තර පහත පරිදි ලැයිස්තුගත කර ඇත.

### බදුකරණය සැපයීම

2018 නොවැම්බර් 1 වන දින සහතික කරන ලද 2018 අංක 35 දරණ මූල්‍ය පනතට අනුව, රජය විසින්, 2018 ඔක්තෝබර් 1 සිට 2021 දෙසැම්බර් 31 දක්වා බලපැවැත්වෙන පරිදි 7%ක ණය ආපසු ගෙවීමේ බද්දක් හඳුන්වාදී ඇත.

මෙය බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි ආන්තිකයන්ට වඩා අහිතකර ලෙස බලපා ඇත. මෙය 2018/19 මූල්‍ය වර්ෂය සඳහා අර්ධ වශයෙන් බලපානු ලැබුව ද, ලාභදායිතාවයට වඩා පූර්ණ බලපෑම ඉදිරි වර්ෂවල දී අපේක්ෂා කළ හැකිය.

වර්ෂය තුළ උපයා ඇති ලාභය සඳහා අදාළ වන ආදායම් බදු අනුපාතය 28% (2017/18 දී 28%) විය. සලකා බලන කාල සීමාව සඳහා මූල්‍ය සේවා සඳහා වැට් බදු අනුපාතය 15% ක් විය. (2017/18 දී 15%) ඒ අනුව, සමාගමේ වර්තමාන ආදායම් බදු වියදම රුපියල් මිලියන 2,169.14ක් වන අතර ආදායම් බදු වියදම සහ සමාගමේ කල් දැමූ බදු වත්කම්/වගකීම් පිළිබඳ සවිස්තරාත්මක සටහනක් සහ සමූහය පිළිවෙළින් 17 හා 42 සටහන් මගින් මූල්‍ය ප්‍රකාශන අනාවරණය කරයි.

| සමාගම | 2018/19 රු. මිලියන | 2017/18 රු. මිලියන |
|---|---|---|
| ආදායම් බද්දට පෙර ලාභය | **6,585.26** | 5,769.67 |
| ආදායම් බදු වියදම | **(2,169.14)** | (1,460.34) |
| වසර සඳහා ලාභය | **4,416.12** | 4,309.33 |
| පෙර වසරේ සිට ඉදිරියට ගෙන ආ ලාභය | **11,502.16** | 9,400.08 |
| ආරම්භක ශේෂ නැවත සකස් කිරීම | **(755.90)** | – |
| විසර්ජන ලාභය | **15,162.38** | 13,709.41 |
| **විසර්ජන** | | |
| පෙර/වත්මන් වර්ෂය සඳහා ගෙවන ලද ලාභාංශ | **(1,974.83)** | (1,974.83) |
| විස්තීර්ණ ආදායම් | **(4.94)** | (16.95) |
| සංචිත සඳහා මාරු කිරීම් | **(220.81)** | (215.47) |
| සංචිත වලින් මාරු කිරීම | **400.00** | – |
| මුළු විසර්ජනය | **(1,800.58)** | (2,207.25) |
| ඉදිරියට ගෙන ගිය විසර්ජනය නොකළ ලාභය | **13,361.80** | 11,502.16 |

### දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්

සමාගමේ සහ සමූහයේ දේපළ, පිරියත සහ උපකරණ සඳහා (ප්‍රාග්ධන වැඩ කටයුතු ප්‍රගතිය ඇතුළුව) 2019 මාර්තු 31 අවසන් වන විට සිදුකරන ලද මුළු ප්‍රාග්ධන වියදම පිළිවෙලින් රුපියල් මිලියන 147.67ක් සහ මිලියන 257.37 කි. (රුපියල් මිලියන 170.35 සහ රුපියල් මිලියන 412.26, 2017/18 දී)

සමාගමේ හෝ එහි පරිපාලිත සමාගම්වල ස්ථාවර වත්කම් වෙනත් සැලකිය යුතු වෙනසක් සිදු නොවූ බව අධ්‍යක්ෂවරුන් සනාථ කරන අතර, 32.4 සටහනේ දක්වා ඇති පරිදි ඉඩම්වල වටිනාකමට පොත් වටිනාකම සමග සැලකිය යුතු වෙනසක් නොමැත.

2019 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය තුළ සමාගම සහ සමූහය අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 8.62ක් සහ රුපියල් මිලියන 12.19ක් ආයෝජනය කර ඇත. (2017/18 දී අස්පෘශ වත්කම් ලබා ගැනීම සඳහා පිළිවෙළින් රුපියල් මිලියන 36.75 ක් සහ රුපියල් මිලියන 145.30 ක් ආයෝජනය කර ඇත).

දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ විස්තර සටහන 32 හි සහ 303 සිට 309 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශන සඳහා ඉදිරිපත් කර ඇත.

### සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි

මෙම වාර්ෂික වාර්තාවේ 307 වන පිටුවේ 32.4 සටහනෙහි සහ මූල්‍ය කටයුතු සඳහා ඇතුළත් කර ඇති පරිදි 2019 මාර්තු 31 වන විට සමාගම සහ සමූහයට අයත් සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලිවල ශුද්ධ පොත් වටිනාකම රුපියල් මිලියන 564.78 සහ රුපියල් මිලියන 2,956.61 ක් ලෙස විස්තර කර ඇත.

### ආයෝජන

සමාගම විසින් දරනු ලබන ආයෝජන පිළිබඳ තොරතුරු 269 සිට 273 දක්වා පිටුවල 23, 24, 27 සහ 28 යන සටහන්වල මූල්‍ය ප්‍රකාශනවල 294 සිට 297 දක්වා සටහන් කර ඇත.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

### හිමිකම

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2019 මාර්තු 21 වන විට සමාගමේ සහ සමූහයේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 13,236.07 ක් වූ අතර, එය පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව නොවෙනස්ව පවතී.

### සංචිත

2019 මාර්තු 31 වන විට සමාගමේ සහ සමූහයේ මුළු සංචිත පිළිවෙලින් රුපියල් මිලියන 15,367.28 ක් සහ රුපියල් මිලියන 476.37 ක් විය. සමාලෝචනයට භාජනය වූ මූල්‍ය වර්ෂය තුළ රුපියල් මිලියන 220.81 ක් රඳවා ගත් ඉපැයීම්වලින් සංචිත වෙත මාරුකරන ලදී. 224 සිට 225 දක්වා පිටුවල "හිමිකම වෙනස්වීමේ ප්‍රකාශයේ" සහ මූල්‍ය ප්‍රකාශනවල 45 සිට 47 දක්වා සටහන්වල තොරතුරු දක්වා ඇත.

### ණය ප්‍රාග්ධනය

2018/19 මුදල් වර්ෂය තුළදී සමාගම විසින් ජ්‍යෙෂ්ඨ, අනාරක්ෂිත, මුදවා ගතහැකි ශ්‍රේණිගත ණයකර මිලියන 60 ක් නිකුත්කර ඇති අතර, මේවා 2018 අප්‍රේල් 27 වන දින කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන මණ්ඩලයේ ලැයිස්තුගතකර ඇත. ණය ප්‍රාග ්ධන පිළිබඳ විස්තර 28 සටහනෙහි දක්වා ඇත. සමාගමේ ණයකර පිළිබඳ වඩාත් සවිස්තරාත්මක විශ්ලේෂණයක් 38.2 සටහනේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

### ප්‍රාග්ධන ප්‍රමාණාත්මක බව

ශ්‍රී ලංකා මහ බැංකුවේ නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා අනුව ගණනය කරන ලද ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය සහ සමාගමේ සමස්ත ප්‍රාග්ධන අනුපාතය 2019 මාර්තු 31 වන විට පිළිවෙලින් 14.46% සහ 15.20% ක් විය. අවම ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 177 වන පිටුවේ දක්වා ඇත.

## 4 බාහිර විගණනය

(168 (1) (ඇ) (ස) සහ (ව) වගන්තිය)

ඉහත අංශ මගින් සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව නිර්වචනයකර ඇති අතර සමාගම සහ එහි අනුබද්ධ සමාගම් විසින් විගණන ගාස්තු සහ ගිණුම්කරණ කාලසීමාව තුළ සිදු කරන ලද වෙනත් සේවාවන් සඳහා වන ගාස්තු සහ විගණකවරුන්ගේ සම්බන්ධතාවය හෝ කිසියම් පොලියක් සමාගම සහ එහි පරිපාලිත සමාගම් පිළිබඳ තොරතුරු දක්වා ඇත.

### 4.1 විගණක සහ ඔවුන්ගේ ස්වාධීනත්වය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සමාග මේ විගණක ලෙස සේවය කළ අර්න්ස්ට් ඇන්ඩ් යංග් වරලත් ගණකාධිකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශ මත පදනම්ව සහ අධ්‍යක්ෂවරුන් දන්නා පරිදි මෙම ඡේදයේ අනාවරණය කරඇති ප්‍රමාණයට අමතරව විගණකවරයාට සමාගම හෝ එහි පරිපාලිත සමාගම් කෙරෙහි කිසිදු සම්බන්ධයක් හෝ උනන්දුවක් නැත.

### 4.2 විගණක වාර්තාව

සමාගමේ සහ එහි සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකගේ වාර්තාව 217 සිට 219 දක්වා පිටුවල දක්වා ඇත.

### 4.3 විගණකගේ වේතනය

විගණන හා ආශ්‍රිත සේවාවන් මෙන්ම බදු සම්බන්ධ සේවා ඇතුළු විගණන නොවන සේවා සඳහා සමාගම විසින් අර්න්ස්ට් ඇන්ඩ් යංග් වරලත් ගණකාධිකාරවරුන්ට පහත පරිදි ගෙවීම් සිදු කරන ලදී.

### 4.4 විගණක පත්කිරීම

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 55 වැනි වගන්තියට අනුව පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. "විගණනය කරනු ලබන ආයතනය" යන්නෙන් අර්ථ දක්වීම යටතට ගැනෙන අතර, විගණකාධිපති විසින් බලය පවරන ලද ඕනෑම පුද්ගලයෙකු විසින් සමාගමේ ඉදිරි මූල්‍ය වර්ෂයේ විගණන කටයුතු සිදුකළ යුතුය.

## 5 ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වර්ෂය තුළ සිදු වූ වෙනස්කම්

(168 (1) (ඇ) වගන්තිය)

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ගිණුම්කරන ප්‍රතිපත්තිවල යම් වෙනසක් සිදුකර තිබේද යන්න.

මූල්‍ය ප්‍රකාශනවල අනාවරණ අධික වීම සහ අවුල් සහගත බව අවම කිරීම සඳහා ගිණුම්කරන ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීමේදී විකල්ප ආකෘතියක් භාවිතා කර ඇත. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවයන්ට අනුව LKAS 1 "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" සහ 168 (1) (ඇ) වගන්තිය සමග 2007 අංක 07 දරන සමාගම් පනත අනුකූල වේ.

සැලකියයුතු ගිණුම්කරන ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරනලද සටහන් 277 සිට 369 දක්වා පිටුවල දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සැලකියයුතු වෙනස්කම් 232 සහ 233 පිටුවල 3.3 සටහනෙහි දක්වා ඇත.

| ගාස්තු | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2018/19 රු. මිලියන | 2017/18 රු. මිලියන | 2018/19 රු. මිලියන | 2017/18 රු. මිලියන |
| විගණන සහ අදාළ සේවා | **7.46** | 6.99 | **12.57** | 10.69 |
| විගණන නොවන සේවා | **5.73** | 4.35 | **6.71** | 6.67 |

වගකිවයුතු භාරකරුවන් වීම

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

## 6 අධ්‍යක්ෂ මණ්ඩලය

(168 (1) (ඉ) (ඊ) (උ) වගන්තිය)

ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළ සමාගමේ සහ එහි අනුබද්ධ සමාගම්වල පොලී ලේඛණයේ ඇතුළත් කිරීම්, ගිණුම්කරණ කාලය තුළ සමාගමේ අධ්‍යක්ෂවරුන්ට සහ එහි පරිපාලිත සමාගම්වලට ගෙවන ලද ප්‍රතිලාභ සහ සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ සහ එහි පරිපාලිත සමාගම්වල තොරතුරු ගිණුම්කරණ කාලසීමාව තුළ සහ අවසානයේ දැක්වේ.

### 6.1 අධ්‍යක්‍ෂක මණ්ඩලයේ සාමාජිකයන්ගේ දත්ත

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ නම් සහ කුසලතා සහ පළපුරුද්ද ඇතුළු ඔවුන්ගේ දත්ත මෙම වාර්තාවේ 26 සිට 28 දක්වා පිටුවල දක්වා ඇත.

### 6.2 අධ්‍යක්‍ෂක මණ්ඩල කාර්යසාධනය ඇගයීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය තක්සේරු කිරීමට භාවිතා කරන ක්‍රමවේදය 48 සහ 49 පිටුවල "ආයතනික පාලනය" කොටසේ දක්වා ඇත.

### 6.3 වෙනත් අධ්‍යක්ෂ තනතුරු/ අධ්‍යක්ෂවරුන්ගේ සැලකියයුතු තනතුරු

සමාගමේ වර්තමාන අධ්‍යක්ෂවරුන්ගේ වෙනත් අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකත්වයන් සහ අධ්‍යක්ෂවරුන්ගේ සැලකියයුතු තනතුරුවල තොරතුරු 27 සහ 28 පිටුවල දක්වා ඇත.

### 6.4 පත්වීම් සහ ඉවත්වීම්

ආර්.එම්. ජයසේන මහතා 2018 ජුනි 17 දින ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ ධූරයෙන් විශ්‍රාමගත් අතර, ආචාර්ය අලී අස්ගර් ෂබ්බීර් ගුලාම්හුසෙයින් 2018 ඔක්තෝබර් 16 වන දින ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉවත් වෙන ලදී.

ආචාර්ය කේ.ඩී. ගුණවර්ධන සහ එන්.ඩබ්.ඒ.එම්.යූ.කේ.කේ.ඒ. වීරසිංහ මහතා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සමබරතාවය ශක්තිමත් කිරීම සඳහා 2018 ඔක්තෝම්බර් 09 දින විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂවරුන් ලෙස පත් කරන ලදී.

කෝට්ටේගොඩගෙදර ලක්මිණි දිල්රුක්ෂි කෝට්ටේගොඩ මහත්මිය 2018 ජුලි 30 දින සිට බලපැවැත්වෙන පරිදි පීපල්ස් ලීසිං සමාගමේ සමාගම් ලේකම් ලෙස රොහාන් පතිරගේ මහතා වෙනුවට පත් කරන ලදී.

### 6.5 අධ්‍යක්ෂවරුන්ගේ වේතනය

2019 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා සමාගම සහ සමූහය විසින් ගෙවනලද අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ දීමනා පිළිවෙලින් රුපියල් මිලියන 9.69ක් සහ රුපියල් මිලියන 18.63ක් වේ. මූල්‍ය ප්‍රකාශනවල 15 වන සටහනේ සංසන්දනාත්මක තොරතුරු දක්වා ඇත.

### 6.6 පොලී ලේඛණය/අධ්‍යක්ෂවරුන්ගේ ගනුදෙනු සඳහා ඇති උනන්දුව

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව, සමාගම විසින් පොලී ලේඛණයක් පවත්වාගෙන යනු ලබන අතර එය පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකිය. සමාගම්වල 192 (2) වගන්තිය අනුව 2007 අංක 07 දරණ පනතට අනුව සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් සමාගමේ ගනුදෙනු සඳහා දක්වන උනන්දුව පිළිබඳ සාමාන්‍ය ප්‍රකාශයන් කර ඇත. එහි අනාවරණය වූ ගනුදෙනුවල විස්තර සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු යටතේ 340 සිට 344 දක්වා පිටුවල දක්වා ඇත. තවද, සමාගමේ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය සහ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා මූල්‍ය සමාගම් විසින් අනාවරණය කළයුතු පරිදි තමන් අතර මූල්‍ය, ව්‍යාපාර, පවුල් හෝ වෙනත් ප්‍රමාණාත්මක/අදාළ සම්බන්ධතා නොමැති බව සාමාන්‍ය ප්‍රකාශ කර ඇත. (ආයතනික පාලනය) 2008 අංක 03 දරණ දිශාව සංශෝධනය කර ඇත.

### 6.7 අධ්‍යක්ෂවරුන්ගේ කොටස් පිළිබඳ විස්තර

අධ්‍යක්ෂවරුන් විසින් තමන්ගේ කොටස්හිමිකම පිළිබඳ අධ්‍යක්‍ෂක මණ්ඩලයට හෙළිදරව් කර ඇති අතර 2007 අංක 07 දරණ සමාගම් පනතේ 200 වන වගන්තියට අනුකූලව අත්පත්කර ගැනීම් හෝ බැහැර කිරීම් ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම් සහ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියාගේ කොටස් හිමිකම පිළිබඳ "ආයෝජක සබඳතා" යන මාතෘකාව යටතේ මෙම වාර්ෂික වාර්තාවේ 372 සිට 380 දක්වා පිටුවල සඳහන් වේ.

### 6.8 රැස්වීම්

අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 46 සිට 48 දක්වා පිටුවල ආයතනික පාලන වාර්තාවේ දක්වා ඇත.

## 7 කොටස් පිළිබඳ තොරතුරු

මෙම වාර්ෂික වාර්තාවේ 372 සිට 380 දක්වා පිටුවල "ආයෝජක සබඳතා" යන මාතෘකාව යටතේ සැලකියයුතු කොටස්හිමියන්ගේ තොරතුරු සහ කොටස් හිමියන්ගේ තොරතුරු සහ අනෙකුත් කොටස් ආශ්‍රිත තොරතුරු සවිස්තරාත්මකව ඉදිරිපත් කෙරේ.

### 7.1 කොටස් හිමියන්ට සාධාරණ ලෙස සැලකීම

සියළුම කොටස්හිමියන්ට සාධාරණ ලෙස සලකන බවට සමාගම සැමවිටම සහතික කර ඇත.

### 7.2 සාමාන්‍ය කොටස් සඳහා ලාභාංශ

අතුරු ලාභාංශ 2019 ජනවාරි 11 වන දින සාමාන්‍ය කොටස්හිමියන්ට කොටසකට රුපියල් 0.75 ක් ගෙවා ඇති අතර, අධ්‍යක්ෂවරු 2019 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා කොටසකට රුපියල් 0.50 බැගින් ගෙවීමට නිර්දේශ කළහ. මෙය කොටස් ලාභාංශයක් ලෙස ගෙවනු ලැබේ. තවද, සමාගමේ සාංගමික ලිපිවලට අනුකූලව, මෙම ලාභාංශය 2019 ජුනි 31 දින පැවැත්වීමට නියමිත වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස්හිමියන් විසින් අනුමත කළ යුතුය.

2007 අංක 07 දරන පනතේ 56 (3) වගන්තිය සහ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරු ලැයිස්තුගත කිරීමේ නීතිරීති අනුව, එම අතුරු ලාභාංශ ගෙවීම සහ එකී අවසාන ලාභාංශයෙන් පසුව නුබුන්වත් බව පිළිබඳ පරීක්ෂණයට අනුකූලවීම සහතික කරනු ඇත. 56 (2) වගන්තියට අනුව, ඉහත ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුකූල එක් එක් ලාභාංශ ගෙවීම් වලින් පසු නුබුන්වත් බව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විගණකගෙන් සහතිකයක් ලබා ගෙන ඇත.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

වගකිවයුතු භාරකරුවන් වීම

## 8 පරිත්‍යාග සහ ආයතනික සමාජ වගකීම්

(168 (1) (උ) වගන්තිය)

ගිණුම්කරණ කාලය තුළ සමාගම විසින් කරන ලද මුළු පරිත්‍යාග ප්‍රමාණය

පසුගිය වාර්ෂික මහා සභා රැස්වීමේදී සම්මත වූ යෝජනාවට අනුව, 2018/19 මූල්‍ය වර්ෂය තුළ සමාගම විසින් 2017/18 දී රුපියල් මිලියන 101.53 ට සාපේක්ෂකව රුපියල් මිලියන 122.23 ක ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම් මඟින් පරිත්‍යාග කරන ලදී. සමාගමේ ආයතනික සමාජ වගකීම් දෙපාර්තමේන්තුව විසින් ආයතනික සමාජ වගකීම් "CSR" මුලපිරීම හා ක්‍රියාකාරකම් හසුරුවයි. වටිනාකම් නිර්මාණය කිරීමේ වගකීම් භාරකාරත්වය මූර්තිමත් කිරීම යන මාතෘකාව යටතේ කොටස්වල ඉදිරිපත්කර ඇති ආයතනික සමාජ වගකීම් වැඩසටහන් 130–145 පිටුවල දක්වා ඇත.

## 9 ආයතනික පාලනය

(හොඳම භාවිතයේ කේතය D.6, D.6.1, D.2, D.1.4)

සමාගමේ ආයතනික පාලන මූලධර්ම සංවර්ධනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටින අතර, සමාගමේ විවිධ සහභාගීවන්නන් පාලනය කරන ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලීන් ඇතුළත් ආයතනික පාලන ප්‍රතිපත්තියක් සම්මත කරගෙන ඇත. අධ්‍යක්ෂක මණ්ඩලය, කළමනාකරුවන්, කොටස්හිමියන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වැනි ඒවා සහතික කිරීමත් ආයතනික පාලනයේ ඉහළම මූලධර්ම සංවිධානයපුරා පවත්වාගෙන යාමත් කරගෙන යනු ලැබේ.

ඉහත ආයතනික ප්‍රතිපත්ති සම්මතකර ගැනීමේදී, කොළඹ කොටස් වෙළෙඳපොලේ ලැයිස්තුගත රීතීන්ද සමාගම් (ආයතනික පාලන) 2008 අංක 03 දරණ නියෝග 1 හා ඊට අදාළ සංශෝධනයන්ද අනුව කටයුතුකර ඇත.

ඒ අනුව අධ්‍යක්ෂවරුන් පහත සඳහන් දෑ ප්‍රකාශයට පත්කර ඇත:

01. සමාගම නීති හා රෙගුලාසිවලට පටහැනි කිසිදු ක්‍රියාකරකමක නිරතවී නොමැත.
02. කොටස්හිමියන්ගේ සාධාරණ සැළකිල්ල සහතික කිරීම සඳහා සමාගම සියලු උත්සාහයන් ගෙන ඇත.
03. ව්‍යාපාරය අඛණ්ඩ පැවැත්ම යන සංකල්පය මත රැඳීසිටින බවත් වේ.
04. අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය කාර්යක්ෂමව හා සාර්ථකව පිළිපැදීම සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් ගනුලබන ක්‍රියාමාර්ග මෙම වාර්ෂික වාර්තාවේ 37 සිට 53 දක්වා පිටුවල ආයතනික පාලන වාර්තාවේ දක්වා ඇත.
05. ඔවුන්ගේ දැනුමට අනුව, සමාගමේ ව්‍යාපාරික චර්යාධර්ම හා ආචාරධර්ම උල්ලංඝණයවී නොමැත.

### 9.1 අධ්‍යක්‍ෂක මණ්ඩල අනුකමිටු

අධ්‍යක්‍ෂක මණ්ඩල විගණන කමිටුව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, වේතන හා නාමයෝජනා කමිටුව සහ සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටුව අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද ඇති අධ්‍යක්ෂවරුන් සමග අධ්‍යක්‍ෂ මණ්ඩල අනුකමිටු ලෙස ක්‍රියා කරයි. එකී කමිටුවල සංයුතිය මෙම වාර්ෂික වාර්තාවේ 45 සහ 46 පිටුවල දක්වා ඇත.

### 9.2 නීති හා රෙගුලාසිවලට අනුකූලවීම

අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනුම හා විශ්වාසයට අනුව සමාගම සහ සමූහය කිසිඳු නීති හා රෙගුලාසිවලට පටහැනිව කිසිදු ක්‍රියාකාරකමක නිරත වී නොමැත.

### 9.3 ව්‍යවස්ථාපිත ගෙවීම්

රජය, වෙනත් නියාමන ආයතන සහ සේවකයින් සම්බන්ධයෙන් ගෙවියයුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් කාලෝචිත ලෙස සිදුකර ඇති බවට අධ්‍යක්ෂවරුන් සෑහීමකට පත් වේ.

### 9.4 පාරිසරික ආරක්ෂාව

සමාගම සහ සමූහය අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනුම අනුව පරිසරයට අහිතකර කිසිඳු ක්‍රියාකාරකමක නිරතවී නොමැති බව අධ්‍යක්ෂවරු සනාථ කරයි.

### 9.5 ESG වාර්තාකරණය

පාරිසරික, සමාජයීය සහ පාලනය සලකා බැලීම් මගින් ව්‍යාපාර උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට සහ වටිනාකම් නිර්මාණය කිරීමට සමාගමට ඇති හැකියාව කෙරෙහි බලපෑම් කළ හැකිය. සමාගමේ වාර්ෂික වාර්තාව 52 වන පිටුවේ දක්වා ඇති පරිදි ESG අවදානම් සහ අවස්ථාවන් හඳුනා ගැනීම, කළමනාකරණය, මැනීම සහ වාර්තා කිරීම පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු අඩංගු වේ.

## 10 පිළිගැනීම

(168 (1) (කේ) වගන්තිය)

අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සහ සමාගමේ ලේකම් විසින් මණ්ඩලය වෙනුවෙන් මෙම වාර්තාවේ අත්සන්වල අන්තර්ගතය පිළිගැනීම.

මෙම වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය 59 වන පිටුවේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගෙන ඇත.

## 11 පාර්ශ්වකරුවන් කළමනාකරණය සහ සංකලිත වාර්තාකරණය

පාරිභෝගිකයින්, සේවකයින්, ආයෝජකයින්, ව්‍යාපාරික හවුල්කරුවන්, ප්‍රජාව සහ පරිසරය ඇතුළුව එහි වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සඳහා සමාගම විසින් පියවර කිහිපයක් ගෙන ඇත. වාර්තාකරණ ක්‍රියාවලියේදී ආර්ථිකය, පරිසරය සහ සමාජයීය බලපෑම් පිළිබඳ අපේක්ෂාවන් ප්‍රමාණවත් ලෙස ඇතුළත්කර ඇත. මෙම වාර්ෂික වාර්තාවේ 66 සිට 69 දක්වා පිටුවල පාර්ශ්වකරුවන්ගේ සබඳතා ශක්තිමත් කිරීම ඉදිරිපත් කර ඇත. තවද, අපගේ පාර්ශ්වකරුවන් සමග අප කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳ අපගේ වාර්තාවෙන් බලාගැනීමටද හැකිය.

## 12 විභාගවෙමින් පවතින නඩු

සමාගමේ නීතිඥවරුන් සමග සාකච්ඡා කර දැනගත් පරිදි අධ්‍යක්ෂවරුන්ගේ මතයවී ඇත්තේ සමාගමට එරෙහිව දැනට විභාග වෙමින් පවතින නඩු වාර්තා කර ඇති මූල්‍ය ප්‍රතිඵල හෝ සමාගමේ අනාගත මෙහෙයුම් කෙරෙහි කිසිදු වැදගත් බලපෑමක් ඇති නොකරනු ඇති බවය. මූල්‍ය ප්‍රකාශනවල 332 සහ 333 පිටුවල සමාගමට එරෙහිව නඩු පැවරීමේ විස්තර සටහන 52 හි දක්වා ඇත.

## 13 මානව සම්පත්

සමාගම විසින් පුද්ගලයන්ට ගරු කරන සහ ස්ත්‍රී/පුරුෂ භාවය හෝ භේදය නොසළකා වාහක අවස්ථාවන් ලබාදෙන පරම වෙනස්කම් රහිත රැකියා ප්‍රතිපත්තියක් අනුගමනයකර ඇත.

2019 මාර්තු 31 වන විට පුද්ගලයින් 2,329 ක් සේවය කර ඇත. (2018 මාර්තු 31 වන විට පුද්ගලයින් 2,085 ක් විය.)

වගකිවයුතු භාරකරුවන් වීම

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

## 14 අන්තර්ජාල කටයුතු සහ සයිබර් ආරක්ෂාව

(හොඳම පාර්ශ්වයේ කේතය G.1, G.2, G.3)

සමාගම ප්‍රමාණවත් පළපුරුද්දක් හා අධිකාරියක් සහිත ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියකු පත්කර ඇති බවත් සයිබර් අවදානම් කළමනාකරණය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් න්‍යාය පත්‍රයට විධිමත් හා ප්‍රමාණාත්මක කාලයක් වෙන්කරන බවත් 53 වන පිටුවේ අදාළ තොරතුරු ආයතනික පාලන අංශයේ දක්වා ඇති බවත් අධ්‍යක්ෂක මණ්ඩලය සනාථ කරයි.

## 15 වාර්තාකරණ කාලයෙන් පසුව සිදුවීම්

වාර්තාකරණ කාලයෙන් පසු සිදුවීම් පිළිබඳ විස්තර 369 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 60හි අනාවරණය වේ.

## 17 අඛණ්ඩ පැවැත්ම

(හොඳම භාවිතයේ කේතය ඩී 1.4)

සමාගමහි ව්‍යාපාරික කටයුතු දෙස නැවත බැලූ විට අධ්‍යක්ෂ මණ්ඩලය සතුව සාධාරණ අපේක්ෂාවන් ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ඔවුන් අඛණ්ඩ පැවැත්ම යන සංකල්පය අනුගමනය කරයි.

## 18 වාර්ෂික මහා සභා රැස්වීම

23 වන වාර්ෂික මහා සභා රැස්වීම මහජන බැංකු සේවක පුහුණු පාසල් ශ්‍රවණාගාරයේ 11 වන මහළ, පීපල්ස් ලීසිං ගොඩනැගිල්ල, අංක 7, හැව්ලොක් පාර, කොළඹ 5 ස්ථානයේ 2019 ජූලි 31 දින ප.ව 3.30ට පැවැත්වේ.

23 වන වාර්ෂික මහා සභා රැස්වීමට අදාළ රැස්වීම පිළිබඳ දැන්වීම මෙම වාර්ෂික වාර්තාවේ 393 වන පිටුවේ දක්වා ඇත.

## 16 ලැයිස්තුගත කිරීමේ රීති 7.6 රීතියේ වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය පිළිබඳ අවශ්‍යතාවයන්ට අනුකූලවීම

| රීති යොමුව | අනාවරණය කළයුතු තොරතුරු | අනුකූලතාවයේ තොරතුරු | පිටු යොමුව |
|---|---|---|---|
| 7.6 (i) | මූල්‍ය වර්ෂවල සමාගම්හි අධ්‍යක්ෂවරුන්ගේ නම් | ✔ | 26-28 |
| 7.6 (ii) | වර්ෂය තුළ සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් | ✔ | 54 සහ 227 |
| 7.6 (iii) | වසර අවසානයේ විශාලතම කොටස්හිමියන් 20 දෙනා පිළිබඳ තොරතුරු | ✔ | 378 |
| 7.6 (iv) | මහජනයා සතු කොටස් | ✔ | 378 |
| 7.6 (v) | අධ්‍යක්ෂක සහ ප්‍රධාන විධායක නිලධාරීයා කොටස් තබාගැනීම | ✔ | 379 |
| 7.6 (vi) | පුරෝකතනය කළහැකි අවදානම් සාධක පිළිබඳ තොරතුරු | ✔ | 152-169 |
| 7.6 (vii) | සේවකයින්ට හා කාර්මික සම්බන්ධතාවන්ට අදාළව නිකුත් කරනලද තොරතුරු පිළිබඳ විස්තරය | ✔ | 112-123 |
| 7.6 (viii) | වසර අවසානයේ ගොඩනැගිලි/ඉඩම් හෝ ආයෝජන දේපල පිළබඳ තොරතුරු | ✔ | 307 |
| 7.6 (ix) | වර්ෂය අවසානයේදී ප්‍රකාශිත ප්‍රාග්ධනය නියෝජනය කරන කොටස | ✔ | 377 |
| 7.6 (x) | එක් එක් පන්තියේ කොටස් සුරැකුම්පත් හා අදාළ තොරතුරු දරන්නන්ගේ සංඛ්‍යාව බෙදාහැරීමේ කාලසටහන | ✔ | 377 |
| 7.6 (xi) | කොටස්, ණය, ණය ශ්‍රේණිගත කිරීම්වල වෙනසක් පිළිබඳ අනුපාත සහ වෙළෙඳපොළ මිල තොරතුරු | ✔ | 89, 376, 380 |
| 7.6 (xii) | සමාගමේ හෝ උපසමාගම්වල ස්ථාවර වත්කම්වල සැළකිය යුතු වෙනස්කම් | ✔ | 304-306 |
| 7.6 (xiii) | වර්ෂය තුළ පොදු නිකුතුවක්, අයිතිවාසිකම් නිකුතුවක් සහ පුද්ගලික නිකුතුවක් හරහා රැස්කරනලද අරමුදල් පිළිබඳ විස්තරය | ✔ | 380 |
| 7.6 (xiv) | සේවක කොටස්හිමිකාරිත්වය හෝ කොටස් විකල්ප යෝජනා ක්‍රම සම්බන්ධයෙන් දැනුම් දීම | ✔ | අභියාචනයක් නැත |
| 7.6 (xv) | ලැයිස්තුගත කිරීමේ 7 වන වගන්තියේ 7.10.0, 7.10.5 සී සහ 7.10.6 සී රීති ප්‍රකාරව ආයතනික පාලන භාවිතයට අදාළ අනාවරණය කිරීම | ✔ | 190 |
| 7.6 (xvi) | සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු කොටස්වලින් 10% හෝ ආයතනයේ මුළු වත්කම්වලින් 5% ඉක්මවයි. | ✔ | 58 |

අධ්‍යක්ෂවරුන්ගේ විධානය පරිදි,

එම්.පී. අමිර්තනායගම් මහතා
උපසභාපති

හේමසිරි ප්‍රනාන්දු මහතා
සභාපති

ලක්මිණි කෝට්ටේගොඩ මහත්මිය
සමාගම් ලේකම්

13 ජූනි 2019 දින දීය.

# 3

# ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය

62
මෙහෙයුම් පරිසරය

64
අවදානම් සහ අවස්ථාවන්

# මෙහෙයුම් පරිසරය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අපගේ වර්ධනය අපගේ දේශීය ආර්ථිකයට බලපාන ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම්වල සන්දර්භය තුළ බැලිය යුතු අතර, එකී ක්‍රියාකාරකම් තුළින් අපගේ ව්‍යාපාරයට බලපෑම් සිදුවිය.

දළ දේශීය නිෂ්පාදිතය 2018 අවසන් වන විට 3.2% දක්වා ළඟා වී ඇති අතර, එය අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ (IMF) සහ ආසියානු සංවර්ධන බැංකුවේ පුරෝකථනයන් පිළිවෙලින් 4.3% සහ 3.8% ට වඩා පහළ මට්ටමක පවතින අතර, දළ දේශීය නිෂ්පාදිතය 7% දක්වා වර්ධනය වී ඇති කලාපීය ආර්ථිකයන්ට සාපේක්ෂව අඩුවේ.




මෙම රූපය මගින් ගෝලීය සහ දේශීය වර්ධනයට හේතු වූ සහ වර්ධනය අඩාල වීමට බලපෑ සාධකයන් විදහා දක්වයි. අපගේ ව්‍යාපාරයට බලපෑ අවදානම් සහ අවස්ථාවන් පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් සඳහා කරුණාකර 64 සහ 65 පිටුවල අවදානම් සහ අවස්ථාවන් යන කොටස බලන්න.

# මෙහෙයුම්

## දුෂ්කර කාලය

ශ්‍රී ලංකාවේ වෙළෙඳ හිඟය 2018 දෙසැම්බර් 31 වන විට ඇමරිකානු ඩොලර් මිලියන 10,343 ක් දක්වා පුළුල් වී ඇති අතර, එය 2017 ට සාපේක්ෂව 7.53 ක වර්ධනයකි. මෙය ආනයන වියදම් වර්ධන වේගය 5.97% ක් වූ අතර එය අපනයන ඉපැයීම් 4.66% ඉක්මවා ඇත. විනිමය අනුපාතය ප්‍රාග්ධනයේ පීඩනය යටතේ පිටතට ගලායාම, විශේෂයෙන් රජයේ රුපියල් සුරැකුම්පත්, ගෝලීය වෙළෙඳපොලවල දැඩි කොන්දේසි සහ දේශීය වෙළඳපොලේ සම්ප්‍රේක්ෂණය.

## ගෝලීය ආර්ථිකය පිලිබඳ ඉදිරි දැක්ම

| සමාගම | 2019 අනාවැකිය | 2018 | 2017 |
|---|---|---|---|
| ලෝක නිෂ්පාදිතය | **3.3** | 3.6 | 3.8 |
| සංවර්ධිත ආර්ථික | **1.8** | 2.2 | 2.4 |
| එක්සත් ජනපදය | **2.3** | 2.9 | 2.2 |
| යුරෝ කලාපය | **1.3** | 1.8 | 2.4 |
| ජපානය | **1.0** | 0.8 | 1.9 |
| එක්සත් රාජධානිය | **1.2** | 1.4 | 1.8 |
| නැගී එන වෙළෙඳපොල හා සංවර්ධනය වෙන ආර්ථිකය | **4.4** | 4.5 | 4.7 |
| රුසියාව | **1.6** | 2.3 | 1.5 |
| චීනය | **6.3** | 6.6 | 6.9 |
| ඉන්දියාව | **7.3** | 7.1 | 6.7 |
| ආසියාව - 5 | **5.1** | 5.2 | 5.3 |

## පීඩනය සමනය කිරීම

අපනයන අනුපාතය මත ඇතිවන පීඩනය සමනය කිරීම සඳහා කෙටිකාලීන පියවර කිහිපයක් ගනු ලැබුවද, ශ්‍රී ලංකාවේ රුපියල 19% කින් අවප්‍රමාණ වූ එක්සත් ජනපද ඩොලරය 2018 දී දශකයක් තුළ තියුණුම පහත වැටීමකි. රුපියල අවප්‍රමාණ පැමිණෙන්නේ බදු වැඩිකිරීම, ඉන්ධන වැඩිකිරීම, බහු වැඩවර්ජන සහ කාලගුණය ආශ්‍රිත ගැටලු, පළාත් පාලන මැතිවරණයෙන් වෙන්කරවා ගැනීම සහ ව්‍යවස්ථාමය අර්බුදය මතය. ඒවා සියල්ලම අපගේ ඉලක්ක වෙළඳපොලෙහි ව්‍යාපාර සහ මූල්‍ය කටයුතුවලට සැළකිය යුතු ලෙස බලපා ඇත. ශ්‍රී ලංකාව ඇමරිකානු ඩොලර් බිලියන 5.9 ක් බව වාර්තා වේ.

ඇමරිකානු ඩොලර් බිලියනයක අභ්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් ද ඇතුලුව 2019 දී බාහිර ණය ආපසු ගෙවීමේදී ජනවාරි මාසයේ දී කල් පිරුණු සහ ආපසු ගෙවන ලදී.

රටේ මතුපිට උද්ධමනය අඩු තනි ඉලක්කම්වල පැවතුන අතර මූලික උද්ධමනය ද සීමාවිය. දැඩි මූල්‍ය ප්‍රතිපත්ති 2018 වර්ෂය පුරාම පැවතුනි. නව දේශීය ආදායම් පනත සහ ඉන්ධන මිල සූත්‍රය හඳුන්වාදීම වැනි ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ රජය විසින් සිදුකරන ලදී.

## සුභවාදී කම්පන

වඩාත් ධනාත්මක සටහනක් මත, ශ්‍රී ලංකාව ලෝක බැංකුවේ ව්‍යාපාර කටයුතු පහසු කිරීමේ දර්ශණයේ රටවල් 190 ක් අතරින් ස්ථාන 11 ක් ඉදිරියට පැමිණ 100 ස්ථානය ලබාගෙන ඇත. කෙසේ වෙතත් වැඩි දිරිගැන්වීමේ උදාහරණයක් ලෙස අපනයනකරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ කාර්‍යක්ෂමතාව වැඩිදියුණු කිරීම, සමෘද්ධිමත්වී ජාත්‍යාන්තර වෙළෙඳපොළට ඇතුලුවීමට පහසුවනු ඇත.

2019 අප්‍රේල් 21 වන දින ත්‍රස්ත ප්‍රහාර නිසා රටට සෘණාත්මක ලෙස බලපා ඇති අතර, ලෝන්ලි ප්ලැනට් (Lonely Planet) මගින් 2019 සඳහා ඉහළම සංචාරක අභිමතාර්ථය ලෙස ශ්‍රී ලංකාව පත්වීම නිසා සංචාරක පැමිණීමේ ඉලක්ක සපුරා ගැනීමට රට තුළ ඇති ඉඩකඩ වැඩිකළ හැකි අතර, වාර්ෂික ඉපැයීම් වේගවත් කළ හැකිය. මෙමගින් ක්ෂුද්‍ර ව්‍යාපාර සහ මධ්‍ය ව්‍යාපාර හිමියන්ට මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගැනීමට හැකිවීමත් සමඟ ලීසිං අංශයට බලපෑමක් ඇති කළ හැකිය.

**එක්සත් ජනපද ඩොලරය අඛණ්ඩව ශක්තිමත් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය මූල්‍ය වෙළඳපොලෙන් අරමුදල් පිටතට ගලායාම ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතයට සහ විදේශ විනිමය සංචිත මත පීඩනය වැඩි කළේය. මෙහි ප්‍රතිවිපාකයන් අතර 2019 වසර තුළ රුපියල තවදුරටත් අවප්‍රමාණය වීමද ඇතුලත් විය හැකිය.**

# අවදානම් සහ අවස්ථාවන්

පීපල්ස් ලීසිං හිදී අපගේ අවධානය යොමු වී ඇත්තේ වගකිව යුතු ආයතනික පුරවැසියෙකු ලෙස කටයුතු කිරීමයි. තවද, අප ආයතනය තිරසාර ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා එහි ශක්තීන් හා සම්පත් කැපකරන ආයතනයන්හි අපගේ උපායමාර්ගයේ කේන්ද්‍රස්ථානය වන්නේ වටිනාකම් හා අගයන් නිර්මාණය කිරීමයි. එනම් අප අපගේ පාර්ශ්වකරුවන්ගෙන් වටිනාකම් උකහා ගන්නාසේම, ඔවුන්ටද වටිනාකම් හා අගයන් ලබා දීමයි.

මෙම වාර්තාවේ අප වැඩි වශයෙන් අවධානය යොමුකර ඇත්තේ, අප ආයතනයේ වටිනාකම් හා අගයන් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට වඩාත්ම බලපෑමක් ඇතිකරන ලද මාතෘකා දෙසටයි. අගයන් හා වටිනාකම් නිර්මාණය කිරීමේදී අප ක්‍රියාත්මක වන පරිසරය තුළ නිරන්තරයෙන් වෙනස් වන පරිසර තත්ත්වයන් අපගේ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා හා ප්‍රමුඛතා පාදක කර ගැනේ.

## ප්‍රමාණාත්මතාව

ප්‍රමාණාත්මතාව පිළිබඳ අභ්‍යන්තර හා බාහිර කරුණු තක්සේරු කිරීම සඳහා අප දැඩි තක්සේරුවක් පවත්වන්නෙමු. කිසියම් වූ කරුණක් හෝ සංසිද්ධියක් කොතරම් වැදගත්ද යන්න තක්සේරු කරනු ලබන්නේ අප ආයතනයට හා අපගේ පාර්ශ්වකරුවන්ට එහි ඇති අදාලත්වය හා වැදගත්කම තක්සේරු කිරීම තුළිනි. තවද සිදුවීමේ සම්භාවිතාව සහ එහි බලපෑමේ විශාලත්වය යන කරුණුද එකී තීරණ සඳහා වැදගත් වේ.

## ප්‍රධාන බලපෑම්

මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලය වනුයේ අනුරූපී පාරිසරික, සාමාජීය හා පාලන කාරණා හඳුනා ගැනීම සහ ආයතනයේ මෙහෙයුම් පරිසරය කෙරෙහි ඒවා ක්‍රියාත්මක වන ආකාරය මැන ගැනීමයි. අප ආයතනයේ සහ අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ තිරසාර මෙහෙයුම් කෙරෙහි බලපෑ හැකි අවදානම් සහ ලැබිය හැකි අවස්ථාවන් තීරණය කිරීම සඳහා අප හට අධ්‍යයන තොරතුරු කල හැක.

GRI 102-47

## හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ නැගීඑන ප්‍රවණතාවයන්ගෙන් පැනනගින කරුණු සහ ප්‍රධාන පාර්ශ්වකරුවන්ට ඒවා අදාළ වන්නේ කෙසේද යන්න හඳුනා ගැනීම සඳහා අපගේ බාහිර පරිසර විශ්ලේෂණය කළෙමු.

**පහත ප්‍රවණතාවයන් අප විසින් හඳුනා ගන්නා ලදී:**

1. සංවර්ධනය වෙමින් පවතින සහ නැගීඑන වෙළඳපොල ආර්ථිකයන්ගෙන් අරමුදල් ගලා ඒම.
2. ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ප්‍රමාණවත් නොවීම.
3. තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දායකත්වය දැක්වීමේ අවශ්‍යතාවය.
4. සංක්‍රමණය වැඩිවීම.
5. ඩිජිටල් අලෙවිකරණයේ අඛණ්ඩ වර්ධනය හා එහි බලපෑම.
6. බලශක්ති අර්බුදය සහ පුනර්ජනනීය නොවන බලශක්තිය වෙත ක්‍රමයෙන් මාරුවීම.
7. ණය ලබාදීමේදී පාරිසරික, සාමාජීය සහ පාලන අවශ්‍යතා කෙරෙහි සැලකිලිමත්වීමේ වර්ධනයක් දැකිය හැකිවීම.
8. මන්දගාමී දළ දේශීය නිෂ්පාදිතය සහ ආර්ථික වර්ධනය/අනාගත ආර්ථික වර්ධනයට පවතින අභියෝග/ජීවන වියදම ඉහළ යාම.
9. දේශපාලන අවිනිශ්චිතතාව සහ නැගීඑන ජනවාර්ගික ගැටුම්.
10. රුපියල තියුණු ලෙස ක්ෂයවීම.
11. කොළඹ කොටස් වෙළෙඳපොලේ දුර්වල ක්‍රියාකාරීත්වය.
12. සංචාරක ප්‍රවර්ධනය.
13. ගෝලීය තරඟකාරිත්ව දර්ශකයේ ශ්‍රී ලංකාවේ පහත වැටීම.
14. මූල්‍ය අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම.
15. දේශීය මූල්‍ය හා මූල්‍ය ප්‍රතිපත්තිවල නිරන්තර වෙනස්කම් (ණය ගැනීමේ පිරිවැය සහ බදු).
16. මූල්‍ය අවහිරතා.
17. ෆින් ටෙක්, ටෙක් ජයන්ට්ස් සහ ටෙල්කෝස් මඟින් ඇතිවන අධි තරඟකාරිත්වය,
18. තාක්ෂණයේ කාර්යභාරය සීඝ්‍රයෙන් වර්ධනය වීම.
19. සයිබර් ආරක්ෂාව/ATM කාඩ්පත් වංචා.
20. වැඩිවන නියාමන අවශ්‍යතා.
21. ආයතනයන්හි අනාගත ශක්‍යතාව කෙරෙහි ආයෝජකයින්ගේ උනන්දුව වැඩිවීම.
22. වෙනස් වෙමින් පවතින පාරිභෝගික අවශ්‍යතා.
23. වෙළෙඳපොල වෙනස්කම්වලට අනුගතවීමේ නිපුණතා.
24. ව්‍යවසායකත්ව කෙරෙහි අවධානය වැඩිවීම.
25. උපායමාර්ගික රාජ්‍ය හා පුද්ගලික හවුල්කාරිත්වයන්.
26. ස්වභාවික ව්‍යසනයන්ට ගොදුරුවීමේ අවදානම.
27. මුල් ළමාවිය සංවර්ධනය/අධ්‍යාපනය, සෞඛ්‍ය ගුණාත්මක හා ප්‍රමාණාත්මක ජල මූලාශ්‍ර සහ සෞඛ්‍ය ආරක්ෂිත පහසුකම් ආදි වූ සපුරා නොමැති සහ අඩුවෙන් සපුරා ඇති සමාජ ප්‍රමුඛතා
28. වන ගහණයේ සිදුවන සීඝ්‍ර අඩුවීම.
29. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමේ සෘණාත්මක බලපෑම් වැඩිවීම.

# අවදානම් සහ අවස්ථාවන්

මෙම ප්‍රවනතා පහත පරිදි වගුගත කර ඇත:

| | දේශපාලන | ආර්ථික | සමාජීය | තාක්ෂණික | පාරිසරික | නීති නියාමක |
|---|---|---|---|---|---|---|
| ආයෝජකයන් | 9 | 3, 11, 12, 13, 14, 16, 21 | | | | 20 |
| පාරිභෝගිකයින් | | 1, 8, 10, 15 | 7, 22 | 5, 18, 19 | | |
| සේවකයින් | | | 2, 4, 17 | 23 | | |
| ව්‍යාපාර හවුල්කරුවන් | | 25 | | | | |
| සමාජීය පරිසරය | | | 24, 27 | | 29 | |
| පරිසරය | | | | | 6, 26, 28 | |

3 සියලුම පාර්ශ්වකරුවන්ට අදාළ වේ.

ප්‍රවණතා නිසා ඇති වන අවදානම් සහ අවස්ථාවන්ට ප්‍රමුඛතාවය ලබාදී ඇත්තේ අපගේ දිගුකාලීන උපායමාර්ග, තරගකාරී තත්ත්වයන් සහ වටිනාකම්වල අදාළත්වය අනුවය.

## අවදානම්




## අවස්ථාවන්



# 4

# පාර්ශ්වකරුවන්ගේ සබඳතා ශක්තිමත් කිරීම

**68**

පාර්ශ්වකරුවන්

**70**

ප්‍රමාණාත්මක
කරුණු

# පාර්ශ්වකරුවන්

GRI 102-40 GRI 102-42 GRI 102-43 GRI 102-44

ප්‍රධාන පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම

පාර්ශ්වකරුවන් ශ්‍රේණිගත කිරීම හා ප්‍රමුඛතාවය ලබාදීම

පාර්ශ්වකරුවන් සඳහා වටිනා යෝජනා ක්‍රමවත්ව දැක්වීම

පාර්ශ්වකරුවන් සමග සම්බන්ධ වීම

**අපගේ ක්‍රියාවන්, නිෂ්පාදනයන් සහ සේවාවන් මඟින් සැළකිය යුතු ලෙස බලපෑම් කල හැකි පුද්ගලයන් හා කණ්ඩායම් අපගේ පාර්ශ්වකරුවන් ලෙස අර්ථ දක්වන්නෙමු. අනෙක් අතට, අපගේ උපාය මාර්ගික අරමුණු සපුරා ගැනීම සඳහා අප දරන උත්සාහයන්ට අපගේ පාර්ශ්වකරුවන්ගේ හැඟීම් සහ ක්‍රියාවන් බලපාන්නේ කෙසේද යන්න පිළිබඳව අපි හොඳින් දනිමු.**

69 වන පිටුවේ දක්වා ඇති පරිදි අපගේ පාර්ශ්වකරුවන් කණ්ඩායම් සමග සම්බන්ධව සිටීමට විධිමත් යාන්ත්‍රණ ගණනාවක් අපි පවත්වාගෙන යන්නෙමු. (වැඩි විස්තර සඳහා අන්තර්ජාල අනුවාදය බලන්න). ඊට අමතරව, අපගේ පාර්ශ්වකරුවන් සමග සම්බන්ධ වන සෑම අවස්ථාවකම එම සම්බන්ධතාව පවත්වා ගැනිමේ වගකීම ආයතනය පුරාම විහිදී පවතී.

පාර්ශ්වකරුවන් හා සම්බන්ධ වන ක්‍රම පිළිබඳ වැඩි විස්තර සඳහා අපගේ මංගත වාර්තාව බලන්න.

http://plc2018-19.annualreports.lk/sh.html

# පාර්ශ්වකරුවන්

නිර්මාණය කරන ලද වටිනාකම් බෙදා හැරීම සමතුලිත කරන අතරතුර අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන් කණ්ඩායම්වල අවශ්‍යතා සහ උත්සුකයන් වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමට හා ඒවාට විසඳුම් ලබාදීමට හැකි වන්නේ ඔවුන් සමග වන අර්ථවත් සංවාදයකින් පමණි.

අපගේ පාර්ශ්වකරුවන්ගෙන් ලැබෙන ප්‍රතිචාර මත පදනම්ව අපගේ ව්‍යාපාර ආකෘතිය සහ උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලින් වැඩිදියුණු කිරීම සඳහා අප අඛණ්ඩව කටයුතු කරන බැවින් ඵලදායි පාර්ශ්වකරුවන්ගේ මැදිහත් වීම අනාගතයට සූදානම් වීමට අපට බල කරයි.



# ප්‍රමාණාත්මක කරුණු

අපගේ සමාලෝචනයේ අන්තර්ගතය තීරණය කිරීම සඳහා අප වාර්ෂිකව ප්‍රමාණාත්මකතා තක්සේරුවක් පවත්වනු ලබන අතර, එහිදී අපගේ ව්‍යාපාරයට සහ අපගේ පාර්ශ්වකරුවන් හට වන සැළකිය යුතු ආර්ථික, පාරිසරික හා සමාජීය බලපෑම් කෙරෙහි නිසි සැළකිල්ලක් දක්වමු.

යම් මාතෘකාවක් ප්‍රමාණාත්මක හෝ වැදගත් වන්නේ කෙසේද යන්න තක්සේරු කරනු ලබන්නේ එම කරුණු පීපල්ස් ලිසිං ආයතනයට හෝ අපගේ පාර්ශ්වකරුවන්ට ඇති අදාළත්වය සහ එහි වැදගත්කම මතයි. එම කරුණු කොතරම් වැදගත්ද යන්න තීරණය වුයේ සිදුවීමේ සම්භාවිතාව සහ එහි බලපෑමේ විශාලත්වය අනුවයි.

## සම්පූර්ණත්වය

අපගේ තිරසාර කාර්යසාධනය කත්සේරු කිරීමට අපගේ පාර්ශ්වකරුවන්ට හැකිවන පරිදි සැළකිය යුතු ආර්ථික, පාරිසරික හා සමාජීය බලපෑම් පිළිබිඹු වන ප්‍රමාණාත්මකතා ආකෘතියක් හරහා අපගේ වාර්ෂික සමාලෝචනය වඩාත් ප්‍රමාණාත්මක කරුණු හා ඒවායේ සීමාවන් ආවරණය කරයි.

වැදගත් මාතෘකාවන් හදුනා ගැනීම සඳහා අපි තිරසාර සන්දර්භය, අපගේ දැක්ම, මෙහෙවර සහ වටිනාකම්, ව්‍යාපාර ආකෘතිය, පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය තුළින් ලබා ගන්නා ප්‍රතිචාර, ස්වාධීන පර්යේෂණ සහ වෙළඳපොල සමාලෝචන යනාදිය සැලකිල්ලට ගනිමු.

GRI 102-46 GRI 102-47 GRI 103-1

| GRI ප්‍රමිත අංකය | ප්‍රමාණාත්මක තේමාව | පීපල්ස් ලීසිං ආයතනයට ඇති ප්‍රමාණාත්මකතාව | පාර්ශවකරුවන්ට ඇති ප්‍රමාණාත්මකතාව | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | අභ්‍යන්තර | බාහිර | | | | |
| | | | සේවකයින් | ගනුදෙනුකරුවන් | ව්‍යාපාරික හවුල්කරුවන් | ප්‍රජාව | පරිසරය | ආයෝජකයින් |
| **ප්‍රමාණාත්මක GRI මාතෘකා** | | | | | | | | |
| 201 | ආර්ථික කාර්යසාධනය | √ | √ | √ | √ | √ | √ | √ |
| 202 | වෙළඳපොලෙහි පැවතුම | √ | √ | | | √ | | |
| 203 | වක්‍ර ආර්ථික බලපෑම් | √ | √ | √ | √ | √ | √ | √ |
| 204 | ප්‍රසම්පාදන පිළිවෙත් | √ | | | √ | √ | √ | |
| 205 | දූෂණ මර්ධන | √ | √ | √ | √ | √ | √ | √ |
| 206 | තරගකාරිත්ව විරෝධී චර්යාව | √ | √ | √ | √ | | | √ |
| 301 | ද්‍රව්‍ය | √ | √ | √ | √ | | √ | |
| 302 | බලශක්තිය | √ | √ | | | | √ | |
| 304 | ජෛව විවිධත්වය | √ | | | | | √ | |
| 305 | විමෝචන | √ | | | | | | √ |
| 307 | පාරිසරික අනුකූලතාව | √ | | √ | √ | | √ | |
| 308 | සැපයුම්කරුවන් පිළිබඳ පාරිසරික තක්සේරුව | √ | | | √ | | √ | |
| 401 | රැකියා නියුක්තිය | √ | √ | | | | | |
| 402 | කම්කරු/කළමනාකරණ සම්බන්ධතා | √ | √ | | | | | |
| 403 | වෘත්තීය සෞඛ්‍ය සහ රැකියාව | √ | √ | | | | | |
| 404 | පුහුණුව හා අධ්‍යාපනය | √ | √ | | √ | √ | | |
| 405 | විවිධත්වය සහ සමාන අවස්ථාව | √ | √ | | | | | |
| 406 | වෙනස්කම් නොදැක්වීම | √ | √ | | | | | |
| 408 | ළමා ශ්‍රමය | √ | √ | | | | | |
| 409 | බලාත් ශ්‍රමග්‍රහණය/අනිවාර්යයෙන් වැඩකිරීම | √ | √ | | | | | |
| 410 | ආරක්ෂක පිළිවෙත් | √ | √ | √ | √ | | | |
| 412 | මානව හිමිකම් තක්සේරුව | √ | √ | √ | √ | √ | √ | √ |
| 413 | ප්‍රාදේශිය ප්‍රජාවන් | √ | √ | | √ | √ | | |
| 414 | සැපයුම්කරුවන්ගේ සමාජ තක්සේරුව | √ | | | √ | √ | | |
| 417 | අලෙවිකරණය සහ ලේබල් කිරීම | √ | √ | √ | | √ | √ | |
| 418 | ගනුදෙනුකරුවන්ගේ රහස්‍යභාවය | √ | | √ | | | | |
| 419 | සමාජ ආර්ථික අනුකූලතාවය | √ | √ | √ | √ | √ | √ | |
| **වෙනත් ප්‍රමාණාත්මක මාතෘකා** | | | | | | | | |
| | ඩිජිටල් මුල්‍යකරණය | √ | √ | √ | | | √ | |
| | පාරිසරික, සමාජීය සහ පාලනය – (ESG) කාරණා | √ | √ | √ | √ | √ | √ | √ |

# ප්‍රමාණාත්මක කරුණු

GRI 102-49

ප්‍රමාණාත්මකතා සමාලෝචනයේදී සමහර මාතෘකා අපගේ මෙහෙයුම් සඳහා ප්‍රමාණාත්මක නොවන බව හඳුනාගෙන 2017/18 හා සසඳන විට ලැයිස්තුවෙන් ඉවත් කරන ලදී. තවද, ඩිජිටල් මූල්‍යකරණය හා ඊ.එස්.ජී. සලකා බැලීම් අලුතින් ලැයිස්තුවට ඇතුළත් කරන ලදී.

## සහාය වටිනාකම් නිර්මාණය කිරීම සඳහා අපගේ ප්‍රවේශය

පීපල්ස් ලීසිං ආයතනය තුළ අපගේ අවධානය යොමුවී ඇත්තේ තිරසාර ව්‍යාපාරයක් සඳහාත් අපගේ පාර්ශ්වකරුවන්ගෙන් ලබාගන්නා වටිනාකම තරමටම ඔවුන්ට වටිනාකමක් ලබාදීම සඳහා අපගේ ශක්තීන් හා සම්පත් කැපකිරීමටත්ය.

අපගේ ප්‍රමාණාත්මකතාව විශ්ලේෂණයේ ප්‍රතිඵල මත පදනම්ව අපගේ උපායමාර්ග සහ උපායමාර්ගික අවශ්‍යතා සකස් කරන ලදී. සියලු ප්‍රමාණාත්මක මාතෘකා අපගේ උපායමාර්ගික සැලැස්මට අනුකූලව හසුරවනු ලබන අතර, අදාළ ක්‍රියාකාරි ප්‍රධානීන්ට වගකීම් පවරා ඇත. ඒ සඳහා සම්පත් වෙන්කරනු ලබන්නේ අවදානම සහ අවස්ථාවෙහි ඇති ප්‍රමාණාත්මකතාව මතය. ඒ තුළින් නිර්වචනය කරනලද ප්‍රධාන කාර්යසාධන දර්ශකයන්ට එරෙහිව අපගේ සේවකයින්ගේ සහ මෙහෙයුම්වල ක්‍රියාකාරිත්වය මැනීම අපගේ වටිනාකම් ප්‍රස්තුතය තුළ රැඳී සිටීමට අප දරණ කැපවීම ශක්තිමත් කරයි. එය අධීක්ෂණ හා සමාලෝචන ක්‍රියාවලියක් වන අතර, එය අපගේ මෙහෙයුම් අවශ්‍ය පරිදි යථාතත්ත්වයට පත් කරන අතර, අපගේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කරගනිමින් අපගේ පාර්ශ්වකරුවන් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීමට උපකාරී වේ. තිරසාර පාලන මෙහෙයුම් කමිටුව හා අධ්‍යක්ෂක මණ්ඩලය කාර්තුමය පදනම මත ප්‍රගතිය සමාලෝචනය කරයි.

GRI 103-1 GRI 103-2 GRI 103-3

අපගේ කළමනාකරණ ප්‍රවේශය පිළිබඳ වැඩිදුර තොරතුරු අපගේ මංගත වාර්ෂික වාර්තාවː HTML අනුවාදයෙන් ලබා ගත හැකිය.

GRI ප්‍රමිතීන්, ප්‍රමාණාත්මකතාවට හේතු ඇතුලු කළමනාකරණ ප්‍රවේශය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා පහත දිගුව ඔස්සේ අපගේ මංගත වාර්තාවට පිවිසෙන්න.

http://plc2018-19.annualreports.lk/mm.html

# 5

# අපගේ ගමන්මග තීරණය කිරීම

# 74

## උපායමාර්ගික ගමන් මග

# උපායමාර්ගික ගමන් මග

සමාජ, ආර්ථික හා පාරිසරික අස්ථාවරත්වයන්, වැඩිවන වෙළෙඳපොල තරඟකාරිත්වය, දැඩි නියාමක සීමාවන් සහ සයිබර් අපරාධකරුවන්ගෙන් එල්ල වන දරුණු තර්ජන යන කරුණු හේතුකොටගෙන වටිනාකම් නිර්මාණය කිරීමට දරන උත්සාහයේදී දිනෙන් දින ඉහළ යන පීඩනයකට අපි ලක්ව සිටිමු.

අපගේ උපායමාර්ගික අවශ්‍යතා සැලසුම්කර ඇත්තේ අවදානම් අවම කරගැනීමට සහ අපට ඇති ප්‍රමාණාත්මක අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට හා පාර්ශ්වකරුවන්ගේ උත්සුකයන්ගෙන් ජනිත වූ හා අපගේ මෙහෙයුම් පරිසරයේ සමෝච්ඡයන් හැඩගස්වන ප්‍රවණතාවයන්ගෙන්ය.



**1**

තිරසාර වර්ධනයක් ළඟා කරගැනීම



**2**

පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම



**3**

ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයන් ළඟා කරගැනීම




**4**

කාර්යක්ෂම සම්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීම



**5**

වගකිවයුතු භාරකාරිත්වය මූර්තිමත් කිරීම

මෙහෙයුම් පරිසරයේ සිදුවන වෙනස්කම්වලට සරිලන ලෙස හැඩගැසීම සහ පාර්ශ්වකරුවන්ගේ උත්සුකයනට ප්‍රතිචාර වශයෙන් එක් එක් උපාය මාර්ගික අත්‍යාවශ්‍යතාවයන් යටතේ කෙටිකාලීන හා දිගුකාලීන අරමුණු අපි හඳුනා ගත්තෙමු. එය අපගේ උපායමාර්ගයන් නියම කරන දිශාවට අපගේ සමාගම මෙහෙයවීමට උපකාරි වේ. ඊට අමතරව එක් එක් උපායමාර්ගික අත්‍යාවශ්‍යතාවයන් සඳහා පසු පිටෙහි දක්වා ඇති උපායමාර්ග ගණනාවකින් සහාය ලැබේ. අපගේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට අප දරන උත්සාහයේදී එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකවීමේ අපගේ වගකීම පිළිබඳව ද අපි දැඩි ලෙස දනිමු.

# උපායමාර්ගික ගමන් මග

## අපගේ පරමාර්ථ

### 1 තිරසාර වර්ධනයක් ළඟාකර ගැනීම

**කෙටිකාලීන**

- වත්කම් වර්ධනය 15%ට වඩා ළඟාකර ගැනීම
- 20% වඩා වැඩි ලාභ වර්ධනයක් ළඟාකර ගැනීම
- 5% වඩා වැඩි සාමාන්‍ය පොළියක් පවත්වා ගැනීම
- අක්‍රීය ණය අනුපාතය 4.5%ට වඩා අඩුවෙන් පවත්වා ගැනීම හා හානිකරණ ගාස්තු අනුපාතය 1%ට වඩා අඩුවෙන් පවත්වා ගැනීම
- ප්‍රාග්ධනය කාර්යක්ෂමව භාවිතා කිරීම සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක මට්ටම් 13%ට වඩා පවත්වා ගැනීම

**මධ්‍ය හා දිගුකාලීන**

- වෙළෙඳපොල නායකත්වය සක්ෂාත්කර ගැනීම සඳහා වත්කම් පදනම අනුව වෙළෙඳපොල කොටස නැවත ලබා ගැනීමට එම කොටස අවම වශයෙන් 15%ක් දක්වා වැඩි කිරීම
- ණය කළඹෙන් ලැබෙන ප්‍රතිලාභ 21% දක්වා වැඩි කිරීම
- අක්‍රීය ණය අනුපාතිකය 4% වඩා අඩුවෙන් පවත්වා ගැනීම
- නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව ශක්තිමත් ප්‍රාග්ධන පදනමක් පවත්වා ගැනීම

### 2 පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

**කෙටිකාලීන**

- ගනුදෙනුකරුවන් සමග ඇති සබඳතා හා පාරිභෝගික තෘප්ති මට්ටම් වැඩි දියුණු කර ගැනීම
- සමාගමේ පාරිභෝගික පදනම වැඩි දියුණු කිරීම
- පාරිභෝගික පහසුව සහතික කිරීම සඳහා තාක්ෂණික ලක්ෂණ ඇතුළත්කොට සමාගමේ නිෂ්පාදන යාවත්කාලීන කිරීම
- රටපුරා සියලුම ජනාකීර්ණ ප්‍රදේශවල සමාගමේ ශාඛා තිබෙන බවට තහවුරු කිරීම

**මධ්‍ය හා දිගුකාලීන**

- රටේ වඩාත්ම කැමති මූල්‍ය සේවා සැපයුම්කරු බවට පත්වීම
- අසුරු සැනින් තොරතුරු ලබාගැනීමේ පහසුකම් සපයන අතරම, පාරිභෝගික සේවා සැපයීම ඩිජිටල්කරණය කිරීම

### 3 ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වය ළඟාකර ගැනිම

**කෙටිකාලීන**

- 40%ට වඩා අඩු ආදායමට පිරිවැය අනුපාතයක් සමග මෙහෙයුම් කාර්යක්ෂමතාව පවත්වා ගැනීම
- උපායමාර්ගික බැඳීම් පවත්වා ගනිමින් ව්‍යාපාරික හවුල්කරුවන් සමග ඇති සම්බන්ධතාවය වැඩි කිරීම
- ව්‍යාපාර අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අලෙවිකරණ සහ පසුපෙළ කාර්යමණ්ඩලයේ නිවැරදි මිශ්‍රණයක් පවත්වා ගැනීම
- කාර්යමණ්ඩලයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම

**මධ්‍ය හා දිගුකාලීන**

- බැංකු නොවන මූල්‍ය ආයතනයන් අතර අවම ආදායමට පිරිවැය අනුපාතය ළඟාකර ගැනීම
- ඉහළ නගින තරගකාරිත්වයට මුහුණදීම සඳහා ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම

### 4 කාර්යක්ෂම සම්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීම

**කෙටිකාලීන**

- ස්ථාවර අරමුදල් රැස්කිරීමෙන් කෙටිකාලීන පරිණත නොගැලපීම් අඩුකර ගැනීම
- අවදානම් අභිරුචි රාමුව තුළ නියම කර ඇති අවදානම් දරා සිටීමේ මට්ටම්වලට අනුකූලව මෙහෙයුම් කාර්ය සාධනය පවත්වා ගැනීම
- මුළු අරමුදල් පදනම තුළ අන්තර්ගත ණයගැනීම් සහ තැන්පතු අතර 40%-60%ක මිශ්‍රණයක් පවත්වා ගැනීම

**මධ්‍ය හා දිගුකාලීන**

- ආයතනය අභ්‍යන්තරයේ දක්වා ඇති සීමාවන්ට අනුකූලව ද්‍රවශීලතාව හා පොළී අනුපාත නොගැලපීම අඩුකරන අතරම, විවිධාංගිකරණය වූ අරමුදල් ප්‍රවාහයන් පවත්වා ගැනීම

### 5 වගකිවයුතු භාරකාරත්වය මූර්තිමත් කිරීම

**කෙටිකාලීන**

- ආයතනයේ සියලුම මෙහෙයුම් අංශ තුළ අනුකූලතාවයේ ඉහළම ප්‍රමිතීන් හා ආර්ථික, සමාජීය හා පාලන යන වැදගත්කම් පවත්වා ගැනීම
- සමාගමේ ලාභයෙන් අවම වශයෙන් 1%ක් සහ පවතින පුණ්‍යාධාර අරමුදලින් ලැබෙන ආදායම් සමාජ ප්‍රමුඛතා සහ පරිසර සංරක්ෂණය සඳහා ආයෝජනය කිරීම
- පරිසර හිතකාමී මූල්‍ය විසඳුම් සපයන්නකු වීම

**මධ්‍ය හා දිගුකාලීන**

- තිරසාර සංවර්ධන අරමුණු සක්ෂාසාත් කර ගැනීම සඳහා ධනාත්මක දායකත්වයක් සපයන අතරම ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ සහ පරිසරයේ ජාතික හා ප්‍රාදේශීය ප්‍රමුඛතා ආමන්ත්‍රණය කරමින් සමාජ වගකීම් දරන ආයතනික පුරවැසියෙකු ලෙස දිගටම කටයුතු කිරීම

# උපායමාර්ගික ගමන් මග



## අපගේ උපායමාර්ග

මෙහෙයුම් පරිසරයේ වේගවත් සංවර්ධනයට අනුකූලව කටයුතු කිරීම සඳහා අප කවුරුන් ද යන්න පිළිබඳ නිවැරැදි අවබෝධයකින් යුතුව පරිසරයේ ඇතිවන වෙනස්කම් අනුගමනය කිරීමේ වැදගත්කම අපි තේරුම් ගත්තෙමු.

ඒ අනුව අපගේ ගමන් මගෙහි හමුවන අවස්ථාවන් නිසි පරිදි උකහා ගැනීමටත් අවදානම් අවම කර ගනිමින් ඒ තුළින් අනාගත ස්ථාවරත්වය සහතික කිරීම සඳහා උපායමාර්ගික අවශ්‍යතා පහක් ප්‍රධාන වශයෙන් හඳුනා ගත්තෙමු.

### තිරසාර සංවර්ධනයක් ළඟාකර ගැනීම



තවදුරටත් හඳුනා නොගත් වෙළඳපොල අවස්ථා කෙරෙහි අවධානය යොමුකිරීමෙන් ව්‍යාපාර පරිමාව වැඩිකර ගැනීම

පාරිභෝගික කළඹ දැඩි ලෙස අධීක්ෂණය කිරීම සහ අගයකර ගැනීමේ පියවර තීව්‍ර කිරීම

කණ්ඩායම් සහජීවනය ප්‍රශස්ත කිරීම

ආයතනික වෙළඳනාම ප්‍රතිරූපය ස්ථානගත කිරීම සහ වර්ධනය කිරීම





### වගකිවයුතු භාරකාරත්වය මූර්තිමත් කිරීම

සදාචාරාත්මක, විවෘත හා විනිවිද පෙනෙන ව්‍යාපාරික පරිසරයක් පවත්වාගෙන යාම

යහපත් ආයතනික පාලන පරිචයක් පවත්වා ගැනීම

විහිදුනු තිරසාර වටිනාකමක් ඇති කිරීම සඳහා ජාතික හා දේශිය සමාජීය ප්‍රමුඛතා කෙරෙහි අවධානය යොමු කිරීම

ස්වාභාවික පරිසරයට අපගෙන් සිදුවන සෘජු බලපෑම නිසි පරිදි කළමනාකරණය කිරීම සහ ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගෙන යාම.

# අපගේ උපායමාර්ග << උපායමාර්ගික ගමන් මග



## පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

දිවයින පුරා විහිදුනු ශක්තිමත් ශාඛා ජාලය තුළින් ගනුදෙනුකරුවන්ට වඩාත් සමීපවීම

විවිධ වූ පාරිභෝගික කණ්ඩායම් හරහා නිෂ්පාදන කළඹ විවිධාංගීකරණය කිරීම

දීර්ඝකාලීන පාරිභෝගික සබඳතා (ජීවිත කාලය පුරාවට) වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ තෘප්තිමත් මට්ටම් වැඩි දියුණු කිරීම.

පාරිභෝගිකයින් සමග සම්බන්ධතා පවත්වන විවිධ ක්‍රම ඔස්සේ නව පහසුකම් හඳුන්වා දීම

වගකිවයුතු සන්නිවේදනය තුළින් පාරිභෝගික දැනුවත්භාවය වැඩි කිරීම

## ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වය ළඟා කර ගැනීම

මෙහෙයුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම

විශිෂ්ටත්වය ළඟාකර ගැනීම සඳහා හවුල්කාරී සබඳතා

වඩාත්ම සුදුසු කුසලතා පරිපූර්ණ සේවකයින් ආකර්ශනය සහ රඳවා ගැනීම

දක්ෂ, නියැළී සිටින සහ අභිප්‍රේෂිත කණ්ඩායමක් ගොඩනැඟීම

## කාර්යක්ෂම සම්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීම

අවදානමට එදිරිව ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීම සඳහා අරමුදල් ඵලදායි ලෙස භාවිතා කිරීම

ද්‍රවශීලතාවය කළමනාකරණය කරන අතරම, අරමුදල් ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම

වත්කම් කළඹේ කල්පිරීමේ හා අරමුදල් පදනමේ නොගැලපීම් අඩු කිරීම

ආයතනික වර්ධනය සහ ලාභදායීත්වය ළඟාකර ගැනීම සඳහා ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම

# 6

# ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

80
යෙදවුම්

83
වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

146
නිමැවුම්

148
ප්‍රතිඵල

150
බලපෑම

# යෙදවුම්

## ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා භාවිතාකරන සම්පත්

### මූල්‍ය ප්‍රාග්ධනය

- මූල්‍ය ස්ථායිතාව හා මූල්‍ය ශක්තිය
- රුපියල් බිලියන 27.03ක් වූ කොටස් ප්‍රාග්ධනය
- රුපියල් බිලියන 69.76ක් වූ පාරිභෝගික තැන්පතු
- රුපියල් බිලියන 55.70 ක් වූ ණය ගැනීම්
- අරමුදල් සහ ද්‍රවශීලතා කළමනාකරණ උත්සාහයන් සමග රුපියල් බිලියන 11.74ක් වූ ද්‍රවශීල වත්කම්
- ප්‍රාග්ධන කළමනාකරණ මූලපිරීම්
- කොටසකට රුපියල් 1.25 බැගින් ගෙවන ස්ථාවර ලාභාංශ ප්‍රතිපත්තිය
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනලද උපදෙස්, මාර්ගෝපදේශ සහ නිර්නායක
- කොළඹ කොටස් හුවමාරුවේ නීති රීති හා රෙගුලාසි
- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන්

### ආයතනික/බුද්ධිමය ප්‍රාග්ධනය

- රුපියල් බිලියන 6.5ක් වූ ශක්තිමත් ආයතනික/වෙළෙඳනාම ප්‍රතිරූපයක්
- මව් සමාගමේ/මහජන බැංකුවේ සහාය
- ෆිච් රේටිංස් ලංකා විසින් AA - (lka) ණය ශ්‍රේණිගත කිරීම
- අති නවීන මූලික තොරතුරු තාක්ෂණික පද්ධතිය
- ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුව
- සමාජ මාධ්‍ය තුළ පැවැත්ම වැඩිවීම
- අංග සම්පූර්ණ ශාඛා 103 ක් සමග දිවයින පුරා විහිදී සිටීම
- අවංකත්වය
- වංචාවන් පිළිබඳ අනාවරණය කිරීමේ ප්‍රතිපත්තිය
- ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි

### ආයෝජන ප්‍රාග්ධනය

- 8,500 කට අධික කොටස් හිමියන්ගෙන් සැදුම්ලත් කොටස්හිමියන්ගේ අරමුදල
- 45.83% ක් වළ ලාභාංශ ගෙවීමේ අනුපාතයක් සහිත ආකර්ෂණීය ලාභාංශ ප්‍රතිපත්තිය
- කොටස්හිමියන් සමග සන්නිවේදනය
- රුපියල් බිලියන 25 ක් වූ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය



# යෙදවුම්

### පාරිභෝගික ප්‍රාග්ධනය

- 250,000 කට වැඩි පාරිභෝගික/ගනුදෙනු-කරුවන් පදනම
- වැදගත් සේවාදායක සබඳතා
- ඵලදායි සන්නිවේදන මාර්ග
- වගකිය යුතු අලෙවිකරණ ක්‍රම
- පාරිභෝගික දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණය

### ව්‍යාපාරික හවුල්කරු-වන්ගේ ප්‍රාග්ධනය

- 27,000 කට වැඩි සැපයුම්කරුවන් පදනම
- සුහද සම්බන්ධතා
- පාරදෘෂ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය
- වාහන අලෙවිකරුවන් සමග ඇති උපාය මාර්ගික බැඳීම්

### මානව ප්‍රාග්ධනය

- වසර 13,000 කට වැඩි සමුච්චිත අත්දැකීම් ඇති කාර්යමණ්ඩලය
- 2,000 කට වඩා වැඩි විවිධාංගිකරණයවූ ශ්‍රම බලකාය
- කාර්යසාධනය මත පදනම් වූ ආයතන සංස්කෘතිය
- සෑම දෙයක් ගැනම ඇති දැඩි උනන්දුව
- සුහද කාර්මික සම්බන්ධතා
- ව්‍යවසාත්මක හැඟීම
- කාර්යයන් සඳහා ආචාරධර්ම
- වෙනස්කොට සැලකීම් නොකරන සේවා පරිසරයක්
- නවෝත්පාදන සඳහා ඇති අවධානය
- කැපවීම් හා පක්ෂපාතීත්වය
- සේවක දුක්ගැනවිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය
- බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය
- කාර්යසාධනය මත පදනම් වූ ප්‍රතිලාභ ව්‍යුහය

### සමාජ හා පාරිසරික ප්‍රාග්ධනය

- අංශ 5ක් වටා කේන්ද්‍රගත වූ ආයතනික සමාජ වගකීම් රාමුව
- හරිත ණය දෙන නිෂ්පාදන
- තිරසාර මෙහෙයුම් ක්‍රියාවලියක් සඳහා ආර්ථික, සමාජ හා පාලනයට අදාළ කරුණුවල ඇති අවශ්‍යතාව
- වගකිය යුතු ණයදීම් සඳහා ඇති ඉල්ලුම
- සමාජ කටයුතුවලට දායකත්වය ලබාගැනීම සඳහා වන ඉල්ලීම්
- සාධාරණ සම්පත් උපයෝජනයට ඇති ඉල්ලීම්
- එක්සත් ජාතීන්ගේ (UN) තිරසාර සංවර්ධන ඉලක්ක (SDGS)
- ගෝලීය වාර්තාකරණ ප්‍රවේශයේ ප්‍රමිතීන්ට අනුකූලවීම (GRI)
- පාරිසරික ප්‍රමිතීන් සහ නීති



බදු පසු ලාභය

# රුපියල් බිලියන 4.42

2017/18 රුපියල් බිලියන 4.31



ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

**අප වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම් ලෙස නිර්වචනය කරනුයේ යෙදවුම් නිමවුම් බවට පරිවර්තනය කිරීම තුළ ගනුලැබූ ක්‍රියාමාර්ගයන් හෝ ඉටුකරන ලද කාර්යයන් වේ. මෙම වටිනාකම් නිමැවුම් ක්‍රියාකාරකම් අප කටයුතු කරන පරිසරය හැඩගස්වන විශිෂ්ට උපනතීන් මගින් ඇතිකරන අවස්ථාවන් වෙත බලපාන අවදානම් අවම කිරීමෙහිලා මෙන්ම එම අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීම සඳහා අප සතුව ඇති පස් වැදෑරුම් උපායමාර්ගික අත්‍යවශ්‍යතා මගින් විස්තරාත්මකව දක්වා ඇත.**

මෙම සංකලිත වාර්ෂික වාර්තාව තුළ එකිනෙකට සම්බන්ධ වූ අපගේ මෙහෙයුම් පිළිබඳ විවිධ පැතිකඩයන් අප සාකච්ඡා කරනු ලැබේ. රූප සටහනේ දක්වෙන ආකාරයට අපගේ උපායමාර්ගික අත්‍යවශ්‍යතා සංකීර්ණ ලෙස සම්බන්ධවීමක් හා මනාලෙස සංකලිතවීමක් ප්‍රදර්ශනය කරයි.




අප විසින් වාර්ෂිකව ප්‍රකාශනය කරන සියළුම ඒකාබද්ධ වාර්තාවන් තුළින් අපගේ එක් එක් ප්‍රාග්ධනයන් වන, මූල්‍ය ආයතනික, ආයෝජන, පාරිභෝගික, ව්‍යාපාර හවුල්කරුවන්, සේවකයින්, හා සංයුක්ත වූ සමාජීය හා පාරිසරික කරුණු, එකිනෙකට බලපවත්වන හා ගැටෙන ආකාරය දක්වනු ලැබේ.

ඒකාබද්ධ චින්තනය අපගේ ව්‍යාපාර ආකෘතිය ශක්තිමත් කිරීමට හා ප්‍රතිසාධනය කිරීම හා පීපල්ස් ලීසිං සමාගම තුළ කටයුතු කරන ආකාරය සඳහා පාදක වේ. දිගුකාලීනව තිරසාරත්වය ඉක්මවන අපගේ අගය නිර්මාණයට මාර්ග යක් ලබාදෙන විවිධ වූ ඒකාබද්ධ දර්ශනයන් සඳහා එය ප්‍රතිඵලදායී විය. මෙලෙස එය පිරිවැය කාර්යක්ෂමව මෙහෙයවීම සහ ප්‍රාග්ධනය වඩා කාර්යක්ෂමව වෙන්කර දෙන අතරතුර, අවදානම් අඩුකිරීමට හා සැලකියයුතු මාත්‍රාවකට බන්ධනයවීම වළක්වාලීමට උපකාරී වේ. එමෙන්ම මෙවැනි ආකාරයෙන් වූ චින්තනයන් පහත කරුණු ඒකාබද්ධ කිරීමට හේතු වේ –

- අපගේ මෙහෙයුම් පරිසරය තුළ සමූහ ඉලක්ක සමග බැඳුණු ආර්ථික ඉලක්ක.
- වෙළෙඳපොල තුළ ව්‍යාපාරික අවස්ථාවන් සහිත ව්‍යාපාර ආකෘතිය.
- නිරන්තරයෙන් වෙනස්වන මෙහෙයුම් පරිසරයක් සහිත වූ උපායමාර්ග.
- සංයුක්ත පාරිභෝගික අත්දැකීම් සඳහා පාදක වන සියලු පාරිභෝගික ස්පර්ශයන් ආවරණය කරන සේවා ප්‍රමිතීන්.
- සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ බැඳියාව ඉහළින් පවත්වා ගැනීමට සියළු සන්නිවේදන මාධ්‍යයන් මගින් කෙරෙන මුඛ්‍යාර්ථ පණිවිඩ සන්නිවේදනය.
- මෑතකදී යාවත්කාලීන කළ පද්ධතීන් හා ක්‍රියාවලීන් සහිත වූ සේවක පුහුණුව හා සංවර්ධනය.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

## තිරසාර වර්ධනයක් වෙත ගමන් කිරීම

වගකිවයුතු ආයතනික පුරවැසියකු වශයෙන් තැන්පතු නිසි ලෙස උපයෝගීකර ගනිමින් ණය නිර්මාණය කිරීමේදී ජනතාවගේ මෙන්ම ආර්ථිකයේ වර්ධනය සහ සංවර්ධන අරමුණු කරගත් තිරසාර ප්‍රවේශයක් අප විසින් ක්‍රියාත්මක කරන්නෙමු. අප සපයන සේවාවන් සමාජයට අත්‍යාවශ්‍ය වන අතර, ව්‍යවසායේ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සඳහා ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය දිනාගැනීමට අපි උත්සාහ කරන්නෙමු.

ආයතනික වර්ධනය සඳහා මෙම දූරදර්ශී හා පාරිභෝගික කේන්ද්‍රීය ප්‍රවේශය අපගේ වෙළෙඳ නාමය ශක්තිමත්කර ඇති අතර, අද අප, සමාගමේ වත්කම් පදනමට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ විශාලතම බැංකු නොවන මූල්‍ය ආයතනයක් ලෙස ශ්‍රේණිගත කර ඇත්තෙමු.

තිරසාර වර්ධනයක් සඳහා යන ගමන්මග යනු, ලාභදායි වර්ධනයක් ලබාගැනීම සඳහා වර්තමාන ව්‍යාපාර සංවර්ධනය කිරීම, ක්‍රියාකාරකම් පරාසය පුළුල් කිරීම සහ ආදායම් ප්‍රවාහ විවිධාංගීකරණය කිරීම කෙරෙහි නිරන්තර අවධානයක් යොමුකරමින් අනාගත ආයතනික අරමුණු කරා ගමන් ගැනීමයි. මේ සම්බන්ධයෙන් අප ආයතනය විසින් නැගීඑන වෙළෙඳපොල තත්ත්වයන්ට සරිලන පරිදි නව නිෂ්පාදන නිපදවා ඇති අතර, කළමනාකරණය, ණය කළඹ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් ශක්තිමත් කර ඇත.

## පාර්ශ්වකරුවන් කෙරෙහි අපගේ බලපෑම

අයකරගැනීමේ නිලධාරීන් සවිබල ගැන්වීම්

පද්ධතිවල දියුණුව, ණය තක්සේරු කිරීම් සහ ඩිජිටල් සංවර්ධනයක් තුළින් කාර්ය මණ්ඩල ධාරිතා වර්ධනය

අප ආයතනය සතු වෙළෙඳපොල කොටස වර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම උදෙසා කණ්ඩායම් සහජීවනය අභිප්‍රේරණය කිරීම

බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් (Brand Finance) මගින් අප ආයතනය බැංකු නොවන මූල්‍ය ආයතන අතුරින් අංක 01 ලෙස ශ්‍රේණිගත කර ඇත




අංග සම්පූර්ණ ශාඛා 103කින් යුතු ජාලයක්

සේවා මධ්‍යස්ථාන 101 ක්

රුපියල් බිලියන 95.28ක් වූ ණය මුදාහැරීම් ප්‍රමාණයක්

පාරිභෝගික සත්‍ය අපහසුතා සැලකිල්ලට ගත් නිවැරදිව අයකර ගැනීම් ක්‍රමවේදයන්

නව්‍ය නිෂ්පාදිත 6ක්

ප්‍රාදේශීය ප්‍රජාව සවිබල ගැන්වීම

පරිසර සංරක්ෂණය කිරීම

ණය අයකර ගැනීම සඳහා අදාල නිපුණතාව සහිත බාහිර ආයතනයන්හි සහාය ලබාගැනීම

උපසමාගම්වලට අන්තර් සමූහ සේවා සහ මෙහෙයුම්

## තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය

8 DECENT WORK AND ECONOMIC GROWTH

සෑම දෙනාටම බැංකු, රක්ෂණ සහ මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය දිරිගැන්වීම හා පුළුල් කිරීමක් ඊට අවශ්‍ය ශක්‍යතා හා ධාරිතාවය ශක්තිමත් කිරීම

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## තිරසාර වර්ධනයක් වෙත ගමන් කිරීම

### → – තරඳුරටත් හඳුනා නොගත් වෙළෙඳපොල අවස්ථා කෙරෙහි අවධානය යොමු කිරීමෙන් ව්‍යාපාර පරිමාව වැඩි කිරීම

පහත වගුවේ දැක්වෙන පරිදි අපගේ වත්කම් පදනම වසර ගණනාවක් තිස්සේ වර්ධනය වෙමින් පවතින අතර එහි ප්‍රතිඵලයක් ලෙස එය පසුගිය වසර පහ තුළ 54%කින් වැඩිවී තිබේ. 12.05% ක වෙළඳපොළ කොටසක් සහිත බැංකු නොවන මූල්‍ය අංශයේ දෙවන විශාලතම වත්කම් පදනම අප සතුව ඇත.

**වත්කම් පදනම**

රු. බිලියන




**නව ව්‍යාපාර පරිමාව**

රු. බිලියන




වත්කම් පදනම සහ ව්‍යාපාරයේ පරිමාව වර්ධනය කිරීම සඳහා යොදා ගන්නා ප්‍රධාන උපාය මාර්ගයක් වන්නේ ශාඛා සඳහා මෙන්ම තනි අලෙවිකරුවන් සඳහාද ණයදීමේ ඉලක්ක සකස් කිරීම සහ කාර්යසාධනය අඛණ්ඩව අධීක්ෂණය කිරීමයි. එම ඉලක්ක සපුරා ගැනීම ශාඛා සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධන කළමනාකරණ පද්ධතියට ඇතුළත්කර ඇත.

කාර්යභාරයන් සහ වගකීම්, ව්‍යවස්ථාපිත රෙගුලාසි, ණය ඇගයීම, අනුමැතිය සහ අධීක්ෂණය වැනි කරුණු ගෙනහැර දැක්වීම, සමාගමේ ණය ප්‍රතිපත්තිය සමස්ත ණය ක්‍රියාවලියට මග පෙන්වයි. නිවැරදි ගනුදෙනුකරුවන්ට පහසුකම් ලබාදීම සහතික කිරීම සඳහා, ණය ඇගයීම සහ ණය ගුණාත්මකභාවය පිළිබඳ අපගේ සේවකයින්ගේ දැනුම වැඩිදියුණු කිරීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු.

සමාගමට දිවයින පුරා පුළුල් ශාඛා ජාලයක් ඇති අතර අංගසම්පූර්ණ ශාඛා 103ක් සහ සේවා මධ්‍යස්ථාන 101ක් ඇත. (වැඩි විස්තර සඳහා "දිවයින පුරා ජාලය හරහා වැඩිවීම" යටතේ 96 පිටුව බලන්න.)

එක් එක් නිෂ්පාදන කාණ්ඩ සඳහා ලබාදී ඇති මුදල පහත වගුවේ දක්වා ඇති අතර එය වසරින් වසර ලබාඇති වර්ධනය පිළිබිඹු කරයි.

| නිෂ්පාදනය | 2019 මාර්තු | 2018 මාර්තු | වෙනස | |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | (%) |
| මූල්‍ය කල්බදු | **41,943.48** | 44,625.94 | (2,682.46) | (6.01) |
| මෝටර් ණය | **18,721.89** | 10,820.65 | 7,901.24 | 73.02 |
| වෙනත් ණය | **28,270.09** | 27,088.90 | 1,181.19 | 4.36 |
| ඉස්ලාමීය මූල්‍යකරණය (IJ/MR/TM) | **6,347.14** | 5,316.64 | 1,030.50 | 19.38 |
| එකතුව | **95,282.60** | 87,852.13 | 7,430.47 | 8.46 |

තිරසාර වර්ධනයක් සඳහා වන උපායමාර්ගය වෙනස්වන වෙළෙඳපොල අවශ්‍යතා සපුරාලීම සඳහා නව නිෂ්පාදන සංවර්ධනය කිරීම සහ ලාභදායීතාව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමුකළයුතු බව අපි හඳුනා ගනිමු. පීපල්ස් ලීසිං විසින් මූල්‍ය වර්ෂය තුළ නව නිෂ්පාදන හයක් හඳුන්වාදී ඇති අතර, විවිධ පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට මෙන්ම වෙළෙඳපොලේ ඇති තරගකාරීත්වය මග හරවා ගැනීම සඳහා පවත්නා නිෂ්පාදනවල වැඩිදියුණු කරන ලද විශේෂාංග.

- **රන් ණය** – ඇපකරයක් ලෙස රත්‍රන් භාවිතා කිරීමෙන් අපගේ අවදානම් නිරාවරණය අඩුකරඇති අතර, හදිසි අරමුදල් අවශ්‍යතාවයන්ට මුහුණ දෙන නව ගනුදෙනුකරුවන්ද ආකර්ෂණයකර ගනිමු. මෙම නිශ්පාදනය භාර ගැනීම ප්‍රගතියක් පෙන්නුම්කර ඇති අතර සහතික කරන වර්ෂයේදී එය ශාඛා 40ක් දක්වා ව්‍යාප්ත කිරීමට අදහස් කරයි.
- **විචල්‍ය අනුපාත කල් බදු සහ ණය** – විචල්‍ය අනුපාත කල්බදු වෙළෙඳපොල හඳුන්වා දුන් බැංකු නොවන මූල්‍ය අංශයෙහි පළමු අවස්ථාව පීපල්ස් ලීසිං වන අතර, මෙය ගනුදෙනුකරුවන්ගේ ප්‍රසාදය දිනා ඇත. මෙම අවස්ථාවේදීද, අනුපාතවල නොගැලපීමේ අවදානමට අප නිරාවරණය වීම අඩුකරඇති අතර සමාගමට සම්මත කරගත හැකි ඕනෑම විභව අනුපාත අඩුකිරීම් සඳහා සහභාගීවීමට පාරිභෝගිකයාට අවස්ථාව ලබාදී ඇත.

(වැඩි විස්තර සඳහා "නිෂ්පාදන කළඹ" යටතේ පිටු 99 සහ 100 බලන්න.)

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## >> තිරසාර වර්ධනයක් වෙත ගමන් කිරීම

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

### මෙහෙයුම්

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, අපි මධ්‍යගත මෙහෙයුම් ගණන කලාප පහේ සිට දෙක දක්වා අඩු කළ අතර, මෙහෙයුම් ක්‍රියාවලියේ අඛණ්ඩතාව වැඩි දියුණු කළ අතර, අපගේ සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවූවෙමු.

වටිනාකම මත ණය අනුපාතය (LTV) අපගේ වත්කම් මත පදනම් වූ ණයදීමට අහිතකර ලෙස බලපා ඇති අතර, දූන් ලීසිං ක්ෂේත්‍රයට පිවිසෙන බැංකු සමග ඇති තරගකාරිත්වය වැඩි කරයි. වාහන ආනයන සඳහා ණයවර ලිපි විවෘත කිරීම පිළිබඳ සීමාවන් පනවන ලදී. රුපියල අවප්‍රමාණය සහ වාහන සඳහා නව බදු මගින් වාහන මිල ඉහළ ගිය අතර, එමගින් ඉල්ලුමට අහිතකර ලෙස බලපාන ලදී.

### පාරිභෝගික කළඹ දැඩි ලෙස අධීක්ෂණය කිරීම සමග අයකරගැනීමේ පියවර තීව්‍ර කිරීම

සමාගමේ තිරසාර වර්ධන සැලසුම් සඳහා අවදානම් පාලනය මූලික වේ. සාර්ථක ප්‍රතිඵල ලබාගැනීම සඳහා අවදානම් යෝජනා කරන්නන් කළමනාකරණය කිරීම වැදගත් බව අපගේ ස්ථාවරයයි. මේ සම්බන්ධයෙන් 2017 දී අපි අයකර ගැනීමේ අංශය සහ තවත් ප්‍රධාන ඒකක තුනක් සමග ප්‍රතිව්‍යුහගත කළෙමු. නව පියවරයන්, වෙළෙඳපොල තුළ අපගේ ස්ථාවරය ශක්තිමත් කිරීමට සහ අපගේ වත්කම්වල ගුණාත්මකභාවය, ලාභය සුරක්ෂිත කිරීමට උපකාරී වනු ඇතැයි විශ්වාස කෙරේ.

### ඉදිරිපෙළ ශක්තිමත් කිරීම

ප්‍රතිසංවිධානය කිරීමේ අපගේ පළමු පියවර වනුයේ ශාඛාවල අයකිරීමේ නිලධාරීන් සවිබල ගැන්වීමයි. එය සහතික කිරීම සඳහා ඔවුන්ගේ සියලු කාලය හා සම්පත් කැපීපෙනෙන අවශ්‍යතා සපුරාලීම සඳහා යොමු කිරීමට ඔවුන්ට හැකිවන පරිදි ප්‍රාදේශීය වශයෙන් මෙම නිලධාරීන් බඳවා ගන්නා ලදී. ඔවුන්ගේ දේශීය දැනුම, ගනුදෙනුකරුවන් සමග සමීප සබඳතා සහ ඔවුන්ගේ ව්‍යාපාර පිළිබඳ ගැඹුරු අවබෝධය අපගේ ගනුදෙනුකරුවන්ට පුද්ගලාරෝපිත හා අගය එකතු කළ සේවාවක් සැපයීමේදී ප්‍රයෝජනවත් බව ඔප්පු වේ.

සමාගමේ එකතු කිරීමේ උත්සාහයන් ශක්තිමත් කිරීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අයකර ගැනීම් යටතේ කැප වූ දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කර ඇත. අපගේම සේවකයින් පැවරීමට අමතරව, මාස 24ට වැඩි කාලයක් හිඟ මුදල් අය කර ගැනීම සඳහා අපි බාහිර ආයතන කිහිපයක් යොදවා ඇත්තෙමු.

කිසිදු ගිණුමක් නොසලකා හැරීම සහතික කිරීම සඳහා සමස්ත ශාඛාවේම අයකර ගැනීමේ කළඹ වගකීම භාර ගන්නා අයකර ගැනීමේ ප්‍රධානියා, අපගේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි නීති අංශය සමග සම්බන්ධව කටයුතු කරයි.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, 2019 මාර්තු මස අවසානයේදී අපගේ පිහිටුවන ලද කළඹ 3.91%ක් ලෙස ගණනය කරන ලද අතර, එය කර්මාන්තයේ සාමාන්‍ය 7.7%කට වඩා බෙහෙවින් අඩු විය.

### ක්‍රියාවලි ස්ථාවර කිරීම

අයකර ගැනීම් පෙර පැවති වඩාත් ආක්‍රමණශීලී ප්‍රවේශයට වඩා වෙනස් ගනුදෙනුකරුවන්ට සහන සහ බේරුම් කිරීම් ලබාදීමට අපගේ අයකර ගැනීමේ නිලධාරී පුහුණු කරනු ලැබේ. උසාවිය නියෝජනය කිරීම සඳහා බාහිර නීතිඥයින් අඛණ්ඩව සම්බන්ධ කර ගනිමින් ප්‍රගතිය අධීක්ෂණය හා ඇගයීම සඳහා අභ්‍යන්තර නීතිඥයින් පත්කිරීමටද අපි අදහස් කළෙමු.

ණය පිළිබඳ පසු විපරම් කිරීම සඳහා වගකිව යුතු නිලධාරියා සහ අයකර ගැනීමේ ක්‍රියාවලියේ අවදිය වැනි තොරතුරු අධීක්ෂණය කිරීමට විශේෂිත අයකරගැනීම් අංශයට ඉඩ සලසන වඩා වේගවත් ස්වයංක්‍රීය පද්ධතියක් අප විසින් හඳුන්වා දී ඇත.

අපගේ බැහැර කිරීමේ පාඩු අතර අය කර ගැනීමේ ඒකකයේ සහාය අයකර ගැනීමේ අංශයට තවත් වැදගත් එකතු කිරීමකි. ඔවුන් නැවත අවධානය යොමු කිරීමෙන් පසු වත්කම් බැහැර කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. (උදා: වාහනයක) මෙම ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සහ සමාගමට උපරිම ආදායම ලබා ගැනීම.

ඉදිරියේදී අයකර ගැනීමේදී ලබා ඇති ප්‍රගතිය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ඇමතුම් මධ්‍යස්ථාන වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ඇතැයි අපි විශ්වාස කරමු. එක් කලාපයක එහි ශක්‍යතාව සහ ඵලදායීතාවය ගවේෂණය කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ළඟදීම දියත් කෙරේ.

ණය ලබාදීමට පෙර ණය ලබන්නාගේ ශක්තිය තහවුරු කිරීම කෙරෙහි අන්තර් ක්‍රියාකාරී ක්‍රියාවලීන් කෙරෙහි අවධානය යොමු කරයි. මෙම භාවිතයේ අවධාරණය වන්නේ දුර්වල අයදුම්කරුවන්ගෙන් ණය එකතු කිරීම කෙරෙහි අවධානය යොමු කරනවා වෙනුවට බොල් ණය වළක්වා ගැනීමයි.

ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ උවමනාව මත, අනුමත කිරීමේ ක්‍රියාවලි විමධ්‍යගත කරඇති අතර, ණය කළඹ පිරිහීම වැළැක්වීම සඳහා කාර්යසාධන කළමනාකරණ ක්‍රියාමාර්ග ගෙන ඇත.

සමස්ත අයකරගැනීමේ ක්‍රියාවලියම තීරණයකට එළඹීමේදී බැරෑරුම් ලෙස සලකා බලනු ලබන ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලික තත්ත්වයන් කෙරෙහි සංවේදී ලෙස විමසා බලනු ලැබේ.

### සමූහයේ සහජීවනය ප්‍රශස්ත කිරීම

අපගේ සාර්ථකත්වය සඳහා අතිරික්ත අමුද්‍රව්‍යය පවතින්නේ සමූහය තුළ පවතින සහසම්බන්ධයෙනි. මව් ආයතනය සමග අපගේ සම්බන්ධතාවය, මහජන බැංකුව අඛණ්ඩව අපගේ ස්ථිරභාවය ශක්තිමත් කරන ශක්තිමත් ආකෘතියක් සපයයි. මෙම සම්බන්ධතාවය අධ්‍යක්ෂක මණ්ඩලය හා කළමනාකරණ මට්ටමින් සහයෝගීතාවය තුළින් හොඳම පුහුණුව ව්‍යාප්ත කිරීමට පහසුකම් සපයයි.

මහජන බැංකුව සමග ඇති සම්බන්ධය, ආශ්‍රිත සේවා සැපයුම්කරුවකු වීමේ අපේක්ෂාවන් විවර කර දෙන අතර, නිෂ්පාදන කළඹ සහ හරස් විකිණීම හරහා පාරිභෝගිකයන්ට පහසුවක් ලබාදෙයි. එබැවින් තරගකාරී පරිසරයක පීපල්ස් ලීසිං සමාගම වෙනස්කොට හඳුනාගත හැකිය.

### මව් ආයතනය සහ සමූහයේ සහක්‍රියාවන්

75% ක හිමිකමක් සහිතව මහජන බැංකුව අපගේ නැංගුරම ලෙස කටයුතු කරන අතර, ඔවුන්ගේ සන්නාමේ ප්‍රබලත්වය, බලවත් කීර්තිය, වෙළෙඳපොල තුළ පවතින තත්ත්වය සහ ඔවුන්ගේ අත්දැකීම් තුළින් විශාල සහයෝගයක් සපයයි. මීට අමතරව, මහජන බැංකු ශාඛා ජාලය තුළ කවුළු කාර්යාල වාසි ලබා ගැනීමට අපට හැකි වී ඇත.

### පරිපාලිකයන්

අපගේ පරිපාලිත සමාගම්වලට ඔවුන්ගේ උපරිම ශක්‍යතාවයට ළඟාවීමට සහායවීමට අපි උපායමාර්ගිකව පූර්ණ වශයෙන් කැපවී ඇත. අපගේ සන්නම, ශාඛා ජාලය සහ හවුල් සේවා වෙළෙඳපොල තුළ විශ්වාසය ගොඩනගන අතර, පරිපාලිතයන්ට ඔවුන්ගේ වෙළෙඳපොල පදනම ශක්තිමත්කර ගැනීමට සහ ශක්තිමත් ප්‍රතිඵල ළඟා කර ගැනීමටත්, සහාය වේ.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## තිරසාර වර්ධනයක් වෙත ගමන් කිරීම <<

**පීපල්ස් ලීසිං සමූහයේ පරිපාලිතයන් සහ පොදුවේ බෙදාගත් පහසුකම්**




### පීපල්ස් ඉන්ෂුවරන්ස්

පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. (PI) යනු පූර්ණකාලීන ජීවිත නොවන රක්ෂණකරුවකු වන අතර, එය රක්ෂණ කර්මාන්ත නියාමන කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරඇති අතර, කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන මණ්ඩලයේ ලැයිස්තුගත කර ඇත.

පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාල හයක මෙහෙයුම් පවත්වාගෙන යෑමට අමතරව, පීපල්ස් ලීසිං ශාඛා ජාලයේ ඇති කවුළු කාර්යාල ඔස්සේ සහ මහජන බැංකුවේ ප්‍රාදේශීය ශාඛාවල සිටින නියෝජිතයින් ඔස්සේ තම සේවා සපයනු ලබයි.

පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම අඛණ්ඩව මව් ආයතන සමග ඇති සබඳතා ශක්තිමත් කරගනිමින් සහ ඔවුන් සමග සමීපව කටයුතු කිරීමෙන් ඔවුන්ගේ විශාල පාරිභෝගික පදනම උපයෝගී කර ගැනීමටත් සහ පාරිභෝගික යොමුකිරීම් හරහා ඔවුන්ගේ ව්‍යාපාර වර්ධනයකර ගැනීමට කටයුතු කරයි. එසේම ඔවුන් සමූහයේ අනෙකුත් ආයතන සමග සහජීවනයෙන් සහ සහයෝගීතාවයෙන් කටයුතු කිරීමෙන් ඔවුන්ගේ රක්ෂණ අවස්ථා සපුරාලීමේ අවස්ථා ලබාගනී. පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ සමූහය තුළ සහයෝගීතාවයෙන්, විශේෂයෙන් මව් ආයතන හරහා ජනනය කරන ව්‍යාපාර කටයුතු මතයි. මෙය ඔවුන්ගේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතුවලින් 77% ක ප්‍රතිශතයකට දායක වේ.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## >> තිරසාර වර්ධනයක් වෙත ගමන් කිරීම



### ව්‍යාපාරික සංයුතිය




| | 2018/19 | 2017/18 |
|---|---|---|
| PLFML වෙතින් ලබාගත් ඇගයීම් වාර්තා (නැත) | **26,146** | 23,664 |
| පීපල්ස් ලීසිංවල මුළු තක්සේරුවලින් % ක් ලෙස PFLML තක්සේරු කිරීම | **51.56** | 56.29 |
| **කුලී ආදායම** | | |
| පීපල්ස් ලීසිං වලින් ලැබෙන ආදායම (රුපියල් මිලියන) | **46.69** | 40.67 |
| PI වෙතින් ලැබෙන කුලී ආදායම (රුපියල් මිලියන) | **3.52** | 3.70 |
| සේවා විකුණුම් පීපල්ස් ලීසිං සමූහයේ අලුත්වැඩියා කටයුතු (රුපියල් මිලියන) | **4.05** | 4.38 |
| පීපල්ස් ලීසිං සඳහා ස්ථිරවම වෙන්කරනලද වාහන සංඛ්‍යාව | **13** | 10 |

මව් ආයතනය සමග එක්ව වැඩකිරීම, නිෂ්පාදන – බෙදීම සහ හරස් විකිණීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස PI පුළුල් මූල්‍ය විසඳුමක් සැලසුම් කරයි.

අනෙකුත් උප සමාගම්වලට සමානව, එය සමූහ ජාලයේ පොදුවේ බෙදාගත් සේවාවන්ගෙන් සහ වෙනත් ඒවායින් ප්‍රයෝජන ගනී.

- පීපල්ස් ලීසිං ශාඛා 99ක් අතර සිටීම.
- මිලියන 16ක බැංකු රක්ෂණ ව්‍යාපාරයක් 2018 මූල්‍ය වර්ෂයේදී PI රුපියල් මිලියන 368ක් සමූහ රක්ෂණ ව්‍යාපාර හරහා ආකර්ෂණය කර සිටීම.
- හරස් විකුණුම් නිෂ්පාදන සහ සේවා
- දළ ලිඛිත වාරිකය (GWP) රුපියල් මිලියන 4,292 කි.

### පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්

ප්‍රමුඛ තිරසාර වාහන සමූහයක් ලෙස ශ්‍රී ලංකාවේ කළමනාකරණය, ව්‍යාපාරයක් ගොඩනගන අතරතුර පීපල්ස් ලීසිං සමූහ කළමනාකරණය (PLFML) කොටස්හිමියන්ට, ගනුදෙනුකරුවන්ට, සේවකයින්ට සහ සමාජයට වටිනාකමක් නිර්මාණය කරයි. අපගේ ලීසිං මෙහෙයුම් මෙන්ම හිමිකම් රක්ෂණ කළමනාකරණ ක්‍රියාවලියට සහය දක්වමින් නාවික සේවා සහ මෝටර් තක්සේරුකරණයේ සැලකිය යුතු සහජීවනය ලබා ගැනීම සමූහය තුළ හොඳින් ස්ථානගතවී ඇත.

PLFML විසින් ඔවුන්ගේ නියෝජිතයින් පීපල්ස් ලීසිං ශාඛාවල ස්ථානගත කිරීමෙන් සේවා සපයයි.

GRI 203-2

### පීපල්ස් මයික්‍රෝ-කොමර්ස් LTD

ක්ෂුද්‍ර මූල්‍යකරණය සඳහා වන අපගේ ව්‍යාපාරය, වටිනාකම් නිර්මාණය කිරීම සඳහා වන ප්‍රවේශය සහ මූල්‍ය ඇතුළත් කිරීම සඳහා වූ අපගේ කැපවීම සම්පූර්ණ කරයි. වඩාත් ශක්තිමත් පාරිභෝගික පදනමක් ලබා ගැනීමටත්, නියමිත වේලාවට ඔවුන්ගේ දෙමාපියන්ට දූන ගැනීමටත්, අවස්ථාවක් ලබාදෙන බිම් මට්ටමේ ප්‍රජාවක් අපට පෙනේ.

ඉලක්කගත ප්‍රේක්ෂකයින් මූලික වශයෙන් කාන්තාවන්ගෙන් සමන්විතවන අතර, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයාට සමාජ හා ආර්ථික වෙනසක් ගෙනඒමට බලයඇති අතර, එමගින් ඇතිවන විපාකය තුළින් ප්‍රතිලාභ ලබාගත හැකිය.

| මාර්තු 31 වන විට | 2019 | 2018 |
|---|---|---|
| පාරිභෝගික පදනම | **26,850** | 26,773 |
| ණය කළඹ (රුපියල් මිලියන) | **2,438.82** | 1,951.08 |

කුඩා හා මධ්‍ය පරිමාණ ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සහ ඔවුන්ගේ ජීවන රටාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා සමාගම ත්‍රීරෝද රථ සහ මෝටර් බයිසිකල් වැනි කුඩා වාහන සඳහා වෙළෙඳපොල පහසුකම් සපයයි.

පීපල්ස් ලීසිං මයික්‍රෝ-කොමර්ස් ලිමිටඩ් (PML) වත්කම් පිටුබලයලත් පහසුකම් සඳහා පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගමට සැලකිය යුතු ව්‍යාපාරික වටිනාකමක් ලබාදෙන අතර පීපල්ස් ලීසිං ශාඛා ජාලය හරහා දිවයින පුරා පුළුල් සේවාවන් සපයයි.

අනෙකුත් උප සමාගම්වලට සමානව, හවුල් සේවා පරාසයක් සඳහා PML මව් අනුග්‍රහය සහ කණ්ඩායම් සහයෝගීතාව භුක්ති විඳින අතර ඊට අමතරව –

- 33 PML ශාඛා පීපල්ස් ලීසිං ජාලය පුරා ක්‍රියාත්මකවේ.
- ව්‍යාපාර බෙදීම

### පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ්

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් දේපළ සංවර්ධනය හා දේපළ කුළියටදීම කෙරෙහි යොමුවී ඇත. සමාගම ප්‍රධාන වශයෙන් පීපල්ස් බැංකුව සඳහා ශාඛා ඉදිකිරීම සහ පීපල්ස් ලීසිං අධීක්ෂණය කිරීමේ නිරතවේ. දේපළ මිළදී ගැනීමේ හෝ කුළියට ගැනීමේදී ඔවුන් කණ්ඩායමේ අනෙක් ආයතනවලට උපදේශන සේවා සපයයි.

# අගය නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## තිරසාර වර්ධනයක් වෙත ගමන් කිරීම <<

### පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ්

සමාගමේ ප්‍රධාන ව්‍යාපාර කටයුතු වන්නේ කාර්යාල සංකීර්ණ ඉදිකිරීම හා ක්‍රියාත්මක කිරීමයි.

ඔවුන්ගේ සමූහ සමාගම් සඳහා නවීන වැඩබිම් සාධාරණව ලබා දෙයි.



අපගේ උප සමාගම්වල තොරතුරු අන්තර්ජාලය හරහා සොයාගත හැකිය.

http://plc2018-19.annualreports.lk/sr.html

### ආයතනික වෙළඳනාම ප්‍රතිරූපය ස්ථානගත කිරීම සහ ගොඩනැගීම

පහත දැක්වෙන පරිදි අපගේ වෙළඳනාම තත්ත්වය සමාලෝචනයට භාජනය වූ වර්ෂය පුරාම ශක්තිමත්ව පැවතිනි. ෆිච් ශ්‍රේණිගත කිරීම් ලංකා සමාගමට AA- (lka)හි ණය ශ්‍රේණිගත කිරීමක් ලබාදී ඇති අතර, එය ශ්‍රී ලංකාවේ ඉහළම ශ්‍රේණිගත කළ මූල්‍ය සමාගමකි. පීපල්ස් ලීසිං සඳහා ෆිච් ශ්‍රේණිගත කිරීමේ ජාත්‍යන්තර (B-) වෙතින් ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමක් ඇත. එය ස්වෛරී ශ්‍රේණිගත කිරීමට වඩා ඉහල එකකි. මූල්‍ය වර්ෂය තුළ ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් වෙතින් ලබාගත් ශ්‍රේණිගත කිරීම අත්හිටුවේ. සමාගම විදේශීය ණය ගැනීම් භාවිතා නොකරන බැවිනි.

### ශ්‍රේණිගත කිරීම්

| | 2018/19 | 2017/18 | 2016/17 | 2015/16 | 2014/15 |
|---|---|---|---|---|---|
| ෆිච් ශ්‍රේණිගත කිරීම් (ලංකාව) | **AA-(lka)** | AA-(lka) | AA-(lka) | AA-(lka) | AA-(lka) |
| ෆිච් ශ්‍රේණිගත කිරීම් (ජාත්‍යන්තර) | **B-** | B | B | B+ | B+ |
| ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් | **අත්හිටුවා ඇත** | B+/B | B+/B | B+/B | B+/B |

### සන්නාම වටිනාකම




පීපල්ස් ලීසිං වල මූලධර්ම ශක්තිමත්වී ඇත්තේ එහි සන්නාමේ වටිනාකම මූල්‍ය ස්ථායිතාවය, පාරිභෝගික මිත්‍රත්වය, විශ්වාසනීයත්වය යන කරුණුවලින්ය.

වෙනත් සාදක පහත පරිදි අපගේ සන්නමට අතිරේකව ලබා දී ඇත:

- ඉහත වගුවේ පෙන්වාදී ඇති පරිදි ඉහළ ශ්‍රේණිගත කිරීම් අඛණ්ඩව පවත්වා ගැනීම.
- බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. 2018 විසින් බැංකු නොවන මූල්‍ය සේවා ශාඛාවේ අංක 1 ශ්‍රේණියේ සන්නාම මූල්‍ය ශ්‍රේණිගත කිරීම් අඛණ්ඩව පවත්වා ගැනීම.
- සන්නාම වටිනාකම 2019 දී මූල්‍ය සේවා (ලීසිං) කාණ්ඩයේ රුපියල් බිලියන 8.72ක් වේ.
- 2014 දෙසැම්බර් සිට එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකයට ඇතුළත්කර තිබේ.

### වෙළඳනාම ශක්තිය වැඩිදියුණු කිරීම

දශක දෙකකට පෙර 1995 දී පිහිටුවන ලද, පීපල්ස් ලීසිං යනු ශ්‍රී ලංකාවේ විශාලතම රාජ්‍ය බැංකුවලින් එකක් වන මහජන බැංකුවේ පූර්ණ හිමිකාරිත්වය දරන සමාගමකි. කලින් පී.එල්.සී. ලෙස හැඳින්වූ සමාගම, තම මව් සමාගම සමග ඇති සම්බන්ධතාවය ප්‍රයෝජනයට ගනිමින් පීපල්ස් ලීසිං යන නම පිළිබිඹු වන පරිදි සිය වෙළඳනාමය වෙනස් කළේය.

තරගකාරීත්වය දැඩි පරිසරයක ප්‍රමුඛ ස්ථානයක් දැරීමට මිනිසුන් දායක වන සාධක මේවාය.

එහෙත් අපගේ සම්මානලාභීන් මත රැඳී සිටීම කිසි විටෙකත් සමාගමේ සාරධර්ම නොවේ. සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ක්‍රීඩකයන්ගෙන් වෙළෙඳපොළේ දැඩි තරගකාරීත්වයක්ද ඇති කර්මාන්තයක උදාසීනත්වය අතිශයින්ම භයානකය. අනෙක් අයට වඩා ඉදිරියෙන් සිටීමට අපිට නිරන්තරයෙන් බලපෑම් කරයි.

එහෙත්, අපගේ සම්මානලාභීන් මත රඳා සිටීම කිසි විටෙකත් සමාගමේ සාරධර්ම නොවේ. සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ක්‍රීඩකයින්ගෙන් වෙළෙඳපොළේ දැඩි තරගකාරීත්වයක් ඇති කර්මාන්තයක උදාසීනත්වය අතිශයින්ම භයානකය. අනෙක් අයට වඩා ඉදිරියෙන් සිටීමට අපට නිරන්තරයෙන් බලපෑම් කරයි.

හැකිතාක් දුරට තර්ජන වඩා හොඳින් අපේක්ෂා කිරීම සහ උදාසීන කිරීම සහ වෙළෙඳපොළ අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීම සඳහා අපට ඉතා ඉක්මනින් කැප වූ පර්යේෂණ හා සංවර්ධන අංශයක් ලැබෙනු ඇත. මෙම ඒකකය පිහිටුවීම තුළින් වෙළෙඳපොළ මනෝභාවයන් සහ අවශ්‍යතා වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ආරම්භ කරන ලදී. එවැනි පර්යේෂණවල පිටුබලය ඇතිව, නිෂ්පාදන වැඩිදියුණු කිරීමටත්, වෙළෙඳපොළ තුළට අපගේ ප්‍රවේශය වැඩිදියුණු කිරීමටත්, අභ්‍යන්තර ක්‍රියාවලීන් විධිමත් කිරීමටත්, සේවා ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමටත් අපිට හැකි වනු ඇත. එමගින් සමාගම පාරිභෝගික අපේක්ෂාවන් වෙනස් කිරීම වළක්වාලමින් වෙළෙඳපොළ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි අපගේ ව්‍යාපාරය හැඩගස්වනු ඇත.

වෙළෙඳපොළ නාමය නව වෙළෙඳපොළ වෙත ගෙන යාම අප ගවේශණය කරන තවත් මාර්ගයකි. 2017දී බංග්ලාදේශයේ වාණිජ මෙහෙයුම් සඳහා දැනටමත් භූගෝලීය සීමාවක් සීමාවන් ඉක්මවා ගොස් ඇති අපි දැනටමත් ලාභයක් උපයා ගනිමින් "රන් ණය" සහ "මුෂාරාකා" වැනි නව නිෂ්පාදන වෙළෙඳපොළට හඳුන්වා දෙමු.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## >> තිරසාර වර්ධනයක් වෙත ගමන් කිරීම



**2018/19 වසරේ ජයග්‍රහණයන්**

**ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයඃ** (Ceylon Chamber of Commerce) **මගින් පහත අයුරින් ඇගයීමට ලක්විය.**

1. 2018 වර්ෂයේ හොඳම තිරසාර ආයතනික පුරවැසියාට හිමි සම්මාන (Best Corporate Citizen Sustainability Awards 2018) අංශයෙන් පීපල්ස් ලීසිං ආයතනය හොඳම ආයතනික පුරවැසියන් දසදෙනාගෙන් කෙනෙකු ලෙස සම්මානයට පාත්‍ර විය.
2. මූල්‍ය කාර්යසාධනයේ අඛණ්ඩ වර්ධනය සහ ස්ථාවර සන්නිවේදනය (2018) සඳහා ඇගයීමට ලක්විය.



**පීපල්ස් ලීසිං සමාගම සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් සංවිධානය කරන ලද** (Institute of Certified Management Accountants of Sri Lanka (CMA), CMA **ඒකාබද්ධ වාර්තාකරණයේ විශිෂ්ටත්වය සඳහා වන සම්මාන උළෙලේදී ප්‍රමුඛතම සම්මාන 4 ක් දිනා ගනී.**

3. සමස්ථ ජයග්‍රහණය වෙනුවෙන් පිරිනැමෙන ලෝකඩ සම්මානයද,
4. ලීසිං හා ෆිනෑන්ස් රන් සම්මානය,
5. ඒකාබද්ධ වාර්තාකරණය පිළිබඳ හොඳම වාර්තාකරණ දහයෙන් එකක්වීම සඳහා පිරිනැමෙන සම්මානය (Ten Best Integrated Reports,
6. ඒකාබද්ධ චින්තනයඃ Integrated Thinking) සඳහා පිරිනැමෙන කුසලතා සම්මානය.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## තිරසාර වර්ධනයක් වෙත ගමන් කිරීම <<

**ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය (CA Sri Lanka) විසින් සංවිධානය කරනලද 2018 වාර්ෂික වාර්තා (Annual Report Awards) උදෙසාවූ සම්මාන උළෙලෙහිදී පහත සම්මානයට පාත්‍ර විය:**

7. ඒකාබද්ධ වාර්තාකරණයේ ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳ හොඳම අනාවරණය සඳහා වූ ලෝකඩ සම්මානය ද,
8. මූල්‍ය කල්බදු සහ වෙනත් මූල්‍ය ආයතන අංශය සඳහා වූ ලෝකඩ සම්මානය ද,
9. ආයතනික සමාජ වගකීම පිළිබඳ වාර්තාකරණය සඳහා වූ ලෝකඩ සම්මානය ද හිමි විය.

**දකුණු ආසියාතික ගණකාධිකාරවරුන්ගේ සම්මේලනය මඟින් සංවිධානය කරන ලද වඩාත්ම හොඳින් ඉදිරිපත් කරනලද වාර්ෂික වාර්තා ඇගයීමට ලක්වන සම්මාන උළෙලේ පහත සඳහන් සම්මානයන්ට පාත්‍ර විය. (SAFA 2018)**

10. ඒකාබද්ධ වාර්තාකරණය සඳහා දෙවන ස්ථානය ද,
11. මූල්‍ය සේවා අංශයෙන් කුසලතා සම්මානය ද හිමි විය.

**ARC Awards International – 2018 හි මූල්‍ය හා සාමාන්‍ය අංශයෙන් සම්මාන 4 කින් පිදුම් ලැබීය.**

12. "මූල්‍ය සේවා" අංශය යටතේ "මූල්‍ය දත්ත" සඳහා පිරිනැමෙන රිදී සම්මානය,
13. "මූල්‍ය සේවා" අංශය යටතේ "සභාපතිගේ පණිවිඩය" සඳහා පිරිනැමෙන ලෝකඩ සම්මානය,
14. මූල්‍ය සේවා" අංශය යටතේ "ලිඛිත සටහන්" සඳහා පිරිනැමෙන ගෞරව සම්මානය,
15. මූල්‍ය සේවා" අංශය යටතේ "ජාත්‍යන්තර නිර්මාණාත්ම සැලසුම" සඳහා පිරිනැමෙන ගෞරව සම්මානය

21. **2019 දී "පීපල්ස් ලීසිං" නාමය මූල්‍ය ක්ෂේත්‍රයේ වටිනාම පාරිභෝගික සන්නාමය සහ මූල්‍ය ක්ෂේත්‍රයේ වඩාත්ම ආදරයට බඳුන්වූ සන්නාමය ලෙස සම්මාන ලැබීය.**




IFFSA Awards 2018 –
**ශ්‍රී ලංකාවේ දකුණු ආසියාතික ඉස්ලාම් මූල්‍ය සංසදය**

16. වසරේ හොඳම ආයතනික සමාජ වගකීම් (CSR) ව්‍යාපෘතිය සඳහා රන් සම්මානයෙන් ද,
17. වසරේ හොඳම ඉස්ලාමීය මූල්‍ය නිෂ්පාදන සඳහා ලෝකඩ සම්මානය ද හිමිවිය.

**පීපල්ස් ලීසිං ආයතනයට බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයේ කාර්යසාධනය හා දායකත්වය අගයමින් සම්මාන රාශියක් ලැබී තිබේ. පාර්ශ්වකරුවන්ගේ දැනගැනීම සඳහා මේවා ලැයිස්තුගතකර ඇත.**

18. "Business Today" සගරාවේ ප්‍රබලතම ආයතන 30 අතරින් 13 වැනි ස්ථානය දිනා ගැනීමට සමත්ව ඇත.
19. බැංකු නොවන මූල්‍ය ආයතන අතුරින් විශිෂ්ටතම බැංකු නොවන මූල්‍ය ආයතනය ලෙස බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. ආයතන මඟින් ශ්‍රේණිගත කර ඇත.
20. STING උපදේශකයින් (STING Consultants) විසින් නිකුත් කරන ලද පරිදි පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් හි ආයතනික වගවීමේ ශ්‍රේණිගත කිරීම "රන්" ප්‍රමිතියට අනුකූල බව තහවුරු කර ඇත.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්



## පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

පීපල්ස් ලීසිං හීදී පාරිභෝගික සේවය සහ ව්‍යාපාරයේ සාර්ථකත්වය අතර, ඇති ශක්තිමත් සබඳතාව පිළිබඳ අපි පැහැදිලි අවබෝධයකින් සිටින්නෙමු. අප ආයතනයට, පාරිභෝගික සේවාව යනු හුදෙක් පාරිභෝගිකයින් හඳුනාගැනීම හා ඔවුන් වෙතට ළඟාවීම පමණක් නොව, ඔවුන්ගේ සියලු මූල්‍ය අවශ්‍යතා සඳහා පූර්ණ විසඳුමක් ලබාදීමයි.

## පාර්ශ්වකරුවන් කෙරෙහි අපගේ බලපෑම්




**සේවකයින්**

- සයිබර් සහ දත්ත සුරක්ෂිතතාව පිළිබඳ පුහුණුව හා සංවර්ධනය
- පාරිභෝගික සේවාවට පහසුකම් සපයන පද්ධති සහ ක්‍රියාවලි

**පාරිභෝගිකයින්**

- අන්තර්ජාලය හා ඒ හා සබැඳි අනෙකුත් සේවාවන් තුළින් පාරිභෝගික සේවාව වැඩිදියුණු කිරීම
- වැඩි නම්‍යශීලීතාවයකින් යුතු නව නිෂ්පාදිතයන් හඳුනාගැනීම
- ඉහළ සේවා ප්‍රමිතීන්
- සේවා ලබාගැනීමේදී විවිධ මාධ්‍යයන් අතර මාරුවීමේ පහසුව

**ආයෝජකයින්**

- ලීසිං, ණය තැන්පතු, ඉස්ලාමීය මූල්‍යකරණ සේවා, ආන්තික වෙළෙඳාම හා සාධකකරණය වැනි විවිධත්වයෙන් යුත් නිෂ්පාදනය කිරීම
- 8.16%ක්වූ පාරිභෝගික වර්ධනය
- ISO 27001 මගින් සහතික කර ඇති තොරතුරු සුරැකුම් කළමනාකරණ පද්ධතිය
- ඩිජිටල්කරණයට යොමු වූ අනාගතයක්

**ව්‍යාපාර හවුල්කරුවන්**

- ණය පහසුකම් අනුමත ක්‍රියාවලිය වේගවත් කිරීමට ඩිජිටල් මාධ්‍ය යොදාගැනීම
- අපගේ ගනුදෙනුකරුවන්ගේ තොරතුරු සුරක්ෂිතව කළමනාකරණය කිරීමට සහ අපගේ සේවකයින්ට ඉතා පහසුවෙන් පාරිභෝගික තොරතුරු ලබාගත හැකි පද්ධතියක් ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගනිමින් නිර්මාණය කිරීම

**සමාජය හා පරිසරය**

- සමාජය හා පාරිසරික වශයෙන් වගකීම ආරක්ෂා වන ආකාරයේ නිෂ්පාදන ඉදිරිපත් කිරීම
- ගනුදෙනුකරුවන්ට හා අදාළ ආර්ථික අංශයන්ට අදායම් උත්පාදනය සඳහා සහාය වන ප්‍රධාන ආර්ථික අංශ අරමුණු කරගත් නිෂ්පාදන හා සේවා හඳුන්වාදීම
- ඩිජිටල්කරණය කෙරෙහි යොමුවූ පුරවැසියන් බිහි කිරීම

## තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය

1 NO POVERTY

සියලුම ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට ආර්ථික සම්පත් හා මූල්‍ය සේවයට ප්‍රවේශවීමට සමාන අයිතිවාසිකම් ඇති බවට සහතික වීම.

10 REDUCED INEQUALITIES

වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ආබාධිතභාවය, ජාතිය, ජනවාර්ගිකත්වය සම්භවය, ආගම හෝ ආර්ථික හෝ වෙනයම් තත්ත්වයක් නොසලකා සියලු දෙනාගේ සමාජ හා ආර්ථික තත්ත්වයන් බලගැන්වීම හා ප්‍රවර්ධනය කිරීම.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

GRI 102-10

### පාරිභෝගික අත්දැකීම් වැඩි දියුණු කිරීම

පුළුල් ජාලය හරහා පැමිණීම වැඩි කිරීම, තරගකාරීත්වය ඉහළ මට්ටමක පවතින පරිසරයක අපගේ ගනුදෙනුකරුවන්ට අපගේ නිෂ්පාදන හා සේවාවන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි බව සහතික කිරීම සහ සැම විටම පීපල්ස් ලීසිං හි ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇති අතර, මේ අනුව අප දිවයින පුරා විහිදෙන අංග සම්පූර්ණ ශාඛා 103 ක් සහ සේවා මධ්‍යස්ථාන 101 පුළුල් කර තිබේ. අපගේ ප්‍රවේශය පුළුල් කිරීම සඳහා අප මව් සමාගම විසින් මහජන බැංකුව සමග සහයෝගයෙන් කටයුතු කර ඇත්තෙමු.

2019/20 දී අංග සම්පූර්ණ ශාඛා බවට පරිවර්තනය කිරීමට නියමිත සේවා මධ්‍යස්ථාන




ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතියට යටත්වේ.

මෙම කාර්යයේ කොටසක් ලෙස ඉහළ කාර්යසාධනයක් සහිත සේවා මධ්‍යස්ථාන ශාඛා බවට පරිවර්තනය කිරීම ඇතුළු පියවර ගැනීමෙන් අපි දිගටම ප්‍රවේශය වැඩි කරන්නෙමු.
ඊට අමතරව අපගේ නවතම ශාඛාව පුදුකුඩිඉරිප්පු හි විවෘත කෙරේ.

අපගේ අවධානය ගඩොල් සහ මෝටාර් වලින් ඔබ්බට ගොස් ඇත. අපි දැන් ෆේස්බුක්, වයිබර් සහ වට්ස්ඇප් වැනි සමාජ මාධ්‍ය වේදිකා හරහා ව්‍යාප්ත කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, අපගේ වෙබ් අඩවිය නැවත සකස් කිරීම තුළින් අපලේ නිරන්තර සේවාදායකයින් සඳහා වඩාත් අන්තර්ක්‍රියා සහ පාරිභෝගික හිතකාමී පරමාදර්ශී ස්පර්ශක ස්ථාන වේ.

මහජන බැංකුව සමග අපගේ සහයෝගීතාවය තුළින් පුළුල් මුදල් තැන්පතු යන්ත්‍ර (සී.ඩී.එම්) ජාලයක්, මාර්ගගත ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීමේ පද්ධතිය (එස්.එල්.අයි.පී) සහ කොමන් ඉලෙක්ට්‍රොනික් අරමුදල් ට්‍රැස්ෆර් ස්විච් (සී.එෆ්.ටී. එස්) හරහා අපගේ ප්‍රේෂණය පුළුල් කරන්නෙමු.

අපගේ ශාඛා ජාලය පිළිබඳ විස්තර අන්තර්ජාලය හරහා සොයාගත හැකිය.

http://plc2018-19.annualreports.lk/bn.html

### අපගේ පාරිභෝගික පදනමේ සංයුතිය –

හරස් විකිණීම හැරුණු විට, අපගේ ගණුදෙනුකරුවන්ගෙන් තුනෙන් දෙකක් තැන්පත්කරුවන්ගෙන් සමන්විත වන අතර, අනෙක් අය ගනුදෙනුකරුවන් ණයට ගනිමින් අපගේ තැන්පතු පාරිභෝගිකයා වැඩි වශයෙන් ආයෝජනය කරන්නේ ඉතුරුම් තැන්පතුවලය. ඒවා අපට සාපේක්ෂව අඩු පිරිවැයක් වන අතර ස්ථාවර අරමුදල් වේ. ගනුදෙනුකරුවන් උනන්දු වූ ප්‍රධාන නිෂ්පාදන ලීසිං වේ. එබැවින් එය අපගේ මුළු ණය දෙන ගනුදෙනුකරුවන්ගෙන් බහුතරයක් නියෝජනය කරයි.

# පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

## >> පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම



GRI 102-6

**ප්‍රධාන නිෂ්පාදන අනුව කොටස්කර ඇති ගනුදෙනුකරුවන් සංඛ්‍යාව**




සටහන - හරස් විකිණීම හේතුවෙන් මුළු ගනුදෙනුකරුවන්ගේ සංඛ්‍යාව එක් එක් නිෂ්පාදනයේ එකතුවට වඩා අඩුය.

## පාරිභෝගික කොටස් හරහා නිෂ්පාදන කළඹ විවිධාංගීකරණය කිරීම

තරගකාරීත්වය දරුණු වන වෙළෙඳපොලක අපගේ අනාගතය පවතින්නේ අපගේ නිෂ්පාදන හා සේවාවන් විවිධාංගීකරණය කිරීමයි. දැනට අපගේ නිෂ්පාදන කළඹ විහිදේ. ලීසිං, ණය, තැන්පතු, ඉස්ලාමීය මූල්‍ය නිෂ්පාදන, ආන්තික වෙළෙඳාම සහ සාධතතරණය (සමස්ත නිෂ්පාදන කළඹ සඳහා මාර්ගගතව බලන්න) අපගේ නිෂ්පාදන වෙළෙඳපොලේ ඇති සුවිශේෂ අංගයන්ගෙන් සමන්විත වේ. උදාහරණයක් ලෙස, අපි අපගේ ගනුදෙනුකරුවන්ට පිරිනමන්නෙමු. වෙළෙඳපොළ උච්චාවචනයන්ගෙන් සහතික නොවන හා බලපෑමට ලක් නොවන අද්විතීය ඉතිරි කිරීම් සහ ආයෝජන සැලැස්ම - ශ්‍රී ලංකාවේ මහ බැංකුවෙන් (CBSL) NBFI වෙත මෙවැනි අනුමැතියක් ලැබුණු පළමු අවස්ථාව මෙයයි.

මෙම පරාසයට අමතරව, අපගේ අද්විතීය අත්දැකීම් සම්මිශ්‍රණය, පාරිභෝගික කේන්ද්‍රීයභාවය සහ තාක්ෂණික දියුණුව සඳහා නිරාවරණයට මෙන්ම අප අපගේ නිෂ්පාදන හා සේවාවන්ට ස්තූතිය පිරිනමයි. ජීවන අරමුණු සඳහා ඉතුරුම් සැලසුම් කිරීමට අපි ගනුදෙනුකරුවන්ට උදව් කරන්නෙමු. පාරිභෝගික පදනමේ ස්ථාවර වර්ධනය අපගේ නිෂ්පාදනවල ශක්තිය මෙන්ම අදාළත්වය සඳහා හොඳම සාක්ෂියකි.

**පාරිභෝගික පදනමේ වර්ධනය**




වර්ෂය තුළදී, පාරිභෝගික අවශ්‍යතා පිළිබඳ අපගේ ගැඹුරු දැනුම, වැඩි නම්‍යශීලී බවක් සහ නව අංගයන් ලබා දෙමින් පවත්නා නිෂ්පාදන නැවත සැලසුම් කිරීම සඳහා භාවිතා කළෙමු. පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සඳහා නිර්මාණය කර ඇති විශේෂාංග හරහා අපි නව නිෂ්පාදන ගණනාවක් හඳුන්වා දුන්නෙමු.

## භූගෝලීය පැවැත්ම

අපි සෑම පළාතකම සිටින අතර, අපගේ සමාජයේ අඩු සංවර්ධනයට හා ධනවත් කොටස්වලට සේවය කිරීමට හැකියාව ඇත. අපගේ ණය දෙන ගනුදෙනුකරුවන්ගෙන් 63.14% ක් බස්නාහිර පළාත හැර වෙනත් පළාත්වල ජීවත් වන අතර, වැඩ කරන අතර වර්ෂය තුළ බෙදාහැරීම්වලින් 57.22% ක් මෙම ගනුදෙනුකරුවන්ට ලබා දී ඇත.

අපගේ නිෂ්පාදන කළඹ හරහා පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම හා ඉක්මවා යාම හැරුණුවිට ආර්ථිකයට ධනාත්මක බලපෑමක් ඇති කිරීමට අපි බලාපොරොත්තු වෙමු. අපගේ නිෂ්පාදන හා සේවාවන් ප්‍රධාන ආර්ථික අංශ හා වාණිජ අරමුණු සඳහා අප විසින් සපයනු පහසුකම් අපගේ ගනුදෙනුකරුවන්ට පමණක් නොව අදාළ අංශ සඳහාද ආදායම් උත්පාදනයට අනුබල දෙයි.

මුළු පාරිභෝගික පදනම

**311,135**

2018 – 287,655



# පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

## >> පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම



GRI 102-4 GRI 102-6

**ගනුදෙනුකරුවන්ගේ භූගෝලීය ව්‍යාප්තිය**



### උතුරු පළාත

| | | |
|---|---|---|
| | ශාඛා | 5 |
| | සේවා මධ්‍යස්ථාන | 11 |
| | මුළු ගනුදෙනුකරුවන් | 9,809 |
| ණයදීම් | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 3,878 |
| | ණයදීම් (රුපියල් මිලියන) | 2,944 |
| | ශුද්ධ ණය කළඹ (රුපියල් මිලියන) | 3,830 |
| තැන්පතු | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 5,931 |
| | තැන්පතුවල වටිනාකම (රුපියල මිලියන) | 1,462 |

### උතුරු මැද පළාත

| | | |
|---|---|---|
| | ශාඛා | 5 |
| | සේවා මධ්‍යස්ථාන | 9 |
| | මුළු ගනුදෙනුකරුවන් | 20,461 |
| ණයදීම් | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 6,833 |
| | ණයදීම් (රුපියල් මිලියන) | 4,243 |
| | ශුද්ධ ණය කළඹ (රුපියල් මිලියන) | 6,701 |
| තැන්පතු | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 13,628 |
| | තැන්පතුවල වටිනාකම (රුපියල මිලියන) | 582 |

### වයඹ පළාත

| | | |
|---|---|---|
| | ශාඛා | 10 |
| | සේවා මධ්‍යස්ථාන | 10 |
| | මුළු ගනුදෙනුකරුවන් | 28,692 |
| ණයදීම් | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 10,849 |
| | ණයදීම් (රුපියල් මිලියන) | 7,563 |
| | ශුද්ධ ණය කළඹ (රුපියල් මිලියන) | 11,144 |
| තැන්පතු | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 17,843 |
| | තැන්පතුවල වටිනාකම (රුපියල මිලියන) | 2,563 |

### මධ්‍යම පළාත

| | | |
|---|---|---|
| | ශාඛා | 12 |
| | සේවා මධ්‍යස්ථාන | 8 |
| | මුළු ගනුදෙනුකරුවන් | 38,754 |
| ණයදීම් | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 14,338 |
| | ණයදීම් (රුපියල් මිලියන) | 9,559 |
| | ශුද්ධ ණය කළඹ (රුපියල් මිලියන) | 15,039 |
| තැන්පතු | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 24,416 |
| | තැන්පතුවල වටිනාකම (රුපියල මිලියන) | 5,463 |

### බස්නාහිර පළාත

| | | |
|---|---|---|
| | ශාඛා | 32 |
| | සේවා මධ්‍යස්ථාන | 16 |
| | මුළු ගනුදෙනුකරුවන් | 155,352 |
| ණයදීම් | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 45,223 |
| | ණයදීම් (රුපියල් මිලියන) | 40,758 |
| | ශුද්ධ ණය කළඹ (රුපියල් මිලියන) | 69,643 |
| තැන්පතු | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 110,129 |
| | තැන්පතුවල වටිනාකම (රුපියල මිලියන) | 68,788 |

### නැගෙනහිර පළාත

| | | |
|---|---|---|
| | ශාඛා | 9 |
| | සේවා මධ්‍යස්ථාන | 11 |
| | මුළු ගනුදෙනුකරුවන් | 18,938 |
| ණයදීම් | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 6,393 |
| | ණයදීම් (රුපියල් මිලියන) | 4,750 |
| | ශුද්ධ ණය කළඹ (රුපියල් මිලියන) | 6,867 |
| තැන්පතු | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 12,545 |
| | තැන්පතුවල වටිනාකම (රුපියල මිලියන) | 1,019 |

### ඌව පළාත

| | | |
|---|---|---|
| | ශාඛා | 6 |
| | සේවා මධ්‍යස්ථාන | 7 |
| | මුළු ගනුදෙනුකරුවන් | 30,326 |
| ණයදීම් | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 8,908 |
| | ණයදීම් (රුපියල් මිලියන) | 5,558 |
| | ශුද්ධ ණය කළඹ (රුපියල් මිලියන) | 8,449 |
| තැන්පතු | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 21,418 |
| | තැන්පතුවල වටිනාකම (රුපියල මිලියන) | 1,396 |

### දකුණු පළාත

| | | |
|---|---|---|
| | ශාඛා | 15 |
| | සේවා මධ්‍යස්ථාන | 17 |
| | මුළු ගනුදෙනුකරුවන් | 47,167 |
| ණයදීම් | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 18,917 |
| | ණයදීම් (රුපියල් මිලියන) | 14,609 |
| | ශුද්ධ ණය කළඹ (රුපියල් මිලියන) | 22,315 |
| තැන්පතු | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 28,250 |
| | තැන්පතුවල වටිනාකම (රුපියල මිලියන) | 5,028 |

### සබරගමුව පළාත

| | | |
|---|---|---|
| | ශාඛා | 9 |
| | සේවා මධ්‍යස්ථාන | 12 |
| | මුළු ගනුදෙනුකරුවන් | 23,755 |
| ණයදීම් | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 7,499 |
| | ණයදීම් (රුපියල් මිලියන) | 5,302 |
| | ශුද්ධ ණය කළඹ (රුපියල් මිලියන) | 7,720 |
| තැන්පතු | ගනුදෙනුකරුවන් සංඛ්‍යාව | 16,256 |
| | තැන්පතුවල වටිනාකම (රුපියල මිලියන) | 2,068 |

හරස් විකුණුම් සැලකිල්ලට ගෙන නොමැත.

# පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

## >> පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

GRI 102-6

**විවිධ අංශවල දායකත්වය (2019 මාර්තු 31 වන දිනට දළ ණය කළඹ රුපියල් මිලියන වලින්)**

| අංශය | වටිනාකම |
|---|---|
| මූල්‍ය සේවා | 4,361 |
| කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය | 23,499 |
| නිෂ්පාදන කර්මාන්ත | 8,172 |
| සංචාරක ක්ෂේත්‍රය | 3,728 |
| ප්‍රවාහන හා ගබඩා පහසුකම් | 31,529 |
| ඉදිකිරීම් හා යටිතල පහසුකම් සංවර්ධනය | 12,009 |
| තොග සහ සිල්ලර වෙළෙඳාම | 18,755 |
| සෞඛ්‍ය සේවා, සමාජ සේවා සහ උපකාරක සේවා | 33,836 |
| පරිභෝජනය | 9,085 |
| වෙනත් අංශ | 11,679 |

GRI 206-1

### අපගේ සේවාවන්

අපගේ නිෂ්පාදනයන් ගොඩනගා ඇත්තේ පීපල්ස් ලීසිං සන්නාමය කෙරෙහි පාරිභෝගිකයාගේ විශ්වාසය සැලකිල්ලට ගනිමින් හා පවතින වෙළඳපොල ප්‍රවණතාවන් තුළ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා පිළිබඳ අපගේ අවබෝධය තුළිනි. අපගේ නිෂ්පාදන ප්‍රතිපත්තිය මූලික වශයෙන් අවධානය යොමුකර ඇත්තේ පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සඳහාය.

කෙසේ වෙතත් එහි අවසාන ඉලක්කය වන්නේ පවත්නා සේවා ප්‍රමිතීන් වැඩි දියුණුකර ගනිමින්, නව සහ අදාළ නිෂ්පාදන ගොඩනැගීම සහ අපගේ සියලුම පාරිභෝගික කොටස් සමග ශක්තිමත් සබඳතා ගොඩනගා ගන්නා අතර, පුළුල් ජනගහනයක් වෙත අපගේ ප්‍රවේශය ව්‍යාප්ත කිරීමයි.

අපි තරඟකාරී සංගති විරෝධී සහ ඒකාධිකාරී ක්‍රියාවල නිරත නොවෙමු. අපගේ නිෂ්පාදන වෙළෙඳපොල ප්‍රවණතා සහ රටේ මූල්‍ය ප්‍රතිපත්තියට අනුකූලව මිල කර ඇත. එබැවින් වාර්තාවට අදාළවන වර්ෂය තුළදී අප කිසිම දඬුවමකට ලක්ව නොමැති අතර, දඩ මුදල් ගෙවීමටද සිදුවී නොමැත.

# පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

## >> පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

### සේවා ප්‍රමිති

සමාගමේ අරමුණු සහ ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් ඇතුළත් කිරීම සඳහා අප දායක වන සේවා සැපයුම් ආකෘතිය අප සපයන සේවා මට්ටමට ද්‍රව්‍යමය වශයෙන් බලපෑ හැකි සාදක පහත දක්වේ:




### ලීසිං

අපගේ ප්‍රධාන නිෂ්පාදනයක් වන අතර, දළ වශයෙන් රුපියල් මිලියන 87,421.57ක් සහ ගනුදෙනුකරුවන් 92,508ක් වන අපි මෑතකදී අපගේ ලීසිං නිෂ්පාදන හා සේවා කට්ටලයට අතිරේකව මෝටර් රථ සඳහා පුද්ගලයින්ට සහ ව්‍යාපාරික ව්‍යවසායයන් සඳහා විචල්‍ය පොලී ලීසිං හඳුන්වා දීමත් සමඟ ගනුදෙනුකරුවන්ට අනුපාතය සහ කාලසීමාව අනුව වැඩි වාසි ලබා ගත හැකිය. මෙම කෙටි කාලය තුළ නිෂ්පාදිතය රුපියල් මිලියන 54ක් හා මිලියන 49ක දළ කළඹක් සමග පොරොන්දුවක් පෙන්වයි. අපගේ සමස්ත ලීසිං නිෂ්පාදන කළඹ සඳහා වන සමස්ත අක්‍රීය ණය අනුපාතය 2.07% ක් වන අතර, ඒ සඳහා වන ගැටුමේ අනුපාතය 95.10%කි.

### ණය

ශක්ති ව්‍යාපාර ණය, ශාස්ත්‍ර අධ්‍යාපන ණය සහ සැනසුම් පියස නිවාස ණය යන නව නිෂ්පාදන තුනක් හඳුන්වාදීමත් සමග අපි අපගේ ණය කළඹ පුළුල් කළෙමු. මෙම නව නිෂ්පාදන අපගේ ගනුදෙනුකරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල ප්‍රධාන ජීවන රටාවන් තුනක් ආවරණය කරයි. අපි පසුගිය වසර තුළ රන් ණය ද දියත් කළ අතර මෙම මෑත නිෂ්පාදිතය ද රුපියල් මිලියන 240.12ක් සහ පාරිභෝගික සංඛ්‍යාව 795 දක්වා වර්ධනය වේ. රන් ණය මගින් පාරිභෝගිකයින්ට හදිසි මූල්‍ය අවශ්‍යතා සඳහා ඉක්මන් විසඳුමක් ලබා දේ. රන් ණය පහසුකම් කිහිපයක් අප සතුව ඇති ගනුදෙනුකරුවන්ට තනි ලිපි මුදා හැරීමේ අවස්ථාව ලබා දීමෙන් අපි නම්‍යශීලී බවක් සහ පහසුවක් ලබා දෙන්නෙමු. අපි 2019/20 දී මෙම නිෂ්පාදනය ශාඛා 40ක් දක්වා ව්‍යාප්ත කරන්නෙමු.

වර්ෂය තුළ අපගේ ණය නිෂ්පානවල මුළු අක්‍රිය ණය අනුපාතය 6.66%ක්වූ අතර, ඒ සඳහා එකතු කිරීමේ අනුපාතය 91.02%ක් විය. අපගේ ණය නිෂ්පාදන අඛණ්ඩව ජනප්‍රිය වෙමින් පවතී. වසරේ නිෂ්පාදන සඳහා වූ මුළු ණය මුදල් රුපියල් මිලියන 46,991.98ක්වූ අතර, එය රු 37,909.55ක් ලෙස පසුගිය වසරේ සඳහන් විය.

### ආන්තික වෙළඳාම සහ සාධකකරණය

ආන්තික වෙළඳාම සහ සාධකකරණය දිගු කලක් තිසසේ අපගේ නිෂ්පාදන හා සේවා කළඹෙහි ප්‍රධාන තැනක් ගනී. කලින් සඳහන් කළ කොටස් හා ණය වෙළෙඳපොළවල ආයෝජකයින්ට ඔවුන්ගේ ආයෝජනයට එරෙහිව පහසුකමක් ලබා ගැනීමටත්, ඔවුන්ගේ කළඹ තවදුරටත් ගොඩනගා ගැනීමටත් අතිරේක සුරැකුම්පත් වෙළඳාම් කිරීමටත් අවස්ථාව ලබා දේ. දෙවැන්න ප්‍රාග්ධන විසඳුම්, අවදානම් හුවමාරුව සහ විකුණුම් ලෙජර කළමනාකරණය, සහ ලැබිය යුතු දේ කළමනාකරණය කිරීම සඳහා කැප වූ කණ්ඩායමක් සමග ගනුදෙනුකරුවන්ට ලබාදීම, ආන්තික වෙළඳාමෙන් රුපියල් මිලියන 2,058,46ක් වන අතර, පොලී ආදායම රුපියල් මිලියන 338.81කි. මෙම අංශය සඳහා පාරිභෝගික සංඛ්‍යාව 141 සිට 164 දක්වා ඉහළ ගොස් ඇති බව අපි දක ඇත්තෙමු. ඇත්ත වශයෙන්ම, අපගේ දළ කලඹ රුපියල් මිලියන 2,755.55ක් සහ රුපියල් මිලියන 895.98ක විසර්ජන ලබා දී ඇති අතර, ගනුදෙනුකරුවන්ගේ සංඛ්‍යාව 80.95% කින් ඉහළ ගොස් වසර 152 ක් විය.

### තැන්පතු

නව ළමා ඉතුරුම් ගිණුම් දෙකක් එකතු කිරීමත් සමග අපගේ තැන්පතු කළඹ තවදුරටත් ශක්තිමත් විය. "සෙනෙහස යාළු" දරුවන්ගේ ඉතිරිකිරීම් සඳහා ඉහළ පොලී අනුපාතයක් ලබා දෙන අතර, සෙනහස අනාගතය මඟින් දරුවෙකු වෙනුවෙන් සෑම වසරකට හෝ පහක් තුළ ඉලක්කගත මුදලක් ළඟා කර ගැනීම සඳහා නිශ්චිත මුදලක් වෙන් කිරීමට ඉඩ සලසයි. විශේෂයෙන්ම දරුවෙකුගේ ජීවිතයේ අධ්‍යාපනික හා වෙනත් සන්ධිස්ථාන සැලසුම් කිරීමට ප්‍රයෝජනවත් වේ. තවත් නිෂ්පාදනයක් වන සුපිරි ආයෝජන සැලැස්මක් සැලසුම් කිරීමට ප්‍රයෝජනවත්වේ. තවත් නිෂ්පාදනයක් වන සුපිරි ආයෝජන සැලැස්මක් සැලසුම් කර ඇත්තේ වසර දෙකේ සිට පහ දක්වා කාල සීමාවක් තුළ නිශ්චිත ඉලක්කයන් සපුරා ගැනීමට අපේක්ෂා කරන පාරිභෝගිකයින්ට උපකාර කිරීම සඳහා වන අතර, සෑම මසකම ඔවුන්ගේ වැටුපෙන් නිශ්චිත කොටසක් ඉතිරිකර ගැනීම සහතික කිරීමට අවශ්‍ය පාරිභෝගිකයින්ට ලාංජන ප්‍රයෝජනවත් වේ.

# පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

## >> පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

GRI 102-2

## නිෂ්පාදන කළඹ

### ණයදීම්

PLC ලීසිං LEASING லீசிங்

ප්‍රධාන වශයෙන් මුල්‍ය කල්බදු වලින් සමන්විත අපගේ ලීසිං කළඹ දිවයින පුරා පිහිටි ශාඛා ජාලය හරහා පහසු ගෙවීමේ ක්‍රම සහ වේගවත් මිත්‍රශීලී සේවාවක් සපයයි.

PLC FAST TRACK BUSINESS SUPPORT LOAN

මෙම සේවාව කෙටිකාලීන මුල්‍යකරණය සඳහා විශේෂයෙන් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ලබාදී ඇති අයිරාවකට සමාන චක්‍රීය ණය පහසුකමකි.

Term Loans

ඇපකරයට එරෙහිව සුරක්ෂිත කර ඇති ස්ථාවර දේපල උකස් ණයවලට සමාන පාරිභෝගික ඉල්ලීම මත ස්ථාවර පොලී අනුපාත යටතේ සපයනු ලැබේ.

AUTO LOAN

ගෘහස්ථ මෝටර් රථ මිලදී ගැනීමට අදහස් කරන පාරිභෝගිකයින්ට දැරිය හැකි මාසික කුලියක් සහ අවුරුදු හතක් දක්වා ආපසු ගෙවීමක් සහිත වාහන ණය ක්‍රමයකි.

Self2cash

තනි තනිව හෝ ඒකාබද්ධව (හිමිකාරිත්වය මත පදනම්ව) ගනුදෙනුකරුවනට ඔවුන්ගේ ස්ථාවර තැන්පතු ඇපයට තබා එක්වරක් අදාළ සේවාව සඳහා ලියාපදිංචි වීම තුළින් අවශ්‍ය ණය පහසුකම් ලබා ගැනීමට ඉඩ ලබාදෙන ක්‍රමයකි.

PLC Quick Cash පුද්ගලික ණය

ප්‍රධාන වශයෙන් ස්ථිර රැකියාවක් කරන්නන් සඳහා ඉක්මන් සහ බාධාවලින් තොර මුල්‍ය විසඳුමකි. මෙය බොහෝ දුරට පුද්ගලික ණයවලට සමානකම් කියයි.

PLC රන් ණය தங்கக்கடன் GOLD LOAN

රත්‍රන් ඇපයට එරෙහිව ණය ප්‍රදානය කෙරේ. අපගේ නවතම නිෂ්පාදනයන් වන මෙම සේවාක්‍රමය පෙර වර්ෂයේදී දියත් කරන ලදී.

PLC ශක්ති ව්‍යාපාර ණය BUSINESS LOAN வியாபாரக் கடன்

නව නිෂ්පාදිත ක්‍රමයක් ලෙස හඳුන්වා දුන් මෙම ණය ක්‍රමය ව්‍යාපාරික ප්‍රජාව අරමුණු කරගෙන නිර්මාණයකර ඇති අදාළ පාර්ශවයන්ගේ දිගු කාලීන හා කෙටිකාලීන මුල්‍ය අවශ්‍යතා සපුරාලීම සිදු කරයි.

PLC ශාස්ත්‍ර අධ්‍යාපන ණය EDUCATION LOAN கல்விக் கடன்

මෑතකදී දියත් කරන ලද මෙම නිෂ්පාදන ක්‍රමය පාරිභෝගිකයින්ට ඔවුන්ගේ දේශීය හෝ විදේශීය අධ්‍යාපන වියදම පියවා ගැනීමට උපකාරී වේ.

PLC සෑනසුම් පියස නිවාස ණය HOME LOAN வீட்டுக் கடன்

මෑතකදී දියත් කරන ලද මෙම ණය පහසුකම සාම්ප්‍රදායික නිවාස ණය ක්‍රමයක් නොවන නම්‍යශීලි ණය ක්‍රමයක් වන අතර, ණයගැතියා ආදේශ කිරීම වත්කම් ප්‍රතිස්ථාපනය කිරීම, වසර පහක් දක්වා කාලයක් සහ නම්‍යශීලී ආපසුගෙවීම් ක්‍රමයක් ආදි වූ අංග ඇතුළත් ණය පහසුකමකි.

IJARAH ISLAMIC LEASING

ලිසිං නිෂ්පාදනයට සමානකම් කියන මෙම පහසුකම තුළින් කලින් තීරණය කරගන්නා ලද කාලයක් හා මුදලක් සඳහා පාරිභෝගිකයාට අයිතමයක් භාවිතා කිරීමේ පහසුකම සැලසෙන අතර, අයිතිය ආයතනය සතු වේ.

MURABAHA ISLAMIC FINANCING

වත්කම් මිලදී ගැනීම සහ විකිණීම සඳහා ෂරියා නීතියට අනුකූල කෙටිකාලීන හා මධ්‍ය කාලීන මුල්‍යකරණයක් සපයන නිෂ්පාදන.

MUSHARAKAH PARTNERSHIP FINANCING

මෑත කාලයේ දියත් කරන ලද නිෂ්පාදනයක් වන මෙය ෂරියා නීතියට අනුකූලව මුල්‍යකරණය සහ කළමනාකරණ සඳහා පාර්ශවයන් දායක වන හවුල් කාරිත්වය මත පදනම් වූ ලාභ හා අලාභ බෙදාගැනීමේ කොන්ත්‍රාත්තුවකි.

# පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

## >> පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

### තැන්පතු

**FD Fixed Deposits**

මාසිකව හෝ කල්පිරීමේදී ගෙවිය යුතු පොළිය සමග ස්ථාවර පොලී අනුපාත යටතේ මාසයක සිට අවුරුදු පහ දක්වා වූ ස්ථාවර කාලසීමාවක් සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන් සහ වයස අවුරුදු 18ට වැඩි නේවාසික වීසා බලපත්‍රලාභීන් සඳහා පවතින ස්ථාවර තැන්පතු ක්‍රමයකි.

**Mudharabah – Islamic Investments**

ව්‍යාපාරික ප්‍රජාව සඳහා එකඟ වූ සම්මුතීන්ට අනුකූලව ලාභ බෙදාගැනීමේ පදනමකින් යුතුව ඇතිකර ගන්නා ගිවිසුම්ගත එකඟතාවයකි.

**Super Savings – Savings Account**

තැන්පතු දරන්නාට ඉහළ පොලී අනුපාතයක් සහිත සාමාන්‍ය ඉතුරුම් ගිණුමකි. තවද තැන්පතු හිමියාට ජාත්‍යන්තර වීසා ඩෙබිට් කාඩ්පතක් ද ලැබේ.

**Senior Citizen – Savings Account**

මෙම ඉතිරිකිරීමේ ගිණුම් සඳහා වයස අවුරුදු 55 ට වැඩි තැන්පතු හිමියන් සුදුසුකම් ලබන අතර ඉහළ පොලී අනුපාතයකට ද හිමිකම් කියයි.

**සෙනෙහස Future**

අවුරුදු 2 සිට 5 දක්වා කාලය තුළ ඉලක්කගත මුදල ළඟාකර ගැනීම සඳහා දරුවකු වෙනුවෙන් සෑම මසකම ස්ථාවර මුදලක් වෙන්කළ හැකි නව ළමා ඉතුරුම් කිරීමේ ගිණුමකි.

**සෙනෙහස – Senehasa - Minor's Savings Account**

මෙම ගිණුම් ක්‍රමය වැඩි පොලී අනුපාතයක් සහිත ළමා ඉතුරුම් කිරිමේ ගිණුම් ක්‍රමයකි. වයස අවුරුදු 18 ට අඩු ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකු මේ සඳහා සුදුසුකම් ලබයි. අවම තැන්පතු මුදල රුපියල් 250/-ක් වන අතර, දරුවන්ගේ මනසෙහි ඉතිරිකිරීමේ පුරුද්ද ඇති කිරිම මෙහි මූලික අරමුණයි.

**Usfoor Islamic Savings – The Little Saver**

ළමුන් සඳහා අද්විතීය ඉස්ලාම් ඉතිරි කිරීමේ ගිණුමක් වන අතර, එය මාසිකව ගණනය කර ලාභයට සාධාරණ ප්‍රතිලාභ ලබා දෙයි.

**Super Investment Plan**

එකඟ වූ කාලපරිච්ඡේදයන් අවසානයේ (වසර දෙකේ සිට පහ දක්වා විහිද පවතී) ඉලක්කගත මුදල ළඟාකර ගැනීමට සෑම මසකම ස්ථාවර ඉතිරියක් වෙන් කිරිමට අපේක්ෂා කරන ගනුදෙනුකරුවන් සඳහා වන නව නිෂ්පාදන ක්‍රමයකි.

**Crest Saver – Savings Account**

වයස අවුරුදු 18 සිට 55 අතර, පිළිගත් ආයතනයක වැටුප් සහිත ස්ථිර සේවකයන් සඳහා මෑතකදී ආරම්භ කරන ලද ඉතිරිකිරිමේ ගිණුම් ක්‍රමයකි. අවම මාසික ඉතිරිකිරීමේ මුදල රුපියල් 1,000 ක් වේ.

**Senehasa Yalu – Kids Savings Gift Scheme**

තෑගි යෝජනා ක්‍රමයක් සහිත ළමා ඉතිරිකිරීමේ නිෂ්පාදනයකි. මෙම ගිණුම අවුරුදු 18 ට අඩු දරුවෙකු වෙනුවෙන් දෙමාපියන් හෝ වෙනයම් නීතිමය භාරකරුවෙකු විසින් විවෘත කළ හැකිය.

### අනෙකුත් නිෂ්පාදන හා සේවා

**Margin Trading**

ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව යටතේ බලපත්‍ර ලබා ඇති මෙම පහසුකම කුඩා හා මධ්‍ය පරිමාණයේ අයෝජනයකින් හා ඉහළ ශුද්ධ වටිනාකමක් ඇති ආයතන කෙරෙහි ද අවධානය යොමු කරයි.

**Factoring**

ලැබීම් කළමණනාකරණය කිරීම්, ප්‍රාග්ධන විසඳුම්, අවදානම් අවම කිරිමේ සහ විකුණුම් ලෙජර කළමනාකරණය කිරිම සඳහා කැප වූ කණ්ඩායමක් මඟින් අප ආයතනික, අර්ධ ආයතනික කුඩා හා මධ්‍ය පරිමාන ගනුදෙනුකරුවන් සඳහා සාධක, බිල්, චෙක්පත්, ඉන්වොයිස් වට්ටම් ලබා දීම සිදුකරන්නෙමු.

# පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

## >> පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

GRI 102-11

### නිෂ්පාදන කළඹ පරීක්ෂා කිරීම

නිෂ්පාදන ව්‍යුහගත කිරීමේ හා බෙදා හැරීමේ පාරිසරික හා සාමජීය බලපෑම් සඳහා සවිස්තරාත්මක පූර්වාරක්ෂා යාන්ත්‍රණයක් අඛණ්ඩව ක්‍රියාත්මකවේ. හාරකරුවන් සමග අපගේ මෙහෙයුම්වල පාරිසරික හා සමාජීය ප්‍රතිවිපාක කෙරෙහි සාධක ලබාදීම සඳහා අපි පුළුල් පරීක්ෂණ ක්‍රියාවලියක් අනුගමනය කරමු.

අපගේ ණය ප්‍රතිපත්තිය අපට ණය දියහැකි ව්‍යාපාර සම පාරිභෝගික වර්ග පැහැදිලිව අර්ථ දක්වයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ අධීක්ෂණය යටතේ අවදානම් සහ පාලනය පිළිබඳ විශේෂඥ කණ්ඩායමක් විසින් ප්‍රතිපත්ති වරින්වර සමාලෝචනය කරනු ලැබේ.

අනුමත ණය ලිපිගොනු මාසිකව අහඹු ලෙෂ සෝදිසි කිරීම, විෂමතාවන් විශ්ලේෂණය කිරීමට හේතු සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සෑම නව නිෂ්පාදනයක් සමගම අපගේ පාරිසරික අඩිපාර අඩුකිරීමට හැකි සෑම තැනකම කඩදාසි රහිත ක්‍රියාවලීන් ප්‍රවර්ධනය කරමු.

### සමාජීය හා පාරිසරික වශයෙන් වගකිව යුතු නිෂ්පාදන

වාහන විමෝචන මගින් පරිසරයට සිදුවන බලපෑම අවම කිරීම සහ සමනය කිරීම සඳහා විශේෂිත ක්‍රියාපටිපාටි ගණනාවක්ද අපි සිදුකරමු.

හරිත වාහන ලීසිං කිරීම සහ හරිත ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම සඳහා පිළිවෙත් අපි පාරිභෝගිකයින්ට පාරිසරික ලීසිං සහ විද්‍යුත් මිතුරන් වැනි හරිත නිෂ්පාදන ප්‍රවර්ධනය කරමු.

GRI 418-1

### පාරිභෝගික සම්බන්ධතා සහ තෘප්තිමත් මට්ටම් වැඩි දියුණු කිරීම

පහසුවෙන් අනුකරණය කළහැකි ලක්ෂණ සහිත සමාන නිෂ්පාදන වෙළෙඳපොලකදී, අපගේ ගනුදෙනුකරුවන් සමග අප බෙදා ගන්නා බැඳීම ශක්තිමත් කිරීමට අප ගන්නා උත්සාහයන් කිසි විටෙකත් වඩා වැදගත් නොවීය. එසේ කිරීම සඳහා අපි ආයෝජනයකර ඇත්තේ පාරිභෝගිකයින්ට තමන්ට සැබවින්ම ඇහුම්කන්දී ඇති බවත්, ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලන බවත්, හැඟෙන පරිසරයක් නිර්මාණය කිරීම සඳහාය. දිගුකාලීන හා අන්‍යෝන්‍ය වශයෙන් යහපත් සබඳතා ගොඩනගා ගැනීම සඳහා වඩාත්ම වැදගත් වන්නේ තේරුම් ගැනීමයි.

අනන්‍යතා සොරකම් කිරීම සහ දත්තවලට අනවසරයෙන් ඇතුළුවීම නිතර සිදුවන නවීනතම ඩිජිටල්කරණය කරන ලද ලෝකයේ සයිබර් ආරක්ෂණය ප්‍රමුඛතාවයකි. අපගේ දත්ත ආරක්ෂා කිරීම, අප ඉල්ලා සිටින සහ ගබඩා කරන පාරිභෝගික තොරතුරු සම්බන්ධ විස්තර, සමාගමට ඉතා වැදගත්වේ. දත්ත සුරක්ෂිතතාවය සහ පාරිභෝගිකයාගේ පෞද්ගලිකත්වය උල්ලංඝණය කිරීමේ ප්‍රතිවිපාක අපි හොඳින් අවධාරණය කරමු. එබඳු විශ්වාසයක් උල්ලංඝණය කිරීම පාරිභෝගිකයාට විනාශකාරී වනු ඇති අතර එය අපගේ නිපුණතාව පිළිබද පාර්ශ්වකරුවන්ගේ විශ්වාසයට බෙහෙවින් බලපානු ඇත. තවදුරටත් 2018/19 කාලය තුළ පාරිභෝගිකයින්ගේ පෞද්ගලිකත්වය පළුදුවීම් වර්ගයන් හෝ පාරිභෝගික දත්ත වලට හානිවීම පිළිබඳ සනාථ කළ හැකි කිසිඳු පැමිණිල්ලක් වාර්තා වී නොමැත. කළමනාකරණය පද්ධතියේ අලාභයන් පිළිබඳ ISO 27001 සහතික කරඇති අතර, එමගින් අපගේ මෙහෙයුම් පද්ධතිවල ගුණාත්මකභාවය පිළිබඳව අපගේ ගනුදෙනුකරුවන්ට විශ්වාසයක් ලබාදේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති අනුගමනය කරමින්, අපගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ශාඛා කළමනාකරුවන් දත්ත සුරක්ෂිතතාව පිළිබඳ වගකීම භාර ගැනීම සහ කර්මාන්තයේ හොඳම පිළිවෙත් භාවිතා කිරීමත් සමග තොරතුරු ආරක්ෂා කිරීමේ වැදගත්කම සේවකයා දැනසිටිනබව අපි සහතික කරමු. අපි ශක්තිමත් තර්ජනයක් සහ අනාරක්ෂිතතා තක්සේරු කිරීම් භාවිතා කරන අතර ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලිකත්වය උල්ලංඝනය කිරීම් පිළිබඳ සොයා බලමු. දත්ත සුරක්ෂිතභාවය මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධාරී. විසින් අධීක්ෂණය කරනු ලැබේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විසින් පුද්ගලික දත්තවල ආරක්ෂාව සහ වගකිව යුතු ගබඩා කිරීම සහතික කිරීම, පද්ධති වෙනස් කිරීම් නිර්දේශ කිරීම සහ අවශ්‍ය තාක්ෂණය හා තොරතුරු අවම කිරීම සඳහා වැඩි දියුණු කිරීම් සිදුකරයි.

### පාරිභෝගිකයින්ට ප්‍රතිචාර දැක්වීම

පාරිභෝගිකයින් පිළිබඳ අපගේ ගැඹුරු අවබෝධය, ඔවුන්ගේ අනපේක්ෂිත මූල්‍ය අවශ්‍යතා සපුරාලන රන්ණය වැනි ප්‍රායෝගික නිෂ්පාදන සහ සේවාවන් ඔවුන්ට ලබාදීමට අපට ඉඩ සලසන අතර, අපගේ පාරිභෝගිකයින්ගේ ජීවිතවල වැදගත් සන්ධිස්ථාන වලදී ඔවුන් සමඟ සිටීමට අප උනන්දු වෙමු. එසේ කිරීම යනු වසර ගණනාවක් තිස්සේ ආයතනිකකරණය කරඇති දැනුම හොඳින් වටහා ගැනීම සඳහා සෑම ක්‍රියාමාර්ගයක්ම ගැනීමයි.

අපගේ නවතම නිෂ්පාදන, ශක්ති ව්‍යාපාර ණය, ශාස්ත්‍ර අධ්‍යාපන ණය සහ සැනසුම් පියස නිවාස ණයද, නව ළමා ඉතුරුම්වන සෙනෙහස යාලු, සෙනෙහස අනාගත සැලැස්ම සහ වැඩිහිටියන් සඳහා සුපිරි ආයෝජන සැලැස්ම වැනි වැඩසටහන් ක්‍රියාත්මකවේ. මේවන විට ශාඛා වෙත යොමුකර ඇති මෙම නව නිෂ්පාදන හා සේවාවන් අපගේ ගනුදෙනුකරුවන්ගේ ජීවන රටාවන්, මූල්‍ය අවශ්‍යතා සහ ඔවුන්ගේ පවුල් සඳහා දීප්තිමත් අනාගතයක් සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍යවන ගැඹුරු අවබෝධයේ ප්‍රතිඵලයකි.

ආයතනික දැනුම මත පමණක් පදනම් වීම අපව අවදානමට ලක් කරයි. අප එය ප්‍රතික්ෂේප කරන අවදානමකි. පාරිභෝගික පැමිණිලිවලට ඉක්මන් හා කාර්‍යක්ෂම ක්‍රමවේදයක් සහතික කිරීම සඳහා අපි පාරිභෝගිකයින්ගේ රැකවරණය සහ පැමිණිලි භාරදීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීමට අදහස්කර ඇත්තෙමු. එහි පරමාර්ථය වන්නේ සියලුම පාරිභෝගිකයින්ගේ දුක්ගැනවිලි සමාගමට ළඟාවී මිනිත්තු දහයක් ඇතුළත ඔවුන්ට ලැබිය යුතු සැළකිල්ල සහ අවධානය ලබාදීම සහතික කිරීමයි.

**පාරිභෝගික පැමිණිලි වාර්තා විය.**

| | |
|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව | 7 |
| මූල්‍ය ඔම්බුඩ්ස්මන් | 28 |

මෙම ප්‍රතිපත්තියේ දියුණුව සඳහා වන මූලික වැඩවල කොටසක් ලෙස, දෝෂ සහ ප්‍රමාදයන් අවම කිරීම, දෛනික වැඩකටයුතු ඉවත් කිරීම සහ අපගේ සේවකයින්ට පාරිභෝගික සේවය සඳහා ප්‍රශස්ත කාලයක් ගතකිරීම සඳහා අභ්‍යන්තර ක්‍රියාවලීන් විධිමත් කළෙමු. ශාඛා මට්ටමින් වැඩි ස්වයං පාලනයක් ලබාදෙමින් වඩාත් නවීන පාරිභෝගික සේවාවක් සැපයීමට ඉඩදීමට අපි බලය විමධ්‍යගත කළෙමු.

### පාරිභෝගික පක්ෂපාතීත්වය ඇගයීම

අපගේ ව්‍යාපාරයෙන් අඩක් පමණ වන්නේ අපගේ පවත්නා පාරිභෝගික පදනමෙන් වන අතර, සමාග මේ නිෂ්පාදන සහ සේවාවන් කෙරෙහි විශ්වාසය තබන පාරිභෝගිකයින්ට සහ අපගේ මෙහෙයුම්වල අඛණ්ඩතාව කෙරෙහි ඔවුන් දක්වන විශ්වාසය සහතික කරයි. මූල්‍ය සේවා අංශයේ නිෂ්පාදන හා සේවාවන් සඳහා වැඩි ඉල්ලුමක් පවතින පරිසරයක පාරිභෝගිකයින්ගේ පක්ෂපාතීත්වය පීපල්ස් ලීසිං සඳහා ඊටත් වඩා වැදගත්වේ.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

## >> පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම

අපගේ ගෞරවය පෙන්වීම සඳහා අපි ව්‍යාපාරික ආයතන 22ක් සමඟ හවුල් වී දිගුකාලීන පාරිභෝගිකයින්ට “ග්‍රැටිටියුඩ්” නමින් ලෝයල්ටි කාඩ්පත් හඳුන්වා දීමට පටන් ගත්තෙමු. මුලදී අපගේ පාරිභෝගික පදනමේ 30,000කට අධික සංඛ්‍යාවකට මෙය ඉදිරිපත් කළෙමු. එක් එක් පාරිභෝගික කාණ්ඩයට වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා රන්, ප්ලැටිනම්, හා රිදී කාඩ්පත් තුනකින් සමන්විත මෙම වැඩසටහන සමන්විත වේ. “ග්‍රැටිටියුඩ්” ලෝයල්ටි කාඩ්පත අපගේ පක්ෂපාත ගනුදෙනුකරුවන්ට ලබාදෙනු ලැබේ. වාහන, ඇඳුම් පැළඳුම්, ගෘහ භාණ්ඩ, සංචාර, දෘෂ්ටි ආරක්ෂණ, රන් ආභරණ, වාහන සේවා, වාහන අමතර කොටස් සහ රෝහල් සම්බන්ධ ගනුදෙනු කිරීමේදී විශේෂ වට්ටම් ලබා ගැනීම.

අපගේ සේවකයින්ද පාරිභෝගිකයින්ගේ පක්ෂපාතීත්වය ජනනය කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සමාගමේ වටිනාකම් අනුව අපගේ සේවකයින් කටයුතු කරන බව සහතික කිරීම තරගකාරීත්වයෙන් පීපල්ස් ලීසිං වෙනස් කරන තවත් වැදගත් සාධකයකි. අපගේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය අපගේ පුහුණු, සංවර්ධනය සහ කුසලතා වර්ධන වැඩසටහන් අප අපගේ වෘත්තීය සංවර්ධනය හා අනුප්‍රාප්තික සැලසුම් කෙරෙහි අපි වැඩි අවධානයක් යොමු කරන්නේ මේ නිසාය. (අපගේ ව්‍යාපාර සාර්ථකත්වය සඳහා අපගේ සේවකයින්ගේ කාර්යභාරය පිළිබඳ වැඩිදුර දැනගැනීමට 112 සිට 123 දක්වා පිටු බලන්න) අපගේ සේවකයින්ගේ කැපවීම සහ උනන්දුව පාරිභෝගික පක්ෂපාතීත්වයට මඟපාදයි.

### → නාලිකා සංක්‍රමණය හරහා නව පහසුකම් හඳුන්වා දීම

තෝරාගැනීමේ සිට තීරණ ගැනීම, මිළදී ගැනීම දක්වා පාරිභෝගිකයාගේ ගමන ඩිජිටල්කරණය කිරීම නිසා පුද්ලයින්ට ඔවුන්ගේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි අභිමතකරණය කළ විසඳුම් ලබා ගැනීම පහසුවී ඇත. අපගේ වෙළඳ නාමයේ වටිනාකම පැහැදිලිව ප්‍රකාශ කරන සැබෑ පුද්ගලික සම්බන්ධතා ඇතිකර ගතහැකි පරිසරයක් නිර්මාණය කිරීම යනු අපගේ පිරිනැමීම සම්පාදනයෙන් වෙනස් වේ යන්නයි.

### ඩිජිටල්කරණයෙන් ඉදිරියට යෑම

තාක්ෂණික දියුණුව වේගයෙන් වේගයෙන් ඉදිරියට යද්දී පීපල්ස් ලීසිං සමාගම පියවරක් ඉදිරියට තැබීමට සෑම උත්සහයක්ම දරයි. මෙම ගොනුකරන ලද අපගේ තරගකාරීත්වය වෙළෙඳපොලේ වෙනත් තරගකරුවනගෙන් පමණක් නොවේ. මෙම ඩිජිටල් යුගයේදී අපගේ පාරිභෝගිකයින් ඇමසන්, ඊබේ සහ එයාර් බීඑන්බී වැනි ගෝලීය සමාගම් වල පාරිභොගිකයින් වේ. එම පාරිභෝගිකයින්ගේ දෘෂ්ටි කෝණයෙන් බලන කල අපගේ පාරිභෝගික සේවය ප්‍රමාද නොවිය යුතුය. අප මෙයින් අදහස් කරන්නේ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ නවතම තාක්ෂණික සංවර්ධනයෙන් එක ලෙස සිටීමය.

උසස් විශ්ලේෂණය යනු සංවිධානයේ ප්‍රධාන අවකලනයකි. ඉලක්කගත අලෙවිකරණ ව්‍යාපාර සඳහා සේවාදායකයාගේ වර්ගය අනුව වඩා හොඳ කොටස් කිරීමට ඉඩ සලසයි. ආයෝජනවලින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ නව අවබෝධයක් මත පදනම්ව අලෙවිකරණ සහ වෙළඳ දැන්වීම්වල උපායමාර්ගික රැකියා සඳහාද එය ඉඩ සපයයි.

පහසුකම් අනුමත කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සදහා ඩිජිටල්කරණ පද්ධතියක් සහ අපගේ පාරිභෝගික දත්ත ගබඩාව ආරක්ෂිතව කළමනාකරණය කරන ඩිජිටල් වේදිකාවක් සහ අපගේ සේවකයින්ට ඇසිල්ලකින් පාරිභෝගික තොරතුරු ලබාදීමට අපි මේ වන විට කටයුතු සූදානම් කරමින් සිටිමු. සෑම ස්පර්ශක ස්ථානයකදීම සියළු තතු පිළිබඳ දැනුවත්ව සිටීම අපගේ ගනුදෙනුකරුවන් වඩාත් හොඳින් වටහා ගැනීමටත්, ඔවුන්ගේ අවශ්‍යතාවන්ට ගැලපෙන විසඳුම් ලබාදීමටත් වෙනත් නිෂ්පාදන හා සේවාවන් හරස් විකිණීම සඳහාත් අපට ඉඩ සලසයි. මෙම ඩිජිටල් විසඳුම අපගේ පාරිභෝගික සේවය සහ ශුද්ධ ප්‍රවර්ධන ලකුණු විශාල වශයෙන් වැඩිදියුණු කිරීමට පොරොන්දු වේ. සේවකයාට වඩා හොඳින් සේවය කිරීම සඳහා සේවකයින්ට උපකාර කිරීම සඳහා කෘත්‍රිම බුද්ධි භාවිතා කිරීමේ හැකියාවන්ද අපි ගවේෂණය කරන්නෙමු.

නව තාක්ෂණය සඳහා ආයෝජනය කිරීමට අමතරව අපගේ වෙළෙදපොල අවකාශයේ නැගී එන ඩිජිටල් සහ දත්ත විශේෂඥයින් සමග තරග කිරීම සඳහා අපි නව නිපුණතා කට්ටල සඳහා ආයෝජනය කරන්නෙමු. ඉහළ යන ඉල්ලුම සහ පාරිභෝගික අපේක්ෂාවන් සපුරාලීම සඳහා නව නිපැයුම් නවෝත්පාදනයන් සහ නිෂ්පාදන දිගුකිරීම් සංවර්ධනය කිරීම සඳහා අපගේ ආයතනය තුළ සිටින ප්‍රවීණයන් වගකියනු ලැබේ. ඔවුන් අපගේ ව්‍යාපාර ආකාතිය ශක්තිමත් හා ප්‍රශස්තිකරණය කළ හැකි ක්‍රම පිළිබඳව ද සොයා බලනු ඇත.

### → පාරිභෝගිකයින්ගේ දැනුවත්භාවය වැඩිකිරීම සඳහා ඵලදායි සන්නිවේදනයක් ඇතිකිරීම

වසර ගණනාවක් තිස්සේ පීපල්ස් ලීසිං ප්‍රචාරණයට වඩා කට වචනයේ ප්‍රචාරක ප්‍රවණතාව මත රඳා පැවතුණ නමුත් තරගකාරීත්වය ඉහළ යාමත් සමඟ මෙය තවදුටත් විකල්පයක් නොවේ. ව්‍යාපාර වැඩි කිරීම සඳහා ජනමාධ්‍ය වැදගත් කාර්යභාරයක් ඉටුකරන අතර, ඉලක්කගත පිරිවැය - ඵලදායී අලෙවිකරණ සන්නිවේදනයක් කෙරෙහි අපගේ අවධානය යොමුවී ඇති අතර, එමගින් අදාළ පණිවිඩ පාර්ශ්වකරුවන් වෙත, යොමු වන බව සහතික කරයි.

### ඩිජිටල් මාධ්‍ය භාවිතාය වැඩිකිරීම

ශ්‍රී ලංකාවේ බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සඳහා ඇති ඉල්ලුම වැඩිවෙමින් පවතින අතර, එය 4G සහ ස්මාර්ට් ෆෝන් භාවිතයද වැඩි කරයි. මෙම සංයෝජනයත් සමග වෙළෙඳපොල දැන් 5G මොබයිල් සේවා වෙත ගමන් කරමින් සිටින අතර, ඉදිරි වසර කිහිපය තුළ දේශීය වෙළෙදපොලේ ශක්තිමත් වර්ධනයක් අපේක්ෂා කරයි.

මෑත වසරවලදී ශ්‍රී ලංකා ඉන්ටර්නෙට් සහ ස්මාර්ට් ෆෝන් භාවිතය සැලකිය යුතු ලෙස වර්ධනයවී ඇති අතර, විද්‍යුත් - වාණිජ්‍යය භාවිතය කරන්නන් තවමත් සංඛ්‍යාවෙන් කුඩාය.

උදාහරණයක් ලෙස ජිනිවා හි ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය වන ජාත්‍යන්තර ව්‍යාපාරික ප්‍රජාව විසින් වර්තමාන ස්වල්පයක් වූ විශාල මූල්‍ය ආයතන වලින් ඔබ්බට රටේ විද්‍යුත් වාණිජ්‍ය ගෙවීමේ පහසුකම් පුළුල් කරන ලෙස ඉල්ලාසිටි අතර, එමගින් වැඩි ශ්‍රී ලාංකිකයන්ට මාර්ගගතව වෙළෙදාමට පිවිසිය හැකිය.

මෙම ප්‍රවණතා සැලකිල්ලට ගෙන වර්ෂය තුළදී වේගයෙන් ව්‍යාප්ත වන තාක්ෂණික බුද්ධිය ඇති පාරිභෝගිකයින් සහ අනාගත පාරිභෝගිකයන් සඳහා කේන්ද්‍රිය වන අපගේ වෙබ් අඩවිය පුනර්ජීවනය කිරීම සඳහා අප ආයෝජනය කරන ලදී. ඉලක්කගත වෙළෙඳපොළට බලපෑම් කිරීමට තරම් අපගේ මාර්ගගත පැමිණීම සැලකිය යුතු මට්ටමක පවතින බව සහතික කිරීම සඳහා අපි ඩිජිටල් අලෙවිකරණය කෙරෙහි අවධානය යොමු කළෙමු. සමාජ මාධ්‍යවල අපගේ පැමිණීම වැඩිදියුණු කරමින් අපි දැන් ෆේස් බුක්, යූ ටියුබ්, ලින්ක්ඩ්ඉන් වැනි වේදිකාවල ක්‍රියාකාරී වෙමු. අපගේ ගනුදෙනුකරුවන් වැඩි වැඩියෙන් මාර්ගගතව සිටින විට, ඔවුන් අපට අවශ්‍ය විට ඔවුන් සිටින තැන අප සිටිය යුතුය.

GRI 417-1 GRI 417-2 GRI 417-3

### නියාමනය කළ පරිසරයක් තුළ සන්නිවේදනය කිරීම

අලෙවිකරණ ගොනු කිරීමේදී වෙළෙද දැන්වීම් සහ ප්‍රසිද්ධ නිවේදන පිළිබඳ මහ බැංකු නීති සහ රෙගුලාසිවල රාමුව තුළ අප ප්‍රවේසමෙන් වැඩ කළ යුතුය. අපගේ සියලුම අලෙවිකරණ සන්නිවේදනයන් රෙගුලාසි තුළ පවතින බව අපි සහතික කරමු. වාර්තාකරණ වර්ෂය තුළ අපගේ අලෙවිකරණ සන්නිවේදනයක් හෝ නිෂ්පාදන සහ සේවා තහවුරු කිරීමක් සම්බන්ධයෙන් අනුකූල නොවන සිදුවීම් කිසිවක් වාර්තා නොවීය. අපගේ ගනුදෙනුකරුවන්ට දැනුවත් තීරණ ගැනීම සඳහා භාෂා තුනකින් (ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ) නිෂ්පාදන හා සේවා සම්බන්ධයෙන් අදාළ තොරතුරු අනාවරණය කිරීමට අපි සහතික වෙමු.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## පාරිභෝගික අත්දැකීම් වර්ධනය කිරීම <<

### එක ඇමතුමක ඇසිල්ලකින්

වර්ෂය තුළදී අපි පීපල්ස් ලීසිං ඇමතුම් මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරිම සඳහා නියමු ව්‍යාපෘතියක්ද ක්‍රියාත්මක කළෙමු. එය අවසානයේදී ක්‍රියාත්මක කිරීම තුළින් උපරිම වේලාවන්හීදී ඇමතුම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමටත්, ඇමතුම් අතහැර දැමීම අඩු කිරීමටත්, සෑම විටම එක ඇමතුමක් ලබා ගැනීමෙන් අපගේ පාරිභෝගික සේවා යෝජනාව සැලකියයුතු ලෙස ශක්තිමත් කිරීමටත් අපි බලාපොරොත්තු වෙමු

අප අන්තර්ජාලය තුළ වැඩි වැඩියෙන් සිටියද ඇමතුම් මධ්‍යස්ථානයත වටිනාකම පැහැදිලිව ඕනෑම වේලාවක අප වෙත ළඟාවීමේ හැකියාව ලබා දෙයි.

අවශ්‍ය යටිතල පහසුකම් පිළිබඳ කටයුතු සිදුකෙරෙමින් පවතින අතර, අපි ඇමතුම් මධ්‍යස්ථානය මෙහෙයවීම සඳහා අවශ්‍ය කාර්යමණ්ඩලය දෙස බැලීමට පටන්ගෙන ඇති අතර, එය දියත් කළ විගස ඔවුන් නිරත වීමට සූදානම් බව සහතික කිරීම සඳහා විෂය මාලාවක් සකස් කරමින් සිටිමු.

GRI 205-1 GRI 205-2 GRI 205-3

### දූෂණ විරෝධී

පීපල්ස් ලීසිං සමාගම සදාචාරාත්මක ආචාරධර්ම පද්ධතියක් සඳහා දායක වන අතර, එය සදාචාර විරෝධී ව්‍යාපාරික භාවිතයන්ගෙන් වැළකී සිටීමට සේවකයින්ට මඟපෙන්වීම සඳහා නිර්මාණය කර ඇත. සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ අධීක්ෂණය යටතේ, දූෂණ විරෝධී ක්‍රියාවන්ට එරෙහිව සමස්ත ජනතාවගේ ලීසිං මෙහෙයුම් ඒකක මාර්ගගත වාර්තා මගින් විගණනය කරනු ලැබේ. තවදුරටත් ශාඛා සාර්ථකව විගණනය කරනු ලබන්නන් මනා පුහුණුවක් ලබා ඇති අතර, අත්දැකීම් ඕනෑම වංචනික ක්‍රියාවකට එරෙහිව විගණන කාර්යමණ්ඩල සාමාජිකයින් ගොනු කරනු ලැබේ. ශාඛා ඔවුන්ගේ ශ්‍රේණිය, අදාළ කලාප ප්‍රධානීන් විසින් සපයනු ලබන අතර, ප්‍රතිපෝෂණ වාර්තා සහ අභ්‍යන්තර විගණන කණ්ඩායම විසින් අභ්‍යන්තර අවදානම් තක්සේරුව සිදුකරනු ලැබේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවද දූෂණ විරෝධී දෙපාර්තමේන්තුවට එරෙහිව වසර දෙකක හෝ ඊට අඩු කාලයක් තුළ කාර්යාල හා ශාඛා ජාලය ආවරණය කරයි. මෙම මාර්ගෝපදේශයන්ට දැඩි බවක් එක් කිරීම සඳහා නුසුදුසු ක්‍රියාකාරකම් සිදුවීම වැළැක්වීම සඳහා අපි හොඳ අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කරමු.

ඊට අමතරව යාන්ත්‍රණයන් ක්‍රියාත්මක වන අතර, නුසුදුසු පැමිණිලි හෝ චෝදනා තිබේ නම් අවශ්‍ය අවස්ථාවන්හීදී විමර්ශනය කර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා සමාගමේ සමස්ත මෙහෙයුම් ඒකක දූෂණ විරෝධී ක්‍රියාවන්ට එරෙහිව රේඛීය වාර්තා මගින් විගණනය කරනු ලැබේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාල දෙපාර්තමේන්තු සහ ශාඛා ජාල දෙවසරකදී වරින්වර හෝ දූෂණයට එරෙහිව අලාභයෙන් ආවරණය වන බව සහතික කරයි. තොරතුරු ලබා දෙන්නාට පිළිගැනීමකින් තොරව "විස්ට්ල් බ්ලෝවර්" ක්‍රියාවලිය විධිමත් යාන්ත්‍රණයක් ද ක්‍රියාත්මක වේ. දූෂණය සඳහා විශේෂයෙන් පුහුණු වැඩසටහන් නොමැත. කෙසේවෙතත් දේශීය ලීසිං මගින් කාර්යමණ්ඩලයට සහ පවත්නා කාර්යමණ්ඩලයට අපගේ අභ්‍යන්තර විගණකවරුන්ගේ වෙනත් පුහුණු කිරීමේදී සිදුවන දූෂණයට අදාළ රෙගුලාසි සහ ක්‍රියාපටිපාටි පිළිබඳ පුළුල් දැනුමක් ලබාගැනීම සහතික කරනු ලැබේ. දූෂිත පරිචයන් හා සම්බන්ධ සිදුවීම් සහ විනයානුකූල ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා කර ඇත.

### ඉදිරිදැක්ම

වෙළෙඳපොල තරගකාරීත්වය වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගිකයින්ගේ තේරීම සඳහා ගනුදෙනුකරුවන්ගේ ජයග්‍රහණය දිනාගැනීම වඩ වඩාත් දුෂ්කර වනු ඇත. අපගේ වර්තමාන අවධානය තරගයෙන් විවිධාංගීකරණය හා වෙනස් කිරීමේ අරමුණින් අපගේ ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාර හා ජීවන රටාවන්ට සරිලන පරිදි නිෂ්පාදන ලබාදීමට ඇති හැකියාව පද්ධති සහ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම අවසාන ප්‍රවණතා සහ සේවක ව්‍යාප්තිය කෙරෙහි අවධානය යොමුකිරීම පාරිභෝගික සේවයට ධනාත්මක ලෙස බලපානු ඇත. මීට අමතරව අපි මධ්‍යගත අලෙවිකරණ අංශය යටතේ නැවත නැවත සැකසුම් හා සංවර්ධන ඒකකයක් දියත් කිරිමට අපේක්ෂා කරන අතර, එහි ප්‍රමුඛතාවය වනුයේ නව නිෂ්පාදන සහ පාරිභෝගික සේවයේ නවෝත්පාදන ගවේෂණය කිරීමය.

වෙළෙඳපොලේ මුල් කාලය සඳහා අපි නව ආයෝජන යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර, එය දැනටමත් මහ බැංකුව විසින් අනුමත කර ඇති අතර, ඒ සඳහා පෙරොන්දු ඇත. නිශ්චිත දිනයකින් ඉලක්කගත ඉතිරි කිරීම් මුදලකට ළඟා වීමට පාරිභෝගිකයින්ට අවස්ථාව ලබා දෙන අතර, ඉතුරුම් ගිණුමකට වඩා වැඩි පොලියක් ලබා දෙයි.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

## ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම

වර්තමානයේ ගනුදෙනුරුවන් ඉහළ තාක්ෂණික දැනුමකින් යුක්තවන අතර, ඉහළ තාක්ෂණයෙන් යුතු පාරිභෝගික සේවාවන් සපයන දැවැන්තයන්ගෙන් ද ඔවුන් සේවාවන් ලබා ගනී. එවැනි තත්ත්වයක් තුළදී එම ගනුදෙනුකරුවන් අප ආයතනය තුළින්ද ඊට සමාන සේවාවක් බලාපොරොත්තු වීම නිතැතින්ම සිදුවන්නකි.

අපගේ නිෂ්පාදිත හා සේවාවන් තුළින් ගනුදෙනුකරුගේ අවශ්‍යතාව පුරෝකථනය කිරීම, ඉටුකරලීම හා අපේක්ෂාවන්ට එහා ගිය තෘප්තිමත් සේවාවක් තුළින් අපි නොනැවතෙන්නෙමු. තවද, ඔවුන්ට අවශ්‍ය අවස්ථාවන්හිදී නිසි පරිදි එම අවශ්‍යතා සපුරාලීමට ඇප කැපවී සිටිමු.

අප ගනුදෙනුකරුට අවශ්‍ය අවස්ථාවේදී එය සපුරාලීමට සමත් නොවුවහොත්, පවතින දැඩි තරගකාරිත්වය හමුවේ අපට පසුබැසීමට සිදුවනු ඇත.

මේවන විටත් පීපල්ස් ලීසින් සමාගම විශාල දියුණුවක් ලබා ඇති අතර, එමගින් වෙළඳපොල ශක්තිමත් හා විශ්වාසනීය සන්නාමයක් බවට පත්ව ඇත.

තවදුරටත් අපගේ වෙළෙඳපොල ප්‍රමුඛ ස්ථානය පවත්වාගෙන යාමට අපගේ පද්ධති හා ක්‍රියාවලින් සෘජු හා වේගවත්ව පැවතීම අපගේ පුරප්පාඩු වඩාත් සුදුසු කුසලතාවයන්ගෙන් යුතු සේවක මඩුල්ලකින් ආවරණය වන බව හා පොදු අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය සියලු දේ සමග සේවක මඩුල්ල පෙළඹවීම හා සන්නද්ධවීම අඛණ්ඩව සිදුවිය යුතුයි.

## පාර්ශ්වකරුවන් කෙරෙහි අපගේ බලපෑම

වාහන සැපයුම්කරුවන් සමග සෘජු හවුල්කාරීත්වයක් පවත්වාගෙන යාම

පාරිභෝගික සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා විධිමත් දත්ත සංචිත පවත්වාගැනීම

අපගේ සැපයුම්කරුවන්ගෙන් 99% ක්ම දේශීය සැපයුම්කරුවන් වේ

අපගේ සේවක බඳවාගැනීම් දිවයින පුරා විහිදුම් නියෝජිතයන් පවතින අයුරින් සිදු කෙරේ

සමාජයීය හා පාරිසරික වශයෙන් ආයතනික වගකීම ආරක්ෂාවන අයුරින් මුදාහැරීම් සිදුකිරීමට අපගේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම

14,546 ක් වු සැපයුම්කරුවන්

කුඩා මට්ටමේ ආයතනවල සිට ජාත්‍යන්තර සමාගම් දක්වා විහිදුනු සැපයුම්කරුවන්ගේ පදනම




නවීන අභ්‍යන්තර ජාලය

ප්‍රසම්පාදන කටයුතුවල වගවීම සහතික කිරීම සඳහා තීරණ ගැනීමේ ඒකකයක් පැවතීම

අවසන් වු මුල්‍ය වර්ෂය සඳහා රුපියල් මිලියන 12.90 ක් වු ආයෝජනයක් සිදුකරමින් කාන්තා හා පිරිමි සේවකයින්ට සමාන සාමාන්‍ය පුහුණු කාලයක් ලබාදීම

සැපයුම්කරුවන්, මූල්‍ය සේවා සපයන්නන්, බැංකු, දේශීය හා විදේශීය මූල්‍ය ආයතන සමග නිරන්තරයෙන් ශක්තිමත් සම්බන්ධතා පවත්වාගැනීම

වඩාත් සුදුසු කුසලතා සහිත අපේක්ෂකයින් සේවක මඩුල්ලට බඳවාගැනීම

ඉහළ විචල්‍ය තත්ත්වයක් නොමැති සේවක පිරිවැටුම් අනුපාතයක් පවත්වාගැනීම

## තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය

5 GENDER EQUALITY

දේශපාලනික, ආර්ථික හා සමාජයීය වශයෙන් තීරණ ගැනීමේදී සෑම තරාතිරමකම කාන්තාවන්ගේ පූර්ණ හා ඵලදායී නායකත්වය සඳහා සමාන අවස්ථා සහතික කිරීම

8 DECENT WORK AND ECONOMIC GROWTH

පරිසරයට හානියක් නොවන අතරම, ආර්ථිකය උත්තේජනය කරන ගුණාත්මක රැකියා ලබා ගැනීමට මිනිස්සුනට ඉඩ සලසන නිර්ණායකයක් බිහි කිරීම

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

නිෂ්පාදකයාගේ සිට අවසාන පාරිභෝගිකයා දක්වා සියල්ලන් සම්බන්ධකර ගනිමින් තිරසාර සැපයුම් දාමයක් මත ක්‍රියාත්මක කිරීම

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම

### මෙහෙයුම් ක්‍රියාවලිය වැඩිදියුවැඩිදියුණු කිරීම

### මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ආයෝජනය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, සමාගමේ සමස්ත මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය අංශ කිහිපයක අපි ආයෝජනය කළෙමු.

විශාල සහයෝගීතාවය දිරිගැන්වීම සහ පහසුකම් සැපයීම සඳහා කලාපීය කාර්යසාධන සමාලෝචන එකතුවක් සඳහා ද අපි ආයෝජනය කළෙමු. ගනුදෙනුකරුවන්ට සැබැවින්ම අවශ්‍ය නිෂ්පාදන හෝ සේවාවක් නිර්මාණය කිරීම සඳහා බාධාවකින් තොරව කටයුතු කරන බලය උපයෝගීකර ගැනීම සඳහා අන්තර් කණ්ඩායම් සහයෝගීතාවයෙන් අපට හැකි වේ. අපේ සහයෝගී සංස්කෘතිය තුළින් නිෂ්පාදන වේගයෙන් වෙළෙඳපොලට ගෙනඒමට අපට හැකි වේ. එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත සමාගමේ වටිනාකම් නිර්මාණය කිරීමේ හැකියාව වේගවත් වේ.

අපගේ සේවක පුහුණුව හා සංවර්ධනය වර්ෂය තුළ ආයෝජන සඳහා තවත් අවධානයක් යොමු කරන ලදී. අපගේ සේවකයින්ට පාරිභෝගික අපේක්ෂාවන් ඉක්මවා යාමට සහ වෙනස් වන මෙහෙයුම් පරිසරයෙන් සිටීමටත් අවශ්‍ය මෙවලම්, කුසලතා සහ පළපුරුද්ද ලබාගැනීමටත් උපකාරී වේ. ප්‍රතිවිරෝධතා මත සහ අධික ප්‍රවණතා නිසා ඇතිවිය හැකි අවදානම් අවම කිරීමට උපකාරී වේ. (වැඩි විස්තර සඳහා දක්ෂ කාර්යයක නියැළී සිටින සහ අභිප්‍රේරිත කණ්ඩායමක් ගොඩනැගීම යටතේ 121 සිට 123 පිටු බලන්න)

ගනුදෙනුකරුවන් දත්ත රැස්කිරීම හා නඩත්තු කිරීම සඳහා අපි නව අභ්‍යන්තර යෙදුමක් සඳහාද ආයෝජනය කර ඇත්තෙමු. මෙම දත්ත සමුදාය අපිට වැඩි අවධානයකින් යොමුකළ හා ඉලක්කගත පාරිභෝගික සන්නිවේදනයන් යැවීමට උපකාරී වන අතර, ගෞරවණීය සන්නාම කළමනාකරකරුවන්ට සහ ප්‍රධාන කාර්යාල අධීක්ෂණය ආයතනවලට පාරිභෝගිකයාට ඔවුන්ගේ ඇඟිලි තුඩුවල තොරතුරු සමග වඩා හොඳ සේවාවක් ලබා දීමට සහ අදාළ නිෂ්පාදන මනා සේවාවන් පාරිභෝගිකයාට වක්‍ර අලෙවිකරණය සඳහා සමාගමේ සමස්ත හැකියාව වැඩිදියුණු කිරීම, අලෙවිකරණ නිලධාරියෙකු සිය ගනුදෙනුකරුවන්ගේ දත්ත සමුදාය සමාගම සමග ඉතිරි වුවහොත් ශාඛා කළමනාකරුවන්ට ඔවුන්ගේ ඉලක්ක සපුරා ගැනීමේදී අලෙවිකරණ නිලධාරියාගේ ප්‍රගතිය නිරීක්ෂණය කළ හැකිය.

පහසුකම් අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා ගතවන කාලය අවම කිරීම අපගේ ඉලක්කයයි. සාමාන්‍ය විමර්ශනයේ සිට පහසුකම් අනුමත කිරීමේ අදියර දක්වා සමස්ත ක්‍රියාවලියම ඩිජිටල්කරණය කිරීමෙන් මෙම ඉලක්කය සපුරා ගැනීමට අපි සැලසුම් කරමු.

### තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී ව්‍යාපාරික හවුල්කරුවකු ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ කාර්යභාරය පුළුල් කරන ලදී. මෙම අංශය සමාගම් ක්‍රියාකාරීත්වයට නව නිපැයුම් නව මොඩියුලයන් සහ ව්‍යාපාරික අවස්ථා සමග සහයෝගයෙන් අතිරේක විශේෂාංග සංවර්ධනය කිරීමට උපකාරී වේ. සමහර උදාහරණ අතර -

- *ශක්ති* ව්‍යාපාර ණය
- අධ්‍යාපන ණය
- නිවාස ණය
- Co-System – නව ණය ඇගයීම සහ ණය ප්‍රවාහය
- මාර්ගගත අරමුදල් හුවමාරු මොඩියුලය

මෙම දායකත්වය ව්‍යාපාර පරිමාව ඉක්මවායාම, පරිභෝගික කළඹ පුළුල් කිරීම සහ ලාභදායීතාවය වැඩිදියුණු කිරීම.

ඊට අමතරව, තොරතුරු තාක්ෂණ අංශය සමාගමේ තොරතුරු තාක්ෂණ යටිතල ව්‍යුහයට සහාය වූ අතර, ව්‍යාපාරික පරිශීලකයින්ට ඔවුන්ගේ කාර්යභාරය ඵලදායී ලෙස, හා සුරක්ෂිතව ඉටුකිරීමට හැකි විය. කාර්යක්ෂමතාවය වැඩිකිරීම සඳහා සමහර උදාහරණ ඇතුළත් වේ.

- නව WHT බදු ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.
- පාවෙන අනුපාත ණය සහ කල්බදු
- ගෙවීම් හා ලේඛන ලුහුබැඳීම
- සැපයුම්කරුවන්ගේ ගෙවීම් සහ සාධක ගෙවීම් සඳහා රිසිට්පත්
- ඉතුරුම් තෑගි කවය
- අයකිරීම් තොරතුරු පුවරුව
- අවදානම් ශ්‍රේණිගත ක්‍රියාවලිය
- ණය අයකිරීම් ක්‍රියාවලිය

දේශගුණික විපර්යාස මැඩපැවැත්වීම සඳහා එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු සඳහා දායක වීමට ජනතාව පෙළඹී සිටී. (134 පිටුව) සමාගමේ ව්‍යාපාරය නිෂ්පාදන අංශය තරම් පරිසරයට සැලකිය යුතු ලෙස බලපාන්නේ නැති අතර, එහි පරිසර බලපෑම අඩු වෙයි. මේ සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය පිරිවැය ඵලදායී, කඩදාසි රහිත පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සඳහා නව ඊ මෙමෝ පද්ධතියක් සකස් කළේය.

අපගේ ආයතනික වෙබ් අඩවිය භාෂා තුනෙන්ම (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) නැවත සකස් කිරීම අපගේ ඉලක්කගත ප්‍රේක්ෂකයින් වෙත වඩාත් සමීප කරයි. වර්තමාන භාරකරු විසින් සියලු සේවා සපයන්නන්ගෙන් අපේක්ෂා කරන්නේ මෙයයි. නමුත් පීපල්ස් ලීසිං යනු මුල්කාලීනව භාවිතා කරන්නන්ගෙන් එකක් වන අතර, එහි භාරකරුට අන්තර්ජාලය හරහා ගොස් ඔවුන්ට අවශ්‍ය තොරතුරු ඔවුන් වඩාත් හුරු භාෂාවෙන් සොයාගත හැකි බව සහතික කරයි. නව වෙබ් අඩවිය වඩාත් අන්තර් ක්‍රියාකාරී වන අතර, එහි තොරතුරු ගෘහ නිර්මාණය පරිශීලකයන්ට වඩාත් අවබෝධාත්මකය.

අපගේ දත්ත සමුදායේ දත්ත සමුදා සේවකයින් අවසාන IBM බල පද්ධති සේවාදායකගෙන් සහ ගබඩා යටිතල පහසුකම් දක්වා උසස් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, අපගේ දත්ත මධ්‍යස්ථානයට පුළුල් වන ව්‍යාපාරික අවශ්‍යතා සපුරාලිය හැකිය, ඒ අතරම අපගේ පවතින දත්ත සමුදායේ මෘදුකාංග වේදිකාව සහ වේදිකා මෙහෙයුම් පද්ධතිය නවතම අනුවාදයන් වෙත යාවත්කාලීන කළෙමු.
මේ දෙකම දැන් සමස්ත දත්ත සමුදා යටිතල ව්‍යුහයට වැඩි පරිමාණයක්, විශ්වාසනීයත්වයක්, ආරක්ෂාවක් සහ කාර්යක්ෂමතාවයක් ලබා දෙයි. වැඩි ආරක්ෂාව සඳහා අපගේ ද්විතියික දත්ත කේන්ද්‍රය අතිරික්ත හා ද්විත්ව බලයෙන් යුත් සේවා ශක්තිමත් ජාල සම්බන්ධතා සහ අනෙකුත් තොරතුරු තාක්ෂණික සංරචක සහිත ස්ථර තුන ප්‍රමිතියට ගෙන ගියෙමු.

වර්ෂය තුළ හඳුන්වාදුන් තවත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විසඳුමක් වන්නේ පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත නව හඬ විසඳුමයි.

- දිගුකිරීමේ සංචලතා
- කඩදාසි රහිත ෆැක්ස් විසඳුම
- අත්තිකාරම් ස්වයංක්‍රීය අන්තර් ක්‍රියාකාරී හා හඬ ප්‍රතිචාර විසඳුම
- වඩා හොඳ පාරිභෝගික සේවාවක් සඳහා විමධ්‍යගත උසස් මෙහෙයුම් පද්ධති
- වැඩිදියුණු කළ ඵලදායීතාවය සහිත උසස් වාර්තා කරණ විසඳුම්

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

## >> ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම

නව හඬ විසඳුම සියලු ප්‍රධාන ශාඛා වේගවත්, ස්වාධීන සහ විශ්වසදායක සන්නිවේදනය සඳහා තනි ආයතනයක් ලෙස අන්තර් සම්බන්ධ කිරීම සඳහා අඩිතාලම දැමීම. එය පරිභෝගික සේවය වැඩිදියුණු කිරීමට, ශ්‍රව්‍ය සම්මන්ත්‍රණය පැවැත්වීමට, අපගේ නවතම ව්‍යාපාරික අවශ්‍යතා අනුව උපස්ථ ඇමතුම් මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීමට සහ කාලය අඩුකිරීමට අපට උපකාරීවේ.

මීට අමතරව, පහත දක්වෙන්නේ වර්ෂය තුළ අපගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ මූලාශ්‍රයකි:

- ව්‍යාපාර මෙහෙයුම් වැඩිදියුණු කිරීම සඳහා වෙනත් වර්ග විසඳුම් පිළිබඳ පර්යේෂණ.
- සේවකයින් සඳහා නව විද්‍යුත් ගෙවීම් පත්‍රිකාවක් හඳුන්වා දීම.
- සමාජ මාධ්‍ය භාවිතය වැඩිවීම.

සයිබර් අවදානම් සඳහා ආයෝජනය කිරීම සහ අවශ්‍ය පරිදි වැඩි දියුණු කිරීම් වලින් ද අපව ශක්තිමත්කර ඇත. ඊට අමතරව, දත්ත උල්ලංඝණවය කිරීම් සහ වෙනත් සයිබර් අවදානම්වලට තුඩුදිය හැකි මානව දෝෂ සීමාකිරීම සඳහා පරිශීලකයින් අතර හොඳින් ව්‍යුහගත අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී.

මෙය සාක්ෂාත්කර ගැනීම සඳහා ගනු ලබන එක් ප්‍රධාන පියවරක් වන්නේ අනිෂ්ට චේතනා ඇති අයගෙන් පරිගණක පද්ධති දත්තවල රහස්‍යභාවය, අඛණ්ඩතාවය සහ ලබාගත හැකිබව ආරක්ෂා කිරීම සඳහා නිර්මාණය කරඅැති අපගේ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමයි.

අපගේ සිදුවීම කළමනාකරණය ක්‍රියාවලිය මගින් සේවකයින්ට ඕනෑම විභව හෝ සත්‍ය ආරක්ෂාව උල්ලංඝණය කිරීම් පිළිබඳව තොරතුරු ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියා වෙත ඉදිරිපත් කිරීමට ඉඩ ලබාදිය යුතුය.

ආපදා ප්‍රතිසාධන සැලැස්ම මගින් සමාගමේ සියලු අංශ ආවරණයවන අතර දත්ත සුරක්ෂිතතාවයට අදාළ අංශ ඇතුළුව දෙපැත්තේම ඇතුළත හා පිටත අඩවි උපස්ථය ආරක්ෂිත පරිසරයක පවතී.

ව්‍යාපාර අඛණ්ඩ පවත්වාගෙන යාමේ සැලැස්ම වසරකට වරක් හෝ ඊට වැඩිකාලයක් දක්අැති තොරතුරු සමග සහයෝගයෙන් පරීක්ෂා කරනු ලැබේ. දත්ත සුරක්ෂිතව උපස්ථකර ඇති බව සහතික කිරීම සඳහා සහ ඕනෑම අනපේක්ෂිත විපත්තියකින් මෙහෙයුම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත්වේ.

### තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය

අනවසරයෙන් තොරතුරු හා විශේෂයෙන් විද්‍යුත් දත්ත භාවිතයෙන් සමාගම ආරක්ෂා කිරීම අපට අතිශයින්ම වැදගත්වේ.




පීපල්ස් ලීසිං නිතිපතා අභ්‍යන්තර ආරක්ෂක විගණන පවත්වයි. බාහිර විගණනයන් සිදුකරනු ලබන්නේ ව්‍යාපාර සහතික කිරීමේ ඉන්දියාවේ ඩී.එන්.වී. සමාගම මගිනි. හැකර්වරයෙකු විසින් සූරාකෑමට ලක්විය හැකි ආරක්ෂක අවදානම සඳහා අපගේ පරිගණක පද්ධති, ජාල සහ වෙබ් යෙදුම් පරීක්ෂා කිරීම සඳහා අපි KMPG සහ PWC සමඟ සම්බන්ධ වෙමු. සමාගම ISO 27001 සහතික කර ඇත.

### කාර්යක්ෂම පද්ධති ක්‍රියාත්මක කිරීම

අපගේ ගනුදෙනුකරුවන්ගේ සහ මහජනතාවගේ විශ්වාසය හා පක්ෂපාතිත්වය පවත්වා ගැනීම අපට ඉතා වැදගත්වේ. අපගේ පද්ධති සහ ක්‍රියාවලීන්ගේ ආරක්ෂාව සහ විශ්වාසනීයත්වය පිළිබඳ ඔවුන්ගේ විශ්වාසය අප සැහැල්ලුවට නොගන්නා විශ්වාසයකි. මෙම ප්‍රදේශයේ අපගේ මුලපිරීම් සඳහා උදාහරණ ඇතුළත්වේ.

- සියළුම අත්පොත් ක්‍රියාවලි කාලෝචිත ආකාරයකින් ස්වයංක්‍රීය කිරීම.
- ලේඛණ කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- eMemo පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- පුහුණු ද්‍රව්‍ය, අත්පොත් සහ ප්‍රතිපත්ති ඇතුළත් සේවකයින් සඳහා නවීන උපකරණයක් ක්‍රියාත්මක කිරීම.
- අලෙවිකරණ සේවකයින් සඳහා "IntApp" ජංගම යෙදුම වෙළඳපොළ සඳහා දියත් කිරීම.
- ශාඛා කාර්ය මණ්ඩලය සහ කළමනාකරණය අතර සන්නිවේදනය සක්‍රීය කිරීම සහ කාර්ය මණ්ඩල පුහුණුව පැවැත්වීම සඳහා වීඩියෝ සම්මන්ත්‍රණය පහසුකමක් ලබාදීම.
- අතින් පුහුණු කිරීමේ පහසුකම් සහ ආපදා පුනරුත්ථාපන අඩවි සඳහා අථත්‍යකරණය කළ සේවාදායක පරිසරයක් වැනි තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ගනුදෙනුකරුවන් සඳහා මෙන්ම සාමාන්‍ය ජනතාව සඳහා තවත් ජංගම යෙදුම් හඳුන්වා දීම.
- සමාජ මාධ්‍යවල සම්පූර්ණයෙන්ම ක්‍රියාකාරීවීම.

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම <<

### ඉදිරිය දැක්ම

2019/20 සඳහා අපගේ නව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රමෝපායට ව්‍යාපාර ක්‍රියාවලියට කෘතිම බුද්ධිය (AI) යොදා ගැනීම සහ සේවාදායකයා තබා ගන්නේ කෙසේද ණය පහසුකම් සේවා සහ ප්‍රතිසාධන ක්‍රියාවලියෙහි වේ. ගුණාත්මකභාවය ඉහළ නැංවීම යනාදිය ඇතුළත් වේ. ඔවුන්ට උදව් කිරීමට භාවිතා කිරීමට (AI) භාවිතා කිරීම, අපගේ සේවකයින්ට කවුන්ටරයේ පාරිභෝගික තොරතුරු වෙත පිවිසීමට හැකි වන අතර, හරස් විකිණීම හා පසුවිපරම් ක්‍රියාවලියක් පිළිබඳව විමසනු ඇත. (AI) පද්ධති මගින් පාරිභෝගික පරීක්ෂා කර නිසි පරිදි ගනුදෙනුකරුවන් සම්බන්ධකර ගැනීමට සහ අදාළ විසඳුම් යෝජනා කරනු ඇත.

ඊට අමතරව, පළපුරුදු කාර්‍ය මණ්ඩලය මත යැපීම අඩු කිරීම සඳහා ණය ඇගයීමේ ක්‍රියාවලිය ස්ථාවර කිරීම සඳහා වන අපගේ විකල්පයන් අපි ගවේශණය කරන්නෙමු. ඒ වෙනුවට ඔවුන් පාර්භෝගිකයා කෙරෙහි අවධානය යොමු කරනු ඇතැයි හැඟේ. සමාගම තොරතුරු තාක්ෂණ සංවර්ධනයන්ගෙන් වැළකී සිටින අතර, සුදුසු අවස්ථාවලදී පවතින මෘදුකාංග වෙනස් කිරීම් වලට දායකවේ.

වංචා අවම කිරීම සඳහා සහ පද්ධතියට කඩදාසි රහිත පරිසරයකට සමීප වීමට අපට උපකාර කළහැකි නව තාක්ෂණයන් පිළිබඳව ද අපි සොයා බලනු ඇත. ඉදිරි වසර කිහිපය තුළ අපගේ අවධානය යොමු වූ ක්ෂේත්‍රයන්ගෙන් සමහරක් ඇතුළත් වනු ඇත:

- ආකෘති ඩිජිටල්කරණය
- වංචා අවම කිරීම සඳහා ඩිජිටල් අත්සන් භාවිතා කිරීම
- පාරිභෝගික ඡායාරූප ඉදිරි පෙළට ගැනීම
- නව තොරතුරු පුවරු හරහා මූලික කළමනාකරණ විසඳුම වැඩිදියුණු කිරීම
- WIFI කළාප සහ ශාඛා සඳහා WIFI පදනම් කරගත් VOICE විසඳුම
- තාක්ෂණික නවෝත්පාදනයන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දෙපාර්තමේන්තුවේ නැවත සකස් කිරීමේ හා සංවර්ධන ඒකකයක් පිහිටුවීම

ගනුදෙනුකරුවන් සඳහා වේගවත් සේවාවක් සැපයීම සඳහා, අපි ආරක්ෂක ලියවිලි ඩිජිටල්කරණය කිරීම පිළිබඳ අවධානය යොමු කරමු. මෙයින් අදහස් කරනු ලබන්නේ ප්‍රාදේශීය ශාඛා පාරිභෝගික ගොනුවක් කොළඹට නොයැවීමත් සැකසුම් කාලය අඩු කිරීමත්ය.

GRI 308-1 GRI 308-2 GRI 414-1 GRI 414-2

### වගකීමෙන් සහ තිරසාරව බවින් ලබාගැනීම

අපි අපේ ප්‍රසම්පාදන අත්පොත් නිකුත් කළේ පසුගිය වර්ෂයේදිය. සේවක අන්තර්ජාල මත, මෙම අත්පොත් සැලසුම්කර ඇත්තේ මිලදී ගැනීම සම්බන්ධ තීරණ ගැනීමේ ක්‍රියාවලියට මග පෙන්වීම සඳහාය. මේ සමග ඇති මධ්‍යම සම්පාදන මාර්ගෝපදේශ අනුමත අනුකෘතියේ දක්වා ඇති පරිදි බලය පැවරීමේ සීමාවන්ට යටත්ව සම්පාදන ක්‍රම ආමන්ත්‍රණය කරයි.

අපගේ තීරණ ගැනීමේ ඒකකය (DMU) අපගේ අනුමත අනුකෘතියට අනුකූලව භාණ්ඩ හා සේවා සම්පාදනය කිරීම සඳහා වගකීම සහ බලය ලබාදී ඇත. ක්‍රියාපටිපාටියේ අරමුණු, සාරාංශයක් ලෙස මිලදී ගත් භාණ්ඩ හා සේවා සහතික කිරීම

- අවශ්‍ය ගුණාත්මකභාවය
- කලට වේලාවට ලැබීම
- නීති හා රෙගුලාසිවලට අනුකූල වීම
- විනිවිද පෙනෙන සම්පාදන ක්‍රියාවලියක ප්‍රතිඵලය

මිලදී ගැනීමේ ක්‍රියාපටිපාටියට (අත්පොතෙහි දක්වා ඇති පරිදි) සහභාගී වන සියලු දෙනා වගකීම සහ රහස්‍යභාවය පිළිබඳ මූලධර්ම පිළිපැදීම, දූෂිත ක්‍රියාවලින් වැළකී සිටීම, උනන්දුවක් දක්වන ඕනෑම ගැටලුවක් කිරීම සහ ඔවුන්ගේ යුතුකම් ගෞරවාන්විතව ඉටු කිරීම අනිවාර්ය වේ.

අපගේ නව සැපයුම්කරුවන් 14,564 වර්ෂය තුළ වාර්තා විය. සැපයුම් දාමයේ පරිසර හිතකාමී සමාජ අවශ්‍යතා සම්බන්ධයෙන් 2018/19දී කිසිදු නිෂේධාත්මක ඇගයීමක් හඳුනාගෙන නොමැත.

අපගේ දේපළ අත්පත් කර ගැනීම සහ බැහැර කිරීමේ ප්‍රතිපත්තිය මගින් සමාගම විසින් සියලු මැදිහත් වූ පාර්ශවයන්, ආයතන සහ නියාමන ආයතන වෙත දේපළ අත්පත් කර ගෙන බැහැර කරනු ලබන මූලධර්ම හා රීති නියම කරයි. ඉඩම් හා ගොඩනැගිලි කළමනාකරණය, අත්පත්කර ගැනීම සහ බැහැර කිරීම සහ එහි නෛතික උනන්දුව පිළිබඳ සමාගමේ ප්‍රවේශය පාලනය කරන ප්‍රධාන අංග එහි අඩංගු වේ.

වාහන, උපකරණ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දෘඩාංග හා මෘදුකාංග වැනි ප්‍රධාන ප්‍රසම්පාදන සඳහා ප්‍රධාන කාර්යාලයේ පිහිටා ඇති අපගේ සැපයුම් දෙපාර්තමේන්තුව වගකීම දරයි. එක් එක් ශාඛාව විසින් කුඩා ප්‍රසම්පාදන සිදු කරනු ලැබේ.

අපගේ තාක්ෂණික ඇගයීම් කමිටුව සැපයුම්කරුවන් තෝරා ගන්නා අතර, මෙම තේරීම ටෙන්ඩර් මණ්ඩලයක් විසින් අනුමත කරනු ලැබේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මෙහෙයුම් එහි සභාපතිත්වය දරන අතර කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් නියෝජනය කරයි.

GRI 102-9

### සැපයුම්කරුවන් තෝරා ගැනීම

සැපයුම්කරුවන් තොරා ගැනීමේ නිර්නායකය සැපයුම්කරුවන් හා සම්බන්ධ පහත සඳහන් අංග සහ ඔවුන්ගේ පෙර කාර්යසාධනය මත පදනම් වේ:

- ගුණාත්මක ප්‍රමිතීන්
- පිරිවැය – තරගකාරීත්වය
- නියමිත වේලාවට භාරදීම
- විශ්වාසනීයත්වය
- පවත්වාගෙන යාම
- කර්මාන්තයට පෙර අත්දැකීම්
- සැපයුම් ධාරිතාව
- අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූල වීම
- අමුද්‍රව්‍ය ලබා ගැනීමේ තිරසාර භාවිතයන්
- පාරිසරික හා සමාජීය පිරිවිතරයන්ට අනුගත වීම
- සාධාරණ ශ්‍රම කළමනාකරණ භාවිතයන්

සම්පාදන සඳහා මිල ගණන් තුනක් ලබා ගැනීමේ ක්‍රමයක් භාවිතා කරමු. විශාල පරිමාණ සහ විශේෂිත ප්‍රසම්පාදනය පිළිගත් ටෙන්ඩර් ක්‍රියාපටිපාටියට අනුකූලව තරඟකාරී යෝජනා සඳහා වන ඉල්ලීම්වලට යටත් වේ. ස්ථාපිත ප්‍රතිපත්තිය වෙතට උල්ලංඝණයන් අදාළ වර්ෂය තුළ වාර්තාවී නොමැත.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

## >> ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම

ව්‍යාපාර සේවා ප්‍රසම්පාදන ක්‍රියාවලිය




* e rims යනු සැපයුම් දෙපාර්තමේන්තුවෙන් විවිධ සැපයුම් ඉල්ලුම් කිරීම සඳහා ඇති මාර්ගගත පද්ධතියකි.

GRI 412-3

### සම්පාදනය අධීක්ෂණය කිරීම

කාර්‍යක්ෂමතාව සහ ඵලදායීතාවය සහතික කිරීම සඳහා අපි හොඳ කළමනාකරණ භාවිතයන්ට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙහෙයවමු. එක් එක් සම්පාදන කොන්ත්‍රාත්තුවේ සඳහන් පරිදි සැපයුම්කරුවන්ගේ කාර්‍යසාධනය කලින් දර්ශකවන්ට සාපේක්ෂව මනිනු ලැබේ. අපි ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය තක්සේරුකර, අප්‍රසන්න විස්මයන් වළක්වා ගැනීම සඳහා වරින්වර වෙබ් අඩවි නැරඹීම සහ සැපයුම්කරුවන්ගේ අභිමතාර්ථයන් සපුරාලීමට ඇති හැකියාවට ඇතිවිය හැකි බාධාවන් පිළිබඳව කලින් අනතුරු අඟවන්නෙමු.

අපගේ ව්‍යාපාර හවුල්කාර කොන්ත්‍රාත්තු සහ වෙනත් ආයෝජන ගිවිසුම් විධිමත් පරීක්ෂණයක් මගින් මනාව හිමිකම් පිළිබඳ වගන්තියක් ඇතුළත් නොවන අතර, ඊට අනුකූල නොවන සැපයුම්කරුවන් ප්‍රතික්ෂේපවන බවට අපි සහතික වෙමු.

GRI 102-10 GRI 204-1

### දේශීයව සපයා ගැනීම

භාණ්ඩ හා සේවා ලබාගැනීමේදී, දේශීය හා ජාතික වශයෙන් පදනම් වූ සැපයුම්කරුවන්ට අපි ප්‍රමුඛතාවය ලබා දෙන්නෙමු. දේශීය සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීම් සම්බන්ධ අපගේ සම්පාදන පිරිවැයෙන් 99%ක් පමණවේ. මෙය දේශීය ආර්ථිකයට වාසිවන අතර, අපගේ පාරිසරික බලපෑම අඩු කරයි. අප විදේශීය සැපයුම්කරුවන් සම්බන්ධකර ගන්නේ දේශීය සැපයුම්කරුවන්ට අපගේ ප්‍රසම්පාදන පිරිවිතරයන් සපුරා ගැනීමට නොහැකි නම් පමණි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ පරිගණක දෘඩාංග හා මෘදුකාංග මිලදී ගැනීම සඳහා සම්පාදන පිරිවැයෙන් 1%කට වඩා අඩු ප්‍රමාණයක් විදේශීය සැපයුම්කරුවන්ගෙන් දරනු ලැබීය.

අපි ගනුදෙනු කරන්නේ ක්ෂුද්‍ර මට්ටමේ ආයතනවල සිට ජාත්‍යන්තර සමාගම් දක්වා විවිධ සැපයුම්කරුවන් සමගය. වර්ෂය තුළ අපි 29,320ක් වූ සැපයුම්කරුවන් සමග ගනුදෙනු කළෙමු. වර්ෂය තුළ සැපයුම්කරුවන් සඳහා සමුච්චිත ගෙවීම් රුපියල් මිලියන 68,475.02ක් වූ අතර එය පෙර වසරට වඩා රුපියල් මිලියන 54,372.35කි. දේශීය සැපයුම්කරුවන් සඳහා ගෙවීම් සඳහා අරමුදල් සපයනු ලබන්නේ ප්‍රධාන කාර්‍යාලයේ කළමනාකරණ කරන ලද අයවැයක් මගිනි. නව සැපයුම්කරුවන් 14,564ක් ලියාපදිංචි කිරීම හැරුණු විට, 2018/19 දී සැපයුම්දාමය සම්බන්ධයෙන් සැලකිය යුතු වෙනසක් සිදු නොවීය.

### අන්තර්ජාතික වශයෙන් සපයා ගැනීම

පරිභෝජන ද්‍රව්‍ය මුද්‍රණය කිරීම සඳහා අපගේ අවශ්‍යතා සපුරාලීමට දේශීය සැපයුම්කරුවන්ට නොහැකිවීමත් සමග, අපි HP (හෙව්ලෙට් - පැකාර්ඩ්) සමග "වඩාත්ම වටිනා පාරිභෝගිකයා" (MVC) වැඩසටහනට ඇතුළු වූ අතර, විශේෂ වරප්‍රසාද සහ වට්ටම් මිළ, පක්ෂපාතී ගෙවීම්, මිළ ආරක්ෂණ සහ ක්ෂණික ප්‍රතිලාභ ලබා ගනිමු. මුද්‍රණ කාට්රිජ් ප්‍රතිචක්‍රීකරණය කිරීමේ වැඩි කාර්‍යක්ෂමතාවයක් සැපයීම අරමුණු කරගත් HP ප්ලැනට් හවුල්කරුවන්ගේ වැඩසටහනට ඇතුළත්වීම. මෙම හවුල්කාරීත්ව මගින් තොග සීමිත වූ විට නිෂ්පාදන සඳහා ප්‍රමුඛතා ප්‍රවේශය ලබාදේ.

GRI 102-9

### නිරතවීම හා තක්සේරු කිරීම

අපගේ සැපයුම්කරුවන්ගේ දිරිගැන්වීම සහ ඔවුන්ගේ ව්‍යාපාර භාවිතයන්හි තිරසාරභාවය පිළිබඳ අපගේ ස්වයං තක්සේරුකරණ ප්‍රශ්ණාවලියට නිදහසේ ප්‍රතිචාර දක්වීම සහතික කිරීම සඳහා අපි නිතිපතා නිරත වෙමු.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම <<

මෙම දැඩි මාර්ගෝපදේශ හා ක්‍රියාදාමයන් පවත්වා ගෙන යන අතරම සැපයුම්කරුවන් සමග අපගේ සම්බන්ධතා ශක්තිමත් කිරීමේ වැදගත්කම ද අපි හඳුනා ගනිමු. මෙය හදිසි අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇති අතර ඉදිරි වසර තුළ සහ ඉන් ඔබ්බට වර්ධනය කිරීම සඳහා අප කටයුතු කරනු ඇත.

| | 2018/19 | 2017/18 | වෙනස % |
|---|---|---|---|
| ව්‍යාපාර හවුල්කරුවන් (සංඛ්‍යාව) | **29,320** | 27,431 | 6.89 |
| වාහන හවුල්කරුවන් (සංඛ්‍යාව) | **28,661** | 26,785 | 7.00 |
| සම්පාදන වියදම් (රු. මිලියන) | **68,475.02** | 54,372.35 | 25.94 |
| දේශීය සම්පාදන වියදම් (රුපියල් මිලියන) | **68,370.36** | 54,267.93 | 25.74 |
| විදේශීය සම්පාදන වියදම් (රුපියල් මිලියන) | **104.66** | 104.42 | 0.23 |

GRI 102-9

### විශිෂ්ටත්වය සඳහා හවුල්කාරීත්වය

අපගේ සැපයුම්කරුවන්ගේ ප්‍රධාන අංගයක් සඳහා මෝටර් වාහන, වාහන අලෙවිකරුවන් සහ සැපයුම්කරුවන් බඳු දීමට අදාළ අපගේ ප්‍රධාන නිෂ්පාදන දක්විය හැකිය.

මූල්‍ය සේවා සපයන්නන්, වාර්තා කරන බැංකු සහ දේශීය හා ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමග අපගේ සබඳතා ද අපි අගය කරමු. අපගේ කීර්තිනාමය ගොඩනැගෙන්නේ සියලුම කර්මාන්ත රෙගුලාසි දැඩි ලෙස පිළිපැදීම, විනිවිදභාවය සහ සදාචාරාත්මක ව්‍යාපාරික භාවිතයන් සඳහා වූ අපගේ කොමිෂන් සභාව සහ කාලෝචිත ආකාරයකින් අපගේ ණය බැඳීම් වෙනස් කිරීම තුළින් මෙම සංවිධානය කෙරෙහි ඇති විශ්වාසය මතය.

### සම්පාදන වියදම්




A – ව්‍යාපාර හවුල්කරුවන් (ගණන) B – වාහන හවුල්කරුවන් (ගණන)
C – සම්පාදන වියදම් (රුපියල් මිලියන)
D – දේශීය සම්පාදන වියදම් (රුපියල් මිලියන)

### සාමාජිකත්ව හා සංගම්වලට සම්බන්ධවීම

අදාළ ව්‍යාපාරික සංගම්වල සාමාජිකත්වය ලබාගැනීමෙන් සහ ගොනු කරන ලද දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ අපේම වියදමින් ලබාගත් දැනුම සංචිතයට එළදායී ලෙස දායක වීමෙන් අපි ව්‍යාපාරික ප්‍රජාව සහ අපගේ හවුල්කරුවන් සමග අපගේ සබඳතා තවදුරටත් ශක්තිමත් කරමු.

මෙම සබඳතා කර්මාන්ත සමගිය හා ජාලකරණයට පහසුකම් සපයයි. කර්මාන්ත ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සහ මෙම සංවිධාන විසින් සපයනු ලබන ක්‍රියාකාරකම්වලින් සේවකයින්ට ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථාව ලබා දේ.

GRI 102-13

අපි පහත සාමාජිකත්වය පවත්වා ගනිමු

- ශ්‍රී ලංකාවේ ලීසිං සංගමය
- ශ්‍රී ලංකාවේ මූල්‍ය නිවාස සංගමය
- ශ්‍රී ලංකාවේ මූල්‍ය ඔම්බුඩ්ස්මන් සංගමය
- ශ්‍රී ලංකාවේ ණය සැපයුකරුවන්ගේ සංගමය
- ආන්තික සැපයුම්කරුවන්ගේ සංගමය
- ශ්‍රී ලංකාවේ ජෛව විවධත්වය (අනුග්‍රාහක සාමාජික)

### වාහන සැපයුම්කරුවන් සමග හවුල්කාරීත්වය

වාහන සැපයුම්කරුවන් සමග අපගේ සෘජු හවුල්කාරීත්වය අපගේ ගනුදෙනුකරුවන්ට වෙළෙඳපොළේ ප්‍රශස්ත මූල්‍ය විසඳුම් ලබා දෙන බවට සහතිකයකි.

2019 මාර්තු 31 වන විට අපගේ වාහන සැපයුම්කරුවන් 28,661 ක් විය. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අප වෙත ගෙවීම් රුපියල් මිලියන 68,800.57 ක්වූ අතර, එය රුපියල් මිලියන 52,841.34 කි. මෙය සමස්ත සැපයුම්කරුවන් 755 දෙනාගෙන් ආයතනික සැපයුම්කරුවන්ට ගෙවන මුළු ගෙවීම්වලින් 97.55% ක් නියෝජනය කරයි.

අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අපි වාහන අලෙවිකරුවන් සහ ආනයනකරුවන් සමග උපායමාර්ගික හවුල්කාරීත්වයකට එළඹුනෙමු. අපගේ සියලුම ශාඛා සමග සහයෝගයෙන් අපි පිරිනමන නිෂ්පාදන සඳහා ශක්තිමත් පාරිභෝගික පදනමක් ලබා ගැනීම සඳහා ප්‍රවර්ධන කටුයතු සිදු කළෙමු.

මෙම හවුල්කාරීත්වය තුළින් අපගේ ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ අතර –

- නොමිලේ වාහන ලියාපදිංචි කිරීම
- නොමිලේ ආදායම් බලපත්‍රය
- වාහනය සඳහා පූර්ණ සේවා
- වාහන සඳහා සම්පූර්ණ ඉන්ධන ටැංකිය
- මුළු මුදලින් කොටසක් පියවීම
- වාහනවල මුල් මිල පිළිබඳ වට්ටම්
- ප්‍රවර්ධන අයිතම

හඳුන්වාදුන්

# නව නිෂ්පාදන ගණන හයයි

2018 – නිෂ්පාදන දෙකයි



# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම <<

**ප්‍රධාන උපායමාර්ගික බැඳීම්**

| ව්‍යාපාරික හවුල්කරු | හවුල්කාරීත්වයේ ස්වභාවය | පාරිභෝගිකයාට ලැබෙන ප්‍රතිලාභ |
|---|---|---|
| **ඇසෝසියේටඩ් මෝටර්වේස් ප්‍රයිවෙට් ලිමිටඩ් (AMW)** | දේශීය වාහන අංශයේ අපගේ ස්ථාවරය ශක්තිමත් කිරීමට සහ පාරිභෝගික පදනම පුළුල් කිරීම සඳහා ඩට්සන් රෙඩිගෝ (DATSUN REDIGO) මෝටර් රථ ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපාරික හවුල්කාරීත්වය නැවත දියත් කිරීම | • මිල වට්ටම්<br>• නොමිලේ ලියාපදිංචිය<br>• එක් වාහනයකට සම්පූර්ණ ඉන්ධන ටැංකිය |
| | සුසුකි මෝටර් රථ පරාසය ප්‍රවර්ධනය කිරීම සඳහා නව උපායමාර්ගික ව්‍යාපාර සම්බන්ධතාවයක් ආරම්භ කිරීම | • මිල වට්ටම්<br>• සැලකිය යුතු වගකීම් කාලය<br>• නොමිලේ ලියාපදිංචිය<br>• නොමිලේ වාහන රක්ෂණය<br>• ගෙවීමේ කාලය දිගු කිරීම<br>• මුල් මුදලින් කොටසක් පියවීමේ පහසුකම |
| **ඉන්ද්‍රා ට්‍රේඩර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්** | පවත්නා සම්බන්ධතාවය තුළින් මහනුවර කලාපය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට තවත් අවස්ථාව | • විශේෂ පොළී අනුපාතය<br>• නොමිලේ ලියාපදිංචිය<br>• පීපල්ස් ඉන්ෂුවරන්ස් වෙතින් විශේෂ රක්ෂණ පැකේජයක් |
| **ඩීසල් ඇන්ඩ් මෝටර් ඉංජිනියරින් පී.එල්.සී. (DIMO)** | ටාටා ටිපර් රථ ප්‍රවර්ධනය කිරීම සඳහා උපායමාර්ගික ව්‍යාපාරික බැඳීම | • ශ්‍රම වියදම රහිත සේවා වාර තුනක්<br>• සැලකිය යුතු වගකීම් කාලය<br>• මුල් මුදලින් කොටසක් පියවීමේ පහසුකම |
| **හේලීස් ඇග්‍රිකල්චර් හෝල්ඩින්ග්ස් ලිමිටඩ්, DIMO සහ AMW** | ට්‍රැක්ටර් සඳහා වූ මූල්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීමට උපාය මාර්ගිකව වැඩිදියුණු කළ ව්‍යාපාරික සම්බන්ධතාවය | • නොමිලේ ලියාපදිංචිය<br>• නොමිලේ රක්ෂණය<br>• ශ්‍රම වියදම රහිත සේවා සැපයීම<br>• වගකීම් දැරීම<br>• මිල වට්ටම් |
| **බ්‍රවුන්ස් ඇග්‍රිකල්චර් - බ්‍රවුන්ස් ඇන්ඩ් කම්පැනි පී.එල්.සී.** | TAFE සහ මැසේ ෆර්ගියුසන් (Massey Ferguson) ට්‍රැක්ටර් ප්‍රවර්ධනය සඳහා "යල"අස්වනු සමයේ ඇතිකරගත් ව්‍යාපාරික බැඳීම | • නොමිලේ රක්ෂණය<br>• ට්‍රැක්ටර් නොමිලේ ලියාපදිංචිය<br>• ශ්‍රම වියදම රහිත සේවා වාර 3ක්<br>• සැලකිය යුතු වගකීම් කාලයක්<br>• නොමිලේ ජල පොම්පයක් හෝ තෙල් ඉසිනයක්<br>• නොමිලේ දැති නගුලක් හෝ ට්‍රේලරයක්<br>• නොමිලේ කොකු නගුලක් |
| **නවලෝක ඇග්‍රි ප්‍රයිවෙට් ලිමිටඩ්** | සොනාලිකා (Sonalika) ට්‍රැක්ටර් ප්‍රවර්ධනය සඳහා "මහ" අස්වනු සමයේ ඇතිකරගත් ව්‍යාපාරික බැඳීම | • නොමිලේ රක්ෂණය<br>• නොමිලේ ලියාපදිංචිය<br>• වසර දෙකක වගකීම |
| **ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ප්‍රයිවෙට්) ලිමිටඩ්** | දිවයින පුරා පිහිටි සේවා මධ්‍යස්ථාන 28ක ලියාපදිංචි සහ ලියාපදිංචි නොකළ ත්‍රිරෝද රථවල සමස්ත ව්‍යාපාර ප්‍රමාණය වැඩිකිරීම සඳහා දෙදින "ත්‍රීවීල් ක්ලිනික්" වැඩසටහනක් පැවැත්වීම | • සාමාන්‍ය ප්‍රවර්ධන කටයුතු හැර තාක්ෂණික හා නඩත්තු සම්බන්ධ ආධාර |

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## >> ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

### වෙනත් සේවා සපයන්නන් සමග සබඳතා ශක්තිමත් කිරීම

ක්ෂණික ගෙවීම්, සුහද සබඳතා, නිතිපතා සම්බන්ධතා සහ සපයනු ලබන සේවාවන් සඳහා පිළිගැනීම සේවා සපයන්නන් සමග අපගේ සම්බන්ධතා ගොඩනැගීමේ උත්සාහයේ ප්‍රතිඵලයකි.

### මූල්‍ය සේවා සපයන්නන් සමග හවුල්වීම

අපගේ අධීක්ෂණ යාන්ත්‍රණය ක්‍රියාත්මක කරනු ලැබුවේ සමාගම අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සමග ඇති සියලුම ගිවිසුම් පිළිපැදීම සහ සියලුම වගකීම් සපුරාලීම සහතික කිරීම සඳහාය. දිගු කාලීනව අපගේ දේශීය හා ජාත්‍යන්තර මූල්‍ය සේවා සපයන්නන් සමග හොඳ සබඳතා පවත්වාගෙන යාමේ මූලික අඩිතාලම මෙයයි.

සමාගම සමග සම්බන්ධවී සිටින බැංකුකරුවන්ගේ සම්පූර්ණ ලැයිස්තුවක් මෙම වාර්තාවේ පිටුපස සටහන් කර ඇත.

### ව්‍යාපාර අඛණ්ඩ සේවා සපයන්නන් සමග හවුල්වීම

බාධාවකින් තොරව විවෘතව කටයුතු කිරීමේ අපගේ හැකියාවට අත්‍යවශ්‍ය යැයි වර්ගීකරණය කර ඇති එම සේවා සපයන්නන් කෙරෙහි අපි විශේෂ අවධානයක් යොමු කරමු. ඔවුන්ට ගෙවීම් නියමිත වේලාවට සිදුවන බවටත්, නිරන්තර සම්බන්ධතා පවත්වාගෙන යන බවටත් විවෘත කිරීම්වල තිරසාරභාවය සම්බන්ධ සියලු ගැටළු කඩිනමින් හා සතුටුදායක ලෙස විසඳීමටත් අපි සහතික වෙමු.

### බාහිර සේවා සපයන්නන් සමග හවුල්වීම

ආරක්ෂාව, සනීපාරක්ෂක සේවා, ලොජිස්ටික්ස්, කුරියර්, අපද්‍රව්‍ය කළමනාකාරණය, බදු උපදේශණ සේවා වැනි මූලික නොවන මෙහෙයුම් සඳහා පිරිවැය ඵලදායී විසඳුම් ලබාදිය හැකි විශේෂ සමාගම් බාහිරින් ලබාගෙන ඇත. මෙම සේවා සපයන්නන් සමග දිගුකාලීන සබඳතා පවත්වා ගැනීමට කැමැත්තක් දක්වමින්, අපි ඔවුන් සමග නිතිපතා සම්බන්ධ වන අතර, ඔවුන්ගේ දායකත්වය සඳහා පිළිගැනීමක් ලබා දෙන්නෙමු.

වර්ෂය තුළ අපි ව්‍යාපාර මෙහෙයුම් බාහිරින් ලබාගැනීම පිළිබඳ ප්‍රතිපත්තියක් හඳුන්වා දුන්නෙමු. එහි අරමුණ වන්නේ අපගේ දැඩි අවශ්‍යතා සපුරාලන සේවා සපයන්නන් සමග සමාගම පිරිවැය ඵලදායි බාහිරකරණ විධිවිධානවලට ඇතුළු වන බව සහතික කිරීමයි. NBFI කර්මාන්තයට අදාළ නියාමනයන්ට අනුකූලව එවැනි විධිවිධානයන්ගෙන් මතුවන අවදානම් කාලෝචිත ආකාරයකින් ඵලදායි ලෙස කළමනාකරණය කෙරේ.

### උපයෝගීතා සේවා සපයන්නන් සමග හවුල්වීම

අපගේ උපයෝගිතා සේවා සපයන්නන් (විදුලිය, ජලය, දුරකතන සහ අන්තර්ජාල සේවා) සමග සබඳතා ශක්තිමත් කිරීම සහ අඛණ්ඩ සේවාවක් සහතික කිරීම සඳහා, ඔවුන්ට ක්ෂණිකව මුදල් ගෙවන බවට අපි සහතික වෙමු.

### අනෙකුත් සේවා සපයන්නන් සමග සම්බන්ධවීම

දේපළ, උපකරණ නඩත්තු කිරීමේ සිට පද්ධති සංවර්ධනය, පරිගණක දෘඩාංග හා මෘදුකාංග විසඳුම්, ඉන්ධන සහ වෙළෙඳ ප්‍රචාරණ සහ ප්‍රවර්ධන දක්වා විවිධ ලිපි ගොනුවල ව්‍යාපාරික හවුල්කරුවන් සමග අපි අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සම්බන්ධතා භුක්ති විඳින්නෙමු.

### ඉදිරි දැක්ම

නුදුරු අනාගතය සඳහා අපගේ අරමුණු වන්නේ අපගේ සැපයුම්කරුවන් සමග අපගේ පවතින සබඳතා ශක්තිමත් කිරීම සහ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමයි. අපි අනාගතයේදී තවදුරටත් උපායමාර්ගික හවුල්කාරිත්වයන් අපේක්ෂා කරමු.

GRI 202-2

### → හොඳම ගැළපෙන දක්ෂතා ආකර්ෂණයකර ගැනීම සහ රඳවා ගැනීම

අපි ක්‍රියාත්මක වන්නේ ඉහළ තරගකාරී වෙළෙඳපොලක් තුළ වන අතර, තරුණ පරම්පරාව පසුපෙළ කාර්යයන්හි නිරතවීමේ කැමැත්තක් දක්වයි. එහෙත් අපගේ කර්මාන්තය තුළ අපගේ ව්‍යාපාරයෙන් වැඩි ප්‍රමාණයක් ගොනුවී ඇත්තේ ක්ෂේත්‍ර ක්‍රියාවලීන් තුළයි. අපි හොඳම දේ ආකර්ෂණයකර ගන්නේ කෙසේද? සේවකයින්ගේ ප්‍රධාන ආකර්ෂණය වන්නේ ඔවුන්ගේ සේවායෝජකයාගේ සංස්කෘතියයි.

සියලුම ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් දේශීයව බඳවාගත් ශ්‍රී ලාංකිකයන් වේ.

GRI 102-8 GRI 402-1 GRI 404-1 GRI 405-1

### සියල්ල ඇතුළත් සංස්කෘතියක් පවත්වා ගැනීම

වර්තමාන මෙහෙයුම් පරිසරය අනුව වඩාත් සුදුසු කුසලතා ආකර්ෂණයකර ගැනීම පහසු කාර්යයක් නොවේ. සාම්ප්‍රදායික හා නව ආයතනයන් වෙළෙඳපොල කොටස සහ පාරිභෝගික අවධානය යන අංශයෙන් රටේ NBFI ක්ෂේත්‍රය තරගකාරීවේ. එහෙත්, මෙම පරිසරය තුළ අපගේ නායකත්වය පවත්වා ගැනීම සඳහා අපගේ නිෂ්පාදන හා සේවාවන් විවිධාංගීකරණයකර නව පාරිභෝගිකයන් සොයාගත යුතුය. පිරිස් සම්බන්ධයෙන් ගත් කළ, එවැනි විවිධාංගීකරණයකට අප ගවේෂණය කිරීමට බලාපොරොත්තු වන නව හැකියාවන්ගෙන් යුතු පිරිස් බඳවා ගැනීම අවශ්‍යවේ.

පීපල්ස් ලීසිං තුළදී අපි සංස්කෘතියේ අංශ තුනක් කෙරෙහි අවධානය යොමු කරමු:

- ආයතනික සංස්කෘතිය - විවෘත, විනිවිද පෙනෙන සහ සහයෝගීතාවයට හිතකරය
- දැනුම සංස්කෘතිය - ආයතනිකරණය සඳහා දශක දෙකක වටිනාකමින් යුත් අත්දැකීම්
- නවෝත්පාදන සංස්කෘතිය - අසාමාන්‍ය චින්තනය සහ එහි යෙදුම පෝෂණය කිරීම

අපගේ මානව සම්පත් උපායමාර්ගික සමාගමේ ආයතනික උපායමාර්ග සමග සමපාත වන අතර, ශ්‍රම බලකාය තුළ ඇති පරම්පරාගත වෙනස්කම් සහ තාක්ෂණික ප්‍රතිපත්තියේ වැඩෙන භාවිතය සහ සේවක චර්යාධර්ම පද්ධතිය වැනි මෙහෙයුම් පරිසරයේ පවතින ප්‍රවණතා පිළිබිඹු කරයි.

නියාමනයන් ප්‍රමිති, ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ භාවිතයන්ට පටහැනි හැසිරීම් සම්බනධ ඕනෑම ආරවුලක් විනය නීති සංග්‍රහයට අනුකූලව විධිමත් හා විනිවිදභාවයෙන් යුතුව මෙහෙයවනු ලැබේ.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම <<

GRI 405-1

පහත දැක්වෙන ප්‍රස්ථාර මගින් අපගේ කාර්යය මණ්ඩලයෙහි විවිධත්වය විදහා දක්වයි:

| සේවක කාණ්ඩය | ස්ත්‍රී/පුරුෂභාවය | 2018/19 | | | | | | 2017/18 | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වයස් විශ්ලේෂණය (අවුරුදු) | | | | | මුළු ගණන ස්ත්‍රී පුරුෂභාවය විශ්ලේෂණය | වයස් විශ්ලේෂණය (අවුරුදු) | | | | | මුළු ගණන ස්ත්‍රී පුරුෂභාවය විශ්ලේෂණය |
| | | > 60 | 50-59 | 40-49 | 30-39 | <= 29 | | > 60 | 50-59 | 40-49 | 30-39 | <= 29 | |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | පුරුෂ | **2** | **11** | **19** | **2** | **–** | 34 | 2 | 9 | 20 | 2 | – | 33 |
| | ස්ත්‍රී | **–** | **1** | **1** | **–** | **–** | 2 | – | 1 | 1 | – | – | 2 |
| මැදපෙළ කළමනාකරුවන් | පුරුෂ | **1** | **7** | **86** | **57** | **–** | 151 | – | 7 | 69 | 48 | – | 124 |
| | ස්ත්‍රී | **–** | **–** | **13** | **12** | **–** | 25 | – | – | 10 | 8 | – | 18 |
| විධායක ශ්‍රේණියේ සේවකයින් | පුරුෂ | **1** | **7** | **60** | **275** | **29** | 372 | 1 | 6 | 62 | 228 | 22 | 319 |
| | ස්ත්‍රී | **–** | **1** | **36** | **52** | **4** | 93 | – | – | 33 | 44 | 6 | 83 |
| විධායක නොවන සේවකයින් | පුරුෂ | **1** | **1** | **26** | **349** | **754** | 1,131 | 1 | 1 | 19 | 301 | 718 | 1,040 |
| | ස්ත්‍රී | **1** | **1** | **4** | **118** | **296** | 420 | – | – | 6 | 110 | 264 | 380 |
| සහාය සේවකයින් | පුරුෂ | **–** | **6** | **20** | **35** | **38** | 99 | – | 5 | 18 | 29 | 32 | 84 |
| | ස්ත්‍රී | **–** | **1** | **1** | **–** | **–** | 2 | – | 1 | 1 | – | – | 2 |
| මුළු ගණන | | **6** | **36** | **266** | **900** | **1,121** | 2,329 | 4 | 30 | 239 | 770 | 1,042 | 2,085 |

GRI 405-1

### සේවා කාණ්ඩය මත සේවකයින් වර්ග කිරීම




### වයස් කාණ්ඩය සහ ස්ත්‍රී පුරුෂභාවය මත සේවකයින් වර්ග කිරීම




අපි තාවකාලික හෝ අර්ධකාලීන යන පදනම මත සේවකයින් බඳවා ගැනීම සිදු නොකරයි.

සියලු බඳවා ගැනීම් පරිවාස කාලයකට යටත් වන අතර, මෙම කාලසීමාව සාර්ථකව සම්පූර්ණ කළ අය ස්ථිර සේවක මණ්ඩලයට අන්තර්ග්‍රහණය කරනු ලබයි. සියලුම සේවකයින්ගෙන් 85% ක ප්‍රතිශතයක් ස්ථිර පදනම යටතේ සේවය කරයි. සේවක සංඛ්‍යාවෙන් 15% ක ප්‍රතිශතයක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇත.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්



## >> ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම

GRI 102-8

### පළාත අනුව සේවකයින් සංඛ්‍යාව

| පළාත | 2018/19 | | | 2017/18 | | |
|---|---|---|---|---|---|---|
| | ශාඛා/ අංශ ගණන | පුරුෂ | ස්ත්‍රී | ශාඛා/ අංශ ගණන | පුරුෂ | ස්ත්‍රී |
| බස්නාහිර පළාත | **73** | **804** | **334** | 69 | 732 | 308 |
| මධ්‍යම පළාත | **12** | **164** | **44** | 12 | 144 | 34 |
| නැගෙනහිර පළාත | **9** | **108** | **12** | 9 | 94 | 11 |
| උතුරු පළාත | **7** | **73** | **8** | 7 | 64 | 8 |
| දකුණු පළාත | **16** | **225** | **50** | 16 | 210 | 37 |
| සබරගමු පළාත | **9** | **105** | **25** | 9 | 84 | 26 |
| උතුරු මැද පළාත | **7** | **81** | **18** | 7 | 70 | 16 |
| වයඹ පළාත | **11** | **124** | **35** | 11 | 107 | 29 |
| ඌව පළාත | **6** | **103** | **16** | 6 | 95 | 16 |
| **මුළු ගණන** | | **1,787** | **542** | | 1,600 | 485 |

### සේවක සංකේන්ද්‍රණය - අවුරුදු පහක සාරාංශය

| පළාත | සේවක සංඛ්‍යාව | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2018/19 | | 2017/18 | | 2016/17 | | 2015/16 | | 2014/15 | |
| | මුළු ගණන | නව බඳවා ගැනීම් | මුළු ගණන | නව බඳවා ගැනීම් | මුළු ගණන | නව බඳවා ගැනීම් | මුළු ගණන | නව බඳවා ගැනීම් | මුළු ගණන | නව බඳවා ගැනීම් |
| මධ්‍යම පළාත | **208** | **46** | 178 | 14 | 181 | 35 | 158 | 24 | 148 | 25 |
| උතුරු පළාත | **81** | **22** | 72 | 7 | 73 | 19 | 62 | 10 | 57 | 158 |
| උතුරු මැද පළාත | **99** | **25** | 86 | 13 | 84 | 27 | 65 | 11 | 60 | 7 |
| වයඹ පළාත | **159** | **39** | 136 | 15 | 137 | 35 | 110 | 22 | 103 | 16 |
| සබරගමු පළාත | **130** | **28** | 110 | 24 | 109 | 29 | 90 | 21 | 76 | 9 |
| ඌව පළාත | **119** | **24** | 111 | 11 | 110 | 20 | 104 | 24 | 91 | 11 |
| බස්නාහිර පළාත - ශාඛා | **678** | **136** | 609 | 62 | 641 | 124 | 557 | 84 | 527 | 82 |
| බස්නාහිර පළාත - ප්‍රධාන කාර්යාලය | **460** | **64** | 431 | 47 | 424 | 34 | 416 | 77 | 356 | 45 |
| නැගෙනහිර පළාත | **120** | **42** | 105 | 24 | 97 | 25 | 91 | 18 | 87 | 13 |
| දකුණු පළාත | **275** | **66** | 247 | 23 | 229 | 62 | 181 | 31 | 161 | 35 |
| **මුළු ගණන** | **2,329** | **492** | 2,085 | 240 | 2,085 | 410 | 1,834 | 322 | 1,666 | 258 |

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම <<

අපගේ සේවකයින් දිවයින පුරා විසිරී සිටින අපගේ පාර්භෝගික කොටස් මෙන් විවිධාකාර වේ.

අපගේ සේවක මණ්ඩලය දිවයින පුරා පැතිරී ඇති අතර, සියලුම සේවකයින්ගෙන් 48.86% ක් බස්නාහිර පළාතේ වෙති. මෙම කලාපයේ ජනනය කරන ලද ශාඛා ගණන නියෝජනය කරන අතර, බස්නාහිර පළාතේ වැඩි සංඛ්‍යාවක් ප්‍රධාන කාර්යාලයේ සේවකයින්ගේ සංකේන්ද්‍රණයට ප්‍රතිචාර දක්වයි. මෙය පසුගිය වසර කිහිපය තුළ අඛණ්ඩව පැවතිනි.

ප්‍රධාන කාර්යාල සහ ශාඛා ජාලය අතර සන්නිවේදන මාර්ග විවෘතව හා කාර්යක්ෂමව පවතින බව අපි සහතික කරමු. එවිට ඔවුන්ගේ භූගෝලීය පිහිටීම කුමක්වුවත් එකිනෙකා සමග හොඳින් සම්බන්ධ විය හැකිය. සියලුම සේවකයින් සඳහා මෙහෙයුම් වෙනස්වීම් පිළිබඳ දැන්වීම් අප සන්නිවේදනය කරන අතර අවශ්‍ය වන වෙනස්වීම්වල ස්වභාවය අනුව මෙහෙයුම් සන්නිවේදනය කරන අතර, අවශ්‍යවන වෙනස්වීම්වල ස්වභාවය අනුව මෙහෙයුම් වෙනස්කම්වල දැනුම් දීමේ කාලය වෙනස්විය හැකිය.

සේවක සන්නිවේදනයේ නිත්‍ය ක්‍රම අතරට –

- අන්තර්ජාලය
- කාර්යමණ්ඩල චක්‍රලේඛ
- අන්තර් මතක සටහන්
- ඊමේල්
- පිළිවෙත්
- කාර්යමණ්ඩල රැස්වීම්

සාම්ප්‍රදායිකව අපගේ සේවකයින්ගේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සංයුතිය සැමවිටම වඩා බරින් යුක්තවන අතර පිරිමින් ගොනුකර ඇති වැඩ කිරීමට අකමැතිවී ඇත.

**එක් සේවකයෙකු සඳහා සාමාන්‍ය පුහුණු කාලය**




GRI 102-41 GRI 406-1 GRI 408-1 GRI 409-1 GRI 410-1 GRI 412-1 GRI 412-2

### සමාන අවස්ථා ලබාදීම සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම

අපගේ බඳවා ගැනීමේ ප්‍රතිපත්තියට අනුකූලව, භූදේශපාලනික හා සමාජ ආර්ථික පරිවාරක නියෝජනය කරමින් සේවකයින් බෙදාහැරීම සහ උසස්වීම් පදනම්වී ඇත්තේ පුද්ගල කුසලතා මතය. සමාන අවස්ථා සේවායෝජකයෙකු ලෙස අපගේ තත්ත්වය පවත්වාගෙනයාම, ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ජාතිය, සංස්කෘතික වෙනස්කම් හෝ වෙනත් එවැනි සාධක මත අපි වෙනස්කම් නොකරමු. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ වෙනස්කම් කිරීමේ සිදුවීම් කිසිවක් වාර්තා නොවූ බැවින් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයක් අවශ්‍ය නොවිය.

වෘත්තීය සමිති සහිත සමාගමක් නොවීම නිසා පීපල්ස් ලීසිං එහි සේවකයින් සමග සාමූහික ගිවිසුම්වල නියමයන්ට යටත් නොවේ. එබැවින් අපි සමාගම පුරා ශක්තිමත් සේවක සබඳතා කල්තියා ගොඩනගා ඇත්තෙමු.

අපගේ සියලු ජනතාවට ඇසුරු කිරීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ඇති බව අපි සහතික කරමු. මෙම අයිතිය ප්‍රතික්ෂේපය වීම හෝ උල්ලංඝණයවීමේ අවදානමක් ඇති බවට සමාගම නොදැන සිටී.

2018/19 කාලය තුළ බලහත්කාරයෙන් වැඩකරන ළමා ශ්‍රමයේ අවදානමක් ඇති බවට අපගේ මෙහෙයුම්වල හෝ අපගේ සැපයුම්දාමයේ කිසිදු සනාථ කිරීමක් වාර්තාවී නොමැත.

වර්ෂය තුළ මානවහිමිකම් කෙරෙහි විශේෂයෙන් අවධානය යොමුකළ විධිමත් පුහුණුවක් අපි සේවකයින්ට ලබා නොදුනි. අපගේ බාහිර සේවා සපයන්නන්ට මානවහිමිකම් පිළිබඳ විධිමත් පුහුණුවක් ලබාදී නොමැති අතර ඒ වෙනුවට ඔවුන්ගේ සේවායෝජකයා විසින් එවැනි පුහුණුවක් ලබාදෙන බවට අපි සහතික වෙමු.

තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ වූ හා ඒවාට සම්බන්ධ වූ සේවකයින් සමග ද්වි මාර්ග සන්නිවේදනය පරිසරයක් නිර්මාණය කිරීමට අපි මහන්සි වෙමු.

අප මානවහිමිකම් කෙරෙහි ආකෘති බලපෑම් තක්සේරුවක් සිදු කරන අතරම, අපගේ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ ඕනෑම ආකාරයකින් මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වලින් අපව ආරක්ෂා කරයි.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්



## >> ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම

**ජනවාර්ගිකත්වය අනුව සේවක සංයුතිය**

| ජන වර්ගය | 2018/19 | | | |
|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | මුලු ගණන | % |
| සිංහල | 1,565 | 511 | 2,076 | 89 |
| දෙමළ | 135 | 21 | 156 | 7 |
| මුස්ලිම් | 87 | 10 | 97 | 4 |
| මුළු ගණන | 1,787 | 542 | 2,329 | 100 |

GRI 202-1

### ස්ත්‍රී/පුරුෂභාවය අනුව මූලික වැටුප් අනුපාතිකය

කම්කරු දෙපාර්තමේන්තුව අවම වැටුප් පිරිවිතරයන් දක්වා නොමැති අතර, 2016 අංක 03 දරණ ජාතික අවම කම්කරු වැටුප් පනත මගින් නියම කර ඇති අවම වැටුප් ප්‍රමිතීන්ට හා 2016 අංක 04 දරණ අයවැය සහන දීමනා පනත මගින් නියම කර ඇති අය වැය දීමනාවට අනුකූල වන වැටුප් පරිමාණයන් අප විසින් අනුගමනයකර ඇත.

GRI 405-2

ස්ත්‍රී/පුරුෂභාවය අනුව වේතනයන්හි හොඳ සමබරතාවයක් පවත්වා ගැනීම කෙරෙහි පීපල්ස් ලීසිං සමාගම අවධානය යොමු කරයි. වාර්තාකරන වර්ෂය තුළ සියලුම සේවක කාණ්ඩයන් තුළ පුරුෂ -ස්ත්‍රී අතර සාමාන්‍ය මූලික වැටුප් අනුපාතය 1.00:0.97 ක් විය.

**ස්ත්‍රී පුරුෂභාවය අනුව මූලික වැටුප් අනුපාතිකය**

| | 2018/19 | 2017/18 | 2016/17 | 2015/16 | 2014/15 |
|---|---|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය** | | | | | |
| පුරුෂ | **1.00** | 1.00 | 1.00 | 1.00 | 1.00 |
| ස්ත්‍රී | **0.71** | 0.70 | 0.68 | 0.61 | 0.90 |
| **මැද පෙළ කළමනාකරුවන්** | | | | | |
| පුරුෂ | **1.00** | 1.00 | 1.00 | 1.00 | 1.00 |
| ස්ත්‍රී | **0.97** | 0.93 | 0.93 | 0.88 | 0.91 |
| **විධායක ශ්‍රේණියේ සේවකයින්** | | | | | |
| පුරුෂ | **1.00** | 1.00 | 1.00 | 1.00 | 1.00 |
| ස්ත්‍රී | **1.14** | 1.12 | 1.14 | 1.12 | 1.10 |
| **විධායක නොවන සේවකයින්** | | | | | |
| පුරුෂ | **1.00** | 1.00 | 1.00 | 1.00 | 1.00 |
| ස්ත්‍රී | **1.01** | 1.01 | 1.03 | 1.00 | 1.10 |
| **සහාය සේවකයින්** | | | | | |
| පුරුෂ | **1.00** | 1.00 | 1.00 | 1.00 | 1.00 |
| ස්ත්‍රී | **1.11** | 1.05 | 1.04 | 1.00 | 1.00 |
| **සාමාන්‍ය වැටුප් අනුපාතිකය** | | | | | |
| පුරුෂ | **1.00** | 1.00 | 1.00 | 1.00 | 1.00 |
| ස්ත්‍රී | **0.97** | 0.81 | 0.79 | 0.75 | 1.00 |

### වැඩ කිරීමට කැමති ස්ථානයක් නිර්මාණය කිරීම

වෙළෙඳපොලේ ඇති අනෙකුත් තරගකාරී ආයතන හා සසඳන විට අපගේ සේවක පුරප්පාඩු සඳහා ඉල්ලුමක් නිර්මාණය කිරීම යනුවෙන් අදහස් කරන්නනේ මිනිසුන් විශ්වාස කරන පරිදි ඔවුන්ට නැවත පැමිණීමට අවශ්‍ය ස්ථානයක් හා සම්පූර්ණයෙන්ම කැප වී සිටින ස්ථානයක් නිර්මාණය කිරීමයි. අපගේ සේවක මණ්ඩලයෙන් වැඩි කොටසක් අවුරුදු 3 ට වඩා අඩු අත්දැකීම් ඇති කාණ්ඩයට අයත්වන අතර අවුරුදු 3 සිට 10 දක්වා වූ අත්දැකීම් වලින් සමන්විත වන සැලකිය යුතු සේවක සංඛ්‍යාවක් ද අප සතුවේ. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් හා මැදපෙළ කළමනාකරුවන් විශාල පිරිසකට පීපල්ස් ලීසිං සමාගම තුළ වසර ගණනාවක අත්දැකීම් තිබේ.

**සේවා කාලය විශ්ලේෂණය**



# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම <<

GRI 201-3 GRI 401-2 GRI 401-3 GRI 404-3

### ප්‍රතිලාභ සහ අගය කිරීම

පීපල්ස් ලීසිං මගින් කාර්‍යසාධනය මත පදනම් වූ ආයතනයක් වන අතර සියලුම සේවකයින්ට නිත්‍ය කාර්‍යසාධනය සහ වෘත්තීය සංවර්ධනය සමාලෝචනය කරනු ලැබේ.

අපගේ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය කුසලතා රඳවා තබා ගැනීමේදී වැදගත් කාර්‍යභාරයක් ඉටුකරන අතර වැටුප් සහ මුදල් නොවන සංරචකය යන දෙකම සමන්විතවේ. මුදල් ප්‍රතිලාභ වැටුප්, බෝනස් සහ දීමනාවලින් සමන්විතවේ. සියලුම සේවක EPF, ETF සහ පාරිතෝෂික ගෙවීම් නියමිත වේලාවට සිදු කරන බවට අපි සහතික වෙමු. EPF සඳහා පීපල්ස් ලීසිං දායකවීම 12%ක්ද, ETF සඳහා දායකවීම 3%ක් ද වන අතර සේවකයින්ගේ EPF දායකත්වය 8%ක් වේ.

වසර පහක් හෝ ඊට වැඩි කාලයක් තමා යටතේ සේවය කරන සේවකයින්ට විශ්‍රාම යාම හෝ ඉල්ලා අස්වීම මත පාරිතෝෂිකයක් ගෙවනු ලැබේ. එය සම්පූර්ණ කරන ලද සෑම සේවා වර්ෂයක් සඳහාම මාස භාගයක වැටුපට සමානවේ.

ශාඛා තරග සංවිධානය කරනු ලබන්නේ සුදුසුකම්ලත් ශාඛා සේවකයින්ට ත්‍යාග පිරිනමමිනි.

සාප්පු හා කාර්යාල සේවකයින්ගේ පනත අනුව මාතෘ නිවාඩු හා පහසුකම් සැපයේ.

ස්ථිර සේවකයින් සඳහා රක්ෂණ ප්‍රතිලාභ රාශියක් අප විසින් සපයනු ලැබේ. අපගේ සුබසාධන යෝජනා ක්‍රමය තුළින් ලබාගත හැකි අතිරේක ප්‍රතිලාභ අතරට -

- වාහන මිළදී ගැනීම සඳහා සහනදායී ණය යෝජනා ක්‍රමයක්
- සහනදායී නිවාස ණය යෝජනා ක්‍රමයක්
- ජංගම දුරකතනවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම
- කාලත්‍රයාගේ පවුල ඇතුළු සේවකයින්ට සහ ඔවුන්ගේ ආසන්නතම පවුලට මරණ ප්‍රතිලාභ
- විභාග ගාස්තු ප්‍රතිපූරණය කිරීම
- මරදාන, මහරගම, බණ්ඩාරවෙළ නිවාඩු නිකේතන සඳහා සහනදායී මිළ

සමාගම පහත සඳහන් ප්‍රතිලාභ ලබා දෙමින් සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් වෙනුවෙන් පෙනී සිටී.

- වෛද්‍ය, හදිසි අනතුරු සහ ජීවිත රක්ෂණය
- වෛද්‍ය රක්ෂණයෙන් ආවරණය නොවන රෝග සඳහා අසාධ්‍ය රෝග අරමුදල
- ප්‍රධාන කාර්‍යාලයේ අංගසම්පූර්ණ ව්‍යායාම ශාලාවක්
- දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සෞඛ්‍ය පෝෂණය සහ බරපතල රෝග වැළැක්වීමේ ප්‍රතිකාර පිළිබඳ පුහුණුව

සේවකයින්ට යහපත් දීමනා ක්‍රමයක් භුක්ති විඳීම සහතික කිරීම සඳහා අපි නිතිපතා වැටුප් සමීක්ෂණ පවත්වමු. උද්ධමන අනුපාතයට අනුකූලව වේතනය සහතික කිරීම සඳහා මෙහෙයුම් කාර්‍ය මණ්ඩලයේ වැටුප් පරිමාණය වැඩිකිරීම පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක්ද අපි පවත්වමු.

#### අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම්

| ප්‍රතිලාභ | 2018/19 රු. මිලියන | 2017/18 රු. මිලියන |
|---|---|---|
| වැටුප් සහ ප්‍රසාද දීමනාව | **2,209.74** | 2,003.96 |
| සේ.අ.අ. | **163.15** | 146.74 |
| සේ.භා.අ. | **40.78** | 36.69 |
| අතිරේක කාල දීමනා | **41.99** | 36.99 |
| නිවාඩු දීමනා | **51.43** | 48.04 |
| දීමනා සහ දිරිදීමනා | **690.61** | 487.79 |
| අනියම් වැටුප් | **4.00** | 3.59 |
| වෛද්‍ය ප්‍රතිකාර දීමනා | **145.88** | 126.74 |
| පාරිතෝෂිකය | **90.59** | 83.71 |
| මුළු | **3,438.17** | 2,974.25 |

GRI 403-1 GRI 403-2 GRI 403-3 GRI 403-4

### සෞඛ්‍ය සහ ආරක්ෂාව

අපගේ සේවකයින්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව අපිට අතිශයින්ම වැදගත්ය. සමාගම වැඩ කරන කාලය තුළ මාර්ග අනතුරු දෙකක් වාර්තා වූ අතර, මෙම අනතුරු හේතුවෙන් අහිමි වූ දින 29ක් වූ අතර එය පෙර වසරේ 94 ට වඩා අඩු අගයකි.

#### වෘත්තීය අනතුරු/රෝග සහ සෞඛ්‍ය ගැටළු

| අවසන් වර්ෂය | 2018/19 | 2017/18 |
|---|---|---|
| අනතුරු | **2** | 1 |
| වෙනත් තුවාල ඇත්නම් | **–** | – |
| මෙම අනතුරු හේතුවෙන් වාර්තාවී නැති වූ දින | **29** | 94 |

අපගේ ව්‍යාපාර මෙහෙයුම්වල ස්වභාවය නිසා ඒවා ඔවුන්ගේ රැකියාවට සම්බන්ධ ඉහළ අවදානමක් හෝ රෝග අවදානමක් නොමැති අතර විධිමත් සෞඛ්‍ය හා ආරක්ෂක කමිටුවක් ක්‍රියාත්මක නොවන නමුත් පහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මකවේ.

- ගිනි ආරක්ෂණ උපකරණ සහිත නඩත්තුවන ගොඩනැගිලි
- ගිනි ආරක්ෂණ උපකරණ
- ගිනි ගැනීම් සඳහා පෙරහුරුවන්
- සැලසුම් කරන ලද ගිනි නිවන භටයින් සඳහා පුහුණුවක්
- ස්වෙච්ඡා සේවකයින් සඳහා පළමු ආධාර සහ පුහුණුව
- හොඳින් නඩත්තු කරන ලද වාහන සමූහයක්

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## >> ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

GRI 401-1

### සේවක පිරිවැටුම

තරගකාරී සේවක වෙළෙඳපොළක ඉල්ලුමට එරෙහිව අපගේ ආයතනික සංස්කෘතිය හා සාරධර්ම ශක්තිමත්වී ඇති අතර, එය වඩාත් සුදුසු කුසලතා ආකර්ශනය කර ගැනීමට උපකාරී වේ. 2019 මාර්තු 31 වන විට අපගේ සේවක සංඛ්‍යාව 2,329 ක් වූ අතර, එය පෙර වසරට වඩා 11.7%ක වර්ධනයකි. එම වර්ධනය පසුගිය වසර තුළ ආරම්භ කරන ලද ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ බලපෑම පිළිබිඹු කරයි.

#### සේවක පිරිවැටුම හේතුව අනුව

| | 2018/19 | | 2017/18 | |
|---|---|---|---|---|
| හේතුව | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| ඉල්ලා අස්වීම | **180** | **64** | 192 | 45 |
| විශ්‍රාම ගැනීම | – | – | 1 | – |
| මරණයට පත්වීම | – | – | – | – |
| ඉවත් කිරීම් | **1** | **1** | 2 | – |

#### සේවා කාණ්ඩය අනුව සේවක පිරිවැටුම - වසර 5ක සාරාංශය

| | සේවක සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| සේවා කාණ්ඩය | **2018/19** | 2017/18 | 2016/17 | 2015/16 | 2014/15 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය | **–** | 2 | 2 | 1 | 1 |
| මැදපෙළ කළමනාකරුවන් | **3** | 5 | 2 | – | 4 |
| විධායක ශ්‍රේණියේ සේවකයින් | **19** | 19 | 9 | 15 | 23 |
| විධායක නොවන සේවකයින් | **218** | 206 | 139 | 127 | 136 |
| සහාය සේවකයින් | **6** | 8 | 3 | 7 | 2 |
| **මුළු සංඛ්‍යාව** | **246** | 240 | 155 | 150 | 166 |

#### සේවක පිරිවැටුම ශ්‍රේණිය අනුව




A – ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය B – මැදපෙළ කළමනාකරුවන් C – විධායක ශ්‍රේණියේ සේවකයින් D – විධායක නොවන සේවකයින් E – සහාය සේවකයින්

#### වයස් කාණ්ඩය මත සේවක පිරිවැටුම

| | **2018/19** | | 2017/18 | 2016/17 | 2015/16 | 2014/15 |
|---|---|---|---|---|---|---|
| වයස් කාණ්ඩය | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව |
| <29 | **193** | **78.46** | 185 | 118 | 129 | 118 |
| 30-39 | **45** | **18.29** | 50 | 32 | 18 | 44 |
| 40-49 | **3** | **1.22** | 3 | 1 | 1 | 3 |
| 50-59 | **2** | **0.81** | – | 1 | 2 | 1 |
| >60 | **3** | **1.22** | 2 | 3 | – | – |
| **මුළු සංඛ්‍යාව** | **246** | **100** | 240 | 155 | 150 | 166 |

#### සේවක පිරිවැටුම වයස අනුව



# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම <<

පළාත සහ ස්ත්‍රී/පුරුෂභාවය අනුව සේවක පිරිවැටුම

| | 2018/19 | | | 2017/18 | | |
|---|---|---|---|---|---|---|
| පළාත | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
| බස්නාහිර පළාත | **80** | **46** | **126** | 82 | 36 | 118 |
| මධ්‍යම පළාත | **16** | **2** | **18** | 15 | 2 | 17 |
| නැගෙනහිර පළාත | **21** | **4** | **25** | 16 | – | 16 |
| උතුරු පළාත | **9** | **3** | **12** | 8 | – | 8 |
| දකුණු පළාත | **17** | **3** | **20** | 14 | 1 | 15 |
| සබරගමුව පළාත | **7** | **2** | **9** | 24 | – | 24 |
| උතුරු මැද පළාත | **4** | **2** | **6** | 10 | 3 | 13 |
| වයඹ පළාත | **16** | **2** | **18** | 15 | 2 | 17 |
| ඌව පළාත | **11** | **1** | **12** | 11 | 1 | 12 |
| **එකතුව** | **181** | **65** | **246** | 195 | 45 | 240 |

### පළාත අනුව සේවක පිරිවැටුම




මුළු ඉල්ලා අස්වීම් පෙර වසරේ 240 ට සාපේක්ෂව 246 ක් වූ අතර පිරිවැටුම් අනුපාතය පෙර වසරේ 11.51% සිට 11.15% දක්වා බොහෝ දුරට සමාන විය. පසුපෙළ කාර්යාල සේවකයින් සඳහා සාපේක්ෂව අඩු පිරිවැටුම් අනුපාතයක් දිගටම දුටුවෙමි. වෙනත් අංශවල අය සඳහා ඉහළ අනුපාතයක් තිබීම වෙළඳපොල තුළ අපගේ පුහුණුව හා සංවර්ධනයේ වටිනාකම පිළිබිඹු කරයි. අපගේ වෘත්තිය සංවර්ධන වැඩසටහන් සඳහා වැඩි පළපුරුද්දක් සහ නිරාවරණයක් ඇති සේවකයින්ට වැඩි ඉල්ලුමක් ඇති අතර වැඩි ඉඩක් ඇත.

තරුණ පරම්පරාව අතර, වේගවත් වෘත්තීය ප්‍රගතියක් අපේක්ෂා කරන අතර, පිරිවැටුම ඉහළ මට්ටමක පවතින්නේ තරගකරුවන් අපගේ විධායක නොවන සේවකයින් ආකර්ෂණීය උසස්වීම් සහ වඩා හොඳ අපේක්ෂාවන් සමග පොළඹවන බැවිනි.

වර්ෂය තුළ සේවකයින් ඉල්ලා අස්වීමට දුන් ප්‍රධාන හේතු අතර -

- නව රැකියා අවස්ථා
- උසස් අධ්‍යාපනය
- සංක්‍රමණය

GRI 401-3

### මාතෘ නිවාඩු වලින් පසු සේවකයන් නැවත සේවයේ යෙදවීම.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ මාතෘ නිවාඩු වලින් පසු නැවත සේවයට පැමිණෙන කාන්තා සේවකයින් අනුපාතය 70.09% සිට 78.72% දක්වා ඉහළ ගොස් ඇති අතර, එය කර්මාන්තය තුළ වැඩකිරීමට වඩාත් සුදුසු ස්ථානයක් ලෙස එහි තත්වය පිළිබිඹු කරයි.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## >> ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම



**මාතෘ නිවාඩුවලින් පසු රඳවා තබාගැනීම – අවුරුදු පහක සාරාංශය**

| | සේවකයන් ගණන | | | | |
|---|---|---|---|---|---|
| විස්තරය | **2018/19** | 2017/18 | 2016/17 | 2015/16 | 2014/15 |
| මාතෘ නිවාඩු සඳහා හිමිකම් | **542** | 485 | 475 | 422 | 354 |
| මාතෘ නිවාඩු මත සිටින්නන් | **47** | 46 | 28 | 24 | 33 |
| මාතෘ නිවාඩුවලින් පසු නැවත සේවයට වාර්තා කිරීම | **37** | 35 | 18 | 18 | 26 |
| මාතෘ නිවාඩු පැමිණීමෙන් පසු පසුගිය මාස 12 සඳහා සේවයේ රැඳවීම | **23** | 20 | 18 | 24 | 28 |
| මාතෘ නිවාඩුවලින් පසු රඳවා ගැනීමේ අනුපාතය (%) | **50.00** | 71.40 | 75.00 | 72.73 | 96.55 |

### හොඳම ආයතනික ව්‍යුහයක් පවත්වා ගැනීම

අපගේ ආයතනික ප්‍රතිව්‍යුහගතකරණය සැලසුම්කර ඇත්තේ සමාගම තුළ ධූරාවලීන්ගේ බලපෑම අවම කිරීම සඳහාවන අතර ඒ වෙනුවට අපි අනාගතය වෙත වේගයෙන් ඉදිරියට යන විට සහයෝගීතාවය සහ ඵලදායී සංවාදයක් දිරිමත් කරන්නෙමු. අපගේ නව සංවිධාන ව්‍යුහය සමඟ ව්‍යතිරේකයට වඩා සහයෝගීතාවය සහ විවෘත සන්නිවේදනය සම්මතයක්වන සංස්කෘතියක් පවත්නා ගැනීමට අපට හැකිවන අතර මිනිසුන්ට වටිනාකමක්, ඇහුම්කන්දීම හා නිරතවීම දුනේ. ප්‍රගතිශීලී දෘෂ්ඨිය යනු නව බඳවාගැනීම් සඳහා සමාගමේ ආකර්ශණීය ලක්ෂණයකි.

පීපල්ස් ලීසිං වන අපගේ ආයතනික ව්‍යුහය සමාගම තුළ නවෝත්පාදන හා සංවර්ධනය සඳහා අපගේ පුද්ගලයින් සමග කාර්‍ය සාධනය මත පදනම් වූ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම දිගටම කරගෙන යයි. වැඩිදියුණු කිරීම සඳහා සේවක යෝජනා දිරිමත් කිරීම මෙන්ම අගය කිරීම උපායමාර්ගික සැලැස්මේ ස්වරූපයෙන් දැනටමත් ක්‍රියාත්මක කරඇත. පසුගිය දශක දෙක තුළ ගොඩනගා ඇති දැනුම සංස්කෘතිය අපගේ සේවක සේවිකාවන්ගේ අත්දැකීම් පෝෂණය කරයි. ඔවුන් තෝරාගත් ක්ෂේත්‍රයන්හි වෘත්තීමය වශයෙන් දියුණුවේ. කර්මාන්තයේ සුවිශේෂී තරගකාරී වාසියක් අපට ලබාදෙන්නේ මෙම සාරධර්මයි.

අපගේ සේවක රඳවා ගැනීමේ අනුපාතය 88.85% න් පැහැදිළිව පෙන්නුම් කරන්නේ වඩා පළපුරුද්ද සහ දැනුමක් ඇති පුද්ගලයින් රඳවා තබාගැනීම තුළින් ගනුදෙනුකරුවන්ට ඉහල සේවයක් ලබා දිය හැකි බවයි.

GRI 401-1

### අවශ්‍ය අවස්ථාවලදී බඳවා ගැනීම් සිදු කිරීම

සමාගම තුළ උසස්වීම් සහ පුරප්පාඩු සඳහා අපි සෑම විටම අභ්‍යන්තර අපේක්ෂකයින්ට ප්‍රමුඛත්වය දෙමු. කෙසේ වෙතත්, නව දැනුම හා විශේෂඥතාව අවශ්‍ය වන විට, අප අපගේ නිෂ්පාදන හා සේවාවන් විවිධාංගීකරණය කර නව පාරිභෝගික කොටස් ගවේෂණය කරන විට, සමාගමේ සංස්කෘතිය වඩාත් සුදුසු කුසලතා ඇති අය බඳවා ගැනීමට කටයුතු කරන්නෙමු.

අපගේ නව ආයතනික ව්‍යුහය වෙළඳපොළ තුළ අපගේ නායකත්ව තත්වය පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා අපට අවශ්‍ය භූමිකාවන් පිළිබඳ පැහැදිළි දැක්මක් සපයයි. අවශ්‍ය කුසලතා ආකර්ශණය කර ගැනීම සඳහා අවශ්‍ය කුසලතා හා සුදුසුකම් පිළිබඳ හොඳ විනිශ්චය මෙන්ම අපගේ සංස්කෘතියට ගැලපෙන පෞරුෂත්වයන් අතර පරිපූර්ණ සමතුලිතතාවයක් අවශ්‍ය වේ.

### වයස් කාණ්ඩ අනුව සේවකයින් බඳවා ගැනීම



# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම <<

**පළාත හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවකයින් බඳවා ගැනීම**

| | 2018/19 | | | 2017/18 | | |
|---|---|---|---|---|---|---|
| කලාපය | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
| බස්නාහිර පළාත | **151** | **49** | **200** | 77 | 32 | 109 |
| මධ්‍යම පළාත | **38** | **8** | **46** | 12 | 2 | 14 |
| නැගෙනහිර පළාත | **37** | **5** | **42** | 20 | 4 | 24 |
| උතුරු පළාත | **19** | **3** | **22** | 6 | 1 | 7 |
| දකුණු පළාත | **45** | **21** | **66** | 17 | 6 | 23 |
| සබරගමුව පළාත | **24** | **4** | **28** | 20 | 4 | 24 |
| උතුරු මැද පළාත | **19** | **6** | **25** | 11 | 2 | 13 |
| වයඹ පළාත | **33** | **6** | **39** | 14 | 1 | 15 |
| ඌව පළාත | **22** | **2** | **24** | 8 | 3 | 11 |
| **එකතුව** | **388** | **104** | **492** | 185 | 55 | 240 |

### පළාත අනුව සේවක බඳවා ගැනීම




සමාගමේ නව ආයතනික ව්‍යුහය සහ අවශ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ පැහැදිලි දැක්ම හේතුවෙන් බඳවා ගැනීමේ සංඛ්‍යාව වසරින් වසර 105% කින් ඉහළ ගොස් තිබේ.

GRI 102-16 GRI 102-17

### නව බඳවා ගැනීම් අපේ සංස්කෘතියට ගලපා ගැනීම

සියළුම නව බඳවා ගැනීම් සඳහා සමාගමේ මෙහෙයුම් ක්‍රියාවලීන්, පද්ධති, සංස්කෘතිය, සාරධර්ම සහ ආචාර ධර්ම පිළිබඳව හුරු පුරුදු කිරීම සඳහා නිර්මාණයකර ඇති සවිස්තරාත්මක ප්‍රේරණ වැඩසටහනක් අනුගමනය කිරීම අනිවාර්ය වේ. අපගේ "සේවක අත්පොත්" අතිරේක මග පෙන්වීමක් සපයයි.

ප්‍රේරණය සම්පූර්ණ කිරීමෙන් පසු, බඳවාගත් සේවකයනට පහත කරුණු පිළිබඳ මනා අවබෝධයක් බලාපොරොත්තුවේ.

- සමාගම් පැතිකඩ
- සංවිධාන ව්‍යූහය
- මානව සම්පත් ප්‍රතිපත්තිය
- ඔවුන්ගේ තනි කාර්ය භාරයන් සහ වගකීම්
- තොරතුරු තාක්ෂණ පද්ධති
- සමාගමේ ප්‍රතිපත්ති සහ භාවිතයන්
- අනුබද්ධ මෙහෙයුම් පිළිබඳ කෙටි දළ විශ්ලේෂණ

ඵලදායි ප්‍රේරණ වැඩසටහනක්, පුහුණු කිරීමක් සහ උපදේශණයක් තුළින් සමාගමේ ආයතනික දැනුම සෑම මට්ටමකින්ම අලුතින් බඳවා ගන්නා අයට ලබා දෙන බවට අපි සහතික වෙමු. එවිට පීපල්ස් ලීසිං සෑම විටම අනාගතයට ගැලපේ.

### දක්ෂ, නියැලී සිටින සහ පෙළඹ වූ කණ්ඩායමක් ගොඩනැගීම

වෘත්තීය සංවර්ධනය සහ වෘත්තීය ප්‍රගතිය සේවකයින්ගේ සහභාගීත්වය සඳහා ප්‍රබල පෙළඹවීමක් සපයයි. ආයතනික අරමුණු හා අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා සේවක සංවර්ධනය අත්‍යවශ්‍ය වන අතර එය දිගුකාලීන ආයෝජනයක් ලෙසද අපි සලකන්නෙමු. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අපි සේවක සංවර්ධනය සඳහා රුපියල් මිලියන 27.09 ක අයවැයක් වෙන් කළෙමු. අපි නව පාරිභෝගික කොටස් ගවේෂණයකර අපගේ නිෂ්පාදන හා සේවාවන් විවිධාංගීකරණය කරන විට, ධාරිතා වර්ධනය ඉතා වැදගත්වේ.

පුහුණු අවශ්‍යතා වාර්ෂික කාර්ය සාධන ඇගයීම්වලදී සහ සමහර විට අවශ්‍යතා මත රේඛීය කළමනාකරුවන් විසින් හඳුනා ගනු ලැබේ. බහු නිපුණතා ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම සඳහා නම් කරන ලද සේවකයින් අධීක්ෂකවරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ශාඛා කළමනාකරුවන් අතර බෙදා ගැනේ. මෙම ක්‍රියාවලියට රැකියා භ්‍රමණය ද, රැකියාව හා රැකියාවෙන් බැහැර වීමද ඇතුළත්වේ.

සෑම පුහුණු වැඩසටහනක් අවසානයේම නිපුණතා වැඩිදියුණු කිරීමට අදාළ ප්‍රතිඵල ඇගයීමට සහ ආයෝජනවලින් ලැබෙන ප්‍රතිලාභ තක්සේරු කිරීමට ඇගයීමක් සිදු කරනු ලැබේ.

අවශ්‍ය දැනුම හා විශ්වාසය ලබා ගැනීම, කුසලතා හා කාර්යසාධන අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම සහ අනාගත අභියෝගයන්ට මුහුණදීම සඳහා අවශ්‍ය අත්දැකීම් ලබා ගැනීම සඳහා තෝරාගත් වෘත්තීය ආයතනවලට සහභාගීවීම සඳහා කළමණාකරුවන් විසින් සේවකයින් නම් කරනු ලැබේ.
සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා සමාගම රුපියල් මිලියන 1.4 කට වඩා ආයෝජනයකර ඇත. මීට අමතරව අදාළ ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය සම්පූර්ණ කිරීම සඳහා ද ප්‍රතිපූරණය කරනු ලැබේ.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## >> ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

GRI 404-1 GRI 404-2

### පුහුණු පැය ගණන සහ ආයෝජනය

මානව සම්පත් අංශයෙහි මුඛ්‍යාර්ථ ඉලක්ක අතර පුහුණුව හා සංවර්ධනය තුළින්, වඩාත් ව්‍යාපාරය කේන්ද්‍රීය කරගත් හා අභිප්‍රේරණය වූ කණ්ඩායමක් නිර්මාණය කිරීම එක් ඉලක්කයක් වනු ඇත. සමාලෝචිත වර්ෂය තුළ පුහුණු කිරීමේ පැය ප්‍රමාණයන් දැඩි ලෙස ඒකාකාරී වීමක් දක්නට ලැබෙන අතර සමාගම සම්බන්ධයෙන් වූ පසුගිය වර්ෂයේ ආයෝජනය වන රුපියල් මිලියන 17.21 හා සාපේක්ෂව ප්‍රවර්ධන වර්ෂයේ ඒ සඳහා වූ ආයෝජනය රු. මිලියන 12.93 ක් වීම අභ්‍යන්තර පුහුණු කිරීමේ පැය ගණන කෙරෙහි සමාගම අවධානය යොමු කිරීමේ ප්‍රතිඵලයකි. වර්ෂය තුල වඩාත් යෝග්‍ය වූ පුහුණු අවස්ථා සේවකයින්ට යොමු කිරීම එහි ඉලක්කය විය.

සේවක පුහුණුව හා සංවර්ධනය ආවරණය කරන විෂය පරාසය තුළ -

- නිෂ්පාදන දැනුම
- පද්ධතීන් හා ක්‍රියාවලීන්
- මෙහෙයුම්
- මූල්‍ය
- තොරතුරු තාක්ෂණය හා ලේඛන නිපුණතාවය
- අලෙවිකරණ විමර්ශනය හා විශ්ලේෂණය
- ගැටළු නිරාකරණය හා තීරණ ගැනීම
- ණය සහ පාරිභෝගික ඇගයීම
- නව ව්‍යාපාර යෝජනා පිලියෙල කිරීම
- කාර්යාල කළමනාකරණය හා සේවක මණ්ඩල මෙහෙයවීම
- නායකත්ව නිපුණතාවය හා තීරණ ගැනීම
- ඉදිරිපත් කිරීමේ සහ සන්නිවේදන නිපුණතාවය
- පාරිභෝගික සේවාව

ඊට අතිරේකව සේවකයින් ලබාගනු ලබන පිළිගත් වෘත්තීය ආයතන සාමාජිකත්වයන් හා සහතික කිරීම් සඳහා දරනු ලබන ගාස්තු සමාගම විසින් ප්‍රතිපූරණය කරනු ලබයි.

GRI 102-17

### දුක්ගැනවිලි මෙහෙයවීම

ඕනෑම සේවක දුක්ගැනවිල්ලක් සඳහා යොමුවන පරිපූර්ණ යාන්ත්‍රණයක් අප විසින් ස්ථානගත කරනු ලැබේ. සේවක මණ්ඩලයට නිර්නාමිකව හෝ අපගේ කළමනාකරණ දොර විවෘත කිරීමේ ප්‍රතිපත්තිය තුළ ඕනෑම කළමනාකරණ සාමාජිකයෙකු වෙත ඉදිරිපත්වීමේ ඉඩ ප්‍රස්ථාව ලැබී ඇත. සේවකයින්ට උපදෙස් හා නිර්දේශ හෝ ක්ෂණික ක්‍රියාමාර්ගයන් අදාල අවස්ථාවට අනුකූලව ලබාදෙනු ඇත. සදාචාරාත්මක නොවන හා නෛතික නොවන හැසිරීම් සහිත වූ ඕනෑම අයෙකුගේ එමෙන්ම සමීප සුපරීක්ෂකගේ වුවද සෘජුවම මානව සම්පත් ප්‍රධානී හෝ ප්‍රධාන විධායක ඇතුළු සාමූහික කළමනාකරණය වෙත වාර්තා කිරීමට අවස්ථාව ඇත.

**එක් සේවකයෙකු සඳහා වූ සාමාන්‍ය පුහුණු පැය ගණන**

| | ස්ත්‍රී/පුරුෂ භාවය | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | | | | පුහුණුව සේවක මණ්ඩල එකතුව (ඉලක්කම්) | පුහුනු පැය | සාමාන්‍ය (පැය) |
|---|---|---|---|---|---|---|---|---|
| | | අභ්‍යන්තර | බාහිර | විදේශීය | එකතුව | | | |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණය | පිරිමි | 12 | 1 | 1 | 14 | 17 | 366.00 | 10.76 |
| | කාන්තා | 1 | – | – | 1 | 1 | 6.00 | 3.00 |
| රේඛීය කළමනාකරණය | පිරිමි | 37 | 9 | 3 | 49 | 155 | 3,616.00 | 23.95 |
| | කාන්තා | 19 | 5 | – | 24 | 25 | 441.00 | 17.64 |
| විධායක නිළධාරින් | පිරිමි | 56 | 7 | 3 | 66 | 321 | 5,226.50 | 14.05 |
| | කාන්තා | 29 | 6 | – | 35 | 76 | 994.50 | 10.69 |
| විධායක නොවන නිළධාරින් | පිරිමි | 76 | 5 | 2 | 83 | 1,119 | 24,106.00 | 21.31 |
| | කාන්තා | 44 | 7 | – | 51 | 371 | 6,256.50 | 14.90 |
| සුලුසේවක මණ්ඩල | පිරිමි | 16 | – | – | 16 | 23 | 665.00 | 6.72 |
| | කාන්තා | – | – | – | – | – | – | – |
| **එකතුව** | **පිරිමි** | 197 | 22 | 9 | 228 | 1,635 | 33,979.50 | 19.01 |
| | **කාන්තා** | 93 | 18 | – | 111 | 473 | 7,698.00 | 14.20 |
| **මුලු එකතුව** | **පිරිමි +කාන්තා** | 290 | 40 | 9 | 339 | 2,108 | 41,677.50 | 17.90 |

පසුගිය වසරේ 1,727 ක් වූ සේවක සංඛ්‍යාවට සාපේක්ෂව මෙම වසරේ 2,108 ක් වූ සේවක ප්‍රමාණයක් පුහුණු සැසි වලට සහභාගී විය.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## ව්‍යාපාරික ක්‍රියාවලියේ විශිෂ්ටත්වයක් ළඟාකර ගැනීම <<

අපගේ විස්ල්-බ්ලෝවර් ප්‍රතිපත්තිය කළමනාකරණය කරනු ලබන්නේ අභ්‍යන්තර විගණනය මගිනි.

### සේවකයින් සම්බන්ධ කර ගැනීම

වර්ෂය තුළ, අපගේ සේවකයන් තවදුරටත් පෙළඹවීම සඳහා අපි පහත සඳහන් පියවරයන් කෙරෙහි අවධානය යොමු කළෙමු.

- ඉලක්ක පදනම් කරගත් දිරිගැන්වීම් සහ දීමනා හඳුන්වා දීම
- කළමනාකරණ මට්ටමේ සේවකයින්ගේ වරප්‍රසාදවල සමහර දීමනා සඳහා ගැලපීම්
- වාහන ණය සීමාවන් සංශෝධනය කිරීම
- වාහන නඩත්තුව හඳුන්වාදීම
- ශ්‍රේණිය මත පදනම්ව දුරකතන දීමනාවක් හඳුන්වා දීම
- පවත්වා රක්ෂණ ප්‍රතිලාභ සංශෝධනය කිරීම

ඉදිරියට යමින් අපගේ උපායමාර්ගික ප්‍රමුඛතා අතර මූලාශ්‍ර සැපයීම, ව්‍යාපාරයට අදාළ පුහුණුව හා සංවර්ධනය සැපයීම සහ සේවකයින්ගේ සංවර්ධනය ඇතුළත් වේ. අපගේ ප්‍රධාන අවධානය අඛණ්ඩව සමාගම පුරා කාර්ය සාධනය මත පදනම්වූ සංස්කෘතියක් නිර්මාණය කිරීම වනු ඇත. අපගේ මානව සම්පත් අංශය උපායමාර්ගික ව්‍යාපාර තීරණවලට සහය වීම සඳහා කළමනාකාරිත්වයට විශ්ලේෂණය ලබා දෙනු ඇති අතර, ව්‍යාපාර සදහා තීරණාත්මක කාර්යභාරයන් සඳහා අනුප්‍රාප්තික සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කරන කළමනාකරණ සංවර්ධන වැඩසටහනකට පහසුකම් සපයයි.

මෙම වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද අනෙකුත් සේවක නියුක්ත වීමේ අභිප්‍රායන් ඇතුළත් වේ.

- සේවකයින්ගේ පෞද්ගලිකත්වය දිරිගැන්වීම සඳහා සිකුරාදා දින ඇඳුම් ලබාදීම
- සේවා - ජීවන සමතුලනය කිරීම සඳහා අනිවාර්ය වාර්ෂික නිවාඩු
- විතත පවුල් සාමාජිකයින් සඳහා පුළුල් රක්ෂණ ප්‍රතිලාභ
- සෑම නව සේවකයෙකු සඳහාම පුළුල් ප්‍රේරණ වැඩසටහන
- නිවාඩු නිකේතන සහ සේවා - ජීවන සමතුලනය සඳහා වාර්ෂික දෙපාර්තමෙන්තු චාරිකා
- සෞඛ්‍ය සහ යහපැවැත්ම සඳහා ව්‍යායාම් මධ්‍යස්ථාන සාමාජිකත්වය

### ඉදිරි දැක්ම

ඉදිරියට ගමන් කිරීමේදී, සමාගම සඳහා නිවැරදි කුසලතා ලබා ගැනීම කෙරෙහි අප දිගටම අවධානය යොමු කළ යුතුය. අපගේ වර්තමාන ප්‍රතිපත්ති වන්නේ නිවැරදි ආකල්පයක් ඇති පුද්ගලයින් බඳවා ගැනීම සහ සමාගම තුළ අවශ්‍ය භූමිකාවන් පිරවීම සදහා ඔවුන් පුහුණු කිරීමයි. එවැනි කාර්ය මණ්ඩලයක් රඳවා ගැනීමට අපි සෑම උත්සහයක්ම දරන්නෙමු. වර්තමාන සංසන්දනාත්මක පරිසරය තුළ එය පහසු කාර්යයක් නොවේ. අපගේ කර්මාන්තයේ ස්වභාවය අනුව අලෙවිකරණය සහ විකුණුම් භූමිකාවන් හි විශාල සේවක පිරිසක් අපට අවශ්‍ය වන අතර, කාර්යාල රැකියාවලට වැඩි කැමැත්තක් දක්වන තරුණ පරම්පරාව ඒ සඳහා වැඩි වැඩියෙන් ආකර්ශනීය නොවේ.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්



## කාර්යක්ෂම සම්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීම

විවිධ මූලාශ්‍රයන්ගෙන් රැස්කරගත් අරමුදල් නිසි ලෙස බෙදාහැරීම හා කළමනාකරණය කර ගැනීමත් ණය ලබාදීමේ අඛණ්ඩතාව ආරක්ෂා කර ගැනීම සඳහා සුරැකුම් පිළිගැනීමත් ආදී ක්‍රියාවලින් මූල්‍ය ආයතනයක සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමට ඇතුළත් වේ. ණය මුදාහැරීම් සඳහා ඒකරාශී කරගන්නා අරමුදල් සඳහා මූල්‍ය ආයතනයක් වශයෙන් අපහට දැරීමට සිදුවන පිරිවැය, ගනුදෙනුකරුවන්ගේ තැන්පතු මගින් අරමුදල් ඒකරාශී කරන බැංකුවකට සාපේක්ෂව ඉහළ අගයක් ගනී. එබැවින් ණය මුදල් මුදාහැරීමේදී කොටස්හිමියන්ට සාධාරණ ප්‍රතිලාභයක් ලබාදීම පමණක් අරමුණු කර නොගන්නා අතර, ගෙවීම් ශක්‍යතාව හා විශ්වාසනීයත්වයෙන් යුතු ගනුදෙනුකරුවන්ට ණය ලබාදීමට අත්‍යාවශ්‍ය වේ. බොහෝ විට මූල්‍ය ආයතනයකට පිවිසෙනුයේ බැංකුවලට පිවිසීමේ මූල්‍ය ශක්‍යතාවක් හෝ වෙනයම් හේතුවක් මත ඊට පිවිසුම් නොමැති ගනුදෙනුකරුවන් කොටසකි. එබැවින් මූල්‍ය ආයතනයක මෙම ණයදීම් ක්‍රියාවලිය අරමුණ අතර, තුලනයකින් යුතුව පවත්වාගෙන යා යුතු ක්‍රියාවලියකි.

ඉහත තත්ත්වයන් යටතේ පීපල්ස් ලීසිං හා කාර්යසාධනය, එහි ව්‍යාපාර ජනනය කිරීමේ හැකියාව හා පරිමාව, අන්තර් සමාගම් සම්පත් භාවිතා කිරීමේ හැකියාව සහ ණය කළඹහි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ හැකියාවන් අනුව අප ආයතනය මත ඉහළ විශ්වාසනීයත්වයක් තැබිය හැකි බව මනාව පැහැදිලි වේ.

## පාර්ශ්වකරුවන් කෙරෙහි අපගේ බලපෑම

සමාජයට වටිනාකමක් නිර්මාණය කිරීමට සහ පරිසරය ආරක්ෂා කර ගැනීමට හැකිවන පරිද්දෙන් ලාභදායීත්වයක් පවත්වාගෙන යාම

වත්කම් හා වගකීම් කමිටුව (ALCO) ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය ඵලදායී ලෙස හැසිරවීම




අරමුදල් ඵලදායී ලෙස භාවිතා කිරීම සහ මුළු වත්කම්වලින් 89.92% ක ප්‍රතිශතයක් සඳහා ණය මුදා හැරීම

පොලී දරන වගකීම්වල තැන්පතු අනුපාතය 55.60% සිට 65.54% දක්වා වැඩිකිරීම

පාරිභෝගික තැන්පතු (54%) වෙනත් ණය ගැනීම් (29%) සහ කොටස් හිමියන්ගේ කොටස් (17%) සමඟ අරමුදල් ප්‍රභවයක් විවිධාංගීකරණය කිරීම

අනාගත වර්ධන සැලසුම් සඳහා ආධාර කිරීම අරමුණු ඇතිව 2018/19 වර්ෂයේ අවසාන ලාභාංශ ලෙස ගෙවීම් සිදුකිරීම

අරමුදල් කල්පිරීමේ නොගැලපීම් කළමනාකරණය කිරීම සඳහා කෙටිකාලීන ණය දෙන නිෂ්පාදන හඳුන්වාදීම සහ දිගුකාලීන ඉතුරුම් ගිණුම් ප්‍රවර්ධනය කිරීම

විචල්‍ය අනුපාතයන්ට කෙටිකාලීන ණය ගැනීම් අධෛර්යමත් කරන අතරම, පාරිභෝගික තැන්පතු ආකර්ශණය කරගැනීම

## තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය

ඵලදායිතාව ඉහළ නැංවීමට සහ විරැකියා මට්ටම අඩු කිරීමට වෙළෙඳ හා බැංකු කටයුතු සඳහා වන කැපවීම වැඩිකිරීම

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## කාර්යක්ෂම සම්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීම

### → අවදානමට එරෙහි ප්‍රතිලාභ උපරිම කිරීම සඳහා අරමුදල් ඵලදායී ලෙස භාවිතා කිරීම

අවසාන වශයෙන්, තැන්පතු සහ වෙනත් ණය ගැනීම් මෙන්ම නිදහස් ප්‍රාග්ධනය හරහා රැස්කරගත් අරමුදල්, සමාගම විසින් ණය ලෙස ලබාදෙන අතර, ලැබිය යුතු ණය 2019 මාර්තු 31 වන විට (පසුගිය වසරේ 87.23% සහ 96.76% උත්පාදනය කරන ලද) සමස්ත වත්කම්වලින් 87.92% ක් විය. (පසුගිය වසරේ 96.41%) මුළු පොළී ආදායමෙන්, එහි ණය අවදානම සමග, ණය සහ ලැබිය යුතු දේ කළඹෙහි ගුණාත්මකභාවය සමාගමේ අතිරික්ත වත්කම් ගුණාත්මකභාවය පිළිබඳ වැදගත්ම නිර්ණායක වන අතර සමාග මේ ලාභදායීතාවයට සෘජුවම බලපායි. ශුද්ධ පොළී ආදායම සහ හානිකර ගාස්තුව හරහා බැවින් ප්‍රතිලාභ හා අවදානමට එරෙහිව ප්‍රශස්ත කිරීම සඳහා ණය දීමේ ක්‍රියාකාරකම් ඵලදායී ලෙස කළමණාකරනය කිරීමේ අවශ්‍යතාවය පැවතිනි.

### අවදානම් සඳහා අපගේ ප්‍රවේශය හා ප්‍රතිලාභ සමතය

ඓතිහාසිකව, පීපල්ස් ලීසිං පොළී අනුපාත සහ ආන්තිකයන්ට වඩා පරිමාව කෙරෙහි අවධානය යොමු කරමින් සිය ව්‍යාපාරය ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කළේය. කෙසේ වෙතත් ණය අනුපාතිකයන් සහ පාලනයේ අනෙකුත් සාර්ව විචක්ෂණ තීරණ සඳහා LTV නීති පැනවීමේ ප්‍රතිඵලයක් ලෙස, පොළී ආන්තිකයන් වැඩිදියුණු කිරීම සහ එමගින් වැඩි ප්‍රතිලාභ ලබා ගැනීම කෙරෙහි සමාගම අවධානය යොමු කළේය. ඊට අමතරව, නිෂ්පාදන මිශ්‍රණය ප්‍රධාන වශයෙන් ලීසිං ව්‍යාපාරයක සිට වෙනත් ණය දීම් දක්වා වෙනස් විය.

ඉහළ මට්ටමේ බැංකු නොවන මූල්‍ය ආයතනයක් ලෙස සමාගමේ වෙළෙඳපොළ තුළ ස්ථාවරය පවත්වා ගැනීමේ අත්‍යවශ්‍යතාවය පැන නැගුණි. මෙවැනි තත්වයක් තුළදී ආයතනයේ අගය නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට බාදා වීම වැළැක්වීම සඳහා සමාගම අවදානම් කළමනාකරණය කෙරෙහි වැඩි අවදානයක් යොමු කිරීම වැදගත් යැයි හඳුනා ගැනිණි.

මේ සම්බන්ධයෙන් සමාගම, රන් ණය සහ විචල්‍ය අනුපාත ලීසිං සහ ණය වැනි කෙටිකාලීන නිෂ්පාදන කිහිපයක් හඳුන්වා දුන්නේය. අපගේ සියලු ණය දෙන නිෂ්පාදන සඳහා ස්ථාවර අනුපාතයක් ලබාදීමේ පෙර භාවිතයට සාපේක්ෂව විචල්‍ය අනුපාත කල්බදු සහ ණය හඳුන්වාදීම මගින් පොළී අනුපාත අවදානමට නිරාවරණයවීම අවමකර ගැනීමට අපට හැකි විය.

### සාම්ප්‍රදායික අවදානම් පැතිකඩ සහ මධ්‍යස්ථ අවදානම් රුචිය

සමාගමේ අවදානම් රුචිය සැකසීම සඳහා පීපල්ස් ලීසිං අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු අතර එය ක්‍රියාත්මක කිරීමේ වගකීම ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත පැවරේ. මණ්ඩලයේ බලය පවරන ලද අධිකාරිය යටතේ සමාගම තුළ ඵලදායි අවදානම් රුචිකත්ව රාමුවක් ස්ථාපිත කිරීමේ වගකීමද IRMC සතුවේ.

IRMC යනු මණ්ඩල අනුකමිටුවකි. අවදානම් පාලන ව්‍යුහය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ඒකාබද්ධ මට්ටමේ කළමනාකරණ කමිටුවක් ලෙස නැවත ස්ථාපිත කරන ලදී.

සංවිධානයේ අවදානම් ඉවසීමේ මට්ටම් නිරන්තරයෙන් මනිනු ලබන්නේ එක් එක් ප්‍රධාන අවදානම් කාණ්ඩ සඳහා වන ප්‍රධාන කාර්යසාධන දර්ශකවලට එරෙහිවය.

### වත්කම් හා වගකීම්වල සංයුතිය අධීක්ෂණය කිරීම

ප්‍රධාන වශයෙන් ණය සහ ලැබිය යුතු දේවලින් සමන්විත වූ 2019 මාර්තු 31 වන විට (පසුගිය වසරේ 93.09%) සමාගමේ මුළු වත්කම්වලින් 94.75% ක් පොළි උපයන වත්කම් වේ. අනෙක් අතට, ගනුදෙනුකරුවන්ගේ තැන්පතු මගින් ආධිපත්‍යය පොළී දරණ වගකීම් මුළු අරමුදල් වලින් 53.39% ක් (පසුගිය වසරේ 45.75%) විය. සමස්ත අරමුදල් පදනමේ භාරකරුවන්ගෙන් තැන්පතු අනුපාතය මෑත අතීතයේදී ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය කිරීම වැදගත් වන අතර බැංකු ණය ගැනිම් මත යැපීම අඩුවී ඇති අතර මෙහෙයුම්වල සාපේක්ෂව අඩු වියදම් අරමුදල් සඳහා ප්‍රවේශය ලබාදේ.

පසුගිය වසර පහ තුළ පොළී ඉපැයීම් සහ පොළී නොවන ඉපැයීම් සහ පොළී සහ පොළී නොවන වගකීම් සම්බන්ධයෙන් සමාගමේ වත්කම් හා වගකීම්වල සංයුතිය පහත දක්වේ. මෙම කාල සීමාව තුළ උපයන වත්කම් 94% ක් පමණ පවත්වා ගැනීමට අපට හැකිවී තිබේ.

**වරිපනම් හා වගකීම් සංයුතිය - පස් අවුරුදු සාරාංශය**

| වත්කම් | **2018/19 %** | 2017/18 % | 2016/17 % | 2015/16 % | 2014/15 % |
|---|---|---|---|---|---|
| පොළී ඉපැයීම | **94.75** | 93.09 | 94.13 | 93.13 | 94.62 |
| පොළී නොවන ඉපැයීම | **5.25** | 6.91 | 5.87 | 6.87 | 5.38 |
| මුළු | **100.00** | 100.00 | 100.00 | 100.00 | 100.00 |
| වගකීම් | | | | | |
| පොළී | **95.12** | 93.87 | 94.61 | 93.20 | 92.05 |
| පොළී රහිත | **4.88** | 6.13 | 5.39 | 6.80 | 7.95 |
| මුළු | **100.00** | 100.00 | 100.00 | 100.00 | 100.00 |

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## >> කාර්යක්ෂම සම්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීම

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

බලමුලු ගැන්වීමේ ප්‍රතිඵලයක් ලෙස වර්ෂය තුළ ස්ථාවර හා ඉතිරි කිරීමේ තැන්පත්වලින් රුපියල් බිලියන 18.6 ක් වන අතර, පොළී තැන්පතුවල තැන්පතු අනුපාතය 2017/18 දී 55.60% සිට 2019 මාර්තු 31 වන විට 64.54% දක්වා වැඩි කිරීමට සමාගමට හැකි වී තිබේ.

නව ආයෝජනයක් කිරීමට සමාගම සැලසුම් නොකරන අතර දේපළ, උපකරණ සහ අස්පෘශ්‍ය වැනි පොළී නොවන ඉපැයීම් සඳහාද කිරීමට සැලසුම් නොකරයි.

### මුළු වත්කම්වලට සාපේක්ෂව අවදානම් මත බර තැබූ වත්කම්වල සංයුතිය වැඩිදියුණු කිරීම

අලුතින් හඳුන්වා දුන් නිවාස ණය සහ රන් ණය පුළුල් කිරීම වැනි අඩු අවදානම් නිෂ්පාදන නවෝත්පාදනයන් කෙරෙහි පීපල්ස් ලීසිං අවධානය යොමුකිරීම වත්කම් කළඹේ අවදානම් බර කිරීමට හිතකර ලෙස බලපා ඇත.

අඩු අවදානම් මූලාශ්‍රයක් ලෙස සමාගම විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතුවලට එරෙහිව ණය ද අවදානම් බර තැබූ වත්කම් වැඩිදියුණු කිරීම කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇතිකර තිබේ. පහත දැක්වෙන වගුවේ පසුගිය වසර පහ තුළ ස්ථාවර තැන්පතුවලට එරෙහිව ණයවල වර්ධනය දැක්වේ.

### තැන්පතුවලට එරෙහිව ණය වර්ධනය




තවද, සිය අතිරික්ත අරමුදල් ආයෝජනය කරනවිට, සමාගම එවැනි ආයෝජනය ඉහළ ණය ශ්‍රේණිගත කිරීම් සහිත ආයතන වෙත යොමුකිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර එමගින් එම ආයෝජන ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අරමුණු සඳහා අඩු අවදානම් බරක් ලබාගනී.

### වැදගත් අවදානම් කළමනාකරණ තීරණ

අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් වර්ෂය තුළ සමාගම විසින් ගනු ලැබූ වැදගත් තීරණ කිහිපයක් පහත දැක්වේ:

- ශුද්ධ පොළී ආන්තිකය ප්‍රශස්ථ මට්ටමින් පවත්වා ගෙනයාම සහතික කිරීම.
- නියාමන අවශ්‍යතාවන්ට වඩා වත්කම්වල ද්‍රවශීලතාවය පවත්වාගෙන යනු ලැබීය.
- කෙටිකාලීන පහසුකම් අඩුකර ගැනීමට සහ සමාගමේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වැඩි කිරීමට භාවිතා කළ ණයකර නිකුතුවක් හරහා දිගුකාලීන අරමුදල් රැස් කිරීම.
- තෝරාගත් නිෂ්පාදන/තක්සේරු කාණ්ඩ සඳහා සමාගම නතු වීම සීමාකිරීම සඳහා යොදා ගන්නා දැඩි ප්‍රතිසාධන උපායමාර්ග.
- ණය පහසුකම් ප්‍රදානය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වෙනම ණය අංශයක් පිහිටුවන ලදී.
- ණය අයදුම්පත් තක්සේරු කිරීමට ශාඛා කළමනාකරුවන්ට ඇති හැකියාව වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

### → ද්‍රවශීලතාවය කළමනාකරණය කරන අතරම අරමුදල් ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම

ලාභදායී හා දූරදර්ශී මූල්‍ය අතරමැදි හා පරිණත පරිණාමනය මෙන්ම ද්‍රවශීලතාවය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම සඳහා අවම වශයෙන් හැකි පිරිවැයකින් සුරක්ෂිත කළ විවිධාංගීකරණය වූ හා ස්ථාවර අරමුදල් ප්‍රභවයන් පුළුල් ලෙස පාරිභෝගික තැන්පතු (53.39%), වෙනත් ණය ගැනීම් (29.3%) සහ කොටස්හිමියන්ගේ කොටස් (17.28%) 2019 මාර්තු 31 වන විට සමන්විත විය. පොළී වියදම් සඳහා වන අරමුදල් පිරිවැය සමස්ත පොළී ආදායමෙන් 50.74% කි. වර්ෂය (පසුගිය වසරේ 54.30%) දිගු කාලීන අරමුදල් ප්‍රභවයක් දුර්ලභ වන වෙළෙඳපොළක එහි සහයක පොළී අනුපාතය සහ ද්‍රවශීලතා අවදානම සහ පරිණත නොගැලපීම් සමග, අරමුදල් සුරක්ෂිත කිරීමද ශුද්ධ පොළී ආදායම තුළින් සමාගමේ ලාභදායිතාවයට සෘජුවම බලපායි. එබැවින් අරමුදල් ක්‍රියාකාරකම් ඵලදායි ලෙස කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය පවතී.

### ස්ථාවර අරමුදල් ලබාගැනීමේ වැදගත්කම

අරමුදල් සැපයීමේ විවිධත්වයේ අවශ්‍යතාවය සහ ද්‍රවශීලතා අවදානම අවම කිරීම සමාගම විසින් හඳුනාගෙන ඇති අතර එම නිසා විවිධාංගීකරණය වූ අරමුදල් ප්‍රභවයන්ගේ කළඹක් පවත්වාගෙන යයි.

අද වන විට සමාගමේ ප්‍රධාන අරමුදල් ප්‍රභවය වන්නේ තැන්පතුවේ, කෙටිකාලීන බැංකු ණය ගැනීම් මෑත වසරවල දෙවන ස්ථානයට පත් විය. සමාගම බාලවයස්කරුවන් සඳහා ඉතිරි කිරීමේ ගිණුම් දිරිගන්වයි. එය දිගු කාලීන අරමුදල් ප්‍රභවයක් වන අතර අඩු මිළට පොළී ගනුදෙනුකරුවන්ගේ තැන්පතු ආකර්ශණයකර ගැනීම, කෙටි කාලීන ණය ගැනීම්වලින් විචල්‍ය අනුපාතයන්ට මාරු වීම කෙරෙහි අවධානය යොමුකර ඇති අතර එමගින් සමාගමේ සෘණාත්මක බලපෑම් වළක්වා ගැනීමට සමාගමට උපකාරීවී තිබේ. LTV රීතීන් හඳුන්වා දීමත් සමග තරගකරුවන් බවට පත් වූ බැවින් දිගු කාලීන බැංකු ණය ගැනීම් මත රඳා පැවතීම අඩුවී ඇත. වර්තමානයේ බැංකු කල් බදු ප්‍රවර්ධනය කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමාගම තවදුරටත් බැංකුවලින් ලබාගන්නා ණය සඳහා තරගකාරී අනුපාත ලබා නොගනී. එබැවින් පසුගිය වසර දෙක තුළ සමාගමට සිය තැන්පතු පදනම සැළකිය යුතු ලෙස වර්ධනයකර ගැනීමට හැකිවීම වැදගත්ය.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## කාර්යක්ෂම සම්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීම <<

කල් පිරීමේ අසමානතා සහ අරමුදල් හිඟය පියවා ගැනීම සඳහා සමාගම වරින් වර ණයකර නිකුත් කරනුයේ ඒවායේ ස්වභාවය අනුව මධ්‍යම හා දිගුකාලීන අරමුදල් ජනනය වන අතර සමාගමේ ණය කළඹේ කාල සීමාවන්ට වඩා සමීපව ගැලපේ.

### අරමුදල් සහ ද්‍රවශීලතා කළමනාකරණ අරමුණු

අරමුදල් සහ ද්‍රවශීලතා කළමනාකරණයේ දී සමාගමේ ප්‍රධාන අරමුණු අතරට:

- නියාමන අවශ්‍යතා සමග අනුකූලවීම
- පාරිභෝගික තැන්පතු ඉවත්කර ගැනීමට අවශ්‍ය විට ඉඩ සැලසීම
- වෙනත් මුදල් බැඳීම් කාර්‍යක්ෂමව සපුරාලමින් බාධාවකින් තොරව හා සුමටව කටයුතු කිරීමට පහසුකම් සැපයීම
- නියාමන අවශ්‍යතාවයන්ට වඩා දැඩි වන අන්තර් අරමුදල් සහ ද්‍රවශීලතා ඉලක්ක පවත්වා ගැනීම
- ලාභදායීතාවය උපරිම කිරීම සඳහා ප්‍රශස්ථ මට්ටම්වල ද්‍රවශීලතාවය පවත්වා ගැනීම
- ප්‍රශස්ත පිරිවැයකින් අනාගත ව්‍යාප්තිය පුළුල් කිරීම
- ණය ශ්‍රේණිගත කිරීම් සඳහා සහාය වීම

### ප්‍රශස්ථ මට්ටමින් ද්‍රවශීලතාවය පවත්වා ගැනීම

පීපල්ස් ලීසිං එහි අරමුණු සහ වෙළෙඳපොළ ද්‍රවශීලතාවයට බලපාන විවිධ වර්ධනයක් සැලකිල්ලට ගෙන ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වා ගැනීමට කැපවී සිටී. ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය සඳහා වගකීම් පැවරෙන්නේ වත්කම් හා වගකීම් කමිටුව විසිනි. මෙම කමිටුව නියම කරන ලද ප්‍රමිතීන් තුළ එදිනෙදා ද්‍රවශීලතා කළමනාකරණය භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

### අරමුදල් සුරක්ෂිත කිරීම සහ ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීමේදී ALCO හි කාර්යභාරය

ALCO හි පරමාර්ථය වනුයේ පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් සුදුසු වත්කම් හා වගකීම් සම්මිශ්‍රණය කරමින් සමාගම සඳහා වඩාත් සුදුසු උපාය මාර්ග සකස් කිරීමයි.

අනාගතය පිළිබඳ අපේක්ෂාවන් සහ ඇතිවිය හැකි ප්‍රතිවිපාක

- කළඹ මිශ්‍රණය
- ද්‍රවශීලතා කළමනාකරණය
- වත්කම් හා වගකීම් අතර කල්පිරීමේ පරතරය
- ලාභදායීතාවය මත පොළී අනුපාත සංවේදීතාව
- විදේශ විනිමය නිරාවරණය
- ණය දීම සහ තැන්පතු නිෂ්පාදන මිල කිරීම
- පසු - ශේෂ පත්‍ර ක්‍රියාකාරකම්

ව්‍යාපාර ව්‍යාප්තිය සඳහා අරමුදල් ලබා ගැනීම සහතික කිරීම සඳහා මෙන්ම එදිනෙදා මෙහෙයුම් මුදල් ප්‍රවාහ බැඳීම් සපුරාලීම සඳහා සමාගම ප්‍රමාණවත් නොවන උපයෝගීතා පහසුකම් පවත්වාගෙන යයි. මීට අමතරව, සමාගමය මූල්‍ය ආයතන කිහිපයක් සමග අවිනිශ්චිත අරමුදල් සම්පාදනයක් ඇත.

2019 මාර්තු 31 වන විට භාවිතයට නොගත් අරමුදල් පහත පරිදිවේ:

| අරමුදල් වර්ගය | භාවිතයට නොගත් මුදල |
|---|---|
| මුදල් වෙළෙඳපොළ ණය | 5,000 |
| කෙටි කාලීන ණය | 9,885 |
| අයිරා ණය | 2,500 |
| දිගු කාලීන ණය | 2,000 |

ඊට අමතරව, සමාගමේ ශාඛා සහ අනෙකුත් ප්‍රධාන ව්‍යාපාරික ඒකක සඳහා මිලකරණය හෝ පොළී පිරිවැය වෙත් කිරීම ALCO විසින් අධීක්ෂණය කරනු ලැබේ. ALCO විසින් නියම කරනු ලබන වාර්ෂික එලදායි අනුපාතය ශාඛා ජංගම ගිණුම් ශේෂයට අදාළවේ. සමාගම් උපාය මාර්ගයට අනුකූලව එම අනුපාත ස්ථාවර තැන්පතුවල අනුපාතය සමග සංසන්දනය කිරීමට ශාඛා බලාපොරොත්තු වේ.

### වත්කම් කළඹේ සහ අරමුදල් පදනමේ කල්පිරීමේ නොගැලපීම අඩු කිරීම

ගනුදෙනුකරුවන්ගේ තැන්පතු හෝ වෙනත් ආකාරයේ ණය ගැනීම් මගින් බලමුළු ගැන් වූ අරමුදල් ණයට දීමේ සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතුවලට කල් පිරීමේ පරිවර්තනය ඇතුළත් වේ. කෙසේ වෙතත්, වෙළඳපොලේ මධ්‍යම හා දිගු කාලීන අරමුදල් නොමැතිකම, එහි වත්කම් හා වගකීම්වල පරිණතභාවය කළමනාකරණය කිරීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වන පරිවාරක අනුපාතය සමාගමට සැලකිය යුතු අභියෝගයන් මින් මතු කරයි.

මෙම අවදානම්වලට පිළියම් යෙදීම සහ පරිණත නොගැලපීම් කළමනාකරණය කිරීම සඳහා සමාගම විසින් අරමුදල් සම්පාදනය සහ ණය දෙන පැති යන දෙඅංශයෙන්ම නිර්මාණාත්මක අභිප්‍රායන් ලබා ගෙන ඇත. මෑත කාලීනව ප්‍රවර්ධනය කරන අතරම "රත්ණය" සහ "වේගවත් මාර්ග ණය" වැනි කෙටි කාලීන ණය නිෂ්පාදන හඳුන්වා දීම. බාල වයස්කරුවන් සඳහා ඉතිරිකිරීමේ ගිණුම් සහ ණයකර නිකුත් කිරීම් වැනි දිගු කාලීන ඉතිරිකිරීමේ ගිණුම් උදාහරණ වේ.

2019 මාර්තු 31 වන විට සමාගමේ වත්කම් හා වගකීම් පිළිබඳ පරිණතභාවය (වර්තමාන/වර්තමාන නොවන) විශ්ලේෂණය මෙම වාර්තාවේ 336 වන පිටුවේ ඇති මූල්‍ය ප්‍රකාශණ සඳහා 55 වන සටහනෙහි දක්වා ඇත.

### වර්ධනය සහ ලාභදායීතාවය සඳහා ප්‍රාග්ධන කළමනාකරණය කිරීම

ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් මූල්‍ය ආයතනවලට අවම නිරපේක්ෂ මට්ටමක් සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයන් සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටමක් පවත්වා ගෙනයායුතු නීති රීති සහ රෙගුලාසි ප්‍රකාශයට පත් කර ඇත.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්



## >> කාර්යක්ෂම සම්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීම

### ප්‍රාග්ධන කළමනාකරණ පරමාර්ථ

ප්‍රාග්ධන කළමනාකරණයේ සමාගමේ මූලධර්ම අරමුණු අතරට ඇතුළත් වේ.

- නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වීම.
- ලාභදායීතාවය උපරිම කිරීම සඳහා ප්‍රාග්ධන කාර්යක්ෂමව උපයෝජනය සහ එමගින් ආයෝජකයින්ගේ අපේක්ෂාවන් සපුරාලීම.
- නියාමන අවශ්‍යතාවයන්ට වඩා දැඩි අභ්‍යන්තර ප්‍රාග්ධන ඉලක්ක සපුරාලීම.
- අනාගත ව්‍යාපාර පුළුල් කිරීමේ කාර්යයන්ට සහාය වීම.
- ණය ශ්‍රේණිගත කිරීම් පවත්වා ගැනීමට සහාය වීම.
- නව ගිණුම්කරණ ප්‍රමිතිවල බලපෑම අනුකූල අතර බාසල් III ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම.

### සමාගමේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය

2018 ජූලි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි 2018 අංක 3 දරණ මූල්‍ය ව්‍යාපාර පනතේ නියමයන් අනුව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා මට්ටම් සංශෝධනය කරන ලදී, කෙසේ වෙතත්, අභ්‍යන්තර ප්‍රාග්ධන ඉලක්ක මත පදනම්ව, සමාගම අතීතයේ ඉතා පහසුවෙන් ඉහළ මට්ටමේ ප්‍රාග්ධන මට්ටමක් පහත වගුවේ දැක්වෙන පරිදි පවත්වා ගෙනයනු ලැබීය.

| | ස්ථාවර 1 අනුපාතය | | මුළු ප්‍රාග්ධන අනුපාතය | |
|---|---|---|---|---|
| | සමාගම | අවශ්‍යතාවය | සමාගම | අවශ්‍යතාවය |
| **2019 මාර්තු 31** | **14.36** | **6.0** | **15.20** | **10.0** |
| 2018 මාර්තු 31 | 18.38 | 5.0 | 16.46 | 10.0 |
| 2017 මාර්තු 31 | 17.56 | 5.0 | 16.37 | 10.0 |
| 2016 මාර්තු 31 | 19.56 | 5.0 | 20.22 | 10.0 |
| 2015 මාර්තු 31 | 18.14 | 5.0 | 19.04 | 10.0 |

බාසල් III නිර්නායකයන් සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 හි ද අවශ්‍යතා නිසා මූල්‍ය ආයතන වලට ඉහළ මට්ටමේ නියාමන ප්‍රාග්ධනයක් තිබීම අවශ්‍ය වේ. මෙම කර්මාන්තයේ පුළුල් පරාසයක විහිදෙන වාර්තාකරණ අවශ්‍යතාවයන්ට අනුකූලව, මෙම අනුපාත බැංකු නොවන මූල්‍ය අංශයේ මූලික ප්‍රාග ්ධනයට වඩා ඉහළ මට්ටමක පවතින අතර සමස්ත අවදානම් මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත පිළිවෙළින් 9.9% සහ 11.2% බවත් එහි පාර්ශ්වකරුවන්ට දැනුම් දීම සතුටට කරුණකි.

### ලාභාංශ ප්‍රතිපත්තිය

සමාගම පසුගිය වසරවල ස්ථාවර ලාභාංශ ප්‍රතිපත්තියක් පවත්වා ගෙනයන ලදී. කෙසේ වෙතත්, අනාගත වර්ධන සැලසුම් සඳහා අරමුදල් වැඩි වෙමින් පවතින් අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් සමාගම මේ වසරේ සිය ලාභාංශ ප්‍රතිපත්තියට වැදගත් වෙනසක් සිදු කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2018/19 සඳහා ඉදිරි අවසාන ලාභාංශ ගෙවීම කොටස් ලාභාංශයක් ලෙස ගෙවීමට සමාගම සැලසුම්කර ඇති අතර, එහිදී පෙර මෙන් මුදල් පිටතට ගලායාමක් සිදු නොවේ. ඒ හේතුවෙන් තවදුරටත් ප්‍රාග්ධන අරමුදල් ඉහළ යාමක් සිදු වේ.

# නව බඳවා ගැනීම් 492

2017/18 – 240



# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම



## වගකිව යුතු භාරකාරීත්වය මූර්තිමත් කිරීම

පීපල්ස් ලීසිං ආයතනය වසර 22ක් පුරාවට ඉතා වගකීමෙන් හා විශ්වාසනීයත්වයෙන් යුතුව මුල්‍ය සේවා සැපයීම් කාර්යයේ නිරත විය. ව්‍යාපාරය පිළිබඳ උනන්දුවක් දක්වන අපගේ පාර්ශ්වකරුවන්ගේ හා සමාජයීය පරිසරය තුළ යහපත් පරිවර්ථනයක් සිදු කිරීමට අපගේ කැපවීම දිගටම පවත්වාගෙන යන්නෙමු. මිහිතලය හා මිනිසා කෙරෙහි අප සතු වගකිව යුතු භාරකාරීත්වයේ ඇති වැදගත්කම අප දැඩි ලෙස විශ්වාස කරමු. ඒ තුළින් ගනුදෙනුකරුවන්, ව්‍යාපාරික හවුල්කරුවන් ඇතුලු එහි පාර්ශ්වකරුවන්ට, සේවකයන්ට හා ප්‍රාදේශීය ප්‍රජාවන්ට ඔවුන්ගේ යහපැවැත්ම උදෙසා බලපැවැත්වීමට පීපල්ස් ලීසිං ආයතනය සැමවිටම උත්සාහ දරයි. අපගේ අවදානය මූලික වශයෙන් යොමු වී ඇත්තේ අප මෙහෙයුම් ක්‍රියාවලිය තුළින් සෘජුව හා වක්‍රව පරිසරය කෙරෙහි සිදුවන බලපෑම අවම කිරීමයි. අපගේ සමස්ථ වටිනාකම් නිර්මාණය කිරිමේ ක්‍රියාවලියද, එකී අරමුණු කෙරෙහි යොමුව පවතී. තවද, අපගේ උත්සාහයක් කෙරෙහි පරිසර ආරක්ෂණය සඳහා හරිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම ද ඇතුළත් වේ.

## පාර්ශ්වකරුවන් කෙරෙහි අපගේ බලපෑම

ගනුදෙනුකරුවන්ගේ ජීවන ගමන් මගෙහි පුද්ගලික හෝ ව්‍යාපාරික වශයෙන් අත්‍යවශ්‍යතාවයන් නිර්මාණය වන සෑම සන්ධිස්ථානයකටම අවශ්‍ය වන තිරසාර මූල්‍ය විසඳුම් ලබාදීම

වගකීමකින් යුතු මූල්‍ය විසඳුම් හා හරිත මූල්‍ය විසඳුම් ප්‍රවර්ධනය කිරීම

දේශීය ප්‍රජාවන් සහ පරිසරය සවිබල ගැන්වීමට අපගේ සම්පත් විශේෂතාවයන් හා ස්වේච්ඡා සහභාගීත්වය බලමුළු ගැන්වීම

පරිසරය කෙරෙහි අපගේ වක්‍ර බලපෑම අධීක්ෂණය කිරීම සඳහා ණය ලබාදීමේ අප වගකීම සහ තිරසාර මුල්‍ය ප්‍රවර්ධනය කිරීම

අපගේ කාබන් පතුල් සටහන සහ පරිසරයට අපගේ බලපෑම අඩු කිරීම

ආයතනික සමාජ වගකීම් වැඩසටහන් සඳහා අවම ලාභයන් 1% සිට 25% දක්වා ආයෝජනය කිරීම




සදාචාරාත්මක, විවෘත, හා විනිවිදභාවයෙන් යුතු ව්‍යාපාරික පරිසරයක් පවත්වා ගැනීම

ආරක්ෂිත හා විනීතභාවයෙන් සමන්විත සේවා ස්ථානයක් සැපයීම

යහපත් වු ආයතනික පාලන ක්‍රමවේදයක් පවත්වාගෙන යාම

තිරසාර අරමුණු සඳහා කැපවී සිටීම

වගකිව යුතු ආයතනික පුරවැසියෙකු ලෙස අඛණ්ඩව කටයුතු කිරීම

වගකීමෙන් යුතුව කටයුතු කිරීම සහ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් යහපත් සදාචාරාත්මක ව්‍යාපාරික සබඳතා ඇති කර ගැනීම

වටිනාකම් දාමය හරහා වගකිව යුතු මූලාශ්‍ර ප්‍රවර්ධනය කිරීම

## තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය

1 NO POVERTY — තිරසාර රැකියා සැපයීම සහ ඉහළ සංචලතාව ප්‍රවර්ධනය කිරීම තුළින් ආර්ථික වර්ධනයට සහාය වීම

2 ZERO HUNGER — මූල්‍ය සේවා සැපයීම ඇතුලුව කෘෂිකාර්මික නිෂ්පාදනවල සහ කුඩා පරිමාණ ආහාර නිෂ්පාදනයන්ගේ ඵලදායිතාව සහ ආදායම වැඩි කිරීම

3 GOOD HEALTH AND WELL-BEING — සෞඛ්‍ය පද්ධති සඳහා වඩාත් කාර්යක්ෂමව අරමුදල් සැපයීම, සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීම සහ වෛද්‍යවරුන් සඳහා ප්‍රවේශය වැඩි කිරීම

4 QUALITY EDUCATION — අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා ආයෝජන වැඩි කිරීම, ගුරු පුහුණු වැඩමුළු, පාසල් ගොඩනැගීම සහ පාසල්වලට ජල විදුලි ප්‍රවේශය වැඩි දියුණු කිරීම

13 CLIMATE ACTION — පුනර්ජනනීය බලශක්ති සහ විමෝචන අඩු කිරීමට සහ අනුවර්තන උත්සාහයන් වැඩි කිරීමට ගන්නා වෙනත් පියවරක් වෙත ජනතාව යොමු කිරීම

17 PARTNERSHIPS FOR THE GOALS — තිරසාර සංවර්ධන අරමුණු සක්ෂාත් කර ගැනීම සඳහා දැනුම විශේෂ ප්‍රාඥානය, තාක්ෂණය හා මූල්‍ය සම්පත් බලමුලු ගැන්වීම සහ බෙදා හැරීම

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## වගකිව යුතු භාරකාරීත්වය මූර්තිමත් කිරීම

### සදාචාරාත්මක, විවෘත හා විනිවිද පෙනෙන ව්‍යාපාරික පරිසරයක් පවත්වා ගැනීම

අපගේ ව්‍යාපාරයේ තිරසාර බව සහතික කිරීම සඳහා අප අනුගමනය කරන්නේ නීතිමය පසුබිම පමණක් නොව ජය අප තුළ නිතැතින්ම පවතින්නකි. වෙනත් වචන වලින් කිවහොත්, අපගේ සේවකයින්ට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට පැහැදිලිව සන්නිවේදනය කෙරෙන අපගේ තිරසාර මෙහෙවර, මූලික සාරධර්ම, ප්‍රතිපත්ති, තිරසාර උපායමාර්ග සහ රෙගුලාසි මත අපි රඳා සිටිමු. අනාගත පරපුර සහ පෘථිවියේ යහපැවැත්ම සැලකිල්ලට ගනිමින් තිරසාර ව්‍යාපාරයක් නිර්මාණය කිරීමේ අවස්ථාවන් ලෙස අපගේ කාර්‍ය මණ්ඩලයේ කැපවීම සහ කැපවීම මත රඳා පවතින අතර, ඔවුන්ගේ හැකියාවන් නව්‍යකරණයට ලක් කිරීම සහ තිරසාර ව්‍යාපාරයට ඇති අවස්ථාවන් ලෙස පිලිගන්නෙමු.

GRI 102-16

### අපගේ මූලික අගයන්

පීපල්ස් ලීසිං වගකිව යුතු ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා අපගේ සෑම සේවකයෙකුම ඔවුන්ගේ කාර්‍ය භාරය ඉටු කරනු ඇතැයි අපි විශ්වාස කරන අතරම, අපගේ සේවකයින් සමග මූලික සාරධර්ම හයක් අපි හඳුනාගෙන ඇත්තෙමු.

### අපගේ තිරසාර මෙහෙවර

ණය තුළින් ජනතාවගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීම සහ වඩාත්ම අගය කළ සහ විශ්වාසදායක සියල්ල ඇතුළත් මූල්‍ය සේවා සැපයුම්කරු වීම.

### හොඳ ආයතනික පාලන භාවිතයන් පවත්වාගෙන යාම

වඩ වඩාත් දැඩි රෙගුලාසි, අධිකාරිය පිළිබඳ මහජන අභිලාෂය ගැඹුරු කිරීම, අපගේ මෙහෙයුම්වල සංකීර්ණත්වය සහ ජීව ගුණය සහ විවිධාකාර හෝ ගැටුම්කාරී පාර්ශවයන්ගේ ඉල්ලීම් නිසා ව්‍යවස්ථාවන් හොඳ, විනිවිද පෙනෙන පාලන පිළිවෙත් අනුගමනය කිරීම සහ පැහැදිලි මහජන අනාවරණයක් නිකුත් කිරීම අත්‍යවශය වේ. මූල්‍ය සේවා ආයතනයකට වඩා හොඳ ආයතනික පාලනයක් යෙදීම ඊටත් වඩා වැදගත්ය. මූල්‍ය ආයතන වඩාත්ම නියාමනය කරන ලද ආයතනය විය හැක්කේ මේ හේතුව නිසාය. උපායමාර්ගික අරමුණු සපුරාලීමට සහ ඒවාට වටිනාකමක් ලබා දීමට අප උත්සහ කරන විට පීපල්ස් ලීසිං කාර්‍යක්ෂමව හා විනිවිදභාවයෙන් යුතුව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා යහපත් ආයතනික පාලනක බලපෑම පාර්ශ්වකරුවන් අගය කිරීමට පටන් ගෙන තිබේ.

අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් සහ සෑම සේවකයෙකුම ආයතනික පාලන රාමුවක් මත පදනම් වූ තීරණාත්මක කාර්‍යභාරයක් ඉටු කරයි. එය පාලන ව්‍යුහයන්, ක්‍රියාවලීන්, පද්ධති සහ ප්‍රතිපත්ති රාමු ඇතුළත් වන අතර එය යහපාලනයේ පහත දක්වෙන පුළුල් මූලධර්ම මත කේන්ද්‍රගත වී ඇත.

(අ) නීතියට අනුකූල වීම සහ වාණිජමය නීත්‍යානුකූලභාවය

(ආ) සේවකයින්ට සහ ව්‍යාපාරික හවුල්කරුවන්ට සාධාරණ ලෙස සැලකීම

(ඇ) අප ක්‍රියාත්මක වන පරිසරයට සහ ප්‍රජාවට වගකීම

(ඈ) මෙහෙයුම් පරිචයන්හි සම්භාවිතාව, අඛණ්ඩතාවය සහ ව්‍යාපාර ආචාර ධර්ම.

සමාගම තුළ ශක්තිමත් පාලන ව්‍යුහයක් පවත්වාගෙන යාමේ දී වැදගත් කාර්‍යභාරයක් ඉටු කරන අභ්‍යන්තර හා බාහිර වශයෙන් බලපාන සාධක පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර 38 වන පිටුවේ ආයතනික පාලනය බලන්න.



# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## >> වගකිව යුතු භාරකාරීත්වය මූර්තිමත් කිරීම



### අපගේ ව්‍යාපාරික මෙහෙයුම් තුළින් තිරසාරත්වය නිරූපණය කිරීම

පහත දක්වෙන මුඛ්‍ය උත්තෝලන සාධකයන් පීපල්ස් ලීසිං හි ව්‍යාපාරික මෙහෙයුම් හා තිරසාර ව්‍යාපාරයක් ලෙස වූ දැක්ම තුළින් තිරසාරත්වය නිරූපණය කිරීමට අනුබලයක් ලබාදී ඇත.




### තිරසාරත්ව ප්‍රවේශය

තිරසාරත්වය අපගේ සාමූහික මූලෝපායන්හි අන්තර්ගතකර ඇති අතර මූල්‍යමය ප්‍රතිලාභ ඉක්ම වූ අපගේ ක්‍රියාකාරී බලපෑම අගයනු ඇත. අප මනස තුළ වූ කාර්‍යක්ෂමතා වර්ධනය හා ධනාත්මක බලපෑමක් ඇති කරන මූලාරම්භයක් ඉටු කිරීම, මගින් අප දේශීය ප්‍රජාවන් සහ මෙහෙයුම් සඳහා සාමාජීය බලපත්‍රයක් ලබාදීම සහතික කරන පරිසරය කෙරෙහි බලපෑම් කිරීම හා පෝෂණය කිරීම සිදු කරයි.

අපගේ තරගකාරී වාසි මත ගොඩනැගෙන සියලු ව්‍යාපාරික ක්‍රියාවලීන් තුළින් තවදුරටත් ස්ථිර සාරත්වය ඒකාබද්ධ කිරීමේ හැකියාව පිළිබඳ අවබෝධ කරගනිමින් සිටී. දනට ක්‍රියාත්මක වෙමින් පවතින සමාජ පාරිසරික කළමනාකරණ පද්ධතිය (ESMS) සහ මූලික ක්‍රියාකාරිත්ව දර්ශකයන් පිහිටුවීම පාරිසරික සමාජ පාලනය (ESG) සම්බන්ධයෙන් පසු පරීක්ෂාවන් සිදුකිරීමට වඩා හොඳ දිරිගැන්වීමක් සිදු කෙරේ. මෙම මූල්‍යාරම්භයන් කාර්යක්ෂමව හා සංකල්‍ය ක්‍රියාවට නැංවීම්, නියාමනය, සහ පීපල්ස් ලීසිං හි තිරසාර ප්‍රතිඵලයක් ඇගයීම කෙරෙහි දායකත්වය දක්වයි.

අපගේ තිරසාරත්ව ප්‍රවේශය රාමුගත කිරීම, මූලිකත්වය ගනුලබන උනන්දු පාර්ශවයන් සමග වූ වර්ෂ පුරා සහයෝගීත්වය තුළින් සිදුවේ. අප උනන්දුවක් දක්වන පාර්ශව සමග ප්‍රබල සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් ඔවුන් අපේක්ෂා කරන වගකිව හැකි ඒකාබද්ධ පුරවැසියෙකු ලෙස කටයුතු කිරීම කෙරෙහි ප්‍රතිචාර දක්වනු ඇත.

1. **ප්‍රබල පාරිභෝගික සම්බන්ධතාවයන්.**
   ඩිජිටල් පහසුකම් මගින් ශක්තිමත් වූ තිරසාර මූල්‍යමය වටිනාකම් එකතුකල පාරිභෝගික මූලික වූ කාර්යගත කිරීම.
2. **ප්‍රබල ව්‍යාපාරික කොටස්කරු සම්බන්ධතාවයන්**
   උප පාරිභෝගිකයින්ට උපරිම වටිනාකමක් ලබාදීමට ව්‍යාපාරික කොටස්කරුවන් සමග ඇතිකරගෙන ඇති සබඳතාවයන් වඩා හොඳින් පවත්වාගෙන යාම.
3. **ප්‍රබල සේවක සම්බන්ධතාවයන්**
   ආරක්ෂිත, සාමකාමී සහ ප්‍රවර්ධනාත්මක සේවා ස්ථානයක් නිර්මාණය කිරීම.
4. **ප්‍රබල සමාජ සම්බන්ධතාවයන්**
   සාමූහික සමාජීය වගකීම කෙරෙහි යොමුවීම තුළින් සමාජය ශක්තිමත් කිරීම.
5. **ප්‍රබල පාරිසරික සම්බන්ධතාවයන්**
   පරිසර හානීන් සඳහා බලපාන හානිකර භාවිතයන් සහ වගකිව යුතු බැරකම් තුළින් කාලගුණික වෙනස්කම් අවම කිරීම.

GRI 419-1

### උනන්දුවක් දක්වන කණ්ඩායම් හරහා තිරසාරත්වය ඒකාබද්ධ කිරීම

අප මහජනයාගේ ව්‍යාපාරයන්ගේ හා සමාජයන්ගේ මූල්‍යමය සැපපහසුව සැපයීම කෙරෙහි යොමු වූ ව්‍යාපාරයක් බැවින් පීපල්ස් ලීසිං සමාගම හුදු අනුකූලවීමකට සීමා නොවන අතර අපගේ සංස්ථාපිත අපේක්ෂාව සමග වූ කරුණු ඒකාග්‍රවීමක් හා ඒකාබද්ධ කිරීමක්ද වේ.

2018/19 තුළදී සමාජීය හා ආර්ථික සීමාවන් තුළ බලපවත්වන නීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ සිදුවීම් වාර්තා නොවුණි.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## වගකිව යුතු භාරකාරීත්වය මූර්තිමත් කිරීම <<

### අපගේ ගනුදෙනුකරුවන්



අපගේ ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ජීවිතයේ සෑම පෞද්ගලික හා ව්‍යාපාරික සන්ධිස්ථානයක් සඳහාම වගකිය යුතු, සහ තිරසාර මූල්‍ය විසඳුම් ලබාදෙන අතර, ජීවනෝපායන් වැඩිදියුණු කිරීමට සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට අප උපකාරී වන්නෙමු. අපගේ සේවකයින් සංවේදනයෙන්, අව්‍යාජව අපේ ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ මූල්‍ය කළමනාකරණයට සහ ව්‍යාපාර පුළුල් රෙගුලාසි යටතේ ව්‍යාප්ත කිරීමට උපදෙස් දීමට සහ උදව් කිරීමට බලා සිටිති. අපගේ පැමිණීම පුළුල් කිරීමට සහ වැඩි ප්‍රවේශයක් ලබාදීමට අපි නව ක්‍රමයක් සොයමින් සිටිමු. විශේෂයෙන් අපගේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හා ආයතනික ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් දූරදර්ශී මූල්‍ය කළමනාකරණය වෙනුවෙන් අපි පෙනී සිටිමු.

### අපගේ ව්‍යාපාර හවුල්කරුවන්



අපි රටේ නීතියට, කර්මාන්ත නීති රෙගුලාසි සහ ව්‍යාපාර ආචාර ධර්මවලට ගරු කරමු. හොඳ ආයතනික පාලන මූලධර්මවලට අනුකූලව අපගේ මෙහෙයුම් පැවැත්වීම අපි වගකීමෙන් යුතුව කටයුතු කරන අතර තිරසාර වර්ධනයක් සඳහා අපගේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සමාන අදහස් ඇති පුද්ගලයින් සහ ආයතන සමග අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක ව්‍යාපාරික සබඳතා ගොඩනගා ගනිමු.

### අපේ සේවකයින්



අපි ආරක්ෂිත, විනීත හා සියල්ල අන්තර්ගත වැඩ ස්ථානයක් පවත්වාගෙන යන්නෙමු. අපගේ ආචාර ධර්ම පදනම් කරගත් ආයතනික සංස්කෘතියක් පවතින අතර එය අපගේ සේවකයන් ඔවුන්ගේ උපරිමය ලබාදීමට පොළඹවන අතර ඔවුන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම, සෞඛ්‍ය සම්පන්න බව, ජීවිත සමතුලිතතාවය පවත්වා ගැනීම, අඛණ්ඩ පුහුණුව, සංවර්ධනය සහ වෘත්තීය ප්‍රගතිය සඳහා ආයෝජන කිරීමෙන් ඔවුන්ව සවිබල ගන්වයි. තවද අපගේ සේවක මණ්ඩලයේ විවිධත්වය පුළුල් පරාසයකට ගැලපෙන බව සහතික කරමින් දේශීය මූලාශ්‍ර හරහා රැකියා අවස්ථාද අපි ලබා දෙන්නෙමු.

### අපේ ප්‍රාදේශීය ප්‍රජාවන්



සමාජයට අපගේ මෙහෙයුම් බලපෑම අපි තේරුම්ගෙන ඇති අතර ප්‍රාදේශීය ප්‍රජාවන්ට සිදුවන අහිතකර බලපෑම අවම කිරීම සඳහා ක්‍රියාත්මක වෙමු. සමාන අදහස් ඇති ආයතන සමග හවුල් වීමෙන් ප්‍රාදේශීය ප්‍රජාවන් සවිබල ගැන්වීම සඳහා අපි අපගේ සම්පත් විශේෂඥතාව සහ ස්වේච්ඡා ක්‍රියාකාරීත්වය බලමුලු ගන්වමු. අපි ක්‍රියාත්මක වන ප්‍රජාවන්ට අපගේ වගකීම් ඉටු කිරීමෙන් විශ්වාසදායක හා අගය කළ ආයතනික පුරවැසියෙකු වීමට අපි උත්සහ කරමු.

### අපේ පරිසරය



අපගේ මෙහෙයුම්වල ස්වභාවය සමාජයට හෝ පරිසරයට සැලකිය යුතු හෝ සෘජු සෘණාත්මක බලපෑමක් ඇති නොකරයි. එසේ වුවද, වගකීමෙන් යුතුව ණය දීමෙන් සහ තිරසාර ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා අපගේ සම්පත් විශේෂඥතාව සහ අපගේ ජනතාවගේ ස්වෙච්ඡා ක්‍රියාකාරීත්වය අපි බලමුලු ගන්වමු. අපගේ කාබන් පතුල් සටහන නැවත සකස් කිරීම, හරිත මෙහෙයුම් මෙහෙයවීම, තිරසාර මූල්‍ය ප්‍රවර්ධනය කිරීම සහ පරිසරය සංරක්ෂණය කිරීම සඳහා හරිත සංවිධානාත්මක ආයතන සමග හවුල්වීම කෙරෙහි අපි අවධානය යොමු කරමු.

### එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDG) සඳහා කැපවී සිටීම

එක්සත් ජාතීන් විසින් ප්‍රකාශයට පත්කරන ලද තිරසාර සංවර්ධන අරමුණු 17ට අනුබල දීමේදී, අපගේ තිරසාර උපායමාර්ගයට SDGs වල අදාළත්වය සමාලෝචනයකර ඒවා අපගේ තිරසාර රාමුවට අනුගතකර ඇත්තෙමු. ඒ අනුව, අපගේ සේවකයින් ඉලක්ක පිළිබඳව දැනුවත්කර ඇති අතර ප්‍රධාන කාර්‍යසාධන දර්ශක සකසා මැනීම සහ වාර්තා කිරීම කරනු ලැබේ.

### තිරසාර හවුල් වටිනාකමක් ඇතිකිරීම සඳහා ජාතික හා ප්‍රාදේශීය සමාජ ප්‍රමුඛතා ආමන්ත්‍රණය කිරීම

සම්පත් පහත වැටීම හා ගෝලීය උෂ්නත්වය ඉහළයාමේ සිට විරැකියාව දක්වා, පරිභෝජනය ඉහළයාමත් සමග වර්ධනය වන ජනග්‍රහණය ගෝලීය හා දේශීය වශයෙන් ආර්ථික, සමාජීය හා පාරිසරික අභියෝග රාශියකට හේතුවී තිබේ. ජාතියට අපගේ දායකත්වය ලෙස පීපල්ස් ලීසිං ආයතනය මූල්‍ය දායකත්වය ලබාදීමෙන් ආදායම් අසමානතාවය අඩු කිරීමට කැපවී සිටී. එසේ කිරීමේදී අපි පහත දක්වෙන SDGවල දියුණුව සඳහා දායක වෙමු.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## >> වගකිව යුතු භාරකාරීත්වය මූර්තිමත් කිරීම



**එක්සත් ජාතින්ගේ ධරණීය සංවර්ධන ඉලක්ක සඳහා අපගේ ප්‍රධාන පෙළේ දායකත්වය**

**හරවත් (සෘජු)**

1 NO POVERTY

අපි මූල්‍ය සහාය පිරිනමමින් සහ ක්ෂුද්‍ර ව්‍යවසායකයන් සහ කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තයන් වෙත අවතීර්ණ වෙමින් ඔවුන්ගේ ජීවන ගමන සඳහා අවශ්‍ය මූල්‍ය සහාය දීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කර ගැනීමට උපකාරී වන්නෙමු.

8 DECENT WORK AND ECONOMIC GROWTH

අපි අපගේ සේවක සේවිකාවන්ට අභිමානවත් කාර්ය පරිසරයක් සපයනු ලබන අතර ඔවුන්ගේ පුද්ගලිකමය සහ වෘත්තීමය යහපත උදෙසා ආයෝජනය කරන අතර ඔවුනට හොඳ වැටුපක් සහ අනෙකුත් පළ ප්‍රයෝජනයන් ලබා දෙන්නෙමු. අපි අනාගතය සඳහා සූදානම් සුදානම් සේවක බලකා පදනමක් සඳහා ද ආයෝජනය කරන්නෙමු. අපගේ කාර්ය මණ්ඩලය හරහා ප්‍රාදේශීය වශයෙන් රැකියා අවස්ථාවන් නිර්මාණය කරන්නෙමු.

**හර නොවන (සෘජු)**

4 QUALITY EDUCATION

මූල්‍ය සැලසුම්කරණයේ වැදගත්කම සහ ඉතුරුම් අවස්ථාවන් පිළිබඳව අපි අපගේ පාරිභෝගිකයන් දැනුවත් කරන අතර මූල්‍යමය සාක්ෂරතාවය දිරි ගන්වා පොළඹවන්නෙමු. එමෙන්ම සුදුසු අය සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමෙන් , අධ්‍යාපන සේවා සපයන්නන්ගේ ගුණාත්මකභාවය දියුණු කිරීමෙන්, අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කිරීම මගින් අපි පූර්ව - ළමා සංවර්ධනය, පාසැල් අධ්‍යාපනය සඳහා උදව් උපකාර කරන්නෙමු.

17 PARTNERSHIPS FOR THE GOALS

අපගේ සංගත සමාජ වගකීම ඉටු කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය යටතේ මූල්‍ය පහසුකම් සැලසීම සහ සමාජ කණ්ඩායම් කරා ළඟා වීම සඳහා අපි රාජ්‍ය ආයතන සමග, රාජ්‍ය නොවන ආයතන සමග, සංස්ථාගත සමාගම් සමග, සමාජ - පදනම්ගත සංවිධානයන් සමග සහ වෙනත් සංවිධානයන් සමග හවුල්කරුවන් සේ කටයුතු කරන්නෙමු.

**හරවත් (සෘජු නොවන)**

2 ZERO HUNGER

ක්ෂුද්‍ර ව්‍යවසායකයන් සහ කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තයන් වෙත අවතීරණ වෙමින් ඔවුන්ගේ ජීවනෝපායන් වැඩිදියුණු කර ගැනීමට මූල්‍ය පහසුකම් සඳහා අවතීරණ වීමට පහසුකම් සලසමින් අපි ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරන්නෙමු.

10 REDUCED INEQUALITIES

අපගේ පාරිභෝගිකයන්ට සහ ඉලක්කගත ව්‍යාපෘතින් සඳහා සේවා සපයන විට මූල්‍ය උපදේශන තුළින් මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කරමින් සහ මූල්‍ය සහායක වැඩපිළිවෙළවල් මගින් සහාය ලබා දෙමින් අපගේ ශාඛා ජාලය සහ ආංකිතමය වේදිකාව හරහා දිවයින පුරා අපගේ මෙහෙයුම් පිය සටහන් වැඩිදියුණු කිරීම අපි දිගටම කරගෙන යන්නෙමු.

13 CLIMATE ACTION

දේශගුණ - මිත්‍රශීලී විකල්පයන් සමග අපගේ පාරිභෝගිකයන්ට හරිත නිෂ්පාදනයන් අපි පිරිනමනු ලබන්නෙමු. මේවාට අඩංගු වන්නේ පරිසර හිතකාමී හරිත වාහන දිරි ගන්වන කල්බදු පහසුකම් සහ පරිසර හිතකාමී ව්‍යාපාර දිරිගන්වන කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා ඊ-මිත්‍රත්ව 2 අ සහනදායක ණය මාලාවන් වේ. හරිතාගාර වායු විමෝචනය සහ ගෝලීය උෂ්ණත්වය අවම කෙරෙන අඩු මට්ටමේ කාබන් පියසටහන් ගස් සිටුවීමේ ආරම්භකත්වය සඳහා අපගේ දායකත්වය මේ සම්බන්ධ අපගේ කැපවීමේ ප්‍රතිපල වන්නේය.

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

අවම කඩදාසි සහ බලශක්ති භාවිතය සඳහා වන ආංකිත මූල්‍ය සේවාවන් සඳහා සහ හරිත තාක්ෂණය සඳහා ආයෝජනය කිරීම අපි අඛණ්ඩව කරගෙන යන්නෙමු. ඵලදායි නොවන කඩදාසි භාවිතයෙන් යුතු කාර්ය භාරයන් අපි බැහැර කොට ඇති අතර සුපුරුදු කසල සහ විද්‍යුත් කසල වගකිව යුතු ආකාරයෙන් බැහැර කරන්නෙමු.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## වගකිව යුතු භාරකාරීත්වය මූර්තිමත් කිරීම <<

### ආයතනික සමාජ වගකීම් සඳහා අපගේ උපායමාර්ගය

අපගේ තිරසාර ප්‍රතිපත්තියෙන් මග පෙන්වනු ලබන, පීපල්ස් ලීසිං කැපවී ඇත්තේ අපගේ ආයතනික සමාජ වගකීම් තුළින් මූල්‍යමය වශයෙන් ඔබ්බට ගොස් ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ ජීවිත ස්පර්ශ කිරීමටය. වටිනාකම් නිර්මාණය කරන අතරම ව්‍යාපාර සාර්ථකත්වය ළඟාකර ගැනීම සඳහා අපි අපගේ ව්‍යාපාරික සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා අපි අපගේ ව්‍යාපාරික අරමුණු සමාජ හා පාරිසරික සළකා බැලීම් සමග CRS DGM අලෙවිකරණය විසින් අධීක්ෂණය කරනු ලැබේ.

අපගේ තිරසාර රාජ්‍ය මෙහෙයුම් කමිටුව, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ අදාළ ක්‍රියාකාරී හා මෙහෙයුම් ප්‍රධානීන්, තිරසාර කාර්‍ය සාධනය සමාලෝචනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලද පීපල්ස් ලීසිංහි කෙටි කාලීන හා මධ්‍ය කාලීන අරමුණු හා ආයතනික සමාජ වගකීම් සම්බන්ධ ඉලක්ක සපුරාගැනීම සහතික කිරීමේ වගකීම ඔවුන් වෙත පවරා ඇත.

### ආයතනික සමාජ වගකීම් ආයතනීකරණය

ආයතනික සමාජ වගකීම් කාර්‍යසාධනය පූර්ණ කාලීන කාර්‍ය මණ්ඩල සාමාජිකයින් හතර දෙනෙකුගෙන් සමන්විත ආයතනික සමාජ වගකීම් දෙපාර්තමේන්තුව ලෙස ආයතනීකරණයකර ඇත. කලාපීය වශයෙන් මෙම මූලාරම්භයන් මෙහෙයවනු ලබන්නේ අපගේ ශාඛා ජාලයේ ප්‍රධානීන් විසිනි. ආයතනික සමාජ වගකීම්/තිරසාර මුලපිරීම් සමාගම තුළ ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා පීපල්ස් ලීසිං ඵලදායී අභ්‍යන්තර පද්ධති සහ ක්‍රියාවලීන් සුරක්ෂිතකර ඇත.

**ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරීත්වයේ සංවිධාන ව්‍යුහය**




අධීක්ෂණය සහ ඇගයීම ශාඛා මට්ටමින්, මධ්‍යගතව සහ තෙවන පාර්ශවයන්ගේ ස්වාධීන බලපෑම් ඇගයීම මගින් සිදුවිය. මෙම මූලාරම්භයන්හි සාර්ථකත්වයට තීරණාත්මක වන්නේ ශාඛා ජාලය හරහා සේවකයින්ගේ නිර්මාණශීලීත්වය, කුසලතා සහ ක්‍රියාකාරී ස්වේච්ඡා සේවයයි. මෙම මුලපිරීම් ඉහළ නැංවීම සහ දිවයින පුරා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අපි ආයතනික හවුල්කාරීත්වයක් ගොඩනගමු.

GRI 203-1 GRI 203-2 GRI 413-1 GRI 413-2

### ආයතනික සමාජ වගකීම් සඳහා ආයෝජනය කිරීම

වගකිව යුතු මූල්‍ය සේවා සැපයුම්කරුවෙකු ලෙස තිරසාර මූල්‍ය ප්‍රවර්ධනය කිරීමේ අපගේ ප්‍රධාන වගකීම සහ අනාගතයේ අවශ්‍යතාවයන්ට සරිලන අයුරින් ප්‍රජාවේ අවශ්‍යතා සපුරාලීමේදී ධනාත්මක බලපෑමක් ඇති කිරීම සඳහා අපගේ කාර්‍ය භාරය අපි තේරුම් ගනිමු.

ඒ හා සමානව අපගේ ආයතනික පරිපාලන කුසලතා සහ සම්පත් අපගේ ශාඛා ජාලය සහ ප්‍රධාන කාර්‍යාලයේ ආයතනික සමාජ වගකීම් දෙපාර්තමේන්තුව හරහා අපගේ ආයතනික සමාජ වගකීම් මූලාරම්භයන් සඳහා ගෙන එනු ලැබේ. ප්‍රධාන වැඩසටහන්වල බලපෑම සහ මණ්ඩලය වෙත අදාළ මුලපිරීම්වල ප්‍රගතිය පිළිබඳ වාර්තා දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලැබේ.

2014/15 සිට, අපි ශුද්ධ ලාභයෙන් 2.5% ක් ආයතනික සමාජ වගකීම් වැඩසටහන් සඳහා වෙන්කර ඇත්තෙමු. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අපි දේශීය ප්‍රජාවන් හා පරිසරය තුළ මිලියන 122.23ක් වූ අතර එය පෙර වසරේ රුපියල් මිලියන 101.53ක් විය. බදු ගෙවීමෙන් පසු ලාභයෙහි ප්‍රතිශතයක් ලෙස මෙය 2.76% කි. පෙර වර්ෂයේදී ප්‍රතිලාභීන් 161,991 ක් සඳහා 167 සිට ප්‍රතිලාභීන් 62,370 ක් සඳහා ප්‍රජා මූලික වැඩසටහන් 155ක් අප විසින් පවත්වන ලදී. අපගේ සේවකයින්ගේ දායකත්වය පැය 6,693ක් වන අතර එය පෙර වසරේ පැය 5,800 සිට ඉහළය. අප කිසිම දේශපක්ෂ පක්ෂයකට මූල්‍ය දායකත්වයක් ලබාදී නොමැත. ප්‍රාදේශීය ප්‍රජාවන්ට සැළකිව යුතු සත්‍යය හා විභව ඍණාත්මක බලපෑම් ඇති මෙහෙයුම් නොමැත.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## >> වගකිව යුතු භාරකාරීත්වය මූර්තිමත් කිරීම



ආයතනික සමාජ වගකීම් සඳහා අයෝජන ක්‍රියාත්මක කිරීමේ ක්‍රමය අනුව

| ප්‍රාදේශීය වශයෙන් වූ ආයතනික සමාජ වගකීම් මුල පිරීම් | ප්‍රාදේශීය පුණ්‍ය කටයුතු | පුණ්‍ය කටයුතු ආයතනික සමාජ වගකීම් | පුණ්‍යායතන සඳහා ආධාර |
|---|---|---|---|
| ශාඛා ජාලය විසින් රුපියල් මිලියන 30.8 (25%) | ශාඛා ජාලය විසින් රුපියල් මිලියන 30.8 (25%) | අංශය විසින් රුපියල් මිලියන 17.4 (14%) | රුපියල් මිලියන 28.0 (23%) |

| | 2018/19 | 2017/18 |
|---|---|---|
| **සමස්ථ** | | |
| ප්‍රාදේශීය ප්‍රජාවන් සඳහා ආයෝජනය කිරීම් (රුපියල් මිලියන) | **120.29** | 99.33 |
| ප්‍රතිලාභ ලැබූවන් (ගණන) | **Approx. 62,370 reported** | 161,991 |
| **ව්‍යවසාය සංවර්ධනය හා මූල්‍ය සාක්ෂරතා ගොඩනැගීම** | | |
| ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් ගණන | **22** | 4 |
| පුහුණු කළ/අධ්‍යාපනය ලද ව්‍යවසායකයින් ගණන | **1,710** | 207 |
| ව්‍යවසායකත්වය සංවර්ධනය සඳහා කළ මුළු ආයෝජන (රුපියල් මිලියන) | **8.15** | 10.31 |
| **මාර්ග ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම සහ හදිසි අනතුරුවලින් පසු රැකවරණය වැඩිදියුණු කිරීම** | | |
| මාර්ග ආරක්ෂාව සඳහා කළ වැඩසටහන් ගණන | **21** | 5 |
| මාර්ග ආරක්ෂාව පිළිබඳ දැනුවත් කළ පාර්ශවයන් ගණන | **5,500** | 1,636 |
| මාර්ග ආරක්ෂාව වෙනුවෙන් කළ මුළු ආයෝජනය (රුපියල් මිලියන) | **3.83** | 11.95 |
| **අධ්‍යාපනය නංවාලීම සහ මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය සඳහා ආයෝජනය කිරීම** | | |
| මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් ගණන | **118** | 98 |
| මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීමට කළ ආයෝජනය (රුපියල් මිලියන) | **8.73** | 6.34 |
| පාසල් අධ්‍යාපනය නගාසිටුවීම වෙනුවෙන් කළ වැඩසටහන් | **8** | 19 |
| පාසල් අධ්‍යාපනය නගාසිටුවීම වෙනුවෙන් කළ ආයෝජන (රුපියල් මිලියන) | **8.71** | විශේෂයෙන් ගණනය කර නොමැති |
| ශිෂ්‍යත්ව සඳහා කළ ආයෝජන (රුපියල් මිලියන) | **17.99** | 7.55 |
| ශිෂ්‍යත්ව මගින් ප්‍රතිලාභ ලැබූවන් ගණන | **1,077** | 851 |
| අධ්‍යාපනය හා මුල් ළමාවිය සංවර්ධනය සඳහා කල මුළු ආයෝජනය (රුපියල් මිලියන) | **11.94** | 36.24 |
| **ප්‍රාදේශීය ප්‍රජාව සවිබල ගැන්වීම** | | |
| ප්‍රාදේශීය ප්‍රජාවන් සවිබල ගැන්වීම සඳහා කළ වැඩසටහන් ගණන | **43** | 41 |
| සෞඛ්‍ය සේවාවන් සඳහා කළ ආයෝජන (රුපියල් මිලියන) | **27.14** | 15.82 |
| විශේෂිත වූ හැකියාවන් ඇති අය සඳහා කළ ආයෝජන (රුපියල් මිලියන) | **13.82** | 1.45 |
| ආගමික හා සංස්කෘතික උත්සවවලදී ධනාත්මක ප්‍රජා සහභාගිත්වයන් සඳහා කළ ආයෝජන (රුපියල් මිලියන) | **13.49** | 17.34 |

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## වගකිව යුතු භාරකාරීත්වය මූර්තිමත් කිරීම <<

**ආයතනික සමාජ වගකීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය**

01. ප්‍රසිද්ධියේ ලබාගත හැකි සංඛ්‍යා ලේඛණ, ප්‍රකාශිත නැවත සකස් කිරීම සහ මූලික අධ්‍යයනයන් මත පදනම්ව ප්‍රාදේශීය ප්‍රජාවේ උත්සුකයන් සහ සීමාවන් හඳුනා ගැනීම.

02. අදාළ රජය/රාජ්‍ය නොවන/වෙනත් ආයතන සමග සාකච්ඡාකර පාර්ශ්වකරුවන් ඵලදායී ලෙස හඳුනාගෙන ඇති බවට සහතික වීම සහ ආගමික නායකයින්, ප්‍රජා පාදක සංවිධානවල නියෝජිතයින්, පාරිභෝගික යොමු කිරීම් හෝ ප්‍රාදේශීය ප්‍රජාවේ සාමාජිකයින් සමග සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම දක්වා අධීක්ෂණය කිරීම සිදු කෙරේ. අපේ මුළු ආයෝජනයෙන් 70%ක්ම ක්‍රියාත්මක වූයේ දේශීය ප්‍රජා සහභාගීත්වයෙන් ඔවුන්ගේ අපේක්ෂාවන් සහ අවශ්‍යතා තක්සේරු කිරීමෙනි.

03. ප්‍රාදේශීය ප්‍රජාව සහ පරිසරය කෙරෙහි අපගේ මෙහෙයුම්වල බලපෑම තක්සේරු කිරීම සහ වගකිව යුතු ඇතුළත් මූල්‍ය සැපයුම්කරුවෙකු ලෙස සමාජය තුළ ධනාත්මක වෙනසක් ඇතිකළ හැකි හොඳම ආකාරය සහ ප්‍රාදේශීය ප්‍රජාවේ උත්සුකයන් හා සීමාවන් විසඳීම සඳහා අපගේ මූල්‍ය ශක්තිය සහ කාර්‍ය මණ්ඩල ශක්තිය ආයෝජනය කිරීම.

04. උපායමාර්ගික හවුල්කාරිත්වයක් වුවද අපිට සම්පත් ලබාගැනීමට සහ අපගේ මුල පිරීම් ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකි හොඳම ආකාරය ගවේෂණය කරන්න.

05. අපගේ ශාඛා කාර්‍යමණ්ඩලයේ සහ ප්‍රජා නියෝජිතයින්ගේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් පහසුවෙන් කළමනාකරණය කළහැකි ප්‍රදේශයක නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

06. අවශ්‍ය පරිදි තවදුරටත් අභිරුචිකරණය කිරීම සඳහා මුලපිරීම පරිමාණය කරගන්නා සේවක ස්වෙච්ඡා සේවය සමග ක්‍රියාත්මක කිරීම.

07. ප්‍රතිලාභින්, හවුල්කරුවන් සහ ස්වාධීන සමාලෝචකයින්ගෙන් ප්‍රාදේශීය ප්‍රජා පෝෂණය කෙරෙහි ඇති බලපෑම තක්සේරු කිරීම. ප්‍රාදේශීය ප්‍රජාවේ දුක්ගැනවිලි ආයතනික සමාජ වගකීම් දෙපාර්තමේන්තුව විසින් ශාඛා ජාලය හරහා කේන්ද්‍රගතව එකතු කරනු ලබන අතර නව මුලපිරීම් සංවර්ධනය කිරීමේදී නිසි ලෙස සළකා ලබනු ලැබේ.

08. වරින් වර පසු විපරම් කිරීම සමග මුලපිරීම කළමනාකරණය කිරීම හෝ තිරසාර පිටවීමක් සහතික කිරීම.

**2018/19 කාල තුළ වැදගත් යටිතල පහසුකම් ආයෝජන, ප්‍රජා සහභාගීත්වය සහ සේවාවන්**

| | ආරම්භක නම | කාල සීමාව | වියදම් 2018/19 රු. මිලියන |
|---|---|---|---|
| සෞඛ්‍ය සම්පන්න ජනග්‍රහනයක් සඳහා පාලක රෝහල් සහ ඒ ආශ්‍රිත ආයතනවල පාර්ශවීය සත්කාර, සෞඛ්‍ය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීම. | ශ්‍රී ලංකා විකලාංග ශල්‍ය වෛද්‍යවරුන්ගේ සංගමය විසින් දිවයින පුරා විසිරී ඇති අනතුරු වාට්ටු පාලක රෝහලකට අවශ්‍යතා තක්සේරු කිරීම මත පදනම්ව විචේචනාත්මකව අවශ්‍ය විකලාංග ශල්‍ය උපකරණ ඉදිරිපත් කිරීම | අවුරුදු එකයි | 12.15 |
| | කොළඹ ජාතික රෝහලේ හදිසි අනතුරු සේවාව අඛණ්ඩව නවීකරණය කිරීම | 2016 පටන් | 1.51 |
| | රෝගීන්ට ප්‍රතිකාර කිරීම සහ බිළිඳුන්ගේ අපේක්ෂිත මව්වරුන්ගේ රැකවරණය ඉහළ නැංවීම සඳහා කොළඹ කාසල් රෝහල වෙත නවීන එක්ස්කිරණ යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම | මාස 5 | 5.56 |
| | නේවාසික ප්‍රතිකාර ලබාගන්නා මානසික සෞඛ්‍ය ගැටලු ඇති යෞවනයන් සඳහා විනෝදාස්වාදක භූමි අලංකරණය සඳහා මූල්‍ය ආධාර සැපයීම. මුල්ලේරියාව ජාතික මානසික සෞඛ්‍ය ආයතනයේ පුනරුත්තාපන මධ්‍යස්ථානයේ වහල තීරු සකස් කිරීම | මාස 4 | 1.76 |
| | ආබාධිත පුද්ගලයින් 111 දෙනෙකු සඳහා කෘතිම සංචලතා අත් පා ඉදිරිපත් කරන ලදී | මාස 2 | 3.32 |
| | මීගමුව දිස්ත්‍රික් මහ රෝහල සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ ඉදිරිපත් කිරීම | මාස 8 | 1.43 |
| | විවිධාකාර හැකියාවන්ගෙන් යුත් ළමුන් සඳහා පූර්ණ සත්කාර සැපයීම සඳහා පළමු ජාතික විශිෂ්ටතා මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා ශ්‍රී ලංකාවේ ආයති පුණ්‍ය භාරයට මූල්‍ය ආධාර ලබාදීම | සති 1 | 10.00 |

වේතන සහ අනෙකුත් ප්‍රතිලාභ

# රු. බිලියන 3.4

2018 – රු. බිලියන 3.0



# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## වගකිව යුතු භාරකාරීත්වය මූර්තිමත් කිරීම <<

| | ආරම්භක නම | කාල සීමාව | වියදම් 2018/19 රු. මිලියන |
|---|---|---|---|
| නිදන්ගත වකුගඩු රෝග පැතිරීම වළක්වා ගැනීමට ගුණාත්මක ජලය ලබාගැනීම ප්‍රවර්ධනයට ප්‍රජාවට යටිතල පහසුකම් ලබාදීම | නවගත්තේගම, මහියංගනය, මැදවච්චිය ඇතුලු ප්‍රදේශවල ප්‍රජාව සඳහා ගුණාත්මක ජලය ලබාදීමට වකුගඩු රෝග ආසාධනයට නැඹුරු ප්‍රජාමූලිකවල යන්ත්‍රාගාර පිහිටුවීම | නවගත්තේගම එක් මසක්<br>මහියංගනය හා මැදවච්චිය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී | 3.91 |
| දුප්පත්කමින් පීඩා විඳි ප්‍රදේශවල සුභසාධන කටයුතු | බටහිර මුත්තූර් ප්‍රදේශ තුළ ප්‍රජා අවමංගලවලදී භාවිතය සඳහා "ජනස" රථයක් පරිත්‍යාග කිරීම | දැනට ක්‍රියාත්මක වෙමින් පවතී | 2.67 |
| ආපදාවන්ට ලක් වූ ප්‍රදේශ සඳහා සුභසාධනය | රාමදාන් කාලසීමාව තුළදී 1,400 ක් පමණ වූ අවශ්‍යතාවන් සහිත කුටුම්භයන්ට හා අඩු වරප්‍රසාද සහිත ප්‍රදේශවලට ආහාර සලාකයන් හා රෙදිපිලි බෙදා හැරීම. | එක් මසකි | 13.49 |
| | අයහපත් කාලගුණයන්ගෙන් පීඩාවට පත් වූ අයට මූල්‍ය සහන ලබාදීම. | එක් මසකි | 3.0 |
| ප්‍රජාවගේ යහපැවැත්ම | කාත්තන්කුඩි, කන්දකුලිය ප්‍රදේශවල ජීවත් වන 40ක් පමණ වූ අවාසිසහගත කුටුම්භයනට ප්‍රතිලාභ ලැබෙන ලෙස ස්ථිර කැසිකිලි තනාදීමෙන් ඔවුන්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට ඉවහල්වීම | කාත්තන්කුඩි 8 මසකි<br>කන්දකුලිය 5 මසකි | 3.42 |
| රැකියා නිර්මාණ වර්ධනය කිරීම | ජීවනෝපාය ශක්තිමත් කිරීමේ ආරම්භක පියවරක් ලෙස 16 ක් පමණ වූ අවශ්‍යතා සහිත ධීවර පවුල්වල කාන්තාවන්ට විදේශිකයින් සඳහා බතික් ඇඳුම් නිෂ්පාදනය පිළිබඳ පුහුණුවක් ලබාදීමට සහාය විය | 24 දිනකි | 0.45 |
| | දිවයින පුරා විහිදී සිටින ආර්ථික වශයෙන් පීඩාවන්ට පත් වූ කාන්තාවන් සඳහා ප්‍රමිතිගත මැහුම් යන්ත්‍ර 128ක් හා ජුකි මැහුම් යන්ත්‍ර 30 ක් ද ප්‍රදානය කරන ලදී | එක් මසකි | 4.54 |
| පූර්ව ළමාවිය සංවර්ධනය | 122 පමණ වූ යෝග්‍යතාව සහිත පූර්ව ළමා විය මධ්‍යස්ථාන ඉහළ නැංවීම තුළින් වඩාත් මිත්‍රශීලී පූර්ව ඉගෙනුම් අත්දැකීම් ලබාදීමට කටයුතු කර ඇත. | වර්ෂයකි | 8.73 |
| අධ්‍යාපනය ඉහළ නැංවීම | ආර්ථික අපහසුතාවයන්ට මුහුණපා සිටි 853 ක් පමණ වූ පාසල් ළමුන් ප්‍රමාණයකට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම | පූර්ණ කාලීන 53කි සීමාසහිත 800 කි | 12.2 |
| | පුණ්‍ය ආයතනයක් සමග එක්ව අවශ්‍යතා සහිත ශිෂ්‍යයන්ට අධ්‍යාපන කට්ටල 15,000 ප්‍රදානය කිරීම | එක් මසකි | 6.0 |
| | පාත් විද්‍යාපීඨයීය ශ්‍රවණාගාරයට ශ්‍රවණාගාර පුටු ප්‍රදානය | එක් මසකි | 2.63 |
| | පාසැල් 434 ක 5,500 කට වැඩි රථවාහන හැසිරවීමේ කාර්යයේ නියුතු ශිෂ්‍යයන් ප්‍රමාණයකට ප්‍රතිලාභ ලැබෙන පරිදි මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පාසැල් 20 ක රථවාහන හසුරුවන ශිෂ්‍යයින් සඳහා පවත්වන ලදී | එක් අවුරුදු කාල සීමාවක් | 3.00 |

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## >> වගකිව යුතු භාරකාරීත්වය මූර්තිමත් කිරීම

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

### අපගේ අවධානය තියුණු කිරීම

අප ක්‍රියාත්මක වන දේශීය ප්‍රජාවන්ගේ අවශ්‍යතා බොහෝ සහ විවිදාකාරවේ. අපගේ ව්‍යාපාර මෙහෙයුම් සඳහා උපායමාර්ගිකව අදාළ වන ප්‍රමුඛතා ක්ෂේත්‍ර පහක් කෙරෙහි අපි දිගටම අවධානය යොමු කළෙමු:




### ව්‍යවසායකත්ව සංවර්ධනය

ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ කොඳු නාරටිය වුවද, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඔවුන්ගේ දිගුකාලීන වර්ධනයට බාධා පමුණුවන බොහෝ බාධාවන්ට මුහුණදී සිටිති. ඔවුන්ට සහය දක්වීම සඳහා සහ ඒ තුළින් ආර්ථිකයට සහාය වීමට අපි අඛණ්ඩව මුල පිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන්නෙමු.

- පාසැල් අධ්‍යාපනය නිම වූවන්, ගනුදෙනුකරුවන් සහ අඩු ආදායම් නිවැසියන්/ප්‍රදේශීය ප්‍රජාවන්ගෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ව්‍යවසායකත්වය පිළිබඳ පොදු වැඩමුළු
- වෘත්තීය අධ්‍යාපනයේ නියුතු අයට සහ ව්‍යාපාර ආරම්භකයින් සඳහා ශිෂ්‍යත්ව සහ මූල්‍ය ආධාර
- ව්‍යාපාර සැලසුම්, ගිණුම්කරණය සහ බදුකරණය, ව්‍යාපාර ව්‍යාප්තිය සහ නව ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ විශේෂිත වැඩමුළු
- කර්මාන්තය සඳහා විශේෂිත කුසලතා පුහුණුව ලබාදීම සඳහා කලාපීය විශේෂිත වැඩසටහන්

### අධ්‍යාපනය සහ මුල් ළමාවිය සංවර්ධනය

#### අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය නොමිලේ වන අතර, පාසැල්වල බොහෝ සීමාවන් තිබේ.

පහත වැඩසටහන් තුළින් ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු:

- පාසැල් ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම, පිරිසිදු ජලය හා වඩා හොඳ සනීපාරක්ෂාව සහ ක්‍රීඩා උපකරණ, සංගීත භාණ්ඩ සහ ඉගෙනුම් මෙවලම් සැපයීම් ඇතුළු පාසැල් යටිතල පහසුකම් සංවර්ධනය.
- නායකත්වය සන්නිවේදන කුසලතා ඇතුළුව ළමුන් සඳහා දැනුවත් කිරීමේ සැසි.
- ඵලදායි දෙමාපිය දැනුවත් කිරීම සහ පෝෂණය ආවරණය වන දෙමාපියන් සඳහා දැනුවත් කිරීම.

#### මුල් ළමාවියේ සංවර්ධනය

අපේ රටට වඩා හොඳ අනාගතයක් සහතික කිරීම ආරම්භ වන්නේ මුල් ළමාවිය සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමෙනි. අපේ පෙර පාසල් බොහොමයක මූලික ඉගැන්වීම් උපකරණවලට අමතරව හොඳ සනීපාරක්ෂාව සහ පිරිසිදු ජලය වැනි මූලික අවශ්‍යතා නොමැත. අපි අවධානය යොමු කළේ පෙර පාසල් දරුවන් ඔවුන්ගේ දෙමාපියන් සහ ගුරුවරුන්ට ආරක්ෂාව සැපයිය හැකි සහ සහාය විය හැකි මුල පිරීම් කෙරෙහිය.

- පෙර පාසැල් ගුරුවරුන් ක්‍රියාකාරකම් පදනම් කරගත් පාඩම් සැලසුම් කිරීම, සෞන්දර්යාත්මක කුසලතා සහ මනෝවිද්‍යාව පිළිබඳ දැනුවත් කිරීම.
- පෙර පාසැල් දරුවන්ගේ දෙමාපියන්ට ඵලදායී දෙමාපිය පුහුණුව ලබාදීම.
- කලා චිකිත්සාව සහ කතන්දර කීමේ සැසි හරහා පෙර පාසැල් දරුවන් සංවර්ධනය කිරීම.
- ගුණාත්මක මුල් කාලීන ඉගනුම් අත්දැකීමක් ලබාදීම සඳහා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන (පෙර පාසැල්) අලුත්වැඩියා කිරීම.

### මාර්ග ආරක්ෂාව සහ හදිසි අනතුරුවලින් පසු රැකවරණය

මාර්ග අනතුරු සංඛ්‍යාවේ ශීඝ්‍ර වැඩිවීමක් සිදුවී ඇති අතර, පීපල්ස් ලීසිං වගකිය යුතු මාර්ග භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ පශ්චාත් අනතුරු ප්‍රතිකාර හා රැකවරණයෙහි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීම සඳහා අඛණ්ඩව සිදු කරන ලදී.

#### පාසැල් රථවාහන පාලකයන් අතර මාර්ග ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම

2016 සිට අපි පාසැල් ආරක්ෂණ පාලකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටිමු. මෙම වැඩසටහන්වල පරමාර්ථය වන්නේ පාසල් පාදක වූ අනතුරු අවම කිරීම සහ පාසැල් දරුවන්ට ප්‍රථමාධාර පිළිබඳ දැනුම හා ජීවන කුසලතා ලබා දීමයි. දැනුවත් කිරීමේ සැසිවාරයෙන් අනතුරුව පාසැල් රථවාහන පාලන ඒකක ශක්තිමත් කිරීම සඳහා මාර්ග ආරක්ෂණ ආම්පන්න සපයන ලදී. පාසල් 434කින් රථවාහන පාලකයින් 5,500ක් සඳහා වැඩසටහන් 20ක් සම්පූර්ණ කරන ලදී.

#### පශ්චාත් හදිසි ප්‍රතිකාර හා රැකවරණය නංවාලීම සඳහා ආයෝජනය කිරීම

2016 සිට රෝහල් පශ්චාත් හදිසි අනතුරු වැඩිදියුණු කිරීම සඳහා පීපල්ස් ලීසිං කැප වී සිටී. 2018/19 මූල්‍ය වර්ෂය තුළ හදිසි අනතුරුවලින් පසු රැකවරණ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය විකලාංග ශල්‍ය උපකරණ පරිත්‍යාග කරන ලද වැඩසටහනක් අවසන් විය.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## වගකිව යුතු භාරකාරීත්වය මූර්තිමත් කිරීම <<

තවද පීපල්ස් ලීසිං සමාගම කොළඹ ජාතික රෝහල තුළ සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම හා හදිසි අනතුරු අංශය තුළ සුලු සේවකයින් සඳහා විවේක ගැනීමට විවේක කාමර පහසුකම් ලබාදීමට අඛණ්ඩව අයෝජනයන් සිදු කරයි. තවද ළමුන් සඳහා වූ රිජ්වේ ආර්යා රෝහලේ අනතුරු සේවා අංශයේ අළුත්වැඩියා කටයුතු වර්ෂය තුළ සිදු කිරීමට භාරගනු ලැබීය.

### දේශීය ප්‍රජාවන් ශක්තිමත් කිරීම

සෞඛ්‍ය සේවා හෝ වෙනත් පොදු යටිතල පහසුකම් හෝ සේවාවන් සංවර්ධනය කිරීම යන මෙම සේවාවන් අවශ්‍ය වන අපගේ පාරිභෝගිකයින් හා ප්‍රජාවන් සඳහා උපකාරී වන මෙවැනි තව බොහෝ දෑ කිරීමට හැකියාව ඇත. තවද අපගේ මානුෂීය පරිශ්‍රමයන් අහිතකර කාලගුණ තත්ත්වයන් මගින් මහජනතාවට ඇති වන ආපදා අවස්ථාවලදීද උපකාරී වීමට යොදවා ඇත. මෙම උපකාරකය යටතේ අපගේ මුලපිරීම මගින් -

- රජයේ රෝහල් පුනරුත්ථාපනය සහ අත්‍යාවශ්‍ය වෛද්‍ය උපකරණ හා ඖෂධ සැපයීම
- පාරිභෝගිකයින් හා ප්‍රජාව සඳහා ජංගම වෛද්‍ය සේවා පැවැත්වීම (බෝනොවන ලෙඩරෝග, එච්.අයි.වී./ඒඩ්ස්, බරපතල වකුගඩු රෝග ආවරණය කිරීම)
- ආපදා සහන සහ ආපදාවට ලක් වූ පුද්ගලයින් සඳහා අත්‍යාවශ්‍ය භාණ්ඩ හා වියලි සලාක ලබාදීම
- රජයේ රෝහල්වල හා පොදු ස්ථානවලට මල සෞඛ්‍යාරක්ෂිත පහසුකම් ලබාදීම මගින් සෞඛ්‍යතාවය ඉහළ නැංවීම ආවරණය කෙරේ.

### පාරිසරික ආරක්ෂාව

අප එක්සත් ජාතින්ගේ තිරසාර සංවර්ධන ඉලක්කවලට සහයෝගය දැක්වීම සහ අපගේ මෙහෙයුම් තුළින් හරිත ලෝකයක් නිර්මාණය කිරීම කෙරෙහි අපගේ සියලු ප්‍රයත්නයන් දායක කරන අතරම ප්‍රජාවගේ අදහස් සහ සිතුවිලි වෙනස් කිරීම කෙරෙහිද අවධානය යොමු කරයි.

GRI 103-3

### අපගේ පාරිසරික මූලෝපාය

අපගේ ස්ථම්භ 4කින් යුත් පාරිසරික වගකීම් දෙසට නැඹුරු වූ ප්‍රවේශය පහතින් දැක්වේ.

පාරිසරික සංරක්ෂණය සඳහා වූ උපායමාර්ගික ප්‍රමුඛතා

අපගේ කැපවීම



# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## >> වගකිව යුතු භාරකාරීත්වය මූර්තිමත් කිරීම



| මූල්‍ය වර්ෂය | 2018/19 | 2017/18 |
|---|---|---|
| **සමස්ථයක් ලෙස** | | |
| පාරිසරය සම්බන්ධ මූලාරම්භයන් (ප්‍රමාණය) | **31** | 8 |
| පරිසරය සම්බන්ධ ආයෝජනය (රුපියල් මිලියන) | **1.94** | 2.19 |
| ප්‍රතිලාභිකයින් (ප්‍රමාණය) | **2,150** | 3,467 |
| සේවක ස්වේච්ඡා සහභාගිත්වය (පැය) | දළ වශයෙන් පැය 1,075 | 268 |
| **උපස්ථම්භකය 1 අගය දාමය තුළින් හරිත විඥානය ප්‍රවර්ධනය** | | |
| හරිත පුහුණු වැඩසටහන් (ප්‍රමාණය) | **30** | 21 |
| පුහුණු සේවකයින් (ප්‍රමාණය) | දළ වශයෙන් පැය 297 | 41 |
| පුහුණු කළ නව සේවකයින් (ප්‍රමාණය) | **492** | 264 |
| **උපස්ථම්භක 2 පරිසරය සම්බන්ධයන් අපගේ ධනාත්මක සෘජු බලපෑම කළමනාකරණය හා ප්‍රතිපල උපරිමකර ගැනීම** | | |
| ප්‍රතිචක්‍රීය කළ කඩදාසි (කි.ග්‍රෑ.) | **6970** | 5,004 |
| බලශක්ති භාවිතය (කිලෝවොට්) | **4,555,556** | 5,729,386 |
| කාබන් මුදුණ (කාබන්ඩයොක්සයිඩ් ටොන්) හා සමාන | **5,694.89** | 7,011.01 |
| **උපස්ථම්භක 3 පීපල්ස් ලීසිං ඉදිරිපත් කරන භාණ්ඩ හා සේවාවන්හි හරිත බලපෑම තුළ ප්‍රතිපල උපරිම කිරීම** | | |
| හරිත මූල්‍ය පහසුකම් (ප්‍රමාණය) | **2,185** | 904 |
| හරිත මූල්‍යකරණ භාවිතය (රුපියල් බිලියන) | **5.48** | 2.38 |
| **උපස්ථම්භක 4 පරිසරය සංරක්ෂණය කිරීම** | | |
| ශාඛා සිටුවීම හා නඩත්තු කිරීම (ප්‍රමාණය) | **14,625** | 6,637 |
| තිරසාර ජීවිතයක් සඳහා දැනුවත් කල උනන්දුවක් දක්වන පාර්ශ්වයන් (ප්‍රමාණය) | **1,105** | 721 |

### → අපගේ සෘජු පාරිසරික බලපෑම කළමනාකරණය කිරීම සහ ප්‍රතිඵල උපරිම කිරීම

අපගේ සෘජු පාරිසරික බලපෑම කඩදාසි, බලශක්ති, ජල භාවිතය, සහ අපද්‍රව්‍ය කළමනාකරණය යන අංශවලට සීමා වී ඇත. මිහිතලය මත අපගේ සෘනාත්මක බලපෑම අවම කිරීම සඳහා අපගේ ව්‍යාපාරික කටයුතුවලට සහ ශාඛා ජාලය පුරා හරිත පිළිවෙත් අන්තර්ගත කිරීමට අපි උත්සාහ දරමු.

GRI 302-1 GRI 302-2 GRI 302-3 GRI 302-4 GRI 302-5

### බලශක්ති කළමනාකරණය

අපගේ මෙහෙයුම් බලශක්තිය මත පදනම් නොවන නමුත් අඛණ්ඩවම බලශක්ති භාවිතය අඩු කිරීම සඳහා විවිධ මාර්ගයන් සෙවීමට ද සැදී පැහැදී සිටිනු ඇත. අපගේ ප්‍රධාන පරිභෝජන ප්‍රභවය විදුලිය වන අතර ප්‍රවාහනය සහ ව්‍යාපාර කටයුතු සඳහා සිදු කරන සංචාර අපගේ බලශක්ති පරිභෝජනයේ සැලකිය යුතු කොටසකට දායක වේ.

භාවිතයන් අඩු කිරීමෙහි ලා දක් වූ කැපවීම නිසා සමාලෝචිත වර්ෂය තුළ පීපල්ස් ලීසිං සමාගම බලශක්ති භාවිතය 2018/19 0.46$\times10^{13}$ කින් අඩු කිරීමට දායක විය. ආයතනය තුළ මෙන්ම බාහිරව ද බලශක්ති කළමනාකරණය පිළිබඳ තොරතුරු පහත දක්වේ.

පීපල්ස් ලීසිං ඇතුළත

| බලශක්ති මූලාශ්‍ර | බලශක්ති වර්ගය | භාවිත මට්ටම (ජූල්ස් වලින්) 2018/19 | 2017/18 |
|---|---|---|---|
| අළුත් කළ හැකි | විදුලිය | **$1.64 \times 10^{13}$** | $2.06 \times 10^{13}$ |
| අළුත් කළ නොහැකි | ඉන්ධන | **$0.11 \times 10^{13}$** | $0.15 \times 10^{13}$ |
| එකතුව | | **$1.75 \times 10^{13}$** | $2.21 \times 10^{13}$ |
| බලශක්ති තීව්‍රතාවය (රැකියා නියුක්තිකයෙකු සඳහා) | | **$6.82 \times 10^{9}$** | $2.21 \times 10^{9}$ |

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## වගකිව යුතු භාරකාරීත්වය මූර්තිමත් කිරීම <<

පීපල්ස් ලීසිං සමාගමෙන් පිටත

| බලශක්ති ප්‍රභව | බලශක්ති වර්ගය | පාරිභෝජන මට්ටම (ජුල්ස්) | |
|---|---|---|---|
| | | **2018/19** | 2017/18 |
| පුනර්ජනනීය නොවන | ඉන්ධන | **$1.7 \times 10^{13}$** | $8.59 \times 10^{13}$ |
| මුළු | | **$1.7 \times 10^{13}$** | $8.59 \times 10^{13}$ |
| බලශක්ති තීව්‍රතාවය (එක් සේවකයෙකුට) | | **$6.64 \times 10^{9}$** | $10.60 \times 10^{9}$ |

පරිවර්තන සාධකය

විදුලිය කිලෝවොට් 1 = ජුල් 3.60 x 106

ඉන්ධන ලීටර 1 (පෙට්‍රල්) = ජුල් 34.46 x 106

ඉන්ධන ලීටර 1 (ඩීසල්) = ජුල් 38.31 x 106

**ඇතැම් වාහනවල තොරතුරු සපයා ඇත්තේ කිලෝ මීටරවලින් වන බැවින් පෙට්‍රල් පරිභෝජනය කරන වාහන සඳහා 1 කිලෝ මීටරයක් ලීටර 0.1 ක් ලෙස උපකල්පනය කරන ලද අතර ඩීසල් පරිභෝජනය කරන වාහන සඳහා 1 කිලෝ මීටරයක් ලීටර 0.17 ක් ලෙස උපකල්පනය කර ඇත.

ගෝලීය වශයෙන් පිළිගත් විමෝචන ගිණුම්කරණ ප්‍රමිතියට අනුව අපි අපගේ කාබන් පාද සටහන නිරීක්ෂණය කරමු.

### ජලය කළමනාකරණය

ජලය යනු මූල්‍ය සේවා සපයන්නෙකුගේ ද්‍රව්‍යමය මාතෘකාවක් නොවේ. එසේ තිබියදීත් එය හිඟ සම්පතක් වන අතර, ගුණාත්මක බීම සඳහා ප්‍රවේශය ශ්‍රී ලංකාවේ වැඩි වැඩියෙන් ගැටලු සහගත වන හෙයින් ජනතාව ලිහිල් කිරීම සේවක සැපයුම්කරු සහ පාරිභෝගික අංශ හරහා ජල සංරක්ෂණය ප්‍රවර්ධනය කරයි. ස්වභාවික ජල කඳට හෝ ඒ ආශ්‍රිත වාසස්ථානවලට අපි කිසිදු හානියක් නොකරමු.

GRI 305-1 GRI 305-2 GRI 305-3 GRI 305-4 GRI 305-5 GRI 305 -6 GRI 305-7

### ඉන්ධන සහ විමෝචන කළමනාකරණය

අපගේ රථවාහන සමූහය සහ ව්‍යාපාර ආශ්‍රිත සංචාර සඳහා ප්‍රවාහනයේ ඉන්ධන පරිභෝජනය බලශක්ති පරිභෝජනය යටතේ ගණනය කර ඇත. ඉන්ධන භාවිතය අඩු කිරීම සඳහා අප සෑම විටම ඵලදායී මාර්ග සැලසුම් හරිත වාහන සහ ද්‍රව්‍ය තොග වශයෙන් ප්‍රවාහනය කිරීම සහ උපරිම වේලාවට ප්‍රායෝගික සැලසුම් ගමන් කරන ස්ථාන භාවිතා කිරීම නිසා මාර්ග තදබදය මගහරවා ගන්නා ලදී.

අපගේ වක්‍ර බලපෑම අවම කිරීම සඳහා දෙමුහුන් හා විදුලි වාහන 2,185ක් අප සතුව ඇත. ද්‍රව්‍ය තොග වශයෙන් ප්‍රවාහනය කිරීම සහ හැකි උපරිමයෙන් සැතපුම් ගණන අඩු කිරීම සඳහා උපරිම බෙදාහැරීම් සහ මාර්ග සැලසුම් භාවිතා කිරීම. මෙම උපාය මාර්ග මගින් ඉන්ධන පරිභෝජනය සහ හරිතාගාර වායු විමෝචන සීමා කිරීමද අරමුණු කරයි.

GRI 307-1

### පාරිසරික අනුකූලතාවය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ පාරිසරික නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම සඳහා දඩ මුදල් හෝ මූල්‍යමය නොවන සම්බාධක වාර්තාවී නොමැත.

### අපද්‍රව්‍ය කළමනාකරණය

අපද්‍රව්‍ය වගකීම් රහිතව බැහැර කිරීමේ බරපතලකම සහ ජෛව විවිධත්වය හා මානව සෞඛ්‍යය පිළිබඳ එහි තත්ත්වයන් අපි තේරුම් ගනිමු. අපගේ සේවකයින්ගේ සහය ඇතිව 2011 සිට ජනනය කරන අපද්‍රව්‍ය වෙන් කිරීම අපි පුරුදු කරන්නෙමු. අදාළ මහ නගර/නාගරික සභා සහ මධ්‍යම පරිසර අධිකාරිය තෙවන පාර්ශ්වීය ප්‍රතිචක්‍රීකරණ සේවා සපයන්නන් විසින් අනුමත කරන ලදී. අපගේ මෙහෙයුම් මගින් පරිසරයට සැලකිය යුතු අපද්‍රව්‍ය හෝ කාන්දුවීමක් සිදු නොවේ. ජනනය කරන අපජලය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව බැහැර කරනු ලැබේ. අපගේ මෙහෙයුම්වලදී ජනනය වන ප්‍රධාන අපද්‍රව්‍යයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පදනම්කර ගත් ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය අප විසින් හඳුනාගෙන ඇති අතර වරින් වර ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය එකතු කිරීමේ සම්පාදනයන් අපි ඒවා වගකීමෙන් බැහැර කරමු.

GRI 301-1 GRI 301-2 GRI 301-3

### කඩදාසි රහිත මූල්‍යකරණය

අන්තර්ජාලය පදනම් කරගත් මූල්‍යකරණය හරහා ඩිජිටල් මූල්‍යකරණයේ ප්‍රවර්ධකයෙකු වන අපි 2017 සිට පී.එල්.සී ඔන්ලයින් හරහා මාර්ගගත ගනුදෙනු පිළිබඳව අපගේ ගනුදෙනුකරුවන්ට හුරු පුරුදුවී සිටිමු.

2018/19 මුදල් වර්ෂය සඳහා ප්‍රධාන කාර්යාලයේ කඩදාසි පරිභෝජනය කිලෝග්රෑම් 5,228 ක් ලෙස සඳහන් විය. අපි ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය සැලකිය යුතු ලෙස භාවිතා නොකරන්නෙමු. අපගේ මෙහෙයුම් ස්වභාවය නිසා අපගේ නිෂ්පාදන නැවත ලබා නොගනිමු.

### සමූහයේ කාබන් පතුල් සටහන තක්සේරුව

ධනාත්මක දේශගුණික ක්‍රියාකාරීත්වයට දායකවීම පීපල්ස් ලීසිං මගින් ආයතනික කාබන් පාද සටහන ප්‍රධාන කාර්යසාධන දර්ශකයක් ලෙස හඳුනාගෙන ඇත. ගෝලීය වශයෙන් පිළිගත් විමෝචන අනුව GHG විමෝචන වඩාත් ද්‍රව්‍යමය ස්ථානීය හා අක්‍රීය ක්‍රියාකාරකම්වලින් සොයා ගන්නා ලදී. ගිණුම්කරණ ප්‍රමිතිය ISO 14064-1: 2006. දිගුකාලීන නැවත වන වගාව/රෝපණ මුලපිරීම් සහ ප්‍රතිචක්‍රීකරණ ප්‍රයත්නයන් මගින් කාබන් ඉවත් කිරීමට අමතරව (අපගේ කඩදාසි ප්‍රතිචක්‍රීකරණය මගින් සම්පූර්ණ වැඩුණු ගස් 118 ක් ඉතිරි කර ඇති අතර, GHG විමෝචනය කාබන් සමාන කිලෝග්‍රෑම් 6.70කින් අඩු කර ඇත.) සමාගම දැනුවත් කිරීම සඳහා අදාළ ශාඛා හා දෙපාර්තමේන්තුවල කාබන් පාද සටහන ලුහුබැඳීමේ නිලධාරීන් ඇතුළු නිලධාරීන් අතර, කාබන් පාද සටහන් ගණනය කිරීමේ වැදගත්කම මෙම වාර්ෂික ගණනය කිරීමේ වැදගත්කම පිළිබඳ වැඩිදුර දැන්වත් කිරීම සහ අපගේ කාබන් තවදුරටත් අඩු කිරීම සඳහා දේශීයකරණය කරන ලද GHG කළමනාකරණ සැලසුම් ජනනය කිරීමයි. අපගේ ශාඛා ජාලයෙන් ජනනය වන GHG විමෝචනය අවබෝධකර ගැනීම සඳහා 2018/19 මූල්‍ය වර්ෂය සඳහා කාබන් ඉන්වෙන්ටරි සෑම ශාඛාවකම සහ පීපල්ස් ලීසිං සඳහා අනුබද්ධිත ආයතනයකට සකස් කරන ලදී. මෙම මුලපිරීම අපේ සේවකයින්ට ඔවුනගේ වැඩපොළ ආශ්‍රිත විමෝචන පිළිබඳ වඩාත් දැනුවත් කිරීමට තවදුරටත් පෙළඹවීමක් අපේක්ෂා කරන අතර, සමස්ත ආයතනික කාබන් පතුල් සටහන අඩු කිරීමට දායක වේ.

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## >> වගකිව යුතු භාරකාරීත්වය මූර්තිමත් කිරීම

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම

| විෂය පථ විමෝචන | ප්‍රභවය වාර්තා කිරීම | විමෝචන සංගටකය | පොදු සංයුතිය හා විමෝචන පරය | මුළු විමෝචනය ($tCO_2e$) 2018/19 | මුළු විමෝචනය ($tCO_2e$) 2017/18 |
|---|---|---|---|---|---|
| විෂය පථ 1 - සෘජු විමෝචනය | ලිපි ද්‍රව්‍ය දහනය | උත්පාදක ඉන්ධන | පහත සඳහන් වායූන් අදාළ යැයි සලකනු ලැබේ. කාබන්ඩයොක්සයිඩ් ($CO_2$) නයිට්‍රස් ඔක්සයිඩ් ($N_2O$) මීතේන් ($CH_4$) | **80.69** | 62.94 |
| | ජංගම දහනය | අයිතිය සහ පාලනය වාහන ඉන්ධන පරිභෝජනය | | **514.22** | 251.21 |
| | පලායන විමෝචන | වායුසමීකරණ ශීතකරණය | | **289.96** | 220.69 |
| | | $CO_2$ ගිනි නිවන උපකරණ කාන්දුවීම් | | **0.04** | 0.07 |
| | විෂය පථය 1 - මුළු විමෝචනය | | | **884.91** | 534.91 |
| විෂය පථ 2 - වක්‍ර විමෝචනය | මිළදී ගත් විදුලිය | විදුලිය පරිභෝජනය | පහත දැක්වෙන වායූන් ලෙස සැලකේ. අදාළ කාබන්ඩයොක්සයිඩ් ($CO_2$) | **2,911.62** | 3,557.23 |
| | විෂය පථය 2 - මුළු විමෝචනය | | | **2,911.62** | 3,557.23 |
| විෂය පථ 3 - විමෝචනය | සේවක ව්‍යාපාර ගමන් | ගුවන් ගමන් | පහත සඳහන් වායූන් අදාළ යැයි සලකනු ලැබේ. කාබන්ඩයොක්සයිඩ් ($CO_2$) නයිට්‍රස් ඔක්සයිඩ් ($N_2O$) මීතේන් ($CH_4$) | **108.73** | 39.07 |
| | ඉඩම් ගමන් | තෙවන පාර්ශවය සඳහා කුලියට ගත් වාහන | | **245.73** | |
| | කාලය තුළ ජනනය වන අපද්‍රව්‍ය | අපද්‍රව්‍ය බැහැර කිරීම | | **37.78** | |
| | ජල භාවිතය | ජලය | | **18.32** | |
| | සේවක ගමනාගමනය | සේවකයා රැකියාවට සහ පිටපතට ගමන් කිරීම | | **1,487,.80** | 13.54 |
| විෂය පථය - 3 මුළු විමෝචනය | | | | **1,898.36** | 2,463.09 |
| මුළු කාබන් පතුල් සටහන | | | | **5,694.89** | 7,011.01 |
| එක් සේවකයෙකුට GHG විමෝචනය තීව්‍රතාව | | | | **2.03** | 2.64 |

### වගකිව යුතු මූල්‍ය හා හරිත මූල්‍ය ප්‍රවර්ධනය කිරීම

පීපල්ස් ලීසිං සමාගමේ අපි නව බඳවා ගැනීම් සහ ශාඛා කණ්ඩායම් වගකිව යුතු ණය ලබාදීමේ ආචාරධර්ම පිළිබඳව දැනුවත් කරමු. එය අයකර ගැනීමේ හැකියාව පිළිබඳව පමණක් නොව, ණය දීමේ සමාජ හා පාරිසරික බලපෑම පිළිබඳවද අවධානය යොමු කරමු. ණය දෙන තීරණයක් ගැනීමට පෙර මෙම කරුණු තක්සේරු කරනු ලැබේ.

මධ්‍යම අලෙවිකරණ ඒකකය හරිත වාහන ප්‍රවර්ධනය කරන නිෂ්පාදනයක් වන ඉකෝ ලීස් සහ හරිත නිෂ්පාදන දියත්කර ඇති අතර පරිසර හිතකාමී ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ඊ-මිතුරු 2 සහනදායී අරමුදල් සම්පාදනය කරයි.

### ප්‍රතිරෝපණ හා රෝපණ වැඩසටහන් සඳහා ආයෝජනය කිරීම

වන වගාව නැවත වගා කිරීම දේශගුණික විපර්යාසයන් අවම කිරීමට සහ දේශගුණික විපර්යාසයන් අවම කිරීමට හොඳ අවස්ථාවක් සපයයි. වනාන්තර ආවරණය ජාතික ප්‍රමුඛතාවයක් වීමත් සමග පීපල්ස් ලීසිං, උඩවත්ත සහ ගල්ඕය රක්ෂිතයේ දිස්ත්‍රික් වන සංරක්ෂණ කාර්යාල සමග අඛණ්ඩව සහයෝගයෙන් කටයුතු කළේය. පීපල්ස් ලීසිං විසින් අදාළ ආයතන හා පාර්ශවකරුවන්ගේ කණ්ඩායම් සමග දේශීයව සිටුවීමේ ව්‍යාපාරද ක්‍රියාත්මක කරන ලදී.

GRI 304-1 GRI 304-2 GRI 304-3 GRI 304-4

### ජෛව විවිධත්වය

ව්‍යාපාර තිරසාරත්වයේ ප්‍රධාන අංගයක් ලෙස වන ජෛව විවිධත්වය හැඳින්විය හැකිය. 2013 සිට ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයේ අනුග්‍රාහක සාමාජිකයෙකි. පීපල්ස් ලීසිං යනු 2013 සිට ජෛව විවිධත්ව ශ්‍රී ලංකාවේ අනුග්‍රාහක සාමාජිකයෙකි. අපගේ ව්‍යාපාරික මෙහෙයුම් ජෛව විවිධත්වයට හෝ IUCN රතු ලැයිස්තු විශේෂ හෝ ජාතික සංරක්ෂණ ලැයිස්තු විශේෂ ඇතුළු වඳවීමේ තර්ජනයට ලක්ව ඇති හෝ අවදානමට ලක්විය හැකි විශේෂයෙන් සැළකිය යුතු සෘජු බලපෑමක් ඇති නොකරයි. වාසස්ථාන යථා තත්ත්වයට පත් කිරීමට/ආරක්ෂා කිරීමට අපි කැපවී සිටිමු.

වෙරලබඩ ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳ විස්තර අපගේ මංගත වාර්තාවෙන් ලබා ගත හැක

http://plc2018-19.annualreports.lk/cbc.html

# වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්

## වගකිව යුතු භාරකාරීත්වය මූර්තිමත් කිරීම <<

තවද, 2018/19 දී අපි ඉහළ ජෛව විවිධත්ව වටිනාකමක් ඇති ආරක්ෂිත ප්‍රදේශයන් හි හෝ ඒ අවට කිසිදු ව්‍යාපාරයක් ක්‍රියාත්මක කර නැත.

කෙසේ වෙතත්, ණය දෙන ආයතනයක් ජෛව විවිධත්වයට සෘණාත්මක බලපෑමක් ඇති කළ හැකි බව අපි වටහාගෙන ඇති අතර, අපගේ කාර්ය මණ්ඩලයේ සෑම මට්ටමකටම ඔවුන් විසින් දෙනු ලබන ණය සම්බන්ධ තීරණය හෝ ක්‍රියාකාරකම් ජෛව විවිධත්වයට අහිතකර ලෙස බලපාන්නේ කෙසේද යන්න පිළිබඳව අපි දැනුවත් කරමු. මෝටර් වාහන සඳහා මුදල් යෙදවීමෙන් අප විසින් ඇති කරන ප්‍රධාන වක්‍ර සෘණාත්මක බලපෑම පිළිබඳ අපි දැනුවත් වෙමු. අපගේ කාබන් පතුල් සටහන අවම කිරීම, නවෝත්පාදනය හා ඵලදායි ලෙස සංරක්ෂණය සඳහා දායක වීමෙන් විසඳුමේ කොටසක් වීමට අපි උත්සහ කරමු. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ දී, අපගේ පරිසර හිතකාමී බව මුල පිරීම් 31 ක් තුළින් සිදු කළ රුපියල් මිලියන 1.94 ක ආයෝජනය මගින් පෙන්නුම් කරන ලදී.

GRI 201-2

තවද, දේශගුණික විපර්යාස හා සම්බන්ධ අවස්ථාවන්හි ප්‍රමාණාත්මක අවදානමක් නොමැති වුවද, දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම ක්‍රමයෙන් තීව්‍ර වනු ඇති බව අපි තේරුම් ගනිමු. එබැවින්, ප්‍රසම්පාදන හා ණය දීමේ දී පාරිසරික සමාජ, පාලන (ESG) සලකා බැලීම් අපි ප්‍රවර්ධනය කරමු.

### තිරසාරභාවය සඳහා පිළිගැනීම

අපගේ තිරසාරභාවය සහ ආයතනික සමාජ වගකීම උපායමාර්ගයේ ප්‍රතිඵලයක් වන අතර, මෙම ක්ෂේත්‍රයන්හි අපගේ වැඩ කටයුතු අවධානයට ලක් නොවී නොමැත. 2018/19 මුදල් වර්ෂය තුළ පීපල්ස් ලීසිං සමාගම පහත පරිදි ඇගයීමට ලක් වී ඇත:

- **"හොඳම ආයතනික පුරවැසියා සම්මානය"** – ලංකා වාණිජ මණ්ඩලය විසින් මෙම සම්මානයේ පිදුම් ලැබූ "හොඳම ආයතනික පුරවැසියන් දස දෙනාගෙන්" කෙනෙකු ලෙස පිළිගැනේ.
- **"හොඳම වාර්ෂික වාර්තා සම්මානය – 2018"** – අඛණ්ඩව විනිවිද භාවය සහ යහපාලනය අපි පිළිපැදීම පිළිබිඹු කරමින් ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ (CA) ආයතනය මගින් ආයතනික සමාජ වගකීම් වාර්තා සඳහා ලෝකඩ සම්මානය අපට පිරිනමන ලදී.
- **විශිෂ්ට ඒකාබද්ධ වාර්තාකරණ සම්මාන 2018 (CMA)** – ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරුවන්ගේ ආයතනය මගින් ඉදිරිපත් කරනු ලැබේ. – ඒකාබද්ධ චින්තනය සඳහා විශේෂ කුසලතා සම්මානය
- **"ඉස්ලාමීය මූල්‍ය සංසදය දකුණු ආසියාව (IFFSA) සම්මානය 2018"** - "වසරේ ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතිය" සඳහා රන් සම්මානය අපට ලැබුණි.
- **"ශ්‍රී ලංකා ඉස්ලාමීය බැංකු හා මූල්‍ය ආයතනය (SLIBFI) සම්මානය 2018"** - KPMG සමග එක්ව UTO අධ්‍යාපනික උපදේශනය මගින් සමාජ නගා සිටුවීමේ කාණ්ඩයේ රන් සම්මානය අපට පිරිනමන ලදී.

### අනාගත දැක්ම

අපගේ ව්‍යාපාරයට සහ අපගේ පාර්ශ්වකරුවන්ට තිරසාර අනාගතයක් සුරක්ෂිත කිරීම සඳහා දේශගුණික විපර්යාසයන්ගේ අහිතකර බලපෑම්වලට එරෙහිව සටන් කිරීමට අපි කැපවී සිටිමු. තිරසර බව වැඩි කිරීම – සාක්ෂරතාවය, අදාළත්වය ප්‍රකාශ කිරීම, සියලු මට්ටමේ සේවකයින් දිරිගැන්වීම අපගේ ප්‍රධාන අරමුණු තුනකි.

භෞතික බලපෑම් මැනීමෙන් ඔබ්බට තිරසාර බව ඒකාබද්ධ කිරීමටද අපට සැලසුම් තිබේ. පිරිවැය ඵලදායි තිරසර උපාය මාර්ග සංවර්ධනය කිරීමට, තිරසාර මිනුම් පදනම් කරගත් කළමනාකරණ පද්ධති භාවිතා කරමින් අවදානම අවම කිරීමට සහ ක්‍රියාවලිය සහ නිෂ්පාදන ප්‍රතිනිර්මාණය සඳහා ක්‍රියාකාරී උපාය මාර්ග සංවර්ධනය කිරීමට අපි සැලසුම් කරමු.

# නිමැවුම්

## නිෂ්පාදනය කරන ලද භාණ්ඩ සහ සේවා මෙන්ම ප්‍රතිපල ළඟාකර ගැනීම සඳහා වැදගත් වන වෙනස්කම්

### වර්ධනය

- රුපියල් බිලියන 32.74ක් වූ දළ ආදායම
- රුපියල් බිලියන 4.42ක් වූ බදුපසු ලාභය
- රුපියල් බිලියන 172.54ක් වූ මුලු වත්කම්
- 15.88% හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතිකය
- 3.95%ක් වූ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතිකය
- කොටසකට ශුද්ධ වත්කම් රුපියල් 18.10
- 14.36%ක් වූ පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය
- 15.20%ක් වූ සමස්ථ ප්‍රාග්ධන අනුපාතය
- 108.91%ක් වූ ද්‍රවශීලතා ආවරණ අනුපාතය
- මුලු වත්කම්වලින් පොළී උපයන වත්කම් ප්‍රතිශතය 94.75% ක් දක්වා වර්ධනය වීම

### සන්නාම

- වෙළෙඳනාම වටිනාකම රුපියල් මිලියන 8,719 ක් දක්වා වර්ධනය විය
- නව නිෂ්පාදන හයක් හඳුන්වා දුන් අතර, එකක් හඳුන්වාදීමට නියමිතය කිරීම
- රුපියල් බිලියන 90.62 ක් තොරතුරු සන්නිවේදන තාක්ෂණය සඳහා ආයෝජනය
- ණය ඇගයීම සහ ණය ප්‍රවාහය සඳහා නව ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
- 148,698ක් වූ ඩිජිටල් මූල්‍යකරණ ගනුදෙනු සංඛ්‍යාව

### ආයෝජකයන්

- 44.72%ක් වූ ලාභාංශ ගෙවීමේ අනුපාතිකය
- කොටසකට රුපියල් 1.25ක ලාභාංශ ගෙවීම
- කොටසක ඉපැයුම - රුපියල් 2.80
- 0.74 ගුණයක් වූ මිලපොත් අගයේ අනුපාතයක් ලෙස
- 4.79 ගුණයක මිල ඉපැයුම් අනුපාතය



# නිමැවුම්

## ගනුදෙනුකරුවන්

- රුපියල් බිලියන 95.28ක් වූ මුලු ණයදීම්
- 311,135 දක්වා ගනුදෙනුකරුවන් පදනම වර්ධනයවීම
- රුපියල් මිලියන 1,374.87ක් වූ විචල්‍ය අනුපාත කල්බදු හා ණය බෙදා හැරීම
- රුපියල් මිලියන 500.27ක රන් ණයදීම්
- පවත්නා ශාඛා තුළ නිෂ්පාදන ව්‍යාප්ත කිරීම
- ඉහළ කාර්යසාධනයක් සහිත සේවා මධ්‍යස්ථාන 10 ක් ශාඛා බවට පරිවර්ථනය කිරීම කෙරෙහි අනාගත අවධානය
- 30,000 කට අධික ගනුදෙනුකරුවන් සඳහා පක්ෂපාතීත්වය (ලෝයල්ටි) දැක්වෙන වැඩසටහන

## ව්‍යාපාරික හවුල්-කරුවන්

සමාගම් දෙකටම වාසිසහගත තත්ත්වයන් ළඟා කරගත හැකි උපායමාර්ගික බැඳීම් ප්‍රධාන උපායමාර්ගික බැඳීම් කිහිපයක් නම්;

- AMW
- DIMO
- ඉන්ද්‍රා ට්‍රේඩර්ස්

## සේවකයා

- වසර පුරා නව බඳවා ගැනීම් 492ක්
- වසර පුරා උසස්වීම් 957ක්
- පුහුණුව හා සංවර්ධනය සඳහා රුපියල් මිලියන 12.93ක් වියදම් කිරීම
- රුපියල් මිලියන 3,438.17ක් වූ වේතන සහ ප්‍රතිලාභ
- පුහුණු වැඩසටහන් 339ක් හරහා පුහුණු පැය 41,678ක්, එක් සේවකයකු සඳහා පුහුණු පැය 17.90ක්

## සමාජය හා පරිසරය

- ආයතනික සමාජ වගකීම් වැඩසටහන් 155ක් සඳහා රුපියල් මිලියන 122ක් ආයෝජනය කිරීම
- වැඩසටහන් 22ක් තුළින් සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 1,710ක් නඟා සිටුවීම සඳහා රුපියල් මිලියන 8.7ක් ආයෝජනය කිරීම
- අධ්‍යාපනික හා මුල් ළමා විය සංවර්ධන වැඩසටහන් සඳහා රුපියල් මිලියන 11.9ක් ආයෝජනය කිරීම
- කාර්ය මණ්ඩලය 270ක් දැනුවත් කරන කලාපිය දැනුවත් කිරීමේ වැඩසටහන් 12ක් හරහා බලශක්ති පරිභෝජනය 0.46 × 1013කින් අඩු කිරීම
- කාබන් පතුල් සටහන 18.77%කින් අඩුකර ගැනීමට සමත්වීම
- හරිත වාහන 2,185 ක් සඳහා කල්බදු පහසුකම් ලබාදීම



# ප්‍රතිඵල

## නිමැවුම්වල ප්‍රතිඵලයක් ලෙස ආයතනය විසින්ම හා පාර්ශ්වකරුවන් වෙත නිර්මාණය කරනලද වටිනාකම්

### ලාභදායීත්වයේ සහ ව්‍යාපාර කටයුතුවල වර්ධනය තුළින් ස්ථාවර සහ සාර්ථක සමාගමක් වීම

- තිරසාර ව්‍යාපාර ආකෘතිය
- ප්‍රශස්ත ද්‍රවශීලතාවය
- අයෝජකයින්ට දිගුකාලීන මතයක් දැරීමට හැකිවීම
- ප්‍රාග්ධන ලාභයට තුඩුදෙන පරිදි කොටස් මිල ඉහල යාම
- ප්‍රශස්ත අවදානම් ප්‍රතිලාභ මට්ටමක් පවත්වා ගැනීම
- ලාභදායිත්වය ඉහල යාම
- ණය කළඹ අනුව බැංකු නොවන මූල්‍ය සමාගම් අතර ප්‍රමුඛස්ථානය ලබා ගැනීම

### පාර්ශවකරුවන්ගේ විශ්වාසය ආකර්ශනය කර ගත හැකි ශක්තිමත් වෙළඳනාම වටිනාකම් සහ ශක්තිමත් වෙළඳපොල කොටසක් හිමිවීම

- විනිවිදභාවය
- ආරක්ෂිත පද්ධති සහ ක්‍රියාවලි
- යහපාලනය
- ඇගයීම් සිදුකරන ආයතන මගින් විවිධ අවස්ථාවන්හිදි ඇගයීම් ලැබීම
- හොද අභ්‍යන්තර පාලන පද්ධතිය
- විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) සහ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS) යන මාර්ගගත අරමුදල් හුවමාරු පද්ධති
- මධ්‍යස්ථ අවදානම් පැතිකඩ
- ගනුදෙනුකරුවන්ගේ පහසුව
- නිෂ්පාදන නවෝත්පාදන හා පාරිභෝගික කේන්ද්‍රියතාවයේ වැඩි දියුණු කල හැකියාව
- විධිමත් ව්‍යාපාර ක්‍රියාවලින් හරහා වැඩි දියුණු වූ සේවා සැපයීම
- පහසුව හා සම්බන්ධතාවය
- සමාජ මාධ්‍ය හරහා ගෙවීම් සහ ගනුදෙනු සදහා පහසුකම් සැපයීම
- ශ්‍රී ලංකාවේ වඩාත්ම ශ්‍රේණිගත කල බැංකු නොවන මූල්‍ය සමාගම වීම

### වටිනාකම් එකතු කල නිෂ්පාදන සහ සේවා විශිෂ්ටත්වය තුලින් ලබා ගන්නා ශක්තිමත් පාරිභෝගික සබඳතාවය සහ තිරසාර තරගකාරි වාසියක් ලබා ගැනීම

- ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවන්ට අනුකූල වු නිෂ්පාදන සහ සේවා
- 3.9% ක් වු අක්‍රීය ණය අනුපාතය
- ඉහල හරස් අලෙවිකරණ අනුපාතය
- නැවත පැමිණෙන ගනුදෙනුකරුවන්ගේ ප්‍රතිශතය - 43%
- වැඩිදියුණු කල පාරිභෝගික පහසුව



# ප්‍රතිඵල

### නව්‍යකරණය මත පදනම් වූ පූර්ණ මූල්‍ය විසඳුම් තුළින් ආයතනයේ සන්නාමය ශක්තිමත් කරන සවිබලගැන්වූ සහ කැපවූ ශ්‍රම බලකාය.

- රැකියා උත්පාදනය
- කාර්ය මණ්ඩලය රඳවා තබා ගැනීමේ ප්‍රතිශතය 88.85%කි
- ඵලදායිතාව සේවකයකු සඳහා ලාභය - රුපියල් මිලියන 2 සේවකයෙකු සඳහා වත්කම් - රුපියල් මිලියන 74.08
- මෙහෙයුම් කාර්යක්ෂමතාව - 37.81%ක් වූ ආදායමට පිරිවැය අනුපාතය
- සේවක පිරිවැටුම් අනුපාතය - 11.15%කි
- පාරිභෝගිකයින් වටා කේන්ද්‍රගතවීම
- නව්‍යකරණය වූ නිෂ්පාදන හා සේවා
- ආයතනයේ හඬ
- වෘත්තිය දියුණුව
- විශ්වාසනීය හා වගකිව යුතු ශ්‍රම බලකායක්
- සමාන අවස්ථා ලබාදෙන සේවා යෝජකයෙකු
- සේවා - ජීවන සමබරතාවය
- සේවක පක්ෂපාතීත්වය සහ තෘප්තිය
- කාර්යක්ෂම ශ්‍රම බලකාය
- ආරක්ෂිත, යහපත් හා ප්‍රගතිශීලී සේවා ස්ථානයක්
- වඩා හිතවත් වූ හා සැළකිලිමත් වූ පාරිභෝගික සම්බන්ධතා
- කාර්ය මණ්ඩල සුභසාධන වැඩසටහන්

### වටිනාකම් නිර්මාණය කිරීමට දායක විය හැකි ශක්තිමත් කළ හවුල්කාරීත්වයන්

- දිගුකල් පවතින අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සබඳතා

### තිරසාර සංවර්ධන අරමුණු සක්ෂාත් කර ගැනීම සඳහා දායක වන අතරම වගකිව යුතු මූල්‍ය, සමාජීය හා පරිසරය සඳහා අයෝජනය කිරීම තුළින් සමාජයන් සවිබල ගැන්වීම

- තිරසාර මෙහෙයුම් කටයුත්තක් සඳහා කැපවීම
- ප්‍රාදේශීය ප්‍රජාවන් සවිබල ගැන්වීම
- මූල්‍යමය අන්තර්ග්‍රහණය
- ඩිජිටල් පහසුවත් සමග, පාරිභෝගික අවශ්‍යතාවන්ට අනුකූල වටිනාකම් එකතුකළ තිරසාර මූල්‍ය පහසුකම් සැපයීම
- පාරිසරික නීති හා ප්‍රමිතීන්ට අනුකූලවීම
- දිගුකාලීන ගස් සිටුවීමේ ව්‍යාපෘතිය
- ජෛව විවිධත්ව සංරක්ෂණය
- හරිතාගාර වායු විමෝචනය 7,011.01tco2 සිට 5,694.89tco2 දක්වා අඩු විය
- පරිසරය සුරැකීමේ මුලපිරීම් වැඩිකිරීම සඳහා සේවකයින්ගේ සහභාගීත්වය
- බලශක්ති පරිභෝජනය අඩු කිරීම
- වගකිව යුතු ණයදීම්



# බලපෑම

මූල්‍ය සේවා සැපයීමේ දශක දෙකකට වැඩි කාලයක් තුළ ආයෝජකයින්, තෘප්තිමත් ගනුදෙනුකරුවන්, උද්‍යෝගිමත් සේවකයින්, තෘප්තිමත් ව්‍යාපාරික හවුල්කරුවන් නියාමකයින් සමඟ සුහද සම්බන්ධතා සහ සමාජ සහ පරිසරය කෙරෙහි පවත්නා ධනාත්මක බලපෑමෙන් පැහැදිලි වන පරිදි අපගේ පාර්ශවකරුවන්ට සැබෑ බලපෑමක් කිරීමට අපට හැකිවී තිබේ.

> පසුගිය වසර පහ තුළ රුපියල් බිලියන 9.8 ක් ලාභාංශ ලෙස ගෙවා රුපියල් බිලියන 12 ක් සේවකයින්ට ගෙවා ඇති අතර, සැපයුම්කරුවන්ට රුපියල් බිලියන 270 ක් ගෙවා ඇත.

සමස්ථයක් ලෙස ගත් කල රටේ ආර්ථික, සමාජයීය හා පාරිසරික සංවර්ධනය සඳහා මූල්‍ය ආයතන විසින් ඉටු කරනු ලබන කාර්යභාරයේ වැදගත්කම හුවාදැක්වීම අවශ්‍ය නොවේ. මූල්‍ය සේවා අතරමැදියෙකු ලෙස බැංකු නොවන මූල්‍ය ආයතන අංශයෙන් වත්කම් සඳහා දායකත්වය 12.05% ක් සමග, පීපල්ස් ලීසිං ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

විශාල හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලින් සමන්විත විධිමත් අංශයට බැංකු වැඩි වශයෙන් දායකවී ඇති අතර, අපගේ අවධානය වැඩි වශයෙන් යොමුවී ඇත්තේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ පුද්ගලයින්ගෙන් සමන්විත අවිධිමත් අංශය වෙතය. මෙම අංශයට සේවා සැපයීමේදී අපහට මුහුණ දීමට සිදුවන අභියෝග සැලකිල්ලට ගැනීම මෙහිදී වඩා වැදගත්වේ. කාර්යසාධනය පිළිබඳ ස්ථාපිත වාර්තා නොමැති වීම, මූල්‍ය විනය නොමැතිකම, ඉදිරිපත් කල යුතු ඇපකර නොමැතිවීම හේතුවෙන් ඔවුන්ගේ ණය සුදුසුකම් තක්සේරු කිරීමේදී අපහට දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවේ. සාපේක්ෂව කුඩා ප්‍රමාණයේ පහසුකම් සහ නිරන්තරයෙන් අධීක්ෂණය කිරීමට සිදුවන නිසා ඉහළ මෙහෙයුම් පිරිවැයක් දැරීමට සිදුවේ.

පසුගිය වසර පහ තුළ ව්‍යවසායකයින් සඳහා රුපියල් මිලියන 371 ක් ලබාදී ඇති අතර, 2019 මාර්තු 31 වන දින වන විට තැන්පත්කරුවන්ගෙන් රුපියල් මිලියන 88 ක් තැන්පතු ලෙස ලබා ගැනීමට අපහට හැකිවී තිබේ. අපි පසුගිය වසර පහ තුළ වාණිජ හා පුද්ගලික වාහන 281,064 ක් රටේ වාහන සමූහයට එකතුකර ඇත්තෙමු. තවද රටේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පොලී ගෙවීම් රුපියල් බිලියන 20.52 කි. මෙම ක්‍රියාවලියේදී ආයෝජකයින් සඳහා ඉතිරි කරන්නන්ගේ අරමුදල් වෙන් කිරීම කාර්යක්ෂමව කිරීමට අපට හැකි වී තිබේ. ණය සහ ලැබිය යුතු දේ අපගේ වත්කම්වලින් 87.93%ක් වන අතර, තැන්පතු, මුලු වගකීම් සහ හිමිකම් වලින් 51.22% ක් වන අතර, ශුද්ධ පොලී ආදායම මුලු මෙහෙයුම් ආදායමෙන් 88.89% කින් සමන්විත වන විට එමඟින් අපගේ මූල්‍ය අතරමැදිකරණයේ කාර්යක්ෂමතාව පෙන්නුම් කෙරේ.

> මූල්‍ය අතරමැදිකරණයේ සාර්ථකත්වය
> – ණය, වත්කම්වලින් 87.93%
> – තැන්පතු මූල්‍යකරණය 53.39%
> – ශුද්ධ පොලී ආදායම, ආදායමෙන් 88.89%

අනෙක් අතට, ප්‍රධාන වශයෙන් කෙටි කාලීන අරමුදල් ප්‍රභවයන් සහිත වෙළඳපොලක මධ්‍යම හා දිගු කාලීන වත්කම් සඳහා අරමුදල් සැපයීම, විශේෂයෙන් කල්බදු ක්‍රමය, අපගේ කල්පිරීම් පරිණාමයේ ශක්තිමත් බව නිරූපණය කරයි.

සමාගම තුළ ශ්‍රී ලාංකිකයින් 2,329 ක් සේවයේ නියුක්ත කරවීම සහ ඔවුන්ගේ යැපෙන්නන් හට උපකාර කිරීමට අමතරව, ණය ගැණුම්කරුවන් ඵලදායී ව්‍යාපාරවල ආයෝජනය කරනවිට සහ වක්‍රව සෘජු ණය ගැණුම්කරුවන්ට භාණ්ඩ හා සේවා සපයන ව්‍යාපාරවල ආයෝජනය කරන විට අපගේ ණය දීම් ආර්ථිකයකට රැකියා හා වටිනාකම් එකතු කිරීමට සෘජුවම දායකවේ. පීපල්ස් ලීසිං සලකා බලන වර්ෂය තුළ රජයට සෘජු හා වක්‍ර බදු රුපියල් බිලියන 4.38ක් (පසුගිය වසර පහ තුල රුපියල් බිලියන 19 ක්) රටේ සංවර්ධන කටුයතු සඳහා යොදවා ඇත.

> රැකියා
> – සෘජු රැකියා 2,329
> – ශ්‍රී ලාංකිකයන් දහස් ගණනකට වක්‍ර රැකියා

අප සේවය කරන වෙළඳපොළෙහි වත්මන් තත්ත්වය සැලකිල්ලට ගැනීමේදී, බැංකු සඳහා ප්‍රවේශ නොවන සහ ප්‍රවේශයන් අඩු මට්ටමක පවතින ශ්‍රී ලාංකිකයන් විධිමත් මූල්‍ය පද්ධතියක් තුළට ගෙන ඒම තුළින් අපගේ මූල්‍ය දායකත්වය ගැන අප හට ආඩම්බර විය හැකිය.

> තැන්පත්කරුවන්ගෙන් 48%ක් පමණ සතුව සාමාන්‍යයෙන් රුපියල් 500,000 කට අඩු තැන්පතු වටිනාකමක්ද, ණයගැතියන්ගෙන් 98.55%ක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ පුද්ගලයින් වේ.

අපි පසුගිය වසර පහ තුළ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සදහා රුපියල් මිලියන 561 කින් දායක වු අතර, එය පොදුවේ ශ්‍රී ලාංකිකයින් බහුතරයකට ප්‍රතිලාභ ලබා දුන්නේය. මෙම ක්‍රියාවලිය තුළ පුද්ගලයින් 4,160 දෙනෙකුගේ සෞඛ්‍යය සුරක්ෂිත කිරීමට අපට හැකිවී තිබේ. පසුගිය වසර පහ තුළ අපගේ ව්‍යාපාර කටයුතුවලින් 23,111 $tCO_2e$ කාබන් නිකුත්කර ඇති නමුත්, මෙම බලපෑම අවම කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබේ. එවැනි එක් පියවරක් වන්නේ අපගේ නැවත වන වගා කිරීමේ වැඩපිළිවෙල වන අතර, එමඟින් පැල 25,742 ක් සිටුවනු ලැබීය.

> ගස් 25,742 ක් සහිත නැවත වන වගා කිරීමේ වැඩ පිළිවෙළ

අපගේ මෙහෙයුම් වඩාත් කාර්යක්ෂම කිරීම මූල්‍ය සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරිම සහ තවදුරටත් මූල්‍ය ඇතුළත් කිරීම, මූල්‍ය අතරමැදිකරණයේ අඩු පිරිවැය සහ අපගේ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් අභිබවා යෑම සඳහා වැඩි වටිනාකම් යෝජනා කිරීම යන අරමුණු ඇතිව තොරතුරු තාක්ෂණය සහ නව්‍යකරණය පුළුල් ලෙස යෙදවීම අප විසින් සිදු කෙරේ. මෙය අප ආර්ථිකය, සමාජයීය හා පරිසරය කෙරෙහි ඇති කරන බලපෑම තවදුරටත් බලපානු ඇති අතර ආර්ථික, සමාජයීය හා පාරිසරික වශයෙන් වගකිය යුතු සැබෑ තිරසාර ආයතනයක් බවට පත් කරනු ඇත.



ආයතනික සමාජ වගකීම් මුලපිරීම් සඳහා ආයෝජනය

# රු. මිලියන 122.23

2018 – රු. මිලියන 101.53



# 7

# නොවෙනස්වූ ගමන් මග

**154**
අවදානම් කළමණාකරණය

**170**
අපගේ කාර්යසාධනය ඇගයීම

# අවදානම් කළමනාකරණය

GRI 102-15

## හැඳින්වීම

මූල්‍ය ආයතනයක් ලෙස, පීපල්ස් ලීසිං යනු සෘජුවම මූල්‍ය සේවා ලබාගන්නා හෝ එවැනි සේවාවන් සැපයීමට අපට සහායවන විවිධ පාර්ශවකරුවන් අතරමැදියෙකි. ඒ හා සමානව පීපල්ස් ලීසිං වල ව්‍යාපාරික ක්‍රියාකාරකම් වත්කම් හා වගකීම්වල කල්පිරීම කෙටිකාලීන සිට දිගු කාලීනව පරිවර්තනය කිරීමටද හේතු වේ. මෙම ක්‍රියාකාරකම් දෙක මගින් පුද්ගල ලීසිං මගින් පවතින ප්‍රාග්ධනයට සාපේක්ෂව ඉහළ මට්ටමේ ආම්පන්න ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබේ. වත්කම් මත ඉතා අඩු ප්‍රතිලාභයක් තිබියදීත් කොටස් හිමියන්ට සාධාරණ ප්‍රතිලාභයක් ලබා දීමට සමාගමට හැකිවන්නේ මෙම ආම්පන්නයයි. එහෙත් එවැනි ඉහළ මට්ටමේ ආම්පන්න නිරන්තරයෙන් සමාගම ඉහළ මට්ටමකට නිරාවරණය කරයි අවදානම ද ඇත.

මෙම ව්‍යාපාර ආකෘතිය හා සම්බන්ධ අවදානම් අවම කිරීම සදහා, පීපල්ස් ලීසිං විසින් හොඳ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක් IRMF සකස් කර ඇත. IRMF අවධානය යොමුවී ඇත්තේ අවදානම් සහ විභව අලාභයන් සඳහා අපගේ නිරාවරණ කළමනාකරණය කිරීම සහ අපගේ වත්කම්වල වටිනාකම ආරක්ෂා කිරීමය. ශ්‍රී ලංකාවේ මහ බැංකුව සහ අනෙකුත් නියාමන අධිකාරීන් විසින් නියමකර ඇති අනුකූලතා අවශ්‍යතා හැරුණු විට, අස්ථාවර, අවිනිශ්චිත, සංකීර්ණ හා අපැහැදිලි පරිසරයට මුහුණ දීම සඳහා අපි වඩාත් දැඩි හා ගතික අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කරමු.

## ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව

සංවිධානයේ අවදානම් කළමනාකරණ උපාය මාර්ග සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා IRMF සහය දක්වයි. හොඳින් නිර්වචනය කර ඇති අවදානම් රුචියක් තුළ සමාගමේ සියලුම ක්‍රියාකාරකම් හා සම්බන්ධ ද්‍රව්‍යමය අවදානම් හදුනා ගැනීම, කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ වාර්තා කිරිම සම්බන්ධ සියලු අංශ IRMF ක්‍රමවත් ලෙස ආමන්ත්‍රණය කරයි.

සමාගමේ සංස්කෘතියට අවදානම් කළමනාකරණය ඒකාබද්ධ කිරීම සඳහා IRMF සපයයි. මණ්ඩලයේ කැපවීම සහ ඉහළට පහළට යන ප්‍රවේශයක අනුග මනය කරන හොඳම භාවිතයන් උපාය මාර්ගික හා මෙහෙයුම් අරමුණු සඳහා අවදානම් උපාය මාර්ග පරිවර්තනය කරන අතර ආයතනය පුරා අවදානම් කළමනාකරණ වගකීම් පැවරීම.

IRMF කට්ටල

- පීපල්ස් ලීසිං මගින් මුහුණ දෙන ප්‍රධාන අවදානම්
- අවදානම් අභිරුචිය
- අවදානම් කළමනාකරණය සඳහා භූමිකාවන් සහ වගකීම්
- අවදානම් කමිටු ව්‍යුහය

## ප්‍රධාන හා නැගී එන අවදානම්

### ප්‍රධාන/ද්‍රව්‍යමය අවදානම්

පීපල්ස් ලිසිං කටයුතුවලට අදාළව පහත සඳහන් ප්‍රධාන/ද්‍රව්‍යමය අවදානම් IRMF හඳුනා ගනී. මූල්‍ය සේවා අතරමැදියෙකු ලෙස, මූලික ක්‍රියාකාරකම් වලට යම් යම් කා වැද්දූ අවදානම් ඇති අතර ඒවා කල්තියා හදුනා ගැනීම සඳහා ගතික යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

සමාගමේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම කෙරෙහි බලපාන ද්‍රව්‍යමය අවදානම් හඳුනා ගැනීම පීපල්ස් ලීසිං අතිශයින්ම වැදගත්වේ. සාර්ව හා ක්ෂුද්‍ර මට්ටම් දෙකෙහිම මෙහෙයුම් පරිසරයේ ඇති අවිනිශ්චිතතාවයන් මූල්‍ය ආයතනවල අවදානම් වැඩි කරන අතර ඒවායේ විශාලත්වය වැඩිවන විට බරපතල ලෙස බලපායි. පීපල්ස් ලීසිං මෙම වර්ධනයන් පිළිබඳව නිරන්තරයෙන් විමසිලිමත්වන අතර උපායමාර්ග සංවර්ධනය කර ක්‍රියාත්මක කරයි.



# අවදානම් කළමනාකරණය

පහත රූප සටහන මගින් පෙන්නුම් කරන්නේ පීපල්ස් ලීසිං සමාගමේ 2018/19 ගිණුම් වර්ෂයට අදාළ ප්‍රධාන හා උපවර්ග අවදානම් වේ:




## මතුවෙමින් තිබෙන අවදානම්

අන්තර්ජාතික හා දේශීයව මතුවෙමින් තිබෙන තත්ත්වයන් හේතුවෙන් ඉහත සඳහන් සාම්ප්‍රදායික අවදානම්වලට පරිබාහිර වූ අවදානම්වලටද මූල්‍ය සමාගම් දිනෙන් දින නිරාවරණය වෙමින් පවතී.

අඩාල වූ ආර්ථික වර්ධන වේගය, නීති පද්ධතිවල සිදුවන වෙනස්කම්, තොරතුරු තාක්ෂණ ප්‍රවණතා, සමාජයීය හා ආර්ථික ව්‍යුහයන්ගේ සිදුවන වෙනස්කම්, දැඩි තරඟකාරීත්වය යනාදිය මගින් සාම්ප්‍රදායිකව මූල්‍ය ආයතනයක් පවත්වාගෙන ගිය අතරමැදි නියෝජිත සේවාවට දැඩි බලපෑමක් එල්ල කර ඇතිවා සේම එමගින් මූල්‍ය සමාගම් සපයන සේවාවන් දිනෙන් දින වෙනස්කම්වලට භාජනය වෙමින් පවතී.

මූල්‍ය වර්ෂ 2018/19 දී පහත මතුවෙමින් පැවති අවදානම් සමාගම්වලට බලපානු ලැබිණ:

| අවදානම | අවදානම | සමාගම සඳහා වන බලපෑම | වළක්වා ගැනීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| මන්දගාමී 3.3% ආර්ථික වර්ධනය | ණය සඳහා ඉල්ලුම අඩුවීම | ණය කළඹේ මන්දගාමී වර්ධනය | ලාභාන්තික කළමනාකරණය |
| | අඩු වියදම් කළ හැකි ආදායම | ණය කළඹ ගෙවීම් පැහැර හැරීම නිසා අපහායන වෙන්කිරීම ඉහළ යාම | අයකර ගැනීම් ශක්තිමත් කිරීම |
| | ආර්ථිකයේ සමහර අංශවල අඩාලවීම | ව්‍යාපාර වර්ධනය සඳහා අවස්ථා අවම වීම | සුරැකුම් සහිත නව සේවාවන් හඳුන්වාදීම |
| රුපියල ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වීම | ආනයන සීමා කිරීම | වාහන ආනයන මත හඳුන්වා දුන් 200% ණයවර ලිපි ආන්තිකය | ලියාපදිංචි වාහන වෙනුවෙන් අවධානය යොමු කිරීම |
| නව දේශීය ආදායම් පනත හඳුන්වාදීම | WHT බදු පදනම පුළුල් කිරීම | අඩු තැන්පතු වර්ධනය | බදු පරිපාලනය හා ගනුදෙනුකරුවන් දැනුවත් කිරීම |
| ණය ආපසු ගෙවීමේ බද්ද | ඉහළ සපළ බදු අනුපාතය හා ලාභදායීත්වය කෙරෙහි බලපෑම | පහළ යන ලාභදායීත්වය | ආදායම් වර්ධනය කිරීම හා පුරෝකතන යාවත්කාලීන කිරීම |
| ප්‍රතිපත්ති වෙළෙඳ අනුපාතය වැඩිවීම | සමාගම් ලාභදායීත්වය සහ පුද්ගල ණය ගැනීමේ හැකියාව පහළ යාම | ඉහළ යන ණය පිරිවැය, ලාභදායීත්වය පහළ වැටීම | විචල්‍ය පොලී අනුපාත සහිත සේවාවන් හඳුන්වා දීම |
| මූල්‍ය සමාගම් බිඳ වැටීම | පාරිභෝගික විශ්වාසය බිඳවැටීම | ඉහළ ණය පොලී වියදම, තැන්පතු පහළ යාම, ලාභදායීත්වය පහළ යාම | වෙළෙඳ නාමය ඉහළ නැංවීම අරමුණු කරගත් ප්‍රවර්ධන වැඩසටහන් තුළින් ආයතනයේ ණය ශ්‍රේණිගත කිරීම් පිළිබඳ දැනුවත් කිරීම |
| තාක්ෂණික දියුණුව | සාම්ප්‍රදායික ව්‍යාපාර ක්‍රමවේදයන් සුදුසු වෙනස්කම්වලට භාජනය වීම | අගයයන් එකතු කළ සේවාවන් හඳුන්වාදීම තුළින් තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වාදීම | PLC Online මෘදුකාංගය |
| SLFRS 9 හඳුන්වාදීම | අපහායන පදනම පුළුල් වීම හා අනාගත අවිනිශ්චිතතාවන් සැළකිල්ලට ගැනීම | ඉහළ අපහායන වෙන් කිරීම් | ණය ලබාදීම වඩාත් විධිමත් කිරීම හා පසුවිපරම |

# අවදානම් කළමනාකරණය



## අවදානම් අභිරුචිය

පීපල්ස් ලීසිං සමාගම විසින් සිය උපායමාර්ගික ක්‍රියාත්මක කිරීමේදී දැරීමට කැමැත්තක්ව දක්වන අලාභයේ ප්‍රමාණය, අවදානම් අභිරුචිය ලෙස දැක්වේ. අවදානම් අභිරුචි වාර්තාව IRMC මගින් යාවත්කාලීන කර ඊට අදාළ වෙනස්කම් වාර්ෂිකව සිදුකරනු ලබයි. අවදානම් හා පාලන දෙපාර්තමේන්තුව මගින් ඉහත කී අවදානම් අභිරුචි සීමාවන් සමාගමේ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන්ට ඇතුළත් කර එය මාසිකව, ත්‍රෛමාසිකව හා දෛනිකව නිරීක්ෂණය කරනු ලබන අතර, ඒ සඳහා ප්‍රමාණවත් අවධානයක් අවදානම් හා පාලන දෙපාර්තමේන්තුව මගින් ඊට ලබා දෙයි.

| අංශය | අවදානම් දර්ශකය | උපරිම අවදානම් කලාපය | නීතිමය සීමාව | 2019 මාර්තු 31 දිනට % | 2018 මාර්තු 31 දිනට % |
|---|---|---|---|---|---|
| ණය අවදානම | දළ අක්‍රීය වත්කම් | <5% | | 3.91 | 2.70 |
| | මාස තුනකට වඩා ගෙවීම් පැහැර හැරීම | <10% | | 7.57 | 4.43 |
| | අපහායන වියදම් | <1.2% | | 0.63 | 1.00 |
| සංකේන්ද්‍ර අවදානම | තනි පුද්ගල ණය ගැණුම්කරු සීමා | <රු. 3.2 බිලියන | 15% ප්‍රාග්ධනය | අනුකූල වේ | අනුකූල වේ |
| ද්‍රවශීලතා අවදානම | ද්‍රවශීලතා අනුපාතය | >100% | 100% | 108.90 | 117.89 |
| | පරිණත පරතර අනුපාතය | >-45% | | -20.04 | -21.55 |
| | ජංගම වගකීම ද්‍රවශීල වත්කම් අනුපාතය | >30% | | 78.19 | 74.86 |
| වෙළෙඳපොල අවදානම | පොළී අනුපාත සංවේදනය | <6% | | 0.37 | 0.66 |
| | පොළී අනුපාත නැවත මිල වීමේ පරතරය | <20% | | 7.43 | 11.92 |
| මෙහෙයුම් අවදානම් | හෙළිදරව් වූ වංචා | <0.5% | | – | – |
| | අසතුටුදායක විගණන | <15% | | – | – |
| නීති අවදානම් | මූලික ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය | >6% | 6% | 14.36 | 18.38 |
| | අවදානම් හරිත ප්‍රාග්ධනය | >12.5% | 10% | 15.20 | 16.46 |
| උපායමාර්ගික අවදානම | හිමිකමට ලැබීම් අනුපාතය | >15% | | 15.88 | 16.66 |
| | ශුද්ධ පොළී ආන්තිකය | >7.5% | | 9.70 | 8.36 |

## අවදානම් කළමනාකරණය අදාළ කාර්යභාරය හා වගකීම

මෙහෙයුම් පරිසරය තුළ සිදුවන වෙනස්කම් නව ආයතනික ප්‍රතිපත්ති හඳුන්වාදීම මගින් සහ පවතින ප්‍රතිපත්ති වෙනස් කිරීම මගින් සමාගම එදිනෙදා කටයුතුවලට එක් කරගනු ලබයි. සමාගම සිය සේවකයින්ට අවශ්‍ය වූ විටක ආරක්ෂිතව කටයුතු කිරීමට හා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට දැනුම්දීමට අවශ්‍ය බලතල ලබාදී ඇත.

සමාගම අවදානම් කළමනාකරණය සඳහා ආරක්ෂක වළලු ත්‍රිත්ව ක්‍රමය යොදා ගනී.



# අවදානම් කළමනාකරණය

## ආරක්ෂක වළල්ල

පළමු ආරක්ෂක පෙළට අයත් වන්නේ ව්‍යාපාරයේ ආදායම් උත්පාදනයට මුහුණට මුහුණලා ඇති අංශවල අවදානම උපකල්පනය කරන සියලුම සේවකයින්, භාණ්ඩාගාරය, මානව සම්පත් දෙපාර්තමේන්තුව, ගිණුම්කරණ, අලෙවිකරණය වැනි සියලුම උපකාරක සේවා කාර්යයන්ය.

## පළමු වන ආරක්ෂක වළල්ලේ කාර්යභාරයන් සහ වගකීම්

### ප්‍රධාන විධායක නිලධාරී සහ ආයතනික කළමනාකරණය

- අවදානම් සහ අවදානම් රුචිය සැකසීම සඳහා උපායමාර්ගික ප්‍රවේශය අවලංගු කිරීම.
- අවදානම් කළමනාකරණය සඳහා ව්‍යුහය ස්ථාපිත කිරීම.
- පී.එල්.සී. වලට ඇති වඩාත්ම වැදගත් අවදානම තේරුම් ගැනීම.
- සංවිධානය කළමනාකරණය කිරීම

### ව්‍යාපාර ඒකක කළමනාකරුවන්

- ආයතනය තුළ අවදානම් දැනුවත් කිරීමේ සංස්කෘතියක් ගොඩනැගීම
- පිළිවෙත් වෙනස් වීම් සන්නිවේදනය කිරීම.
- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම.
- ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති සහ වැඩිදියුණු කළ ක්ෂේත්‍රවල ඵලදායිතාවය පිළිබඳ ප්‍රතිපෝෂණය සන්නිවේදනය කිරීම.

### තනි සේවකයින්

- අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අවබෝධකර ගැනීම, පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
- අකාර්‍යක්ෂම, වැඩ කළ නොහැකි පාලනයන් වාර්තා කිරීම.
- කළමනාකාරීත්වය සමඟ සහයෝගීතාව ප්‍රවර්ධනය.

## ආරක්ෂක දෙවන පෙළ

ආරක්ෂක දෙවන පෙළ අවදානම්, අනුකූලතා කාර්යයන් සහ සේවකයින්ගෙන් සමන්විත වේ. දෙවන ආරක්ෂක රේඛාව මගින් ආරක්ෂක විධිවිධාන අනුගමනය කිරීම සඳහා ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ සීමාවන් අනුගමනය කරයි. මෙම මට්ටමේ මූලික කාර්යය වනුයේ ආරක්ෂක වළල්ලේ රේඛාව මත තිබිය යුතු අවදානම් රුචි මට්ටම් සැකසීමයි.

## දෙවන ආරක්ෂක වළල්ලේ කාර්යභාරයන් සහ වගකීම්

### ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC)

මෙම සමාගමේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා එහි බලධාරීන් වෙත බලය පැවරීමෙන් මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) පිහිටුවන ලදී.

සමාගමේ අවදානම් කළමනාකරණය කිරීමේ ඉහළම අධිකාරිය ලෙස ක්‍රියාකළේය. මෙම කමිටුවේ නායකත්වය දරනු ලබන්නේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකු වන අතර තවත් අධ්‍යක්ෂකවරුන් දෙදෙනකු ඇතුළත් වේ. CEO, SDGM දෙදෙනකු DGM අවදානම් හා පාලන දෙපාර්තුමේන්තුවේ කාර්තුමය වශයෙන් පැවති කමිටු රැස්වීම්වලට සහභාගී විය. අවශ්‍ය විටෙක අනෙකුත් නිලධාරීන්ට සාකච්ඡා වලට සහභාගී වන ලෙස ආරාධනා කර ඇත.

### වත්කම් හා වගකීම් කමිටුව (ALCO)

මෙය කළමනාකරණ කමිටුවක් වන අතර එය ප්‍රධාන විධායක නිලධාරී විසින් මෙහෙයවනු ලබන අතර, සමාගම් කළමනාකාරීත්වය විසින් ප්‍රධාන වශයෙන් සමාගමේ ද්‍රවශීලීතාවය සහ පොලී අනුපාත අවදානම් පිළිබඳ සොයා බලයි. මේ හැරුණු විට කමිටුව දෛනික කටයුතු පිළිබඳ ද සොයා බලයි.

### ඒකාබද්ධ අවදානම් කළමනාකරණ මෙහෙයුම් කමිටුව (IRMOC)

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ මෙහෙයුම් කමිටුව (IRMOC) යනු කළමනාකරණ මට්ටමේ කමිටුව වන අතර, එය SDGM සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සහ අවදානම් සහ පාලන දෙපාර්තමේන්තුවේ නියෝජිතයින්ගෙන් සමන්විත විය.

මෙම කමිටුව නැවත පිහිටුවීමේ මූලික පරමාර්ථය වන්නේ පිරිහෙන ණය කළඹ සහ අනෙකුත් නැගී එන අවදානම් යන අංශ සඳහා අවදානම් අවම කිරීමේ උපායමාර්ග සාකච්ඡාකර ක්‍රියාත්මක කිරීමයි. මේ හැරුණු විට නව ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ මූලාශ්‍රයක් ලෙසද මෙය ක්‍රියා කරයි.

### අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව

- අවදානම් කළමණාකරණ ප්‍රතිපත්ති හඳුන්වාදීම සහ එය යාවත්කාලීනව තබාගැනීම.
- අවදානම් වාර්තා සම්පාදනයකර මණ්ඩලයට වාර්තා කිරීම.
- අභ්‍යන්තර අවදානම් ප්‍රතිපත්ති සහ ව්‍යුහයන් සැකසීම.

## ආරක්ෂක තුන්වන පෙළ

තුන්වන ආරක්ෂාව සමාගමේ අභ්‍යන්තර විගණන කාර්යය නියෝජනය කරයි. අභ්‍යන්තර විගණනය මගින් සමාගම විසින් පිහිටුවා ඇති අභ්‍යන්තර පාලනයන් සහ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල ඵලදායීතාවය සහ ක්‍රියාත්මක කිරීම වාර්තා කරයි. අනෙක් අංශ විසින් පිහිටුවා ඇති අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනකරණ දෙපාර්තමේන්තුව මෙයට ඇතුළත් වේ.

නීති දෙපාර්තමේන්තුව අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වාර්තා කළද මෙය ආරක්‍ෂ වළලු ත්‍රිත්වයේ කොටසක් නොවේ. නමුත් මෙය සියලු දෙපාර්තමේන්තු හට අවශ්‍ය සහාය ලබාදේ.

# අවදානම් කළමනාකරණය



## අවදානම් කළමනාකරණ කමිටුව

අධක්ෂක මණ්ඩලය මගින් අවදානම් කමිටු පිහිටුවනු ලබන අතර, අවදානම් කළමනාකරණ කාර්යයන් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව හරහා සිදු කරනු ලබයි.




## ප්‍රධාන අවදානම් කළමනාකරණය

### ණය අවදානම

ණය අවදානම යනු සමාගමේ ප්‍රතිපාර්ශ්වය විසින් එකඟ වූ කොන්දේසි ප්‍රකාරව සිය බැඳීම් සපුරාලීමට අපොහොසත්වීමට ඇති විභවතාවයයි. මීට සමාගම විසින් ලබාදුන් ණය මුදල, ඊට අදාළ පොලිය හා සබැඳුනු ගාස්තු ඇතුළත් වේ. සමාගම සඳහා ණය මගින් ඇතිවන අවදානමට සමාග මේ මුළු අවදානම් බරතැබූ වත්කම්වලින් 90% වඩා වැඩි වේ. එම නිසා ණය අවදානම මගින් සමාගම වෙත ඇතිකරන්නාවූ බලපෑම ඉතා බැරෑරුම්ය. එම නිසා පීපල්ස් ලීසිං සමාගම විසින් කාලානුරූපීව වෙනස්වන සුළු හා ශක්තිමත් ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාවට නංවයි.

### ණය අවදානම් කළමනාකරණය

ණය අවදානම් කළමනාකරණය ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වේ.

- ණය ලබාදීම් කළමනාකරණය
- ණය අයකර ගැනීම් කළමනාකරණය

### ණය ලබාදීම් කළමනාකරණය

2019 මාර්තු 31 දින වනවිට, ප්‍රකාශිත ප්‍රාග්ධනය, රඳවාගත් ඉපැයීම් සහ වෙනත් සංචිතවලින් සමන්විත මුළු හිමිකම පෙර වසරට වඩා වැඩි 5.82%ක වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් මිලියන 28,603.36 ක් බවට පත්විය. ලාභදායීත්වය ඉහළ යාම හේතුකොටගෙන ලාභාංශ ගෙවීමෙන් පසු සහ සංචිතවලට මාරුකිරීමෙන් පසුවද රඳවාගත් ඉපැයීම් සැළකියයුතු වර්ධනයක් පෙන්නුම් කරයි. අපගේ පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය සහ සමස්ථ ප්‍රාග්ධන අනුපාතය පිළිවෙලින් 14.36%ක් සහ 15.20%ක් වූ අතර, ඒවා මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන විධාන 2018 අංක 3 හි දක්වා ඇති නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවයන්ට වඩා වඩාත් ඉදිරියෙන් සිටී. එය ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් පිළිඹිබු කරයි.

| | 2018/19 | 2017/18 |
|---|---|---|
| පළමු පෙළ ප්‍රාග්ධනය (රුපියල් මිලියන) | **26,517.79** | 26,515.11 |
| සමස්ථ ප්‍රාග්ධනය (රුපියල් මිලියන) | **28,065.76** | 23,733.49 |
| සමස්ථ අවධානම මත බර තැබූ අගය (රුපියල් මිලියන) | **184,632.63** | 144,222.71 |
| පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (අවමය 6%) (%) | **14.36** | 18.38 |
| සමස්ථ ප්‍රාග්ධන අනුපාතය (අවමය 10%) (%) | **15.20** | 16.46 |

2018/19 මුදල් වර්ෂය සඳහා යෝජිත අවසන් ලාභාංශය වන කොටසකට රුපියල් 0.50 ක් බැගින් වන කොටස් ලාභාංශ ගෙවීම සමාගමේ මුළු හිමිකම් කෙරෙහි කිසිදු ඍණාත්මක බලපෑමක් ඇති නොකරනු ඇත.

ලාභදායීත්වය පිළිබද අවධානය යොමු අතරම, 108.91% ක් වූ ද්‍රවශීල අනුපාතයකට මග පාදමින් 019 මාර්තු 31 දිනට රුපියල් මිලියන 13,192.50 ක ද්‍රවශීල වත්කම් පවත්වා ගැනීම තුළින් ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන ද්‍රවශීලතා අවශ්‍යතාවයන්ට අප සමාගම අනුගතබව සහතික වේ.

GRI 201-1

## ජනනය කළ හා බෙදාහැරිය වටිනාකම්

සමාගම විසින් සිය මෙහෙයුම් තුළින් ජනනය කරන ලද ආර්ථික වටිනාකම ව්‍යාපාරය පුළුල් කිරීම සහ අනාගත වර්ධනය සඳහා කොටසක් රඳවාගෙන සේවකයින්, ප්‍රාග්ධන සැපයුම්කරුවන්, රජය සහ ප්‍රජාව අතර පහත සදහන් පරිදි බෙදාහරින ලදී.

**ජනනය කළ හා බෙදාහැරිය ඍජු ආර්ථික වටිනාකම**

| | 2018/19 රුපියල් මිලියන | 2018/19 රුපියල් මිලියන |
|---|---|---|
| **ජනනය කළ ඍජු ආර්ථික වටිනාකම:** | | |
| පොලී ආදායම | **30,836.30** | 26,704.64 |
| ගාස්තු හා කොමිස් ආදායම | **1,508.95** | 1,378.36 |
| අනෙකුත් මෙහෙයුම් අදායම | **390.39** | 520.04 |
| ජනනය වූ ආර්ථික වටිනාකම | **32,735.64** | 28,603.04 |
| **බෙදාහැරිය ආර්ථික වටිනාකම:** | | |
| ප්‍රාග්ධනය සැපයුම්කරුවන් හට | | |
| කොටස්හිමියන්ට ගෙවූ ලාභාංශ | **1,974.83** | 1,974.83 |
| ණයකරුවන් වෙත ගෙවූ පොලිය | **6,963.55** | 7,539.88 |
| තැන්පතුකරුවන් වෙත ගෙවූ පොලිය | **8,682.55** | 6,960.28 |
| | **17,620.93** | 16,474.99 |
| **සේවකයින් හට** | | |
| වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ | **3,438.17** | 2,974.25 |
| | **3,438.17** | 2,974.25 |
| **රජයට** | | |
| ආදායම් බදු වියදම | **3,351.43** | 1,101.05 |
| මූල්‍ය සේවා මත බදු | **2,087.21** | 1,300.12 |
| අනෙකුත් ගෙවූ බදු | **46.09** | 40.09 |
| | **5,484.73** | 2,441.26 |
| **ප්‍රජාවට** | | |
| ආයතනික සමාජ වගකීම් කටයුතු සඳහා ගෙවූ සහ පරිත්‍යාග | **122.23** | 103.70 |
| | **122.23** | 103.70 |
| **මෙහෙයුම් වියදම්** | | |
| ක්ෂයවීම සහ ක්‍රමක්ෂය | **179.61** | 192.51 |
| ණය සහ ලැබිය යුතු සඳහා හානිකරණ පිරිවැය සහ අනෙකුත් අලාභ | **1,586.51** | 1,429.97 |
| ආශ්‍රිත සමාගමේ ආයෝජනය සඳහා හානිකරණ පිරිවැය | **348.79** | – |
| කීර්තිනාමය සඳහා හානිකරණ පිරිවැය | **19.58** | – |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | **2,767.48** | 2,384.07 |
| | **4,901.97** | 4,006.55 |
| බෙදාහරින ලද ආර්ථික වටිනාකම | **31,568.03** | 26,000.75 |
| රඳවාගත් ආර්ථික වටිනාකම | **1,167.60** | 2,602.30 |

GRI 201-4

2018/19 මූල්‍ය වර්ෂය තුළ රජයෙන් කිසිදු මූල්‍ය ආධාරයක් ලබාගෙන නොමැත.

# අපගේ කාර්යසාධනය ඇගයීම



GRI 201-1

## ආර්ථික අගය එකතු කළ ප්‍රතිලාභ (EVA)

ආර්ථික අගය එකතු කළ ප්‍රතිලාභ මගින් කොටස්හිමියන් සඳහා ඔවුන්ගේ ආයෝජනය මත නිර්මාණය කරන ලද අතිරික්ත වටිනාකම පෙන්නුම් කරයි.

| වර්ෂය සඳහා එකතු කල ආර්ථික අගය | 2018/19 රු. මිලියන | 2017/18 රු. මිලියන |
|---|---|---|
| කොටස්හිමියන්ගේ අරමුදල් | **28,603.36** | 27,029.82 |
| එකතු – හානිකරණ ගාස්තු සඳහා සමුච්චිත ප්‍රතිපාදන | **4,944.34** | 3,055.56 |
| එකතු – සමුච්චිත වෙළඳපොල ගොඩනැගීමේ වියදම් | **885.95** | 880.00 |
| | **34,433.65** | 30,965.38 |
| **ලාභය බෙදී යන ආකාරය** | | |
| කොටස්හිමියන්ට | **4,416.12** | 4,309.33 |
| එකතුව – වර්ෂය සඳහා වෙළෙඳපොල ගොඩනැගීමේ වියදම් | **324.81** | 175.37 |
| එකතුව – හානිකරණය සඳහා වෙන් කිරීම | **1,954.88** | 1,406.00 |
| එකතුව – වර්ෂය සඳහා විලම්භිත බදු ගාස්තු/(ප්‍රතිවර්ථනය) | **(1,182.29)** | 359.30 |
| | **5,513.52** | 6,250.00 |
| ආර්ථික පිරිවැය % (සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත්+අවදානම් වාරිකය සඳහා 2%) අනුපාතිකය | **10.73%** | 11.74% |
| ආර්ථික පිරිවැය | **3,508.66** | 3,423.76 |
| **එකතු කළ ආර්ථික අගය** | **2,004.86** | 2,826.24 |

## එකතු කරන ලද වෙළඳපොල වටිනාකම

මූලික ව්‍යාපාරික කටයුතු වර්ධනය සහ ලාභදායීත්වය ඉහළ යාම මධ්‍යයේ වුවද, වසර පුරා ප්‍රාග්ධන වෙළඳපොල තුළ පැවති මන්දගාමී තත්ත්වය සහ ලැයිස්තුගත සමාගම් බොහොමයක වෙළෙඳපොල මිළ ගණන්වලට සාපේක්ෂව සමාගමේ කොටස් මිල වර්ෂය තුළ පහත වැටුණි. මෙය හේතු කොටගෙන 2019 මාර්තු 31 දිනට එකතු කල වෙළෙඳපොල වටිනාකම පසුගිය වසරට සාපේක්ෂව අඩුවිය.

| වර්ෂය සඳහා | 2018/19 රුපියල් මිලියන | 2017/18 රුපියල් මිලියන |
|---|---|---|
| වෙළඳපොල ප්‍රාග්ධනීකරණය/කොටස් වෙළඳපොල අගය | **21,170.16** | 24,961.83 |
| අඩු කළා: කොටස් හිමියන්ගේ අරමුදල් | **28,603.36** | 27,029.82 |
| එකතුකරන ලද වෙළඳපොල වටිනාකම | **(7,433.20)** | (2,067.99) |

## සමූහයේ ප්‍රතිපල පිළිබඳ දළ විශ්ලේශණය

පීපල්ස් ලීසිං සමූහය 2019 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රුපියල් මිලියන 7,587.31ක් වූ බදු පෙර ලාභයක් සහ රුපියල් මිලියන 5,011.27 ක් වූ බදුපසු ලාභයක් වාර්තා කරන ලදී. විශේෂයෙන්ම නව ණය ආපසු ගෙවීමේ බද්ද හඳුන්වාදීමෙන් ඉහළ ගිය මූල්‍ය සේවා මත බදු, ඉහළ ගිය මෙහෙයුම් වියදම් සහ හානිකරණ පිරිවැය මධ්‍යයේ වුවද සමූහයේ බදු පෙර ලාභය පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 13.88%ක වර්ධනයක් වාර්තා කළේය.

එක් එක් පරිපාලිත සමාගමෙහි කාර්යසාධනය පිළිබඳ කෙටි විස්තරයක් අපගේ මාර්ගගත වාර්තාවේ දක්වා ඇත.

**ප්‍රධාන මූල්‍ය දර්ශනයන් – පීපල්ස් ලීසිං සමූහය**

| | 2018/19 | 2017/18 |
|---|---|---|
| **දර්ශකය** | | |
| වත්කම් මත ප්‍රතිලාභ (%) | **4.26** | 4.07 |
| හිමිකම් මත ප්‍රතිලාභ (%) | **16.21** | 17.67 |
| කොටසක ඉපැයීම (රුපියල්) | **3.05** | 3.05 |
| කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම (රුපියල්) | **19.44** | 18.16 |

හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය

# 15.88%

2017/18 - 16.66%



★

**This Annual Report is Carbon Neutral**

Produced by Smart Media (Pvt) Limited, a carbon neutral company that offsets its direct and indirect GHG emissions through verified sources.


SMART MEDIA
The ANNUAL REPORT Company

www.SmartAnnualReport.com

PARTNER Carbonfree Carbonfund.org

www.carbonfund.org

GSARN© www.gsarn.org

Global Standard Annual Report Number©
LKA8773PLFXX0180190S105

PEOPLE'S LEASING
පීපල්ස් ලීසිං | பீப்பள்ஸ் லீசிங்


**පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.**

1161, මරදාන පාර, කොළඹ 08, ශ්‍රී ලංකාව
තැපැල් කේතය 00800
දුරකථනය: +94 11 263 1631
ෆැක්ස්: +94 11 263 1980
ඊමේල්: plclease@plc.lk
වෙබ් ලිපිනය: www.plc.lk




පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.

වාර්ෂික වාර්තාව 2018/19

ආර්ථික ශක්‍යතාව, සමාජ වගවීම සහ පාරිසරික වගකීම පිළිබඳ අපගේ මූලික සාරධර්ම කෙරෙහි අප අවධානය සෑම විටම යොමු වී තිබේ.
අප ගමන් මග අගනාකම්/වටිනාකම්වලින් යුතු අවස්ථාවන් සහිතව නිර්මාණය කිරීමට අපි සෑම විටම උත්සුක වන්නෙමු.

2

Scan to view the online version
http://plc2018-19.annualreports.lk

# අප වටිනාකම් නිර්මාණය කරන ආකාරය

## පටුන

පළමු කොටස


අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය 01
අපගේ හයවන සංකලිත වාර්ෂික වාර්තාව 02
අප වටිනාකම් නිර්මාණය කරන ආකාරය 03

1

පුරාවෘත්තයක් ගොඩනැගීම
ජීපල්ස් ලීසිං ආයතනය පිළිබඳව 12
– වසරේ වැදගත් තොරතුරු 16
අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම
– සභාපතිගේ පණිවිඩය 18
අපගේ මෙහෙවරට අනුකූලව සිටීම
– ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය 20

2

වගකිවයුතු භාරකරුවන් වීම
අධ්‍යක්ෂ මණ්ඩලය 26
ආයතනික කළමනාකරණය 30
කළමනාකරණ මණ්ඩලය 32
අනුකූලතා කළමනාකරණය 35
ආයතනික පාලනය 37
සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 54

3

ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය
මෙහෙයුම් පරිසරය 62
අවදානම් සහ අවස්ථාවන් 64

4

පාර්ශ්වකරුවන්ගේ සබඳතා ශක්තිමත් කිරීම
පාර්ශ්වකරුවන් 68
ප්‍රමාණාත්මක කරුණු 70

5

අපගේ ගමන්මග තීරණය කිරීම
උපායමාර්ගික ගමන් මග 74
– අපගේ පරමාර්ථ 75
– අපගේ උපායමාර්ග 76

6

ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම
යෙදවුම් 80
වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම් 83
නිමැවුම් 146
ප්‍රතිඵල 148
බලපෑම 150

7

නොවෙනස්වූ ගමන් මග
අවදානම් කළමනාකරණය 154
අපගේ කාර්යසාධනය ඇගයීම 171

8 අනුකූලත්ව වාර්තා

ආයතනික පාලනය - ඇමුණුම් 183
විගණන මණ්ඩල කමිටු වාර්තාව 202
වේතන හා නාමයෝජනා කමිටු වාර්තාව 204
සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු පිළිබඳ කමිටු සමාලෝචන වාර්තාව 205
ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටු වාර්තාව 206

9 මූල්‍ය වාර්තා

මූල්‍ය දින දර්ශණය 212
මූල්‍ය වාර්තා සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම 213
ස්වාධීන ආරක්ෂණ වාර්තාව 214
අභ්‍යන්තර මූල්‍ය පාලනයට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රකාශනය 215
ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීන්ගේ වගකීම් ප්‍රකාශනය 216
ස්වාධීන විගණන වාර්තාව 217
මූල්‍ය ප්‍රකාශන - පටුන 220
ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනය 221
විස්තිරණ ආදායම් ප්‍රකාශනය 222
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 223
ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය 224
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 226
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 227

10 පරිපූරක තොරතුරු

ආයෝජක සබඳතාවන් 372
කාර්තුමය විශ්ලේෂණය 381
දස වසරක සාරාංශය 383
ලාභ අලාභ ප්‍රකාශය ඇමෙරිකානු ඩොලර් වලින් 385
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය ඇමරිකානු ඩොලර් වලින් 386
ස්වාධීන සහතිකකරණ වාර්තාව 387
ගෝලීය වාර්තාකරණ මුලපිරීම් දර්ශකය 388
අනුපාතවල පදනම 392
රැස්වීම පිළිබඳ නිවේදනය 393

ඇමුණුම්

පෙරකලාසි පත්‍රය

සාංගමික තොරතුරු පසුපස කවරයේ ඇතුල් පිටුව

8

# අනුකූලත්ව වාර්තා

**183**
ආයතනික පාලන – ඇමුණුම්

**202**
විගණන මණ්ඩල කමිටු වාර්තාව

**204**
වේතන හා නාමයෝජනා කමිටු වාර්තාව

**205**
සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු පිළිබඳ කමිටු සමාලෝචන වාර්තාව

**206**
ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටු වාර්තාව

තැන්පතු පදනම

# රු. බිලියන 88.37

2018 - රු. බිලියන 69.76



# ආයතනික පාලන - ඇමුණුම්

## ආයතනික පාලනය පිළිබඳ විශිෂ්ට ප්‍රතිපත්ති සංග්‍රහයට අනුගතවීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කල විශිෂ්ට ප්‍රතිපත්ති සංග්‍රහයට (සංග්‍රහය) අනුගත වීම - 2017

| ප්‍රතිපත්ති යොමුව | මූලධර්මතා අනුගතවීම් | අනුගතවීමේ තත්ත්වය |
|---|---|---|
| **සමාගම** | | |
| A | **අධ්‍යක්ෂවරුන්** | ✓ |
| A.1 | **අධ්‍යක්ෂක මණ්ඩලය**<br>පීපල්ස් ලීසිං හි අධ්‍යක්ෂ මණ්ඩලය විවිධ ශික්ෂණයන්ගෙන් යුතු විශිෂ්ට වෘත්තිවේදීන් අට දෙනෙකු ගෙන් සමන්විත අතර සමාගමේ අරමුණු ඉටු කර ගැනීම සහතික කිරීම සඳහා ඔවුන් කාර්යක්ෂමව හා කැපවීමෙන් යුතුව කටයුතු කරයි. සියලු අධ්‍යක්ෂවරුන් හැකියා, පළපුරුදු සහ දැනුම සහිත අවංකත්වය පිළිබඳ මනා හැඟීමකින් හා සමාගම සඳහා ස්වාධීන විනිශ්චයක් මගින් නායකත්ව සපයන පුද්ගලයන් වනු ඇත. | |
| A.1.1 | **නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම**<br>වර්ෂය තුළ සියලු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා අවශ්‍ය වන තොරතුරු කල්වේලා ඇතිව ලබා දීම හා අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ වගකීම් කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 13 ක් පැවැත්වීමට යෙදුනි. "අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්" පිටුව 76 දක්වා ඇත. | ✓ |
| A.1.2 | **අධ්‍යක්ෂ මණ්ඩල භූමිකාව හා වගකීම්**<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම් සහ කාර්යයන් දක්වෙන පිටු 44 හි සාරාංශගත කිරීම හා යාවත්කාලීන කිරීම මගින් සංස්ථාපිත පාලනය පිළිබඳ විශිෂ්ට ප්‍රතිපත්ති සංග්‍රහයහි අවශ්‍යතාවලට අනුගත වීම. | ✓ |
| A.1.3 | **රටේ නීතියට අනුව කටයුතු කිරීම**<br>අධ්‍යක්ෂ මණ්ඩලය පූර්ණ වශයෙන් මෙන්ම තනි තනිව රටේ නීතියට අනුගත වන අතර එම රීතී බොහෝමයක් සමාගමට අදාළ වනු ඇත. සමාගමේ සාමූහික පාලන පඤ්ප්තියේ සහ ව්‍යාපාර ප්‍රතිපත්ති සංග්‍රහය සහ සදාචාර හැසිරීම පැහැදිලිව පිහිටුවා ඇති අතර අනුමැතිය ද ලැබී ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන වෘත්තීය උපදෙස් අංශය අවස්ථාවන්හඳී ඒවා පරිහරණයට ගත හැකි ආකාරයට පවත්වා ගනී. | ✓ |
| A.1.4 | **සමාගමේ ලේකම්ගේ සේවය ලබාගැනීම සහ ලේකම් ඉවත් කිරීම**<br>වෘත්තියෙන් නීතිඥයෙකු වන සමාගමේ ලේකම්ගේ සේවය සියලු අධ්‍යක්ෂකවරුන්ට ලබා ගැනීමේ හැකියාව ඇත. සමාගමේ ලේකම්වරයෙකු පත් කිරීම හා ඉවත් කිරීම අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීමක් වනු ඇත. | ✓ |
| A.1.5 | **අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීන විනිශ්චයන්**<br>කිසිවෙකු වෙත අධික විශ්වාසයක් නොතබා සෑම අධ්‍යක්ෂවරයෙකුගේම ශක්තීන් ලබා දිය හැකි වන ලෙස අධ්‍යක්ෂ මණ්ඩල කාර්යක්ෂම හා අන්‍යෝන්‍ය බැඳියාවක් ලෙස ඒකකයක් ලෙස කටයුතු කරනු ඇත. | ✓ |
| A.1.6 | **ප්‍රමාණවත් කාලයක් හා පරිශ්‍රමයක් අධ්‍යක්ෂ මණ්ඩල කරුණු කෙරෙහි යොමු කිරීම**<br>සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය දින 13 කදී මුණගැසී ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සැලකිය යුතු කාලයක් මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් හා වගකීම් කාර්යක්ෂමව ලබාදීමට උපරිම සහායක් ලබා දීම මගින් වෙන්කර ඇත. | ✓ |
| A.1.7 | **සමාගමේ උපරිම වාසිය පිණිස අධ්‍යක්ෂක යෝජනා සම්මත වීම**<br>සමාගමේ උපරිම ලාභය පිණිස අධ්‍යක්ෂවරුන් 1/3ක් කොටසකින් යෝජනාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කළ හැක. කෙසේ වුව ද සමාලෝචන වර්ෂය තුළ එවැනි තත්ත්වයක් දක්නට නොලැබුණි. | ✓ |
| A.1.8 | **අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා හඳුන්වාදීම හා පුහුණු කිරීම**<br>"හඳුන්වාදීම් හා කරගෙන යන පුහුණු කිරීම්" පිටු 45 යොමු වන්න | ✓ |
| A.2 | **සමාගමේ ව්‍යාපාරික කටයුතු කළමනාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විධායක වගකීම් විභේදනය කිරීම**<br>"සභාපති හා ප්‍රධාන විධායක" පිටු අංක 43 යොමු වන්න | ✓ |
| A.3 | **යහපත් සංස්ථාපිත පාලනයක් ඉදිරිපත් කිරීම සඳහා සභාපති කාර්යභාරය**<br>යහපත් සංස්ථාපිත පාලනයක් ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ නායකත්වය ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු සලසා පහසුකම් සැපයීම සහතික කිරීම සභාපතිවරයාගේ වගකීම වේ. තවද සමාගම සඳහා තර්කාන්විත නායකත්වයක් සැපයීම, හා කොටස්කරුවන්ගේ හා අනෙකුත් පාර්ශ්ව දර්ශනය අවබෝධ කර ගැනීමට ද අපේක්ෂා කරනු ඇත. "සභාපති කාර්යභාරය" පිටුව 543 කොටසට යොමු වන්න. | ✓ |

# ආයතනික පාලන - ඇමුණුම්



| ප්‍රතිපත්ති යොමුව | මූලධර්මතා අනුගතවීම් | අනුගතවීමේ තත්ත්වය |
|---|---|---|
| A.4 | **මූල්‍ය බුද්ධිය හා දැනුම අධ්‍යක්ෂක මණ්ඩලය තුළම පැවතීම** | ✓ |
| | "මූල්‍ය බුද්ධිය" පිටුව 44 යොමුව | |
| A.5 | **අධ්‍යක්ෂක මණ්ඩල සමබරතාවය** | |
| | **අධ්‍යක්ෂක මණ්ඩලය තුළ බුද්ධිය වන විධායක නොවන අධ්‍යක්ෂකවරු** | |
| | 2018/19 වර්ෂය තුල, අධ්‍යක්ෂක මණ්ඩලය තුළ, පුළුල් මාතෘකාවක් යටතේ පෙලගැසුණු එමෙන්ම අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය සඳහා සැළකිය යුතු වරක් තැබිය හැකි අදහස්, දැනුම හා පළපුරුද්ද විෂය වූ පූර්ණ වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂකවරුන් ද (වි.නො.අ.) අන්තර්ගත විය. | ✓ |
| | **විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ගේ ස්වාධීනත්වය** | |
| | පටිපාටිය තුළ වූ අවශ්‍යතාවයන්ට අනුව, අධ්‍යක්ෂක මණ්ඩලය තුළ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂකවරුන් (ස්.වි.නො.අ.) 5 දෙනෙකු අන්තර්ගත විය යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය තුළ අන්තර්ගත වූයේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂකවරුන් (ස්.වි.නො.අ.) 3 දෙනෙකු පමණි. සමාගම මෙම අඩුපාඩුව සඳහා කඩිනම් අවධානය යොමුකර, එය අවම කිරීම සඳහා මූලික පියවරයන් සළකා බැලීමෙන් ඉක්බිතිව 2019 ජූනි 13 වන දින වනවිට ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂකවරුන් 4 දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරනු ලැබීය. | |
| | ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂකවරුන් 4 දෙනා ස්වාධීනත්වය සම්බන්ධයෙන් වූ පටිපාටින් තුළ අන්තර්ගත නිර්නායකයන්ට අනුකූල ලෙස කටයුතු කළ අතර, කළමනාකරණයෙන් ස්වාධීන, ව්‍යාපාර කටයුතුවලින් නිදහස් හෝ අනෙකුත් ප්‍රමාණිකව මැදිහත්වන සීමාවලින් මිදුන හා ස්වාධීන විනිශ්චය කෙරෙහි බලපාන ක්‍රියාකාරකම්වලින් නිර්මුක්ත අය වෙති. | ✓ |
| | සියලුම විධායක නොවන අධ්‍යක්ෂකවරු ස්වයං අනාවරණයන් සිදු කිරීම හා එවැනි හෙළිදරව් මත පදනම්ව විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳව, පටිපාටින්හි දක්වන ලද නිර්ණායකයන්වලට අනුකූලව වන ආකාරයට වාර්ෂිකව ඇගයීමකට භාජනය කෙරේ. | ✓ |
| | **විකල්ප අධ්‍යක්ෂකවරු සහ ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂක** | |
| | 2018/19 වර්ෂය තුළදී විකල්ප අධ්‍යක්ෂකවරුන් පත්කර නැත. | ✓ |
| | සභාපති ස්වාධීන නියෝජිතයෙකු නොවන හෙයින් සමාගම විසින් විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකු (එම්.පී. අමිර්තනායගම් මහතා) ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත් කරනු ලැබීය. අධ්‍යක්ෂක මණ්ඩලය ජ්‍යෙෂ්ඨ විධායක නොවන අධ්‍යක්ෂකවරයා සඳහා බලතල සහිත කාලයක් අනුමත කිරීම හා අනෙකුත් විධායක නොවන අධ්‍යක්ෂකවරුන් සමඟ රහස්‍ය සාකච්ඡා සඳහා ඔහුගේ සේවය ලබාගත හැකිවන ආකාරයට සූදානමක් ඇතිව සිටින ලෙස ඉල්ලා සිටින ලද අතර, විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ගේ අවධානයට යොමු වුවද අධ්‍යක්ෂක මණ්ඩලයේ අවධානයට පූර්ණ ලෙස භාජනය නොවූ කරුණු සහ අවශ්‍ය වූ විට, හෝ අවශ්‍ය වේ යැයි ඔහුට හැඟෙන කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා සඳහා කැඳවීමක් කිරීමටද අවස්ථාව ලබා දී ඇත. | ✓ |
| | වාර්ෂික මහසභා රැස්වීම සඳහා ජ්‍යෙෂ්ඨ විධායක නොවන අධ්‍යක්ෂවරයා පෙනී සිටි අතර, කොටස්හිමියන්ගේ විවිධ අදහස් දැක්වීම හා ගැටළු සම්බන්ධයෙන් ප්‍රශ්නකාරී වන අවස්ථාවන්හීදී ඒ සඳහා ජ්‍යෙෂ්ඨ විධායක නොවන අධ්‍යක්ෂකවරයාට මැදිහත්වීමට අවස්ථාව ලබා දී ඇත. | ✓ |
| | අධ්‍යක්ෂකවරුන් සැළකිල්ලක් දක්වන අදාළ වූ ද නොවිසුඳුනු කරුණු පිළිබඳ සාකච්ඡා කරනු ලබන අතර, සාකච්ඡා ප්‍රකාශ සටහන් සමාගමේ ලේකම් විසින් ප්‍රමාණවත් විස්තර සහිතව වාර්තාගත කරනු ඇත. එම කරුනු සම්බන්ධයෙන් වූ වැඩිදුර වාර්තාවන් නැවත පවත්වන ආසන්නතම රැස්වීම් වාරයේදී විසඳුමක් ලබාගැනීමේ අදහස් ඇතිව සාකච්ඡාවට ගනු ඇත. | ✓ |
| A.6 | **තොරතුරු සැපයීම** | ✓ |
| | "තොරතුරු සැපයීම" පිටුව 47ට යොමු වන්න. | |
| A.7 | **අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම** | |
| | "අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීම හා නැවත පත්වීම" පිටුව 44 ට යොමු වන්න, හා පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටු වාර්තාව" පිටුව 204 ට යොමු වන්න. | |
| A.8 | **නැවත පත්වීම** | ✓ |
| | සාංගමික ව්‍යවස්ථාවලියේ 27(2) වගන්තියේ නියමයන්ට වර්ෂය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයට අනුකූලව පත්වී ඇති සියලු අධ්‍යක්ෂකවරුන් ඊළඟ මහසභා රැස්වීම් වාරයේදී විශ්‍රාම ගතයුතුයි. එමෙන්ම ඔවුන්ගේ නැවත පත්වීම් සඳහා සුදුසුකම් ලැබීම කොටස්හිමියන්ගේ කැමැත්ත මත සිදු වේ. | |
| | කෙසේ වුවද, විධායක නොවන අධ්‍යක්ෂකවරුන් පත්කිරීම නිශ්චිත කාලසීමාවකට අනුව සිදු නොකරන අතර, සාංගමික ව්‍යවස්ථාවලිය හා සමාගම් පනත යටතේ දක්වා ඇති අධ්‍යක්ෂකවරු ඉවත් කිරීම සඳහා වූ විධිවිධානයන්ට අනුකූලව වාර්ෂික මහසභා රැස්වීමේදී ඔවුනගේ නැවත පත්කිරීම සිදුවනු ඇත. | |
| | සමාලෝචිත වර්ෂය තුළ ආචාර්ය ඒ.ඒ.එස් ගුලාම් හුසේන් ඔහුගේ අධ්‍යක්ෂක මණ්ඩල සේවයෙන් ඉවත්වීම දැනුම්දෙනු ලැබීම අධ්‍යක්ෂක මණ්ඩල සභා වාරයට පෙර සභාගත කළ අතර, එය අනුමැතිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමුකරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව සේවයෙන් ඉවත්වීම පිළිගනු ලැබූ අතර, අප්‍රමාදව මහජනයා දැනුවත් කිරීමට අදාළ අනාවරණය කොළඹ කොටස් හුවමාරු මගින් සිදු කරන ලදී. | |

# ආයතනික පාලන - ඇමුණුම්

| ප්‍රතිපත්ති යොමුව | මූලධර්මතා අනුගතවීම් | අනුගතවීමේ තත්ත්වය |
|---|---|---|
| A.9 | **අධ්‍යක්ෂ මණ්ඩල කාර්යයන් ඇගයීම**<br>"අධ්‍යක්ෂ මණ්ඩල කාර්යයන් ඇගයීම" පිටුව 48 සහ 49 යොමු වන්න. | ✓ |
| A.10 | **අධ්‍යක්ෂවරුන් සම්බන්ධ තොරතුරු අනාවරණය**<br>පටිපාටින්හි දක්වන ආකාරයට සමාගම අධ්‍යක්ෂකවරුන් සම්බන්ධයෙන් වූ තොරතුරු පහත වගන්තීන් යටතේ අනාවරණය කරන ලදී:<br>• "අධ්‍යක්ෂක මණ්ඩල ආකෘතිය" පිටු අංක 27 සහ 28<br>• "සම්බන්ධ පාර්ශ්ව අනාවරණයන්" මූල්‍ය ප්‍රකාශනවලට සටහන් පිටු අංක 340 සිට 344<br>• අධ්‍යක්ෂක මණ්ඩල අනුකමිටු" පිටුව 45<br>• අධ්‍යක්ෂක මණ්ඩල හා අධ්‍යක්ෂක මණ්ඩල කමිටු රැස්වීම්වලට සහභාගිත්වය" පිටුව 48 | ✓ |
| A.11 | **ප්‍රධාන විධායක ඇගයීම (ප්‍ර.වි.)**<br>"ප්‍රධාන විධායක/සාමාන්‍යාධිකාරි ඇගයීම" පිටුව 49 ට යොමුවන්න. | ✓ |
| **B** | **අධ්‍යක්ෂක පාරිශ්‍රමිකයින්** | |
| B.1 | පාරිශ්‍රමික පටිපාටිය<br>සමාගම වියහැකි අයිතීන් සම්බන්ධ ගැටුම් මගහැරවීම සඳහා යොමු වූ කාර්යක්ෂම පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීමෙහිලා විධිමත් හා විනිවිදභාවයක් සහිත පාරිශ්‍රමික පටිපාටියක් පිහිටුවන ලදී. ලේඛණගත කළ නිර්දේශ යොමුවක් හා පූර්ණ වශයෙන් වූ විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ගෙන් සමන්විත පාරිශ්‍රමික කමිටුවක් අධ්‍යක්ෂ මණ්ඩලය පිහිටුවා ගෙන ඇත.<br>2018/19 වර්ෂය තුළ සමාගම අධ්‍යක්ෂ මණ්ඩලය තුළ විධායක අධ්‍යක්ෂකවරුන් අන්තර්ගත නොවුණු අතර, එබැවින් ඔවුන්ගේ පාරිශ්‍රමිකයන් වැඩිනොවූ බැවින් සභාපති සහ/හෝ ප්‍රධාන විධායක උපදෙස් සඳහා යොමුවීම අවැසි විය. | ✓ |
| B.2 | ප්‍රාරිශ්‍රමික මට්ටම්<br>විධායක හා විධායක නොවන අධ්‍යක්ෂක පාරිශ්‍රමිකයන් වෙළෙඳපොල අපේක්ෂාවන් ප්‍රතිබිම්බනය වන ආකාරයට සහ ව්‍යාපාර මෙහෙයවීමට සහ සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීමට හැකියාවක් ඇති ගුණාත්මක පුද්ගලයින් ආකර්ශනය කර ගැනීමට හා රඳවා ගැනීමට ප්‍රමාණවත්වීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය පරික්ෂාකාරී වේ.<br>එබැවින් සමාගමේ පාරිශ්‍රමික ව්‍යුහය කාලානුරූපව වෙනත් සමාන ආයතනයන්හි සමාන තනතුරු සම්බන්ධයෙන් වූ පාරිශ්‍රමික සමග සසැඳීම් කර සමාලෝචනය කරනු ඇත .<br>එකිනෙකට අන්‍යෝන්‍ය වූ අපේක්ෂාවන් සහිත එමෙන්ම කරමින් හා ප්‍රමාණයෙන් කුඩා සමූහය තුළ පවතින අනෙකුත් ආයතනවල වැටුප් වර්ගික මට්ටම් තීරණය කිරීමේදී අනුව බර තැබීමක් සිදුකරනු ඇත. කෙසේ වුවද සමාගම් සමූහය තුළ ස්ථාවර පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් නඩත්තු කිරිමට ඉමහත් පරිශ්‍රමයක් ගනු ලැබේ.<br>වර්තමානයේදී සමාගම විසින් කිසිදු කොටස් හිමිකම් ප්‍රදානය කිරීමේ ක්‍රමවේදයක් අධ්‍යක්ෂකවරුන් හෝ සේවකයින් සඳහා හඳුන්වා දී නැත. | ✓ |
| B.3 | **පාරිශ්‍රමිකයින් පිළිබඳ අනාවරණය**<br>පටිපාටින්හි නිර්දේශකර ඇති ආකාරයට අධ්‍යක්ෂකවරුන්ගේ පාරිශ්‍රමිකයන්ට අදාළ කාර්යපටිපාටීන් හා අනාවරණයන් වාර්ෂික වාර්තාවේ පහත දැක්වෙන ඡේද යටතේ පෙන්නුම් කෙරේ:<br>• "අධ්‍යක්ෂක හා විධායක පාරිශ්‍රමික හා ප්‍රථිලාභ" පිටුව 49<br>• "සබඳතා දක්වන පාර්ශ්ව අනාවරණයන්" මුල්‍ය ප්‍රකාශනවලට සටහන් පිටුව 49<br>• "පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටු වාර්තාව" පිටුව 204 | ✓ |
| **C** | **කොටස්හිමියන් සමග සම්බන්ධතාවය** | |
| C.1 | වාර්ෂික මහා සභා රැස්වීම ඵලදායී ලෙස භාවිතය<br>අධ්‍යක්ෂක මණ්ඩලය වාර්ෂික මහසභා රැස්වීමක් තුළින් කොටස්හිමියන්ට සාමූහික ප්‍රතිඵල සන්නිවේදනය කරමින් සහ ඔවුන්ගේ ක්‍රියාකාරි සහභාගීත්වය ධෛර්යමත් කිරීමට කටයුතු කරනු ඇත. වාර්ෂික වාර්තාව තුළ රැස්වීම පිළිබඳ දැනුම්දීමක් සමග වූ පෙරකලාසි පත්‍රයක් මහසභා රැස්වීමට පෙර වැඩකරන දින 15කට පූර්වයෙන් ව්‍යවස්ථාවේ දැක්වෙන පරිදි කොටස්හිමියන්ට යවනු ඇත.<br>සමාගම විසින් වැදගත්කමක් දරන වෙන් වූ ගැටළු සහ වෙන් වෙන්ව යෝජනා ඉදිරිපත් කිරීම හා ඒ අනුව ඒ ඒ යෝජනා සඳහා ඡන්දය භාවිතා කිරීම සඳහා කොටස්හිමියන්ට අවස්ථාවක් ලබාදීම යෝජනා කෙරුණි. අධ්‍යක්ෂක මණ්ඩල වාර්ෂික වාර්තාව පිළිගැනීම, සමාගම් මුල්‍ය වාර්තා සහ විගණකවරුන්ගේ වාර්තා වෙන් වෙන්ව සලකා බලන යෝජනා ලෙස පිළිගැනුණි.<br>මහසභා රැස්වීමේදී පෙරකලාසි ඡන්දය, කොටස්හිමියන්ගේ ඡන්දය සහ එම යෝජනා සඳහා සලකා බලන ලදී. | ✓ |

# ආයතනික පාලන - ඇමුණුම්

අනුකූලත්ව වාර්තා

| ප්‍රතිපත්ති යොමුව | මූලධර්මතා අනුගතවීම් | අනුගතවීමේ තත්ත්වය |
|---|---|---|
| | සමාගම සියලුම පෙරකලාසි ඡන්ද වාර්තා කරගන්නා අතරම, එම ඡන්ද සභාපති අවධානයට යොමුකර සෑම යෝජනාවකටම ලැබී ඇති පෙරකලාසි ඡන්ද මට්ටම අනුව සහ එම යෝජනාවට පක්ෂව හා ප්‍රතිපක්ෂ ලැබුණු ඡන්ද ප්‍රමාණය දැක්වීමට කටයුතු කරයි.<br>"අත්හිටවූ ඡන්ද" යෝජනාවන්ට පක්ෂව හෝ විපක්ෂව ලැබුණු ඡන්ද ගණනයේදී නොසලකා හරිනු ඇත.<br>අධ්‍යක්ෂක මණ්ඩල සභාපති වාර්ෂික මහසභා රැස්වීමේදී අධ්‍යක්ෂක මණ්ඩල අනුකමිටු සභාපති හා ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂක කොටස්හිමියන් විසින් නගන ප්‍රශ්න සඳහා ප්‍රතිචාර දැක්වීමට ඉදිරිපත්වීම සහතික කරනු ඇත.<br>2018 ජුනි 29 වන දින පවත්වන්නට යෙදුන පසුගිය වර්ෂයට අදාළ වූ මහසභා රැස්වීමේදී ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂක හා අධ්‍යක්ෂක මණ්ඩලය අනුකමිටු සභාපති ඉදිරිපත්ව සිටිනු ලැබු අතර, කොටස්හිමියන්ගෙන් ඔවුන් වෙත කිසිදු විමසීමක් ඉදිරිපත් නොකරන ලදී. | |
| C.2 | **කොටස්හිමියන් සමග සන්නිවේදනය**<br>විවිධ පාරිභෝගිකයින් සමග පවත්වන දෙවාර්ගික වූ සන්නිවේදනයේ වැදගත්කම පිළිබදව අවබෝධ කරගනු ලදුව අධ්‍යක්ෂක මණ්ඩලය සිය ව්‍යාපාරික පාර්ශ්වයන් සමඟ මෙන්ම වෙනත් ව්‍යාපාරික පාර්ශ්වයන් සමග සන්නිවේදනය සඳහා කාර්යක්ෂම සන්නිවේදන ප්‍රපිපත්තියක් නිර්මාණය කරනු ලැබීය. සන්නිවේදන ප්‍රතිපත්තිය මඟ පෙන්වනු ලබන මූලධර්ම 4ක් මත පදනම්ව ඇත. ඒවායේ කාර්යක්ෂමතාවය, විනිවිධභාවය, පැහැදිලිභාවය හා සංස්කෘතික අවබෝධය සහ පසු විපරම යනාදියයි.<br>සමාගමේ ස්ථාපිත පාලන ප්‍රඥප්තියේ පූර්ණ අංගය වන සන්නිවේදන ප්‍රතිපත්තිය අධ්‍යක්ෂක මණ්ඩල සමාලෝචනයට යොමුවූ අතර, ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලැබිණි.<br>සමාගම් ලේකම් හා සංස්ථාමය කටයුතු පිළිබඳ අංශය කොටස්හිමියන්ගෙන් යොමුවන ලිපිලේඛණ සම්බන්ධ වාර්තා නඩත්තු කරන අතර ඒවා ඔබින සන්නිවේදන මාධ්‍යයකින් යෝජනා සඳහා යොමු කරනු ඇත.<br>කොටස්හිමියන්ගේ මතභේදයට යොමු වූ හා උනන්දුවක් දක්වන සියලු කරුණු අධ්‍යක්ෂක මණ්ඩලයට යොමුවනු ඇත.<br>ඉහත දැක්වූ පරිදි කොටස්හිමියන්ට අදාළ වන මතභේදාත්මක/සැළකිලිමත්වන කරුණු සම්බන්ධව අධ්‍යක්ෂක මණ්ඩලයෙන් හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයකින් ලැබී ඇති උපදෙස් මත, සමාගම් ලේකම් හෝ සංස්ථාමය කටයුතු අංශය ප්‍රමාණවත් ප්‍රතිචාර සමඟින් අදාළ කොටස් හිමියා වෙත යොමු වේ.<br>කොටස්හිමියන් තමන්ට අදාළ කරුණු සම්බන්ධව සමාගම් ලේකම් හා සම්බන්ධ වියහැකි අතර, ඔහු පිළිබඳ විස්තර පහතින් දක්වා ඇත.<br>ලක්මිණී කෝට්ටේගොඩ මෙනෙවිය<br>සමාගම් ලේකම්<br>පීපල්ස් ලීසිං සමාගම<br>1161, මරදාන පාර, කොළඹ 8, ශ්‍රී ලංකා<br>දුරකථනය – +94 11 263 1103<br>ෆැක්ස් – +94 11 248 1500<br>සාමාන්‍ය සන්නිවේදන මාධ්‍යයන් මගින් විසඳිය නොහැකි කිසියම් ප්‍රධාන ගැටලුවක් සම්බන්ධව කොටස්හිමියන් සමග සාකච්ඡා කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂකවරයා සූදානම්ව සිටිනු ඇත. | ✓ |
| C.3 | **ප්‍රධාන හා ප්‍රමාණාත්මක ගනුදෙනු**<br>ශක්තිමත් හා විනිවිදභාවයක් සහිත අනාවරණයන් කොටස්කරු අයිතීන් දැක්වීම සඳහා කොටස්කරුවන්ට කේන්ද්‍රිය වන සාධකයක් බව අධ්‍යක්ෂක මණ්ඩලය හඳුනාගෙන ඇත.<br>2007 අංක 01 දරන සමාගම් පනතේ වගන්ති 185 න් දක්වා ඇති ආකාරයට වර්ෂය තුළ සමාගමට බලපාන හෝ සමාගම විසින් සිදුකරනු ලැබූ ප්‍රධාන හා ප්‍රමාණාත්මක ගනුදෙනු කිසිවක් නොමැත. | ✓ |
| D | **වගකිවයුතු බව සහ විගණනය** | |
| D.1 | **මූල්‍ය හා ව්‍යාපාර වාර්තාකරණය (වාර්ෂික වාර්තාව)**<br>සමාගමේ මූල්‍ය තත්ත්වය, මෙහෙයුම් ප්‍රතිපල, ව්‍යාපාර ආකෘති, පාලන ව්‍යුහය, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ අභියෝග, අවශ්‍යතාවන් සහ අපේක්ෂාවන් සම්බන්ධව සමබර සහ අවබෝධකර ගතහැකි තක්සේරුවක් ඉදිරිපත් කිරීමේ වගකීම පිළිබඳ අධ්‍යක්ෂවරුන් දැනුවත්ව සිටී.<br>වාර්ෂික වාර්තාව ඇතුළත සියලු ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අවනතව සිටීම සහතික කරනුවස් යෝග්‍ය අවධානයෙන් සිටීම අභ්‍යාස කරනු ඇත. කාලානුරූපව අතරමැදි ගිණුම් වාර්තා පල කිරීම, නියාමන වාර්තා යෝග්‍ය දිනයන්හීදි ගොනු කිරීම, අදාළ මූල්‍ය කාලසීමාව ආවරණය කරන මූල්‍ය වාර්තා අනුමත කිරීමට පෙර සිදුවිය යුතුය. අධ්‍යක්ෂක මණ්ඩලය ප්‍රධාන විධායක නිලධාරි හා ප්‍රධාන මූල්‍ය නිලධාරි යන නිලධාරින්ගේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳව ඔවුන්ට ඇති වගකීම සම්බන්ධ අනාවරණයක් ලබාගනු ඇත .<br>සමාගම සම්බන්ධ පාර්ශ්ව සමග කරන්නා වූ ගනුදෙනු සම්බන්ධ ප්‍රතිපත්තියක් (ස.පා.ග.) ස්ථානගත කරඇති අතර, එමගින් ප්‍රමාණවත් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හෙළිදරව්වක් ද කර ඇත.<br>සමාගම් මෙහෙයුම් ව්‍යවස්ථාව සහ ආචාරධර්මයන් (ව්‍යවස්ථාව) නියම කරඇති ආකාරයට ඔහු/ඇය විභව්‍ය හෝ සත්‍ය ව්‍යාපාර පක්ෂපාතීත්වයට එදිරිව ගැටීම් කෙරෙහි ඔවුන්ගේ පෞද්ගලික සම්බන්ධතාවයන්, බාහිර සම්බන්ධතාවයන් හා ඔහු/ඇයගේ ස්වාධීන විනිශ්චය කෙරෙහි බලපවත්වන ප්‍රමාණාත්මක කරුණු සම්බන්ධයෙන් වූ උනන්දුව ආදී කරුණු පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම තහවුරු කළ යුතුය. තවද ව්‍යවස්ථා නියාමනය අනුව එවැනි ව්‍යාපාර පක්ෂපාතීත්වය කෙරෙහි ගැටෙන එවැනි විභව්‍ය හෝ සත්‍ය සම්බන්ධතා ඇති අධ්‍යක්ෂකවරයෙකු වේ නම් ඒ පිළිබඳව දැනුවත් වූ වහාම අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් කළයුතු අතර, ඒ සම්බන්ධයෙන් වූ වාර්තා නඩත්තු කිරීම සමාගමේ ලේකම් විසින් කරන අතර, ඒ සඳහා වූ අයිතීන් සම්බන්ධ රෙජිස්ටරයෙහි ඇතුළත කරනු ඇත. | ✓ |

# ආයතනික පාලන - ඇමුණුම්

<table>
<tr><th>ප්‍රතිපත්ති යොමුව</th><th>මූලධර්මතා අනුගතවීම්</th><th>අනුගතවීමේ තත්ත්වය</th></tr>
<tr><td></td><td>

ව්‍යවස්ථාවේ දක්වා ඇති ආකාරයට වාර්ෂික වාර්තාවේ අඩංගු වියයුතු හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයක් පහත දැක්වෙන පරිච්ඡේදයන්හි ඇතුළත් කර ඇත:

- "සමාගමේ සම්බන්ධතාවයන් සම්බන්ධ අධ්‍යක්ෂක මණ්ඩල වාර්ෂික වාර්තාව" පිටු 54 සිට 59
- "මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් වු අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම" පිටුව 213
- "මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රකාශය" පිටුව 215
- "ස්වාධීන විගණක වාර්තාව" පිටුව 219 සිට 221
- "අපගේ ගමන්මඟ තීරණය කිරීම" පිටු 74 සිට 79 සහ "ක්‍රියාකාරී ලෙස ව්‍යාපාරයේ යෙදීම" පිටු 80 සිට 152
- "සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව" පිටුව 205
- "සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම" මූල්‍ය ප්‍රකාශනවලට සටහන් " පිටු අංක 342 සිට 346

</td><td></td></tr>
<tr><td>D.2</td><td>

**අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලනය**

සමාගමේ මුලෝපායික අරමුණු ඉටුකර ගැනීමෙහිලා සහ ප්‍රමාණවත් කාර්යක්ෂමතාවය සමාලෝචනය කිරීම සඳහාවූත් අභ්‍යන්තර පාලන පද්ධතියක් නඩත්තු කරන බවට සහතිකවීම පිණිස අවදානම් රුචිය තීරණය කිරීම අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීමකි.

කණ්ඩායම කෙරෙහි බලපවත්නා වු අවදානම් හඳුනාගැනීමට සහායවීම, ඇගයීම් හා කළමනාකරණය සඳහා සමාගමේ අභ්‍යන්තර පාලනයන් නිර්මාණය කර ඇත. එය මූල්‍යමය, ක්‍රියාන්විත, අනුකූලතාවය සහ තොරතුරු තාක්ෂණ පාලනය ආවරණය කරනු ඇත. එමෙන්ම අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් හා යාන්ත්‍රණය ද සලකා බලනු ඇත .

අවදානම් හා පාලනයේ අඛණ්ඩව සමාලෝචනයට හා විමර්ශනයට භාජනය කරමින් අදාළත්වය හා කාර්යක්ෂමතාවය පිළිබඳ පරීක්ෂාවන් සිදුකරනු ඇත. සංයුක්ත අවදානම් කළමනාකරණ කමිටුව (අයි.ආර්.එම්.සී.) සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (බී.ඒ.සී.) මේ සම්බන්ධ අධ්‍යක්ෂක මණ්ඩලයට උපකාරි වේ.

තවදුරටත් සමාගමට අයත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තරය තුළ ස්ථානගතව ඇත. සමාගමේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව අවදානම් කළමනාකරණ පියවරයන් සහ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර පාලන පද්ධතිය නිරතුරුව සමාලෝචනය කරන අතර, ඔවුන්ගේ තීරණයන් සම්බන්ධ වාර්තා අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුවට වාර්තා කරනු ඇත. ඒ අනුව අධ්‍යක්ෂක මණ්ඩලය නියෝජනය කරමින් අයෙකු විස්තරාත්මක සමාලෝචනයක් සහ විමර්ශණයක් අදාළව දක්වන ලද පාලනයන් හා අවදානම් කළමනාකරණ පියවරයන් සම්බන්ධයෙන් සිදු කරනු ලබයි. අභ්‍යන්තර පාලනයන් හා අවධානම් කළමනාකරණ කාර්යයන් සම්බන්ධ කමිටු තීරණයන් අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටු රැස්වීම් ප්‍රගති වාර්තාව සමග කාලානුරූපව පවත්වන්නට යෙදෙන අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් සඳහා ඉදිරිපත් කෙරේ.

යොමුවීම

- "අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටු වාර්තාව" පිටු අංක 202 සිට 203
- "ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව" පිටු 206 සිට 208
- "මුල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය" පිටුව 215

</td><td>✓</td></tr>
<tr><td>D.3</td><td>

**විගණන කමිටුව**

මුල්‍ය වාර්තාකරණයේ පොදු ප්‍රමාද දෝශයක්, අභ්‍යන්තර හා බාහිර විගණනයට අදාළ වන අභ්‍යන්තර පාලනයන් හා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුව අධ්‍යක්ෂක මණ්ඩලයට සහාය වේ. අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටු ව්‍යවස්ථාව කාලානුරූපව සමාලෝචනය කරන අතර, අධ්‍යක්ෂක මණ්ඩල එකගත්වය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු නිර්දේශයන්ට පැහැදිළිවම යොමුවී සංශෝධනය සිදුකරනු ඇත. ව්‍යවස්ථාවෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ක්‍රියාකාරකම් ව්‍යවස්ථාවලියෙන් හා ශ්‍රී ලංකා මහ බැංකු නිර්දේශයන් මත ඒකාග්‍රවීම පැහැදිලි කෙරේ.

2019 මාර්තු 31 දිනට අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුවට සාමාජිකයින් 3 දෙනෙකු අන්තර්ගත විය. මෙම සාමාජිකයින් සියලු දෙනාම විධායක නොවන අධ්‍යක්ෂකවරු විය. එක් කමිටු අධ්‍යක්ෂකවරයෙකු ස්වාධින විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකු විය. 2019 ජුනි 13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අම්ර්තනායගම් මහතා ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකුවීම මත අධ්‍යක්ෂක මණ්ඩල විධායක කමිටුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත විය.

අධ්‍යක්ෂක විගණන කමිටු සභාපතිවරයා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ (CIASL) ජ්‍යෙෂ්ඨ පුර්ණකාලීන සාමාජිකයෙකු වන අතර, මහා බ්‍රිතාන්‍යයේ වරලත් කළමනාකාර ගණකාධිකාරවරුන්ගේ ආයතනයේද ජ්‍යෙෂ්ඨ පුර්ණකාලීන සාමාජිකයෙකු වේ. (FCMA) එමෙන්ම ඔහු වර්ෂ 33 කට වඩා පුළුල් මුල්‍ය හා කළමනාකරණය පිළිබඳ අත්දැකීමක් සහිත පුද්ගලයකු ද වේ.

2018/19 වර්ෂය සඳහා සමාගම් විගණකවරුන් වූ අර්නස්ට් සහ යන්ග් සමාගම, වරලත් ගණකාධිවරුන් ඔවුන්ගේ ස්වාධීනත්ව අනාවරණයන් , අදාළ නීතිමය අවශ්‍යතාවයන් අනුකූලව අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුව ඉදිරියේ සිදු කරනු ඇත.

යොමුවීම්

- "අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව" පිටු 202 සහ 203

</td><td>✓</td></tr>
<tr><td>D.4</td><td>

**සම්බන්ධිත පාර්ශ්ව සමග ගනුදෙනු විමර්ශන කමිටුව**

සමාගම් සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාදාමය තුළ සම්මුතිගත තුන්වන පාර්ශ්වයක් කෙරෙහි දක්වන සැළකිල්ල ඉක්ම වු අවධානය යොමු කිරීමක්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24ක් දක්වා ඇති ආකාරයට සිදු නොවන බවට සහතික වීම සඳහා පටිපාටියක් ඇති කිරීම පිණිස සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විස්තරාත්මක සම්බන්ධිත පාර්ශව සමග ගනුදෙනු පිළිබඳව වු ප්‍රතිපත්තියක් අනුමතකර ගන්නා ලදී.

සමාගමේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අභිප්‍රේශණය කිරීම සඳහා සම්බන්ධිත පාර්ශ්ව හා ගනුදෙනු සමාලෝචන කමිටුවක් පිහිටුවන ලදී.

2019 මාර්තු 31 වන දිනට, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවට සාමාජිකයින් 3 දෙනෙකු අන්තර්ගත විය. ඔවුන් සියලු දෙනාම විධායක නොවන අධ්‍යක්ෂකවරුන් විය.

</td><td>✓</td></tr>
</table>

# ආයතනික පාලන - ඇමුණුම්

අනුකූලත්ව වාර්තා

| ප්‍රතිපත්ති යොමුව | මූලධර්මතා අනුගතවීම් | අනුගතවීමේ තත්ත්වය |
|---|---|---|
| | කමිටුවේ එක් අධ්‍යක්ෂකවරයකු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකු විය. 2019 ජූනි මස 13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අම්ර්තනායගම් මහතා ස්වාධීන අධ්‍යක්ෂකවරයකු වීමත් සමාගම, සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත විය.<br><br>සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවේ මෙහෙයුම් මණ්ඩලය අනුමත කළ පැහැදිලි නිර්දේශ යොමුවකින් ආවරණය වනු ඇත. කමිටුවේ රාජකාරි හා වගකීම් නිර්දේශ යොමුව තුළ දක්වා ඇති පරිදි ව්‍යවස්ථාවට හා ශ්‍රී ලංකා මහ බැංකු නියමයන්ට අනුකූල වනු ඇත.<br><br>යොමුවීම්<br><br>• "සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව" පිටුව 205 | |
| D.5 | **ව්‍යාපාරය පවත්වාගෙන යාම හා ආචාරධර්ම පිළිබඳ ව්‍යවස්ථාව**<br><br>සමාගම පිළිබඳ උනන්දු වන පාර්ශ්වයන් කෙරෙහි සමාගම දක්වන හැසිරීම කෙරෙහි ප්‍රධාන ප්‍රතිශ්ඨාවන් ඇති කරන ශක්තිමත් ආරක්ෂිත වළල්ලක් ලෙස ආයතන සංස්කෘතියකින් ශක්තිමත්වී ඇත. මෙම වටිනාකම් ලිඛිත වටිනාකම් ඇගයීමේ ලේඛණයක් තුළින් මූර්තිමත් කරනු ඇත. එමෙන්ම එය සමාගම් ව්‍යාපාරික කටයුතු සිදු කිරීමේදී සහ ආචාරධර්මයන්ට අදාළ වූ ව්‍යවස්ථාවන් ලෙස උපකාරී වන අතර, එය අඛණ්ඩව ප්‍රතිපෝෂණය කිරීම ද සිදු කරනු ඇත.<br><br>සමාගම සියලු අධ්‍යක්ෂකවරුන්ට හා සේවකයින්ට අදාලව ව්‍යාපාර මෙහෙයුම් කටයුතු හා ආචාරධර්ම පිළිබඳ ව්‍යවස්ථාවක් ස්ථාපිත කර ඇත. මෙම ව්‍යවස්ථාව සමාගම් අධ්‍යක්ෂකවරුන් හා සේවකයින් අතර සංසරණය කරන අතර, සමාගම් අභ්‍යන්තර පරිගණක අන්තර්ජාලය තුළින් ප්‍රකාශයට පත් කරයි. එතුළින් ශක්තිමත් අදාළ කරුණු සම්බන්ධ අනුගතවීමක් අපේක්ෂා කෙරේ. සාංගමික ඇගයීම් මූර්තිමත් කරන ව්‍යාපාර මෙහෙයුම් හා ආචාරධර්ම සම්බන්ධ ව්‍යවස්ථාව, නිර්දේශිත විශිෂ්ට භාවිතයන්ට අනුකූලව සමාලෝචනය හා යාවත්කාලීන කිරීම සිදු වේ.<br><br>සමාගම් අධ්‍යක්ෂකවරයෙකු හෝ ප්‍රධාන කළමනාකරණ සාමාජිකයෙකු කිසිදු ප්‍රමාණාත්මක උල්ලංඝනයක් කිසියම් වූ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් හෝ ආචාරධර්ම විධිවිධානයන්ට අනුව සිදුකළ බවට අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් කිරීමක් කර නැත.<br><br>සමාගමක පිහිටුවාගෙන ඇති යාන්ත්‍රණයක් තුළින් මිල සංවේදී තොරතුරු ලෙස ප්‍රත්‍යක්ෂ කරගත් තොරතුරු හා අප්‍රමාදව කළ යුතු අනාවරණයන් අදාළ වන නියාමන අධිකාරීන් වෙත යොමු කරනු ලැබේ.<br><br>සමාගම ස්ථාපනය කරන ලද ක්‍රියාදාමයක් ස්ථානගත කිරීම තුළින් සම්බන්ධිත පාර්ශ්වයන් හා ගනුදෙනු නියාමනය හා අනාවරණය කිරීම අධ්‍යක්ෂක මණ්ඩලය අනුමැතිය ලත් සම්බන්ධිත පාර්ශ්ව සමග සිදුවන ගනුදෙනු සම්බන්ධ ප්‍රතිපත්තිය තුළ විස්තර කරඇති ආකාරයට සිදු කරනු ලබයි.<br><br>තවදුරටත් ව්‍යාපාර මෙහෙයුම් හා ආචාරධර්ම සම්බන්ධ ව්‍යවස්ථාවන් ආයතනගතකර එහිම කොටසක් බවට පත්කර ඇත. විස්තරාත්මක ප්‍රතිපත්ති හා ක්‍රියාවලීන් මගින් පාලනය කරන අධ්‍යක්ෂවරුන්ගේ සබඳතා ඉහළ කළමනාකරණ තොරතුරු දරන්නන් හා සේවකයින්ගේ සබඳතා පාලනය කිරීම ද මෙමගින් සිදු වනු ඇත.<br><br>යොමුවීම්<br><br>• "සමාගමේ කටයුතු සම්බන්ධ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්ෂික වාර්තාව" පිටු 54 සිට | ✓ |
| D.6 | **ආයතනික පාලන අනාවරණයන්**<br><br>ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි ආයතනික පාලනයේ සියලු අංගෝපාංග ආවරණය වන ආකාරයට වාර්ෂික වාර්තාවට ඇතුලත් කරන සංස්ථාපිත වාර්තාවට ව්‍යුහගත කර ඇත. | ✓ |

**කොටස්හිමියන්**

**E** —— **ආයතනික අයෝජකයින්**

සමාගම සියලුම කොටස්හිමියන් සමග කාර්යක්ෂම හා විවෘත සන්නිවේදනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා කැපවෙන අතර, විනිවිදභාවයකින් හා අඛණ්ඩව විවිධ පාර්ශ්වයන්ගේ එක් එක් අරමුණු පිළිබඳව අන්‍යෝන්‍ය අවබෝධයක් ඇති කිරීමට පහසුකම් සැලසෙන පරිදි කටයුතු කරනු ලබයි. අධ්‍යක්ෂක මණ්ඩලය හා කළමනාකාරීත්වය ආයතනික සහ පෞද්ගලික සහ දෙආකාර ආයෝජකයින් කරා ළඟාවීමට මහත් වෑයමක් දරන අතර, පෙර සූදානමක් සහිතව වාර්ෂික මහසභා සැසි වාරයන්ට සහභාගීවීමට කොටස්හිමියන් දිරිගැන්වීමද සිදු කරනු ඇත.

වාර්ෂික මහා සභා රැස්වීම (වා.ම.රැ.) කොටස්හිමියන් සමග පොදු සාමාජිකත්වයට අදාළ කරුණු සම්බන්ධයෙන් ව්‍යුහගත කළ හා අරමුණුගත සංවාද ඇති කරලීමට පොදු වේදිකාවක් ලෙස භාවිතා කරයි.

සමාගම සතු පූර්ණ ආයෝජකයින් 8,951 වන එකතුවෙන් අයෝජකයින් 298 ක් ආයතනික ආයෝජකයින් වේ. එමෙන්ම ඔවුන් සමාගම් ඡන්ද හිමි කොටස් ප්‍රමාණයෙන් 95.14% ක අයිතිය දරනු ඇත.

සමාගමේ සභාපතිවරයා මව් සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු වන අතර, එයට සමාගම සම්බන්ධයෙන් 75% ක අයිතියක් හිමි වේ. එබැවින් සභාපතිවරයා ආයතනික කොටස්හිමියන්ගේ අදහස් නිෂ්චිතවම අධ්‍යක්ෂක මණ්ඩලයට යොමුකරන ලෙස තරයේ දන්වා සිටී. ✓

අතිරේක වශයෙන් සමාගම ආයතනික කොටස්හිමියන් සමග දැනට කරගෙන යන සංවාදශීලී වැඩසටහන් හා සාකච්ඡා මගින් පුළුල් පරාසයක වූ ගැටලු සාකච්ඡාවට බඳුන් කරනු ඇත.

දැනුවත් කළ කොටස්හිමියන්ගේ තීරණ ගැනීම්, උනන්දුමත දක්වන හා පොරොත්තු ආයෝජකයින්ගේ ප්‍රාග්ධන කොටස, සංස්ථාමය ගනුදෙනු හා මූල්‍ය කාර්යසාධන නියාමනය පිළිබඳව පදනමක් සපයන බැවින් හෙළිදරව් කිරීම ශක්තිමත් සංස්ථා පාලන ව්‍යුහයක අත්‍යවශ්‍ය මූලධාතුවක් ලෙස සලකනු ඇත.

ප්‍රමාණවත් අවධානයක් ආයතනික ආයෝජකයින් වෙත යොමු කරන අතර, අධ්‍යක්ෂක මණ්ඩල ව්‍යුහය හා සංයුතිය පිළිබඳ මත යෝජනාවන්ට තම ඡන්දය භාවිත අයිතිය භාවිතා කිරීමේදී ස්වාධීනත්වයක් යටතේ යෝග්‍ය බරතැබීමක් කිරීමට අවස්ථාව ලබා දී ඇත.

# ආයතනික පාලන - ඇමුණුම්

| ප්‍රතිපත්ති යොමුව | මූලධර්මතා අනුගතවීම් | අනුගතවීමේ තත්ත්වය |
|---|---|---|
| F | **අනෙකුත් ආයෝජකයින්** | |
| | සමාගම ආයතනික ආයෝජකයින් සහ පෞද්ගලික ආයෝජකයින් සමග යහපත් සම්බන්ධතාවයක් හා සන්නිවේදනයක් පවත්වා ගැනීම කෙරෙහි ඉහළ වැදගත්කමක් යොමුකර ඇති අතර, ඒ ආකාරයටම සහතිකවනු වස් ඔවුන්ට නිරන්තරයෙන් වැදගත් සමාගම් සංවර්ධනය පිළිබඳව වූ තොරතුරු සන්නිවේදනය කරන අතර, එමගින් ඔවුන්ගේ ආයෝජකයින් ඇගයීමට අවශ්‍ය කරන උපක්‍රමික තොරතුරු ලබා දීමට කටයුතු කරයි.<br><br>තනි ආයෝජකයින්ට එම ආයෝජනය කිරීම, හිමිකාරිත්වය දැරීම හෝ අත්හැර දැමීම පිළිබඳ තීරණ සම්බන්ධයෙන් ප්‍රමාණවත් විශ්ලේෂණයක් කිරීමටත් හෝ ස්වාධීන උපදෙස් ගැනීමටත් නිදහස ලබා දී ඇත.<br><br>තවදුරටත් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශයේ අනාවරණය කරඇති ආකාරයට පිටුව 1, වර්තමානයේ පවතින තොරතුරු පදනම් කරගත් අනාගත අවස්ථාවන් සම්බන්ධයෙන් මූල්‍යමය ප්‍රක්ෂේපණයන් හා ප්‍රකාශයන් මත අනාගත අවස්ථාවන් පිළිබඳව සහතික වීම කල නොහැකි අතර, ප්‍රක්ෂේපිත දත්ත මත තීරණ ගැනීමේදී නොයුතු විශ්වාසයක් නොතබන ලෙස පරිශීලකයන්ට උපදෙස් දෙන අතර, පසු මුද්‍රණයන්හි තොරතුරු යාවත්කාලීනකර නොමැතිබවද දන්වා සිටිමි.<br><br>මහසභා රැස්වීම් අධ්‍යක්ෂක මණ්ඩලයට ආයෝජකයින් මුණගැසීමට හා සභාපතිවරයාට සමාගමේ ප්‍රවර්ධනය පැහැදිළි කිරීමටත් කොටස්හිමියන්ගෙන් හා අයිතිකරුවන්ගෙන් ප්‍රශ්ණ යොමුවීමටත් ප්‍රතිපත්තිමය අවස්ථාවක් ලබා දේ.<br><br>තනි තනි කොටස්හිමියන්ට වාර්ෂික මහසභා රැස්වීම්වලට සහභාගිවී තම ඡන්දය ප්‍රකාශ කිරීමට ධෛර්යමත් කරනු ඇත. | ✓ |
| G | **අන්තර්ජාලය සහ සයිබර් ආරක්ෂාව** | |
| | තොරතුරු තාක්ෂණ ශික්ෂණය, බලපත්‍රලාභී තොරතුරු තාක්ෂණ මෘදුකාංග භාවිතය, වඩාත් සමීප අන්තර්ජාල අධීක්‍ෂණය, විද්‍යුත් තැපෑල, සහ වෛරස් ප්‍රතිරෝධක සහ ෆයර්වෝල් මෘදුකාංග භාවිතයන් පිළිබඳ නියාමනයන් සඳහා සමාගම් සමූහයේ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තීන් විසින් පාලනය කරනු ඇත.<br><br>සමාගමේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරිවරයාගේ කාර්යයන් සිදුකිරීමට සමාගම් සමූහයේ තොරතුරු තාක්ෂණ ප්‍රධානියා වෙත පවරා ඇත.<br><br>සයිබර් ආරක්ෂාව හා අනෙකුත් සියලුම තොරතුරු තාක්ෂණයට සම්බන්ධ අවදානම් විගණන කමිටුවේ සවිස්තරාත්මක සාකච්ඡාවකට හා පරිශීලනයකට භාජනය කරන අතර, අධ්‍යක්ෂක මණ්ඩලය ද සැළකියයුතු කාලයක් සයිබර් ආරක්ෂාව හා සමූහයේ තොරතුරු තාක්ෂණ ප්‍රධානි සඳහා අදාළ රැස්වීම් කාලය තුළ ලබාදෙනු ඇත. තොරතුරු තාක්ෂණ විගණන නිලධාරින් අවශ්‍ය වේ යැයි හැඟෙන අවස්ථාවන්හිදී විශේෂඥ උපදෙස් ලබාගැනීම සඳහා සේවයේ යොදවා ඇත. තොරතුරු ආරක්ෂාව සම්බන්ධ විවරණයක් වර්ෂ අවසානයේදී බාහිර විගණකවරුන් විසින් සිදු කරනු ලැබේ. | |
| H | **පරිසරය, සමාජය හා පාලනය (ESG)** | |
| H.1 | ESG වාර්තාකරණය<br><br>සාංසමික තිරසාරත්වය වාර්තාකරණය, අයෝජකයින්ට, පාරිභෝගිකයින්ට, සේවකයින්ට හා අනෙකුත් අදාළ පාර්ශ්වයන්ට, එනම් සමාගම් සම්බන්ධයෙන් අයිතියක් පවතින යම්කිසි මාර්ගයක් සම්බන්ධයෙන් සමාගමේ ක්‍රියාකාරීත්වය මත ඇතිවන බලපෑම කෙරෙහි යටත් වන පාර්ශ්වයන් ඉලක්කගතව තොරතුරු බෙදාහැරීම හා එවැනි වූ මාර්ගයකින් එම පාර්ශ්වයන්ට තීරණය ගැනීමේ වටිනාකමක් ලබාදෙනු ඇත.<br><br>පරිසරය, සමාජය හා පාලනය (ප.ස.පා.) යන අංගයන් සමාගමේ වටිනාකම් සම්බන්ධයෙන් වැදගත් කොටසක් ලෙස සලකා බලනු ලබන අතර, සමාගමේ මූලෝපායයන් සමග එම අංගයන්ගේ සම්බන්ධතාවය සහතික කිරීම පිළිබඳව වූ වගකීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ව සිටී.<br><br>සමාගමේ ESG වාර්තාකරණය, සමාගම කෙසේ කටයුතු කර ඇත්තේද? සහ දිගුකාලීන වටිනාකම් ළගාකර ගෙන ඇත්ද? භාරගනු ලැබූ සාංසමික වගකීම්, සහ තිරසාර සංවර්ධනයට දායකත්වය සම්බන්ධව ප්‍රතිබිම්බයක් වේ. මෙලෙස මෙම වාර්ෂික වාර්තාව ඒකාබද්ධ වාර්තාවක් ස්වරූපයෙන් පිළියෙල කරනු ලැබුවා වුවද, එමගින් ගෝලීය වාර්තාකරණය (GRF) මගින් හඳුනාගනු ලැබූ සියලු තිරසාර වාර්තාකරණ පරාමිතියක් ආවරණය කරනු ඇත. | ✓ |

# ආයතනික පාලන - ඇමුණුම්



## ලැයිස්තුගත නීති සමග අනුගත වීම – ඇමුණුම්

ලැයිස්තුගත කිරීමේ නීති 7.6 සහ 7.10 හා අනුගතවීම – ඡේදය 7 (ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම) කොළඹ කොටස් හුවමාරුව නිකුත් කරන ලදී.

| රෙගුලාසි අංකය | මූලධර්ම හා අනුගතවීම | අනුගත වීමේ තත්ත්වය |
|---|---|---|
| 7.6 | **වාර්ෂික වාර්තාවේ සංයුතිය**<br>වාර්ෂික වාර්තාවේ සංයුතිය පිළිබඳ අවශ්‍යතාවයන් සමග අනුගත වූ වාර්තාව පිටුව 59 ට යොමු වන්න. | ✓ |
| 7.10 | **ආයතනික පාලනය** | |
| 7.10.1 | දෙදෙනෙකු හෝ 1/3 ක් අධ්‍යක්ෂකවරුන්ගෙන් වැඩි ප්‍රමාණය විධායක නොවන අධ්‍යක්ෂකවරුන් විය යුතුය.<br>සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය සමන්විත වූයේ විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ගෙනි. | ✓ |
| 7.10.2 | දෙදෙනෙකු හෝ 1/3 ක් අධ්‍යක්ෂකවරුන්ගෙන් වැඩි ප්‍රමාණය ස්වාධීන මෙන්ම ස්වාධීනත්වය/නොවීම පිළිබඳ අනාවරණ අවශ්‍යතාවයන්ට අනුව හෙළිදරව් කිරීමක් කළ යුතු වේ.<br>2019 මාර්තු 31 දිනට සමාගම් අධ්‍යක්ෂක මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් 8 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, තිදෙනෙකු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂකවරුන් විය. 2019 ජූනි 13 වන දින අමිර්තනායගම් මහතාගේ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුවීමත් මත අධ්‍යක්ෂ මණ්ඩලය හතර දෙනෙකුගෙන් යුත් ස්වාධීන අධ්‍යක්ෂකවරු අඩංගු විය.<br>තවදුරටත් සියලුම විධායක නොවන අධ්‍යක්ෂකවරුන් සමාලෝචිත වර්ෂය තුළ අවශ්‍ය අනාවරණයන් සිදු කර ඇත. | ✓ |
| 7.10.3 | ස්වාධීන අධ්‍යක්ෂකවරුන්ගේ නාමයෙන්, ඔවුන්ගේ ස්වාධීනත්වය පිළිබඳව තීරණය කිරීමේ පදනම ව්‍යවස්ථාවෙන් නියමකර ඇති බාහිර නිර්නායකයන් සහ සිටින හෝ නව අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු ආරම්භයේදී කළ යුතු අනාවරණයන්<br>එවැනි විනිශ්චයක් සිදුකිරීමට අධ්‍යක්ෂක මණ්ඩලයට අවශ්‍ය නොවූ අතර, සියළුම ස්වාධීන අධ්‍යක්ෂකවරුන් නියමිත අවශ්‍යතාවයන් සපුරන ලදී.<br>සමාලෝචිත වර්ෂය තුළ නව අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු අධ්‍යක්ෂක මණ්ඩලයට පත්කර ගන්නා ලද අතර, ඔවුන්ගේ පත්වීම් කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත මහජනයා වෙත දැනුම්දීම පිණිස යොමු කරන ලදී. | ✓ |
| 7.10.5 | පාරිශ්‍රමික කමිටුව සම්බන්ධ සංයුතිය, ක්‍රියාකාරකම් හා අනාවරණයන්<br>2018/19 වර්ෂය තුළ වේතන හා නාමයෝජනා කමිටුව විධායක නොවන අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය. ඔවුන් ස්වාධීන අධ්‍යක්ෂකවරන් නොවීය. 2019 ජූනි මස 13 සිට ක්‍රියාත්මක වන ලෙස අමිර්තනායගම් මහතා ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු වීමත් මත පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටුව එක් ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකුගෙන් සමන්විත විය. කමිටුවේ සභාපතිවරයා වූයේ විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකි.<br>වේතන හා නාමයෝජනා කමිටු වාර්තාව – පිටු අංක 204 යොමු වන්න. | ✗ |
| 7.10.6 | වාර්ෂික වාර්තාව තුළ විගණන කමිටුවේ සංයුතිය, ක්‍රියාකාරකම් සහ අනාවරණයන්<br>විගණන කමිටුව සම්බන්ධ සංයුතිය, ක්‍රියාකාරකම් හා වාර්ෂික වාර්තා තුළ අනාවරණයන් විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් සමන්විතවන අතර, ඔවුන්ගෙන් අයෙකු ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු විය. 2019 ජූනි 13 වන දින අමිර්තනායගම් මහතාගේ ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකුවීමත් මත විගණන කමිටුව ස්වාධීන අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වන ලදී. කමිටුවේ සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකි.<br>ප්‍රධාන විධායක නිලධාරියා විගණන කමිටු රැස්වීම් සඳහා ලද ආරාධනාවන්ට අනුව සහභාගි විය.<br>කමිටු සභාපතිවරයා ශ්‍රී ලංකා වරලත් ගණකාධිවරුන්ගේ ආයතනයේ පූර්ණකාලීන ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වන අතර, මහා බ්‍රිතාන්‍යයේ වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේද ජ්‍යෙෂ්ඨ පූර්ණ කාලීන සාමාජිකත්වය ද දරනු ලැබේ.<br>අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටු වාර්තාව පිටු 202 සහ 203 යොමුවන්න. | ✗ |

## මූල්‍ය සමාගම් නියාමනය සමග අනුගතවීම

2008 අංක 3 දරන මූල්‍ය සමාගම් නියාමනය සමග අනුගතවීම (සංස්ථාපිත පාලනය) සහ එයට කරනු ලැබූ සංශෝධන සහිත වූ 2008 අංක 4 දරන මූල්‍ය සමාගම් නියාමනය (ආයතනික පාලනය) සහ 2013 අංක දරන සංශෝධිත නියාමනයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලදී.

| නියෝග අංක | මූලධර්මය හා අනුකූලතාවය දැක්වීම | අනුකූලතා තත්ත්වය |
|---|---|---|
| A | **අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීම්** | ✓ |
| 2 (1) | **සමාගමේ ආරක්ෂිතභාවය හා නිරෝගී භාවය ශක්තිමත් කිරීම** | |
| (a) | **උපායශීලී අරමුණු සහ ආයතනික වටිනාකම් අනුමත කිරීම හා පාලනය කිරීම**<br>සමාගමේ මූලෝපායික අරමුණු සමාගමේ දැක්ම හා ධූත මෙහෙවර ප්‍රකාශනයේ ස්ථාවරව දක්වා ඇති අතර, ආයතනික වටිනාකම් සමාගමේ මෙහෙයුම් ව්‍යවස්ථාව හා ආචාරධර්ම පද්ධතිය තුළට කාවද්දා ඇත. එමෙන්ම මෙම වටිනාකම් සමාගමේ සෑම මට්ටමක වූ සේවකයින්ට සන්නිවේදනයද, සිදු කරමින් පවතී.<br>අධ්‍යක්ෂක මණ්ඩල ක්‍රියාකාරී භූමිකාවක් නිරූපණය කරමින් සමාගම සඳහා මූලෝපායික අරමුණු පිහිටුවා ගැනීමෙහිලා උපකාරී වන අතර, සමාගම් දර්ශනය හා දූත මෙහෙවර ක්‍රියාත්විතයන් බවට පත්කිරීම සහතික කර ගැනීමට ද උත්සුක වනු ඇත.<br>පිහිටුවා ගනු ලැබූ ඉලක්ක හා අරමුණු ක්‍රියාත්මක කිරීමට අදාළ කාර්යයන් අධ්‍යක්ෂක මණ්ඩලය මගින් සමාගමේ කළමනාකරණයට යොමු කරඇත. සමාගමේ මෙහෙයුම් ප්‍රගතිය, ඒ අනුව වූ ඉලක්ක අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නියාමනය හා ඇගයීම සිදු කරන අතර, පෙර ක්‍රියාත්මකවීම තුළින් අවහිරතාවයන් හා බාධා හඳුනාගනු ලැබේ.<br>දර්ශන හා දූත මෙහෙවර පිටුව 12 යොමුවන්න. | ✓ |
| (b) | **අවදානම් ප්‍රතිපත්ති හා කළමනාකර පටිපාටින් සමග සමස්ථ ව්‍යාපාර මූලෝපාය අනුමත කිරීම**<br>සමාගමේ මූලෝපායික අරමුණු කෙරෙහි යොමු වර්ෂ 3කට අදාළව පිළියෙල කරන විස්තරාත්මක සැලැස්මක් සමාගමේ මූලෝපායික සැලැස්ම මගින් ආවරණය කරනු ලබන අතර, සමාගම මුහුණ දෙන මූලික ගැටළු හා අභියෝගයන්ටද ආමන්ත්‍රනය කරයි.<br>ව්‍යාපාර සැලසුම් හි මූලෝපායික ඉලක්ක ඇතුළත්ව ඇත. මෙම ඉලක්ක මැනිය හැකි ආකාරයට පිහිටුවන අතර, ඒවා අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කළ අවදානම් කළමනාකරන ප්‍රතිපත්තිය, අවදානම්වලට ඔරොත්තුදීම හා අවදානම් රුචිය සම්බන්ධ ප්‍රකාශයන්ට අනුව සංවර්ධනය කරනු ලැබේ.<br>මාසික අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වලදී කළමනාකරණය මගින් ව්‍යාපාරික මූලෝපායන් නිරන්තරයෙන් සමාලෝචනයන්ට නවීකරණය සමගින් ඉදිරිපත් කරනු ඇත. | ✓ |
| (c) | **අවදානම් කළමනාකරණය**<br>සමාගමේ සම්පූර්ණ අවදානම් ආකෘතිය මූලික වශයෙන් සමස්ථ අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීමක් වේ. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අවධානය හඳුනාගැනීම, විචක්ෂණශීලීව අවදානම් කළමනාකරණය කිරීමට ප්‍රමාණාත්මක පද්ධතියක් ක්‍රියාත්මක වන බවට තහවුරුකර ගැනීමට සහ ත්‍රෛමාසිකව අධ්‍යක්ෂක මණ්ඩල වාර්තා කිරීමද සිදු කරනු ලබයි.<br>ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව පිටු 206 සිට 208 යොමුවන්න. | ✓ |
| (d) | **උනන්දුවක් දක්වන්නන් සමග සන්නිවේදනය**<br>සමාගම පිළිබඳ උනන්දුවන පාර්ශ්වයන් සමග ද්විපාර්ශ්වික සන්නිවේදනයක් සිදුකිරීමේ ඇති වැදගත්කම හඳුනාගැනීමෙන් අධ්‍යක්ෂක මණ්ඩලය කොටස්හිමියන් සහ තැන්පත්කරුවන්, ණය හිමියන්, ණයකරුවන්, සැපයුම්කරුවන් සහ අනෙකුත් උනන්දුවන පාර්ශ්වයන් සමග සන්නිවේදනය පාලනය සඳහා විස්තරාත්මක ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත. | ✓ |
| (e) | **අභ්‍යන්තර පාලන පද්ධතිය හා කළමණාකරන තොරතුරු පද්ධතිය සමාලෝචනය කිරීම**<br>අධ්‍යක්ෂක මණ්ඩලයේ සමස්ථ වගකීමක් වන සමාගම ප්‍රමාණවත් අභ්‍යන්තර පාලකයින් නඩත්තු කිරීම සහතික කිරීමේහිලා සහ එහි කාර්යක්ෂමතාවය ඇගයීම අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුව විසින් භාරගැනීම සහ හෙළිදරව් කිරීම් අධ්‍යක්ෂක මණ්ඩලයට ත්‍රෛමාසිකව දැනුම්දීම.<br>කළමණාකරණ තොරතුරු පද්ධතිය අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනයකර එහි නිවැරදිභාවය හා නිරවුල් බව තහවුරු කරයි. | ✓ |
| (f) | **මූලික/ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්**<br>සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි සහ අනුගතවීමේ නිලධාරි යන තනතුරු දරන්නන් ප්‍රධාන කළමනාකරණය ලෙස හැඳින්වේ. | ✓ |
| (g) | **අධ්‍යක්ෂක මණ්ඩලය හා ප්‍රධාන තනතුරු දරන්නන් සඳහා වූ බලය සහ වගකීම්**<br>සාංගමික ව්‍යාවස්ථාවේ විස්තරාත්මකව අධ්‍යක්ෂක මණ්ඩලය සහ ප්‍රධාන විධායක රාජකාරි සහ වගකීම් දක්වා ඇත. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්ගේ ප්‍රධාන ක්‍රියාකාරකම් (ඔවුන්ට අදාළව රැකියා විස්තරයේ ඇතුළත් කර ඇත.) දක්වා ඇති අතර, එයට අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. | ✓ |

# ආයතනික පාලන - ඇමුණුම්

අනුකූලත්ව වාර්තා

| නියෝග අංක | මූලධර්මය හා අනුකූලතාවය දක්වීම | අනුකූලතා තත්ත්වය |
|---|---|---|
| (h) | **ප්‍රධාන කළමනාකරණ තනතුරු හොබවන්නන්ට සමාගම සම්බන්ධ කටයුතු පාලනය කිරීම**<br>මාසිකව පවත්වන අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වලදී සමාගම සම්බන්ධ කටයුතු සමාලෝචනයට හා සාකච්ඡාවට නැගෙනු ඇත. මෙම රැස්වීම් වලදී ප්‍රධාන තනතුරු දරන්නකු ලෙස ප්‍රධාන විධායක නිළධාරි පිහිට වූ ඉලක්ක හා සමාගම් මෙහෙයුම් ප්‍රගතිය සම්බන්ධයෙන් ඇගයීමක් අධ්‍යක්ෂක මණ්ඩලයට යොමු කරනු ලබයි.<br>සමාගමේ කටයුතු පිළිබඳ සමාලෝචනය හා සාකච්ඡා කරීම් කළමනාකරණ මට්ටමේදී ජ්‍යෙෂ්ඨ කළමනාකකරණය විසින් සිදුකරනු ඇත.<br>සංස්ථාපිත පාලනය තුළ අධ්‍යක්ෂක මණ්ඩලයේ කාර්ය හා වගකීම් පිටුව 44ට යොමු වන්න. | ✓ |
| (i) | **පාලන පරිචයන්ගේ කාර්යක්ෂමතාවය තක්සේරු කිරීම**<br>සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අධ්‍යක්ෂකවරුන් තෝරාගැනීම හා පත්කරගැනීම හා පොදු පටිපාටියක් සපයනු ලැබේ. වර්තමානයේදී විධායක නොවන අධ්‍යක්ෂකවරුන් හැර සමාගමේ අධ්‍යක්ෂකවරුන් නිර්දේශ කිරීම මව් සමාගම වන මහජන බැංකුව විසින් සිදුකරන අතර, ඔවුන්ගේ පත්කිරීම සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සාංගමික ව්‍යවස්ථාවලිය දැක්වෙන නියමයන්ට අනුකූලව සිදුකරනු ඇත. ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා පත්කිරීම ප්‍රධාන විධායක නිලධාරියාගේ නිර්දේශය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සිදු කෙරේ.<br>සමාගම් මෙහෙයුම් කටයුතු හා ආචාරධර්ම සම්බන්ධයෙන් වූ නියමයන්ට අනුකූලව, අධ්‍යක්ෂක මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම තමන්ගේ පෞද්ගලික සබඳතාවයන්, බාහිර සංගමයන් සහ ප්‍රමාණාත්මක දේ සම්බන්ධ රුචිය හා එමෙන්ම එම කරුණු මත ඔහුගේ/ඇයගේ ස්වාධීන විනිශ්චයනට බලපෑමක් කරනු ලබන සබඳතා මගින් බැඳියා පිලිගැනුම කෙරෙහි විභව්‍ය හෝ සත්‍ය වශයෙන් බලපානු ලබන කටයුතුවල ඔහු/ඇය නියුක්තව සිටීදැයි නිගමනය කිරීමට වගකීමක් ඇත. සාකච්ඡා කරන කරුණු සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන අධ්‍යක්ෂකවරුන් ඔහු/ඇයගේ අතිරුපිය අදාළ කාලය අනාවරණය කිරීම, සහ එවැනි කාර්යයන් සම්බන්ධ විචාරයන් සහ එවැනි සබඳතා මත ඡන්දය භාවිතා කිරීමෙන් වැලැක්වීමට කටයුතු කරනු ඇත.<br>අරමුණු පිලිගැටුම් කළමනාකරණය හා ස්වාධීනත්වය සහතික කිරීම පිටුව 45ට සහ අධ්‍යක්ෂක මණ්ඩල ඇගයීම පිටුව 48ට යොමු වන්න. | ✓ |
| (j) | **ප්‍රධාන කළමණාකරන පුද්ගලයින් සම්බන්ධ අනුප්‍රාප්තික සැලසුම**<br>2018 ඔක්තෝම්බර් මස සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය සමාගමේ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සඳහා අනුප්‍රාප්තික සැලසුමක් අනුමත කරන ලදී. | ✓ |
| (k) | **ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සමග අඛණ්ඩ රැස්වීම් පැවැත්වීම**<br>සමාගමේ ප්‍රධාන විධායක නිළධාරියා විසින් ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් මාසිකව පවත්වන අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වලට ඉදිරිපත් කරනු ලබන අතර, තවද, ඔහු විසින් ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් රැස්වීම්වලදී නියෝජනය කරන අතර, උනන්දුවන කරුණු හා උග්‍ර මතභේදාත්මක කරුණු සම්බන්ධව අධ්‍යක්ෂක මණ්ඩලයට යොමු කරනු ඇත.<br>තොරතුරු සැපයීම පිටුව 47ට යොමු වන්න. | ✓ |
| (l) | **නියාමන පරිසරය හඳුනා ගැනීම**<br>අධ්‍යක්ෂක මණ්ඩලය, සමූහයේ වටිනාකම්, ව්‍යාපාර කටයුතු, මෙහෙයුම්, මූල්‍යමය කටයුතු, පාලන රාමුව සහ සමාගමේ මූලෝත්පායික තත්ත්වය පිළිබඳ නිපුණත්වයක් ඇතිවේ.<br>නීති පද්ධතිය තුළ සිදුවන වෙනස්කම්, නියාමනයන් හා සංස්ථාපිත පාලනය සම්බන්ධ අඛණ්ඩ යාවත්කාලීන කිරීම් එමෙන්ම අංශ සංවර්ධනයන් වැනි සමූහ සහ එහි මෙහෙයුම් කෙරෙහි බලපෑහැකි ආර්ථික, සමාජීය හා පාරිසරික අංගයන් ආවරණය වන පුළුල් වර්ණාවලියක් සහිත මාතෘකාවන් අධ්‍යක්ෂක මණ්ඩල කමිටු රැස්වීම් සැසි වාරයකදීම හා අවශ්‍ය වන ආකාරයට සමස්ථ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත සපයනු ඇත.<br>නියාමන අවශ්‍යතාවන්හි සංයුතියේ සාරාංශයක් හා අදාළ පාර්ශ්වයන් අධ්‍යක්ෂක මණ්ඩලයට අඛණ්ඩව ඉදිරිපත් කිරීම තුළින් නියාමන පරිසරය සම්බන්ධයෙන් සමාගමේ ස්ථාවරය පිළිබඳව ඔවුන් දැනුවත් කරනු ඇත. | ✓ |
| (m) | **බාහිර විගණකවරුන්ගේ සේවය ලබාගැනීම හා පාලනය**<br>බාහිර විගණකවරුන්ගේ සේවය ලබාගැනීම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටු නිර්දේශය මත සිදුකරනු ලබයි.<br>අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුව බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය, අරමුණු සහගත භාවය, සහ විගණක ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය නියාමනය හා සමාලෝචනය කිරීම අදාළ වෘත්තීය හා නියාමන අවශ්‍යතා කල්පනාවට ගෙන සිදුකරනු ලැබේ.<br>2018/19 වර්ෂය සඳහා සමාගමේ බාහිර විගණක වූයේ වරලත් ගණකාධිකාරිවරුන් වන අර්න්ස්ට් සහ යංග් ආයතනයයි, බාහිර විගණකවරුන් තම ස්වාධීනත්වය අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුව වෙත 2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (3) වගන්තිය අනුකූලව ඉදිරිපත් කර ඇත. | ✓ |
| 2 (2) | **සභාපතිවරයා හා ප්‍රධාන විධායක පත්කිරීම, ඔවුන්ගේ කාර්යයන් හා වගකීම් පැහැදිලි කරීම හා අනුමත කිරීම**<br>සභාපතිවරයා හා ප්‍රධාන විධායකවරයා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත්කර ඇත. ඔවුන්ගේ භූමිකාව වෙනස්වන අතර, සංස්ථාපිත පාලනය ව්‍යවස්ථාවෙන් විස්තර කර ඇත. | ✓ |
| 2 (3) | **අධ්‍යක්ෂකවරුන් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීම**<br>සේවයෙන් ඉවත්කිරීම සම්බන්ධයෙන් වූ නීතින් පිළිබඳ නීති උපදෙස් ඒ සම්බන්ධයෙන් වූ අධ්‍යක්ෂකවරුන් ලබාදෙනු ඇත. | ✓ |

# ආයතනික පාලන - ඇමුණුම්

| නියෝග අංක | මූලධර්මය හා අනුකූලතාවය දැක්වීම | අනුකූලතා තත්ත්වය |
|---|---|---|
| 2 (4) | **අරමුණු පිළිගැටුම් කළමනාකරණය කිරීම**<br>සමාගම් ව්‍යාපාර පාලනය හා ආචාරධර්ම පද්ධතියේ නියමයන්ට අනුව අධ්‍යක්ෂක මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම ඔහු/ඇය විභව්‍ය හෝ සත්‍ය වශයෙන්ම ඔවුන්ගේ පෞද්ගලික සබඳකම්, බාහිර සංගමයන් සහ ප්‍රමාණාත්මක භෞතික කරුණු පිළිබඳව දක්වන උනන්දුව මත ඔහු/ඇයගේ ස්වාධීන විශිෂ්ටත්වය කෙරෙහි බලපැවැත්විය හැකි බැඳියා පිළිගැනුම් විනිශ්චය කිරීමේ වගකීමක් ඇත.<br>අරමුණු පිළිගැටුම් කළමනාකරණය හා ස්වාධීනත්වය තහවුරු කිරීමට යොමු වන්න. | ✓ |
| 2 (5) | **අධ්‍යක්ෂක මණ්ඩලය සඳහා නිරූපිත අවශේෂිත විධිමත් කාර්යසටහනක් තිබීම**<br>සංස්ථාමය පාලන ව්‍යවස්ථාව තුළ අධ්‍යක්ෂක මණ්ඩලයට තීරණ ගැනීම සඳහා නිරූපිත අවශේෂිත කාර්යසටහන් අඩංගුව ඇත. | ✓ |
| 2 (6) | **වියහැකි බුන්වත්භාවය සම්බන්ධ ගැටලු අනාවරණය**<br>2018/19 වර්ෂය තුළ එවැනි අවස්ථාවන් ඇතිවී නැත. තවදුරටත් සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය සතිපතා බැංකු නොවන මූල්‍ය සමාගම් අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාට වාර්තා කරනු ඇත. | ✓ |
| 2 (7) | **දැක්වෙන ආයතනික පාලන නියාමයන් සමග අනුකූල ආයතනික පාලන වාර්තාව වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත් කරීම**<br>අධ්‍යක්ෂක මණ්ඩලය සමාගම් වාර්ෂික වාර්තාවේ අඩංගු වන ආකාරයට හා වාර්ෂික සංස්ථාමය පාලනය සම්බන්ධ වාර්තාවේ දැක්වෙන ආකාරයට නියාමනයන් හා එකගත්වය විදහා පෙන්වනු ලැබේ. | ✓ |
| 2 (8) | **අධ්‍යක්ෂකවරුන්ගේ ස්වයං තක්සේරුව**<br>අධ්‍යක්ෂක මණ්ඩලය ස්වයං කත්සේරු කිරීමේ යෝජනාක්‍රමයක් හඳුන්වා දී ඇති අතර, වාර්ෂිකව එය සෑම අධ්‍යක්ෂකවරයෙකු විසින්ම භාරදිය යුතුය. | ✓ |
| B | **අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්** | |
| 3 (1) | **නිරතුර අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්**<br>සාමාන්‍යයෙන් අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් මාසික විරාමයක් තුළ පැවැත්වේ. නැතහොත් හදිසි අවශ්‍යතාවයක් හේතුකොටගෙන සාකච්ඡා කැඳවීමක් කෙටිකාල විරාමයක් තුළ සිදු කරනු ඇත.<br>2018/19 මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂක මණ්ඩලය සාකච්ඡා වාර 13ක් පවත්වන ලද අතර, අධ්‍යක්ෂක මණ්ඩලය කැමැත්ත ලබාගැනීම සම්බන්ධව සංසරණයවීම අවම වශයෙන් අවස්ථා 4ක් සඳහා සිදුවුනි. | ✓ |
| 3 (2) | **න්‍යාය පත්‍රය තුළ අධ්‍යක්ෂකවරුන්ගේ කරුණු හා යෝජනා ඇතුළත් කිරීම**<br>සෑම අධ්‍යක්ෂකවරයෙකුටම ඒකාකාරි අවස්ථාවක් ව්‍යාපාර ප්‍රාග්ධන යෝජනා ඇතුළත් කිරීමට අවදානම් කළමනාකරණය යෝජනා ඇතුළත් කිරීමට, සෑම නිරන්තර රැස්වීම් වාරයකදීම ලබාදෙන ලදී.<br>සමාගමික පාලන ව්‍යවස්ථාවේ මේ සම්බන්ධයෙන් අවශ්‍ය පටිපාටිය දක්වා ඇත. | ✓ |
| 3 (3) | **අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් දැනුම්දීම**<br>ඊලග රැස්වීම් වාරය, දිනය පිළිබඳව සියලුම අධ්‍යක්ෂකවරුන් සාමුහිකව එකගත්වයක් ඇතිකර ගැනීම පෙර රැස්වීමකට සහභාගි වූ සාමාජිකයින් විසින් සිදුකළ යුතු අතර, දෙවනුව එය සියලුම අධ්‍යක්ෂකවරුන්ට දැනුම්දෙනු ලැබීය. එය සහතික කිරීම වස් අවම වශයෙන් රැස්වීමක් සඳහා දින 7ක දැනුම්දීමක්ද, සාධාරණ දැනුම්දීමක් අනෙකුත් රැස්වීම් සඳහා සිදු කරයි. | ✓ |
| 3 (4) | **අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ පැමිණීම**<br>2018/19 වර්ෂයේ අධ්‍යක්ෂකවරුන්ගේ 13 වන සභාවාරය සඳහා පැමිණීම 91% විය. කිසිඳු අධ්‍යක්ෂකවරයෙකු විසින් ආසන්න වාර තුනක් නොපැමිණෙන ලදී.<br>අධ්‍යක්ෂක මණ්ඩල හා අධ්‍යක්ෂක මණ්ඩල කමිටු සඳහා සහභාගිවීම පිටුව 48 බලන්න. | ✓ |
| 3 (5) | **සමාගමේ ලේකම් පත්කිරීම**<br>ප්‍රමාණවත් පලපුරුද්දක් ඇති බලයලත් නීතිඥයකු සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය ලේකම් ලෙස පත්කරගෙන ඇත.<br>සමාගමේ ලේකම් පිටුව 49 බලන්න. | ✓ |
| 3 (6) | **සමාගමේ ලේකම් වෙත බලය බෙදාහැරීම**<br>සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රයක් සකස් කිරීමේ කාර්යයන් සභාපතිවරයා විසින් සමාගම් ලේකම් වෙත පවරනු ඇත. එමෙන්ම සමගාමීව සමාගමේ ලේකම් ඒ සඳහා වගකීමට බැදෙනු ඇත. | ✓ |

# ආයතනික පාලන - ඇමුණුම්



| නියෝග අංක | මූලධර්මය හා අනුකූලතාවය දැක්වීම | අනුකූලතා තත්ත්වය |
|---|---|---|
| 3 (7) | **සමාගමේ ලේකම්ගේ සේවය ලබාගැනීම හා ලේකම්ගේ උපදෙස්**<br>සමාගමේ සංස්ථාමය පාලන ව්‍යවස්ථාවලියේ දක්වන ලද ආකාරයට නෛතියෙන් බලයලත් නීතිඥයෙකු වන සමාගම් ලේකම්ගේ සේවය සෑම අධ්‍යක්ෂකවරයෙකු විසින්ම ලබාගනු ඇත. | ✓ |
| 3 (8) | **සමාගම් රැස්වීම්වල ප්‍රගති සටහන් නඩත්තු කිරීම**<br>සමාගම් ලේකම් විසින් සමාගම් රැස්වීම්වල ප්‍රගති සටහන් නඩත්තුව ප්‍රමාණවත් තොරතුරු සමග හා එම තොරතුරු පරික්ෂා කිරීමට අවශ්‍ය වන ඕනෑම අධ්‍යක්ෂකවරයෙකුට සමාගමේ පාලන ව්‍යවස්ථාවට අනුකුල ලෙස සිදුකරනු ලැබේ. | ✓ |
| 3 (9) | **ප්‍රමාණවත් තොරතුරු සමග සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් පිළිබඳව ප්‍රගති සටහන් තබා ගැනීම**<br>සමාගම් ලේකම් රැස්වීම්වල චර්යාත්මක ප්‍රගති සටහන් තබාගන්නා අතර, එම රැස්වීම්වල තිරණයන්ද වාර්තා කරනු ඇත. එමගින් මේ සම්බන්ධයෙන් වු නීතිය තුළින් දක්වා ඇති සියලුම අවශ්‍යතා සම්පුර්ණ කරනු ඇත. | ✓ |
| C | **අධ්‍යක්ෂක මණ්ඩල සංයුතිය** | |
| 4 (1) | **අධ්‍යක්ෂක මණ්ඩලය තුළ අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රමාණය**<br>2018/19 වර්ෂය අවසානය වන විට අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු වු අතර, එය අවශ්‍යතාවයන් අනුගතවීමක් විය. | ✓ |
| 4 (2) | **අධ්‍යක්ෂකවරයෙකුගේ සේවා කාලය**<br>2018/19 වර්ෂයේදී සියලු අධ්‍යක්ෂකවරුන්ගේ සේවා කාලය වර්ෂ 9කට වඩා අඩු විය. | ✓ |
| 4 (3) | **සේවකයෙකු අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත්කිරීම, තෝරාගැනීම් හෝ නාමයෝජනා කිරිම**<br>සමාගමේ කිසිදු විධායක අධ්‍යක්ෂකවරයෙකු නොමැත. | ✓ |
| 4 (4) | **අධ්‍යක්ෂක මණ්ඩල සමබරතාවය හා ස්වාධීනත්වය පිළිබඳ නිර්නායක**<br>2018/19 මුල්‍ය වර්ෂය තුළ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂකවරුන් වු අතර, එය මෙයට අදාළ නීතියේ දක්වා ඇති ස්වාධීනත්වය පිලිබද නිර්ණායක හා 1/4 ක අනුගතවීමකි. අමිර්තනායගම් මහතාගේ නිදහස් අධ්‍යක්ෂකවරයෙකුවීම 2019 ජුනි 13 සිට ක්‍රියාත්මක වු නිසා අධ්‍යක්ෂක මණ්ඩලය තුළ ස්වාධීන අධ්‍යක්ෂකවරුන් හතරදෙනෙක් විය. | ✓ |
| 4 (5) | **විකල්ප අධ්‍යක්ෂක**<br>වර්ෂය තුළ විකල්ප අධ්‍යක්ෂකවරයෙකු පත්කර නැත. | ✓ |
| 4 (6) | **අරමුණු විනිශ්චයක් ගෙනඒම සඳහා විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකු සතුවිය යුතු පලපුරුද්ද හා හැකියාවන්**<br>අධ්‍යක්ෂක මණ්ඩලය පුර්ණ වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ගෙන් සමන්විත අතර ඔවුන් විවිධ විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් ලබාගෙන ඇත. ඔවුන්ගේ හැකියාවන් හා ව්‍යාපාරික අත්දැකිම්, සම්මිශ්‍රණය අධ්‍යක්ෂක මණ්ඩලයේ හා එහි කමිටුන්හි කාර්යයන් යහපත් ලෙස පවත්වාගෙන යාමට දායකත්වයක් සපයනු ඇත.<br>පිටු අංක 27 හා 28හි අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත අවදානය යොමු කරන්න. | ✓ |
| 4 (7) | **අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වල සනපූර්ණය**<br>2018/19 වර්ෂ තුළ සමාගමේ සියලුම අධ්‍යක්ෂකවරුන් විධායක නොවන අධ්‍යක්ෂකවරුන්වීම නිසා අවශ්‍ය සනපූර්ණය (අධ්‍යක්ෂකවරුන්ගෙන් බාගයක ප්‍රමාණය විධායක නොවන අධ්‍යක්ෂකවරු විය). වර්ෂය තුල කැඳවන ලද සියලු රැස්විම් සඳහා ප්‍රමාණවත්ව පවතින ලදී. | ✓ |
| 4 (8) | **විධායක නොවන නිදහස් අධ්‍යක්ෂකවරුන්ගේ අනාවරණය, අධ්‍යක්ෂක මණ්ඩල සංයුතිය සන්නිවේදනය හා වාර්ෂික වාර්තාවල දැක්වීම**<br>විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂකවරුන් එවැනි සියලුම සංස්ථාමය සන්නිවේදනය; සමාගමේ සියලු අධ්‍යක්ෂකවරුන් නාමයන් සමඟ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් හඳුනාගනු ලැබ ඇත. | ✓ |
| 4 (9) | **නව අධ්‍යක්ෂකවරුන් පත්කිරීමේ විධිමත් හා විනිවිදභාවයක් සහිත ක්‍රමවේදය**<br>සමාගමේ සංස්ථාපන ප්‍රකාශනයේ හා සංස්ථාමය පාලන ව්‍යවස්ථාවෙන් සමාගම සඳහා අදාක්ෂකවරුන් තෝරාගැනීම හා පත්කර ගැනීම සම්බන්ධයෙන් පොදු ක්‍රියාදාමයක් ඉදිරිපත් කෙරේ. “ගැලපෙන හා සුදුසු” ලෙස නම් කළ පුද්ගලයින් මත සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයට පත්කරීම සිදුවනු ඇත. අනතුරුව අධ්‍යක්ෂක, බැංකු නොවන මුල්‍ය සමාගම් සුපරික්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහබැංකුව වෙත අනුමැතියට යොමු කෙරේ.<br>2018/19 වර්ෂය තුළ සියලුම පත්කිරීම් ඉහත ක්‍රියාදාමය සමඟ අනුකූල වු අතර, ඒ සම්බන්ධව පිටු 44ට යොමු වන්න. | ✓ |
| 4 (10) | **තාවකාලික තනතුරු සඳහා පත් වු අධ්‍යක්ෂකවරුන් නැවත පත් කරීම**<br>සමාගමේ සංස්ථාපන ප්‍රකාශනයේ වගන්ති අංක 27 (2)ට අනුව සියලුම අධ්‍යක්ෂකවරුන් තාවකාලික තනතුරුවලට පත් වූ අධ්‍යක්ෂකවරුන් ඇතුළත්ව ඔවුන්ගේ එම පත්වීම්වලට අදාළව පළමු මහසභා රැස්වීමේදී කොටස්හිමියන්ගේ කැමැත්ත විමසීමට යොමු කෙරේ. | ✓ |

# ආයතනික පාලන - ඇමුණුම්

| නියෝග අංක | මූලධර්මය හා අනුකූලතාවය දැක්වීම | අනුකූලතා තත්ත්වය |
|---|---|---|
| 4 (11) | **අධ්‍යක්ෂකවරුන්ගේ ඉල්ලා අස්වීම/ඉවත් කිරීම අනාවරණය**<br>සියළු ඉල්ලා අස්වීම්/ඉවත් කිරීම් සහ පත්කිරීම් ප්‍රමාණවත් තොරතුරු සමග කොටස්හිමියන් දැනුවත් කිරීම, හා අප්‍රමාද දැනුම්දීමකින් කොළඹ කොටස් හුවමාරුව වෙත සිදුකිරීම, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහබැංකුවේ බැංකු නොවන මුල්‍ය සමාගම් අධීක්ෂණ දෙපාර්තමේන්තු අධ්‍යක්ෂකවරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව අදාළ වන රෙගුලාසි අනුකූලව සිදුකරනු ලබයි. | ✔ |
| D | **අධ්‍යක්ෂකවරුන්ගේ යෝග්‍යතාවය හා හිමිකාරීත්වයන්** | |
| 5 (1) | **අධ්‍යක්ෂකවරුන්ගේ යෝග්‍යතාවය හා හිමිකාරීත්වයන්**<br>අධ්‍යක්ෂකවරුන් වයස අවුරුදු 70 නොඉක්මවිය යුතු බව.<br>වයස අවුරුදු 70 ඉක්මවූ අධ්‍යක්ෂකවරුන් සමාගම තුළ නොමැත. | ✔ |
| 5 (2) | **සමාගම් 20කට වඩා අධ්‍යක්ෂක තනතුරු හොබවීම**<br>සමාගම් 20කට වඩා තනතුරු හොබවන අධ්‍යක්ෂකවරුන් සමාගමේ නොසිටීම.<br>කරුණාකර අධ්‍යක්ෂක මණ්ඩල පිටුව 27 සහ 28ට යොමුවන්න. | ✔ |
| E | **කාර්ය බෙදාහැරීම** | |
| 6 (1) | **අධ්‍යක්ෂක මණ්ඩල කාර්යයන් පැවරීම**<br>සාංගමික ව්‍යවස්ථාවලියේ වගන්ති අංක 29 (2) මගින් දක්වා ඇති ආකාරයට අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂක මණ්ඩල කමිටු සහ කළමනාකරණයට පැහැදිලිව නිර්වචනය කළ විධි නියෝග හා අධිකාරී බලය සහිතව බලය බෙදාහැරීම වගකිවයුතු භාවය රකින අතරතුරු සිදුකරනු ලැබ ඇත. | ✔ |
| 6 (2) | **කාලානුරූප පදනමින් අධ්‍යක්ෂක මණ්ඩල බලය බෙදාහැරීම සමාලෝචනය**<br>අධිකාරී ව්‍යුහයේ බලය බෙදාහැරීම අධ්‍යක්ෂක මණ්ඩලය කාලානුරූපව සමාලෝචනය කරනු ඇත. එමගින් ප්‍රමාණවත් කාලසීමාවක්, කල්පනාවට ගන්නා අස්ථිත්ව පරිමාණය සහ එහි නිෂ්චිත මෙහෙයුම් සන්දර්භය පිළිබඳව සහතික කරනු ඇත. | ✔ |
| F | **සභාපති හා ප්‍රධාන විධායක** | |
| 7 (1) | **සභාපති හා ප්‍රධාන විධායක කමිටුවේ බල වියෝජනය**<br>සමාගමේ සභාපති හා ප්‍රධාන විධායක යන තනතුරුවලට සමබර බලයක් හා අධිකාරියක් ලැබීම සහතික කරමින් භූමිකාවන් වෙන්කර ඇත. | ✔ |
| 7 (2) | **විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂක, සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු නොවන අවස්ථාවන්හිදී ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂක ලෙස පදවි ප්‍රාප්තිය**<br>සභාපතිවරයා සදාචාරාත්මක කරුණු මත ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු නොවන අවස්ථාවන් එනම්, මව් සමාගමේ පදවියක් දැරීම, සමාගමේ විවිධ අනුසමාගම්හි සභාපති හා අධ්‍යක්ෂකවරයෙකු වීම වැනි කරුණු මත ඔහු ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු ලෙස සැලකේ. 2018/19 වර්ෂය තුළ කිසිඳු විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂක ලෙස පදවිප්‍රාප්ත නොවුනු අතර, රෙගුලාසි අනුගත නොවීම අප්‍රමාදව සමාගම වෙත අවධානය පිණිස යොමු කළ අතර, එවැනි රෙගුලාසි අනුගත නොවීම සම්බන්ධයෙන් ක්ෂණික නිවැරදි කිරීමේ පිළියම් යොදන ලදී.<br>2019 ජූනි 13 දින සිට ක්‍රියාත්මක වන පරිදි අමීර්තලිංගම් මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකුවීම නිසා ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු ලෙස එදින සිට කටයුතු කරනු ඇත. | ✘ |
| 7 (3) | **සභාපති, ප්‍රධාන විධායක හා අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් අතර සම්බන්ධතාවයක් හෙළිදරව් කිරීම**<br>මෙම තනතුරු දරන්නන් විසින් දක්වනු ලැබූ ආකාරයට කුමණ ආකාරයක හෝ මූල්‍යමය, ව්‍යාපාරික, පවුල් හෝ වෙනත් ප්‍රමාණාත්මක සබඳතාවයක් සභාපති/ප්‍රධාන විධායක සහ/හෝ අනෙකුත් අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් අතර, ඔවුන්ගේ විෂයපථයට හානිකරන ආකාරයට නොපවතින බවට සහතික කර ඇත.<br>අධ්‍යක්ෂක මණ්ඩල පිටු 26 සහ 28 සහ කළමනාකරණ සමූහය, පිටුව 30-34 යොමු වන්න. | ✔ |
| 7 (4) | **සභාපති භූමිකාව**<br>සමාගම් සංස්ථාමය පාලන ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි සභාපතිවරයාගේ වගකීම් තුළ අධ්‍යක්ෂක මණ්ඩලය මෙහෙයවීම සහ එකී කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සුරක්ෂිත කිරීම අයත් වේ.<br>සභාපති සහ ප්‍රධාන විධායක පිටුව 43 යොමු වන්න. | ✔ |
| 7 (5) | **අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම සඳහා න්‍යායපත්‍ර සකස් කිරීමේ සභාපති භූමිකාව**<br>සභාපති විසින් න්‍යායපත්‍ර පිළියෙල කිරීමේ කාර්යසමාගමේ ලේකම්වරයාට පවරනු ලැබ ඇත. | ✔ |
| 7 (6) | **සභාපති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වලදී පැනනැගුණ ගැටුම් සම්බන්ධයෙන් සියළු අධ්‍යක්ෂකවරුන් ප්‍රමාණවත් හා නිසිකලට දැනුවත් කළ බවට සුරක්ෂිතවීම**<br>සභාපති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වලදී පැනනැගුණ ගැටුම් සම්බන්ධයෙන් සියළු අධ්‍යක්ෂකවරුන් සුදුසු ආකාරයට සංෂිප්ත දැනුවත් කිරීම න්‍යායපත්‍ර සහ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා ප්‍රමාණවත් කාලයක් ඒවා කියවීමට සැළැස්වීමට පෙරාතුව ලබාදීම සහතික කරනු ඇත. | ✔ |

# ආයතනික පාලන - ඇමුණුම්



| නියෝග අංක | මූලධර්මය හා අනුකූලතාවය දක්වීම | අනුකූලතා තත්ත්වය |
|---|---|---|
| 7 (7) | **අධ්‍යක්ෂක මණ්ඩල කටයුතු සඳහා ක්‍රියාකාරී දායකත්වයක් ලබාදීමට සියළු අධ්‍යක්ෂකවරුන් ධෛර්යමත් කිරීම**<br>සභාපති විසින් අධ්‍යක්ෂක මණ්ඩලයේ න්‍යාය පත්‍ර ක්‍රමය හා ධිවනිය දක්වනු ලැබෙන අතර, සියළු අධ්‍යක්ෂකවරුන්ගේ මතයන් තීරණ ගැනීමෙහිලා සලකා බැලීමට සහතික කිරීම සහ එමගින් අධ්‍යක්ෂක මණ්ඩල කටයුතුවලට එක් එක් අධ්‍යක්ෂකවරයාගේ ක්‍රියාකාරී දායකත්වය ප්‍රවර්ධනය කිරීම. | ✓ |
| 7 (8) | **විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ගේ සහභාගීත්වය හා විධායක නොවන අධ්‍යක්ෂක සම්බන්ධව ධෛර්යමත් කිරීම**<br>සමාගමේ කිසිදු විධායක අධ්‍යක්ෂකවරයෙකු නොමැත.<br>එසේ වුවද සභාපති මගින් සියළු අධ්‍යක්ෂකවරුන්ට ක්‍රියාකාරිත්ව අධ්‍යක්ෂක මණ්ඩල කටයුතුවලට සහභාගිවීමට සම අවස්ථාවක් ලබා දෙමින් අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් අතර නොබෙදුන හිතකර සබඳතාවයක් ඇති කිරීමට කටයුතු කරනු ඇත. | ✓ |
| 7 (9) | **ප්‍රධාන කළමනාකරණ පුද්ගල හෝ සභාපති විධායක රාජකාරී සම්බන්ධ ඍජු සුපරීක්ෂණය කෙරෙහි බලපවත්වන ක්‍රියාකාරකම් කෙරෙහි මැදිහත්වීම මගහැරීමට කටයුතු කිරීම**<br>සභාපති විධායක අධ්‍යක්ෂකවරයෙකු නොවන නිසා සමාගමේ කිසියම් වූ විධායක රාජකාරින් කෙරෙහි ඍජු මැදිහත්වීමක් නොකරනු ඇත. එලෙසම ප්‍රධාන කළමනාකරණ තනතුරුවල සුපරීක්ෂණ සම්බන්ධයෙන් සභාපති මැදිහත් නොවනු ඇත. | ✓ |
| 7 (10) | **කොටස්හිමියන් සමග කාර්යක්ෂම සන්නිවේදනය**<br>කොටස්හිමියන් සමග යහපත් සබඳතාවයක් පවත්වා ගැනීම සඳහා සැලකිය යුතු වැදගත්කමක් අධ්‍යක්ෂක මණ්ඩලය සම්බන්ධකර ඇති බැවින් සහ වාර්ෂික මහසභා රැස්වීම් සහ අනෙකුත් පොදු රැස්වීම් කෙරෙහි කථිකාවත් සඳහා විධිමත් අවස්ථාවක් ලබාදීම හා සමාගම අතර කොටස්හිමියන් අතර සන්නිවේදනය යන කරුණු සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.<br>වාර්ෂික මහා සභා රැස්වීම පිටු අංක 50ට යොමුවන්න. | ✓ |
| 7 (11) | **ප්‍රධාන විධායක භූමිකාව**<br>සමාගමේ අග්‍රය වූ ප්‍රධාන විධායක නිළධාරි වෙත සමාගම මුලෝපායික අරමුණු විස්තරාත්ම ක සැලසුම්කරණය, හා ක්‍රියාත්මක කිරීම, හා ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධයෙන් අධිකාරිය සමග වූ බලය පවරා ඇත. එසේම සමාගම ප්‍රමාණවත් අවදානම් පරාමිතියකට අනුව එදිනෙදා සිදුවන මෙහෙයුම් කටයුතු ද පවරනු ඇති අතර, ප්‍රධාන විධායක භූමිකාව සමාගමේ සංස්ථාමය පාලන ව්‍යවස්ථාවේ විස්තරාත්මකව දක්වා ඇත.<br>සභාපති හා ප්‍රධාන විධායක පිටුව 43 යොමුවන්න. | ✓ |
| G | **අධ්‍යක්ෂක මණ්ඩලය පත්කළ කමිටූන්** | |
| 8 (1) | **අධ්‍යක්ෂක මණ්ඩල කමිටු පිහිටුවීම, ඒවායේ කාර්යයන් හා වාර්තාකරණය**<br>සමාගමට අධ්‍යක්ෂක මණ්ඩලය පත්කළ කමිටු 4ක් ඇති අතර, අධ්‍යක්ෂක මණ්ඩලය ඍජුව වාර්තා කිරීම කරනු ඇත. නාමිකව ඒවා අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුව, ඒකාබද්ධ ආදායම් කළමනාකරණ කමිටුව, වැටුප් හා නාමයෝජනා කමිටුව හා සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව ලෙස හඳුන්වන අතර, අදාල වූ නීති රීති රෙගුලාසිවලට අනුකූලව පිහිටුවන බලයලත් කමිටූන් ද වේ.<br>සෑම කමිටුවකම අදාළ වන ලේකම්වරයෙකු සිටින අතර, එම කමිටුවේ රැස්වීම්, ප්‍රගති වාර්තා තබාගැනීම, වාර්තා කිරීම සහ වෙනත් ලේඛනය සම්බන්ධ කටයුතු අදාළ කමිටූන්හි සභාපති අධීක්ෂණය යටතේ සිදුකරනු ඇත.<br>පහත අධ්‍යක්ෂක මණ්ඩල කමිටු වාර්තාවන්ට යොමුවන්න.<br>අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටු වාර්තාව පිටු 202 හා 203<br>වේතන හා නාමයෝජනා කමිටු වාර්තාව පිටුව 204<br>සම්බන්ධ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව පිටුව 205<br>ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව පිටුව 206 සිට 208 | ✓ |
| 8 (2) | **විගණන කමිටුව** | |
| (a) | **විගණන කමිටුවේ සභාපති**<br>ජේ.පී. අමරතුංග, විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂක, අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුවේ සභාපති ලෙස කටයුතු කරයි. | ✓ |
| (b) | **විගණන කමිටුවේ අන්තර්ගතය**<br>අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුවේ දෙදෙනකුගෙන් සමන්විත සියළු අධ්‍යක්ෂකවරුන් විධායක නොවන අධ්‍යක්ෂකවරු වේ. | ✓ |

# ආයතනික පාලන - ඇමුණුම්

| නියෝග අංක | මූලධර්මය හා අනුකූලතාවය දැක්වීම | අනුකූලතා තත්ත්වය |
|---|---|---|
| (c) | **විගණන කමිටු කාර්යභාරය**<br>අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන විගණන කමිටුව විසින් ඔවුන්ගේ රැස්වීමේදී නිර්දේශ කොට ඇත්තේ 2018/19 වර්ෂය සඳහා වරලත් ගණකාධිකාරිවරුන් වන අර්නස්ට් ඇන්ඩ් යංග් නැවත වරක් සමාගමේ බාහිර විගණකවරයන් වශයෙන් පත්කරන ලෙසටත්, විගණකවරුන්ට මහ බැංකුව විසින් විටින් විට දෙනු ලබන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කරන ලෙසත්, අදාළ ගිණුම් ප්‍රතිපත්ති මූලධර්මයන් හා ගිණුම් ප්‍රමිතයන් යොදා ගැනීමට කටයුතු කරන ලෙසත් හා 2018/19 සඳහා සමාගම් සමූහයේ විගණක ගාස්තු අනුමත කරන ලෙසත් වේ.<br>2018/19 වර්ෂය තුළදී විගණකවරුන් ඉල්ලා අස්වීමක් හෝ ඉවත් කිරීමක් හෝ සිදු නොවුණි. 2018/19 මුදල් වර්ෂය තුළ දී පත් කරන ලද වර්තමාන විගණන පාර්ශ්වකරුවන් සම්බන්ධ කාර්යභාරය පිළිබඳ කොන්දේසි සම්බන්ධ කාලසීමාව වර්ෂ පහක් ඉක්මවා නැත්තේය. | ✓ |
| (d) | **භාහිර විගණකගේ ස්වෛරීභාවය සමාලෝචනය හා අධීක්ෂණය හා විගණවන කාර්යභාරයේ අරමුණුගත භාවය සහ ඵලදායීත්වය**<br>අදාළ වන්නා වූ වෘත්තිය හා නියාමන අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩල මගින් පත්කරන විගණන කමිටුව බාහිර විගණකගේ සමායෝජනය, ස්වාධීනත්වය, අරමුණුගත භාවය, විගණන කාර්යභාරයේ ඵලදායීත්වය සහ බලාත්මක කොටස සමාලෝචනය හා අධීක්ෂණය කරනු ලබන්නේය.<br>2018/19 වර්ෂය සඳහා විගණකවරුන් වන අර්නස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරිවරු සිය ස්වාධීනත්වය පිළිබඳ ප්‍රකාශන පත්‍රයක් නියමිත නීති රෙගුලාසි මගින් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන ලද විගණන කමිටුව ඉදිරිපත් කර ඇත්තේය. | ✓ |
| (e) | **භාහිර විගණකවරුන් විසින් විගණන නොවන සේවාවන් සැපයීම**<br>අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන විගණන කමිටුව විසින් බාහිර විගණකගේ ස්වාධීනත්වය, අරමුණුගත භාවය සුරක්ෂා කිරීම සඳහා බාහිර විගණකවරුන් විසින් විගණන නොවන සේවාවන් සැපයීම සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති සකස් කොට වැඩිදියුණු කොට ක්‍රියාත්මක කොට ඇත්තේය. | ✓ |
| (f) | **විගණනයේ විෂය පථය නිර්ණය කිරීම**<br>සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන ලද විගණන කමිටුව බාහිර විගණකවරුන් වන අර්නස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරීවරුන් හමු වී ඔවුන්ගේ විගණන සැලැස්ම විගණන කාර්යභාරයේ ස්වභාවය සහ විෂය පථය ගැන වාර්ෂික විගණනය ආරම්භ කිරීමට පෙර සාකච්ඡා කරන ලදී. | ✓ |
| (g) | **සමාගමේ මූල්‍ය තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන ලද විගණන කමිටුව විසින් සමාලෝචනය**<br>සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල සහ අනෙකුත් මූල්‍ය හෙළිදරව් කිරීම්වල අඛණ්ඩභාවය අධීක්ෂණය කිරීම සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත්කරන ලද විගණන කමිටුව විසින් කලින් කලට සමාලෝචනය කරනු ලැබේ.<br>අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන ලද විගණන කමිටුව විසින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරනු ලබන්නේය. | ✓ |
| (h) | **භාහිර විගණකවරුන් සමග අතුරු සහ අවසාන විගණනයන්ගෙන් පැන නගින්නා වූ ගැටලු, ප්‍රශ්න සහගත දේ සහ වෙන් වශයෙන් හෙළිදරව් කොට ඇත්තා වූ කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම**<br>සමාලෝචනයට භාජනය වන කාලසීමාව තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන ලද විගණන කමිටුව එකී යම් කරුණු සඳහා වගකිව යුතු ප්‍රධාන නිලධාරින්ගේ සහභාගිත්වයෙන් තොර බාහිර විගණකවරුන් හමු වී සාකච්ඡා කරන ලදී. | ✓ |
| (i) | **බාහිර විගණකවරුන් කළමනාකරණ ලිපිය සහ එයට ප්‍රතිචාර සමාලෝචනය**<br>වර්ෂය තුළදී බාහිර විගණකවරුන්ගේ 2017/18 වර්ෂය සඳහා කළමනාකරණ ලිපිය අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන ලද විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. | ✓ |
| (j) | **අභ්‍යන්තර විගණන කා්ර්යභාරය සමාලෝචනය කිරීම**<br>අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන ලද විගණන කමිටුව විසින් 2018/19 සඳහා සමස්ත අවදානම් තක්සේරුව සහ පෙර වර්ෂවල දී කරන ලද වැදගත් විගණන නිරීක්ෂණ මත පදනම්ව අභ්‍යන්තර විගණන අංශය විසින් සකස් කොට ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන වැඩසටහන සමාලෝචනය කොට අනුමත කරන ලදී. මෙම වැඩසටහනේ අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය, ක්‍රියාකාරිත්වය සහ ඒ සඳහා පවත්නා සම්පත් ද අඩංගු විය.<br>වර්ෂය තුළදී අභ්‍යන්තර විගණන කාර්ය විසින් හෙළිදරව් කරගනු ලැබූ සහ කරනු සහ අභ්‍යන්තර අංශය විසින් පැවැත්වූ සමාගමේ අභ්‍යන්තර පාලනය සහ එයට අනුකූලතාව දැක්වීම සම්බන්ධයේන් ඇගයීම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත්කරන ලද විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.<br>2018/19 වර්ෂය තුළදී අභ්‍යන්තර විගනන අංශයේ ප්‍රධානියාගේ සහ එහි ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ගේ ප්‍රගතිය මෙන්ම සමස්තයක් වශයෙන් අභ්‍යන්තර විගණන අංශය ප්‍රගතිය අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන ලද විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. | ✓ |
| (k) | අභ්‍යන්තර පරීක්ෂණ ප්‍රධාන සොයාගැනීම් සහ කළමනාකරුවන්ගේ ප්‍රතිචාර<br>අභ්‍යන්තර විමර්ශන අංශය විසින් ඉදිරිපත් කරන ලද වාර්තා පදනම්ව අභ්‍යන්තර විමර්ශන වලින් සොයා ගත් ප්‍රධාන පෙළේ සොයා ගැනීම් සහ ඒ සඳහා කළමනාකරණ ප්‍රතිචාර අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන ලද විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. | ✓ |
| (l) | **විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගිත්වය**<br>අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන ලද විගණන කමිටුවේ කිසිඳු විධායක අධ්‍යක්ෂවරයෙක් අඩංගු නොවන අතර, එම කමිටුව විසින් සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී බාහිර විගණකවරුන් හමුවන ලදී. | ✓ |

# ආයතනික පාලන - ඇමුණුම්



| නියෝග අංක | මූලධර්මය හා අනුකූලතාවය දක්වීම | අනුකූලතා තත්ත්වය |
|---|---|---|
| (m) | **විගණන කමිටුවේ කාර්යභාරය බලාධිකාරය සහ සම්පත්**<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන ලද විගණන කමිටුවේ සේවා කොන්දේසි ලැයිස්තුවට යටත් කමිටුවේ විෂය පථය යටතට වැටෙන ඕනෑම කරුණක් සම්බන්ධව විමර්ශනය කිරීමට එයට පූර්ණ බලතල පැහැදිලි ලෙසම දී ඇත්තේය. | ✓ |
| (n) | **විගණන කමිටුවේ රැස්වීම්**<br>සමාලෝචිත මුදල් වර්ෂය තුළදී විගණන කමිටුව දස වතාවක් රැස්වින | ✓ |
| (o) | **වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කිරීම**<br>අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන ලද විගණන කමිටු වාර්තා විස්තර<br>• 2018/19 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන ලද විගණන කමිටු ක්‍රියාකාරකම්<br>• වර්ෂය තුළදී පවත්වන ලද විගණන කමිටු රැස්වීම් ගණන<br>• කමිටුවේ රැස්වීම් සඳහා පැමිණීමේ ලේඛනය<br>පිටු අංක 202 සහ 203 දක්වෙන අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන ලද විගණන කමිටු වාර්තා බලන්න | ✓ |
| (p) | **රැස්වීම් වාර්තා වාර්තා කර ගැනීම හා නඩත්තුව**<br>විගණන කමිටුවේ සේවා කොන්දේසි අනුව අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා කමිටුවේ ලේකම්වරයා වශයෙන් කටයුතු කරනු ලබන්නේය. ඔහු විසින් ප්‍රමාණවත් විස්තර සහිතව රැස්වීම් වාර්තා සටහන් කොට පවත්වාගෙන යනු ලබන්නේය. | ✓ |
| (q) | **whistle-blowing සහ බාහිර විගණකවරුන් සමග සම්බන්ධතාවය**<br>සේවක සේවිකාවන්ට තමන් දකින, ඇසෙන හෝ තමන්ට දැනගන්නට ලැබෙන කිසියම් නීති-රීති කොන්දේසි කඩකිරීමක්, සදාචාර විරෝධී හැසිරීමක් පිළිබඳව රහසිගතව අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත් කරන ලද විගණන කමිටුවට දනුම් දීමට හැකිවීම සඳහා whistle-blowing අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදාගෙන ඇත්තේය. මේ සඳහා whistle-blowing යටතේ ලැබෙන තොරතුරු ප්‍රවේශමෙන් සොයා බලන අතර කමිටුව විසින් අවශ්‍ය නිසි පියවර ඒ සම්බන්ධයෙන් ගනු ලබන්නේය. එවැනි කඩකිරීම පිළිබඳව වාර්තා කරන (රපෝර්තු කරන) පුද්ගලයන්ගේ රහසිගත භාවය සුරකින අතර එසේ වාර්තා කිරීම හේතුවෙන් ඔවුනට කිසිදු වෙනස්කමක් කිරීමට භාජනය කිරීමක් සිදු නොවීමට වගබලා ගනු ඇත. සියලුම සේවක සේවිකාවන්ගේ දනගැනීම සඳහා මෙම පතිපත්ති භාෂා තුනෙන්ම සමාගමේ අන්තර්ජාල පිටුවෙහි දක්වා ඇත්තේය. | ✓ |
| 8 (3) | **ඒකාබද්ධ අවදානම් කළමනාකරණය කිරීමේ කමිටුව** | |
| (a) | **ඒකාබද්ධ අවදානම් කළමනාකරණය කිරීමේ කමිටුවේ සංයුතිය**<br>ඒකාබද්ධ අවදානම් කළමනාකරණය කරීමේ කමිටුව සමන්විත වන්නේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මෙහෙයුම් සාමාන්‍යාධිකාරිවරුන් දෙදෙනෙකු සහ අවදානම් සහ පාලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරයාගෙන් වේ.<br>ඒකාබද්ධ අවදානම් කළමනාකරණය කිරීමේ කමිටුවේ රැස්වීම් සඳහා අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා, උප සමාගම්වල ප්‍රධාන අවදානම් දරන්නන් සහ අනුකූලතා නිලධාරියා ආරාධිතයා වශයෙන් කමිටු රැස්වීම් වලට සහභාගි වේ. | ✓ |
| (b) | **අවදානම් තක්සේරුව**<br>ඒකාබද්ධ අවදානම් කළමනාකරණය කිරීමේ කමිටුව සියලුම අවදානම් තක්සේරු කරනු ලබයි. උදා: ණය ගැනීම්, වෙළෙඳපොළ ද්‍රවශීලතාවය, සමාගම සහ උපසමාගම් සඳහා ස්ථාපනය කරන ලද අදාළ අවදානම් දර්ශකයන් මගින් වන අවදානම් අවදානම් තක්සේරුව සමාගම් මට්ටමින් මෙන්ම අවශ්‍ය වන පරිදි සමාගම් සමූහය මට්ටමින් ද කරනු ලබන්නේය.<br>ඒකාබද්ධ අවදානම් කළමනාකරණය කිරීමේ කමිටුව විසින් සමාගමේ සහ එහි වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලද උපසමාගම් වල අවදානම් පුවරු වාර්තාවන් සමාලෝචනය කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී එවැනි විශේෂිත අවදානම් මත වන ස්ථාපිත අවදානම් මට්ටම් ඉක්මවා යන අවදානම්වල නරක ප්‍රතිඵල පාලනය කර ගැනීම සඳහා අප්‍රමාදීව නිවැරදි කිරීමේ පියවර ගනු ලබන්නේය. | ✓ |
| (c) | **සියලුම විධායක මට්ටමේ කමිටුවල ප්‍රමාණවත්භාවය සහ බලාත්මක භාවය පිළිබඳව සමාලෝචනය**<br>සම්ගමේ වත්කම් සහ වගකීමේ කමිටුව ඒකාබද්ධ අවදානම් කළමනාකරණය කිරිමේ කමිටුව විසින් ස්ථාපිත කරන ලද අවදානම් දරාගත හැකි මට්ටම් මත ද්‍රවශීලතා අවදානම සහ වෙළෙඳපොල අවදානම සමාලෝචනයට භාජනය කොට අධීක්ෂණය කරනු ලබයි. සමාගමේ වත්කම් සහ වගකීම් කමිටුව තමන්ගේ ක්‍රියාකාරකම්වල බලාත්මක මට්ටම තම විෂය පථය යටතේ දක්වා ඇත්තා වූ සේවා කොන්දේසි මත වාර්ෂිකව තක්සේරුවක් කරනු ලබයි.<br>පාරිභෝගික අයදුම්පත් පදනම්ව දෙනුලබන ණය පහසුකම සහ වටිනාකම සහ ඒ මත වන අවදානම තක්සේරු කිරීම සඳහා ණය අනුමැතිය දීමේ නියමිත මට්ටම ද සමග ණය අනුමැතිය දීමේ අධිකාරි බලය පැවරීම සමාගම විසින් ස්ථාපනය කොට ඇත්තේය. ශාඛාවල ණය දීමේ සීමාවන් ඉක්මවන ණය අනුමැතියන් ශාඛාවල වත්කම් සහ වගකීම් කමිටුව විසින් සලකා බැලීම සඳහා ප්‍රධාන කාර්යාලයට එවනු ලබයි. සංස්ථාමය පාලන වාර්තාවේ දක්වා ඇති පරිදි ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරිමට පෙර ශාඛාවේ වත්කම් සහ වගකීම් කමිටුව විසින් පාරිභෝගිකයා ඇගයීමට ලක් කරනු ලබන්නේය.<br>ඒකාබද්ද අවදානම් කළමනාකරණය කිරීමේ කමිටුව වාර්තා සඳහා 206 සහ 208 දරන පිටු බලන්න. | ✓ |

# ආයතනික පාලන - ඇමුණුම්

| නියෝග අංක | මූලධර්මය හා අනුකූලතාවය දැක්වීම | අනුකූලතා තත්ත්වය |
|---|---|---|
| (d) | **කමිටුව මගින් තීරණය කරන ලද ප්‍රඥා ගෝචර මට්ටම් ඉක්මවන අවදානම් වළක්වා ගැනීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම**<br>ඒකාබද්ධ අවදානම් කළමනාකරණය කිරීමේ කමිටුව විසින් දැරිය හැකි අවදානම් මට්ටම් නිශ්චය කොට ඇති අතර තම කමිටු රැස්වීමේ දී සමාගමේ අවදානම් තත්ත්වය එකී දැරිය හැකි අවදානම් මට්ටම ද සමඟ සමාලෝචනය කරනු ලබන්නේය. | ✓ |
| (e) | **රැස්වීම් පැවැත්වෙන වාර ගණන**<br>2018/19 මුදල් වර්ෂය තුළදී ඒකාබද්ධ අවදානම් කළමනාකරනය කිරිමේ කමිටුව රැස්වීම් 4ක් පවත්වා ඇත්තේය. | ✓ |
| (f) | **විශේෂිත අවදානම් හඳුනා ගැනීමට අපොහොසත් වූ නිලධාරින්ට එරෙහිව කටයුතු කිරිම සහ අප්‍රමාදිව නිවරදි කිරිමේ ක්‍රියා මාර්ග ගැනීම**<br>ඒකාබද්ධ අවදානම් කළමනාකරණය කිරීමේ කමිටුව විසින් සහ වත්කම් වගකීම් කමිටුව සමග එක්ව සාමුහික අවදානම් හඳුනා ගනු ලබන අතර ඒවා සම්බන්ද තිරණ ගනු ලබන්නේ සාමුහිකවය. | ✓ |
| (g) | **අවදානම් තකසේරු වාර්තාවන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරිම**<br>ඒකාබද්ධ අවදානම් කළමනාකරණය කිරීමේ කමිටුවේ රැස්වීම අවසන් වූ වහාම ඒකාබද්ධ අවදානම් කළමනාකරණය කිරීමේ කමිටුවේ රැස්වීම වාර්තාව ඊලගට එන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරනු ලබයි. | ✓ |
| (h) | **අනුකූලතා ක්‍රියාවලියක් ස්ථාපනය කිරිම**<br>සමාගමේ නීති රීති රෙගුලාසි සහ නියාමන මාර්ගෝපදේශ වලට අනුකූලතාවය දැක්වීමේ තක්සේරු කිරිම සඳහා කමිටු විසින් අනුකූලතා ක්‍රියාවලියක් ස්ථාපනය කොට ඇත්තේය.<br>මෙම අනුකූලතා ක්‍රියාවලියේ ප්‍රධානියා වන්නේ නීතිඥවරයෙකු වශයෙන් ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ සේවය කරන අයෙක් වන අතර සමාගමේ ඔහු සෘජුවම නීති, රීති, රෙගුලාසි නියාමන මාර්ගෝපදේශවලට සහ අභ්‍යන්තර පාලනයට අනුකූලතාවය දැක්වීම් පිළිබඳව ඒකාබද්ධ අවදානම් කලමනාකරණ කමිටුවට වාර්තා කරනු ලබයි.<br>පිටු අංක 35 සහ 36 දැක්වෙන අනුකූලතා කළමනාකරණය වෙත යොමු වන්න. | ✓ |
| | **සම්බන්ධිත පාර්ශ්ව අතර ගනුදෙනු** | |
| 9 (2) | **අරමුණු අතර ගැටීම් වළක්වා ගැනීම**<br>සමාගම විසින් "සම්බන්ධිත පාර්ශ්වයන්" යනුවෙන් සැලකිය හැකි පුද්ගල කොට්ඨාශයන් හඳුනා ගත හැකි වන ආකාරයට සම්බන්ධිත පාර්ශ්ව ප්‍රතිපත්තියක් ස්ථාපනය කොට ඇත්තේය.<br>සමාගමේ ව්‍යාපාරික චර්යා ධර්ම හා හැසිරීම සංග්‍රහයට අනුව අවශ්‍ය කොට ඇත්තේ සමාගමේ සෑම අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම පෞද්ගලික සම්බන්ධතාවන් නිසා, බාහිර ඇසුරුම්කම් නිසා සහ වැදගත්කමින් යුත් කරුණු කාරණා නිසා තම ස්වාධීන විනිශ්චය කෙරෙහි ඔහුට/ඇයට ඇති විය හැකි වන්නා වූ අරමුණු අතර, ගැටීම් නිශ්චය කරගත යුතු බවයි. එම චර්යා ධර්ම සංග්‍රහ අවශ්‍ය කරවා ඇත්තේ එවැනි සිදුවිය හැකි හෝ සත්‍ය වශයෙන්ම පවත්නා අරමුණු අතර, ගැටීම් ඇය හෝ ඔහු විසින් තමන්ට දැනගන්නට ලද විගසම වහාම අධ්‍යක්ෂ මණ්ඩලයට හෙළිදරව් කළ යුතු බවයි.<br>සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව හේතුවෙන් ඵලදායී කළමනාකරණ සහ 205 වන පිටුවේ සඳහන් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ සොයා බැලීම් සහ අධීක්ෂණය ශක්තිමත් කෙරේ. | ✓ |
| 9 (3) | **නියෝග මගින් ආවරණය වන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**<br>සමාගමේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය ඒවායේ අගය හෝ ස්වභාවය නොසලකමින් සමාගමේ සෑම ගනුදෙනුවක්ම ආවරණය කෙරේ. | ✓ |
| 9 (4) | **යම් පාර්ශ්වයකට "වඩාත් වාසිදායක ලෙස" සැලකීමක් සලස්වන්නා වූ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවල යෙදීම තහනම් කිරීම**<br>මෙම නීතියෙන් අදහස් කොට දක්වන්නේ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය යටතේ යම් පාර්ශ්වයකට "වඩාත් වාසිදායක ලෙස" සැලකීමක් සලස්වන්නා වූ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සිදුනොවන බවට වගබලා ගැනීමයි. දැනට පවත්නා මාර්ගගත වැළැක්වීමේ පද්ධතිය මගින් මෙය තවදුරටත් තහවුරු වන අතර, එමගින් සම්බන්ධිත පාර්ශ්ව අතර, ගනුදෙනු අධීක්ෂණය කිරීමට, වාර්තා කිරීමට සහ සමාගමේ ජාලය පුරා දත්ත ලබා ගැනීමට සමාගමට හැකිවේ. | ✓ |

# ආයතනික පාලන - ඇමුණුම්



| නියෝග අංක | මූලධර්මය හා අනුකූලතාවය දක්වීම | අනුකූලතා තත්ත්වය |
|---|---|---|
| ෂ | **හෙළිදරව් කිරීම** | |
| 10 (1) | **මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම**<br>සමාගමේ වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශන සහ 2018/19 වර්ෂය සඳහා සමාගමේ කාලීන මූල්‍ය ප්‍රකාශන නියාමන සහ අධීක්ෂණ අධිකාරියන් විසින් නිමකොට දක්වා ඇති ආකෘති වලින් අදාල වන්නා වූ ගිණුම් ප්‍රමිතියන් ප්‍රකාරව ඉදිරිපත් කෙරෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය.<br>ඉහත රීති 10 (1) හි සඳහන් වන්නා වූ මූල්‍ය ප්‍රකාශන සංක්ෂිප්තව සිංහල, ඉංග්‍රිසි සහ දෙමළ භාෂාවන්ගෙන් ප්‍රකාශයට පත් කෙරෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය. | ✔ |
| 10 (2) | **වාර්ෂික වාර්තාවේ උචිත හෙළිදරව් කිරීම කෙරෙන බවට සහතික වීමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම** | ✔ |
| (අ) | අදාළ වන්නා වූ ගිණුම් ප්‍රමිතයනට අනුකූලව සහ නියාමන අවශ්‍යතාවයන්ට අනුව සකස් කරන ලද වාර්ෂික විගණිත ගිණුම් ප්‍රකාශයන් විශේෂිත හෙළිදරව් කිරීම් ද සමග වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කිරීම් සඳහා වන ප්‍රකාශයක්.<br>මෙම වර්තාවේ පිටු අංක 213 දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන්ගේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳව වගකීම් යටතේ විශේෂිත හෙළිදරව් කිරීම් සහ මෙම වාර්තාවේ පිටු අංක 217 සිට 219 දක්වා ඇත්තා වූ ස්වාධීන විගණකගේ වාර්තාව ද අඩංගුව අදාළ වන්නා වූ ගිණුම් ප්‍රමිතියනට අනුකූලව සහ නියාමන අවශ්‍යතාවයන්ට අනුව වාර්ෂික විගණිත ගිණුම් ප්‍රකාශයන් සකස් කොට ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සනාථ කරනු ලබයි. | ✔ |
| (ආ) | **සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදය පිළිබඳ වාර්තාව**<br>මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් සමාගමේ අභ්‍යන්තර පාලනයේ ඵලදායිතාවය හා යාන්ත්‍රණය ගැන වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව මෙම වාර්තාවේ පිටු අංක 215 හි අඩංගු මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් සමාගමේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවෙහි දැක්වේ. | ✔ |
| (ඇ) | **අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ඵලදායිතාවය පිළිබඳව බාහිර විගණකවරුන් ගේ සහතිකකරණය**<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයේන් වන පාලනය ගැන බාහිර විගණකවරුන්ගෙන් සහතික කිරීම් වාර්තාවක් ලබා ගත් අතර එය මෙම වාර්තාවේ පිටු අංක 215 හි දක්වේ. | ✔ |
| (ඈ) | **නම් සහිතව සහ සමාගම සමග කරන ලද ගනුදෙනු ද සහිතව අධ්‍යක්ෂවරුන් පිළිබඳ තොරතුරු**<br>මෙම වාර්තාවේ අංක 26 සිට 28 දක්වා වන පිටු වලින් සමාගමේ අධ්‍යක්ෂවරුන් ගැන තොරතුරු ලබාගත හැකි අතර ඔවුන් විසින් සමාගම සමග කරන ලද ගනුදෙනු පිළිබඳ විස්තර පිටු අංක 340 සිට 344 දක්වා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 58 යටතේ හෙළිදරව් කොට ඇත්තේය. | ✔ |
| (ඉ) | **සමාගම විසින් අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද ගාස්තු/පාරිශ්‍රමික සමුච්චයක් වශයෙන්**<br>සමාගම විසින් අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද ගාස්තු/පාරිශ්‍රමික පිළිබඳ විස්තර පිටු අංක 340 සිට 344 දන්වා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 58 යටතේ හෙළිදරව් කොට ඇත්තේය. | ✔ |
| (ඊ) | සමාගමේ ප්‍රාග්ධන අරමුදල්වල ප්‍රතිශතයක් ලෙස අදාල එක් එක් සම්බන්ධිත පාර්ශ්වවලට අදාළ ශුද්ධ ණය<br>එක් එක් සම්බන්ධිත පාර්ශ්වයන් ආශ්‍රිතව හිඟව ඇති ශුද්ධ ණයවල එකතුව සහ එක් එක් සම්බන්ධිත පාර්ශ්වයන් අශ්‍රිතව හිඟව ඇති ශුද්ධ ණය සමාගමේ ප්‍රාග්ධන අරමුදලේ ප්‍රතිශතයක් වශයෙන් පිටු අංක 340 සිට 344 දක්වා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 58 යටතේ හෙළිදරව් කර ඇත්තේය. | ✔ |
| (උ) | ගෙවන ලද වේතනයේ සමස්ථ වටිනාකම සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ ගනුදෙනු කිරීම්<br>සමාගම විසින් ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන්ට ගෙවන ලද සමුච්චිත පාරිශ්‍රමික සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන් සමඟ කරන ලද ගනුදෙනු පිළිබඳ විස්තර ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කොට ඇත්තේය. | ✔ |
| (ඌ) | **අනුකූලතා සහතිකය**<br>2018/19 වර්ෂ තුළදී දූරදර්ශී අවශ්‍යතාවයන්, රෙගුලාසි, නීති රීති හා අභ්‍යන්තර පාලනය පිළිබඳව සමාගම විසින් අනුකූලත්වය දැක්වීම පිළිබඳව තොරතුරු සමාගමේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ 54 සිට 59 දක්වා වන පිටු තුළද ආයතනික පාලන වාර්තාවේ 37 සිට 53 දක්වා ද විස්තර කොට ඇත්තේය.<br>මෙම වාර්තාවෙන් සහ ඉහත දැක්වූ සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කොට ඇත්තා වූ කරුණු වලට අමතරව ප්‍රමාණවත් වැදගත් කමින් යුත් දූරදර්ශී අවශ්‍යතාවයන්, රෙගුලාසි, නීති රීති සහ අභ්‍යන්තර පාලනය පිළිබඳව අනුකූලතාවය නොදැක්වීමේ අවස්ථාවන් නැත්තේය. | ✔ |

| නියෝග අංක | මූලධර්මය හා අනුකූලතාවය දැක්වීම | අනුකූලතා තත්ත්වය |
|---|---|---|
| (i) | **අනුකූලතාවය නොදැක්වීමේ දක්වන වාර්තාව**<br>සමාගම් අවදානම් කළමනාකරණය ක්‍රියාමාර්ගයේ හෝ මූල්‍ය ව්‍යාපාර පනත සහ එහි අන්තර්ගත නීති රීති සහ නියමයන් යටතේ මූල්‍ය මණ්ඩල මගින් මහජනයා වෙත හෙළිදරව් කළ යුතු යැයි නියම කොට ඇත්තා වූ කරුණු සම්බන්ධ වන්නා වූ ඌණතාවයන් පිළිබඳව අධීක්ෂණ කරුණු නැත්තේය. | ✓ |
| (j) | **අනකූලතාවන් පිළිබඳව බාහිර විගණනකරුවන්ගේ සහතිකකරනය**<br>ආයතනික පාලන නියමයන් සම්බන්ධයෙන් අනකූලතා අවශ්‍යතාවන් ඉටු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කල සමාන ආශ්‍රිත සේවාවන් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිත 4750 (ශ්‍රී.ලං.ස.ආ.සේ. 4750) යටතේ බාහිර විගණකවරුන් විසින් විගණන වැඩසටහන් ක්‍රියාත්මක කරුනු ලැබීය. ඔවුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය අමතමින් නිකුත් කරන ලද වාර්තාව ඉහත හෙළිදරව් කරනු ලැබූ කරුණු හා සම්බන්ධයෙන් සමගාමී වන අතර ඉහත අධ්‍යක්ෂ මණ්ඩලය මගින් වාර්තා කරනු ලැබූ කරුණු වලට අදාළව පරස්පරතාවයන් ඇතැයි ඉන් හෙළිදරව්වක් කොට නැත. පෙරදී කළ ආකාරයටම විගණකවරයා විසින් කරන ලද කිසියම් නිර්දේශයක් ඇතොත් ඒවා අදාළ වන පරිදි 2019/20 දී ක්‍රියාවට නගනු ලබනු ඇත. | ✓ |
| J | **අන්තර් කාලීන විධි විධාන** | |
| 11 | අන්තර් කාලීන සහ වෙනත් විධිවාධාන | ✓ |

# විගණන මණ්ඩල කමිටු වාර්තාව

## විගණන මණ්ඩල කමිටුවේ සංයුතිය

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරනු ලබන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් විගණන මණ්ඩල කමිටුව (කමිටුව යනුවෙන් මින් මතු ඇතැම් තැනක හැඳින්වෙන) සමන්විත වේ.

පහත සඳහන් අධ්‍යක්ෂවරු 2019 මාර්තු මස 31 වැනි දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා පත්ව සිටියහ:

ජෙහාන් පී. අමරතුංග මහතා - සභාපති

මයිකල් ප්‍රදීප් අමිර්තනායගම් මහතා

මොහොමඩ් අනීස් මොහොමඩ් රිස්වාන් මහතා

සභාපති ජෙහාන් පී. අමරතුංග මහතා විධායක නොවන අධ්‍යක්ෂවරයකු වන අතර, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයකු ද, වරලත් කළමනාකරණ ගණකාධිකාරී (එංගලන්තය) ආයතනයේ අධිසාමාජිකයකු ලෙසද ක්‍රියා කරයි. ඔහු වසර 30කට අධික කාලයක් තිස්සේ කළමනාකරණ හා මූල්‍ය ක්ෂේත්‍රයේ හසල අත්දැකීම් ඇති අයෙකි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිවරුන්ගේ ආයතනයේ පාලන මණ්ඩලයේ සාමාජිකයකු ලෙසද ක්‍රියා කර ඇත.

සාමාජිකයන් සම්බන්ධ විස්තර මෙහි පිටු අංක 27 සහ 28 හි දැක්වේ.

විගණන මණ්ඩල කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරන්නේ අභ්‍යන්තර විගණන ප්‍රධානි උදේශ් ගුණවර්ධන මහතාය.

## කමිටුවේ ප්‍රඥප්තිය

කමිටුවේ විෂය ක්ෂේත්‍රය කුමක්ද යන්න විගණන කමිටු ප්‍රඥප්තියේ පැහැදිලිව දක්වා ඇත. මෙම ක්‍රියාවලිය තුළින් ව්‍යාපාරික කටයුතු හා නව සංවර්ධනය සහතික කෙරේ. කමිටුවේ කාර්යයන් පිළිබඳව නිරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම කමිටුවේ වගකීමයි. අධ්‍යක්ෂ මණ්ඩලය සිය කටයුතු කරගෙන යාමේදී මූල්‍ය වාර්තා, බාහිර සහ අභ්‍යන්තර ගිණුම් විගණන, නෛතික හා නියාමන සහ අවදානම් කළමනාකරණය වැනි කටයුතුවලදී කමිටුවේ කාර්යය විය යුත්තේ ඒ සඳහා සහයවීමයි.

## අරමුණු සහ භූමිකාව

- සමාගම් පනතේ හා අදාළ අනෙකුත් රෙගුලාසි අනුව අවශ්‍ය මූල්‍ය තොරතුරු සැපයීම, සමාගමේ සම්පූර්ණ මූල්‍ය තොරතුරු වාර්තා කිරීම
- අභ්‍යන්තර පාලන ක්‍රමයෙහි සාර්ථකත්වය හා සමාගමේ අවදානම් පිළිබඳව ක්‍රියාකාරීත්වය
- පූර්වාපේක්ෂණයෙන් යුතුව සමාගම ඉදිරියට යාමට ඇති හැකියාව
- සමාගමේ බාහිර විගණකවරුන්ගේ ක්‍රියාකාරීත්වය සහ ස්වාධීනත්වය.
- සමාගමේ අභ්‍යන්තර විගණන කටයුතුවල ක්‍රියාකාරීත්වය
- සමාගමේ ක්‍රියාකාරීත්වය ඇතුලුව නීතියට අනුකූලව ක්‍රියාත්මක වන්නේද, හා නියාමන අවශ්‍යතාවයන්ට අනුව ක්‍රියාත්මක වන්නේද, යන්න සහතිකවීමද කමිටුවෙන් අපේක්ෂා කෙරේ

## අධිකාරිත්වය

කමිටු රැස්වීමකට ඕනෑම සේවකයකු කැඳවීමටත්, ප්‍රශ්ණ කිරීමටත් තොරතුරු ලබා ගැනීම සඳහා පූර්ණ ප්‍රවේශයද සමාගමේ වියදමින් බාහිර වෘත්තික උපදෙස් ලබා ගැනීමට හැකියාවද ඕනෑම කරුණක් සම්බන්ධයෙන් විමර්ෂණය කිරීමට නිශ්චිත ලෙසම අධිකාරිත්වය කමිටුව වෙත හිමිකර දී ඇත.

## විගණන කමිටු මණ්ඩල රැස්වීම

මූල්‍ය වර්ෂය තුළදී කමිටුව දස වතාවක් රැස්වී සමාලෝචනයෙහි නිරත වී ඇත. ඊට සහභාගී වූ සාමාජිකයින් ගණන පහත වගුවෙහි දැක්වේ:

| සාමාජිකයාගේ නම | කමිටු රැස්වීම පැවැත් වූ වාර ගණන | කමිටුවලට සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| ජෙහාන් පී. අමරතුංග මහතා | 10 | 10 |
| මයිකල් ප්‍රදීප් අමිර්තනායගම් මහතා | 10 | 10 |
| මොහොමඩ් අනීස් මොහොමඩ් රිස්වාන් මහතා | 10 | 10 |

කමිටුව විසින් ආරාධනා කරනු ලැබූ විට සමාගමේ ඕනෑම නිලධාරියකු, බාහිර විගණකවරුන් සහ ඕනෑම බාහිර තැනැත්තෙකු එම රැස්වීමට හෝ එහි කොටසකට සහභාගී විය යුත්තේය. විගණන කමිටු රැස්වීම්වලදී වාර්තාගත කරන ලද සටහන් ඇතුලු විස්තරද සමග අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය.

## ක්‍රියාකාරම්වල සංක්ෂිප්තය

### මූල්‍ය වාර්තාකරණය

මූල්‍ය ප්‍රකාශණයන් තුළ වැදගත් තීන්දු තීරණ ඇතුළත් වන නිසාත් ඒවා පරිපූර්ණත්වයෙන් හා විශ්වාසනීයත්වයෙන් යුක්තව තිබේද යන්න කමිටුව විසින් සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුත්තේය. මූල්‍ය ප්‍රකාශන එළි දැක්වීමට පෙර, පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය:

(1) වැදගත් තීරණ ගත යුතු අංශ මොනවාද යන්න

(2) ගිණුම් කටයුතු සම්බන්ධයෙන් සිදු කළ යුතු ප්‍රතිපත්ති හා ප්‍රායෝගික වෙනස්කම් මොනවාද යන්න

(3) විගණනය තුළින් අනාවරණය වූ කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය යථාවත් කිරීම්

(4) ව්‍යාපාරයෙහි අඛණ්ඩත්වය පිළිබඳ උපකල්පන

(5) පිළිගත් ගිණුම් ප්‍රමිතීන් හා අනෙකුත් නෛතික අවශ්‍යතාවයන් අනුගමනය කිරීම

සමාගම විසින් මූල්‍ය වාර්තා සැකසීමේදී සැළකිල්ලට ගත යුතු අවශ්‍යතා, සමාගම් පනතේ නියම කර ඇති පරිදි තොරතුරු ලබා දීමේදී සැළකිල්ලට ගතයුතු කරුණු, මූල්‍ය ව්‍යාපාරික පනත සහ මූල්‍ය වාර්තා සැකසීමේදී අදාළ කරගත යුතු රෙගුලාසි හා අවශ්‍යතාවයන් අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්දැයි තක්සේරු කර බැලීම සිදු කෙරේ.

# විගණන මණ්ඩල කමිටු වාර්තාව

## අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම

ශ්‍රී ලංකාවේ පවත්නා විගණන ප්‍රමිතීන්වල දක්වෙන නිර්නායකයන්ට අනුකූලව ව්‍යාපාරික අවදානමේදී ප්‍රමාණවත් පියවර ගෙන ඇති බවට සහතික වෙමින් ව්‍යාපාරයේ අභ්‍යන්තර පාලන කටයුතු සහ අවදානම් කළමනාකරණය සිදුවන බවට කමිටුව නිරීක්ෂණයෙහි යෙදී සිටියි.

ව්‍යාපාරය අනාගතයේදී ද රඳා පැවැත්මට ඇති හැකියාව පිළිබඳවද කමිටුව විසින් තක්සේරු කරනු ලබයි. වාර්ෂික වාර්තාවට ඇතුළත් කරනු ලැබීමට නියමිත මූල්‍ය වාර්තා පිළිබඳ වන අභ්‍යන්තර පාලන ක්‍රම දක්වෙන අධ්‍යක්ෂවරුන්ගේ වාර්තා සමාලෝචනය හා අනුමත කිරීමද කමිටුව විසින් සිදුකරනු ලැබේ.

## බාහිර විගණනය

ස්වාධීන හා විෂය මූලිකව, පිළිගත් බාහිර විගණන ක්‍රියාවලිය ප්‍රමිතීන් හා විශිෂ්ට තත්ත්වයෙන් යුතුව සිදු කෙරෙන්නේදැයි කමිටුව විසින් පරීක්ෂාවට භාජනය කෙරේ. විගණකවරුන්ගේ ස්වාධීනත්වය හා විෂය මූලිකත්වය ආරක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව බාහිර විගණකවරුන්ගේ සේවය විගණන නොවන සේවාවන් සඳහා ලබා ගැනීමටත් එය ප්‍රතිපත්තියක් ලෙස සැකසීම හා දියුණු කිරීමටත් කටයුතු කෙරේ.

වසර තුළදී විගණන කමිටුව විසින් බාහිර විගණකවරුන් මුණගැසී, විගණන යෝජනා සහ එහි විෂය පථය ගැනත් සාකච්ඡා කරන ලද අතර, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් නොමැතිව සාකච්ඡාවට භාජනය විය යුතු කාරණාද ඇතුලුව බාහිර විගණකවරුන්ට විගණනයේදී මුහුණදීමට සිදු වන ගැටලු සහ ප්‍රශ්ණ සාකච්ඡා කිරීම සදහා අවස්ථා ලබා දෙන ලදී.

තවද බාහිර විගණකවරුන් විසින් එවා ඇති ලිපියද, එකී ලිපියට කළමනාකාරීත්වය විසින් යවා ඇති පිළිතුරද කමිටුවේ සමාලෝචනයට ලක්වී ඇත.

## අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය සතු සම්පත්, විෂය පථය හා එහි ක්‍රියාකාරීත්වය පිළිබද සමාලෝචනය කරන ලද කමිටුව එයට අදාළ රාජකාරී කටුයතු කිරීම සඳහා අවශ්‍ය අධිකාරීත්වය ලබාදී ඇති බවට සෑහීමට පත් වී ඇත. සමාගමේ සමස්ත අවදානම් කළමනාකරණ පද්ධතිය තුළ අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරීත්වය කෙතෙක් දුරට සාර්ථකදැයි කමිටුව විසින් සමාලෝචනයට භාජනය කර ඇත.

අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු ස්වාධීනව කෙරෙන බවට, අපක්ෂපාතීව, කාර්යක්ෂමව හා වෘත්තීයමය ආරක්ෂව සහිතව සිදු කෙරෙමින් පවතින බවට කමිටුව විසින් තහවුරු කරනු ලැබ ඇත.

අභ්‍යන්තර විගණනය මගින් සොයාගන්නා ලද කරුණු ද ඒ සම්බන්ධයෙන් ලබා දුන් නිර්දේශයන් ද ඊට අදාළව කළමනාකාරීත්වයට දක්වා ඇති ප්‍රතිචාරයන්ද කමිටුවේ සමාලෝචනයට භාජනය වී ඇත.

## නියාමන අනුකූලතා පිළිබඳ අධීක්ෂණය

අභ්‍යන්තර විගණන අංශයෙහි සහයෝගය ඇතිව අනිවාර්යය ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ ක්‍රමයන්ද, ක්‍රියාමාර්ගයන්ද සම්බන්ධයන් හා ඒවා අනුගමනය කළ යුත්තේ කෙසේදැයි යන්න ඉතාමත් සියුම් ලෙස පරීක්ෂාවට භාරජනය කරන ලදී.

## ආචාරධර්ම සහ යහපාලනය

අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය තුළ යහපාලන පිළිබද විගණන ප්‍රතිපත්ති ප්‍රඥප්තිය පරීක්ෂාවට භාජනය කරමින් ඔවුන් අතර ප්‍රචලිත කිරීමක් සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන් ආයතනයේ ඇති වංචා ආදිය හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය හඳුන්වාදීමක් ක්‍රියාත්මක කෙරේ.

ආයතනික පාලනයේ ඉහළම ප්‍රමිතීන් සමාගමේ ආචාරධර්මවලට ඇතුල් කිරීම සහතික කෙරේ. සමාගමේ සිදුවන වංචාවන් පිළිබඳ අනාවරණය කිරීමේ Whistle Blower ක්‍රමයෙන් හා අන්‍යාකාරයෙන් එවැනි වැරදි අනාවරණයවීමෙන් පසුව ඒ පිළිබඳ අවශ්‍ය ස්වාධීන පරීක්ෂණ පැවැත්වීම සහතික කෙරේ.

## අභ්‍යන්තරයෙන් ලැබෙන තොරතුරු මත වංචාවන් අනාවරණය කිරීම හා වංචා දූෂණ

ඒකාබද්ධව සිදුකරනු ලබන වංචා කළමනාකරණය කිරීම උදෙසා වන සමාගමේ වංචා හෙළිදරව්කර ගැනීමේ ක්‍රමෝපාය පුළුල් කිරීම දක්විය හැකිය. යම් සේවකයකු විසින් නිරීක්ෂණය කරන ලද හෝ දුටු යම්කිසි නුසුදුසු හෝ නීති විරෝධී හෝ ආචාරසම්පන්න නොවන ක්‍රියාවක් ඇතොත්, එය වහාම විගණන මණ්ඩල කමිටුව වෙත දන්විය යුතුය.

මෙම ප්‍රතිපත්ති භාෂා තුනෙන්ම සමාගමේ අන්තර්ජාලයේ පළ කරනු ලැබේ. තොරතුරු සපයන්නා පිළිබඳ විස්තර හෙළිදරව් නොකිරීමට මෙම ප්‍රතිපත්තිය මගින් තදින්ම බැඳී සිටී.

## බාහිර විගණකවරුන් පත්කිරීම

විගණකවරුන්ගේ අංක BAP/B/PLF/2018/01 හා 2019 ජනවාරි මස 18 දිනැති ලිපිය මගින් දන්වා ඇත්තේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 55 වෙනි වගන්තිය අනුව පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, විගණකාධිපතිගේ "විගණන ඒකකයට" වැටෙන බැවින් විගණකාධිපතිවරයා විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන පුද්ගලයකු විසින් විගණනය පවත්වනු ලැබිය යුතු බවය.

විගණකාධිපතිවරයා එම ලිපියෙන් තවදුරටත් කියා සිටින්නේ මින් ඉදිරියට හා වාර්ෂික මහා සභා රැස්වීමේදී විගණකවරයෙකු පත්කිරීම අවශ්‍ය නොවන බවය.



**ජෙහාන් අමරතුංග**
(සභාපති)
විගණන මණ්ඩල කමිටුව

2019 මැයි 16 වන දින

අනුකූලත්ව වාර්තා

# වේතන හා නාමයෝජනා කමිටු වාර්තාව

2011 අගෝස්තු මස 22 දින සමාගමේ වේතන කමිටුව පිහිටුවන ලද අතර, 2013 අගෝස්තු 06 දින වේතන හා නාමයෝජනා කමිටුව ලෙස නැවත නම්කර යථා පරිදි මෙම කමිටුව සංස්ථාපනය කරන ලදී.

## කමිටුවේ සංයුතිය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වේතන හා නාමයෝජනා කමිටුව පත්කරන ලදී. එය විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනකුගෙන් සමන්විත වන අතර, එයින් එක් අයෙකු ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් නොවේ. 2019 ජූනි 13 දින සිට අමිර්තනාගයම් මහතා ස්වාධීන අධ්‍යක්ෂවරයකු ලෙස පත්වීමක් සමගම කමිටුවත් ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු සහිත කමිටුවක් බවට පත් විය.

2015 අප්‍රේල් මස 08 දින සිට ක්‍රියාත්මකවන සේ කමිටුවට පත්කළ සාමාජිකයන් වූයේ -

ජෙහාන් ප්‍රසන්න අමරතුංග මහතා (කමිටු සභාපති)

මයිකල් ප්‍රදීප් අමිර්තනාගයම් මහතා

ජොන්සන් ඇන්තනි ප්‍රනාන්දු මහතා

ඔවුන් පිළිබඳ කෙටි ගොනුවක් වාර්ෂික වාර්තාවේ 27 සහ 28 වෙනි පිටුවල අඩංගු කර ඇත.

## කමිටු රැස්වීම

කමිටුව වර්ෂය තුළ රැස්වීම් 6ක් පවත්වා ඇති අතර, මණ්ඩලය වෙත කෙළින්ම ඒ බව වාර්තා කර ඇත. ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ආරාධනා මත රැස්වීම්වලට සහභාගී වී අනෙකුත් අවස්ථාවලදී ඔවුන්ගේ විෂය පථයට අදාළ කරුණු පිළිබඳව අවශ්‍යතාවය මත සහභාගීවී ඇති අතර, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය අවශ්‍ය වූ අවස්ථාවලදී කමිටුවලට සහාගී කරවා ඇත.

සාමාජිකයන් කමිටුවලට සහභාගිවීම පිළිබඳ පහත වගුවෙහි දැක්වේ.

| සාමාජිකයින් | සහභාගීත්වය |
|---|---|
| ජේ.පී. අමරතුංග මහතා (සභාපති) | 5/6 |
| එම්.පී. අමිර්තනාගයම් මහතා | 6/6 |
| ජේ.ඒ. ප්‍රනාන්දු මහතා | 5/6 |

## කමිටුවේ විෂයපථය

මණ්ඩලයට සාමාජිකයින් තෝරා ගැනීමේදී කමිටුව විසින් මණ්ඩලයට අවශ්‍ය උපදෙස් සැපයීමත් කාර්ය සාධනය මත සමාගමේ වේතන ලබාදීම පෙළගැස්වීම සහතික කිරීමක් කමිටුවෙන් සිදු කෙරේ.

මණ්ඩලය විසින් අනුමත කරන ලද කොන්දේසි මත කමිටුව වෙත බලය පවරා ඇති නිසා, මණ්ඩලයට අවශ්‍ය කරනු ලබන වෙනස්කම් මොනවාද යන්නත්, එහි සැකැස්ම, ප්‍රමාණය හා සංයුතිය කුමක් විය යුතු දැයි යන්නද කමිටුව තීරණය කරයි. කමිටුව යටත් වන කොන්දේසි මත, ඔවුන්ට පත් කිරීම් සම්බන්ධ තීරණගැනීමට සිදු වන අවස්ථාවලට කමිටුවේ සාමාජිකයන්ගේ සහභාගීත්වය වලක්වා ඇත.

## කමිටුවේ ක්‍රියාකාරකම්

ඉහළ මට්ටම්වල ජනතාව ආකර්ෂණයකර ගැනීමේ වැඩපිළිවෙළක් සඳහා සිත් ඇදගන්නාසුලු උපාය මාර්ගයක ත්‍යාග ලබාදීමේ හා ප්‍රතිලාභ ලබාදීමේ වැඩපිළිවෙලක් සඳහා කමිටුවේ අවධානය යොමු වී ඇත.

ඒ අනුව කාර්ය මණ්ඩලය සඳහා ලබා දෙනු ලබන ණය සීමාවන් වැඩිකිරීමටත් වාහන ණය යෝජනා ක්‍රමය සංශෝධනය කිරීමටත් අවශ්‍ය වන බව සමාලෝචනයේදී කමිටුව විසින් නිර්දේශ කර ඇත. ව්‍යාපාරය වර්ධනය සඳහා ලබා දෙන විවිධාකාර පහසුකම් ප්‍රතිශෝධනය කළ යුතු බවටත් කමිටුව විසින් නිර්දේශ කරනු ලැබ ඇත.

සමාගමේ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් ලෙස මහාචාර්ය කෙනඩි ඩෙගලුල්ලේ ගුණවර්ධන සහ එන්.ඩබ්.ඒ.එම්.යූ.කේ.කේ. එඩ්වර්ඩ් වීරසිංහ යන මහත්වරුන් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම සඳහා කමිටුව විසින් නිර්දේශ කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩලය සහ මහා බැංකුවේ අනුමැතිය ඇතිව පත්කරන ලදී.

සේවකයන් තම කාර්යය සඳහා පෙළඹවීමක් ඔවුන් අනවශ්‍ය ලෙස වෙහෙසකාරී තත්ත්වයට පත්වීමක් යන කාරණා අතර මධ්‍යස්ථ තැනකට ගෙනඒම සඳහා කමිටුව විසින් ක්‍රමානුකූල වැටුප් ප්‍රතිශෝධනයක් ලබාදීමටත් එය ඔවුන්ගේ තනතුරු වලදී ඔවුන් දරන තත්ත්වය මත ඔවුන්ගේ අපේක්ෂා ඉටුවන පරිදි සිදු කිරීමටත් යෝජනා කර ඇත.

ව්‍යාපාරයේ දියුණුව අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ඉහළ කළමනාකාරීත්වයට සුදුසු අනුප්‍රාප්තිකයන් පත්කිරීමට අවශ්‍ය පියවර ගැනීමේ අවශ්‍යතාවය හඳුන්වා දී ඇත. අනුප්‍රාප්තිකයන් පත්කිරීමේ සැලැසුම වාර්ෂිකව කමිටුව විසින් සමාලෝචනයට භාජනය කිරීමටත්, එහිදී සමාගම විසින් අනුගමනය කරනු ලබන උපායමාර්ග මොනවාද යන්නත් තරඟකාරී ව්‍යාපාරික පරිසරය යන කරුණුත් සැලකිල්ලට භාජනය කරනු ඇත.

සමාලෝචනයට භාජනය වන කාලය තුළදී දැනට පවතින විශ්‍රාම ප්‍රතිපත්තියද අවධානයට යොමු කෙරේ. වර්තමාන විශ්‍රාමයාමේ ප්‍රතිපත්තිය තවදුරටත් පවත්වාගෙන යාමට නිර්දේශ කරන අතරම, උපදේශාත්මක පදනම මත සේවය කරනු ලබන අයට වයසත් නියම කෙරේ.

සමාගමේ සමස්ථ ක්‍රියාවලිය තුළ තමන් වෙත පැවරී ඇති කාර්යය ඉටුකිරීම කෙතෙක් දුරට සාර්ථකව කරනු ලබන්නේද යන්න මත වේතන ගෙවීම් සිදුකිරීමටත් සේවයන් එක් එක් කෙනාගේ සේවා ඉටුකිරීම ඇගයීමට ලක් කර ඔවුන්ට ප්‍රසාද දීමනා ගෙවීමේ උපදෙස් ප්‍රතිපත්තියට යටත්ව ප්‍රසාද දීමනා ගෙවීමටත් හඳුන්වා දී ඇත.

## අධ්‍යක්ෂවරුන්ට ලබාදෙන වේතන හා අනෙකුත් ප්‍රතිලාභ ලබාදීම.

විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා වේතන ගෙවීම තීරණය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ කමිටු රැස්වීම්වලට සහභාගීවීම වෙනුවෙන් නිශ්චිත ගෙවීමක් එකී විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙත ගෙවනු ලැබේ. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට ගෙවනු ලබන ගාස්තු තීරණය කරනු ලබන්නේ ඔවුන්ගේ කාර්යය ඉටුකිරීමේ පදනම හෝ විශ්‍රාම පදනම සළකා නොවේ. කිසිදු අධ්‍යක්ෂවරයකුට ඔහුගේ ධූරය අහිමිවීම හේතුකොටගෙන වන්දි ගෙවීමට හිමිකම් අත්සන් කරනු නොලැබේ.

වාර්ෂික වාර්තාවේ 340 පිටුවේ අධ්‍යක්ෂවරුන්ට ගෙවනු ලබන ගාස්තු සම්බන්ධයෙන් දැක්වේ.



ජෙහාන් පී. අමරතුංග
සභාපති
වේතන හා නාමයෝජනා කමිටුව

2019 ජූනි 13 වන දින

අනුකූලත්ව වාර්තා

# සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු පිළිබඳ කමිටු සමාලෝචන වාර්තාව

සමාගමේ සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු පිළිබඳ සමාලෝචන කමිටු (කමිටුව) 2014 මුල් භාගයේදී සමාගම විසින් පිහිටුවන ලද්දේ ලැයිස්තුගත ඒකකයන් සමග සිදු කරනු ලබන ගනුදෙනු දැඩි රීති හා රෙගුලාසිවලට යටත්ව සිදු වන බව සහතික කරගනුවස්ය.

## කමිටුවේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන මෙම කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, එයින් එක් අයෙකු ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වේ. 2009 ජූනි මස 13 දින පත්කරන ලද අමීර්තනායගම් මහතා සමග ස්වාධීන අධ්‍යක්ෂවරුන් දෙදෙනකුගෙන් මෙම කමිටුව සමන්විත වේ.

2015 අප්‍රේල් මස 8 වෙනි දින මයිකල් ප්‍රදීප් අමීර්තනායනම් මහතා සභාපති ලෙසද, කමිටුවේ සෙසු සාමාජිකයින් ලෙස ජොන්සන් ඇන්තනි ප්‍රනාන්දු මහතාද, මොහොමඩ් අනීස් මොහොමඩ් රිස්වාන් මහතාද පත්කරන ලදී.

වාර්ෂික වාර්තාවේ 27 සහ 28 වෙනි පිටුවල කමිටුවේ සාමාජිකයින්ගේ විස්තර ඇතුළත්ය.

## කමිටුවේ රැස්වීම්

කමිටුවේ සමාලෝචනයට භාජනය වූ කාලය තුළදී සිව් (4) වතාවක් රැස්වී ඇති අතර එහි වාර්තා කෙළින්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇත. ප්‍රධාන විධායක නිලධාරීට/සාමාන්‍යාධිකාරීවරයාට ආරාධනා කරනු ලැබීම මත රැස්වීම්වලට සහභාගීවී ඇත. රැස්වීම්වලට සාමාජික සහභාගීත්වය සිදු වූ අන්දම පහත වගුවෙහි දැක්වේ:

| සාමාජිකයින් | සහභාගීත්වය |
|---|---|
| එම්.පී. අමීර්තනාගයම් මහතා (සභාපති) | 4/4 |
| ජේ.ඒ. ප්‍රනාන්දු මහතා | 3/4 |
| එම්.ඒ.එම්. රිස්වාන් මහතා | 3/4 |

## කමිටුවේ විෂයපථය

2014 පෙබරවාරි මස 25 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද කොන්දේසි අනුව කමිටුව පිහිටුවා ඇති අතර, සම්බන්ධිත පාර්ශ්වයන් සමග සිදුකිරීමට යෝජිත ගනුදෙනු සම්බන්ධයෙන් කල් ඇතිව සමාලෝචනය කිරීම මෙමගින් සිදු කරනු ලබන අතර, ඊට අදාළ නොවනුයේ සම්බන්ධිත පාර්ශ්වයන් සමග සිදුකරනු ලබන ගනුදෙනු වලදී අදාළ කරගතයුතු වඩාත් යෝග්‍ය සංග්‍රහයයේ (Code of best practices on related party trusactions – December 2013 ) 27 වෙනි රීතියේ දැක්වෙන ගනුදෙනුවලට අදාළව පමණි.

ඒ අනුව ඉහතින් දැක්වූ ගනුදෙනු සම්බන්ධයෙන් හැර සෙසු සියලුම ගනුදෙනු එකී ගනුදෙනුවලට ඇතුළත්වීමට පෙර හෝ එකී ගනුදෙනු අවසන් කිරීමට පෙර සමාලෝචනයට භාජනය කළ යුතුය.

කමිටුව තමන් වෙත පැවරී ඇති රාජකාරී ඉටු කිරීමේදී පැවරුම් රීති, සමාගමේ සම්බන්ධිත පාර්ශ්වයන් සමග සිදුකරගනු ලබන ගනුදෙනුවලදී අදාළ කරගනු ලබන ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටින් අනුගමනය කරන්නේද යන්න සහ එකී සම්බන්ධිත පාර්ශ්වයන් සමග ගනුදෙනු කිරීමේදී සංග්‍රහයේ 13 වෙනි රීතියේ ප්‍රකාරව සමාගමේ කොටස්හිමියන්ගේ අනුමැතිය අවශ්‍ය වේද යන්න සහ එසේ අවශ්‍යවේ නම් එයට අවශ්‍යවන අනුමැතිය ලබාගැනීම සඳහා කමිටුව විසින් යොමු කරනු ලැබිය යුතුය.

සම්බන්ධිත පාර්ශ්වයන් සමග කෙරිගෙන යන ගනුදෙනු සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට නිර්නායකයන් ලබා දීම සිදුකළ යුතුය. ඉන්පසු ඒ අනුව කටයුතු කර ඇත් දැයි සමාලෝචනය කර තක්සේරු කිරීමක් සිදුකළ යුතුය.

සම්බන්ධිත පාර්ශ්වයේ ගනුදෙනුවලට අදාළව සමාලෝචනය සඳහා කමිටුව විසින් අදාළ සමාබන්ධිත සමාගමේ අධ්‍යක්ෂවරයකුට පැමිණෙන ලෙස ඉල්ලා සිටියහොත් මිස එකී සම්බන්ධිත සමාගමේ අධ්‍යක්ෂවරයකු කිසිදු සාකච්ඡාවකට සහභාගීකර නොගත යුතුය.

සම්බන්ධිත පාර්ශ්ව සමග ගනුදෙනු කිරීමේදී විභව්‍ය ආරවුලක් ඇතිවේ නම් එය සමාලෝචනය කර අනුමත කිරීම සඳහා කමිටුව විසින් විශේෂ කමිටුවක් පත්කරනු ලැබිය හැකිය. තවද වෙළඳපොළ මිළ මට්ටමේ ඇති වන වෙනස්කම් අනාවරණය කිරීම විස්තරාත්මකව හා නිසි වේලාවට අනාවරණය කිරීම වාර්ෂික වාර්තාවෙන් සිදුකළ යුතුය.

## ක්‍රියාකාරකම්වල සාරාංශය

සම්බන්ධිත පාර්ශ්වයන් හඳුනා ගැනීමටත්, ඔවුන් සමග සිදු කෙරෙන ගනුදෙනු හඳුනා ගැනීමටත්, රාමුවක් සකස් කිරීමටත් එම ගනුදෙනු සමාලෝචනය කිරීම සඳහා කාර්ය පටිපාටීන් සකස් කිරීමත්, සිදුකළ යුතු බවට කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දන්වා යවනු ලැබ ඇත. සම්බන්ධිත පාර්ශ්වයන් සමග සිදු කෙරෙන ගණුදෙනුවලට අදාළව කාළසීමාවෙන් කාලසීමාවට සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළයුතු අතර, උනන්දුවක් දක්වන පාර්ශ්වයන් හට සමාගමේ මූල්‍ය ප්‍රකාශන හරහා එකී ගනුදෙනු අනාවරණය කළ යුතුය.

යොමුවට අනුව අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තමන් විසින්ම ලබාදෙනු ලබන ප්‍රකාශණයන් හඳුනා ගැනීමේ අරමුණින් ලබා ගනී. සම්බන්ධිත පාර්ශ්වයන් පිළිබඳ එසේ ලබා ගන්නා තොරතුරු In Bank System යටතේ ඇතුළත් කෙරේ. සමාගමේ අන්තර්ජාලය තුළ එසේ දත්ත ඇතුළත් කර තිබීමෙන් අවශ්‍ය විට ඒවා නිවැරදි කර ගැනීමට හැකියාව ලැබේ

## 2018/19 වර්ෂයේ සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු

සමාලෝචනයට යටත් කාලය තුළදී පුනරාවර්තනය හෝ පුනරාවර්තනීය නොවන වියදම් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු කොළඹ කොටස් වෙළඳපොළ ලැයිස්තුගත රීතින් හි දක්වා ඇති ප්‍රමාණයන් ඉක්මවා ඇත.

2018/19 වර්ෂයට අදාළ සමාගම හා අනෙකුත් සම්බන්ධිත පාර්ශ්වයන් අතර ගනුදෙනු පිළිබඳ විස්තර මූල්‍ය වාර්තාවල 342 සිට 344 දක්වා පිටුවල 58 වෙනි සටහනෙහි අන්තර්ගත කර ඇත.

සමාගම විසින් 2018/19 කාලය තුළ ලැයිස්තුගත රීතින් හි විෂයපථයට ගැනෙන සම්බන්ධිත නොවන පාර්ශ්වයන් සමඟ සිදු කරන ලද ගනුදෙනු පිළිබඳ වාර්ෂික වාර්තාවේ 343 සහ 344 පිටුවල ඇතුළත් කර ඇත.



**එම්.පී. අමීර්තනායගම් මහතා**
සභාපති
සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන මණ්ඩල කමිටුව

2019 ජූනි 13 වන දින

# ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටු වාර්තාව

පීපල්ස් ලීසිං සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය මූලික වශයෙන් ඒකාබද්ධ අවදානම් කළමණාකරනය කෙරෙහි වගකීමෙන් බැඳෙන අතර, එකී වගකීම් එහි අනු කමිටුවලටද බෙදා හැරීම සිදු කරයි. 2008 අංක 3 දරණ මූල්‍ය සමාගම් පනතේ (ආයතනික පාලනය) 8 (3) වන වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුව සමාගමේ අවදානම් පැතිකඩ හි ප්‍රමාණවත් බව සහ ඵලදායීතාව සමාලෝචනය කිරීමට සහ තක්සේරු කිරීමට බලය පවරා ඇත.

## යොමුව (TOR)

ඉහත සඳහන් නියෝග ප්‍රකාරව කාරක සභාව, සංයුතිය, වගකීම්, රැස්වීම් වාර ගණන සහ ගණ පූරණය වාර්තා කිරීම සහ කාරක සභාවේ අනෙකුත් ක්‍රියා පටිපාටිවලට අදාළ බලතල/එහි බෙදීයාම් පැහැදිලිව දක්වා ඇත.

2019 ජනවාරියේදී කමිටුව එහි නීති රෙගුලාසි යොමුව සමාලෝචනය කළ අතර පසුව එය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## සංයුතිය

2018/19 මූල්‍ය වර්ෂය සඳහා ඒකාබද්ධ අවදානම් කළමණාකරන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන අතර ඔවුන්ගේ සවිස්තරාත්මක තොරතුරු 27 සහ 28 වන පිටුවල දක්වා ඇත.

**ආරාධනයෙන් නිතිපතා සහභාගී වන්නේ,**

- අනුකූලතා නිලධාරී
- පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් සමාගමේ උප සමාගම් වල ප්‍රධාන කළමණාකරන නිලධාරීන්
  - ප්‍රධාන විධායක නිලධාරී - පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී.
  - තාක්ෂණික උපදේශක - පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී.
  - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරී - අලෙවි - පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී./ පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් ප්‍රධානී
  - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමන්‍යාධිකාරී - අයකර ගැනීම් සහ පරිපාලනය - පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී./පීපල්ස් ෆ්ලීට් මැනේජ්මන්ට්

අකිලා සමරසිංහ මෙනවිය - නියෝජ්‍ය කළමණාකරු - අවදානම් සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණය – කමිටුවේ ක්‍රියාකාරී ලේකම් ලෙස කටයුතු කරයි.

## රැස්වීම්

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කාර්තුමය රැස්වීම් හතරක් (4) පැවතුණු අතර කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පහත පරිදි වේ.

| නම | සහභාගී විය/සහභාගී වීමට සුදුසුකම් ලැබූ |
|---|---|
| එම්. පී. අමීර්තනායගම් මහතා | 4/4 |
| රසිත ගුණවර්ධන මහතා | 4/4 |
| එම් ඒ එම් රිස්වාන් මහතා | 4/4 |
| ඒ. එස්. ඊබ්‍රහීම් මහතා | 4/4 |
| සංජීව බණ්ඩාරනායක මහතා | 4/4 |
| ලයනල් ප්‍රනාන්දු මහතා | 3/4 |
| රොහාන් තෙන්නකෝන් මහතා | 4/4 |

| මණ්ඩලයේ අනු කමිටු සාමාජික | අධ්‍යක්ෂක තොරතුරු | සාමාජිකත්ව තොරතුරු |
|---|---|---|
| මයිකල් ප්‍රදීප් අමීතනායගම් මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය සභාපති/ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ | සභාපති |
| රසිත ගුණවර්ධන මහතා | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ | සාමාජික |
| එම්. ඒ. එම්. රිස්වාන් මහතා | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ | සාමාජික |
| ඒ. එස්. ඊබ්‍රාහීම් මහතා (ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී) | අධ්‍යක්ෂ නොවන | සාමාජික |
| සංජීව බණ්ඩාරනායක මහතා (ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී) | අධ්‍යක්ෂ නොවන | සාමාජික |
| ලයනල් ප්‍රනාන්දු මහතා (ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී) | අධ්‍යක්ෂ නොවන | සාමාජික |
| රොහාන් තෙන්නකෝන් මහතා | අධ්‍යක්ෂ නොවන | සාමාජික |

# ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටු වාර්තාව

## අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම

සැළකිල්ලෙන් පරීක්ෂාවට ලක්කරන ලද හා නිගමනයන් ද ඇතුළත් කමිටු සටහන් එළඹෙන සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව වෙත පිළිගෙන ස්ථිර කිරීම සඳහා ඉදිරිපත් කරන ලදී. රැස්වීමට අදාළ සියලුම සටහන් කමිටු සභාපති විසින් විධිමත් ලෙස අනුමත කරනු ලැබේ. අනුමත කරන ලද සටහන්ද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඔවුන්ගේ අදහස් එකඟත්වය සහ/හෝ විශේෂ උපදෙස් ලබාගැනීම සඳහා යොමුකළ යුතුය.

## ක්‍රියාකාරකම්

සමාගම සිය ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව විසින් සිය කාර්යක්ෂම සහයෝගිතාවය ලබාදිය යුතුය. එසේ සිදු වන ප්‍රමාද හා අවදානම් මොනවාද යන්න මාසිකව සමාලෝචනයට භාජනයකර ඒවා ඒ ඒ කාර්තුවලදී පවත්වනු ලබන රැස්වීම්වලදී සාකච්ඡාවට ගතයුතුය. සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව විසින් පහත සඳහන් කාර්යය ඉටුකරනු ලැබේ.

ප්‍රධාන අංශයන්ට කාලය කැපකිරීම




## අවදානම් පාලන ස්ථරය ශක්තිමත් කිරීම

සමාලෝචනයට භාජනය කරන ලද කාලය තුළ සංකලිත අවදානම් කළමනාකරණ මෙහෙයුම් කමිටුව (IRMOC) වෙනුවට සමාගමේ කළමනාකරණ මට්ටමේ කමිටුවක් ලෙසට අවදානම් පාලන සැකැස්ම ශක්තිමත් කරමින්, අධ්‍යක්ෂ මණ්ඩලයට, අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවලට සහ සහයෝගිතා කළමනාකාරිත්වයට සමාගමේ ව්‍යාපාරික කටයුතු ආශ්‍රිතව පැනනගින අවදානම් කළමනාකරණය කිරීම යන පරමාර්ථය අරමුණු කරගෙන යළි ස්ථාපිත කර ඇත. සංකලිත අවදානම් කළමනාකරණ මෙහෙයුම් කමිටුව සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවට වගකීමට බැඳී සිටී.

- ප්‍රතිෂ්ඨාපනය කරනලද සංකලිත අවදානම් කළමනාකරණ මෙහෙයුම් කමිටුව විසින් කමිටුව වත ඉදිරිපත් කරනලද සංකලිත අවදානම් කළමනාකරණ මෙහෙයුම් කමිටුවේ TOR, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.
- සංකලිත අවදානම් කළමනාකරණ මෙහෙයුම් කමිටුවේ කාර්තු රැස්වීම්වලදී අවධානයට ලක් වූ කරුණු සමාලෝචනයට භාජනය කරන ලදී.

## අවදානම් රුචිය හා අවදානම් ඔරොත්තුදීමේ සීමාවන්

2019 ඔක්තෝබර් මාසය සඳහා සකසන ලද,

- "අවදානම් ඔරොත්තුදීමේ වාර්තාව" වාර්ෂික සමාලෝචන ක්‍රියාවලියේ කොටසක් ලෙස කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.
- අවදානම් ඔරොත්තුදීමේ වාර්තාව සමාලෝචනය කිරීමේදී සමාගමේ උපාය මාර්ගික අරමුණ, සර්ව ආර්ථික පරිසරය තුළ වෙනස්වීම්, නියාමන, අවශ්‍යතා ආදිය සැළකිල්ලට භාජනය කරන ලදී.
- කාර්තු පදනමින් පීපල්ස් ලීසිං සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම්වලට ඔරොත්තුදීමේ ගොනුව, අවදානම්වලට ඔරොත්තුදීමේ මට්ටම් සමග සමාලෝචනය කරන ලදී.

## කළමනාකරණ මට්ටමේ කමිටුවෙහි තක්සේරුව

- ALCO ආයතනය විසින් ඉටුකරන ලද කාර්යයන්හි කාර්යක්ෂමතාවය හා ප්‍රමාණවත් බව TOR හි වාර්ෂික තක්සේරුව සමග සමාලෝචනයට භාජනය කරන ලදී.

## මුදල් තත්ත්වය පිළිබඳව ඇති අවදානම

පහත සඳහන් කරුණු සමාලෝචනය කරන ලදී.

- වත්කම් සහ නිමැවුම් පදනම්කර ණය විශ්ලේෂණය නොකිරීම
- අංශ අනුව ණය එක්රැස් කිරීම
- ඒකපුද්ගල ණයදීමේ සීමාවන්
- හඳුනාගත් වත්කම් අංශයන්හි ප්‍රගතිය වත්කම්වල ගුණාත්මක භාවයෙහි වර්ධනයෙහි NP අනුපාතිකය සමග සමාලෝචනය කරන ලදී
- ණය අවදානම සම්බන්ධයෙන් ප්‍රමාණවත් නොවන ආවරණයකින් හා පීඩන පරීක්ෂණ ප්‍රතිඵල ද සමාලෝචනයට භාජනය කරන ලදී.
- ණය අවදානම සම්බන්ධයෙන් සංකලිත අවදානම් කළමනාකරණ කමිටු විසින් දක්වා ඇති නිර්නායකයන් පිළිබඳ අවධානය යොමු කරමින් සමාලෝචනය කරන ලදී.

| වසර සඳහා ලාභය | – | – | – | – | – | – | | – | 4,416,121 | 4,416,121 |
| වෙනත් විස්තිරණ ආදායම (ශුද්ධ බදු) | – | – | – | – | (7,302) | – | (99,611) | – | (4,937) | (111,850) |
| වසර සඳහා මුළු වෙනත් විස්තිරණ ආදායම | – | – | – | – | (7,302) | – | (99,611) | – | 4,411,184 | 4,304,271 |
| **ස්කන්ධතුල සෘජුවම හඳුනාගත් ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු** | | | | | | | | | | |
| වසර තුල සංචිත වෙත මාරු කිරීම | – | 220,806 | (300,000) | (100,000) | – | – | – | – | 179,194 | – |
| ලාභාංශ ගෙවීම් – අතුරු | – | – | – | – | – | – | – | – | (1,184,896) | (1,184,896) |
| – අවසාන | – | – | – | – | – | – | – | – | (789,931) | (789,931) |
| **ස්කන්ධහිමියන් සමග මුළු ගනුදෙනු** | **–** | **220,806** | **(300,000)** | **(100,000)** | **–** | **–** | **–** | **–** | **(1,795,633)** | **(1,974,827)** |
| **2019.03.31 දිනට ශේෂය** | **13,236,073** | **2,058,219** | **–** | **–** | **–** | **–** | **(52,742)** | **–** | **13,361,805** | **28,603,355** |

පිටු අංක 227 සිට 369 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත් කොටසක් ලෙස සැලකේ.

# ස්කන්ධ වෙනස්වීම්

| සමූහය | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. '000 | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000 | වෙනත් සංචිත<br>පොදු සංචිත රු. '000 | බදු සමතුලිත සංචිත රු. '000 | විකිණීම සඳහා පවතින සංචිත රු. '000 | සාධාරණ අගය සංචිත රු. '000 | මුදල් ප්‍රවාහ හෙජ් සංචිත රු. '000 | විදේශීය වත්කම් පරිවර්තන සංචිත රු. '000 | රඳවාගත් ඉපැයුම් රු. '000 | මුළු ප්‍රමාණය රු. '000 | පාලනයට යටත් නොවන හිමිකම රු. '000 | මුළු හිමිකම් රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **2017.04.01 දිනට ශේෂය** | 13,236,073 | 1,621,946 | 300,000 | 100,000 | 20,078 | – | 879 | – | 10,560,834 | 25,839,810 | 1,084,969 | 26,924,779 |
| **හිමිකාරීත්වය වෙනස්වීමේ ශේෂය** | – | – | – | – | – | – | – | | – | – | 989,833 | 989,833 |
| **වසර සඳහා මුළු වෙනත් විස්තිරන ආදායම්** | | | | | | | | | | | | |
| වසර සඳහා ලාභය | – | – | – | – | – | – | – | – | 4,816,920 | 4,816,920 | 200,793 | 5,017,713 |
| වෙනත් විස්තිරන ආදායම් (ශුද්ධ බදු) | – | – | – | – | 25,507 | – | (879) | 2,828 | (20,288) | 7,168 | 1,975 | 9,143 |
| වසර සඳහා මුළු වෙනත් විස්තිරන ආදායම | – | – | – | – | 25,507 | – | (879) | 2,828 | 4,796,632 | 4,824,088 | 1,192,601 | 6,016,689 |
| **ස්කන්ධතුල සෘජුවම හඳුනාගත් ස්කන්ධහිමියන් සමග ගනුදෙනු** | | | | | | | | | | | | |
| වසර තුල සංචිත වෙත මාරු කිරීම | – | 215,467 | – | – | – | – | – | – | (215,467) | – | – | – |
| ලාභාංශ ගෙවීම් | | | | | | | | | | | | |
| - අතුරු | – | – | – | – | – | – | – | – | (1,184,896) | (1,184,896) | (112,500) | (1,297,396) |
| - අවසාන | – | – | – | – | – | – | – | – | (789,931) | (789,931) | – | (789,931) |
| **ස්කන්ධහිමියන් සමග මුළු ගනුදෙනු** | – | 215,467 | – | – | – | – | – | – | (2,190,294) | (1,974,827) | (112,500) | (2,087,327) |
| **2018.03.31 දිනට ශේෂය** | 13,236,073 | 1,837,413 | 300,000 | 100,000 | 45,585 | – | – | 2,828 | 13,167,172 | 28,689,071 | 2,165,070 | 30,854,141 |
| **2018.04.01 දිනට ශේෂය** | **13,236,073** | **1,837,413** | **300,000** | **100,000** | **45,585** | **–** | **–** | **2,828** | **13,167,172** | **28,689,071** | **2,165,070** | **30,854,141** |
| SLFRS 9 අනුගත කොට ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබ අපේක්ෂිත ණය අලාභය | – | – | – | – | – | – | – | – | (1,066,686) | (1,066,686) | – | (1,066,686) |
| අනුගත කොට ගැලපුම් සඳහා විලම්බිත බද්ද | – | – | – | – | – | – | – | – | 266,494 | 266,494 | – | 266,494 |
| විකුනුම් සඳහා පවතින සංචිතය සාධාරණ අගය සංචිතයකට මාරු කිරීම | – | – | – | – | (45,585) | 45,585 | – | – | – | – | – | – |
| **2018.04.01 දිනට ශේෂය - යළි ප්‍රකාශිත** | **13,236,073** | **1,837,413** | **300,000** | **100,000** | **–** | **45,585** | **–** | **2,828** | **12,366,980** | **27,888,879** | **2,165,070** | **30,053,949** |
| ප්‍රාග්ධන ලාභ මත බදු | – | – | – | – | – | – | – | – | (167,949) | (167,949) | – | (167,949) |
| ප්‍රාග්ධන ලාභ මත බදු - පසු ශේෂය | 13,236,073 | 1,837,413 | 300,000 | 100,000 | – | 45,585 | – | 2,828 | 12,199,031 | 27,720,930 | 2,165,070 | 29,886,000 |
| වර්ෂය සඳහා මුළු විස්තරණ ආදායම | | | | | | | | | | | | |
| වර්ෂය සඳහා ලාභය/අලාභය | – | – | – | – | – | – | – | – | 4,813,578 | 4,813,578 | 197,690 | 5,011,268 |
| වෙනත් විස්තිරණ ආදායම් (ශුද්ධ බදු) | – | – | – | – | – | (100,290) | – | 259,151 | (6,104) | 152,757 | (740) | 152,017 |
| වර්ෂය සඳහා මුළු විස්තිරණ ආදායම | – | – | – | – | – | (100,290) | – | 259,151 | 4,807,474 | 4,966,335 | 196,950 | 5,163,285 |
| **ස්කන්ධතුල සෘජුවම හඳුනාගත් ස්කන්ධහිමියන් සමග ගනුදෙනු** | | | | | | | | | | | | |
| වසරතුල සංචිත වෙත මාරු කිරීම | – | 233,254 | (300,000) | (100,000) | – | – | – | – | 166,746 | – | – | – |
| ලාභාංශ ගෙවීම් | | | | | | | | | | | | |
| - අතුරු | – | – | – | – | – | – | – | – | (1,184,896) | (1,184,896) | (92,500) | (1,277,396) |
| - අවසාන | – | – | – | – | – | – | – | – | (789,931) | (789,931) | – | (789,931) |
| **ස්කන්ධහිමියන් සමග මුළු ගනුදෙනු** | **–** | **233,254** | **(300,000)** | **(100,000)** | **–** | **–** | **–** | **–** | **(1,808,081)** | **(1,974,827)** | **(92,500)** | **(2,067,327)** |
| **2019.03.31 දිනට ශේෂය** | **13,236,073** | **2,070,667** | **–** | **–** | **–** | **(54,705)** | **–** | **261,979** | **15,198,424** | **30,712,438** | **2,269,520** | **32,981,958** |

පිටු අංක 227 සිට 369 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත් කොටසක් ලෙස සැලකේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

## ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය LKAS 7 ට අනුකූලව මුදල් ප්‍රවාහ සකස්කිරිමේ වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇති අතර, එමගින් මෙහෙයුම් කටයුතු ආයෝජන ක්‍රියාකාරකම් සහ මූල්‍ය කටයුතු වෙන වෙනම හඳුනා ගැනේ. මුදල් හා මුදල් සමානකම් යනු කෙටිකාලීන ඉහළ ද්‍රවශීලතා ආයෝජන වලින් සමන්විත වන අතර ඒවා දන්නා මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන් පරිවර්තනය කල හැකි අතර වටිනාකම වෙනස්වීමේ සුළු අවදානමකට යටත් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් පරිදි මුදල් හා මුදල් සමානකම් සටහන 49 සිට 51 දක්වා විස්තර කර ඇති පරිදි එම අයිතම වලින් සමන්විත වේ.

| මාර්තු 31 වන දිනට | සටහන් | පිටු අංක | සමාගම 2019 රු. '000 | සමාගම 2018 රු. '000 | සමූහය 2019 රු. '000 | සමූහය 2018 රු. '000 |
|---|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | | | | |
| ආදායම් බද්දට පෙර ලාභය | | | **6,585,257** | 5,769,672 | **7,587,305** | 6,662,332 |
| ගැලපීම්: | | | | | | |
| ආදායම් බද්දට පෙර ලාභවල ඇතුළත් මුදල් නොවන අයිතමයන් | 49 | 331 | **2,358,912** | 1,702,807 | **2,411,109** | 1,535,280 |
| මෙහෙයුම් වත්කම්වල වෙනස | 50 | 331 | **(16,346,695)** | (11,688,531) | **(19,792,535)** | (13,308,245) |
| මෙහෙයුම් වගකීම්වල වෙනස | 51 | 332 | **17,586,705** | 25,946,052 | **19,674,400** | 26,197,830 |
| ආශ්‍රිත සමාගමේ අලාභයේ කොටස (ශුද්ධ බදු) | | | **–** | – | **33,234** | 52,942 |
| ආයෝජනවලින් ලැබුණු ලාභාංශ ආදායම | 10 | 247 | **(388,945)** | (444,503) | **(16,569)** | (26,610) |
| බැංකු සඳහා ගෙවිය යුතු පොලී වියදම | 6.2 | 244 | **4,569,420** | 5,047,798 | **4,857,611** | 5,236,146 |
| නිකුත්කල ණය සුරැකුම්පත් සඳහා පොලී වියදම | 6.2 | 244 | **2,394,127** | 2,492,085 | **2,378,916** | 2,475,434 |
| විදේශිය පාලිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පරිවර්තනය කිරීමෙන් පැන නගින ශුද්ධ සත්‍ය නොවන වාසි අවාසි | | | **–** | – | **259,151** | 2,828 |
| පාරිතෝෂිත වෙනුවෙන් දායක මුදල් ගෙවීම | 43.1 | 325 | **(9,107)** | (19,555) | **(9,242)** | (21,612) |
| ආදායම් බදු ගෙවීම | 17.8 | 257 | **(805,705)** | (1,113,050) | **(907,945)** | (1,174,927) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය කරන ලද ශුද්ධ මුදල්** | | | **15,943,969** | 27,692,775 | **16,475,435** | 27,631,398 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | | | | |
| දේපල පිරියත සහ උපකරණ මිලදී ගැනීම | 32 | 303 | **(147,667)** | (170,350) | **(257,371)** | (412,263) |
| දේපල පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල් | | | **69,903** | 99,468 | **102,629** | 121,980 |
| අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම | 33 | 308 | **(8,624)** | (36,747) | **(12,195)** | (36,745) |
| පාලිත ව්‍යාපාරවල ආයෝජනය | | | **–** | (1,138,788) | **–** | – |
| ආයෝජන ව්‍යාපර විකිණීමෙන් ලැබුණ ආදායම | | | **141,380** | – | **141,380** | – |
| පාලිත සමාගම් අත්පත් කර ගැනීමේදී ලද ශුද්ධ මුදල් සහ මුදල්වලට සමාන දෑ | | | **–** | – | **–** | (1,107,456) |
| ආයෝනවලින් ලැබුණු ලාභාංශ | | | **246,920** | 444,503 | **16,569** | 26,610 |
| **ආයෝජන ක්‍රියාකාරකම්තුලින්/(භාවිතා කල) ශුද්ධ මුදල්** | | | **301,912** | (801,914) | **(8,988)** | (1,407,874) |
| **මූල්‍යකරණ වෙතින් මුදල් ප්‍රවාහ** | | | | | | |
| බැංකු සඳහා ගෙවිය යුතු වගකීම් වලින් ලද මුදල් | 36.1 | 312 | **59,966,000** | 56,180,000 | **59,966,000** | 56,550,481 |
| බැංකු සඳහා ගෙවිය යුතු වත්කම් ගෙවීම් | 36.1 | 312 | **(77,536,350)** | (74,128,659) | **(77,456,806)** | (74,354,816) |
| නිකුත් කල ණය සුරැකුම්පත් මගින් ලද මුදල් | 38.1 | 315 | **6,000,000** | – | **5,874,220** | – |
| නිකුත් කල ණය සුරැකුම්පත් වලට ගෙවීම | 38.1 | 315 | **(1,164,060)** | (6,067,727) | **(1,164,060)** | (5,967,727) |
| නිකුත් කල ණය සුරැකුම්පත් සඳහා පොලී ගෙවීම | 38.1 | 315 | **(1,738,538)** | (2,724,827) | **(1,738,538)** | (2,704,161) |
| කොටස්හිමියන් වෙත ගෙවන ලද ලාභාංශ | | | **(1,979,340)** | (1,977,071) | **(1,979,340)** | (1,977,071) |
| පාලනයට හවුල් නොවන හිමිකම් වෙත ලාභාංශ ගෙවීම් | | | **–** | – | **(92,500)** | (112,500) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් (තුල භාවිතා කල) වෙතින් ලද ශුද්ධ මුදල්** | | | **(16,452,288)** | (28,718,284) | **(16,591,024)** | (28,565,794) |
| **මුදල් හා මුදල්වලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | | **(206,407)** | (1,827,423) | **(124,577)** | (2,342,270) |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල්වලට සමාන දෑ | | | **3,147,388** | 4,974,811 | **3,161,045** | 5,503,315 |
| **වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල්වලට සමාන දෑ** | | | **2,940,981** | 3,147,388 | **3,036,468** | 3,161,045 |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | 22 | 268 | **3,294,055** | 4,412,683 | **4,310,595** | 4,765,518 |
| බැංකු අයිරාව | 36 | 311 | **(353,074)** | (1,265,295) | **(1,274,127)** | (1,604,473) |
| **වර්ෂය අවසානයේදී මුදල් හා මුදල්වලට සමාන දෑ** | | | **2,940,981** | 3,147,388 | **3,036,468** | 3,161,045 |

පිටු අංක 227 සිට 369 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත් කොටසක් ලෙස සැලකේ.

මූල්‍ය වාර්තා

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1 ආයතනික හා සමූහයේ තොරතුරු

### 1.1 ආයතනික තොරතුරු

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. ("සමාගම") යනු 1995 අගෝස්තු 2 වන දින සංස්ථාගත කරන ලද සහ ශ්‍රී ලංකාවේ පිහිටුවන පොදු සීමිත වගකීම් සමාගමකි. එය 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමකි. 2011 නොවැම්බර් 24 වන දින කොළඹ කොටස් වෙළෙඳපොලේ මුලික ලැයිස්තුගත කර ඇති සමාගමකි. 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සමාගම නැවත ලියාපදිංචි කරන ලදී.

එහි ලියාපදිංචි කාර්යාලය සහ ව්‍යාපාරයේ ප්‍රධාන ස්ථාන අංකය 1161, මරදාන පාර, කොළඹ 08. ආයතනික තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ පිටුපස කවරයේ ඉදිරිපත් කෙරේ.

### ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් සමන්විත වන්නේ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පි.එල්.සී. ("මව් සමාගම"), එහි පාරිපාලිත සමාගම් (එකට "සමූහය" ලෙස හැඳින්වේ) සහ සමූහය එහි ආශ්‍රිත සමාගම කෙරෙහි දක්වන උනන්දුවයි.

### මව් ආයතනය සහ අවසාන මව් ආයතනය

සමාගමේ මව් ආයතනය වන්නේ මහජන බැංකුව වන අතර එය රජය සතු ආයතනයකි.

### සේවකයන් ගණන

2019 මාර්තු 31 වන විට සමාගමේ සහ සමූහයේ කාර්ය මණ්ඩල ශක්තිය පිළිවෙලින් 2,329 සහ 3,232 කි. (2018 මාර්තු මස 31 වන විට 2,085 සහ 2,806).

### 1.2 සමූහයේ තොරතුරු

#### ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

**සමාගම**

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.

ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් වනුයේ මූල්‍ය කල්බදු, කුලී – මිලදී ගැනීමේ වත්කම් මූල්‍යකරණය, කාලීන ණය, ඉස්ලාමීය මූල්‍ය, ආන්තික වෙළෙඳාම, කොටස් වෙළෙඳාම, ණය උපකරණ නිකුත් කිරීම, සාධනීකරණය, රන් ණය සහ රාජ්‍ය තැන්පතු බලමුලු ගැන්වීම ය.

### පාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම්

| සමාගමේ නම | ප්‍රධාන කටයුතු | සංස්ථාගත කළ රට | ප්‍රතිශත කොටස් හිමිකම (%) 2019 | 2018 |
|---|---|---|---|---|
| **පාලිත සමාගම්** | | | | |
| පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | ප්‍රවාහන කළමනාකරණය, වාහන තක්සේරු කිරීම, වාහන විකිණීම, රක්ෂණ තක්සේරු කිරීම සහ වාහන අලුත්වැඩියා කිරීම | ශ්‍රී ලංකාව | **100** | 100 |
| පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති හා දේපල සංවර්ධන කටයුතු සිදු කිරීම | ශ්‍රී ලංකාව | **100** | 100 |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පී. එල්. සී. | සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක් කරගෙන යාම | ශ්‍රී ලංකාව | **75** | 75 |
| පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපටිස් ලිමිටඩ් | කාර්යාල සංකීර්ණයක් ඉදිකර ක්‍රියාත්මක කිරීම | ශ්‍රී ලංකාව | **100** | 100 |
| පීපල්ස් මයික්‍රො කොමර්ස් ලිමිටඩ් | අඩු ආදායම්ලාභීන් සහ ක්ෂුද්‍ර ව්‍යවසායකයන් සඳහා බැංකු නොවන මූල්‍ය සේවා සැපයීම | ශ්‍රී ලංකාව | **100** | 100 |
| ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් | චංචල හා නිශ්චල දේපල බදු දීම සහ ණය ලබාදීම | බංග්ලාදේශය | **51** | 51 |
| **ආශ්‍රිත සමාගම** | | | | |
| පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී. එල්. සී. | තැන්පතු බලමුලු ගැන්වීම, මූල්‍ය කල්බදු, කාලීන ණය, දේපල වෙළෙඳාම් සංවර්ධනය, උකස් කිරීම හා සේවා සැපයීම | ශ්‍රී ලංකාව | **37.06** | 37.06 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



සමාලෝචනයට භාජනය වූ මූල්‍ය වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයෙහි සැලකිය යුතු වෙනස්කම් නොමැත.

## 2 සකස් කිරීමේ පදනම සහ වෙනත් සැලකිය යුතු ගිණුම් ප්‍රතිපත්ති

### 2.1 අනුකූලතා ප්‍රකාශය

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ සමාග මේ වෙනම මූල්‍ය ප්‍රකාශන, 2017 මාර්තු 31 වන විට සහ ඉන් අවසන් වූ වර්ෂය සඳහා ආයතනය විසින්ම නියම කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්ති (SLFRSs සහ LKASs) අනුව සකස් කර ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකාව වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) සහ 2007 අංක 7 දරණ සමාගම් පනත, 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත, 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත පනත සහ ලැයිස්තුගත කිරීමේ රීති, කොළඹ කොටස් වෙළෙඳපොල. මුදල් ප්‍රවාහ පිළිබඳ තොරතුරු හැරුණු විට මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ ගිණුම්කරණයේ උපචිත පදනම අනුවය.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත www.casrilanka.com වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

SLFRSs සහ LKASs හි අවශ්‍යතාවයන්ට අනුකූල නොවන, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පාලනය කරන රෙගුලාසිවලට අනුකූල නොවන කිසිඳු නුසුදුසු ගිණුම්කරණ ප්‍රතිකාර ක්‍රමයක් සමූහය විසින් අනුගමනය කර නොමැත.

වර්ෂය තුළ අනුගමනය කරන ලද සමූහයේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ විස්තර සටහන් 3 හි දක්වා ඇත.

### 2.2 මූල්‍ය ප්‍රකාශන හා වගකීම

2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන SLFRSs සහ LKASs යන විධිවිධාන වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

"සමාගමේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව", "අධ්‍යක්ෂකවරුන්ගේ මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම" සහ 213 පිටුවල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහතික කිරීම යන කරුණු අනුව අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ වගකීම පිළිගනී.

මෙම මූල්‍ය ප්‍රකාශනවල පහත සඳහන් අංග ඇතුළත් වේ:

- සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ (මූල්‍ය කාර්ය සාධනය) පිළිබඳ තොරතුරු සපයන ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශ සහ විස්තීරණ ආදායම් ප්‍රකාශ (පිටු 221 සහ 222 බලන්න).
- වර්ෂය අවසාන වන විට සමාගමේ සහ සමූහයේ මූල්‍ය පිළිබඳ තොරතුරු සපයන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් (පිටු 223 බලන්න);
- සමාගමේ සහ සමූහයේ සමාලෝචනයට භාජනය වර්ෂය තුල කොටස්හිමියන්ගේ හිමිකම් වෙනස්කම් නිරූපණය කරන හිමිකම් වෙනස්වීම් ප්‍රකාශයක් (පිටු 227 සහ 369 බලන්න);
- මුදල් සහ මුදල් වලට සමාන දෑ උත්පාදනය කිරීමට සමාගමට සහ සමූහයට ඇති හැකියාව සහ එම මුදල් ප්‍රවාහයන් උපයෝගි කර ගැනීම සඳහා ආයතනයේ අවශ්‍යතා පිළිබඳව පරිශීලකයින්ට තොරතුරු සපයන මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් (පිටු 226 බලන්න); සහ
- ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (පිටු 227 සිට 369 බලන්න).

### 2.3 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2019 ජුනි 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන (සන්සන්දනාත්මක ඇතුලුව) 2019 ජුනි 13 දින අධ්‍යක්ෂක මණ්ඩලයේ යෝජනාවට අනුව 2019 ජුනි 13 දින නිකුත් කිරීමට අනුමත කර බලය ලබා දී ඇත.

### 2.4 මිනුම් කිරීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පහත සඳහන් අයිතම හැර සමාගමේ ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

| අයිතමය | මිනුම් කිරීමේ පදනම | සටහන | පිටු අංකය |
|---|---|---|---|
| මූල්‍ය වත්කම් – ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගය අනුව/වෙළෙඳාම සඳහා පවතින | සාධාරණ වටිනාකම | 24 | 269 |
| මූල්‍ය වත්කම් – වෙනත් පුලුල් ආදායමක් හරහා සාධාරණ අගය අනුව/විකිණීම සඳහා පවතින | සාධාරණ වටිනාකම | 27 | 294 |
| ආයෝජන දේපල | සාධාරණ වටිනාකම | 31 | 301 |
| විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වගකීම | විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන වටිනාකම සහ ක්‍රියාකාරි ලාභ සහ අලාභ ලෙස වගකීම හඳුනාගෙන ඇත. | 43.1 | 325 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 2.5 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ව ප්‍රකාශයේ සමාගමේ සහ සමූහයේ වත්කම් හා වගකීම් ස්වභාවයෙන්ම කාණ්ඩ කර ඇති අතර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවය සහ පරිණත රටාව පිළිබිඹු වන අනුපිළිවෙළකට ලැයිස්තුගත කර ඇත. සටහන් 55 (වත්මන්/වත්මන් නොවන විශ්ලේෂනය) හි වාර්තා කල දිනට පසු (වත්මන්) මාස 12 ඇතුලත සහ වාර්තාකරන දිනයට (වත්මන් නොවන) මාස 12කට වඩා වැඩිකාලයක් තුල ප්‍රකෘතිමත්වීම හෝ පියවීම පිළිබඳ විශ්ලේෂණයකි. මෙම මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් කිරීමක් කර නොමැත.

## 2.6 පියවීම් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් පියවා ඇති අතර පිළිගත් මූල්‍ය පියවා ගැනීමට නිත්‍යානුකුලව බලාත්මක කල හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් සක්ෂාත් කර ගැනීමේ අදහසක් ඇතිවිට පමණක් මූල්‍ය තත්වය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයේ වාර්තා වන ශුද්ධ මූල්‍ය එකවර වගකීම පියවිය හැක. කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථ නිරූපනයක් මගින් අවශ්‍ය නම් හෝ අවසර දි නොමැති නම් සහ සමූහයේ ගිණුම්කරන ප්‍රතිපත්තිවල විශේෂයෙන් අනාවරණය කර ඇත්නම් මිස ආදායම සහ වියදම් ඒකාබද්ධ ලාභය හෝ අලාබ ප්‍රකාශ මගින් සමනය නොකෙරේ.

## 2.7 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

සමූහයේ සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් (රු.) ඉදිරිපත් කර ඇති අතර එය සමුහය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් වේ (කණ්ඩායම් ක්‍රියාකාරි මුදල්).

"පරිපූරක තොරතුරු" පිළිබඳ කොටසේ එක්සත් ජනපද ඩොලර් වලින් ඉදිරිපත් කර ඇති අතර තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල කොටසක් නොවන අතර එය පාර්ශ්වකරුවන්ගේ තොරතුරු සඳහා පමණක් ලබා ගත හැකිය.

## 2.8 වැටයීම

"මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිය - LKASs 1 විසින් අවසර දී ඇති ආකාරයට හැර වෙනත් ආකාරයකින් දක්වා ඇති අවස්ථා හැර, මූල්‍ය ප්‍රකාශනවල ඇති මුදල් ආසන්නතම රුපියල් දහස් ගණනකට වටයා ඇත.

## 2.9 ප්‍රමාණාත්මක හා එකතුව

"මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම" පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - LKAS 1 ට අනුකූලව, සමාන අයිතමවල සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. අසමසම ස්වභාවයක් හෝ ශ්‍රිතයක් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරනු ලැබේ.

## 2.10 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

SLFRSs සහ LKASs වලට අනුකූලව සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමණාකරනය අවශ්‍ය වේ. තවද ඉදිරි මූල්‍ය වර්ෂය තුල ගෙන යන වත්කම් හා වගකීම් ප්‍රමාණයන් සඳහා ප්‍රමාණාත්මක ගැලපීමක් සිදු කිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති වාර්තාකරන දිනයේදී අනාගත සහ තක්සේරු කිරිමේ අවිනිශ්චිතතාවයේ ප්‍රධාන ප්‍රභවයන් සලකා බැලීම කළමණාකරනයට අවශ්‍ය වේ. සත්‍ය ප්‍රථිපල මෙම ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය.

ගිණුම්කරන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පදනම් පවතින උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. ගිණුම් ඇස්තමේන්තු සඳහා වන සංශෝධන ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාලසීමාව තුළ සහ අනාගතයේදි බලපෑමට ලක් වන ඕනෑම කාලපරිච්ඡේදයක් තුළ හඳුනා ගැනේ.

අවිනිශ්චිතතාවයට සම්බන්ධ ප්‍රධාන වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන පහත සාකච්ඡා කර ඇති අතර අදාල වත්කම් හා වගකීම් අදාල ප්‍රමාණයන් අදාල සටහන්වල දක්වා ඇත.

### අඛණ්ඩ පැවැත්ම

සමූහයේ කළමණාකාරිත්වය ඉදිරියට යාමේ හැකියාව ලෙස තක්සේරු කර ඇති අතර අපේක්ෂා කල හැකි අනාගතයක් උදෙසා ව්‍යාපාරයේ ඉදිරියට යාමට සම්පත් ඇති බවට සෑහීමකට පත්වේ. එපමණක් නොව, ඉදිරියට යන කාරණයක් ලෙස සමූහයට ඇති හැකියාව කෙරෙහි සැලකිය යුතු සැකයක් ඇතිකල හැකි ප්‍රමානාත්මක අවිනිශ්චිතතාවයන් පිලිබඳ කලමණාකරනය නොදැන සිටියි. එම නිසා, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව සැකසීමේ පදනම මත සකස් කරනු ලැබේ.

### මුල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය

**2018 අප්‍රේල් 1 සිට අදාල වේ.**

SLFRS 9 ට අනුව, සමූහයේ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති මගින් මූල්‍ය වත්කම් වර්ගීකරණය කිරීමට හා පසුව විවිධ කාණ්ඩවලට මැනීමට ඉඩ සලසයි. එනම් ක්‍රමක්ෂය පිරිවැය, සාධාරණ වටිනාකම් වෙනත් විස්තීරණ ආදායම් හරහා (FVOIC) සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම (FVTPL) පහත සදහන් නිර්නායකයන් මත පදනම්ව;

- 233 වන පිටුවේ 3.4 සටහනෙහි දක්වා ඇති පරිදි මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමේ ආයතනයේ ව්‍යාපාර ආකෘතිය
- 223 වන පිටුවේ 3.4 සටහනෙහි ආයතනයේ දක්වා ඇති පරිදි මූල්‍ය වත්කම් දක්වා ඇති පරිදි මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණය.

**2018 මාර්තු 31 දක්වා අදාළ වේ**

සමුහයේ වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති මගින් LKAS 39 අනුව යම් යම් තත්වයන් යටතේ වත්කම් ආරම්භයේදීම විවිධ මූල්‍ය වත්කම් කාණ්ඩවලට වර්ගීකරණය කිරීමට ඉඩ ලබා දී ඇත.

- "මුල්‍ය වත්කම් හෝ වගකීම් ලාභය හෝ අලාභය තුලින් සාධාරණ වටිනාකමක්" (FVTPL) ලෙස වර්ගීකරණය කිරීමේදී පියු අංක 269, සටහන් 24 හි දක්වා ඇති අදාල නිර්ණායක සපුරා ඇති බව සමුහය තීරණය කර ඇත.
- මූල්‍ය වත්කම් "පරිණතිය දක්වා පවතින (HTM) ලෙස වර්ගීකරණය කිරීමේදී සමූහය තීරණය කරන්නේ 269 වන පිටුවේ 28 වන සටහන අනුව වත්කම් කලි පිරෙන දිනය දක්වා වත්කම් තබා ගැනීමේ ධනාත්මක අභිප්‍රාය සහ හැකියාව යන දෙකම ඇති බවය.
- මූල්‍ය වත්කම් "ණය සහ ලැබිය යුතු දේ" (L&R) ලෙස වර්ගීකරණය කිරිමේදී 22, 23, 25 සහ 35 වන සටහන්වල දක්වා ඇති මෙම වර්ගීකරණය සඳහා වන නිර්නායක සපුරා ඇති බව සමූහය තීරණය කර ඇත.
- මූල්‍ය වත්කම් "විකිණීම සඳහා පවතින" (AFS) ලෙස වර්ගීකරණය කිරීමේදී, සමූහය තීරණය කර ඇත්තේ AFS ලෙස නම් කර ඇති සියලුම ව්‍යුත්පන්න නොවන මුදල් වත්කම් හෝ ණය සඳහා ලැබිය යුතු දේ ලෙස වර්ගීකරණය නොකල මූල්‍ය වත්කම් FVTPL හෝ HTM AFS ලෙස වර්ගීකරණය කල යුතු බවයි. මෙය සටහන 27 හි දක්වා ඇත.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



### මූල්‍ය වත්කම්වල අපහායනය

SLFRS 9 සහ LKAS 39 යටතේ ඇති සියලුම මූල්‍ය වත්කම් හරහා සිදුවන අපහායනය මැනීම සඳහා විනිශ්චය කිරීම අවශ්‍ය වේ. විශේෂයෙන් හානිය පාඩු තිරණය කිරීමේදී අනාගත මුදල් ප්‍රවාහ සහ ඇපකර අගයන්හි ප්‍රමාණය සහ වේලාව තක්සේරු කිරීම වැදගත් වේ.

මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුර්වල වී ඇති බවට අරමුණුගත සාක්ෂි තිබේද යන්න සමූහය/සමාගම සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරු කරයි.

වත්කම් මුලින් හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ සිදුවීම් එකක් හෝ වැඩි ගණනක ප්‍රතිපලයක් ලෙස අපහනයක් සිදු වී ඇති බවට අරමුණුගත සාක්ෂි තිබේනම් පමණක් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අපහායනයක් සිදු වී ඇති බවයි. එම අලාභ සිදුවීම (හෝ සිදුවීම්) මූල්‍ය වත්කම්වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයට හෝ විශ්වාසදායක ලෙස තක්සේරු කල හැකි මූල්‍ය වත්කම් සමූහයකට බලපෑමක් ඇති කරයි.

### ණය සහ ලැබිය යුතු දේ වල අපහායනය

ඒ අනුව, ආදායම් ප්‍රකාශයේ දුර්වලතා අලාභයක් ලබා දිය යුතු ද යන්න තක්සේරු කිරීම සඳහා සමූහය විසින් එක් එක් වාර්තා කිරීමේ දිනයේදී තනි තනිව සැලකිය යුතු ණය සහ අත්තිකාරම් සමාලෝචනය කරයි. විශේෂයෙන් හානිය අලාභය තිරණය කිරීමේදී අනාගත මුදල් ප්‍රවාහයන්ගේ ප්‍රමාණය සහ වේලාව තක්සේරු කිරීමේදී කළමණාකරණයේ විනිශ්චය අවශ්‍ය වේ.

මෙම ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ ක්‍රියාකාරීන් පිලිබඳ උපකල්පනය මත වන අතර එබැවින් සත්‍ය ප්‍රතිඵල වෙනස් විය හැකිය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 25.7 හි "ණය සහ ලැබිය යුතු දේ වල අපහායනය" පිළිබඳ විස්තර සටහන් කර ඇත.

### මූල්‍ය ආයෝජනය සඳහා වන අපහායනය

SLFRS – 9 මූල්‍ය ආයෝජන අනුව මූල්‍ය ආයෝජන ක්‍රමවත් පිරිවැය යටතේ වර්ගීකරණය කර ඇත. ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය උපකරන පිළිබඳ ඓතිහාසික අලාභ අත්දැකීම් සමාගමට/සමූහයට නොමැත. එහෙත් සමූහය බාහිර ප්‍රභවයන් විසින් ප්‍රකාශයට පත් කරන ලද PD සලකා බලයි. එනම්, බාහිර ණය ශ්‍රේණිගත කිරීම සඳහා බ්ලුම්බර්ග් ලෙස සමූහය සලකයි. එය ශ්‍රී ලංකා රජය විසින් රුපියල් වලින් නිකුත් කරන ලද ණය සුරැකුම්පත් සඳහා වන LGD 0% ක් ලෙස සලකනු ලබන අතර අනෙක් සියලුම උපකරණ සඳහා කර්මාන්තයේ සාමාන්‍යය LGD ලෙස සැලකේ.

මූලික හදුනාගැනීමෙන් පසු මූල්‍ය ආයෝජන සම්බන්ධව සැලකිය යුතු ලෙස වැඩි වී නැත. එම නිසා එම ආයෝජන සඳහා මූල්‍ය ප්‍රකාශනවල අපේක්ෂිත ණය අලාභය සමූහය විසින් වාර්තා කර නොමැත.

### වෙනත් පුළුල් ආදායමක් හරහා සාධාරණ අගය අනුව/විකිණීම සඳහා පවතින වත්කම් අපහායනය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 27 හි "විකිණීම සඳහා පවතින වත්කම් අපහායනය" පිළිබඳ විස්තර සටහන 27 හි දක්වා ඇත .

### දේපල, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය

සෑම වාර්තාකරණ දිනයකදීම ඉතිරිව ඇති වටිනාකම්, ප්‍රයෝජනවත් ජිවිතකාලය හා දේපල පිරියත සහ උපකරණ ක්ෂය කිරීමේ ක්‍රම සමූහය සමාලෝචනය කරයි. කළමණාකරනයේ විනිශ්චය මෙම අගයන්, අනුපාත, ක්‍රම තක්සේරු කිරීමේදී ක්‍රියාත්මක වන අතර එබැවින් ඒවා අවිනිශ්චිතතාවයකට යටත් වේ.

### අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය

අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන වල සටහන 33 හි දක්වා ඇත.

### හුවමාරු මිල නියාමනය

සමාගම ආදායම් බදු සහ හුවමාරු මිල රෙගුලාසි ඇතුලුව වෙනත් බදුවලට යටත් වේ. කළමණාකරන විනිශ්චය භාවිතා කරමින් අවශ්‍ය වන අදාල හුවමාරු මිල රෙගුලාසි වල අර්ථ නිරූපනයට අදාලව පවතින අවිනිශ්චිතතාවයන්. හුවමාරු මිල රෙගුලාසිවල බලපෑම තීරණය කරන්න. ඒ අනුව විවේචනාත්මක තීන්දු සහ ඇස්තමේන්තු භාවිතා කරනු ලැබුවේ ආශ්‍රිත ව්‍යාපාර හඳුනාගැනීම, අදාල මිල ගණන් තක්සේරු සහ සුදුසු මිලකරණ යාන්ත්‍රණයක් තෝරා ගැනීම් ඇතුලුව ඒවාට පමණක් සීමා නොවූ අංශවල රෙගුලාසි ක්‍රියාත්මක කිරීමටය. වර්තමාන බදු ගාස්තුව එවැනි විනිශ්චයන්ට යටත් වේ. කළමණාකරණයේ අර්ථ නිරූපනය සහ හුවමාරු මිල නියාමනය යෙදීම හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායම් බදු ගාස්තු සහ ගෙවිය යුතු සත්‍ය මුදල් අතර වෙනස්කම් ඇතිවිය හැකියි.

### විලම්භිත බදු

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 42 හි විලම්භිත බද්ධ පිළිබඳ විස්තර දක්වා ඇත.

### විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන වල සටහන 43.1 හි දක්වා ඇත.

### පීපල්ස් ලීසිං ඉන්ෂුවරන්ස් පී. එල්. සී හි සාමාන්‍ය රක්ෂණ කොන්ත්‍රාත් වගකීම තක්සේරු කිරීම

සාමාන්‍ය රක්ෂණ කොන්ත්‍රාත්වල ඇස්තමේන්තු වාර්තා කල දිනට වාර්තා කරන ලද අපේක්ෂිත අවසාන හිමිකම් පිරිවැය සඳහා වාර්තා කරන දිනයේදී (IBNR) සිදු වූ නමුත් තවමත් වාර්තා කර නොමැති හිමිකම් සඳහා අපේක්ෂිත අවසාන හිමිකම් පිරිවැය සඳහා කල යුතුය. අවසන් හිමිකම් පිරිවැය නිශ්චිතවම ස්ථාපිත කිරීමට පෙර එය සැලකිය යුතු කාලයක් ගත වනු ඇත. හිඟ හිමිකම් ප්‍රමාණයන් තක්සේරු කිරීමට පාදකව පවතින ප්‍රධාන උපකල්පනය වන්නේ අතීත හිමිකම් සංවර්ධන අත්දැකීමය.

අලාභ ගැලපුම් ඇස්තමේන්තුවල මුහුණත වටිනාකමෙන් වෙන්කර ගැනීමෙන් හෝ ඔවුන්ගේ අනාගත සංවර්ධනය පිලිබිඹු වන පරිදි වෙන වෙනම ප්‍රක්ෂේපණය කිරීමෙන් විශාල හිමිකම් සාමාන්‍යයෙන් වෙන වෙනම ආමන්ත්‍රණය කෙරේ. බොහෝ අවස්ථාවන්හිදී සාමාන්‍ය හිමිකම් අනුපාත, උද්ධමන හෝ අලාභ අනුපාත පිළිබඳ පැහැදිලි උපකල්පනයක් සිදු නොකෙරේ.

### 2.11 සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ අවබෝධ වැඩි දියුණු කිරීම සහ අන්තර් කාල සංසන්දනය වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශවල පෙර කාලපරිච්ඡේදයට සාපේක්ෂව ප්‍රමාණාත්මක, ආඛ්‍යා හා විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු අනාවරණය වේ. පෙර වර්ෂ මූල්‍ය ප්‍රකාශයේ ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණ සංශෝධන කර ඇති අතර එහිදී වඩා හොඳ ඉදිරිපත් කිරීමකට අදාළ වන අතර වත්මන් වර්ෂයේ ප්‍රකාශන ඒවා සමඟ සැසඳිය හැකිය. මූල්‍ය ප්‍රකාශණ සඳහා 334 වන පිටුවේ 54 වන සටහනෙහි විස්තර කර ඇත.

"මූල්‍ය උපකරණ" පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය – SLFRS 9 හි විෂය පථය තුල මූල්‍ය උපකරණ සඳහා සමූහය/සමාගම 2018 හා සන්සන්දනාත්මක තොරතුරු නැවත ලබා දී නොමැති එබැවින් 2018 සඳහා වන සන්සන්දනාත්මක තොරතුරු ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිය – LKAS 39 යටතේ "මූල්‍ය උපකරණය පිලිගැනීම සහ ගිණුම්" පිළිබඳ වාර්තා කර ඇති අතර එය 2019 සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු සමග සසැඳිය නොහැක. 2018 අප්‍රේල් 1 වන දින වන විට සටහන 4 හි අනාවරණය වේ.

## 3 සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1 ඒකාබද්ධ කිරීමේ පදනම

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අතරට සමාගම, එහි පරිපාලිත සමාගම් සහ එහි ආශ්‍රිත සමාගම ඇතුළත් වේ. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී. හි අනුබද්ධිත පීපල්ස් ඉන්ෂුවරන්ස් පී. එල්. සී. හැරුණු විට සමාගමේ අනුබද්ධ සහ සහායකයන්ගේ මූල්‍ය ප්‍රකාශන එකම වාර්තා කරන වර්ෂය සඳහා සුදානම් කර ඇති අතර එහි මූල්‍ය වර්ෂය දෙසැම්බර් 31 වනදායින් අවසන් වේ. ඒකාබද්ධ කරීමේ අරමුණු සඳහා එකම වාර්තා කරන වර්ෂය භාවිතා කර ඇත.

#### 3.1.1 ව්‍යාපාර සංයෝජනය හා කීර්ති නාමය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය – SLFRS – 3 (ව්‍යාපාර සංයෝජන) හි අවශ්‍යතා අනුව අත්පත් කර ගැනිමේ ක්‍රමය භාවිතා කරීම සඳහා ව්‍යෘපාර සංයෝජන ගණනය කෙරේ.

අත්පත් කර ගත් සමාගම තුළ පාලනය කළ නොහැකි උනන්දුවක් දක්වන පිළිගත් මුදල, අත්පත් කරගත් හඳුනාගත් වත්කම්වල ශුද්ධ හඳුනාගත් ප්‍රමාණයට වඩා අඩුවෙන් සහ උපකල්පනය කරන ලද වගකීම් ඇතුළුව මාරු කරන ලද සලකා බැලීමේ ලෙස සමූහය සහ සමාගම කීර්තිනාමය මනිනු ලබයි. අතිරික්තය සෘණාත්මක වන විට ලාභ හෝ අලාභ ප්‍රකාශයේ කේවල් කිරීමේ මිලදී ගැනිමේ වාසියක් වහාම හඳුනා ගැනේ.

ව්‍යාපාර සංයෝජනයකදී ලබාගත් කීර්තිනාමය මුලින් ම මනිනු ලබන්නේ, හඳුනාගත් වත්කම්, වගකීම් සහ අත්පත් කරගත් අවිනිශ්චිත වගකීම්වල ශුද්ධ මූල්‍ය කෙරෙහි සමූහයේ උනන්දුව ඉක්මවා ව්‍යාපාර සංයෝජනයේ පිරිවැයට වඩා වැඩි වීමෙනි.

මූලික හඳුනාගැනීමෙන් පසුව, සමුච්චිත හානිය නැතිවීමකට වඩා අඩුවියදමකින් කිර්ති නාමය මනිනු ලබයි. සිදුවීම හෝ තත්ත්වයන්හි වෙනස්වීම මගින් ගෙන යා හැකි අගය අඩපණ විය හැකි බව පෙන්නුම් කරන්නේ නම් වාර්ෂික හෝ වැඩි වාර ගණනක් දුර්වලතා සඳහා කීර්ති නාමය සමාලෝචනය කෙරේ. හානිකරන පරික්ෂණ සඳහා ව්‍යාපාර සංයෝජනයකින් ලබාගත් කීර්ති නාමය, අත්පත් කරගත් දිනයේ සිටම සමුහයේ මුදල් උත්පාදක ඒකක (CGUS) හෝ වෙන් කරනු ලැබේ. අත්පත් කර ගත් තැනැත්තාගේ වෙනත් වගකීම් හෝ වත්කම් එම ඒකක වලට පවරා තිබේද යන්න නොසලකා.

කීර්තිනාමය CGU (හෝ CGUs සමුහයක) කොටසක් වන අතර එම ඒකක තුළ ක්‍රියාත්මක වන කොටසක් බැහැර කරනු ලැබේ නම්, බැහැර කිරීමේ මෙහෙයුමට සම්බන්ධ සුභදතාවය බැහැර කිරීමේ ලාභය හෝ අලාභය තීරණය කිරීමේදී මෙහෙයුම් ප්‍රමාණයට ඇතුළත් වේ. මෙහෙයුමේ, මෙම තත්ත්වය තළ බැහැර කරන කීර්ති නාමය මනිනු ලබන්නේ බැහැර කරන ලද මෙහෙයුම් සාපේක්ෂ අගයන් සහ CGU හි කොටස රදවා තබා ගැනීම මතය.

උප සමාගම් විකුණන විට විකුණුම් මිල සහ ශුද්ධ වත්කම් සහ සමුච්චිත පරිවර්තන වෙනස් කම් සහ කිර්ති නාමය අතර වෙන ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

#### 3.1.2 පොදු පාලන ව්‍යාපාර සංයෝජනය

පොදු පාලන ව්‍යාපාර සංයෝජනය ගණනය කරනු ලබන්නේ නිර්දේශ පරිචය ප්‍රකාශය (SoRP) යටතේ නිකුත් කර ඇති මාර්ගෝපදේශ භාවිතා කිරීමෙනි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරනු ලබන පොදු පාලන ව්‍යාපාර සංයෝජනය සඳහා ගිණුම් ඒකාබද්ධ කිරීම සිදුකරයි.

#### 3.1.3 පාලනය අහිමිවීම

පාලනය අහිමි වීමෙන් පසුව සමූහය විසින් අනුබද්ධිත ආයතනයේ වත්කම් සහ වගකීම් පාලනය නොකරන ඕනෑම උනන්දුව සහ අනුබද්ධිත සමාගමකට අදාළ කොටස්වල අනෙකුත් කොටස් හඳුනාගනී. පාලනය නැතිවීම මත පැන නගින ඕනෑම අතිරික්තයක් හෝ හිගයක් ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හදුනාගෙන ඇත. පෙර අනුබද්ධිත ආයතනය කෙරෙහි සමුහය කිසියම් උනන්දුවක් දක්වන්නේ නම්, එම උනන්දුව පාලනය නැති වු දිනයේදී සාධාරණ වටිනාකමකින් මනිනු ලැබේ.

#### 3.1.4 ඒකාබද්ධ කිරීම මත ගනුදෙනු ඉවත් කිරීම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අන්තර් සමාගම් ශේෂයන් සහ අභ්‍යන්තර සමාගම් ගනුදෙනු වලින් පැනනගින කිසියම් සත්‍ය නොවන ආදායමක් සහ වියදම් ඉවත් කරනු ලැබේ. කොටස් ගිණුම්ගත අයෝජකයින් සමඟ ගනුදෙනු කිරීමෙන් ඇති වන යථාර්ථවාදී නොවන වාසි ආයෝජකයා කෙරෙහි සමූහයේ උනන්දුව දක්වන ප්‍රමාණයට ආයෝජනයට එරෙහිව ඉවත් කරනු ලැබේ. යථාර්ථවාදී නොවු පාඩු අහෝසි කරනු ලබන්නේ යථාර්ථවාදී නොවන වාසිවලට සමානය. නමුත් හානිය පිළිබඳ සාක්ෂි නොමැති තරමට පමණි.

### 3.2 විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂයන්

සියලුම විදේශ මුදල් ගනුදෙනු ඉදිරිපත් කිරීමේ මුදල් බවට පරිවර්තනය කර ඇති අතර ගනුදෙනු සිදු වූ දින සිට ස්ථානීය විනිමය අනුපාතයට අනුව ශ්‍රී ලංකාවේ රුපියල් (රු.) වේ. මේ සම්බන්ධයෙන් සමුහයේ පරිචය වන්නේ ගනුදෙනුවේ දිනයේ සිට විනිමය තීන්දුවේ මධ්‍යම අනුපාතය භාවිතා කරීමයි.

වාර්තා කරන දිනයේ දී විදේශ මුදල් වලින් නම් කර ඇති මුදල් වත්කම් සහ වගකීම් වාර්තා කරන දිනයේ ස්ථානීය විනිමය අනුපාතයට අනුව ක්‍රියාකාරි මුදලට නැවත පරිවර්තනය කරනු ලැබේ. වර්ෂය තුළ ඵලදායී පොලී සහ ගෙවීම් සඳහා සකස් කරන ලද වර්ෂය ආරම්භයේදී ක්‍රියාකාරි මුදල් වල ක්‍රමක්ෂය පිරිවැය සහ වාර්තා කරන දිනයේ විනිමය අනුපාතයට පරිවර්තනය කරන ලද විදේශ මුදල්වල ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනස විදේශ මුදල් ලාභය හෝ මූල්‍ය භාණ්ඩවල අලාභය වේ.

විදේශ මුදල් වර්ගයක ඓතිහාසික පිරිවැය අනුව මනිනු ලබන මුදල් නොවන අයිතම හඳුනාගත් දිනයේදී ස්ථෘනීය විනිමය අනුපාත භාවිතා කරමින් පරිවර්තනය කරනු ලැබේ. සාධාරණ වටිනාකම තීරණය කළ දිනයේ ස්ථානීය විනිමය අනුපාත භෘවිතා කරමින් විදේශ මුදල්වලින් සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මුදල් නොවන අයිතම පරිවර්තනය කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



## 3.3 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

SLFRS 9 මූල්‍ය උපකරණ සහ SLFRS 7 – (සංශෝධිත), "මූල්‍ය උපකරණ අනාවරණය කිරීම්" සහ SLFRS 15 "ගනුදෙනුකරුවන් සමඟ ඇති ගිවිසුම්වලින් ලැබෙන ආදායම" යන ප්‍රමිතීන් හැර මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාලපරිච්ඡේදයන් සඳහා සමූහය නිරන්තරයෙන් ගිණුම්කරන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර ඇත. ඉහත සඳහන් ගිණුම්කරන ප්‍රමිතීන් ක්‍රියාත්මක කර ඇත්තේ පහත දක්වා ඇති පරිදිය.

නව සහ සංශෝධිත ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් මෙම මූල්‍ය ප්‍රකාශනවලදී, සමූහය විසින් පළමු වරට 2018 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලසීමාවන් සඳහා බලපැවැත්වෙන SLFRS 9, SLFRS 7 සහ SLFRS 15 අයදුම් කර ඇත. නිකුත් කරන ලද නමුත් ඵලදායි නොවන වෙනත් ප්‍රමිතියක්, අර්ථ නිරූපණයක් හෝ සංශෝධනයක් සමූහය විසින් කලින් අනුගමනය කර නොමැත.

### 3.3.1 SLFRS 9 - මූල්‍ය උපකරණ

2014 දෙසැම්බරයේ නිකුත් කරන ලද SLFRS 9, LKAS 39 වෙනුවට ආදේශ කර ඇති අතර, 2018 ජනවාරි 1 වන දිනට හෝ ඊට පසුව ඇරඹෙන වාර්ෂික වාර්තා කරන කාලසීමාවන් සඳහා අදාළ වේ. SLFRS 9 යටතේ ප්‍රතිපත්තිමය තේරීමක් ලෙස තේරී පත් වූ කණ්ඩායම LKAS 39 ට අනුකූලව හෙජ් ගිණුම්කරණය දිගටම කරගෙන යාමට අවසර දී ඇත.

සංසන්දනාත්මක නැවත සඳහන් නොකිරීමට SLFRS 9 හි දක්වා ඇති විකල්පයට අනුකූලව සමූහය 2018 සඳහා සංසන්දනාත්මක තොරතුරු SLFRS 9 විෂය පථය තුල මූල්‍ය උපකරණ සඳහා නැවත සකස් කර නොමැත.

එබැවින්, 2017/18 සඳහා සංසන්දනාත්මක තොරතුරු LKAS 39 යටතේ වාර්තා වන අතර එය 2018/19 සඳහා ඉදිරිපත් කර ඇති තොරතුරු සමඟ සසැඳිය නොහැක. SLFRS 9 සම්මත කිරීමෙන් පැන නගින වෙනස්කම් 2018 අප්‍රේල් 1 වන දිනට සෘජුවම හිමිකම් වශයෙන් හඳුනා ගෙන ඇති අතර, 238 සිට 242 දක්වා පිටුවල 4 වන සටහනෙහි අනාවරණය වේ.

### 3.3.2 වර්ගීකරණ හා මිනුම් වෙනස් කිරීම

ඒවායේ වර්ගීකරණ සහ මිනුම් කාණ්ඩය තීරණය කිරීම සඳහා, වත්කම් කළමනාකරණය කිරීම සඳහා වන ව්‍යාපාරයේ ව්‍යාපාර ආකෘතිය සහ උපකරණවල මුදල් ප්‍රවාහ ලක්ෂණ මත පදනම්ව හිමිකම් උපකරණ සහ ව්‍යුත්පන්නයන් හැර අනෙකුත් සියලුම වත්කම් SLFRS 9 සඳහා තක්සේරු කළ යුතුය.

**වර්ගීකරණය සහ මිනුම් භාණ්ඩ**

මූල්‍ය වත්කම් සඳහා LKAS 39 හි දක්වා ඇති පරිදි (FVTPL, HTM, L&R සහ AFS) ආදේශ කර ඇත්තේ:

- ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබන මූල්‍ය වත්කම්
- වෙනත් පුලුල් ආදායමක් තුලින් සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මූල්‍ය වත්කම්
- ලාභය හෝ අලාභය (FVTPL) හරහා සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මූල්‍ය වත්කම්

FVOCI හි අනෙකුත් පුළුල් ආදායම් හරහා සාධාරණ වටිනාකමකින් මනිනු ලබන හිමිකම් උපකරණ ඇතුළත් වේ. FVOCI හි මනින ලද හිමිකම් උපකරණ හඳුනා ගැනීමෙන් සමුච්චිත වාසි හෝ අලාභ ලාභ හෝ අලාභ සඳහා නැවත වර්ගීකරණය නොකරන අතර සෘජුවම රඳවාගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ. මූල්‍ය වගකීම් වර්ගීකරණය සඳහා LKAS 39 හි පවත්නා අවශ්‍යතා SLFRS 9 බොහෝ දුරට රඳවා ගනී. කෙසේ වෙතත් LKAS 39 යටතේ සාධාරණ වටිනාකම් විකල්පය යටතේ නම් කරන ලද වගකීම්වල සාධාරණ වටිනාකම වෙනස්වීම් ලාභය හෝ අලාභය ලෙස හඳුනාගෙන ඇත. SLFRS 9 යටතේ සාධාරණ අගය වෙනස්වීම් සාමාන්‍යයෙන් පහත පරිදි ඉදිරිපත් කෙරේ.

- වගකීම්වල ණය අවදානම් වෙනස්වීම් වලට හේතු වන සාධාරණ වටිනාකමෙහි වෙනස වෙනත් විස්තීරණ ආදායම් (OCI) හි දක්වා ඇත; සහ
- සාධාරණ වටිනාකමෙහි ඉතිරි වන ලාභය හෝ අලාභය ලෙස ඉදිරිපත් කෙරේ.

සංක්‍රාන්ති දිනයේ පැවති කරුණු හා තත්වයන් පදනම් කරගෙන පහත සඳහන් තක්සේරු කිරීම් සිදු කර ඇත; එනම් 2018 අප්‍රේල් 1

- මූල්‍ය වත්කම් ඇති ව්‍යාපාර ආකෘතිය තීරණය කිරීම
- FVTPL හි මනින ලද පරිදි ඇතැම් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් පිළිබඳ කලින් නම් කිරීම සහ අවලංගු කිරීම
- FVOCI හි මෙන් වෙළෙඳාම සඳහා තබා නොමැති හිමිකම් උපකරණවල ඇතැම් ආයෝජන නම් කිරීම
- FVTPL හි නම් කර ඇති මූල්‍ය වගකීම් සඳහා OCI මූල්‍ය වගකීම්වල ණය අවදානමෙහි වෙනස්වීම්වල ප්‍රතිඵල ඉදිරිපත් කිරීම ලාභාය හෝ අලාභය පිළිබඳ ගිණුම්කරණ නොගැලපීමක් නිර්මාණය කරන්නේද නැතහෙත් විශාල කරන්නේද යන්න තීරණය කිරීම.

සමූහයේ මූල්‍ය වත්කම් සහ වගකීම් වර්ගීකරණ සටහන් 20 හි දක්වා ඇත. 2018 අප්‍රේල් 1 වන විට SLFRS 9 අයදුම් කිරීමේ ප්‍රමාණාත්මක බලපෑම සටහන 4 හි දක්වා ඇත.

අපහායනය ගණනය කිරීමේ වෙනස්වීම් SLFRS 9 සම්මත කර ගැනීම මගින් LKAS 39 යටතේ සිදු වූ පාඩු ප්‍රවේශය ඉදිරියේ අපේක්ෂිත ණය පාඩු (ECL) ප්‍රවේශයකින් ප්‍රතිස්ථාපනය කිරීමෙන් ණය පාඩු පිළිබඳ සමූහයේ ගිණුම්කරණය මූලික වශයෙන් වෙනස් කර ඇත. SLFRS 9 විසින් FVTPL හි නොපවතින සියලුම ණය සහ අනෙකුත් ණය මූල්‍ය වත්කම් සඳහා ණය බැඳීම් සහ මූල්‍ය ඇපකර ගිවිසුම් සමග ECL සඳහා දීමනාවන් වාර්තා කරන ලෙස ඉල්ලා සිටියි. SLFRS 9 යටතේ ණය පාඩු LKAS 39 ට වඩා කලින් හඳුනාගෙන ඇත.

ආරම්භයේ සිටම ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී නොමැති නම්, ඉදිරි මාස 12 තුළ ණය පැහැරහැරීමේ සම්භාවිතාව (PD) සහ සම්බන්ධ ECL මත දීමනාව පදනම් වේ.

මූලික හඳුනාගැනීමෙන් ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති මූල්‍ය වත්කම් සඳහා ජීවිත කාලය අපේක්ෂිත ණය අලාභය සපයනු ලැබේ. මූල්‍ය වත්කම් මිලට ගත් හෝ ආරම්භ කරන ලද ණය අපහායනය (POCI) හා අර්ථ දැක්වීම සපුරාලන්නේ නම් දීමනාව පදනම් වන්නේ වත්කම්වල ආයුකාලය පුරා ECL වල වෙනස මතය.

SLFRS 9 මුලින් අයදුම් කරන අවස්ථාවේදී ණය සුරක්ෂිතතාවයකට අඩු ණය අවදානමක් තිබේ නම් සමූහය උපකල්පනය කර ඇත්තේ වත්කම්වල ණය අවදානම එහි මූලික හඳුනාගැනීමෙන් පසු සැලකිය යුතු ලෙස වැඩි වී නොමැති බවයි.

සමූහයේ අපහායනය ක්‍රමයේ විස්තර සටහන 25.7 හි දක්වා ඇත.

### 3.3.3 SLFRS 7 (සංශෝධිත) - මූල්‍ය උපකරණ: අනාවරණය කිරීම

සමූහය 2018 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි SLFRS 9 සමග SLFRS 7 අනුගත කර ගන්නා ලදි. සටහන 4 හි පෙන්වා ඇති පරිදි සංක්‍රාන්ති ආවරණය කිරීම් ඇතුළු වෙනස්කම් සහ ECL ගණනය කිරීම් පිළිබඳ සවිස්තරාත්මක ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු සමග භාවිතා කරන ලද උපකල්පන සහ යෙදවුම් අවශ්‍යතා අනුව සටහන 25.7 හි අනාවරණය වේ.

ECL දීමනාවල වර්ෂය තුළ සටහන 25.9 හි දක්වා ඇත.

### 3.3.4 SLFRS 15 – ගනුදෙනුකරුවන් සමග ඇති ගිවිසුම්වලින් ලැබෙන ආදායම

SLFRS 15 ආදායම් හඳුනා ගැනීමේ මාර්ගෝපදේශය ප්‍රතිස්ථාපනය කරයි. "ආදායම" පිළිබඳ LKAS 18 "ඉදිකිරීම් කොන්ත්‍රාත්තු" පිළිබඳ LKAS 11 සහ " පාරිභෝගික පක්ෂපාතිත්ව වැඩසටහන්" පිළිබඳ IFRIC 13 ඇතුළත් වන අතර එය 2018 අප්‍රේල් 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාතාවරණ කාලයන් සඳහා ක්‍රියාත්මක වේ.

SLFRS 15 ආදායම් හඳුනාගෙන තිබේද, කොපමණද, කවදාද යන්න තීරණය කිරීම සඳහා පුළුල් රාමුවක් සපයයි. SLFRS 15 සඳහා නව ගුණාත්මක හා ප්‍රමාණාත්මක අනාවරණය කිරීමක් අවශ්‍ය වන අතර මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට ගනුදෙනුකරුවන් සමග ඇති ගිවිසුම්වලින් පැන නගින ආදායමේ ස්වභාවය, ප්‍රමාණය, වේලාව සහ අවිනිශ්චිතතාවය හා මුදල් ප්‍රවාහයන් අවබෝධ කර ගැනීමට හැකි වේ.

ආදායම හඳුනාගත යුත්තේ කවදාද සහ කුමන ප්‍රමාණයකින්ද යන්න තීරණය කිරීම සඳහා ආයතනය විසින් පියවර 5 ක ආකෘතියක් යෙදිය යුතුය. ආයතනයක් විසින් භාණ්ඩයක් හා සේවාවක් පාලනය කිරීම පාරිභෝගිකයෙකුට පැවරෙන විට හෝ ලැබිය යුතු යැයි අපේක්ෂා කරන ප්‍රමාණයට ආදායම හඳුනා ගන්නා බව ආකෘතිය නියම කරයි.

SLFRS 15 භාවිතයෙන් සමූහයේ සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශයට සැලකිය යුතු බලපෑමක් නොමැත.

## 3.4 මූල්‍ය උපකරණ – මූලික හඳුනාගැනීම සහ පසුව මැනීම

### 3.4.1 හඳුනාගත් දිනය

"නිත්‍ය මාර්ග වෙළෙඳාම"හැර අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් සහ වගකීම් මුලින් හඳුනාගෙන ඇත්තේ වෙළෙඳ දිනයේ එනම් සමූහය උපකරණ ගිවිසුම්ගත විධිවිධානවලට පාර්ශ්වකරුවකු වන දිනයෙනි."නිත්‍ය මාර්ග වෙළෙඳාම" යන්නෙන් අදහස් වන්නේ වෙළෙඳපොල තුළ නියාමනය හෝ සම්මුතිය මගින් සාමාන්‍යයෙන් ස්ථාපිත කර ඇති කාලසීමාව තුල වත්කම් බෙදාහැරීම අවශ්‍ය වන මූල්‍ය වත්කම් මිලට ගැනීම හෝ විකිණීමයි. එම ගනුදෙනු මුලින් හඳුනාගනු ලබන්නේ බේරුම්කරණ දිනයේදීය.

### 3.4.2 මූල්‍ය වත්කම් වර්ගීකරණය හා පසුව මැනීම

#### 3.4.2.1 2018 අප්‍රේල් 1ට පෙර

LKAS 39 ට අනුව 2018 මාර්තු 31 දක්වා සමූහය සිය මූලික වත්කම් පහත දැක්වෙන කාණ්ඩවලට වර්ගීකරණය කලේය.

- ලාභය හෝ අලාභය (FVTPL) හරහා සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වත්කම් හා මෙම කාණ්ඩය තුළ
  - වෙළෙඳාම සඳහා පැවැත්වෙන
  - ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමකින් නම් කර ඇත.
- ණය සහ ලැබිය යුතු දේ
- පරිණතිය දක්වා පවතින
- විකිණීම සඳහා පවතින

#### 3.4.2.2 2018 අප්‍රේල් 1 න් පසු

SLFRS 9ට අනුව 2018 අප්‍රේල් 1 වන දින සිට සමූහය සිය මූල්‍ය වත්කම් වත්කම් සඳහා වන ව්‍යාපාරික ආකෘතිය සහ වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි මත වර්ගීකරණය කරයි.

- ක්‍රමක්ෂය පිරිවැය
- වෙනත් පුළුල් ආදායමක් (FVOCI) හරහා සාධාරණ වටිනාකම
- ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම (FVTPL)

මූල්‍ය වත්කම් පසුකාලීනව මැනීම මේ වර්ගීකරණය මත රඳා පවති. සටහන 4හි දක්වා ඇති සංක්‍රාන්ති අනාවරණය කිරීම් වලදි LKAS 39 සිට SLFRS 9 දක්වා නැවත වර්ගීකරණය හා මිනුම් සඳහා ඇති බලපෑම පිළිබඳ තොරතුරු අනාවරණය වේ.

ව්‍යාපාර ආකෘති තක්සේරුව

2018 අප්‍රේල් 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි සමූහය ව්‍යාපාර ආකෘතියක පරමාර්ථය තක්සේරු කරන්නේ වත්කමක් කළඹක් ලෙස තබා ඇති අතර, උපකරණයෙන් උපකරණයට වෙනවෙනම තක්සේරු නොකෙරේ. මෙය ව්‍යාපාර කළමනාකරණය කරන ආකාරය සහ කළමනාකරණයට තොරතුරු සපයනු ලැබේ. සලකා බැලූ තොරතුරුවලට ඇතුළත් වන්නේ -

- කළඹ සඳහා ප්‍රකාශිත ප්‍රතිපත්ති සහ අරමුණු සහ එම ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම, විශේෂයෙන් කළමනාකරණයේ උපාය මාර්ග අවධානය යොමු කරන්නේ ගිවිසුම්ගත පොලී ආදායමක් උපයාගැනීම, විශේෂිත පොලී අනුපාත පැතිකඩක් පවත්වා ගැනීම, මූල්‍ය වත්කම්වල කාලසීමාව එම වත්කම් සඳහා අරමුදල් සපයන වගකීම්වල කාලයට ගැලපීම හෝ වත්කම් විකිණීමෙන් මුදල් ප්‍රවාහයන් සක්ෂාත් කරගැනීම;
- කළඹේ ක්‍රියාකාරීත්වය ඇගයීමට ලක්කර සමූහයේ කළමනාකාරිත්වයට වාර්තා කරන්නේ කෙසේද;
- ව්‍යාපාර ආකෘතියේ ක්‍රියාකාරීත්වයට බලපාන අවදානම් (සහ එම ව්‍යාපාර ආකෘතිය තුළ ඇති මූල්‍ය වත්කම්) සහ එම අවදානම් කළමනාකරණය කරන්නේ කෙසේද;
- ව්‍යාපාරයේ කළමනාකරුවන්ට වන්දි ගෙවන ආකාරය - උදා: වන්දි ගෙවීම කළමනාකරනය කරනු ලබන වත්කම්වල සාධාරණ වටිනාකම මත හෝ එකතු කරන ලද ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් මත ද; සහ
- පූර්ව කාලපරිච්ඡේදයන්හි විකිණුම් වාර ගණන, පරිමාව සහ වේලාව, එවැනි විකිණුම් සඳහා හේතු සහ අනාගත විකුණුම් ක්‍රියාකාරකම් පිළිබඳ එහි අපේක්ෂාවන්, කෙසේ වෙතත්, විකුණුම් ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු හුදකලා ලෙස සලකනු නොලැබේ. නමුත් මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා සමූහයේ ප්‍රකාශිත පරමාර්ථය සක්ෂාත්කර ගන්නේ කෙසේද සහ මුදල් ප්‍රවාහයන් සක්ෂාත් කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව සමස්ත තක්සේරුවක කොටසක් ලෙසය.

ව්‍යාපාර ආකෘති තක්සේරුව පදනම් වී ඇත්තේ " නරකම අවස්ථාව" හෝ "ආතති නඩුව" තත්ත්වයන් සැලකිල්ලට නොගෙන සාධාරණ ලෙස අපේක්ෂිත අවස්ථා මතය. මූලික හඳුනාගැනීමෙන් පසු මුදල් ප්‍රවාහයන් සමූහයේ මුල් අවස්ථාවන්ට වඩා වෙනස් ආකාරයකින් සක්ෂාත්කර ගන්නේ නම්, සමූහය එම ව්‍යාපාර ආකෘතියේ ඉතිරිව ඇති මූල්‍ය වත්කම් වර්ගීකරණය වෙනස් නොකරයි. නමුත් අලුතින් ආරම්භ වූ හෝ අලුතින් මිලදී ගත් මූල්‍ය තක්සේරු කිරීමේදී එවැනි තොරතුරු සැලකිල්ලට ගනී.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් තනිකරම මූලික හා පොලී ගෙවීම්ද යන්න තක්සේරු කිරීම (SPPI පරීක්ෂණය)

වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පියවරක් ලෙස සමූහය SPPI පරීක්ෂණයට යෝග්‍ය ද යන්න හඳුනාගැනීම සඳහා ගිවිසුම්ගත මූල්‍ය වත්කම තක්සේරු කරයි.

මෙම තක්සේරුවේ අරමුණු සඳහා "මුල් මුදල්" යන්න මූලික පිළිගැනීම මත මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකම ලෙස අර්ථ දක්වා ඇති අතර, මූල්‍ය වත්කම්වල ආයුකාලය වෙනස් විය හැකිය. (නිදසුනක් ලෙස වාරික/වට්ටම්වල මුල් මුදල හෝ ආපසු ගෙවීම් හෝ ක්‍රමක්ෂය තිබේ නම්).

"පොලිය" යන්න අර්ථ දැක්වෙන්නේ මුදල්වල කාල වටිනාකම හා නිශ්චිත කාලසීමාවක් තුළ ගෙවිය යුතු ප්‍රධාන මුදල හා සම්බන්ධ ණය සහ වෙනත් මූලික ණය අවදානම් සහ පිරිවැය මෙන්ම ලාභ ආන්තිකය යන කරුණු සඳහාය.

ඊට හාත්පසින්ම වෙනස්ව මූලික ණය ලබාදීමේ විධිවිධානයකට සම්බන්ධ නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි අවදානම් හෝ අස්ථාවරත්වය අවම කිරීමට වඩා වැඩි ප්‍රමාණයක් හඳුන්වා දෙන ගිවිසුම් කොන්දේසි, මූලික මුදල සඳහා මූලික හා පොලිය පමණක් ගෙවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්ට හේතු නොවේ. කැපී පෙනේ. එවැනි අවස්ථාවකදී මූල්‍ය වත්කම් FVTPL හි මැනීම අවශ්‍ය වේ.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් තනිකරම මුල් මුදල හා ගෙවිය යුතු මුල් මුදල සඳහා පොලී ගෙවීමක් ද යන්න තක්සේරු කිරීමේදී සමූහය උපකරණයේ ගිවිසුම් කොන්දේසි සලකා බලයි. මූල්‍ය වත්කමෙහි මෙම කොන්දේසි සපුරාලිය නොහැකි වන පරිදි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්ගේ වේලාව හෝ ප්‍රමාණය වෙනස් කළ හැකි ගිවිසුම්ගත යෙදුමක් තිබේද යන්න තක්සේරු කිරීම මෙයට ඇතුළත් වේ. තක්සේරු කිරීමේදී සමූහය සලකා බලන්නේ;

- මුදල් ප්‍රවාහවල ප්‍රමාණය හා වේලාව වෙනස් කරන අඛණ්ඩ සිදුවීම්;
- තෝලන ලක්ෂණ;
- පෙර ගෙවුම් සහ දීර්ඝ නියමයන්;
- නිශ්චිත වත්කම්වලින් මුදල් ප්‍රවාහයට සමූහයේ හිමිකම් සීමා කරන කොන්දේසි; සහ
- මුදල්වල කාල වටිනාකම සලකා බැලීම වෙනස් කරන විශේෂාංග

දිගු කාලීන ස්ථාවර ණය සඳහා වරින්වර යළි පිහිටුවීමේ දිනයන්හිදී පොලී අනුපාතය සංශෝධනය කිරීමට යෝජනා කිරීම සමූහයට හැකියාවක් ඇත. මෙම යළි පිහිටුවීමේ අයිතිවාසිකම් සංශෝධනය කරන අවස්ථාවේ වෙළෙඳපොළ අනුපාතයට සීමා වේ. සංශෝධිත අනුපාතය පිළිගැනීමට හෝ දඩ මුදලකින් තොරව ණය මුදල මුදවා ගැනීමට ණය ගැතියන්ට විකල්පයක් ඇත. මෙම ණයවල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහය තනිකරම මුල් ගෙවීම් හා පොලී ගෙවීම් බව සමූහය තීරණය කර ඇති හෙයින් විකල්පය පොලී අනුපාතය වෙනස් වන්නේ මුදල්වල කාලවටිනාකම, ණය අවදානම, වෙනත් මූලික ණය අවදානම් සහ ඒ හා සම්බන්ධ පිරිවැය යන කරුණු සැලකිල්ලට ගනිමිනි.

මූල්‍ය තත්ත්වය ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති විවිධ වර්ගයේ මූල්‍ය වත්කම් පිළිබඳ විස්තර

මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයෙන් මැනීම

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ එය FVTPL හි නම් කර නොමැති නම් ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබයි.

- වත්කම් රඳවාගෙන ඇත්තේ ව්‍යාපාර ආකෘතියක් තුළ වන අතර, එහි පරමාර්ථය වන්නේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා වත්කම් තබා ගැනීමයි; සහ
- මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනයන්හි මුදල් ප්‍රවාහයන් සඳහා හේතු වන අතර, ඒවා ප්‍රධාන වශයෙන් ගෙවිය යුතු ප්‍රධාන මුදල සහ පොලිය ගෙවිය යුතු ප්‍රධාන මුදලයි.

ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබන මූල්‍ය වත්කම් සටහන් 22, 23 ,25 සහ 26 සහ 35 හි දක්වා ඇත.

මූල්‍ය වත්කම් වෙනත් පුළුල් ආදායමක් හරහා සාධාරණ අගය (FVOCI) හි මැනීම

FVOCI හි මූල්‍ය වත්කම්වලට වෙනත් පුළුල් ආදායමක් තුළින් සාධාරණ වටිනාකමකින් මනිනු ලබන ණය සහ කොටස් උපකරණ ඇතුළත් වේ. FVOCI හි මනින ලද මූල්‍ය වත්කම් සටහන් 27 හි දක්වා ඇත.

මූල්‍ය වත්කම් ලාභා අලාභ හරහා සාධාරණ අගය (FVTPL) හි මැනීම

SLFRS ක්‍රමක්ෂය පිරිවැය යටතේ වර්ගීකරණය කරනලද වත්කම් හෝ FVOCI හැර අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් FVTPL හි මැන ඇති පරිදි වර්ගීකරණය කර ඇත. ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වත්කම් අතර වෙළෙඳාම සඳහා හෝ කළමණාකරනය කර ඇති මූල්‍ය වත්කම් ඇතුලත් වන අතර ඒවායේ ක්‍රියාකාරීත්වය සාධාරණ වටිනාකමක් මත තක්සේරු කරනු ලබන්නේ ඒවා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් රැස්කිරීමට හෝ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමට සහ විකිණීම සඳහා තබා නොගන්නා බැවිනි. සටහන් 24 හි ඇති ලාභය හෝ අලාභය තුලින් සාධාරණ විටිනාකමකින් මූලික හඳුනාගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය වත්කම් දක්වා ඇත.

ලාභය හෝ අලාභය හරහා සාධාරන අගය ඇති මූල්‍ය වත්කම්

මූලික පිළිගැනීම මත SLFRS 9 ට අනුව; සමූහය විසින් ආපසු හැරවිය නොහැකි ලෙස මූල්‍ය වත්කමක් නියම කළ හැකිය. එසේ නොමැති නම් ක්‍රමක්ෂය පිරිවැයකින් හෝ FVOCI හි මැනිය යුතු අවශ්‍යතා සපුරාලන විට FVTPL හි දී නම් කිරීම, එවැනි නම් කිරීම මැනීමෙන් පැනනගින ගිණුම් නොගැලපීම් ඉවත් කිරීම හෝ සැලකිය යුතු ලෙස අඩු කිරීම වත්කම් හෝ වගකීම් හෝ වෙනත් පදනමක් මත ඒවායින් ලැබෙන ලාභ හෝ අලාභ හඳුනාගැනීම.

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී ලාභය හෝ අලාභය තුලින් සාධාරණ වටිනාකමක් ඇති මූලික හඳුනාගැනීම මත සමූහය කිසිඳු මූල්‍ය වත්කමක් නම් කර නොමැත .

**3.4.2.2 2018 අප්‍රේල් 1ට පෙර**

මුලදී මූල්‍ය වත්කමක් පහත දැක්වෙන කාණ්ඩ වලින් එකක් යටතේ වර්ගීකරණය කර ඇත.

i. ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වත්කම්
   – මූල්‍ය වත්කම් – වෙළෙඳාම සඳහා පවතින හෝ
   – මූල්‍ය වත්කම් – ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගය අනුව

ii. මූල්‍ය වත්කම් – ණය සහ ලැබිය යුතු දේ

iii. මූල්‍ය වත්කම් – පරිණතිය දක්වා පවතින හෝ

iv. මූල්‍ය වත්කම් – විකිණීම සඳහා පවතින

මූලික පිළිගැනීමේදී සමූහය සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය තීරණය කරයි. වර්ගීකරණය රඳා පවතින්නේ ආයෝජනය අත්පත් කරගත් හෝ ආරම්භ වූ අරමුණු මත (එනම් අභිප්‍රාය) සහ සමූහයේ රඳවා ගැනීමේ හැකියාව මත පදනම්ව.

මූල්‍ය වත්කම් පසුකාලීනව මැනීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

ලාභය හෝ අලාභය (FVTPL) හරහා සාධාරණ වටිනාකමින් යුතු මූල්‍ය වත්කම්

ලාභය හෝ අලාභය (FVTPL) හරහා සාධාරණ වටිනාකමින් යුතු මූල්‍ය වතකම්වල ඇතුලත් වන්නේ මූල්‍ය වත්කම් වෙළෙඳාම සඳහා පවතින ලාභ අලාභ හරහා සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වත්කම්ය.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයකින් යුත් මූල්‍ය වත්කම්

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් නම් කරඇති සමූහය පහත සඳහන් තත්වයන් යටතේ ලාභ හෝ අලාභ හරහා මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමක් යටතේ නම් කරයි.

- වත්කම් කළමණාකරණය, ඇගයීම සහ අභ්‍යන්තරව සාධාරණ වටිනාකමකින් වාර්තා කිරීම නම් කිරීම.
- ගිණුම්කරණ නොගැලපීම ඉවත් කරයි හෝ සැලකිය යුතු ලෙස අඩු කරයි. එසේ නොමැති නම්
- පැනනගින හෝ ගිවිසුම යටතේ අවශ්‍ය වන මුදල් ප්‍රවාහයන් සැලකිය යුතු ලෙස වෙනස් කරන ඒකාබද්ධ ව්‍යුත්පන්නයක් වත්කමෙහි අඩංගු වේ.

"මූල්‍ය වත්කම් – ණය සහ ලැබිය යුතුදේ" (L සහ R)

"මූල්‍ය වත්කම් – ණය සහ ලැබිය යුතු දේ" පිළිබඳ විස්තර සටහන 25හි දක්වා ඇත.

මූල්‍ය වත්කම් – පරිනතිය දක්වා පවතින (HTM)

"මූල්‍ය වත්කම් – පරිනතිය දක්වා පවතින" අයිතම පිළිබඳ විස්තර සටහන 28හි දක්වා ඇත.

මූල්‍ය වත්කම් – විකිණීම සඳහා පවතින (AFS)

"මූල්‍ය වත්කම් – විකිණීම සඳහා පවතින" අයිතම පිළිබඳ විස්තර සටහන 27හි දක්වා ඇත.

### 3.4.3 වර්ගීකරණය හා මූල්‍ය වගකීම් පසුකාලීනව මැනීම

ආරම්භයේදී සමූහය සහ සමාගම එහි මූල්‍ය වගකීම් වර්ගීකරණය තීරණය කරයි. ඒ අනුව මූල්‍ය වගකීම් පහත පරිදි වර්ගීකරණය කර ඇත:

i. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය අනුව ඇති මූල්‍ය වගකීම්
   - වෙළෙඳාම සඳහා පවතින මූල්‍ය වගකීම්
   - ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය අනුව නම් කරන ලද මූල්‍ය වගකීම්

ii. ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම් පසුකාලීනව මැනීම එම වර්ගිකරණය මත රඳා පවතී.

#### 3.4.3.1 ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය අනුව ඇති මූල්‍ය වගකීම්

FVTPL හි මූල්‍ය වගකීම අතරට වෙළෙඳාම සඳහා වන මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් මූලික පිළිගැනීම මත නම් කරන ලද මූල්‍ය වගකීම් ඇතුළත් වේ. මූලික පිළිගැනීමෙන් පසුව FVTPL හි මූල්‍ය වගකීම් සාධාරණ වටිනාකමකින් මනිනු ලබන අතර ලාභය හෝ අලාභය ප්‍රකාශයේ පිළිගත් වෙනස්කම් හඳුනාගෙන ඇත.

මූල්‍ය වගකීම් වෙළෙඳාම සඳහා රඳවාගෙන ඇති බවට වර්ගීකරණය කර ඇත්තේ ඒවා මූලික වශයෙන් අත්පත් කරගනු ලබන්නේ නුදුරු කාලීනව විකිණීම මත හෝ නැවත මිලදී ගැනීම සඳහා හෝ කෙටිකාලීන ලාභ හෝ පාලනය සඳහා එකට කළමනාකරණය කල කළඹක කොටසක් ලෙසය. ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිය – LKAS 39 මූල්‍ය උපකරණ පිළිබඳ මගින් අර්ථ දක්වා ඇති පරිදි හෙජ් සබඳතාවල හෙජිං උපකරණ ලෙස නම්කර නොමැති සමූහය සහ සමාගම විසින් ඇතුළත් කර ඇති ව්‍යුත්පන්න මූල්‍ය කාණ්ඩයට ඇතුළත් වේ. පිළිගැනීම සහ මිනුම්, වෙන්කල කාවැද්දූ ව්‍යුත්පන්න ඵලදායි හෙජිං උපකරණ ලෙස නම් නොකලහොත් වෙළෙඳාම සඳහා රඳවා ඇති ඒවා ලෙස වර්ගීකරණය කර ඇත.

වෙළෙඳාම සඳහා තබාඇති වගකීම්වල ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

#### 3.4.3.2 ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වගකීම්

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමක් යටතේ නම්කර නොමැති සමූහය විසින් නිකුත් කරනු ලබන මූල්‍ය උපකරණ "බැංකු සඳහා ගෙවිය යුතු", "ගනුදෙනුකරුවන් සඳහා ගෙවිය යුතු" නිකුත් කරන ලද ණය සුරැකුම්පත් සහ වෙනත් මූල්‍ය වගකීම් යටතේ වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. ගිවිසුම්ගත විධිවිධානයේ සාරය ප්‍රතිඵල වශයෙන් සමූහයට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් දරන්නාට ලබාදීමට හෝ ස්ථාවර මුදල් ප්‍රමාණයක් හෝ වෙනත් මූල්‍ය වත්කමක් EIR ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයකින් ස්ථාවර හිමිකම් කොටස් ප්‍රමාණයක් සඳහා හුවමාරු කර ගැනීම හැර වෙනත් වගකීමක් සපුරාලීමට බැඳී සිටී.

මූලික හඳුනා ගැනීමෙන් පසු එවැනි මූල්‍ය වගකීම් පසුව මනිනු ලබන්නේ ක්‍රමක්ෂය පිරිවැයක් යටතේ EIR ක්‍රමය මගිනි. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ නිකුතුව පිළිබඳ කිසියම් වට්ටමක් හෝ අධි මිල සහ EIR හි අනිවාර්ය අංගයක් වන පිරිවැය සැළකිල්ලට ගනිමිනි. ලාභ හෝ අලාභ ප්‍රකාශයේ "පොලී වියදම" සහ EIR ක්‍රමක්ෂය ඇතුළත්වේ. වගකීම හඳුනා නොගත් විට මෙන්ම EIR ක්‍රමක්ෂය කිරීමේ ක්‍රියාවලිය හරහා ඇතිවන වාසි සහ අලාභ, ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

ක්‍රමක්ෂය පිරිවැයක් යටතේ සමූහයේ මූල්‍ය වගකීම් පිළිබඳ විස්තර සටහන 36, 37, 38, 39, සහ 40 මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

### 3.4.4 මූල්‍ය උපකරණ නැවත වර්ගීකරණය කිරීම

මූලික පිළිගැනීමෙන් පසු සමූහය කිසිදු මූල්‍ය මෙවලමක් "ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය" කාණ්ඩයට නැවත වර්ගීකරණය නොකරයි. මූලික පිළිගැනීම මත ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමක් ලෙස නම්කර ඇත්නම් සමූහය "ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට" කිසිදු මූල්‍ය මෙවලමක් නැවත වර්ගීකරණය නොකරයි.

සමූහය විසින් ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් "වෙළෙඳාම සඳහා පවතින" කාණ්ඩයන් සහන විකිණීම සඳහා පවතින ණය සහ ලැබිය යුතු දේ හෝ පරිනතිය දක්වා පවතින යන කාණ්ඩවලට ශ්‍රී ලංකා ගිණුම්කරණයෙන් (ප්‍රමිතිය – LKAS 39 – මූල්‍ය උපකරණ පිළිබඳ පිළිගැනීම සහ මිනුම්) අවසර දී ඇත. යම් යම් තත්ත්වයන් යටතේ මූල්‍ය වත්කම් "විකිණීම සඳහා පවතින" කාණ්ඩයෙන් සහ ණය සහ ලැබිය යුතුදේ "වෙළෙඳාම සඳහා පවතින" හෝ "පරිණතිය දක්වා පවතින" යන කාණ්ඩයට නැවත වර්ගීකරණය කිරීමට සමූහයට අවසර ඇත.

නැවත වර්ගීකරණය කරන ලද දිනයේදී වන වර්ගීකරණයන් සාධාරණ වටිනාකමකින් සටහන් වන අතර, එය නව ක්‍රමක්ෂය පිරිවැය බවට පත්වෙයි. විකිණීම සඳහා පවතින කාණ්ඩයෙන් නැවත වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් සඳහා හිමිකම්වල හඳුනාගෙන ඇති එම වත්කමෙහි පෙර ලාභයක් හෝ අලාභයක් ඵලදායි පොලිය භාවිතා කරමින් ආයෝජනයේ ඉදිරි ආයුකාලය පුරා ලාභය හෝ අලාභය ප්‍රකාශ කිරීම සඳහා ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය පිරිවැය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් අතර කිසියම් වෙනසක් EIR භාවිතා කරමින් වත්කම්වල ඉතිරි ආයු කාලය පුරා ක්‍රමක්ෂය කරඇත.

වත්කම පසුකාලීනව අපහනය යැයි තීරණය කරන්නේ නම් හිමිකම්වල සටහන් කරඇති අගය, ලාභ හෝ අලාභ ප්‍රකාශයට ප්‍රතිචක්‍රීකරණය කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



ණය සහ ලැබිය යුතුදේ පිළිබඳ අර්ථ දැක්වීම සපුරාලන්නේ නම් (එනම් අපේක්ෂිත අනාගතය සඳහා පවතින හෝ පරිනතවන තෙක් පවතින මූල්‍ය වත්කම්) සමූහයට ව්‍යුත්පන්න නොවන වෙළෙඳ වත්කමක් වෙළෙඳාම සඳහා පවතින කාණ්ඩයෙන් සහ ණය සහ ලැබිය යුතු කාණ්ඩයට නැවත වර්ගීකරණය කල හැක. මූල්‍ය වත්කමක් නැවත වර්ගීකරණය කර ඇත්නම් සහ එම මුදල් ලැබීම නැවත අයකර ගැනීමේ ප්‍රථිපලයක් ලෙස සමූහය විසින් අනාගත මුදල් ලැබීම පිළිබඳ ඇස්තමේන්තු වැඩි කරන්නේ නම්, එම වැඩිවීමේ බලපෑම වෙනස් වූ දින සිට EIR වෙත ගැලපීමක් ලෙස හඳුනා ගැනේ.

නැවත වර්ගීකරණය කලමනාකරණයේ තේරීම වන අතර එය උපකරණයෙන් උපකරණයට බැලිය යුතුය.

### 3.4.5 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් ඉවත් කිරීම

#### මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමක් (හෝ මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක් අදාළ වනවිට) හඳුනා නොගන්නේ:

- කල් ඉකුත් වූ වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය;
- සමූහය සහ සමාගම වත්කම්වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය මාරුකර ඇති අතර, හෝ ලැබුණු මුදල් ප්‍රවාහයන් ප්‍රමාදයකින් තොරව තෙවන පාර්ශ්වයකට ගෙවීමට බැඳී සිටී; හෝ
  - සමූහය සහ සමාගම වත්කම්වල සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස මාරුකර ඇත; හෝ
  - සමූහය සහ සමාගම වත්කම්වල සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස මාරුකර හෝ රඳවාගෙන නැත. නමුත් වත්කම් පාලනය මාරු කර ඇත;

මූල්‍ය වත්කමක් හඳුනාගැනීමේදී වත්කම් ධාරණ අගය හා ලැබුණු සළකා බැලීම සහ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති සමුච්චිත ලාභයක් හෝ අලාභයක් අතර වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

සමූහය සහ සමාගම වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය මාරුකර ඇති විට හෝ සම්මත කිරීමේ විධිවිධානයකට අවතිර්ණවී ඇති විට සහ වත්කම්වල සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස මාරු කිරීම හෝ රඳවා නොගැනීම හෝ වත්කම් පාලනය කිරීම මාරු කිරීම සමූහය වත්කම් සඳහා අඛණ්ඩව සම්බන්ධ වන තරමට වත්කම් හඳුනා ගැනේ. එවැනි අවස්ථාවකදී සමූහය ආශ්‍රිත වගකීමක්ද හඳුනා ගනී. මාරු කරන ලද වත්කම සහ ඒ ආශ්‍රිත වගකීම මනිනු ලබන්නේ සමූහය රඳවාගෙන ඇති අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබිඹු කරන පදනමක් මතය.

මාරුකරන ලද වත්කම්වලට වඩා ඇපකරයක ස්වරූපය ගන්නා අඛණ්ඩ මැදිහත්වීම් මනිනු ලබන්නේ වත්කම්වල මුල් ධාරණ අගය සහ ආපසු ගෙවීම සඳහා සමූහයට අවශ්‍ය විය හැකි උපරිම අගය අතර වඩා අඩු අගයයි.

#### මූල්‍ය වගකීම්

වගකීම් යටතේ ඇති වගකීම් නිදහස් කරන විට හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් ඉවත් කරනු ලැබේ. පවත්නා මූල්‍ය වගකීමක් එකම ණය දෙන්නාගෙන් වෙනත් අයෙකු විසින් සැළකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත ප්‍රතිස්ථාපනය කරනු ලැබුවහොත් හෝ පවත්නා වගකීමක නියමයන් සැළකිය යුතු ලෙස වෙනස්කර ඇතිවිට එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනාගැනීම සහ නව වගකීමක් හඳුනන ලෙස සලකනු ලැබේ. මුල් මූල්‍ය වගකීම්වල ධාරණ අගය සහ ගෙවන ලද අගය අතර වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

### 3.4.6 මූල්‍ය උපකරණ පියවා ගැනීම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් පියවා ඇති අතර, පිළිගත් මුදල් පියවාගැනීම සඳහා දැනට බලාත්මක කළ හැකි නෛතික අයිතියක් තිබේ නම් සහ ශුද්ධ පදනමක් මත පියවීමට අදහස් කරන්නේ නම් හෝ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ මුදල වාර්තාවේ. සාමාන්‍යයෙන් ප්‍රධාන ගිවිසුම්වලදී මෙය සිදු නොවේ. එබැවින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ අදාළ වත්කම් හා වගකීම් දල වශයෙන් ඉදිරිපත් කෙරේ.

ආදායම සහ වියදම් ශුද්ධ පදනමක් මත ඉදිරිපත් කරනු ලබන්නේ LKAS/SLFRS යටතේ අවසරදී ඇතිවිට හෝ සමූහය වෙළෙඳ ක්‍රියාකාරකම් වැනි සමාන ගනුදෙනු සමූහයකින් පැනනගින වාසි සහ අලාභ සඳහා පමණි.

### 3.4.7 සාධාරණ වටිනාකම තීරණය කිරීම

වාර්තාකරණ දිනයේ සක්‍රීය වෙළෙඳපොලවල වෙළෙඳාම් කරන මූල්‍ය උපකරණ සඳහා වන සාධාරණ වටිනාකම පදනම් වන්නේ ගනුදෙනු පිරිවැය සඳහා කිසිදු අඩු කිරීමකින් තොරව ඒවායේ මිල කළ වෙළෙඳපොල මිල හෝ නියෝජිතයාගේ මිල ගණන් (දිගු කාලය සඳහා ලංසු මිල සහ කෙටි කාලය සඳහා මිල ඉල්ලීම) මතය.

මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම් විශ්ලේෂණය කිරීම සහ ඒවා මනින ආකාරය පිළිබඳ වැඩිදුර විස්තර සටහන 21හි දක්වා ඇත.

### 3.5 මූල්‍ය නොවන වත්කම්වල අපහනය

විලම්බිත බදු වත්කම් හැරුණු විට සමූහයේ මූල්‍ය නොවන වත්කම්වල ධාරණ අගය එක් එක් වාර්තා කිරීමේ දිනයේදී සමාලෝචනය කරනු ලබන්නේ වත්කමක් අපහනය විය හැකි බවට ඇඟවීමක් තිබේද යන්නයි. කිසියම් ඇඟවීමක් තිබේ නම් හෝ වත්කමක වාර්ෂික අපහනය පරීක්ෂා කිරීමට අවශ්‍ය වූ විට සමූහය විසින් වත්කම් අයකරගත හැකි මුදල තක්සේරු කරයි. වත්කමක අයකරගත හැකි මුදල යනු වත්කමක හෝ මුදල් උත්පාදන ඒකකයේ සාධාරණ වටිනාකමින් විකිණීම සඳහා යන පිරිවැයක අඩුකළ පසු අගය සහ එකී භාවිතයේ වටිනාකම අතර වැඩි අගයයි. වත්කමක් හෝ මුදල් උත්පාදනය කරන ඒකකයක් එහි ආපසු අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවාගිය විට වත්කම අපහනය යැයි සළකනු ලබන අතර, එය අයකරගත හැකි ප්‍රමාණයට කපා හැර ඇත.

භාවිතයේ වටිනාකම තක්සේරු කිරීමේදී ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබන්නේ බදු ගෙවීමට පෙර වට්ටම් අනුපාතයක් භාවිතා කරමිනි. එමගින් වර්තමාන වෙළෙඳපොල තක්සේරු කිරීම මගින් මුදල්වල කාල වටිනාකම සහ වත්කම් වලට විශේෂිත අවදානම් පෙන්වා ඇත. සාධාරණ වටිනාකම විකිණීම සඳහා අඩු පිරිවැයක් තීරණය කිරීමේදී සුදුසුව තක්සේරු ආකෘතියක් භාවිතා කරයි. මෙම ගණනය කිරීම් සනාථ කරනු ලබන්නේ තක්සේරු කිරීමේ ගුණකය, ප්‍රසිද්ධියේ වෙළෙඳාම් කරන ලද සමාගම් සඳහා මිල ගණන් උපුටා දැක්වීම හෝ වෙනත් සාධාරණ වටිනාකම් දර්ශකය මගිනි.

කීර්තිනාමය හැරුණු විට වත්කම් සඳහා කලින් හඳුනාගෙන ඇති අපහනය අඩුපාඩුවී ඇති බවට කිසියම් හෝ ඇඟවීමක් තිබේද යන්න එක් එක් වාර්තා කිරීම් දිනයේදී තක්සේරුවක් කරනු ලැබේ. එවැනි ඇඟවීමක් තිබේනම් සමූහය වත්කම් හෝ මුදල් උත්පාදනය කරන ඒකකයේ අයකර ගතහැකි මුදල තක්සේරු කරයි. කලින් හඳුනාගෙන ඇති අපහනය ආපසු හරවනු ලබන්නේ වත්කම් ආපසු අයකර ගත හැකි මුදල තීරණය කිරීම සඳහා භාවිතා කරන ලද උපකල්පනවල වෙනසක් සිදුවී ඇත්නම් පමණක් සහ පූර්ව වර්ෂවලදී වත්කම් සඳහා කිසිඳු අපහනයක් සිදුවී නොමැති බව හඳුනාගෙන නොතිබුණි. එවැනි ආපසු හැරවීමක් ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 3.6 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වාර්තමාන වගකීමක් (නෛතික හෝ එලදායි) ඇතිවිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ප්‍රතිපාදන හඳුනාගෙන ඇති අතර, වගකීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටපතට ගලාඒම අවශ්‍යවනු ඇත. ප්‍රතිපාදන අවිනිශ්චිත වගකීම් සහ අඛණ්ඩ වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය – LKAS 37ට අනුකූලව වගකීම් ප්‍රමාණය පිළිබඳ විශ්වාසදායක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ හැකිය. හඳුනාගත් මුදල එම දිනයෙහි බැඳීම අවට ඇති අවදානම් සහ අවිනිශ්චිතතාවයන් සැළකිල්ලට ගනිමින් වාර්තා කිරීමේ දිනයේදී වර්තමාන වගකීම පියවීම සඳහා අවශ්‍ය සළකා බැලීමේ හොඳම තක්සේරුවවේ. කිසියම් ප්‍රතිපාදනයකට අදාළ වියදම් ඕනෑම ප්‍රතිපූර්ණයක ලාභ ප්‍රකාශය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශයේ දක්වා ඇත.

### 3.7 ණයට ගැනීමේ පිරිවැය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුව – "ණය ගැනීමේ පිරිවැය" පිළිබඳ LKAS 23 වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස සුදුසුකම් ලත් වත්කම් අත්පත්කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණයවන ණය ගැනීමේ පිරිවැය සමූහය ප්‍රාග්ධන වියදම් ලෙස හඳුනාගෙන ඇත. සුදුසුකම් ලැබීමේ වත්කමක් යනු එහි අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් වීමට සැළකිය යුතු කාලයක් ගතවන වත්කමකි. වෙනත් ණය ගැනීමේ පිරිවැය ඒවා සිදුවන කාලසීමාව තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

### 3.8 ප්‍රවර්තන බදු

ආදායම් බදු වියදම පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 17 හි දක්වා ඇත.

### 3.9 විලම්බිත බදු

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 42 හි විලම්බිත බද්ධ පිළිබඳ විස්තර දක්වා ඇත.

### 3.10 බෝග රක්ෂණ බද්ධ (CIL)

2013 අංක 12 මුදල් පනතේ 14 වන වගන්තියේ විධිවිධානවලට අනුව 2013 අප්‍රේල් 1 දින සිට බලපැවැත්වෙන පරිදි CIL හඳුන්වා දෙන ලද අතර, එය ජාතික රක්ෂණභාර අරමුදලට ගෙවිය යුතුය. වර්තමානයේදී බදු ගෙවීමෙන් පසු ලාභයෙන් 1% කට CIL ගෙවිය යුතුය.

### 3.11 මූල්‍ය සේවා සඳහා බදු

මූල්‍ය සේවාවන් සඳහා වන VAT සහ NBT සහ ණය ආපසු ගෙවීමේ බද්ද පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 16 හි දක්වා ඇත.

### 3.12 ප්‍රමිති නිකුත් කළ නමුත් තවමත් එලදායි නොවන

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති නිකුත්කර ඇති නමුත් එය 2019 මාර්තු 31 වන දින සිට ක්‍රියාත්මක නොවේ. ඒ අනුව මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී මෙම ගිණුම්කරණ ප්‍රමිතීන් ක්‍රියාත්මක කර නොමැත.

### SLFRS 16 – කල්බදු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය (LKAS 17) වෙනුවට SLFRS 16 – කල්බදු IFRIC 4 – විධිවිධානයකට ලීසිං එකක් තිබේද යන්න තීරණය කිරීම, SIC 15 මෙහෙයුම් කල්බදු දිරිදීමනා සහ SIC 27 ලීසිංවල නෛතික ස්වරූපය සම්බන්ධ ගනුදෙනුවල සාරය තක්සේරු කිරීම, SLFRS 16 කල්බදු හඳුනාගැනීම මැනීම ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම සඳහා මූලධර්ම දක්වා ඇති අතර, LKAS 17 යටතේ මූල්‍ය කල්බදු සඳහා ගිණුම්කරණයට සමාන තනි ශේෂපත්‍ර ආකෘතියක් යටතේ සියලුම කල්බදු සඳහා බදු ගෙවන්නන් අවශ්‍යවේ. ප්‍රමිතියට කල්බදු ගැනුම්කරුවන් සඳහා පිළිගැනීමේ නිදහස් කිරීම දෙකක් ඇතුළත්වේ. අඩු වටිනාකම් සහිත වත්කම් කල්බදු සහ කෙටිකාලීන කල්බදු.

කල්බදු ආරම්භක දිනයේදී බදු ගෙවීමක් සිදු කිරීමේ වගකීමක් සහ බදු කාලය තුළ පාදකව පවතින වත්කම් භාවිතා කිරීමේ අයිතිය නියෝජනය කරන වත්කමක් බදු අයිතිකරු විසින් හඳුනාගනු ඇත. කල්බදු වගකීම සඳහා වන පොලී වියදම සඳහා අයිතිය භාවිතා කරන වත්කම සඳහා ක්ෂය කිරීමේ වියදම වෙන වෙනම හඳුනා ගැනීම සඳහා බදු ගෙවන්නන් අවශ්‍යවේ. SLFRS 16 යටතේ ඇති අඩු ගිණුම්කරණය LKAS 17 යටතේ ඇති වර්තමාන ගිණුම්කරණයෙන් සැළකිය යුතු ලෙස වෙනස් නොවේ.

LKAS 17 හි ඇති එකම වර්ගීකරණයක මූලධර්ම භාවිතා කරමින් බදු දෙන්නන් සියලු කල්බදු වර්ගීකරණය කිරීම දිගටම කරගෙන යනු ඇති අතර, කල්බදු වර්ග දෙකක් අතර වෙනස හඳුනා ගනී. මෙහෙයුම් මූල්‍ය කල්බදු SLFRS 16 ට LKAS 17 ට වඩා පුළුල් හෙළිදරව් කිරීම් කිරීමට බදු ගෙවන්නන් සහ බදු දෙන්නන් අවශ්‍යවේ. SLFRS 16 2019 ජනවාරි 1 වන දිනෙන් හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා ක්‍රියාත්මක වේ. කලින් අයදුම් කිරීමට අවසර නැත. සම්පූර්ණ නැවත සළකා බැලීමක් හෝ වෙනස් කළ නැවත සළකා බැලීමේ ප්‍රවේශයක් භාවිතා කරමින් ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීමට බදුකරුට තෝරාගත හැකිය. සම්මතයේ සංක්‍රාන්ති විධිවිධාන සමහර සහන සඳහා අවසර දෙයි. සවිස්තරාත්මක බලපෑම් විශ්ලේෂණයක් සඳහා ඉතිරිව ඇති අතර, වාර්තා කරන දිනය වන විට SLFRS 16 වෙතින් ඇතිවිය හැකි බලපෑම සාධාරණ ලෙස තක්සේරු කළ නොහැක.

**මෙහෙයුම් කල්බදු බැඳීම් (ගෙවිය යුතු)**

මෙහෙයුම් කල්බදු යටතේ ශාඛා ගණනාවක් බදු දීමට සමූහය කටයුතු කර ඇත. මෙම ලීසිංවල සාමාන්‍ය ආයුකාලය අවුරුදු පහේ සිට දහය දක්වාවේ. කල්බදු ගිවිසුම්වලට වෙළෙඳපොල තත්ත්වයන් පිළිබිඹු වන පරිදි වරින්වර කුලී ගෙවීම් සංශෝධනය කිරීමට හැකිවන වගන්ති ඇතුළත්වේ. මෙම ලීසිංවල සාමාන්‍ය ආයුකාලය අවුරුදු 1 සිට 5 දක්වා වේ.

මෙහෙයුම් කල්බදු යටතේ ලැබිය යුතු අනාගත අවම කුලී පහත පරිදිවේ.

| | 2019<br>රු. '000 |
|---|---|
| වසරකට අඩු කාලයක් | 623,508 |
| අවුරුදු 1 සිට 5 දක්වා | 927,203 |
| අවුරුදු 5කට වැඩි කාලයක් | 187,443 |
| එකතුව | 1,738,154 |

### IFRIC අර්ථ නිරූපනය 2.3 (ආදායම් බදු පිළිබඳ අවිනිශ්චිතතාවය)

බදු අයකළ හැකි ලාභය (බදු අලාභය) බදු පදනම්, භාවිතයට නොගත් බදු පාඩු, භාවිතයට නොගත් බදු බැර සහ බදු අනුපාත තීරණය කිරීම සඳහා අර්ථ නිරූපනය යෙදිය යුත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 12 (ආදායම් බදු) යටතේ ආදායම් බදු ප්‍රතිකාර සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයක් ඇති විටය. 2019 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලසීමාවන් සඳහා IFRIC 23 බලපැවැත්වේ. කලින් අයදුම් කිරීමට අවසර නැත.

### IFRS 17 රක්ෂණ ගිවිසුම්

ඉතා දිගු ගමනකින් පසු ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය රක්ෂණ ගිවිසුම් පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය 17 නිකුත් කළේය. මෙම ප්‍රමිතිය 2022 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාතාවරණ කාලසීමාවන් සඳහා අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වේ. IFRS 17 යනු රක්ෂණ කොන්ත්‍රාත්තු සඳහා හඳුනා ගැනීම සහ මැනීම ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම අනාවරණය වන පරිදි පුළුල් නව ගිණුම්කරණ ප්‍රමිතියක් වන අතර, මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට පළමු වරට නව දෘෂ්ටිකෝණයකින් ලබා දෙනු ඇත. රක්ෂණකරුවන් ජාත්‍යන්තර මට්ටමේ සිටී.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



## 4 සංක්‍රාන්ති සම්බන්ධ අනාවරණය

### 4.1 2018 අප්‍රේල් 1 වන දින වන විට SLFRS 9 යටතේ වාර්තා කර ඇති ශේෂයන් සඳහා LKAS 39 යටතේ ඇති ශේෂයන් අතර සසැඳීම

පහත දැක්වෙන පිටු මගින් මූල්‍ය තත්ත්වයන් පිළිබඳ ප්‍රකාශයට SLFRS 9 භාවිතා කිරීමේ බලපෑම දක්වා ඇති අතර, LKAS 39 හි ණය පාඩු ගණනය කිරීම් SLFRS 9 හි ECL සමග ප්‍රතිස්ථාපනය කිරීමේ බලපෑම නිරූපණය කර ඇත.

2018 අප්‍රේල් 1 වන දිනට SLFRS 9 යටතේ වාර්තාකර ඇති ශේෂයන් සඳහා LKAS 39 යටතේ ගෙනයන ප්‍රමාණයන් අතර සසැඳීම පහත පරිදි වේ:

| | | සමාගම | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | LKAS 39 මිනුම් | | ප්‍රතිවර්ගීකරණය | ප්‍රතිමිනුම්කරණය | | SLFRS 9 | |
| 2019 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | කාණ්ඩය | වටිනාකම රු. '000 | රු. '000 | ECL රු. '000 | වෙනත් රු. '000 | වටිනාකම රු. '000 | කාණ්ඩය |
| **මූල්‍ය වත්කම්** | | | | | | | | |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | අ | L&R | 4,412,683 | – | – | – | 4,412,683 | AC |
| බැංකු හා මූල්‍ය ආයතන සමග ශේෂය | අ | L&R | 4,370,473 | – | – | – | 4,370,473 | AC |
| මූල්‍ය වත්කම් – ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය අනුව/වෙළෙඳාම සඳහා පවතින | | | – | 174,736 | – | – | 174,736 | FVTPL |
| සිටඃ මූල්‍ය වත්කම් විකිණීම සඳහා පවතින | | FVTPL | 174,736 | (174,736) | – | – | – | |
| ණය සහ ලැබිය යුතු දේ | ආ, ඇ | L&R | 140,165,437 | – | (895,459) | (111,181) | 139,158,797 | AC |
| මූල්‍ය වත්කම් – වෙනත් පුළුල් අදායමක් හරහා සාධාරණ අගය අනුව/විකිණීම සඳහා පවතින | | | – | 219,132 | – | – | 219,132 | FVOCI |
| සිටඃ මූල්‍ය වත්කම් විකිණීම සඳහා පවතින | ආ | AFS | 219,132 | (219,132) | – | – | – | |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය උපකරණ/පරිනතිය දක්වා පවතින | | | – | 4,889,641 | – | – | 4,889,641 | AC |
| සිටඃ මූල්‍ය වත්කම් – පරිනතිය දක්වා පවතින | ඇ | HTM | 4,889,641 | (4,889,641) | – | – | – | |
| වෙනත් මූල්‍ය වත්කම් | අ | L&R | 145,650 | – | – | – | 145,650 | AC |
| **මුළු මූල්‍ය වත්කම්** | | | 154,377,752 | – | (895,459) | (111,181) | 153,371,112 | |
| **මූල්‍ය නොවන වත්කම්** | | | | | | | | |
| පාලිත සමාගම්වල ඇති ආයෝජන | | | 3,213,788 | – | – | – | 3,213,788 | |
| ආශ්‍රිත සමාගම්වල ඇති ආයෝජන | | | 586,427 | – | – | – | 586,427 | |
| ආයෝජන දේපල | | | 134,400 | – | – | – | 134,400 | |
| දේපල, පිරියත සහ උපකරණ | | | 1,166,883 | – | – | – | 1,166,883 | |
| කීර්තිනාමය හා අස්පෘශ්‍ය වත්කම් | | | 346,395 | – | – | – | 346,395 | |
| ප්‍රවර්තන බදු ලැබිය යුතු දේ | | | 89,849 | – | – | – | 89,849 | |
| කල්බදු දේපල | | | 87,131 | – | – | – | 87,131 | |
| වෙනත් වත්කම් | | | 687,969 | – | – | – | 687,969 | |
| මුළු මූල්‍ය නොවන වත්කම් | | | 6,312,842 | – | – | – | 6,312,842 | |
| **මුළු වත්කම්** | | | 160,690,594 | – | (895,459) | (111,181) | 159,683,954 | |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| 2019 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | සමාගම | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | LKAS 39 මිනුම් | | ප්‍රතිවර්ගීකරණය | ප්‍රතිමිනුම්කරණය | | SLFRS 9 | |
| | | කාණ්ඩය | වටිනාකම රු. '000 | රු. '000 | ECL රු. '000 | වෙනත් රු. '000 | වටිනාකම රු. '000 | කාණ්ඩය |
| **මූල්‍ය වගකීම්** | | | | | | | | |
| බැංකු සඳහා ගෙවිය යුතු | | AC | 39,921,789 | – | – | – | 39,921,789 | AC |
| ගනුදෙනුකරුවන් සඳහා ගෙවිය යුතු | | AC | 69,763,219 | – | – | – | 69,763,219 | AC |
| නිකුත් කරන ලද ණය සුරැකුම්පත් | | AC | 15,783,502 | – | – | – | 15,783,502 | AC |
| වෙනත් මූල්‍ය වගකීම් | | AC | 4,645,818 | – | – | – | 4,645,818 | AC |
| මුළු මූල්‍ය වගකීම් | | | 130,114,328 | – | – | – | 130,114,328 | |
| **මූල්‍ය නොවන වගකීම්** | | | | | | | | |
| විලම්භිත බදු වගකීම් | | | 2,275,868 | – | – | (250,729) | 2,025,139 | |
| වෙනත් වගකීම් | | | 1,270,576 | – | – | – | 1,270,576 | |
| මුළු මූල්‍ය නොවන වගකීම් | | | 3,546,444 | – | – | (250,729) | 3,295,715 | |
| **මුළු වගකීම්** | | | 133,660,772 | – | – | (250,729) | 133,410,043 | |
| **හිමිකම්** | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | | 13,236,073 | – | – | – | 13,236,073 | |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | | | 1,837,413 | – | – | – | 1,837,413 | |
| රඳවාගත් ඉපැයුම් | | | 11,502,165 | – | (895,459) | 139,548 | 10,746,254 | |
| වෙනත් සංචිත | | | 454,171 | | – | – | 454,171 | |
| **මුළු හිමිකම්** | | | 27,029,822 | – | (895,459) | 139,548 | 26,273,911 | |
| **මුළු වගකීම් සහ හිමිකම්** | | | 160,690,594 | – | (895,459) | (111,181) | 159,683,954 | |

අ. මෙම වත්කම් කළමණාකරනය කරනු ලබන්නේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමේ ව්‍යාපාරය ආකෘතියක් තුල බැවින් 2018 අප්‍රේල් 1 වන විට සමාගම විසින් සහ ණය ලැබිය යුතු දේ ක්‍රමක්ෂය පිරිවැය යටතේ වර්ගීකරණය කර ඇත.

ආ. සමාගම විසින් පෙර පැවති සියලුම AFS කොටස් උපකරණ FVOCI හි කොටස් උපකරණ ලෙස ආපසු හැරවිය නොහැකි ලෙස නම් කිරීමේ විකල්පය තෝරගෙන ඇත.

ඇ. 2018 අප්‍රේල් 1වන දින වනවිට සියලුම ණය උපකරණ එහි කල් පිරීමේ කළඹ තුල SPPI නිර්ණායක සපුරාලයි. එම නිසා මෙම සියලු උපකරණ ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලබන ණය උපකරන ලෙස වර්ගීකරණය කිරීමට තෝරා ගන්නා ලදී.

ඈ. ආදායම හඳුනාගත හැක්කේ ගනුදෙනුව සමග සම්බන්ධිත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමට ඉඩ ඇතිවිට පමණි. කෙසේ වෙතත් අයකර ගැනීමේ හැකියාව පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇතිවිට ආදායම් හඳුනාගැනීම නතර කල යුතුය. මූල්‍ය වර්ෂය තුල LKAS 39 මූල්‍ය මෙවලම වෙනුවට SLFRS 9 මූල්‍ය මෙවලම භාවිතා කිරීමත් සමග පාරිභෝගික ප්‍රකෘති ලක්ෂය පෙර ප්‍රමිතින්ට අනුව මාස 6කට වඩා වෙනස් දින 90 කට පසු වෙනස් කර ඇත. ඒ අනුව පොලී ආදායම හඳුනාගත හැක්කේ LKAS 39 අනුව ගෙවිය යුතු මාස 6ක් දක්වා හඳුනා ගැනීම වෙනුවට SLFRS 9 ට අනුකූලව ගෙවිය යුතු දින 90 ක් පමණි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



| | | | සමූහය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | LKAS 39 මිනුම් | | ප්‍රතිවර්ගීකරණය | ප්‍රතිමිනුම්කරණය | | SLFRS 9 | |
| 2019 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | කාණ්ඩය | වටිනාකම රු. '000 | රු. '000 | ECL රු. '000 | වෙනත් රු. '000 | වටිනාකම රු. '000 | කාණ්ඩය |
| **මූල්‍ය වත්කම්** | | | | | | | | |
| මුදල් සහ මුදල් වලට සමාන දෑ | අ | L&R | 4,765,518 | – | – | – | 4,765,518 | AC |
| බැංකු හා මූල්‍ය ආයතන සමග ශේෂය | අ | L&R | 8,758,715 | – | – | – | 8,758,715 | AC |
| මූල්‍ය වත්කම් – ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගය අනුව/වෙළඳාම සඳහා පවතින | | | – | 315,485 | – | – | 315,485 | FVTPL |
| සිට: මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා පවතින | | FVTPL | 315,485 | (315,485) | – | – | – | |
| ණය සහ ලැබිය යුතු දේ | අ, ඇ | L&R | 141,915,077 | – | (944,066) | (122,620) | 140,848,391 | AC |
| රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ | අ | L&R | 406,687 | – | – | – | 406,687 | AC |
| මූල්‍ය වත්කම් වෙනත් පුලුල් ආදායමක් හරහා සාධාරණ අගය අනුව/විකිණීම සඳහා පවතින | | | – | (905,190) | – | – | (905,190) | FVOCI |
| සිට: මූල්‍ය වත්කම් – විකිණීම සඳහා පවතින | | | | (905,190) | | | | |
| මූල්‍ය වත්කම් – විකිණීම සඳහා පවතින | ආ | AFS | 219,132 | (219,132) | – | – | – | |
| වෙත: මූල්‍ය වත්කම් – වෙනත් පුලුල් ආදායමක් හරහා සාධාරණ අගය අනුව/විකිණීම සඳහා පවතින | | | – | 905,190 | – | – | – | |
| වෙත: ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය උපකරණ/පරිනතිය දක්වා පවතින | | | – | (1,124,322) | – | – | – | |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය උපකරණ/පරිනතිය දක්වා පවතින | | | – | 7,138,285 | – | – | 7,138,285 | AC |
| සිට: මූල්‍ය වත්කම් – විකිණීම සඳහා පවතින | | | – | 1,124,322 | – | – | – | |
| සිට: මූල්‍ය වත්කම් – පරිනතිය සඳහා පවතින | | | – | 6,013,963 | – | – | – | |
| මූල්‍ය වත්කම් – පරිනතිය දක්වා පවතින | ඇ | HTM | 6,013,963 | (6,013,963) | – | – | – | |
| වෙත: ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය උපකරණ/පරිනතිය දක්වා පවතින | | | – | (6,013,963) | – | – | – | |
| **මුළු මූල්‍ය වත්කම්** | | | 162,394,577 | – | (944,066) | (122,620) | 161,327,891 | |
| **මූල්‍ය නොවන වත්කම්** | | | | | | | | |
| පාලිත සමාගම්වල ඇති ආයෝජන | | | – | – | – | – | – | |
| ආශ්‍රිත සමාගම්වල ඇති ආයෝජන | | | 423,439 | – | – | – | 423,439 | |
| ආයෝජන දේපල | | | 1,265,996 | – | – | – | 1,265,996 | |
| දේපල, පිරියත සහ උපකරන | | | 4,112,715 | – | – | – | 4,112,715 | |
| කීර්ති නාමය හා අස්පෘශ්‍ය වත්කම් | | | 452,883 | – | – | – | 452,883 | |
| ප්‍රවර්තන බදු ලැබිය යුතු දේ | | | 89,849 | – | – | – | 89,849 | |
| කල්බදු දේපල | | | 87,131 | – | – | – | 87,131 | |
| විලම්බිත බදු වත්කම් | | | 28,155 | – | – | – | 28,155 | |
| වෙනත් වත්කම් | | | 1,301,155 | – | – | – | 1,301,155 | |
| මුළු මූල්‍ය නොවන වත්කම් | | | 7,761,323 | – | – | – | 7,761,323 | |
| **මුළු වත්කම්** | | | 170,155,900 | – | (944,066) | (122,620) | 169,089,214 | |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| 2019 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | සමූහය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | LKAS 39 මිනුම් | | ප්‍රතිවර්ගීකරණය | ප්‍රතිමිනුම්කරණය | | SLFRS 9 | |
| | | කාණ්ඩය | වටිනාකම රු. '000 | රු. '000 | ECL රු. '000 | වෙනත් රු. '000 | වටිනාකම රු. '000 | කාණ්ඩය |
| **මූල්‍ය වගකීම්** | | | | | | | | |
| බැංකු සඳහා ගෙවිය යුතු | | AC | 41,834,394 | – | – | – | 41,834,394 | AC |
| ගනුදෙනුකරුවන් සඳහා ගෙවිය යුතු | | AC | 69,377,794 | – | – | – | 69,377,794 | AC |
| නිකුත් කරනලද ණය සුරැකුම්පත් | | AC | 15,783,502 | – | – | – | 15,783,502 | AC |
| වෙනත් මූල්‍ය වගකීම් | | AC | 4,473,552 | – | – | – | 4,473,552 | AC |
| මුළු මූල්‍ය වගකීම් | | AC | 131,469,242 | – | – | – | 131,469,242 | AC |
| **මූල්‍ය නොවන වගකීම්** | | | | | | | | |
| ගෙවිය යුතු රක්ෂණ වගකීම් සහ ප්‍රතිරක්ෂන | | | 4,054,586 | – | – | – | 4,054,586 | |
| ප්‍රවර්තන බදු වගකීම් | | | 62,673 | – | – | – | 62,673 | |
| විලම්බිත බදු වගකීම් | | | 2,338,807 | – | – | (266,494) | 2,072,313 | |
| වෙනත් වගකීම් | | | 1,376,451 | – | – | – | 1,376,451 | |
| මුළු මූල්‍ය නොවන වගකීම් | | | 7,832,517 | – | – | (266,494) | 7,566,023 | |
| **මුළු වගකීම්** | | | 139,301,759 | – | – | (266,494) | 139,035,265 | |
| **හිමිකම්** | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | | 13,236,073 | – | – | – | 13,236,073 | |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | | | 1,837,413 | – | – | – | 1,837,413 | |
| රඳවාගත් ඉපැයුම් | | | 13,167,172 | | (944,066) | 143,874 | 12,366,980 | |
| වෙනත් සංචිත | | | 448,413 | – | – | – | 448,413 | |
| **සමාගමේ කොටස්හිමියන්ට අයත්කළ හැකි මුළු හිමිකම්** | | | 28,689,071 | – | (944,066) | 143,874 | 27,888,879 | |
| පාලනය කල නොහැකි හිමිකම් | | | 2,165,070 | – | – | – | 2,165,070 | |
| **මුළු හිමිකම්** | | | 30,854,141 | – | (944,066) | 143,874 | 30,053,949 | |
| **මුළු වගකීම් සහ හිමිකම්** | | | 170,155,900 | – | (944,066) | (122,620) | 169,089,214 | |

අ. මෙම වත්කම් කළමනාකරණය කරනු ලබන්නේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමේ ව්‍යාපාරය ආකෘතියක් තුළ බැවින් 2018 අප්‍රේල් 1 වන විට සමාගම විසින් සහ ණය ලැබිය යුතු දේ ක්‍රමක්ෂය පිරිවැය යටතේ වර්ගීකරණය කර ඇත.

ආ. සමාගම විසින් පෙර පැවති සියලුම AFS කොටස් උපකරණ FVOCI හි කොටස් උපකරණ ලෙස ආපසු හැරවිය නොහැකි ලෙස නම් කිරීමේ විකල්පය තෝරගෙන ඇත.

ඇ. 2018 අප්‍රේල් 1වන දින වනවිට සියලුම ණය උපකරණ එහි කල්පිරීමේ කළඹ තුල SPPI නිර්ණායක සපුරාලයි. එම නිසා මෙම සියලු උපකරණ ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලබන ණය උපකරණ ලෙස වර්ගීකරණය කිරීමට තෝරා ගන්නා ලදී.

ඇ. ආදායම හඳුනාගත හැක්කේ ගනුදෙනුව සමග සම්බන්ධිත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලාඒමට ඉඩ ඇතිවිට පමණි. කෙසේ වෙතත් අයකර ගැනීමේ හැකියාව පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇතිවිට ආදායම් හඳුනාගැනීම නතර කළ යුතුය. මූල්‍ය වර්ෂය තුළ LKAS 39 මූල්‍ය මෙවලම වෙනුවට SLFRS 9 මූල්‍ය මෙවලම භාවිතා කිරීමත් සමග පාරිභෝගික ප්‍රකෘති ලක්ෂය පෙර ප්‍රමිතින්ට අනුව මාස 6කට වඩා වෙනස් දින 90 කට පසු වෙනස් කර ඇත. ඒ අනුව පොලී ආදායම හඳුනාගත හැක්කේ LKAS 39 අනුව ගෙවිය යුතු මාස 6ක් දක්වා හඳුනා ගැනීම වෙනුවට SLFRS 9 ට අනුකූලව ගෙවිය යුතු දින 90 ක් පමණි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



## 4.2 සංචිත රඳවාගත් ඉපැයීම් මත SLFRS 9 වෙත මාරුවීමේ බලපෑම

සංචිත රඳවාගත් ඉපැයීම් මත SLFRS 9 වෙත මාරුවීමේ බලපෑම පහත පරිදි වේ:

| 2019 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සමාගම<br>රු. '000 | සමූහය<br>රු. '000 |
|---|---|---|
| **විකුණුම් සඳහා පවතින සංචිතය** | | |
| 2018 මාර්තු 31 දිනට LKAS 39 යටතේ අවසන් ශේෂය (ඒ) | 46,869 | 45,585 |
| විකුණුම් සඳහා පවතින සංචිතය සාධාරණ අගය සංචිතයට මාරුකිරීම | (46,869) | (45,585) |
| 2018 අප්‍රේල් 1 වන විට SLFRS 9 යටතේ ආරම්භක ශේෂය (බී) | – | – |
| **SLFRS 9 සම්මත කර ගැනීමෙන් විකිණුම් සඳහා පවතින සංචිතය වෙත ඇති බලපෑම (සී=බී-ඒ)** | (46,869) | (45,585) |
| **සාධාරණ අගය සංචිතය** | | |
| 2018 මාර්තු 31 දිනට LKAS 39 යටතේ අවසන් ශේෂය (ඩී) | – | – |
| විකුණුම් සඳහා පවතින සංචිතය සාධාරණ අගය සංචිතයට මාරුකිරීම | 46,869 | 45,585 |
| **2018 අප්‍රේල් 1 වන විට SLFRS 9 යටතේ ආරම්භක ශේෂය (ඊ)** | 46,869 | 45,585 |
| **SLFRS 9 සම්මත කර ගැනීමෙන් සාධාරණ අගය සංචිතය වෙත ඇති බලපෑම (එෆ්=ඊ-ඩී)** | 46,869 | 45,585 |
| **රඳවාගත් ඉපැයුම්** | | |
| 2018 මාර්තු 31 දිනට LKAS 39 යටතේ අවසන් ශේෂය (ජී) | 11,502,165 | 13,167,172 |
| SLFRS 9 අනුව ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබන අපේක්ෂිත ණය පාඩුව | (1,006,640) | (1,066,686) |
| සම්බන්ධ ගැලපුම් සඳහා විලම්බිත බද්ද | 250,729 | 266,494 |
| **2018 අප්‍රේල් 1 වනවිට SLFRS 9 යටතේ ආරම්භක ශේෂය (එච්)** | 10,746,254 | 12,366,980 |
| **SLFRS 9 සම්මතකර ගැනීමෙන් රඳවාගත් ඉපැයුම් වෙත ඇති බලපෑම (අයි=එච්-ජී)** | (755,911) | (800,192) |
| **SLFRS 9 සම්මතකිරීම හේතුවෙන් හිමිකම්වල සමස්ත වෙනස (සී+එෆ්+අයි)** | (755,911) | (800,192) |

## 4.3 SLFRS 9 වෙත මාරුවීමෙන් අපහායනය වෙත ඇති බලපෑම

ඉහත දැක්වෙන සටහන SLFRS 9 යටතේ ඇති ECL දීමනා සඳහා LKAS 39 යටතේ ඇති සමස්ත ආරම්භක අපහායනය සඳහා වෙන්කිරීම අතර සසඳයි.

| | 2018 මාර්තු 31 වන විට LKAS 39 යටතේ ඇති අපහායනය<br>රු. '000 | ප්‍රතිමිනුම්කරණය<br>රු. '000 | 2018 අප්‍රේල් 1 වන විට SLFRS 9 යටතේ ECLS<br>රු. '000 |
|---|---|---|---|
| සමාගම | | | |
| LKAS 39 අනුව ණය සහ ලැබියයුතු දේ සඳහා වන අපහානය සඳහා වෙන් කිරීම/SLFRS 9 යටතේ ක්‍රමක්ෂය පිරිවැයකින් මූල්‍ය වත්කම් | 3,055,560 | 895,459 | 3,951,019 |
| **මුළු අපහායනය** | 3,055,560 | 895,459 | 3,951,019 |
| සමූහය | | | |
| සඳහා වෙන්කිරීම/SLFRS 9 යටතේ ක්‍රමක්ෂය පිරිවැයකින් මූල්‍ය වත්කම් | 3,233,329 | 944,066 | 4,177,395 |
| **මුළු අපහායනය** | 3,233,329 | 944,066 | 4,177,395 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 5 දළ ආදායම

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමාගම/සමූහයට ආර්ථික ප්‍රතිලාභ ගලාඒමට ඉඩ ඇතිතාක් දුරට ආදායම හඳුනාගෙන ඇති අතර, ආදායම විශ්වාසනීයව මැනිය හැක. අදාළ ආදායම් සඳහා නිශ්චිත හඳුනාගැනීමේ නිර්නායක යටතේ සටහන් ලබාදී ඇති එක් එක් වර්ගයේ ආදායම පෙන්වා දී ඇත.

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2019 රු. '000 | සමාගම 2018 රු. '000 | සමූහය 2019 රු. '000 | සමූහය 2018 රු. '000 |
|---|---|---|---|---|---|---|
| පොලී ආදායම | 6.1 | 244 | **30,836,300** | 26,704,635 | **32,234,340** | 27,582,045 |
| ශුද්ධ ඉපැයූ වාරිකය | | | **–** | – | **4,728,573** | 4,053,270 |
| ගාස්තු සහ කොමිස් ආදායම | 8 | 246 | **1,508,952** | 1,378,361 | **1,004,297** | 819,727 |
| මූල්‍ය වත්කම්වල ශුද්ධ ලාභ අලාභ - FVTPL/වෙළෙඳාම සඳහා පවතින | 9 | 247 | **(27,887)** | 18,987 | **(44,351)** | 59,910 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 10 | 247 | **418,274** | 501,054 | **433,346** | 629,465 |
| මුළු එකතුව | | | **32,735,639** | 28,603,037 | **38,356,205** | 33,144,417 |

## 6 ශුද්ධ පොලී ආදායම

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

### ආදායම් හා වියදම් හඳුනා ගැනීම

සමූහයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට ඉඩ ඇති තරමට ආදායම හඳුනාගෙන ඇති අතර ආදායම විශ්වාසනීයව මැනිය හැක.

### පොලී ආදායම සහ වියදම

ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබන සියලුම මූල්‍ය උපකරණ සඳහා ඵලදායි පොලී අනුපාතය (EIR) භාවිතා කරමින් පොලී ආදායම හෝ වියදම සටහන් වේ. (EIR) යනු මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ආයුකාලය හෝ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම හෝ ලැබීම හරියටම වට්ටම් කරන අනුපාතය හෝ සුදුසු අවස්ථාවන්හිදී කෙටි කාලීනව මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම්වල ශුද්ධ ධාරන පිරිවැයට වට්ටම් කරන අනුපාතයි. ගණනය කිරීම් මූල්‍ය උපකරණයේ සියලුම ගිවිසුම් කොන්දේසි සැලකිල්ලට ගනී. (නිදසුනක් ලෙස පෙරගෙවුම් විකල්ප) සහ උපකරණයට සෘජුවම ආරෝපණය කල හැකි සහ ගාස්තු හා වර්ධන වියදම් ඇතුලත් වන අතර එය (EIR) හි අනිවාර්ය අංගයක් වන නමුත් අනාගත ණය පාඩු නොවේ.

සමූහය විසින් ගෙවීම් හෝ ලැබීම් පිළිබඳ ඇස්තමේන්තු සංශෝධනය කරන්නේ නම් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් ධාරණ පිරිවැයට සකස් කරනු ලැබේ. සකස් කරනලද ධාරණ පිරිවැය මුල් (EIR) මත පදනම්ව ගණනය කරනු ලබන අතර, ධාරණ පිරිවැයේ වෙනස මූල්‍ය වත්කම් සඳහා පොලී ආදායම සහ මූල්‍ය වගකීම් සඳහා පොලී වියදම ලෙස සටහන් වේ. කෙසේ වෙතත් එම මුදල් ලැබීම්වල අයකර ගැනීමේ හැකියාව වැඩිකිරීමේ ප්‍රතිපලයක් ලෙස සමාගම විසින් අනාගත මුදල් ලැබීම පිළිබඳ ඇස්තමේන්තු වැඩිකරන නැවත වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් සඳහා එම වැඩිවීමේ බලපෑම වෙනස් වූ දින සිට (EIR) සමග ගැලපීමක් ලෙස හඳුනා ගැනේ.

SLFRS 9 සහ LKAS 39 ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබන සියලුම මූල්‍ය වත්කම් සඳහා ඵලදායි පොලී අනුපාත ක්‍රමයක් භාවිතා කරමින් පොලී ආදායම සහ විදයම වාර්තා කරනු ලැබේ.

ආදායම හඳුනාගත හැක්කේ ගනුදෙනුව සමග සම්බන්ධිත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමට ඉඩ ඇති විට පමණි. අයකර ගැනීමේ හැකියාව පිළිබඳ අවිනිශ්චිතතාවක් ඇති වූ විට, ආදායම හඳුනාගැනීම නතර කළ යුතුය. මූල්‍ය වර්ෂය තුළ LKAS 39 "මූල්‍ය මෙවලම" වෙනුවට SLFRS 9 "මූල්‍ය මෙවලම" භාවිතා කිරීමත් සමඟ, පාරිභෝගික ප්‍රකෘති ලක්ෂය (අයකර ගැනීමේ හැකියාව පිළිබඳ අවිනිශ්චිතතාව) පෙර ප්‍රමිතීන්ට අනුව මාස 6 කට වඩා වෙනස් වී දින 90කට පසු ලෙස වෙනස් කර ඇත. ඒ අනුව පොලී ආදායම හඳුනාගත හැක්කේ LKAS 39 අනුව ගෙවිය යුතු මාස 6ක් දක්වා හඳුනාගැනීම වෙනුවට SLFRS 9 ට අනුකූලව ගෙවිය යුතු දින 90 පමණි.

### කල් ඉකුත් වූ කුලී සහ පොලීය

කල් ඉකුත් වූ කුලිවලින් ලැබෙන පොලී මුදල් ලැබුණු පදනම මත ගණනය කර ඇත.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



| මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2019 රු. '000 | සමාගම 2018 රු. '000 | සමූහය 2019 රු. '000 | සමූහය 2018 රු. '000 |
|---|---|---|---|---|---|---|
| පොලී ආදායම | 6.1 | 244 | **30,836,300** | 26,704,635 | **32,234,340** | 27,582,045 |
| පොලී වියදම | 6.2 | 244 | **15,646,099** | 14,500,158 | **15,891,298** | 14,626,672 |
| **ශුද්ධ පොලී ආදායම** | | | **15,190,201** | 12,204,477 | **16,343,042** | 12,955,373 |

## 6.1 පොලී ආදායම

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2019 රු. '000 | සමාගම 2018 රු. '000 | සමූහය 2019 රු. '000 | සමූහය 2018 රු. '000 |
|---|---|---|---|---|---|---|
| මුදල් හා මුදල්වලට සමාන දෑ | | | **27,906** | 91,536 | **57,654** | 121,284 |
| බැංකු හා මූල්‍ය ආයතන සඳහා ශේෂය | | | **355,787** | 405,770 | **485,967** | 544,619 |
| ණය සහ ලැබිය යුතු දේ | 6.1.1 | 244 | **29,835,673** | 25,746,323 | **30,765,517** | 26,196,854 |
| මූල්‍ය වත්කම් – විකිණීම සඳහා පවතින | | | **–** | – | **–** | 258,282 |
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය උපකරණ/පරිණතිය දක්වා පවතින | | | **616,934** | 461,006 | **925,202** | 461,006 |
| **මුළු පොලී ආදායම** | | | **30,836,300** | 26,704,635 | **32,234,340** | 27,582,045 |

## 6.1.1 පොලී ආදායම – ණය සහ ලැබිය යුතු දේ

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමාගම 2019 රු. '000 | සමාගම 2018 රු. '000 | සමූහය 2019 රු. '000 | සමූහය 2018 රු. '000 |
|---|---|---|---|---|
| මූල්‍ය කල්බදු/ඉජාරා ලැබිය යුතු දේ | **17,887,342** | 15,344,028 | **17,887,448** | 15,345,781 |
| කුලියට ගැනීම/මුරාබා ලැබිය යුතු දේ | **146,178** | 537,729 | **806,600** | 993,833 |
| කාලීන ණය සහ ලැබිය යුතු දේ | **11,802,153** | 9,864,566 | **12,071,469** | 9,857,240 |
| **මුළු එකතුව** | **29,835,673** | 25,746,323 | **30,765,517** | 26,196,854 |

## 6.2 පොලී වියදම

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2019 රු. '000 | සමාගම 2018 රු. '000 | සමූහය 2019 රු. '000 | සමූහය 2018 රු. '000 |
|---|---|---|---|---|---|---|
| බැංකු සඳහා ගෙවිය යුතු | 6.2.1 | 245 | **4,569,420** | 5,047,798 | **4,857,611** | 5,236,146 |
| ගනුදෙනුකරුවන් සඳහා ගෙවිය යුතු | 6.2.1 | 245 | **8,682,552** | 6,960,275 | **8,654,771** | 6,915,092 |
| නිකුත් කරන ලද ණය සුරැකුම්පත් | 6.2.1 | 245 | **2,394,127** | 2,492,085 | **2,378,916** | 2,475,434 |
| **මුළු පොලී වියදම** | | | **15,646,099** | 14,500,158 | **15,891,298** | 14,626,672 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 6.2.1 පොලී වියදම් නිපැයුම් අනුව

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | **2019 රු. '000** | 2018 රු. '000 | **2019 රු. '000** | 2018 රු. '000 |
| **බැංකු සඳහා ගෙවිය යුතු** | | | | |
| බැංකු අයිරා සඳහා පොලිය | **74,473** | 18,188 | **102,062** | 40,259 |
| කෙටිකාලීන ණය සඳහා පොලිය | **1,770,898** | 894,808 | **1,770,901** | 895,039 |
| කාලීන ණය සඳහා පොලිය | **1,525,581** | 2,407,846 | **1,786,180** | 2,573,892 |
| සුරැකුම්කරණය සඳහා පොලිය | **1,198,468** | 1,726,956 | **1,198,468** | 1,726,956 |
| **අනු එකතුව** | **4,569,420** | 5,047,798 | **4,857,611** | 5,236,146 |
| **ගනුදෙනුකරුවන් සඳහා ගෙවිය යුතු** | | | | |
| තැන්පතු සඳහා පොලී පිරිවැය | **8,682,552** | 6,960,275 | **8,654,771** | 6,915,092 |
| **නිකුත් කරන ලද ණය සුරැකුම්පත්** | | | | |
| ණයකර සඳහා පොලිය | **2,394,127** | 2,490,573 | **2,378,916** | 2,473,922 |
| වාණිජ ප්‍රතික්‍රියා සඳහා පොලිය | **–** | 1,512 | **–** | 1,512 |
| **අනු එකතුව** | **2,394,127** | 2,492,085 | **2,378,916** | 2,475,434 |
| **මුළු එකතුව** | **15,646,099** | 14,500,158 | **15,891,298** | 14,626,672 |

## 7 ශුද්ධ ඉපැයූ වාරිකය

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

### රක්ෂණ සහ ආයෝජන කොන්ත්‍රාත්තුවල නිපැයුම අනුව වර්ගීකරණය

SLFRS 4 - රක්ෂණ කොන්ත්‍රාත්තු සඳහා රක්ෂණ අවදානම් මාරු කිරීමේ මට්ටම අනුව රක්ෂණකරු විසින්, ලියන ලද කොන්ත්‍රාත්තු රක්ෂණ ගිවිසුම් හෝ ආයෝජන ගිවිසුම් ලෙස වර්ගීකරණය කිරීම අවශ්‍ය වේ.

නිශ්චිත අවිනිශ්චිත අනාගත සිදුවීමක් (රක්ෂිත සිදුවීමක්) රක්ෂණ ඔප්පු හිමියන්ට අහිතකර ලෙස බලපාන්නේ නම්, රක්ෂණ ගිවිසුම් යනු රක්ෂණ ඔප්පු හිමියන්ට වන්දි ගෙවීමට එකඟවීමෙන් සමාගම (රක්ෂණකරු) වෙනත් පාර්ශ්වයකින් (රක්ෂණ ඔප්පු හිමියන්) සැලකිය යුතු රක්ෂණ අවදානමක් පිළිගෙන ඇති ගිවිසුම් වේ. සමාන මාර්ගෝපදේශයක් ලෙස, රක්ෂිත සිදුවීම් සිදු නොවූයේ නම්, ගෙවිය යුතු ප්‍රතිලාභ සමග ගෙවිය යුතු ප්‍රතිලාභ සන්සන්දනය කිරීමෙන් සමාගමට සැලකිය යුතු රක්ෂණ අවදානමක් තිබේ ද යන්න තීරණය කරයි, රක්ෂණ ගිවිසුම් මගින් මූල්‍ය අවදානම් මාරු කළ හැකිය.

ආයෝජන කොන්ත්‍රාත්තු යන සැලකිය යුතු මූල්‍ය අවදානමක් මාරු කරන කොන්ත්‍රාත්තු වන අතර, සැලකිය යුතු රක්ෂණ අවදානමක් නොමැත. මූල්‍ය අවදානම යනු නිශ්චිත පොලී අනුපාතයක්, මූල්‍ය උපකරණ මිල, වෙළෙඳ භාණ්ඩ මිල, විදේශ විනිමය අනුපාතය, මිල හෝ අනුපාත දර්ශකය, ණය ශ්‍රේණිගත කිරීම හෝ ණය දර්ශකය හෝ වෙනත් විචල්‍යයන්ගෙන් එකක් හෝ වැඩි ගණනක් අනාගත වෙනසක් ඇතිවීමේ අවදානමයි. මූල්‍යමය නොවන විචල්‍යයකදී විචල්‍ය කොන්ත්‍රාත්තුවට පාර්ශ්වයකට විශේෂිත නොවේ.

කොන්ත්‍රාත්තුවක් රක්ෂණ කොන්ත්‍රාත්තුවක් ලෙස වර්ගීකරණය කළ පසු, මෙම කාලය තුළ රක්ෂණ අවදානම් සැලකිය යුතු ලෙස අඩු වුවද, සියලුම අයිතිවාසිකම් සහ බැඳීම් නිවා දමා හෝ කල් ඉකුත් නොවන්නේ නම්, එය එහි ජීවිත කාලය පුරාම රක්ෂණ ගිවිසුමක් ලෙස පවතී. කෙසේ වෙතත්, රක්ෂණ අවදානම සැලකිය යුතු නම් ආයෝජන ගිවිසුම් ආරම්භයේ සිටම රක්ෂණ ගිවිසුම් ලෙස නැවත වර්ගීකරණය කළ හැක.

සමාගම විසින් විකුණනු ලබන සියලුම නිෂ්පාදන රක්ෂණ ගිවිසුම් වන අතර, එම නිසා SLFRS 4 - රක්ෂණ ගිවිසුම යටතේ රක්ෂණ ගිවිසුම් ලෙස වර්ගීකරණය කර ඇත. මේ අනුව, වාර්තා කරන දිනය වන විට සමාගම එහි නිෂ්පාදන කළඹ තුළ කිසිදු ආයෝජන ගිවිසුමක් නොමැත.

### දළ කපාහරින ලද වාරිකයේ ආදායම් හඳුනාගැනීම

දළ කපා හරින ලද වාරිකය (GWP) නියෝජනය කරන්නේ අවදානම් සඳහා සමාගම විසින් අයකරනු ලබන වාරිකයයි.

GWP කරනු ලබන්නේ උපචිත පදනම දළ ලිඛිත වාරිකය ගිණුම්කරණ කාලසීමාව තුළ ඇතුළත් කර ඇති කොන්ත්‍රාත්තු මගින් සපයනු ලබන මුළු ආවරණ කාලසීමාව සඳහා ලැබුණු/ලැබිය යුතු මුළු වාරිකවලින් සමන්විත වන අතර, ප්‍රතිපත්තිය ආරම්භ වන දිනයේ සිට පිළිගනු ලැබේ.

වාරික අනුපාතයේ කොටසක් වන වට්ටම්, එනම් හිමිකම් ඉල්ලීම් වට්ටම් GWP වෙතින් අඩු නොකෙරේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



### රක්ෂණ - ආදායම් හඳුනාගැනීම දළ කපා හරින ලද වාරිකය

ජීවිත නොවන රක්ෂණ දළ කපා හරින ලද වාරිකය ගිණුම්කරණ කාලසීමාව තුළ ඇත්තේ කර ඇති කොන්ත්‍රාත්තු මගින් සපයනු ලබන මුළු ආවරණ කාලසීමාව සඳහා ලැබිය යුතු මුළු වාරිකවලින් සමන්විත වන අතර, ප්‍රතිපත්තිය ආරම්භ වන දිනයේ සිට පිළිගනු ලැබේ.

### ප්‍රතිරක්ෂණ වාරිකය

ජීවිත නොවන දළ ප්‍රතිරක්ෂණ වාරිකය සමන්විත වන්නේ කාලසීමාව තුළට ඇතුළත් කර ඇති කොන්ත්‍රාත්තු මගින් සපයනු ලබන සම්පූර්ණ ආවරණය සඳහා ගෙවිය යුතු මුළු වාරිකය වන අතර, එය ප්‍රතිපත්තිය ආරම්භ වූ දිනයේ සිට පිළිගනු ලැබේ. පූර්ව ගිණුම්කරණ කාලසීමාවන් තුළ ප්‍රතිරක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන් ගිණුම්කරණ කාලසීමාව තුළ පැනනගින ඕනෑම වෙනස් කිරීමක් වාරිකයට ඇතුළත් වේ.

### නොඉපැයූ වාරික සංචිතය

නොඉපැයූ වාරික සංචිතය නියෝජනය කරන්නේ වර්ෂයේ කපා හරින ලද ඇති වාරිකයේ කොටසකි. නමුත් අඩු නොකළ ආවරණ කාලයට ආදාළ වේ. නොඉපැයූ වාරික 365 පදනම මත ගණනය කෙරේ.

### නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරික සංචිතය

නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරිකය යනු වාර්තා කරන දිනට පසු අවදානම් කාලයන් හා සම්බන්ධ වසරක් තුළ ලියා ඇති වාරිකයේ අනුපාතයයි. නොඉපැයූ වාරික ප්‍රතිරක්ෂණ වාරික යටින් පවතින සෘජු රක්ෂණ ඔප්පුවල කාලසීමාව ඉක්මවා යයි.

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2019 රු. '000 | 2018 රු. '000 | 2019 රු. '000 | 2018 රු. '000 |
| දළ කපා හරින ලද වාරිකය | **–** | – | **5,666,450** | 4,827,258 |
| අඩු: ප්‍රතිරක්ෂණකරුවන්ට ලබා දී ඇති වාරික | **–** | – | **525,790** | 436,032 |
| අඩු: නොඉපැයූ වාරික සංචිතය වෙනසක් | **–** | – | **412,087** | 337,956 |
| මුළු එකතුව | **–** | – | **4,728,573** | 4,053,270 |

## 8 ගාස්තු සඳහා කොමිස් ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

### ගාස්තු සඳහා කොමිස් ආදායම

සමූහය සිය ගනුදෙනුකරුවන්ට සපයන විවිධාකාර සේවාවන්ගෙන් ගාස්තු සහ කොමිස් ආදායම උපයාගනී. කොමිස් ආදායම උපචිත පදනම මත හඳුනා ගැනේ. ගාස්තු ආදායම පහත දැක්වෙන කාණ්ඩ දෙකකට බෙදිය හැකිය,

### නිශ්චිත කාලසීමාවක් තුළ සපයනු ලබන සේවාවන්ගෙන් උපයන ගාස්තු ආදායම

නිශ්චිත කාලසීමාවක් තුළ සේවා සැපයීම සඳහා උපයන ගාස්තු එම කාලසීමාව තුළ උපචිත වේ.

### ගනුදෙනු සේවා සැපයීමෙන් ලැබෙන ආදායම

තෙවන පාර්ශ්වයක් සඳහා ගනුදෙනුවක් සඳහා සාකච්ඡා කිරීම හෝ සහභාගි වීම නිසා පැනනගින ගාස්තු, ලේඛන සැකසීම සහ වාහනය පරීක්ෂා කිරීම වැනි මූලික ගනුදෙනුව අවසන් වූ පසු හඳුනාගැනේ. අදාළ කාර්ය සාධනය සමග සම්බන්ධ වී ඇති ගාස්තු හෝ සංරචක අනුරූප නිර්ණායක සපුරා ගැනීමෙන් පසුව හඳුනාගැනේ.

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2019 රු. '000 | 2018 රු. '000 | 2019 රු. '000 | 2018 රු. '000 |
| සේවා ගාස්තු | **620,031** | 522,058 | **197,171** | 132,692 |
| වෙනත් ගාස්තු සහ කොමිස් | **888,921** | 856,303 | **807,126** | 687,035 |
| මුළු එකතුව | **1,508,952** | 1,378,361 | **1,004,297** | 819,727 |

## 9 මූල්‍ය වත්කම්වල ශුද්ධ ලාභ/අලාභ FVTPL/වෙළෙඳාම සඳහා පවතින

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මූල්‍ය වත්කම් වෙළෙඳාම සඳහා පවතින) සඳහා සක්ෂාත් කරගත් සහ සත්‍ය නොවන සාධාරණ වටිනාකම් වෙනස්වීම් ඇතුළුව සාධාරණ වටිනාකමේ වෙනස්වීම්වලින් ලැබෙන සියලු වාසි සහ අලාභ මෙයින් සමන්විත වේ.

| | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2019<br>රු. '000 | 2018<br>රු. '000 | 2019<br>රු. '000 | 2018<br>රු. '000 |
| **මූල්‍ය වත්කම්වල ශුද්ධ ලාභ/අලාභ- -FVTPL/වෙළෙඳාම සඳහා පවතින** | | | | |
| වෙළෙඳපොලේ ශුද්ධ අගය (පාඩු) ලාභ | **(24,915)** | (799) | **(57,981)** | 23,522 |
| ශුද්ධ ප්‍රාග්ධන ලාභ | **(2,972)** | 19,786 | **13,630** | 36,388 |
| මුළු එකතුව | **(27,887)** | 18,987 | **(44,351)** | 59,910 |

## 10 වෙනත් මෙහෙයුම් ආදායම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අනෙකුත් මෙහෙයුම් ආදායමට වෙන ප්‍රභවයන්ගෙන් උපයන ලද ආදායම ඇතුළත් වන අතර, ඒවා සමූහයේ සාමාන්‍ය මෙහෙයුම් සමග ඍජුවම සම්බන්ධ නොවන අතර උපචිත පදනම මත හඳුනාගැනේ.

### ලාභාංශ ආදායම

ගෙවීම් ලැබීමේ අයිතිය ස්ථාපිත කළ විට ලාභාංශ ආදායම හඳුනාගැනේ.

### වාහන විකිණීමෙන් ලැබෙන ශුද්ධ වෙළෙඳ ආදායම

ආනයනික වාහන විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලබන්නේ සාමාන්‍යයෙන් වාහන පිටත්කර යැවීමේදී වාහනවල හිමිකාරීත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැණුම්කරු වෙත මාරු වූ විටය.

### මෙහෙයුම් කල්බදු ආදායම

මෙහෙයුම් කල්බදුවලින් ලැබෙන ආදායම අඛණ්ඩව කල්බදු සඳහා වන කල්බදු නියමයන්ට වඩා සරල රේඛීය පදනමක් මත ගණනය කරනු ලබන අතර, වෙනත් මෙහෙයුම් ආදායම්වල ලාභය හො අලාභ ප්‍රකාශයේ සටහන් වේ.

### බොල්ණය අයකරවා ගැනීම

බොල් ණය හා අඩමාණ ණය ලෙස කපාහැර ඇති මුදල් අයකර ගැනීම මුදල් පදනමක් මත හඳුනාගැනේ.

### දේපල පිරියත සහ උපකරණ බැහැර කිරීමේදී ලාභ හෝ අලාභ

දේපල පිරියත සහ උපකරණ බැහැර කිරීමෙන් ඇතිවන ලාභ හෝ අලාභ මුදල් විකිණීම සිදුවන කාලසීමාව තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ මුදල් පදනම මත ගණනය කෙරේ.

### කුලී ආදායම

වර්ෂය සඳහා හිමිකරු සහ කුලීකරු අතර ඇතිකරගත් ගිවිසුම මත පදනම්ව කුලී පදනම මත වාහනයෙන් ලැබෙන ආදායම ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගැනේ.

### වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම මත  හඳුනාගැනේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



| මාර්තු 31න් අවසන් වූ වර්ෂය සඳහා | සමාගම 2019 රු. '000 | සමාගම 2018 රු. '000 | සමූහය 2019 රු. '000 | සමූහය 2018 රු. '000 |
|---|---|---|---|---|
| දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් වාසි | **19,645** | 20,162 | **26,625** | 20,162 |
| කුලී ආදායම | **–** | – | **26,888** | 31,446 |
| මෙහෙයුම් කල්බදු ආදායම | **–** | – | **23,074** | 15,577 |
| ආයෝජන දේපලෙන් කුලී ආදායම | **–** | – | **92,884** | 61,897 |
| වාහන අලෙවියෙන් ශුද්ධ වෙළඳ ආදායම | **2,704** | 2,858 | **3,575** | 2,858 |
| ලාභාංශ ආදායම – FVOCI/විකිණීම සඳහා පවතින | **10,508** | 13,530 | **10,508** | 13,530 |
| – පාලිත සමාගම් | **375,766** | 423,227 | **–** | – |
| – FVTPL/වෙළඳාම සඳහා පවතින | **2,671** | 7,746 | **6,061** | 13,080 |
| ආයෝජන දේපල විකිණීමෙන් ලැබෙන ලාභය/අලාභය | **6,980** | – | **6,980** | – |
| වෙනත් ආදායම් | **–** | 33,531 | **236,751** | 470,915 |
| **මුළු එකතුව** | **418,274** | 501,054 | **433,346** | 629,465 |

## 11 ණය සහ ලැබිය යුතු දේ සඳහා අපහායනය සහ වෙනත් අලාභ

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුව තක්සේරු කරන ලද ණය සහ ලැබිය යුතු දේ සඳහා වන අපහායනය ප්‍රතිපාදනවල වෙනස්වීම් සමාගම සහ සමූහය විසින් හඳුනාගෙන ඇත්තේ ගිණුම්කරණ ප්‍රමිති LKAS 39 – මූල්‍ය උපකරණ – පිළිගැනීම සහ මිනුම් SLFRS 9 – මූල්‍ය උපකරණ පිළිවෙලින් 2018 සහ 2019 වර්ෂය සඳහා සමාගම සහ සමූහය විසින් අනුගමනය කරන ක්‍රමවේදය මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 25.8 හි විස්තර කර ඇත.

### කපාහැරීම් ඇතුළුව ඇපකර බැහැර කිරීමේ පාඩුව

යථා තත්ත්වයට පත්වීමේ යථාර්ථවාදී අපේක්ෂාවක් නොමැතිවිට ණය සහ ලැබිය යුතු දේ (සහ ඒ සම්බන්ධ අපහායනය වෙන්කිරීම්) සාමාන්‍යයෙන් අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් කපාහරිනු ලැබේ. ණය සහ ලැබිය යුතු දේ සුරක්ෂිත කර ඇතිවිට මෙය සාමාන්‍යයෙන් ආරක්ෂාව සාක්ෂාත්කර ගැනීමෙන් ලැබෙන මුදල් ලැබීමෙන් පසුවය.

| මාර්තු 31න් අවසන්වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2019 රු. '000 | සමාගම 2018 රු. '000 | සමූහය 2019 රු. '000 | සමූහය 2018 රු. '000 |
|---|---|---|---|---|---|---|
| ණය හා ලැබිය යුතු දේපල අපහායනය | | | | | | |
| - කේවල අපහායනය | 11.3/11.4 | 250 | **194,262** | 67,006 | **194,262** | 56,163 |
| - සාමූහික අපහායනය | 11.3/11.4 | 250 | **799,059** | 1,338,957 | **905,371** | 1,386,301 |
| වෙනත් ලැබිය යුතු දේ | | | **–** | – | **15,385** | 3,590 |
| කපාහැරීම් ඇතුළුව ඇපකර බැහැර කිරීමේ පාඩුව | | | **728,458** | 186,293 | **728,458** | 186,293 |
| ණය කපාහැරීම්/බැහැර කිරීමේ පාඩු අයකර ගැනීම | | | **(135,273)** | (162,285) | **(135,273)** | (162,285) |
| **එකතුව** | 11.1/11.2 | 249 | **1,586,506** | 1,429,971 | **1,708,203** | 1,470,062 |

## 11.1 ණය සහ වෙනත් අලාභ සඳහා අපහායනය අයකිරීම/(ආපසු හැරවීම) සවිස්තරාත්මකව - සමාගම

| මාර්තු 31න් අවසන්වූ වර්ෂය සඳහා | 2019 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ පාඩු (ශුද්ධ අයකර ගැනීම) රු. '000 | අයකිරීම රු. '000 | (ආපසු හැරවීම) රු. '000 | ශුද්ධ අගය රු. '000 |
| මූල්‍ය කල්බදු/ඉජාරා ලැබිය යුතු දේ | **402,752** | **1,207,248** | **(822,963)** | **787,037** |
| කුලියට ගැනීම/මුරාබා ලැබිය යුතු දේ | **38,955** | **26,602** | **(75,634)** | **(10,077)** |
| කාලීන ණය සහ ලැබිය යුතු දේ | **151,478** | **1,747,012** | **(1,088,944)** | **809,546** |
| **එකතුව** | **593,185** | **2,980,862** | **(1,987,541)** | **1,586,506** |

| මාර්තු 31න් අවසන්වූ වර්ෂය සඳහා | 2018 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ පාඩු (ශුද්ධ අයකර ගැනීම) රු. '000 | අයකිරීම රු. '000 | (ආපසු හැරවීම) රු. '000 | ශුද්ධ අගය රු. '000 |
| මූල්‍ය කල්බදු/ඉජාරා ලැබිය යුතු දේ | 69,412 | 620,341 | (448,332) | 241,421 |
| කුලියට ගැනීම/මුරාබා ලැබිය යුතු දේ | (25,781) | 29,689 | (72,605) | (68,697) |
| කාලීන ණය සහ ලැබිය යුතු දේ | (19,623) | 1,621,995 | (345,125) | 1,257,247 |
| **එකතුව** | 24,008 | 2,272,025 | (866,062) | 1,429,971 |

## 11.2 ණය සහ වෙනත් අලාභ සඳහා අපහායනය අයකිරීම/(ආපසු හැරවීම) සවිස්තරාත්මකව - සමූහය

| මාර්තු 31න් අවසන්වූ වර්ෂය සඳහා | 2019 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ පාඩු (ශුද්ධ අයකර ගැනීම) රු. '000 | අයකිරීම රු. '000 | (ආපසු හැරවීම) රු. '000 | ශුද්ධ අගය රු. '000 |
| මූල්‍ය කල්බදු/ඉජාරා ලැබිය යුතු දේ | **402,752** | **1,207,248** | **(822,962)** | **787,038** |
| කුලියට ගැනීම/මුරාබා ලැබිය යුතු දේ | **38,955** | **26,602** | **(11,982)** | **53,575** |
| කාලීන ණය සහ ලැබිය යුතු දේ | **151,478** | **1,853,324** | **(1,152,597)** | **852,205** |
| වෙනත් ලැබිය යුතු දේ | **–** | **15,385** | **–** | **15,385** |
| **එකතුව** | **593,185** | **3,102,559** | **(1,987,541)** | **1,708,203** |

| මාර්තු 31න් අවසන්වූ වර්ෂය සඳහා | 2018 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ පාඩු (ශුද්ධ අයකර ගැනීම) රු. '000 | අයකිරීම රු. '000 | (ආපසු හැරවීම) රු. '000 | ශුද්ධ අගය රු. '000 |
| මූල්‍ය කල්බදු/ඉජාරා ලැබිය යුතු දේ | 69,412 | 620,341 | (448,332) | 241,421 |
| කුලියට ගැනීම/මුරාබා ලැබිය යුතු දේ | (25,781) | 29,689 | (56,603) | (52,695) |
| කාලීන ණය සහ ලැබියයුතු දේ | (19,623) | 1,658,496 | (361,127) | 1,277,746 |
| වෙනත් ලැබිය යුතු දේ | – | 3,590 | – | 3,590 |
| **එකතුව** | 24,008 | 2,312,116 | (866,062) | 1,470,062 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



## 11.3 ආදායම් ප්‍රකාශයට අපහායනය අයකිරීම - සමාගම

| මාර්තු 31න් අවසන්වූ වර්ෂය සඳහා | 2019 අදියර 1 රු. '000 | 2019 අදියර 2 රු. '000 | 2019 අදියර 3 රු. '000 | 2019 එකතුව රු. '000 |
|---|---|---|---|---|
| **ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම්-ණය සහ අත්තිකාරම්** | | | | |
| - කේවල අපහායනය | – | – | **194,262** | **194,262** |
| - සමූහ අපහායනය | **49,497** | **172,842** | **576,720** | **799,059** |
| **එකතුව** | **49,497** | **172,842** | **770,982** | **993,321** |

| මාර්තු 31න් අවසන්වූ වර්ෂය සඳහා | 2018 විශේෂිත රු. '000 | 2018 සාමූහික (තනි තනිව සැලකිය යුතු නිරාවරණ) රු. '000 | 2018 සාමූහික (නමුත් තවමත් හඳුනාගෙන නොමැත) රු. '000 | 2018 එකතුව රු. '000 |
|---|---|---|---|---|
| මූල්‍ය කල්බදු/ඉජාරා ලැබිය යුතු දේ | (64,749) | 236,809 | (51) | 172,009 |
| කුලියට ගැනීම්/මුරාබා ලැබිය යුතු දේ | (7) | (42,909) | – | (42,916) |
| කාලීන ණය සහ ලැබිය යුතු දේ | 131,762 | 1,151,126 | (6,018) | 1,276,870 |
| **එකතුව** | 67,006 | 1,345,026 | (6,069) | 1,405,963 |

## 11.4 ආදායම් ප්‍රකාශයට අපහායනය අය කිරීම - සමූහය

| මාර්තු 31න් අවසන්වූ වර්ෂය සඳහා | 2019 අදියර 1 රු. '000 | 2019 අදියර 2 රු. '000 | 2019 අදියර 3 රු. '000 | 2019 එකතුව රු. '000 |
|---|---|---|---|---|
| **ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්** | | | | |
| - කේවල අපහායනය | – | – | **194,262** | **194,262** |
| - සමූහ අපහායනය | **71,080** | **200,328** | **633,963** | **905,371** |
| **එකතුව** | **71,080** | **200,328** | **828,225** | **1,099,633** |

| මාර්තු 31න් අවසන්වූ වර්ෂය සඳහා | 2018 විශේෂිත රු. '000 | 2018 සාමූහික (තනි තනිව සැලකිය යුතු නිරාවරණ) රු. '000 | 2018 සාමූහික (නමුත් තවමත් හඳුනාගෙන නොමැත) රු. '000 | 2018 එකතුව රු. '000 |
|---|---|---|---|---|
| මූල්‍ය කල්බදු/ඉජාරා ලැබිය යුතු දේ | (64,749) | 236,809 | (51) | 172,009 |
| කුලියට ගැනීම්/මුරාබා ලැබිය යුතු දේ | (7) | (26,907) | – | (26,914) |
| කාලීන ණය සහ ලැබිය යුතු දේ | 131,762 | 1,171,625 | (6,018) | 1,297,369 |
| **එකතුව** | 67,006 | 1,381,527 | (6,069) | 1,442,464 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 12 පිරිස් වියදම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

පිරිස් වියදම් සඳහා වැටුප් සහ ප්‍රසාද දීමනා, අවසාන ප්‍රතිලාභ ගාස්තු සහ වෙනත් අදාළ වියදම් ඇතුළත් වේ. වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලාඒමක් අවශ්‍ය වන විට සහ ප්‍රසාද දීමනා සඳහා ප්‍රතිපාදන හඳුනාගෙන ඇති අතර, වගකීම් ප්‍රමාණය මත විශ්වාසදායක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ හැකිය.

අදාළ ප්‍රතිපත්ති සහ රෙගුලාසිවලට අනුකූලව සේවකයින්ගේ අර්ථසාධක අරමුදල (EPF) දායකත්වය සහ සේවක භාර අරමුදල (ETF) දායකත්වය සඳහා සේවකයින් සුදුසුකම් ලබයි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට LKAS 19 - "සේවක ප්‍රතිලාභ" අනුකූලව පාරිතෝෂිත වගකීම සඳහා සිදු කරන ලද තක්සේරුවක් මත පදනම්ව ලාභ හෝ අලාභ ප්‍රකාශයේ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් හඳුනාගෙන ඇත. LKAS 19 - "සේවක ප්‍රතිලාභ"

| මාර්තු 31න් අවසන්වූ වර්ෂය සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2019 රු. '000 | සමාගම 2018 රු. '000 | සමූහය 2019 රු. '000 | සමූහය 2018 රු. '000 |
|---|---|---|---|---|---|---|
| වේතන | | | **3,143,641** | 2,707,112 | **3,814,774** | 3,082,119 |
| සේවක ප්‍රතිලාභ - අර්ථ දක්වන ලද දායක සැලසුම් (EPF) | | | **163,148** | 146,744 | **200,849** | 170,772 |
| සේවක ප්‍රතිලාභ - අර්ථ දක්වන ලද දායක සැලසුම් (ETF) | | | **40,784** | 36,687 | **49,660** | 45,563 |
| සේවක ප්‍රතිලාභ - විශ්‍රාම ප්‍රතිලාභ වගකීම - පාරිතෝෂිකය | 43.1 | 325 | **90,594** | 83,710 | **101,335** | 93,186 |
| **එකතුව** | | | **3,438,167** | 2,974,253 | **4,166,618** | 3,391,640 |

## 13 ක්ෂයවීම සහ ක්‍රමක්ෂය

### ක්ෂයවීම

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක එක් එක් කොටසෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිතකාලය මත සරල රේඛීය පදනමක් මත ක්ෂයවීම හඳුනාගෙන ඇත. මෙම ක්‍රමය මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව වඩාත් සමීපව පිළිඹිබු කරයි. ඉඩම් ක්ෂය නොවේ.

ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත පහත පරිදි වේ:

| වත්කම් පන්තිය | වසරකට % | කාලය අවුරුදු |
|---|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 2 | 50 |
| කල්බදු දේපල වැඩිදියුණු කිරීම | 25 | 4 |
| මෝටර් වාහන | 12.5-20 | 5-8 |
| පරිගණක දෘඩාංග | 20 | 5 |
| කාර්යාල උපකරණ | 10-20 | 5-10 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 20 | 5 |

ඉහත අනුපාත සියලුම සමූහයේ ආයතන විසින් නිරන්තරයෙන් භාවිත කරනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණවල එක් එක් සැලකිය යුතු කොටස සඳහා ක්ෂයවීමේ අනුපාතය වෙන වෙනම තීරණය කරනු ලබන අතර, එය භාවිතයට ගතහැකි විට පටන්ගනී. එනම් කළමනාකාරීත්වය විසින් අපේක්ෂා කරන ආකාරයට ක්‍රියාත්මකවීමට හැකියාව තිබිය යුතු ස්ථානය සහ තත්ත්වය තුළ පත්වන විටය. වත්කම් ක්ෂය කිරීම වත්කම් විකිණීම සඳහා වර්ගීකරණය කරඇති දිනට පෙර හෝ වත්කම් හඳුනා නොගත් දිනට පෙර නතර වේ ක්ෂයවීම් ක්‍රම ප්‍රයෝජනවත් ජීවිත සහ අවශේෂ අගයයන් එක් එක් වාර්තා කිරීමේ දිනයේදී නැවත තක්සේරුකර සුදුසු නම් සකස් කරනු ලැබේ.

සියලුම පන්තිවල දේපල, පිරියත සහ උපකරණ ආරම්භයේදී සහ වසර අවසානයේදී ධාරණ අගයයන් සහ සමුච්චිත ක්ෂයවීම් ප්‍රතිසන්ධානය සමග සටහන 32හි දක්වා ඇත.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



## අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම

ක්‍රමක්ෂය ගණනය කරනු ලබන්නේ අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය ඒවායේයි අවශේෂ අගයන්ට ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික ජීවිතකාලය පුරා පහත සඳහන් අනුපාතයන්ට අනුව සරල රේඛා ක්‍රමය භාවිත කරමින් කපා හැරීමයි:

| වත්කම් පන්තිය | වසරකට % | කාලය අවුරුදු |
|---|---|---|
| පරිගණක මෘදුකාංග | 20 | 5 |

සීමිත ජීවිතකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය නොවූ ශේෂයන් වාර්ෂිකව අපහායනය සඳහා සමාලෝචනය කරනු ලබන අතර, අපහායනය පිළිබඳ ඇඟවීමක් ඇතිවිට හා අපේක්ෂිත අනාගත ප්‍රතිලාභවලින් අයකර ගැනීමට තවදුරටත් හැකියාවක් නොමැති තරමට ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

අස්පෘශ්‍ය වත්කම්වල සියලුම පන්ති සහ ආරම්භයේ සහ වසර අවසානයේදී ධාරණ අගය හා සමුච්චිත ක්‍රමක්ෂය සමග සංහිඳියාව සටහන 33හි දක්වා ඇත.

| | සටහන | පිටු අංකය | සමාගම 2019 රු. '000 | සමාගම 2018 රු. '000 | සමූහය 2019 රු. '000 | සමූහය 2018 රු. '000 |
|---|---|---|---|---|---|---|
| දේපල පිරියත සහ උපකරණ ක්ෂය කිරීම | 32 | 303 | **166,006** | 178,905 | **286,193** | 278,342 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | 33 | 308 | **10,535** | 10,535 | **13,101** | 12,827 |
| කල්බදු දේපල ක්‍රමක්ෂය කිරීම | 34 | 310 | **3,066** | 3,066 | **3,066** | 3,066 |
| **එකතුව** | | | **179,607** | 192,506 | **302,360** | 294,235 |

## 14 ප්‍රතිලාභ හිමිකම් සහ ප්‍රතිරක්ෂණ වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

## දළ හිමිකම් පිළිගැනීම

ජීවිත නොවන රක්ෂණය සඳහා වන දළ හිමිකම් සඳහා වර්ෂය තුළ වාර්තාවූ හෝ නොවූ හිමිකම් ඉල්ලීම සැකසීමට හා නිරවුල් කිරීමට සෘජුවම සම්බන්ධ වන බාහිර හිමිකම් හැසිරවීමේ පිරිවැය ගැලවීමේ වටිනාකම සහ වෙනත් අයකර ගැනීම්වල වටිනාකම අඩු කිරීම සහ පෙර වර්ෂවල හිඟ හිමිකම් සඳහා කිසියම් ගැලපීම් ඇතුළත් වේ. තනි හිමිකම් ඉල්ලීම් ලිපිගොනු සමාලෝචනය කිරීම සහ හිමිකම් පියවීම සඳහා වන අවසාන පිරිවැයේ වෙනස්කම් තක්සේරු කිරීම් මගින් හිඟ හිමිකම් තක්සේරු කරනු ඇත.

සෘජු රක්ෂණ ව්‍යාපාරයක් සඳහා හිමිකම් වියදම සහ හිඟව තිබෙන හිමිකම් සඳහා වන වගකීම හඳුනා ගැනේ. වාර්තා කරන ලද නමුත් තවමත් ගෙවා නොමැති වාර්තා නොවූ හිමිකම් IBNR සහ එම හිමිකම් පියවීම සඳහා අපේක්ෂිත සෘජු හා වක්‍ර වියදම් මෙම වගකීම් ආවරණය කරයි. අතීත අත්දැකීම් සහ ප්‍රවණතා මත පදනම්ව අනාගත වගකීම් පිළිබඳ වඩාත් යථාර්ථවාදී තක්සේරුවක් සහතික කිරීම සඳහා කාර්තුමය පදනමක් මත IBNR සඳහා ප්‍රතිපාදනය කරයි.

දැනට පවතින තොරතුරු මත පදනම්ව හිමිකම් සඳහා ප්‍රතිපාදන සාධාරණ ලෙස ප්‍රකාශකර ඇති බව අධ්‍යක්ෂවරුන් සලකන අතර, පසුව ලැබෙන තොරතුරු සහ සිදුවීම්වල ප්‍රතිපලයක් ලෙස අවසාන වගකීම වෙනස් වේ. මෙය ලබාදී ඇති අගයට ගැලපීමට හේතු විය හැකිය. එවැනි අගය එම කාලසීමාව සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු වේ. භාවිතා කරන ක්‍රම සහ ඇස්තමේන්තු නිතිපතා සමාලෝචනය කරනු ලැබේ.

## ප්‍රතිරක්ෂණ හිමිකම් පිළිගැනීම

අදාළ කොන්ත්‍රාත්තුවේ නියමයන්ට අනුව අදාළ දළ රක්ෂණ වන්දි මුදල හඳුනාගත්විට ප්‍රතිරක්ෂණ වන්දි හඳුනාගැනේ.

නැවත රක්ෂණය කරන ලද ව්‍යාපාරයේ නිෂ්පාදන වර්ගීකරණය සැලකිල්ලට ගනිමින් ප්‍රති රක්ෂණය සෘජු ව්‍යාපාරයක් ලෙස සලකනු ලැබුවහොත් උපකල්පනය කරන ලද ප්‍රති රක්ෂණය සඳහා වන හිමිකම් ආදායම හෝ වියදම් ලෙස හඳුනා ගැනේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| මාර්තු 31න් අවසන්වූ වර්ෂය සඳහා | සමාගම 2019 රු. '000 | සමාගම 2018 රු. '000 | සමූහය 2019 රු. '000 | සමූහය 2018 රු. '000 |
|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම් | **–** | – | **2,851,334** | 2,360,649 |
| ශුද්ධ ප්‍රතිලාභ සහ ශුද්ධ අත්පත්කර ගැනීමේ පිරිවැය | **–** | – | **477,371** | 415,483 |
| **එකතුව** | **–** | – | **3,328,705** | 2,776,132 |

## 15 වෙනත් මෙහෙයුම් වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ලාභය හෝ අලාභ ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් වියදම් හඳුනාගෙන ඇත්තේ පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම ඉපැයීම අතර සෘජු සම්බන්ධතාවයක් මතය. ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා දරන ලද සියලු වියදම් වර්ෂය සඳහා ලාභය ලඟා කර ගැනීමේදී ලාභය හෝ අලාභ ප්‍රකාශයට අය කරනු ලැබේ.

### වගා රක්‍ෂණ බද්ද (CIL)

2013 අංක 12 මුදල් පනතේ 14 වන වගන්තියේ විධිවිධානවලට අනුව 2013 අප්‍රේල් 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි CIL හඳුන්වා දෙනලද අතර, එය ජාතික රක්‍ෂණ භාර අරමුදලට ගෙවිය යුතුය. වර්තමානයේදී බදු ගෙවීමෙන් පසු ලාභයෙන් 1% කට CIL ගෙවිය යුතුය.

### අධ්‍යක්‍ෂකවරුන්ගේ දීමනා

විධායක නොවන අධ්‍යක්‍ෂකවරුන්ට ගෙවන ගාස්තු අධ්‍යක්‍ෂකවරුන්ගේ වැටුප් සඳහා ඇතුළත් වේ.

| මාර්තු 31න් අවසන්වූ වර්ෂය සඳහා | සමාගම 2019 රු. '000 | සමාගම 2018 රු. '000 | සමූහය 2019 රු. '000 | සමූහය 2018 රු. '000 |
|---|---|---|---|---|
| අධ්‍යක්‍ෂකවරුන්ගේ දීමනා | **9,315** | 8,392 | **16,564** | 17,100 |
| විගණකවරුන්ගේ වේතන | **7,458** | 6,988 | **12,573** | 10,693 |
| විගණන නොවන විගණකවරුන්ගේ ගාස්තු | **5,730** | 4,354 | **6,711** | 6,666 |
| වෘත්තීය ගාස්තු | **28,697** | 13,169 | **47,480** | 19,798 |
| ප්‍රචාරණ වියදම් | **48,450** | 46,482 | **66,993** | 106,328 |
| නීති ගාස්තු | **19,531** | 13,585 | **19,845** | 13,585 |
| තැන්පතු රක්‍ෂණ වාරික | **106,232** | 81,009 | **106,232** | 81,009 |
| වගා රක්‍ෂණ බද්ද | **46,094** | 40,092 | **46,094** | 40,092 |
| කාර්යාල පරිපාලනය සහ සංස්ථාපිත වියදම් | **2,572,912** | 2,222,284 | **2,728,928** | 2,248,215 |
### 25.10.1 පුද්ගල අපහායනය සඳහා ප්‍රතිපාදන ගෙනයාම

| | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| මාර්තු 31 වන විට | **2019 රු. '000** | 2018 රු. '000 | **2019 රු. '000** | 2018 රු. '000 |
| අප්‍රේල් 1 වන විට ශේෂය | – | 231,999 | – | 242,842 |
| ආදායම් ප්‍රකාශයට අය කිරීම/(ආපසු හැරවීම) | – | 67,006 | – | 56,163 |
| **මාර්තු 31 වන විට ශේෂය** | – | 299,005 | – | 299,005 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



### 25.10.2 සාමූහික අපහායනය සඳහා ප්‍රතිපාදන ගෙනයාම 2017/18

| මාර්තු 31 වන විට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2019 රු. '000 | 2018 රු. '000 | 2019 රු. '000 | 2018 රු. '000 |
| අප්‍රේල් 1 වන විට ශේෂය | – | 1,417,598 | – | 1,548,023 |
| ආදායම් ප්‍රකාශයට අයකිරීම/(ආපසු හැරවීම) | – | 1,338,957 | – | 1,386,301 |
| මාර්තු 31 වන විට ශේෂය | – | 2,756,555 | – | 2,934,324 |

ණය සහ ලැබිය යුතු දේ සඳහා වන අපහායන ප්‍රතිපාදනවල සංවේදීතාව සටහන 59.2.7හි 354 පිටුවෙහි දක්වා ඇත.

## 26 රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ

#### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහය සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ප්‍රතිරක්ෂණකරුවන්ට රක්ෂණ අවදානම ලබා දෙයි. ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ ප්‍රතිරක්ෂණ සමාගම් වෙතින් ගෙවිය යුතු ශේෂයන් නියෝජනය කරයි. ප්‍රතිරක්ෂණකරුවන්ගෙන් අය කර ගත හැකි මුදල තක්සේරු කර ඇත්තේ හිඟ හිමිකම් ඉල්ලීම් ප්‍රතිපාදනයට හෝ ප්‍රතිරක්ෂණකරුගේ ප්‍රතිපත්ති හා සම්බන්ධ නිරවුල් කළ හිමිකම්වලට අනුකූල වන අතර, ඒවා අදාළ ප්‍රතිරක්ෂණ ගිවිසුමට අනුකූල වේ.

රක්ෂිත රක්ෂණ විධිවිධාන සමූහය රක්ෂණ ඔප්පුහිමියන්ට ඇති බැඳීම්වලින් නිදහස් නොකරයි.

### 2018 අප්‍රේල් 1 න් පසු

ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේට අදාළ ලක්ෂණ අනුව, ප්‍රතිලාභ පමණක් ප්‍රාග්ධනය සහ පොලිය නියෝජනය කරන බැවින් මෙවලම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ පරීක්ෂණයට (SSPI පරීක්ෂණය) සුදුසුකම් ලබයි. ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ සඳහා පොලී ගාස්තුවක් නොතිබුණද, ඒවා කෙටිකාලීන යැයි සැලකෙන බැවින් SSPI පරීක්ෂණය තෘප්තිමත් කරයි. පොලිය අය කිරීම සඳහා ණය අවදානම නොපවතී. SSPI පරීක්ෂණය අවසන් වූ පසු, කළමනාකාරීත්වය විසින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කිරීම සහ ක්‍රමෝපායික පිරිවැය යටතේ මෙවලම මැනීම සඳහා ව්‍යාපාරයේ රඳවා තබා ගැනීමේ ව්‍යාපාර ආකෘතිය තෝරා ගන්නා ලදී. මේවා මූල්‍යමය අංගයක් නොමැතිව කෙටිකාලීන ශේෂයන් වන බැවින්, ක්‍රමක්ෂය පිරිවැය ධාරණ වටිනාකමට සමාන වේ.

### 2018 අප්‍රේල් 1 ට පෙර

ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ නියමිත වේලාවට හඳුනා ගෙන ඇති අතර, ලැබිය යුතු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමෙන් මූලික පිළිගැනීම මත මනිනු ලැබේ.

ප්‍රතිරක්ෂණ මිලදී ගැනීමේදී ලැබෙන ලාභ හෝ අලාභ මිලදී ගැනීමේ දිනයේදීම ලාභය හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගෙන ඇති අතර, ඒවා ක්‍රමක්ෂය කර නොමැත.

ගිවිසුම්ගත අයිතිවාසිකම් නිරුද්ධ වූ විට හෝ කල් ඉකුත් වූ විට හෝ ගිවිසුම වෙනත් පාර්ශ්වයකට පැවරූ විට ප්‍රතිරක්ෂණ වත්කම් හඳුනා නොගනී.

එක් එක් වාර්තාකරණ දිනයේදී හෝ අපහායන පිළිබඳ ඇඟවීමක් සිදු වූ විට රක්ෂණ වත්කම් සමාලෝචනය කරනු ලැබේ. ප්‍රතිරක්ෂණ වත්කම් මුලින් හඳුනා ගැනීමෙන් පසුව සිදුවූ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වෛෂික සාක්ෂි ඇති විට, හානිය සිදුවන්නේ ගිවිසුමේ නියමයන් යටතේ සමූහයට ගෙවිය යුතු සියලු හිඟ මුදල් ලැබිය නොහැකි බවත්, එම සිදුවීම විශ්වසනීයව මැනිය හැකිනම්, බලපෑමේ අගය නැවත රක්ෂකයාගෙන් සමූහයට ලැබෙනු ඇත. හානිය ලාභය හෝ අලාභ ප්‍රකාශයේ සටහන් වේ.

### ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේවල් අපහායන තක්සේරු කිරීම

### 2018 අප්‍රේල් 1 න් පසු

ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලබන ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේවල් අලාභ දීමනා සමූහය විසින් හඳුනා ගනී. වාර්තා කරන දිනයේදී අඩු ණය අවදානමක් ඇති බවට තීරණය කර ඇති මූල්‍ය ආයෝජන හැර, සමූහයේ පාඩු දීමනාව ජීවිත කාලය හා සමාන මුදලකින් මනිනු ලැබේ.

### 2018 අප්‍රේල් 1 ට පසු

අධ්‍යක්ෂ මණ්ඩලයේ තක්සේරුව මත පදනම්ව, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කිසිදු අලාභයක් වාර්තා වී නොමැත.

## රක්ෂණ ලැබිය යුතු දේ

### 2018 අප්‍රේල් 1 න් පසු

ප්‍රතිලාභ පමණක් ප්‍රාග්ධනය සහ පොලිය නියෝජනය කරන බැවින් රක්ෂණ ලැබීම් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ පරීක්ෂණය (SPPI පරීක්ෂණය) තෘප්තිමත් කරයි. රක්ෂණ ලැබිය යුතු දේ සඳහා පොලී ගාස්තුවක් නොතිබුණද, ඒවා කෙටිකාලීන යැයි සැලකෙන බැවින් SPPI පරීක්ෂණය තෘප්තිමත් කරයි. පොළිය අය කිරීම සඳහා ණය අවදානම නොපවතී. SPPI පරීක්ෂණය අවසන් වූ පසු, කළමනාකාරීත්වය විසින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කිරීම සහ ක්‍රමෝපායික පිරිවැය යටතේ මෙවලම් මැනීම සඳහා ව්‍යාපාරයේ රඳවා තබා ගැනීමේ ව්‍යාපාර ආකෘතිය තෝරා ගන්නා ලදී. මේවා මූල්‍යමය අංගයක් නොමැතිව කෙටිකාලීන ශේෂයක් වන බැවින්, ක්‍රමක්ෂය පිරිවැය රැගෙන යාමේ වටිනාකමට සමාන වේ.

### 2018 අප්‍රේල් 1 ට පෙර

රක්ෂණ ලැබිය යුතු දේ නියමිත වේලාවට හඳුනාගෙන ඇති අතර, ලැබිය යුතු සලකා බැලීමේ සාධාරණ වටිනාකමෙන් මූලික හඳුනා ගැනීම මත මනිනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව, රක්ෂණ ලැබිය යුතු දේ ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලැබේ. සිදුවීම් හෝ තත්ත්වයන් මගින් ගෙන යන මුදල ආපසු අයකර ගත නොහැකි බව පෙන්නුම් කරන සෑම අවස්ථාවකම රක්ෂණ ලැබිය යුතු දේ රැගෙන යාමේ වටිනාකම සමාලෝචනය කරනු ලැබේ.

මූල්‍ය වත්කම් සඳහා හඳුනා ගැනීමේ නිර්ණායක සපුරා ඇති විට රක්ෂණ ලැබිය යුතු දේ හඳුනා ගනී.

## රක්ෂණ ලැබිය යුතු දේවල අපහායන හානිය තක්සේරු කිරීම

### 2018 අප්‍රේල් 1 න් පසු

සමූහය ECL ක්‍රමය මත පදනම්ව හානිකර ප්‍රතිපාදන තක්සේරු කළේය. පහත දැක්වෙන කාණ්ඩ තුනක් යටතේ හානිකර ප්‍රතිපාදන විශ්ලේෂණය කිරීම.

### 2018 අප්‍රේල් 1 ට පෙර

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 මාර්තු 31 දින වන විට රක්ෂණ ලැබිය යුතු දේවල ඇති විය හැකි හානිය අලාභය තක්සේරු කර ඇත.

## රක්ෂණය – නිෂ්පාදන වර්ගීකරණය

රක්ෂණ ගිවිසුම් යනු අවිනිශ්චිත අනාගත සිදුවීමක් (රක්ෂිත සිදුවීම්) රක්ෂණ ඔප්පු හිමියන්ට අහිතකර ලෙස බලපාන්නේ නම්, රක්ෂණ ඔප්පු හිමියන්ට වන්දි ගෙවීමට එකඟ වීමෙන් සමූහය (රක්ෂණකරු) වෙනත් පාර්ශ්වයකින් (රක්ෂණ ඔප්පු හිමියන්) සැළකිය යුතු රක්ෂණ අවදානමක් පිළිගෙන ඇතිවිට එම ගිවිසුම් වේ. සාමාන්‍ය මාර්ගෝපදේශයක් ලෙස, රක්ෂිත සිදුවීම සිදු නොවූයේ නම්, ගෙවිය යුතු ප්‍රතිලාභ සමග ගෙවන ප්‍රතිලාභ සංසන්දනය කිරීමෙන් සමූහයට සැලකිය යුතු රක්ෂණ අවදානමක් තිබේද යන්න තීරණය කරයි. රක්ෂණ ගිවිසුම් මගින් මූල්‍ය අවදානම්ද මාරු කළ හැකිය.

ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් ලෙස වර්ගීකරණය කළ පසු, මෙම කාලය තුළ රක්ෂණ අවදානම සැලකිය යුතු ලෙස අඩු වුවද, සියලුම අයිතිවාසිකම් සහ බැඳීම් නිවා කෙළවරක හෝ කල් ඉකුත් නොවන්නේ නම්, එය ජීවිත කාලය පුරාම රක්ෂණ ගිවිසුමක් ලෙස පවතී.

## ප්‍රතිරක්ෂණය

පීපල්ස් ඉන්ෂුරන්ස් පී. එල්. සී හි සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සමූහය රක්ෂණ අවදානම මගහරවා ගනී. ප්‍රතිරක්ෂණ වත්කම් ප්‍රති රක්ෂණ සමාගම් වෙතින් ගෙවිය යුතු ශේෂයන් නියෝජනය කරයි. ප්‍රතිරක්ෂණකරුවන්ගෙන් අයකර ගත හැකි මුදල තක්සේරු කර ඇත්තේ හිඟ හිමිකම් ඉල්ලීම් ප්‍රතිපාදනයට හෝ ප්‍රතිරක්ෂණකරුවන්ගේ ප්‍රතිපත්ති සහ සම්බන්ධ නිරවුල් කළ හිමිකම්වලට අනුකූල වන අතර, ඒවා අදාළ ප්‍රතිරක්ෂණ ගිවිසුමට අදාළ වේ.

වාර්තාකරණ වර්ෂය තුළ හානියක් පිළිබඳ ඇඟවීමක් ඇති වූ විට, එක් එක් වාර්තා කිරීමේදී හෝ ඊට වඩා වැඩි වාර ගණනක් ප්‍රතිරක්ෂණ වත්කම් සමාලෝචනය කරනු ලැබේ. ප්‍රතිරක්ෂණ වත්කම් මුලින් හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වෛෂයික සාක්ෂි ඇති විට, හානිය සිදු වන්නේ ගිවිසුම් නියමයන් යටතේ සමූහයට ගෙවිය යුතු සියලු හිඟ මුදල් ලැබිය නොහැකි බවත්, එම නිසා විශ්වසනීයව මැනිය හැකි බලපෑමක් ඇති කරන බවත්ය. සමූහය ප්‍රතිරක්ෂණකරුගෙන් ලැබෙනු ඇති හානිය/පාඩුව, ලාභ හෝ අලාභ ප්‍රකාශයේ සටහන් වේ.

රක්ෂිත රක්ෂණ විධිවිධාන සමූහය රක්ෂණ ඔප්පු හිමියන්ට ඇති බැඳීම් වලින් නිදහස් නොකරයි.

ප්‍රතිරක්ෂණ වගකීම් ප්‍රතිරක්ෂණ සමාගම් ශේෂයන් නියෝජනය කරයි. ගෙවිය යුතු මුදල් අදාළ ප්‍රතිරක්ෂණ කොන්ත්‍රාත්තුවට අනුකූල වන පරිදි ඇස්තමේන්තුගත කර ඇත.

වාරික සහ හිමිකම් ඉල්ලීම් ප්‍රතිරක්ෂණය සඳහා දළ පදනමක් මත ඉදිරිපත් කෙරේ.

ගිවිසුම්ගත අයිතිවාසිකම් නිරුද්ධ වූ විට හෝ කල්ඉකුත් වූ විට හෝ ගිවිසුම වෙනත් පාර්ශ්වයකට පැවරූ විට ප්‍රතිරක්ෂණ වත්කම් හෝ වගකීම් හඳුනා ගැනීම අවසන් වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



## ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ

ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ නියමිත වේලාවට හඳුනාගෙන ඇති අතර, ලැබිය යුතු හෝ ලැබිය යුතු සලකා බැලීමේ සාධාරණ වටිනාකමෙන් මූලික පිළිගැනීම මත මනිනු ලැබේ. සිදුවීම් හෝ තත්ත්වයන් මගින් රැගෙන යන මුදල ආපසු අයකර ගත නොහැකි බව පෙන්නුම්කර සෑම අවස්ථාවකදීම, රක්ෂණ ලැබිය යුතු දේ රැගෙනයාමේ වටිනාකම සමාලෝචනය කරනු ලබන්නේ ලාභයේ හෝ අලාභයේ ප්‍රකාශයේ ඇති හානිය සමගිනි.

## රක්ෂණ ලැබිය යුතු දේ

ලැබිය යුතු හෝ ලැබිය යුතු සලකා බැලීමේ සාධාරණ වටිනාකමෙන් මූලික පිළිගැනීම මත වාරික ලැබිය යුතු දේ හඳුනාගනු ලැබේ. සිදුවීම් හෝ තත්ත්වයන් මගින් රැගෙන යන මුදල ආපසු අයකරගත නොහැකි බව පෙන්නුම් කරන සෑම අවස්ථාවකදීම, රක්ෂණ ලැබිය යුතු දේ රැගෙන යාමේ වටිනාකම සමාලෝචනය කරනු ලබන්නේ ලාභයේ හෝ අලාභයේ ප්‍රකාශයේ ඇති හානිය අලාභය සමගිනි.

## විලම්බිත වියදම්

### විලම්බිත අත්පත් කරගැනීමේ පිරිවැය

කොමිස්, ප්‍රතිරක්ෂණ, අලෙවිකරණ සහ ප්‍රතිපත්ති නිකුත් කිරීමේ වියදම් ඇතුලු නව ව්‍යාපාර අත්පත් කරගැනීමේ පිරිවැය, නව ව්‍යාපාර නිෂ්පාදනයට සෘජුවම සම්බන්ධ වන අතර, අනාගත වාරිකවලින් මෙම පිරිවැය අයකරගත හැකි ප්‍රමාණයට කල් දමනු ලැබේ. අනෙක් සියලුම අත්පත් කරගැනීමේ පිරිවැය දරන විට වියදමක් ලෙස හඳුනා ගැනේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව, අනාවරණය නොවූ වාරික සංචිතය ක්‍රමක්ෂය කර ඇති පදනම මත ජීවිත නොවන රක්ෂණය සඳහා කල්දමූ අත්පත් කරගැනීමේ පිරිවැය කාලසීමාව තුළ ක්‍රමක්ෂයකර ඇත.

වත්කම් තුළ අන්තර්ගත වන අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිතයේ වෙනස්වීම් හෝ අපේක්ෂිත පරිභෝජන රටාව ක්‍රමක්ෂය කිරීමේ කාලසීමාව වෙනස් කිරීම මගින් ගණනය කරනු ලැබන අතර, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනසක් ලෙස සලකනු ලැබේ.

අදාළ ගිවිසුම් කල්ඉකුත් වූ විට හෝ අවලංගු වූ විට DAC හඳුනා ගෙන ඇත.

## ප්‍රතිරක්ෂණ කොමිස්

බාහිර ප්‍රතිරක්ෂණ මත ලැබිය යුතු කොමිස් අපේක්ෂිත වාරිකවල කාලසීමාවට සරල රේඛීය ක්‍රමයක් මත විලම්බිත හා ක්‍රමක්ෂය කර ඇත.

| මාර්තු 31 වන දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2019 රු. '000 | 2018 රු. '000 | 2019 රු. '000 | 2018 රු. '000 |
| ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ | – | – | **481,559** | 163,211 |
| රක්ෂණ ලැබිය යුතු දේ | – | – | **403,836** | 243,476 |
| **මුළු එකතුව** | – | – | **885,395** | 406,687 |

## 27 මූල්‍ය වත්කම් වෙනත් පුළුල් ආදායමක් හරහා සාධාරණ අගය අනුව/විකිණීම සඳහා පවතින

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

### 2018 අප්‍රේල් 1ට පෙර

විකිණීමට ඇති මූල්‍ය වත්කම්වලට කොටස් ආයෝජනය සහ ණය සුරැකුම් ඇතුළත් වේ. විකිණීම සඳහා ලබාගත හැකි ලෙස වර්ගීකරණය කරඇති කොටස් ආයෝජන යනු වෙළෙඳාම් සඳහා රඳවා තබා ඇති ඒවා ලෙස වර්ගීකරණය කර නොමැති අතර ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමකින් නම් කර නොමැත. මෙම කාණ්ඩයේ ණය සුරැකුම් අවිනිශ්චිත කාලයක් සඳහා පැවැත්වීමට අදහස් කරඇති අතර, ඒවා ද්‍රවශීලතාවයේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළෙඳපොල තත්ත්වයන්හි වෙනස්වීම්වලට ප්‍රතිචාර වශයෙන් විකුණනු ලැබේ.

සමූහය සහ සමාගම විකිණීම සඳහා ලබාගතහැකි ණය හෝ ලැබිය යුතු දේ නම් කර නැත.

මූලික මිනුම් කිරීමෙන් පසුව, විකිණීමට ඇති මූල්‍ය වත්කම් පසුව සාධාරණ වටිනාකමකින් මනිනු ලැබේ.

විකිණීමට ඇති සංචිතය තුළ සත්‍ය නොවන වාසි සහ අලාභ සෘජුවම කොටස්වලින් (වෙනත් විස්තීරණ ආදායම) හඳුනා ගැනේ. ආයෝජනය බැහැර කරන විට, කොටස්වල කලින් හඳුනාගෙන ඇති සමුච්චිත ලාභය හෝ අලාභය වෙනත් මෙහෙයුම් ආදායම් තුළ ලාභය හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගෙන ඇත. සමූහය/සමාගම එකම සුරක්ෂිතතාවයක ආයෝජනයකට වඩා තබා ඇති විට, ඒවා පළමුවරට බැහැර කිරීමේ පදනම මත බැහැර කරනු ලැබේ. විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් රඳවාගෙන සිටියදී උපයන ලද පොලිය එළදායී පොලී අනුපාතය භාවිතා කරමින් පොලී ආදායමක් ලෙස වාර්තා වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් රඳවා ගෙන සිටියදී උපයන ලාභාංශ, ගෙවීමේ අයිතිය තහවුරු කර ගත් විට ලාභය හෝ අලාභ ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායමක් ලෙස හඳුනා ගැනේ. එවැනි ආයෝජන අඩපණ වීමෙන් ඇති වන පාඩු ණය සහ ලැබිය යුතු දේ සහ වෙනත් අලාභ සඳහා වන අපහායන ගාස්තු හි ලාභය හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගෙන ඇති අතර ඒවා විකිණීමට ඇති සංචිතයෙන් ඉවත් කරන ලදී.

## 2018 අප්‍රේල් 1 න් පසු

මූලික පිළිගැනිම මත, සමාගම SLFRS 9 මූල්‍ය උපකරණ යටතේ හිමිකම් උපකරණ අර්ථ සපුරාලන විට සහ වෙළෙඳාම සඳහා නොපැවැත්වෙන විට FVOCI හි කොටස් උපකරණ ලෙස උපායමාර්ගික අරමුණු සඳහා තබා ඇති සමහර හිමිකම් ආයෝජන ආපසු හැරවිය නොහැකි ලෙස වර්ගීකරණය කිරීමට තෝරා ගනී. එවැනි වර්ගීකරණය උපකරණයෙන් උපකරණයට තීරණය වේ.

මෙම හිමිකම් උපකරණවල ලාභ හෝ අලාභ කිසි විටෙකත් ලාභයට හෝ අලාභයට ප්‍රතිචක්‍රීකරණය නොකෙරේ. ගෙවීමේ අයිතිය තහවුරු කර ඇති විට ලාභාංශ වෙනත් මෙහෙයුම් ආදායමක් ලෙස ලාභයෙන් හෝ අලාභයෙන් හඳුනා ගැනේ. FVOCI හි හිමිකම් උපකරණ අපහායන තක්සේරුවකට යටත් නොවේ.

මෙම උපකරණවල LKAS 39 යටතේ විකිණීම සඳහා ලබා ගත හැකි යැයි කලින් වර්ගීකරණය කර ඇති මිල කළ සහ මිල නොකළ කොටස්වලින් සමන්විත වේ.

සාධාරණ වටිනාකම් සංචිතය තුළ OCI හරහා සමානාත්මතාවයේ සත්‍ය නොවන ලාභ හෝ අලාභ හඳුනාගෙන ඇත. මෙම මූල්‍ය ආයෝජන බැහැර කරනවිට, සාධාරණ වටිනාකම සංචිතයේ කලින් හඳුනාගෙන ඇති සමුච්චිත ලාභයේ හෝ අලාභය රඳවා ගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ. මූල්‍ය වත්කම් දරමින් සිටියදී උපයන ලාභාංශ ගෙවීම් ලැබීමේ අයිතිය තහවුරු වූ විට FVOCI ආදායම ප්‍රකාශයේ මෙහෙයුම් ආදායම ලෙස හඳුනාගෙන තිබේ.

| මාර්තු 31 වන විට | සටහන | පිටු අංකය | සමාගම 2019 රු. '000 | සමාගම 2018 රු. '000 | සමූහය 2019 රු. '000 | සමූහය 2018 රු. '000 |
|---|---|---|---|---|---|---|
| හිමිකම් සුරැකුම් | 27.1 | 295 | **125,651** | 219,132 | **125,651** | 219,132 |
| **එකතුව** | | | **125,651** | 219,132 | **125,651** | 219,132 |

## 27.1 හිමිකම් සුරැකුම්පත් – සමාගම සහ සමූහය

| මාර්තු 31 වන විට | සටහන | පිටු අංකය | 2019 කොටස් ගණන | 2019 ආයෝජන පිරිවැය රු. '000 | 2019 වෙළෙඳපොළ වටිනාකම රු. '000 | 2018 කොටස් ගණන | 2018 ආයෝජන පිරිවැය රු. '000 | 2018 වෙළෙඳපොළ වටිනාකම රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| **මිල කළ ආයෝජනය** | | | | | | | | |
| සණස සංවර්ධන බැංකුව පී.එල්.සී | | | **2,094,012** | **203,382** | **125,641** | 2,036,446 | 197,253 | 219,122 |
| | | | | **203,382** | **125,641** | | 197,253 | 219,122 |
| **මිල නොකළ ආයෝජන** | | | | | | | | |
| ණය තොරතුරු කාර්යාංශය ශ්‍රී ලංකාව | 27.2 | 296 | **100** | **10** | **10** | 100 | 10 | 10 |
| සීමාසහිත සිටි ෆිනෑන්ස් කෝපරේෂන් | 27.4 | 296 | **50,000,000** | **50,000** | **–** | 50,000,000 | 50,000 | – |
| **මුළු එකතුව** | | | | **253,392** | **125,651** | | 247,263 | 219,132 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



## 27.2 තුන්වන මට්ටමේ ධූරාවලිය යටතේ මිල නොකළ කොටස් සුරැකුම්පත් සඳහා සාධාරණ අගය මැනීම සංසන්දනය කිරීම

| මාර්තු 31 වන විට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2019 රු. '000 | 2018 රු. '000 | 2019 රු. '000 | 2018 රු. '000 |
| අප්‍රේල් 1 වන විට | **10** | 10 | **10** | 10 |
| නැවත මැනීමේදී OCI ට හඳුනාගත් | **–** | – | **–** | – |
| **මාර්තු 31 වන විට ශේෂය** | **10** | 10 | **10** | 10 |

## 27.3 විකිණීමට ඇති සංචිතයේ චලනයන්

| මාර්තු 31 වන විට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2019 රු. '000 | 2018 රු. '000 | 2019 රු. '000 | 2018 රු. '000 |
| අප්‍රේල් 1 වන විට | **46,869** | 31,009 | **45,585** | 20,078 |
| සාධාරණ අගය සංචිතයට මාරු කරන ලදී | **(46,869)** | – | **(45,585)** | – |
| නැවත මැනීමේදී වාසි/(අලාභ) | **–** | 15,860 | **–** | 25,507 |
| **මාර්තු 31 වන විට ශේෂය** | **–** | 46,869 | **–** | 45,585 |

## 27.4 සීමාසහිත සිටි ෆිනෑන්ස් කෝපරේෂන්

| මාර්තු 31 වන විට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2019 රු. '000 | 2019 රු. '000 | 2019 රු. '000 | 2019 රු. '000 |
| සීමාසහිත සිටි ෆිනෑන්ස් කෝපරේෂන් හි ආයෝජනය | **50,000** | 50,000 | **50,000** | 50,000 |
| අඩු: අපහායන ප්‍රතිපාදන | **50,000** | 50,000 | **50,000** | 50,000 |
| **මාර්තු 31 වන විට ශේෂය** | **–** | – | **–** | – |

මූල්‍ය වත්කම්වල සංවේදිතා විශ්ලේෂණය – FVOCI/AFS සටහන 59.4.3 පිටු අංක 366.

## 28 ක්‍රමක්ෂය පිරිවැය යටතේ ණය උපකරණ/පරිණතිය දක්වා පවතින

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

### අප්‍රේල් 1 ට පෙර

කල් පිරෙන මූල්‍ය වත්කම් යනු ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහ ස්ථාවර කල්පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර සමූහයට සහ සමාගමට පරිණතභාවයට පත්වීමේ අභිප්‍රාය හා හැකියාව ඇත. මූලික මිනුම් වලින් පසුව, කල්පිරීමේ මූල්‍ය වත්කම් EIR භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ EIR හි අනිවාර්‍ය අංගයක් වන අත්පත් කර ගැනීම සහ ගාස්තු සඳහා වන වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගනිමිනි. ක්‍රමක්ෂය ලාභ හෝ අලාභ ප්‍රකාශයේ පොළී ආදායම තුළ ඇතුළත් කර ඇත. එවැනි ආයෝජන අඩපණ වීමෙන් ඇති වන පාඩු ණය සහ ලැබිය යුතු දේ සඳහා වන හානිකරතා ගාස්තු සහ වෙනත් අලාභ ලාභය හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

පරිණත වීමට පෙර (ඇතැම් නිශ්චිත තත්ත්වයන් හැරුණු විට) සැලකිය යුතු තරම් කල් පිරීමේ ආයෝජන සමූහයකට වඩා වැඩි ප්‍රමාණයක් සමූහය විසින් විකුණා හෝ නැවත වර්ගීකරණය කරන්නේ නම්, සමස්ත කණ්ඩායම විකිණීම සඳහා පවතින අයිතමය සඳහා නැවත වර්ගීකරණය කරනු ලැබේ. තවද, ඉදිරි වසර දෙක තුළ කිසියම් මූල්‍ය වත්කමක් කල් පිරෙන පරිදි වර්ගීකරණය කිරීම සමූහයට තහනම් වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## පරිණතභාවයට පත් වීමේ අභිප්‍රාය සහිත මූල්‍ය වත්කම්වල අපහායන

ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලබන රඳවා තබා ගැනීමේ සිට කල්පිරීම දක්වා වූ මූල්‍ය වත්කම්වල හානිය අලාභය ගණනය කරනු ලබන්නේ එහි රැගෙන යන මුදල සහ වත්කම්වල මුල් EIR හි වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස වන අතර එය ලාභ හෝ අලාභ ප්‍රකාශයේ පිළිගැනීමට ලක් වේ. අපහානියට ලක් වූ වත්කම්වල පොලිය අඛණ්ඩව ලිහිල් කරන ලද වට්ටම් අනුපාතයක් ඔස්සේ හඳුනාගැනේ. පසුකාලීන සිදුවීමක් මගින් හානිය අලාභයේ ප්‍රමාණය අඩුවීමට හේතු වූ විට, හානිය නැතිවීම අඩුවීම ලාභය හෝ අලාභ ප්‍රකාශය මගින් ආපසු හරවනු ලැබේ.

## 2018 අප්‍රේල් 1 න් පසු

SLFRS 9 ට අනුව "මූල්‍ය ආයෝජන" පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ එය FVTPL යටතේ නම් කර නොමැති නම්, ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ.

- වත්කම් රඳවාගෙන ඇත්තේ ව්‍යාපාරික ආකෘතියක් තුළ වන අතර එහි අරමුණ වන්නේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා වත්කම් තබා ගැනීම. සහ,
- මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනයන් හි මුදල් ප්‍රවාහයන් සඳහා මූලික හා පොළී ගෙවීම් පමණක් ලබා දෙයි නම්,

මූලික ගිණුම්වලින් පසුව, මේවා පසුව ක්‍රමක්ෂව පිරිවැයෙන් මනිනු ලැබේ. (EIR භාවිතා කරමින් දළ ධාරණ අගය, අපහායනය සඳහා ප්‍රතිපාදන ගැලපුම්කොට) ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීම සඳහා සහ ගාස්තු පිරිවැය පිළිබඳ කිසියම් වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගෙන පාරිසරික බලපෑම් තක්සේරුකරණයේ අනිවාර්යය අංගයකිනි. ක්‍රමක්ෂය "පොලී ආදායම" තුළට ඇතුළත් කර ඇති අතර, හානිය නිසා ඇති වන පාඩු ආදායම් ප්‍රකාශයේ " ණය හා වෙනත් අලාභ සඳහා වන අයකිරීම් ගාස්තු" මගින් හඳුනාගෙන ඇත.

| මාර්තු 31 වන විට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2019 රු. '000 | 2018 රු. '000 | 2019 රු. '000 | 2018 රු. '000 |
| භාණ්ඩාගාර බිල්පත් | **7,976,782** | 4,864,258 | **9,066,102** | 5,988,580 |
| භාණ්ඩාගාර බැඳුම්කර | **25,843** | 25,383 | **25,843** | 25,383 |
| **මුළු එකතුව** | **8,002,625** | 4,889,641 | **9,091,945** | 6,013,963 |
| සාධාරණ වටිනාකම | **8,007,001** | 4,886,099 | **9,096,321** | 6,010,421 |

## 29 පාලිත සමාගම්වල ඇති ආයෝජනය

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

පාලිත සමාගම්වල ආයෝජනය පිරිවැය අනුව සඳහන් කර ඇත. මූල්‍ය ප්‍රකාශනවල ලාභය හෝ අලාභ ප්‍රකාශය සඳහා අය කරනු ලබන කිසියම් හානියක් දළ වශයෙන් උප සමාගම්වල ආයෝජන සඳහන් වන අතර එය ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිතිය වන LKAS 27 අනුකූලව ඒකාබද්ධ හා වෙනම මූල්‍ය ප්‍රකාශන අනුව වේ.

පාලිත සමාගම් යනු සමූහය/සමාගම විසින් පාලනය කරනු ලබන ආයතන වේ. සමාගම වෙත පාලනය පැවරූ දින සිට පාලිත සමාගම් ඒකාබද්ධ වන අතර එම පාලනය නතර වන දිනය දක්වා අඛණ්ඩව ඒකාබද්ධ වේ. ආයෝජකයෙකු නිරාවරණය වූ විට හෝ නිවැරදි වූ විට, ආයෝජකයා සමග ඇති සම්බන්ධතාවයෙන් විචල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමට සමාගම අනුමාන කරනු ලබන අතර ආයෝජකයා කෙරෙහි ඇති බලය තුළින් එම ප්‍රතිලාභ කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාව ඇත.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අන්තර් සමූහ ශේෂයන් සහ ගනුදෙනු, ආදායම, වියදම් සහ අභ්‍යන්තර කණ්ඩායම් ගනුදෙනු වලින් පැන නගින කිසියම් සත්‍ය නොවන ලාභයක් සම්පූර්ණයෙන් ඉවත් කරනු ලැබේ.

පාලනය නොකරන පාර්ශ්වය අභිලාෂයන් නියෝජනය කරන්නේ සමාගමට සෘජුව හෝ වක්‍රව අයත් නොවන උප සමාගම්වල ලාභය හෝ අලාභය සහ ශුද්ධ වත්කම්ය.

පාලනය නොකෙරෙන පාර්ශ්වයන් වෙන වෙනම ඉදිරිපත් කරනු ලබන්නේ ඒකාබද්ධ ලාභය හෝ අලාභ ප්‍රකාශය සහ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සමානාත්මතාවය තුළ වන නමුත් මව් කොටස්හිමියන්ගේ කොටස්වලින් වෙන්ව පාලනය නොකිරීමේ අවශ්‍යතාවන්ට අදාළ වන ඕනෑම අලාභයක් හිග ශේෂයක් ඇති වුව ද පාලනය නොකරන පොළියේ අවශ්‍යතාවන්ට එරෙහිව වෙන් කරනු ලැබේ. පාලනය නොකරන ලද ඇල්ම අත්පත් කර ගැනීම මව් ආයතන ව්‍යාප්ති ක්‍රමය භාවිතා කිරීම සඳහා ගණනය කරනු ලබන අතර, එමගින් අත්පත් කරගත් ශුද්ධ වත්කම්වල කොටසෙහි සලකා බැලීම සහ සාධාරණ වටිනාකම අතර වෙනස හිමිකම ලෙස හඳුනා ගැනේ.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහිත උප සමාගම් ලැයිස්තුවක් සටහන 1.2 හි දක්වා ඇත.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



| මාර්තු 31 වන විට | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | හිමිකාරිත්වය % | පිරිවැය රු. '000 | අධ්‍යක්ෂවරුන්ගේ /වෙළෙඳපොළ තක්සේරුව රු. '000 | හිමිකාරිත්වය % | පිරිවැය රු. '000 | අධ්‍යක්ෂවරුන්ගේ /වෙළෙඳපොළ තක්සේරුව රු. '000 |
| **සමාගම** | | | | | | |
| පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | **100.00** | **175,000** | **300,728** | 100.00 | 175,000 | 294,296 |
| පීපල්ස් ලීසිං ප්‍රොපටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් | **100.00** | **550,000** | **991,679** | 100.00 | 550,000 | 1,073,975 |
| පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | **100.00** | **600,000** | **492,817** | 100.00 | 600,000 | 571,580 |
| පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් | **100.00** | **150,000** | **212,983** | 100.00 | 150,000 | 227,316 |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පී. එල්. සී | **75.00** | **600,000** | **2,955,000** | 75.00 | 600,000 | 2,261,894 |
| ලංකා එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් | **51.00** | **1,138,788** | **1,213,996** | 51.00 | 1,138,788 | 1,040,807 |
| **මුළු එකතුව** | | **3,213,788** | **6,167,203** | | 3,213,788 | 5,469,868 |

පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී හැරෙන්නට කොළඹ කොටස් හුවමාරුවේ උප සමාගම් සඳහන් නොවේ. අධ්‍යක්ෂවරුන්ගේ උප සමාගම්වල ආයෝජන ඇස්තමේන්තුව තක්සේරු කිරීම ශුද්ධ වත්කම් පදනම මත සිදු කර ඇත. පීපල්ස් ඉන්ෂුවරන්ස් පී. එල්. සී හි තක්සේරුව වෙළෙඳපොළ වටිනාකම අනුව අගය කර ඇත.

පහත දැක්වෙන වගුවේ සාරාංශගත වන්නේ ප්‍රමාණික පාලනය කළ නොහැකි හිමිකම් (NCI) ඇති සමූහයේ අනුබද්ධිත ආයතනයකට අදාළ තොරතුරුය.

| මාර්තු 31 න අවසන් වූ වර්ෂය සඳහා | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී | ලංකා එලායන්ස් ෆිනෑන්ස් | මුළු එකතුව | පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී | ලංකා එලායන්ස් ෆිනෑන්ස් | මුළු එකතුව |
| පාලනය නොකරන හිමිකම් (NCI) ප්‍රතිශත | **25** | **49** | | 25 | 49 | |
| | රුපියල් '000 | රුපියල් '000 | රුපියල් '000 | රුපියල් '000 | රුපියල් '000 | රුපියල් '000 |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | **5,609,003** | **278,774** | **5,887,777** | 4,920,502 | 36,751 | 4,957,253 |
| අඩු මෙහෙයුම් වියදම | **4,803,207** | **190,662** | **4,993,869** | 4,056,794 | 17,991 | 4,074,785 |
| ආදායම් බද්දට පෙර ලාභය | **805,796** | **88,112** | **893,908** | 863,708 | 18,760 | 882,468 |
| අඩු ආදායම් බදු වියදම | **148,287** | **20,125** | **168,412** | 95,625 | 857 | 96,482 |
| බදුවලින් පසු ලාභය | **657,509** | **67,987** | **725,496** | 768,083 | 17,903 | 785,986 |
| පාලනය නොකරන හිමිකම් (NCI) සඳහා වෙන් කරන ලද ලාභය | **164,376** | **33,314** | **197,690** | 192,021 | 8,772 | 200,793 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| මාර්තු 31 වන විට | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | පීපල්ස් ඉන්ෂුරන්ස් පී. එල්. සී රු. '000 | ලංකා එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් රු. '000 | මුළු එකතුව රු. '000 | පීපල්ස් ඉන්ෂුරන්ස් පී. එල්. සී රු. '000 | ලංකා එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් රු. '000 | මුළු එකතුව රු. '000 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | **946,851** | **23,759** | **970,610** | 313,648 | 10,948 | 324,596 |
| බැංකු හා මූල්‍ය ආයතන සමග ශේෂයන් | **3,269,112** | **1,084,919** | **4,354,031** | 2,660,287 | 2,023,265 | 4,683,552 |
| ණය සහ ලැබිය යුතු දේ | **2,282,413** | **2,572,618** | **4,855,031** | 1,658,288 | – | 1,658,288 |
| රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ | **1,491,238** | **–** | **1,491,238** | 1,015,106 | – | 1,015,106 |
| මූල්‍ය වත්කම් වෙනත් සංයුක්ත ආදායම් හරහා සාධාරණ වටිනාකම/විකිණීමට ඇත | **1,089,320** | **–** | **1,089,320** | 1,124,322 | – | 1,124,322 |
| දේපල, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් | **83,660** | **28,335** | **111,995** | 89,545 | 21,786 | 111,331 |
| වෙනත් වත්කම් | **462,525** | **106,558** | **569,083** | 816,608 | 52,946 | 869,554 |
| **මුළු වත්කම්** | **9,625,119** | **3,816,189** | **13,441,308** | 7,677,804 | 2,108,945 | 9,786,749 |
| බැංකු සඳහා ගෙවිය යුතු | **611,013** | **343,629** | **954,642** | 106,944 | – | 106,944 |
| පාරිභෝගිකයන් සඳහා ගෙවිය යුතු | **–** | **1,014,310** | **1,014,310** | – | – | – |
| වෙනත් මූල්‍ය වගකීම් | **617,231** | **77,866** | **695,097** | 341,690 | 70,974 | 412,664 |
| වෙනත් වගකීම් | **156,933** | **–** | **156,933** | 97,628 | – | 97,628 |
| ගෙවිය යුතු රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ වගකීම් | **4,944,373** | **–** | **4,944,373** | 4,115,681 | – | 4,115,681 |
| සම්පූර්ණ වගකීම් | **6,329,550** | **1,435,805** | **7,765,355** | 4,661,943 | 70,974 | 4,732,917 |
| **ශුද්ධ වත්කම් වටිනාකම** | **3,295,569** | **2,380,385** | **5,675,954** | 3,015,861 | 2,037,971 | 5,053,832 |
| **පාලනය නොකරන හිමිකම් (NCI) වල ධාරණ අගය** | **823,892** | **1,166,389** | **1,990,281** | 753,965 | 998,606 | 1,752,571 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ගලා ඒම | **309,713** | **(1,417,299)** | **(1,107,586)** | 1,102,330 | 2,245 | 1,104,575 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගලා ඒම | **(426,258)** | **(20,243)** | **(446,501)** | 765,376 | (16,531) | 748,845 |
| මූල්‍ය කටයුතුවලින් මුදල් ගලා ඒම | **(21,023)** | **1,012,138** | **991,115** | (350,000) | (490) | (350,490) |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම** | **(137,568)** | **(425,404)** | **(562,972)** | 1,517,706 | (14,776) | 1,502,930 |

## 30 ආශ්‍රිත සමාගම්වල ඇති ආයෝජන

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ආශ්‍රිත සමාගම්වල ආයෝජන මූල්‍ය ප්‍රකාශනවල පිරිවැයට සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හිමිකම් ක්‍රමය යටතේ ගණනය කෙරේ.

හිමිකම් ක්‍රමය යටතේ, ආයෝජන මුලින් ගණනය කරනු ලබන්නේ පිරිවැය අනුව වන අතර, සමාගමේ ආශ්‍රිතවල ශුද්ධ වත්කම්වල සමාගමේ කොටස්වල පශ්චාත් අත්පත් කර ගැනීමේ වෙනස්කම් සඳහා රැගෙන යන මුදල සකස් කරනු ලැබේ. සහ ආශ්‍රිත සමාගමේ ශුද්ධ ආයෝජනයේ අපහායන හානියක් ඇති නම් අඩු වේ.

ආශ්‍රිත යනු සමාගමට සැලකිය යුතු බලපෑමක් ඇති නමුත් මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්ති මත පාලනයක් නොමැති ආයතනයකි. වෙනත් ආයතනයක ඡන්ද බලයෙන් 20% හෝ ඊට වැඩි ප්‍රමාණයක් සමාගම සතුව ඇති විට සැලකිය යුතු බලපෑමක් ඇතැයි අනුමාන කෙරේ.

ආශ්‍රිත සමාගම්හි ආයෝජනය කරනු ලබන්නේ හිමිකම් ක්‍රමවේදය භාවිතා කිරීම සඳහා වන අතර එය මුලින්ම පිරිවැය යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය වන LKAS 28 අනුව "ආශ්‍රිත සහ හවුල් ව්‍යාපාරවල ආයෝජන" යටතේ ගිණුම්ගත කෙරේ. ආශ්‍රිතයෙකු සම්බන්ධ කීර්ති නාමය ආයෝජනය රැගෙන යන ප්‍රමාණයට ඇතුළත් කර ඇති අතර එය ක්‍රමක්ෂය කර නොමැති නමුත් හානිකරතා පරීක්ෂණයට භාජනය වේ. සමාගමේ ආයෝජන අතර අත්පත් කර ගැනීමේදී හඳුනාගත් කීර්තිනාමය, සමුච්චිත අපහායන හානිය සමග ශුද්ධ වේ.

සැලකිය යුතු බලපෑමක් එළදායී ලෙස ආරම්භ වන දින සිට සැලකිය යුතු බලපෑමක් එළදායී ලෙස නතර වන දිනය දක්වා සමූහයේ ප්‍රතිපත්ති සමග ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙළගැස්වීම සඳහා සිදු කරන ලද ගැලපීම් වලින පසුව, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සමාගමේ ආදායම, වියදම සහ හිමිකමේ කොටස ඇතුළත් කෙරේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



සමාගමේ පාඩු කොටස ආශ්‍රිත සමාගම කෙරෙහි ඇති උනන්දුව ඉක්මවා ගියවිට, එහි හිමිකම් වල ධාරණ අගය ශුන්‍යය දක්වා අඩුවන අතර සමාගමට බැඳීමක් ඇති හෝ ආශ්‍රිතය වෙනුවෙන් ගෙවීම් කළ ප්‍රමාණය හැරෙන්නට තවදුරටත් පාඩු හඳුනා ගැනීම අත්හිටවනු ලැබේ. ආශ්‍රිතය පසුව ලාභ වාර්තා කරන්නේ නම්, සමාගම නැවත එම ලාභයේ කොටස හඳුනා ගැනීම ආරම්භ කරන්නේ එහි ලාභයේ කොටස හඳුනා නොගත් පාඩු වලට සමාන වූ පසුවය.

සමාගම සහ ආශ්‍රිතයා අතර ගනුදෙනු හේතුවෙන් ඇතිවන ලාභය සහ අලාභයන් ආශ්‍රිතහි හිමිකම් ප්‍රමාණයෙන් ඉවත් කරනු ලැබේ. "මූල්‍ය උපකරණ පිළිගැනීම සහ මිනුම" පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය වන LKAS 39 ට අනුකූලව, ආශ්‍රිතයෙකුට සැළකිය යුතු බලපෑමක් කිරීම නවතාදැමූ දින සිට සමාගම විසින් හිමිකම් ක්‍රමය භාවිතා කිරීම නවතා දමයි.

## 30.1 ආශ්‍රිත සමාගම් විස්තර

| මාර්තු 31 වන විට | හිමිකාරිත්වය | | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| | **2019 %** | 2018 % | **2019 රු. '000** | 2018 රු. '000 | **2019 රු. '000** | 2018 රු. '000 |
| **මිළ කළ හිමිකම් සුරකුම්** | | | | | | |
| පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී. එල්. සී. (25,014,002 සාමාන්‍ය කොටස්) | 37.06 | 37.06 | **237,633** | 586,427 | **237,633** | 423,439 |
| **මුළු එකතුව** | | | **237,633** | 586,427 | **237,633** | 423,439 |

| මාර්තු 31 වන විට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | **2019 රු. '000** | 2018 රු. '000 | **2019 රු. '000** | 2018 රු. '000 |
| **සාරාංශගත මූල්‍ය තොරතුරු සංසන්දනය** | | | | |
| ආයෝජන පිරිවැය | **586,427** | 586,427 | **586,427** | 586,427 |
| **සමූහයට අදාළවන අලාභයේ කොටස** | | | | |
| අප්‍රේල් 1 දක්වා (අලාභයේ) කොටස | **–** | – | **(162,988)** | (110,046) |
| **වර්ෂය තුළ හඳුනාගත් මුළු කොටස** | | | | |
| (අලාභය)/වර්ෂය සඳහා ලාභ අලාභ ප්‍රකාශයේ හඳුනාගත්, බදු ශුද්ධ | **–** | – | **(33,234)** | (52,942) |
| වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගත අපහායන හානිය | **(348,794)** | – | **(152,572)** | – |
| **මුළු එකතුව** | **237,633** | 586,427 | **237,633** | 423,439 |

## පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී.

පීපල්ස් ලීසිං ඇන්ඩ් පී.එල්.සී. (සමාගම) සමග පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී. ඒකාබද්ධ කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණ මණ්ඩලය විසින් නිකුත් කරන ලද නියෝගයකට අනුව, සමාගම විසින් ඒ පිළිබඳව 2016 ජූලි 29 වන දින කොළඹ කොටස් වෙළඳපොලට නිවේදනයක් නිකුත් කළේය.

2018 මැයි 10 දිනැති අනාවරණයට අමතරව, පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 ජනවාරි 10 වන දින අනාවරණය කරනලද පරිදි පුද්ගලික ස්ථානගත කිරීමක් සහ හිමිකම් නිකුතුවක් මගින් ප්‍රාග්ධනීකරණය කිරීමට තීරණයකර ඇත. ඒ අනුව පූර්ව නිවේදනවලින් හෙළි වූ පරිදි පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී. හා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. යෝජිත ඒකාබද්ධ කිරීම සිදු නොවේ.

එහි ප්‍රතිව්‍යුහගත කිරීමේ ව්‍යායාමයේ අනිවාර්‍ය අංගයක් වන පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී. (පී.එම්.එෆ්.) නැවත ප්‍රාග්ධනීකරණය සඳහා නව ආයෝජකයෙකු සාර්ථකව ලබාගෙන ඇත. නව ප්‍රාග්ධන මුදල් සම්භාරය නුදුරු කාලීනව සිදුවනු ඇතැයි අපේක්ෂා කරන අතරම, එය අනිවාර්‍යයෙන් සමාගමේ බලපෑම් කරන කොටස් 37.06% සිට 20.0% දක්වා අඩුකරනු ඇත. එම ගනුදෙනුව දැනට වෙනත් විධිමත් භාවය සඳහා ඉතිරිව තිබේ.

## අපහායන හානිය පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී.

2018/19 කාලය තුළ සමාගම විසින් හඳුනාගත් අපහායන හානිය රු. 348,793,939ක් වන අතර එය පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී. හි ආයොජනය සඳහා අදාළ වන එහි ඇස්තමේන්තුගත ආපසු අයකර ගත හැකි මුදල ඉක්මවා යන වටිනාකම මත පදනම්වේ. අයකරගත හැකි මුදල එහි සාධාරණ වටිනාකමට වඩා ඉහළ අගයක් වන අතර බැහැර කිරීමේ පිරිවැය හා භාවිතයේ වටිනාකම අඩුය. මෙම සන්දර්භය තුළ, අනාගත ආයෝජකයා සමග එකඟ වූ පරිදි එක් කොටසකට මිලදී ගැනීමේදී සලකා බැලීම මත පදනම්ව එම ආයෝජනයේ සාධාරණ වටිනාකමක් ලබාගත් බව පෙන්වාදිය යුතුය.

## 30.2 ආශ්‍රිතයන්හි මූල්‍ය තොරතුරු සාරාංශගත කිරීම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණවල හඳුනාගෙන ඇති ආශ්‍රිතය සඳහා හිමිකම් රැගෙනයාම සඳහා සාරාංශගත මූල්‍ය තොරතුරු පහත පරිදිවේ.

| මාර්තු 31න් අවසන් වූ වර්ෂය සඳහා | පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී. ප්‍රතිශතය - 37.06% | |
|---|---|---|
| | **2019** **රු. '000** | 2018 රු. '000 |
| **හිමිකාරීත්වය පිළිබඳ ඇල්ම** | | |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | **191,294** | 94,056 |
| අඩු මෙහෙයුම් ආදායම | **280,976** | 236,920 |
| බදුවලට පෙර ආදායම | **(89,682)** | (142,864) |
| අඩු ආදායම් බදු වියදම | **–** | – |
| බදුවලින් පසු පාඩුව | **(89,682)** | (142,864) |
| හිමිකම් ගිණුම්කරණයේ ප්‍රතිඵල ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගත් කොටස | **(33,234)** | (52,942) |

| මාර්තු 31 වනවිට | පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී.එල්.සී. ප්‍රතිශතය - 37.06% | |
|---|---|---|
| | **2019** **රු. '000** | 2018 රු. '000 |
| **හිමිකාරීත්වය පිළිබඳ ඇල්ම** | | |
| මුළු වත්කම් | **2,901,471** | 2,938,139 |
| මුළු වගකීම් | **2,750,028** | 2,717,234 |
| ශුද්ධ වත්කම් | **151,443** | 220,905 |
| ශුද්ධ වත්කම්වල සමූහයේ කොටස | **56,120** | 81,861 |

## 31 ආයෝජන දේපළ

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ආයෝජන දේපළ යනු කුළී ආදායම උපයා ගැනීම සඳහා හෝ ප්‍රග්ධන අගය වැඩිවීම සඳහා හෝ දෙකම සඳහා තබාඇති දේපළකි. නමුත් සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීම සඳහා, භාණ්ඩ හෝ සේවා නිශ්පාදන හෝ සැපයුම සඳහා හෝ පරිපාලනමය අරමුණු සඳහා භාවිතා නොවන දේපළය.

ආයෝජන දේපළ මුලින් හඳුනාගනු ලබන්නේ පිරිවැය අනුසාරයෙන් මූලික හඳුනා ගැනීමෙන් පසුව, ආයෝජන දේපළ මූල්‍ය ප්‍රකාශයේ දිනට වෙළෙඳපොල තත්ත්වයන් පිළිබිඹු කරන සාධාරණ අගය මත ප්‍රකාශ කරනු ලැබේ. සාධාරණ වටිනාකමේ වෙනස්වීම් හේතුවෙන් ඇතිවන වාසි හෝ අලාභ ඒවා පැන නගින වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශයට ඇතුළත්වේ.

සමූහ සමාගමේ අනුබද්ධිත ආයතනයක ආයෝජන දේපළෙන් සැළකිය යුතු කොටසක් අත්පත්කර ගන්නාවිට, එම ආයෝජන දේපළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණවල දේපළ, පිරියත සහ උපකරණ ලෙස සලකනු ලබන අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 අනුව ගිණුම්ගත කෙරේ. LKAS 16 - "දේපළ, පිරියත සහ උපකරණ"

## ඉවත් කිරීම

ආයෝජන දේපළ බැහැරකර ඇතිවිට හෝ ආයෝජන දේපළ ස්ථිර ලෙස භාවිතයෙන් ඉවත්කර ගන්නාවිට සහ අනාගත ආර්ථික ප්‍රතිලාභයක් බලාපොරොත්තු නොවන බව හඳුනාගෙන ඇතිවිට ආයෝජන දේපළ හඳුනාගැනීම නොකරයි. ආයෝජන දේපළක් විශ්‍රාම යාමෙන් හෝ බැහැර කිරීමෙන් ලැබෙන වාසි හෝ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

## පසුව ආයෝජන දේපළ සිට/වෙත මාරු කිරීම

ආයෝජන දේපළ සඳහා මාරුවීම් සිදුකරනු ලබන්නේ, භාවිතයේ වෙනසක් සිදු වූ විට පමණක්වන අතර, හිමිකරුගේ පදිංචිය අවසන්වීම, වෙනත් පාර්ශවයකට මෙහෙයුම් කල්බදු ක්‍රමයකත් ආරම්භ කිරීම හෝ ඉදිකිරීම් හෝ සංවර්ධනය සම්පූර්ණවීම යන සාධක මතවේ.

මාරුවීම් සිදු කරනු ලබන්නේ ආයෝජන දේපළවල භාවිතයේ වෙනසක් සිදු වූ විට පමණක් සහ හිමිකරුගේ පදිංචිය ආරම්භ කිරීම හෝ විකිණීමේ අදහසින් සංවර්ධනය ආරම්භ කිරීම යන සාධක මතවේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



ආයෝජන දේපළෙන් හිමිකරු උපයෝජනය කරමින් සිටින දේපලවලට හෝ භාණ්ඩ වෙත මාරුවීමක් සඳහා, පසුකාලීන ගිණුම්කරණ සඳහා සළකනු ලබන දේපළ පිරිවැය භාවිතයේ වෙනස්වන දිනයේ එහි සාධාරණ වටිනාකම ලෙස සලකයි. සමාගම විසින් හිමිකාරීත්වය දරන දේපළක් ආයෝජන දේපළක් බවට පත්වුවහොත්, සමාගම, දේපළ, පිරියත සහ උපකරණ යටතේ වෙනස්වන දිනය දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව එම දේපළ සඳහා ගිණුම්ගත කරයි.

භාණ්ඩවලින් ආයෝජන දේපළ වෙත මාරුවීමක් සඳහා, එදින දේපළෙහි සාධාරණ වටිනාකම සහ එහි පෙර රැගෙනයන මුදල අතර වෙනසක් ඇතිනම් ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගනු ඇත. සමාගම විසින් තනන ලද ආයෝජන දේපළක් ඉදිකිරීම හෝ සංවර්ධනය කිරීම සම්පූර්ණ කළවිට, එදින දේපළෙහි සාධාරණ වටිනාකම සහ එහි පෙර රැගෙනයන මුදල අතර වෙනසක් ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනා ගැනේ.

## ආයෝජන දේපළවල සාධාරණ වටිනාකම

සමූහයේ සහ සමාගමේ ආයෝජන දේපළ සාධාරණ වටිනාකමකින් පිළිබිඹුවේ. සමාන වත්කම්වල වර්තමාන වෙළඳපොළ මිළ ගණන් පවතිනවිට, මෙම වත්කම්වල සාධාරණ අගයන් තක්සේරු කිරීමේදී එවැනි සාක්ෂි සළකා බලනු ලැබේ. එවැනි තොරතුරු නොමැතිවිට, සමූහය සහ සමාගම යුක්තිසහගත ලෙස සාධාරණ වටිනාකම් ඇස්තමේන්තු තුළ තීරණය කරනු ලැබේ. සාධාරණ වටිනාකම් ලෙස ආරෝපණයකළහැකි මුදල්, ඇස්තමේන්තු මත පදනම් වූ වට්ටම්කළ මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපණයන් සැළකිල්ලට ගනිමින් වර්තමාන වෙළඳපොළ වැනි සාක්ෂිවලින් ලබාගත් ඒවා වේ. සමාන දේපළ සඳහා කුලී සහ මුදල් ප්‍රවාහවල ප්‍රමාණය හා කාලය පිළිබඳ අවිනිශ්චිතතාව පිළිබිඹු කරන වට්ටම් අනුපාත භාවිතා කිරීම.

## සාධාරණ වටිනාකම තීරණය කිරීම

බාහිර හා ස්වාධීන තක්සේරුකරුවන්, සුදුසු පිළිගත් වෘත්තීය සුදුසුකම් සහ දේපළවල වටිනාකම සහ වටිනාකම පිළිබඳ මෑතකාලීන අත්දැකීම් ඇති, සෑම වසරකම ආයෝජන දේපළ කළඹ අගය කරයි. එම කාල සීමාව තුළ මූල්‍ය කාලපරිච්ඡේදයන්හිදී සාධාරණ වටිනාකම තීරණය වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.

සාධාරණ අගයන් පදනම් වන්නේ වෙළඳපොළ වටිනාකම්මත වන අතර, මිනුම් දිනයේදී වෙළඳපොළ සහභාගීවන්නන් අතර විධිමත් ගනුදෙනුවකදී දේපළක් විකිණිය හැකි ඇස්තමේන්තුගත මුදලවේ.

## සමූහය තුළ බඳු දී ඇති ආයෝජන දේපළ

මව් හෝ උප සමාගමකට බදු දී ඇති ඕනෑම දේපළක් සමූහයේ දෘෂ්ටි කෝණයෙන් හිමිකරු විසින් සලකනු ලබන අතර ඒකාබද්ධ කිරීමේ අරමුණු සඳහා ගැලපීම් සිදුකරනු ලැබේ.

## හිමිකරු උප උපයෝජනය කරමින් සිටින දේපළ සහ ආයෝජන දේපළ

දේපළක් ආයෝජන දේපළක් ලෙස සුදුසුකම් ලබන්නේද යන්න තීරණය කිරීමේදී සමූහය/සමාගම විසින් දේපළ පමණක් නොව වෙනත් වත්කම්ද ආරෝපණය කළහැකි මුදල් ප්‍රවාහයන්ට වඩා දේපළ ස්වාධීන මුදල් ප්‍රවාහයක් ජනනය කරන්නේද යන්න තීරණය කරයි. දේපළක් ආයෝජන දේපළක් ලෙස සුදුසුකම් නොලබන්නේ ද යන්න තීරණය කිරීමේදී සහායක සේවාවන් වැදගත්ද යන්න අදාළ වේ.

| මාර්තු 31 වන විට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | **2019** රු. '000 | 2018 රු. '000 | **2019** රු. '000 | 2018 රු. '000 |
| අප්‍රේල් 01 වන විට ශේෂය | **134,400** | 100,800 | **1,265,996** | – |
| සාධාරණ අගය ගැලපීමෙන් ලබාගන්නා ප්‍රතිලාභ | **–** | 33,600 | **–** | 311,422 |
| චේතනාව වෙනස්වීම නිසා ගැලපීම | **–** | – | **–** | 29,652 |
| ආයෝජන දේපළ විකිණීමෙන් ලැබෙන ආදායම | **(134,400)** | | **(134,400)** | – |
| වර්ෂය තුළ මාරු කිරීම | **–** | – | **–** | 924,922 |
| **මාර්තු 31 වන විට ශේෂය** | **–** | 134,400 | **1,131,596** | 1,265,996 |

කොළඹ 7 හි හැව්ලොක් පාරේ අංක 7 සහ 9 හි ඉඩම් හා ගොඩනැගිල්ල පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපටීස් ලිමිටඩ් විසින් මහජන බැංකුව, පීපල්ස් ඉන්ෂුවරන්ස් පී. එල්. සී. සහ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. වෙත කුළියට දෙනු ලැබේ. සමූහ මූල්‍ය ප්‍රකාශණවල, එවැනි දේපළ වෙන්වී ඇති අතර මහජන බැංකුවට කුළියටගත් කොටසක් සමූහයට ආයෝජනය දේපළ ලෙස වර්ගීකරණයකර ඇත. වෙන් කිරීම සඳහා පදනම වර්ග අඩි ගණන මත පදනම් වේ.

සමාගම ආයෝජන දේපළ වෙළඳපළ වටිනාකමට ගෙන යයි. ඉහත ආයෝජන දේපළවල වෙළඳපළ තක්සේරුව 2018 දෙසැම්බර් 31 දින වනවිට සමාගම සමග සම්බන්ධ නොවූ ස්වාධීන තක්සේරුකරුවෙකු වන කේ.ටී.ඩී. තිසෙරා, FRICS (ENG) විසින් සිදුකරයි.

ඉහත ආයෝජන දේපළ සම්බනධයෙන් හඳුනාගන්නා ලද කුළී ආදායම සටහන 10හි දක්වා ඇත.

## 32 දේපළ, පිරියත සහ උපකරණ

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

### හඳුනාගැනීමේ පදනම

දේපළ, පිරියත සහ උපකරණ යනු සේවා සඳහා පරිපාලනමය අරමුණු සඳහා තබාඇති ස්පර්ශ්‍ය අයිතම වන අතර ඒවා වසරකට වැඩි කාලයක් තුළ භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා යාහැකි අතර වත්කම්වල පිරිවැය විශ්වාසනීයව මැනිය හැකිනම් දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගැනේ.

### මිනුම් කිරීමේ පදනම

වත්කමක් ලෙස පිළිගැනීමට සුදුසුකම් ලබන දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් මුලින් මනිනු ලබන්නේ එහි පිරිවැයට වේ. පිරිවැයට වතක්ම් අත්පත්කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය වන වියදම් සහ එහි කොටසක් එකතු කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන පිරිවැය ඇතුළත්වේ. ස්වයං සාධන ලද වත්කම්වල පිරිවැය ද්‍රව්‍යවල පිරිවැය සහ සෘජු ශ්‍රමය ඇතුළත්වේ. වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්ත්වයකට ගෙනඒමට සෘජුවම ආරෝපණය කළහැකි වෙනත් වියදම් සහ භාණ්ඩ විසුරුවාහැර ඉවත් කිරීම හා ඒවා ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ඇතුළත්වේ. ණය ලබාගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය කර ඇත. අදාළ උපකරණවල ක්‍රියාකාරීත්වයට අත්‍යවශ්‍ය වන මිලදී ගත් මෘදුකාංග පරිගණක උපකරණවල කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරඇත.

දේපළ, පිරියත සහ උපකරණවල කොටස්වලට විවිධ ප්‍රයෝජනවත් ජීවිත ඇතිවිට, ඒවා දේපළ, පිරියත සහ උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන කොටස්) ලෙස ගණන් ගැනේ.

සමාගම සහ සමූහය විසින් පිරිවැය ආකෘතිය යටතේ දේපළ, පිරියත සහ උපකරණ වාර්තා කරයි නම් මිළදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සමග අදාළ වෙනත් වියදම් සහ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිවීම් පාඩු අඩු කරනු ලැබේ.

### පසු පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය අයිතමය රැගෙන යන ප්‍රමාණයෙන් හඳුනාගෙන තිබේ නම්, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලාඒමට ඉඩඇති නම් හා එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැකිනම් දේපළ, පිරියත සහ උපකරණවල එදිනෙදා සේවා පිරිවැය, ලාභඅලාභ ප්‍රකාශයට අයකෙරේ.

### අලුත්වැඩියා සහ නඩත්තුව

අලුත්වැඩියාවන් සහ නඩත්තු කිරීම් සිදුකරනු ලබන මූල්‍ය කාලසීමාව තුළ ලාභයේ හෝ අලාභ ප්‍රකාශයට අය කෙරේ. වත්කම්වල මෑතකදී තක්සේරු කරන ලද කාර්‍යසාධනයේ ප්‍රමිතියට වඩා අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම සහ සමූහය වෙත ගලා යාහැකි අතර ප්‍රතිසංස්කරණය මගින් හඳුනා ගතහැකි කොටසක් ප්‍රතිස්ථාපනය කළ හැකිය. වත්කම අදාළ වත්කම්වල ඉතිරිව ඇති ප්‍රයෝජනවත් කාලය තුළ ප්‍රධාන අලුත්වැඩියාවන් ක්ෂය කරනු ලැබේ.

### කරගෙන යන වැඩ ප්‍රාග්ධනීකරණය

මේවා ප්‍රාග්ධනීකරණය බලාපොරොත්තුවෙන් ගොඩනැගිලි ඉදිකිරීම, ප්‍රධාන කර්මාන්තශාලා සහ යන්ත්‍රෝපකරණ සහ පද්ධති සංවර්ධනය සඳහා සෘජුවම දරනු ලබන ප්‍රාග්ධන ස්වභාවයේ වියදම්වේ. මේවා පිරිවැය අනුව මූල්‍ය තත්ත්වයට පිළිබඳ ප්‍රකාශයේ සඳහන්වේ.

### ඉවත් කිරීම

දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමේදී හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. වත්කම් අවලංගු කිරීම නිසා ඇතිවන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ වත්කම් ධාරණ අගය අතර වෙනස) වත්කම් අවලංගු කරන ලද වර්ෂයේ ලාභය හෝ අලාභ ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායම තුළ හඳුනාගෙන ඇත.

### ක්ෂය වීම

දේපළ, පිරියත සහ උපකරණවල එක් එක් කොටසෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිතවලට වඩා සරල රේඛීය පදනමක්මත ක්ෂයවීම හඳුනාගෙන ඇති හෙයින් මෙම ක්‍රමය මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව වඩාත් සමීපව පිළිබිඹුවේ. ඉඩම් ක්ෂය නොවේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත පහත පරිදිවේ.

| වත්කම් පන්තිය | % වසරකට | කාලය |
|---|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 2 | අවුරුදු 50 |
| කල්බදු දේපළ වැඩිදියුණු කිරීම | 25 | අවුරුදු 4 |
| මෝටර් වාහන | 12.5-20 | අවුරුදු 5-8 |
| පරිගණක දෘඩාංග | 20 | අවුරුදු 5 |
| කාර්යාල උපකරණ | 10-20 | අවුරුදු 5-10 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 20 | අවුරුදු 5 |

ඉහත අනුපාත සමූහයේ සියලු ආයතන විසින් නිරන්තරයෙන් භාවිතා කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණවල එක් එක් සැළකිය යුතු කොටස සඳහා ක්ෂයවීමේ අනුපාතය වෙන වෙනම තීරණය කරනු ලබන අතර එය භාවිතයට ගතහැකිවිට ක්ෂය වීමට පටන් ගනී. එනම්, එය ක්‍රියාත්මක වන පරිදි අවශ්‍ය ස්ථානයට හා තත්වයට පත්වෙයි. කළමනාකරණය විසින් අදහස් කරන විට වත්කම් ක්ෂය කිරීම වත්කම් විකිණීම සඳහා වර්ගීකරණයකරඇති දිනට පෙර හෝ වත්කම් හඳුනා නොගත් දිනට පෙර නතරවේ. ක්ෂයවීම් ක්‍රම, ප්‍රයෝජනවත් ජීවිත සහ අවශේෂ අගයන් එක් එක් වාර්තා කිරීමේ දිනයේදී නැවත තක්සේරුකර සුදුසු නම් සකස් කරනු ලැබේ.

## දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලය

සමූහය සහ සමාගම ඔවුන්ගේ ඇස්තමේන්තුගත අවශේෂ අගයන් සැලකිල්ලට ගැනීමෙන් පසු ඔවුන්ගේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලයට වඩා සරල රේඛීය ක්‍රමය භාවිතා කරමින් දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කරයි. ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය සමූහයේ දේපළ, පිරියත සහ උපකරණ භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමට සමූහය සහ සමාගම අදහස් කරන කාලසීමාව පිළිබඳ කළමනාකරණ ඇස්තමේන්තුව පිළිබිඹු කරයි. වත්කම් බැහැර කිරීම සඳහා සමූහය/සමාගම දනට ලබාගන්නා කළමනාකරණයේ ඇස්තමේන්තුගත මුදල, ඉතිරි වටිනාකම, වත්කම දනටමත් ජීවිත කාලය ඉක්මවූවක් මෙන් දනීම සහ අපේක්ෂිත මට්ටමේ භාවිතයේ වෙනස්වීම් සහ තාක්ෂණික වර්ධනයන් ආර්ථිකයට, ප්‍රයෝජනවත් ජීවිතවලට සහ මෙම වත්කම්වල අවශේෂ අගයන්ට බලපානුඇති අතර එමගින් අනාගත ක්ෂයවීම් ගාස්තු කෙරෙහි බලපෑම ඇතිකළ හැකිය.

## 32.1 දේපළ, පිරියත සහ උපකරණ - සමාගම

| | සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි රු. '000 | කල්බදු දේපළ වැඩිදියුණු කිරීම රු. '000 | මෝටර් වාහන රු. '000 | පරිගණක දෘඩාංග රු. '000 | කාර්යාල උපකරණ රු. '000 | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් රු. '000 | මුළු එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| පිරිවැය | | | | | | | |
| 2018 අප්‍රේල් 1 වන විට ශේෂය | 619,181 | 56,872 | 209,752 | 629,512 | 611,767 | 420,360 | 2,547,444 |
| එකතු කිරීම් | – | – | 1,321 | 81,996 | 47,971 | 16,379 | 147,667 |
| ඉවත් කිරීම් | (52,000) | – | (1,564) | (2,052) | (4,341) | (1,268) | (61,225) |
| **2019 මාර්තු 31 දිනට ශේෂය** | 567,181 | 56,872 | 209,509 | 709,456 | 655,397 | 435,471 | 2,633,886 |
| **(අඩු) සමුච්චිත ක්ෂයවීම** | | | | | | | |
| 2018 අප්‍රේල් 1 වන විට ශේෂය | 3,232 | 56,754 | 62,548 | 470,057 | 441,729 | 346,241 | 1,380,561 |
| වර්ෂය සඳහා ගාස්තු | 430 | 20 | 12,897 | 58,417 | 65,154 | 29,088 | 166,006 |
| ඉවත් කිරීම | (1,260) | – | (938) | (3,307) | (4,303) | (1,159) | (10,967) |
| **2019 මාර්තු 31 දිනට ශේෂය** | 2,402 | 56,774 | 74,507 | 525,167 | 502,580 | 374,170 | 1,535,600 |
| **ශුද්ධ පොත් වටිනාකම 2019 මාර්තු 31 දිනට** | 564,779 | 98 | 135,002 | 184,289 | 152,817 | 61,301 | 1,098,286 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි රු. '000 | කල්බදු දේපල වැඩිදියුණු කිරීම රු. '000 | මෝටර් වාහන රු. '000 | පරිගණක දෘඪාංග රු. '000 | කාර්යාල උපකරණ රු. '000 | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් රු. '000 | මුළු එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | |
| 2017 අප්‍රේල් 1 වන විට ශේෂය | 683,660 | 56,872 | 227,385 | 544,967 | 550,174 | 397,780 | 2,460,838 |
| එකතු කිරීම් | – | – | 172 | 84,647 | 62,629 | 22,902 | 170,350 |
| ඉවත් කිරීම් | (64,479) | – | (17,805) | (102) | (1,036) | (322) | (83,744) |
| 2018 මාර්තු 31 දිනට ශේෂය | 619,181 | 56,872 | 209,752 | 629,512 | 611,767 | 420,360 | 2,547,444 |
| **(අඩු) සමුච්චිත ක්ෂයවීම** | | | – | | | | |
| 2017 අප්‍රේල් 1 වන විට ශේෂය | 2,526 | 56,717 | 51,935 | 418,500 | 365,122 | 311,294 | 1,206,094 |
| වර්ෂය සඳහා ගාස්තු | 706 | 37 | 13,783 | 51,627 | 77,644 | 35,108 | 178,905 |
| ඉවත් කිරීම | – | – | (3,170) | (70) | (1,037) | (161) | (4,438) |
| 2018 මාර්තු 31 දිනට ශේෂය | 3,232 | 56,754 | 62,548 | 470,057 | 441,729 | 346,241 | 1,380,561 |
| **ශුද්ධ පොත් වටිනාකම 2018 මාර්තු 31 දිනට** | 615,949 | 118 | 147,204 | 159,455 | 170,038 | 74,119 | 1,166,883 |

## 32.2 දේපළ, පිරියත සහ උපකරණ - සමූහය

| | සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි රු. '000 | කල්බදු දේපල වැඩිදියුණු කිරීම රු. '000 | මෝටර් වාහන රු. '000 | පරිගණක දෘඪාංග රු. '000 | කාර්යාල උපකරණ රු. '000 | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් රු. '000 | මුළු එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | |
| 2018 අප්‍රේල් 01 වන විට ශේෂය | **3,259,486** | **58,583** | **587,694** | **700,364** | **881,733** | **497,551** | **5,985,411** |
| එකතු කිරීම් | **–** | **–** | **71,849** | **106,661** | **57,345** | **21,516** | **257,371** |
| ඉවත් කිරීම් | **(52,000)** | **–** | **(48,776)** | **(2,052)** | **(5,598)** | **(1,268)** | **(109,694)** |
| මාරුවීම් | **6,513** | **–** | **–** | **6,185** | **6,105** | **(12,290)** | **6,513** |
| විනිමය අනුපාත විචලනය | **–** | **–** | **–** | **1,019** | **798** | **1,900** | **3,717** |
| 2019 මාර්තු 31 දිනට ශේෂය | **3,213,999** | **58,583** | **610,767** | **812,177** | **940,383** | **507,409** | **6,143,318** |
| **(අඩු) සමුච්චිත ක්ෂයවීම** | | | | | | | |
| 2018 අප්‍රේල් 01 වන විට ශේෂය | **198,283** | **57,231** | **157,911** | **517,911** | **574,236** | **367,124** | **1,872,696** |
| වර්ෂය සඳහා ගාස්තු | **60,368** | **20** | **41,105** | **70,030** | **74,375** | **40,295** | **286,193** |
| ඉවත් කිරීම | **(1,260)** | **–** | **(22,423)** | **(3,307)** | **(5,560)** | **(1,140)** | **(33,690)** |
| මාරුවීම් | **–** | **–** | **–** | **1,133** | **1,512** | **(2,645)** | **–** |
| විනිමය අනුපාත විචලනය | **–** | **–** | **–** | **198** | **244** | **376** | **818** |
| 2019 මාර්තු 31 දිනට ශේෂය | **257,391** | **57,251** | **176,593** | **585,965** | **644,807** | **404,010** | **2,126,017** |
| **ශුද්ධ පොත් වටිනාකම** | **2,956,608** | **1,332** | **434,174** | **226,212** | **295,576** | **103,399** | **4,017,301** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



| | සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි රු. '000 | කල්බදු දේපල වැඩිදියුණු කිරීම රු. '000 | මෝටර් වාහන රු. '000 | පරිගණක දෘඩාංග රු. '000 | කාර්යාල උපකරණ රු. '000 | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් රු. '000 | නොනිමි වැඩ රු. '000 | මුළු එකතුව රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | | |
| 2017 අප්‍රේල් 1 වන විට ශේෂය | 2,841,602 | 58,583 | 588,436 | 612,507 | 805,106 | 417,001 | 1,327,085 | 6,650,320 |
| එකතු කිරීම් | – | – | 81,275 | 94,295 | 77,847 | 64,450 | 94,396 | 412,263 |
| උපසමාගම් අත්පත් කර ගැනීම නිසා එකතු කිරීම | – | – | – | – | – | 19,979 | – | 19,979 |
| ඉවත් කිරීම | (64,479) | – | (82,017) | (6,438) | (1,220) | (7,437) | (14,196) | (175,787) |
| මාරුවීම් | 482,363 | – | – | – | – | – | (1,407,285) | (924,922) |
| විනිමය අනුපාත විචලනය | – | – | – | – | – | 3,558 | – | 3,558 |
| 2018 මාර්තු 31 දිනට ශේෂය | 3,259,486 | 58,583 | 587,694 | 700,364 | 881,733 | 497,551 | – | 5,985,411 |
| **(අඩු) සමුච්චිත ක්ෂයවීම** | | | | | | | | |
| 2017 අප්‍රේල් 1 වන විට ශේෂය | 152,340 | 57,194 | 145,133 | 462,374 | 490,067 | 327,654 | – | 1,634,762 |
| වර්ෂය සඳහා ගාස්තු | 45,943 | 37 | 42,497 | 61,901 | 85,390 | 42,574 | – | 278,342 |
| උපසමාගම් අත්පත්කර ගැනීම නිසා එකතු කිරීම | – | – | – | – | – | 3,526 | – | 3,526 |
| ඉවත් කිරීම | – | – | (29,719) | (6,364) | (1,221) | (7,013) | – | (44,317) |
| විනිමය අනුපාත විචලනය | – | – | – | – | – | 383 | – | 383 |
| 2018 මාර්තු 31 දිනට ශේෂය | 198,283 | 57,231 | 157,911 | 517,911 | 574,236 | 367,124 | – | 1,872,696 |
| ශුද්ධ පොත් වටිනාකම 2018 මාර්තු 31 | 3,061,203 | 1,352 | 429,783 | 182,453 | 307,497 | 130,427 | – | 4,112,715 |

## 32.3 සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපල, පිරියත සහ උපකරණ

වාර්තා කරන දිනට තවමත් භාවිතයේ පවතින, සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපල, පිරියත සහ උපකරණවල ආරම්භක පිරිවැය පහත පරිදි වේ:

| මාර්තු 31 වන විට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | **2019 රු. '000** | 2018 රු. '000 | **2019 රු. '000** | 2018 රු. '000 |
| කල්බදු දේපල වැඩිදියුණු කිරීම | **53,282** | 54,624 | **53,282** | 54,624 |
| මෝටර් වාහන | **37,444** | 28,241 | **38,520** | 51,818 |
| පරිගණක දෘඩාංග | **400,378** | 357,737 | **434,734** | 381,263 |
| කාර්යාල උපකරණ | **285,671** | 267,334 | **312,322** | 287,137 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | **308,748** | 298,765 | **320,293** | 305,877 |
| මුළු එකතුව | **1,085,523** | 1,006,701 | **1,159,151** | 1,080,719 |

## 32.4 සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි

| පිහිටීම | ලිපිනය | තක්සේරු දිනය | තක්සේරු ක්‍රමය | ඉඩමේ ප්‍රමාණය (පර්චස්) | ගොඩනැගිල්ල වර්ගප්‍රමාණය (වර්ග අඩි) | 2019 පිරිවැය රු. '000 | 2019 ප්‍රත්‍යා ගණනය | 2018 ප්‍රත්‍යා ගණනය රු. '000 |
|---|---|---|---|---|---|---|---|---|
| **පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී.** | | | | | | | | |
| **වාහන අංගන** | | | | | | | | |
| මාකොළ | අංක 496, මාකොළ උතුර, මාකොළ | 31.12.2016 | MCM | 90 | 11,600 | **7,632** | **45,000** | 45,000 |
| මාබිම | අංක 225/ ඩී, නයනගල පාර, හෙයියන්තුඩුව, මාබිම | 31.12.2016 | MCM | 330.75 | 820 | **21,722** | **68,000** | 68,000 |
| මීගහමුල්ල | කන්දපල්ල, බෙලිගමුව, ගලේවෙල | 31.12.2016 | MCM | 260 | 1,836 | **27,558** | **13,754** | 13,754 |
| මොණරාගල | නො 10, පොතුවිල් පාර, මොනරාගල | 31.12.2016 | MCM | 125.9 | 1,376 | **41,056** | **45,000** | 45,000 |
| **පරිපාලනමය අරමුණු** | | | | | | | | |
| බණ්ඩාරවෙළ | අංක 35/2ඩී, වැලිමඩ පාර, බණ්ඩාරවෙළ | 31.12.2016 | MCM | 8.3 | 5,194 | **31,257** | **40,000** | 40,000 |
| යාපනය | අංක 10, මහත්මා ගාන්ධි පාර, යාපනය | 31.12.2016 | MCM | 44.72 | – | **45,764** | **155,063** | 155,063 |
| බොරලැස්ගමුව* | අංක 81, පරණ කැස්බෑව පාර, දිවුලපිටිය, බොරලැස්ගමුව | 31.12.2016 | MCM | 42 | 13,366 | **52,000** | **-** | 50,000 |
| හෝකන්දර* | අංක 414, වෙල්ලංගිරිය, සිංහපුර, හෝකන්දර | 31.03.2017 | MCM | 224 | – | **71,148** | **-** | 134,400 |
| මාතර | අංක 367,අනගාරික ධර්මපාල මාවත, මාතර | 31.12.2016 | MCM | 40 | – | **93,599** | **100,000** | 100,000 |
| මහනුවර | අංක 296, සේනානායක පාර, මහනුවර | 31.12.2016 | MCM | 47.1 | – | **142,711** | **154,575** | 154,575 |
| අනුරාධපුර | අංක 50, මෛත්‍රීපාල සේනානායක පාර, අනුරාධපුර | 31.12.2016 | MCM | 40.51 | | **155,882** | **174,193** | 174,193 |
| **එකතුව** | | | | | | **690,329** | **795,585** | 979,985 |
| **පීපල්ස් ලීසිං ප්‍රොපටි ඩිවලොප්මන්ට් ලිමිටඩ්** | | | | | | | | |
| බොරැල්ල | අංක 1161, මරදාන පාර, කොළඹ 08 | 31.12.2018 | MCM | 104.9 | 127,621 | **1,532,414** | **2,300,000** | 2,088,500 |
| **එකතුව** | | | | | | **1,532,414** | **2,300,000** | 2,088,500 |
| **පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපටීස් ලිමිටඩ්** | | | | | | | | |
| කොළඹ 05 | අංක 07, හැව්ලොක් පාර, කොළඹ 05 | 31.12.2018 | MCM | 111.45 | 84,024 | **1,984,619** | **2,600,000** | 2,600,000 |
| **එකතුව** | | | | | | **1,984,619** | **2,600,000** | 2,600,000 |
| **මුළු එකතුව** | | | | | | **4,207,362** | **5,695,585** | 5,668,485 |

MCM - වෙළඳපල සංසන්දනාත්මක ක්‍රමය
* මෙම ඉඩම මූල්‍ය වශයෙන් විකුණා ඇත.

ඉහත ඉඩම හා ගොඩනැගිලිවල වෙළඳපල තක්සේරුව සමාගම සමග සම්බන්ධ නොවූ ස්වාධීන තක්සේරුකරුවෙකු වන කේ.ටී.ඩී. තිසෙරා FRICS(Eng) විසින් තක්සේරු කර ඇත. තක්සේරු කිරීම සඳහා ආයෝජන ක්‍රමය, කොන්ත්‍රාත්කරුවන්ගේ පරීක්ෂණ ක්‍රමය හා සංසන්දනය කිරීමේ ක්‍රමය භාවිතා කර ඇත. සමාග මේ සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි සාධාරණ වටිනාකම් ධූරාවලියේ 3 වන මට්ටම යටතේ සලකා බලනු ලැබේ.

### තාවකාලික නිෂ්ක්‍රීය දේපල, පිරියත සහ උපකරණ

2019 මාර්තු 31 සහ 2018 මාර්තු 31 දින වන විට සමූහ/සමාගම නිෂ්ක්‍රීය දේපළ, පිරියත සහ උපකරණ නොමැත.

### දේපල, පිරියත සහ උපකරණ සක්‍රීය භාවිතයෙන් විශ්‍රාම ගන්නා ලද

2019 මාර්තු 31 සහ 2018 මාර්තු 31 දින වන විට සක්‍රීය භාවිතයෙන් විශ්‍රාම ගත් සමූහයේ/සමාගම් හි දේපල, පිරියත සහ උපකරණ  නොමැත.

### දේපල, පිරියත සහ උපකරණ සඳහා හිමිකම් සීමා කිරීම

සමූහයේ/සමාගමේ හි දේපල, පිරියත සහ උපකරණවල අයිතිය සඳහා 2019 මාර්තු 31 සහ 2018 මාර්තු 31 දිනට කිසිදු සීමාවක් නොතිබුණි.

### වගකීම් සඳහා සුරැකුම් ලෙස ඔඩපණ වූ දේපල, පිරියත සහ උපකරණ

මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන 57 (වත්කම් අඩපණ) හි දක්වා ඇති වගකීම් සඳහා සුරැකුම්පත් ලෙස පොරොන්දු වූ සමූහයේ/සමාගම හි දේපල, පිරියත සහ උපකරණ කිසිවක් නොතිබුණි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



## දේපළ, පිරියත සහ උපකරණ සඳහා තෙවන පාර්ශ්වයන්ගෙන් වන්දි ගෙවීම

සමූහයේ/සමාගම හි දේපල, පිරියත සහ උපකරණ අපහායනය වූ, නැති වූ හෝ අතරහැර දැමූ භාණ්ඩ සඳහා තෙවන පාර්ශ්වයන්ගෙන් වර්ෂය තුළ කිසිදු වන්දියක් ලැබී නොමැත. (2018: නොමැත)

## සාධාරණ අගය මැනීම සඳහා නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්

සාධාරණ ප්‍රකාශන ධූරායවලියෙහි 3 වන මට්ටම ලෙස වර්ගීකරණය කර ඇති මූල්‍යමය නොවන වත්කම් මැනීම සඳහා භාවිතා කළ නොහැකි සැලකිය යුතු යෙදවුම් සටහන 21.6හි දක්වා ඇත.

## 33 කීර්ති නාමය සහ අස්පෘශ්‍ය වත්කම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහයේ අස්පෘශ්‍ය වත්කම් අතර ව්‍යාපාර සංයෝජනයෙන් සහ පරිගණක මෘදුකාංගවල වටිනාකමෙන් ලබාගත් කීර්තිනාමය සහ පාර්භෝගික ලැයිස්තුව ඇතුළත් වේ.

## හඳුනා ගැනීමේ පදනම

අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලබන්නේ එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැකි විට පමණක් වන අතර, ඒ සඳහා ආරෝපිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සමූහය/සමාගමට ගලා ඒමට ඉඩ ඇත. - LKAS 38 - "අස්පෘශ්‍ය වත්කම්".

අස්පෘශ්‍ය වත්කම් වෙන වෙනම අත්පත් කර ගනු ලබන්නේ පිරිවැය අනුව මූලික පිළිගැනීම මතය. මූළික හඳුනාගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ සදහන් වන්නේ සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිවීම් අලාභයෙන් අඩු කිරීමෙන් පසුවය.

## පසුකාලීන වියදම්

අස්පෘශ්‍ය වත්කම් සඳහා පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ සම්බන්ධිත නිශ්චිත වත්කමෙහි අන්තර්ගතය අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩිකළ විට පමණි.

## ප්‍රයෝජනවත් ජීවිත කාලය, ක්‍රමක්ෂය හා අපහායනය

